# බලය පිළිබඳ මූලධර්ම

## හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය

මෙම පාඨමාලාව **හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය** මගින් සකස් කරන ලද පාඨමාලාවක් වේ. මෙමගින් ඇදහිලිවතුන් සාර්ථක ආත්මික අස්වැන්නක් ලබා ගැනීම සඳහා පිළියෙල කිරීමට සකස් කරන ලද්දකි.

මෙම පුහුණුවේ තේමාව නම්, යේසුස්වහන්සේ ඉගැන්වූ දේ ඉගැන්වීමයි.
මෙම ඉගැන්වීම් මාළු අල්ලන්නන්, සුංගම් අයකරන්නන් යනාදී මනුෂ්‍යයන් ගෙන ශුභාරංචියේ බලය පෙන්නුම් කිරීම තුළින් ඔවුන් සිටියාවූ ලෝකය දිනාගැනීමට හැකි වූ කිතුබැතියන් ලෙසට වෙනස් කළේය.

මෙම අත්පොත මොඩියුල කිපයකින් සමන්විත විෂය මාලාවේ එක් පාඨමාලාවකි. ඇදහිලිවතුන් දර්ශනයක් තුළින් ක්‍රියාකාරී වීමෙන්, වර්ධනය වීමෙන්, සැලසුම් කිරීමෙන් හා සංවිධානය වීමෙන් එවැන්ජලිස්ත කිරීමේ ඉලක්කය කරා එළඹීම මෙහි අරමුණ වේ.

# පටුන


මෙම අත්පොත භාවිත කරන්නේ කෙසේද? . . . . . . 3

කණ්ඩායම් අධ්‍යයනය සඳහා යෝජනා . . . . . . . 4

හැඳින්වීම . . . . . . . . . . 5

පාඨමාලාවේ අරමුණු . . . . . . . . 7

1. ආගමෙන් පසු ජීවිතය . . . . . . . 8

2. බලයේ ප්‍රභවය . . . . . . . . 19

3. අභියෝග කරන්නාවූ ව්‍යාජ දේ . . . . . . 29

4. “උන්වහන්සේ මෙන් කිසිවෙක් කතා නොකළේය” . . . . . 41

5. පවරන ලද අධිකාරී බලය . . . . . . 48

6. බලයේ පරමාර්ථයන් . . . . . . . 56

7. බලය පිළිබඳ පළමුවන මූලධර්මය: ශුභාරංචියේ බලය . . . 69

8. බලය පිළිබඳ දෙවන මූලධර්මය : ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය . 76

9. බලය පිළිබඳ තෙවන මූලධර්මය : ප්‍රේමයේ බලය . . . 86

10. බලය පිළිබඳ සිවුවන මූලධර්මය : ආලේප කිරීමේ බලය . . . 94

11. බලය පිළිබඳ පස්වන මූලධර්මය : බලය, ඇදහිල්ල හා ක්‍රියාවන් . . 106

12. බලය පිළිබඳ හයවන මූලධර්මය : යේසුස්වහන්සේගේ නාමයේ බලය . 113

13. බලය පිළිබඳ සත්වන මූලධර්මය : යාච්ඤාවේ බලය . . . 130

14. බලය පිළිබඳ අටවන මූලධර්මය : දේව වචනයේ බලය . . . 149

15. බලය පිළිබඳ නවවන මූලධර්මය : අධිකාරී බලය . . . 157

16. බලය පිළිබඳ දසවන මූලධර්මය : උන්වහන්සේගේ නැවත නැගිටීමේ බලය 167

17. බලය පිළිබඳ එකළොස්වන මූලධර්මය : දුක්විඳීමේ බලය . . 174

18. දෙවියන්වහන්සේගේ බලය අත්දකින්නේ කෙසේද? . . . 190

19. බලය බිඳවැටීම . . . . . . . . 196

20. විරෝධතාවලට මුහුණ දීම . . . . . . 204

ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු . . . . . . 211

# මෙම අත්පොත භාවිත කරන ආකාරය

## අත්පොතේ සැකසුම

සෑම පාඩමකම පහත දැක්වෙන දේ අන්තර්ගත වේ:

**අරමුණු:** සෑම පාඩමක්ම අධ්‍යයනය කිරීමෙන් පසු ඔබ මුදුන් පමුණුවා ගත යුතු ඉලක්කයන් වේ. පාඩම ආරම්භ කිරීමට පෙර ඒවා කියවන්න.

**ප්‍රධාන පදය:** පරිච්ඡේදයක ප්‍රධාන සංකල්පය මෙම පදයෙන් අවධාරණය කෙරේ. එය කටපාඩම් කරන්න.

**පරිච්ඡේදයක අන්තර්ගතය:** සෑම කොටසක්ම අධ්‍යයනය කරන්න. අත්පොතේ මුද්‍රණය කර නොමැති යොමු කිරීම් සඳහා බයිබලය බලන්න.

**ස්වයං ඇගයීම:** පරිච්ඡේදයක් අධ්‍යයනය කර අවසන් කළ පසු මෙම ඇගයීමට පිළිතුරු සපයන්න. මෙම අත්පොත හෝ බයිබලය හෝ භාවිත නොකර ප්‍රශ්නවලට පිළිතුරු දීමට උත්සාහ කරන්න. ස්වයං-ඇගයීම අවසන් කළ පසු ඔබේ පිළිතුරු මෙම අත්පොතේ අවසානයේ දී ඇති පිළිතුරු හා සසඳා බලන්න.

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** දේව වචනය තවදුරටත් අධ්‍යයනය කිරීමටත් ඔබගේ අධ්‍යයන හැකියාවන් දියුණුකර ගැනීමටත්, ඔබ උගත් දේ ඔබගේ ජීවිතයටත් මෙහෙයටත් අදාළ කර ගැනීමටත් මෙම කොටස උපකාරී වේ.

**අවසාන පරීක්ෂණය:** ඔබ සම්මාන සඳහා මෙම පාඨමාලාවෙහි ලියා පදිංචි වූයේ නම්, පාඨමාලාව හා සමඟ අවසාන පරීක්ෂණයද ඔබට ලැබෙන්නට ඇත. මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු මෙම පරීක්ෂණයට පිළිතුර සපයා, ඔබට ලැබී ඇති උපදෙස් අනුව ශ්‍රේණි පැවරීම සඳහා ආපසු එවන්න.

# කණ්ඩායම් වැඩ සඳහා යෝජනා

## පළමු රැස්වීම

**ආරම්භය:** යාච්ඤාවකින් හා හැඳින්වීමකින් ආරම්භ කරන්න. එකිනෙකා හඳුනාගෙන ශිෂ්‍යයින්ව ලියාපදිංචි කරන්න.

**කණ්ඩායම් ක්‍රියා පිළිවෙළ තහවුරු කරන්න:** රැස්වීම මෙහෙය වන්නේ කවුරුන්ද, කාර්යය සැසි දින, කාලය, ස්ථානය තිරණය කරන්න.

**ප්‍රශංසා කිරීම හා යාච්ඤා කිරීම:** ඔබගේ පුහුණු සැසි සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩ සිටීම අයැදින්න.

**අත්පොත ශිෂ්‍යයින්ට බෙදා දෙන්න:** අත්පොතේ මුල් පිටු කිපයෙන් සපයා ඇති පොතේ මාතෘකාවද, සැකැස්මද, පාඩමාලාවේ අරමුණු ද හඳුන්වා දෙන්න.

**පළමු පැවරුම සකස් කරන්න:** ඊළඟ රැස්වීමට පෙර ශිෂ්‍යයින් ඔවුන්ට නියමිත පරිච්ඡේද කියවා ස්වයං-ඇගයීම්වලට පිළිතුරු සපයනු ඇත. එක් රැස්වීමකදී අධ්‍යයන කරනු ලබන පරිච්ඡේද සංඛ්‍යාව, ඒ ඒ පරිච්ඡේදයේ දිග ප්‍රමාණය, අන්තර්ගතය හා කණ්ඩායමේ දක්ෂතා මත රැඳී පවතී.

## දෙවන හා ඊළඟ රැස්වීම්

**ආරම්භය:** යාච්ඤා කරන්න. අලුතින් පැමිණි ශිෂ්‍යයින් ඇතිනම් ඔවුන්ව පිළිගෙන ලියාපදිංචි කර අත්පොත බැගින් දෙන්න. පැමිණීම ලකුණු කරන්න. ප්‍රශංසා කිරීමේ හා යාච්ඤා කිරීමේ කාලයක් ගත කරන්න.

**පුනරීක්ෂණය:** පසුගිය රැස්වීමේ දී උගත් දේ කෙටි සාරාංශයකින් ඉදිරිපත් කරන්න.

**පාඩම: තද කළු අකුරින් ඇති මාතෘකා,** ඉගැන්වීමේ සැකිල්ලක් ලෙස භාවිත කරමින්, පරිච්ඡේදයක එක් එක් කොටස සාකච්ඡා කරන්න. තමන් අධ්‍යයනය කළ දේ ගැන ප්‍රශ්න හෝ අදහස් හෝ ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ශිෂ්‍යයින්ට පවසන්න. ඒ ඒ පාඩම්, ඔබගේ ශිෂ්‍යයින්ගේ ජිවිතවලටත් සේවයටත් අදාළ කර ගන්න.

**ස්වයං-ඇගයීම්:** ශිෂ්‍යයින් පිළිතුරු සපයා ඇති ස්වයං-ඇගයීම් පුනරීක්ෂණය කරන්න (ස්වයං-ඇගයීම්වල පිළිතුරු ශිෂ්‍යයින් අතට යෑමට ඔබ අකමැති නම්, ඒවා සෑම අත්පොතකින්ම ගළවා ඉවත් කරන්න).

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** මෙහි ඇති ව්‍යාපෘති තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ කළ හැකිය.

**මොඩියුලය: ගුණ කිරීම**
**පාඨමාලාව: බලය පිළිබඳ මූලධර්ම**

# හැඳින්වීම

නව ගිවිසුම් යුගයේ යේසුස්වහන්සේ ආගමික නායකයින්ට මෙසේ පැවසූ සේක.

> **නුඹලා ශුද්ධලියවිලිවත් දෙවියන්වහන්සේගේ බලයවත් නොදැන වරද්දාගනිහුය. (මතෙව් 22:29)**

ශුභාරංචියේ සත්‍යය දෙයාකාරය. පළමුව, ශුද්ධ බයිබලයෙන් එළිදරව්කර ඇත්තාක් මෙන් එය දෙවියන් වහන්සේගේ වචනය වේ. ශුද්ධ ලියවිල්ල දැන ගැනීමට ඔබ එය අධ්‍යයනය කර, අවබෝධ කරගෙන ව්‍යවහාර කළ යුතුය.

එහෙත් ශුභාරංචියයේ සත්‍යය ශුද්ධලියවිල්ලට වඩා වැඩි වේ. එය දෙවියන්වහන්සේගේ බලය ද වේ. දෙවියන්වහන්සේගේ බලය දැනගැනීමට ඔබ බලය පිළිබඳ මූලධර්ම අවබෝධ කරගෙන ව්‍යවහාර කළ යුතුය. දෙවියන්වහන්සේගේ බලය අත්දැකීම් තුළින් ඔබගේ ජීවිතයේ සත්‍යතාවක් විය යුතු වේ.

මුල් සභාව බිහිවුනේ දෙවියන්වහන්සේගේ බලය පෙන්නුම් කිරීමෙන් මිස, ප්‍රසිද්ධ විශිෂ්ට කථිකයන් මගින් හෝ දේවධර්මය පිළිබඳ විවාදවලින් හෝ නොවේ. පාවුලුතුමා මෙසේ ලියා ඇත.

> **මාගේ කථාවත් මාගේ දේශනා කිරීමත් ප්‍රඥාවේ සිත් පොළඹවන්නාවූ වචනවලින් නොව ආත්මයාණන්වහන්සේගේ ද බලයේ ද ප්‍රකාශ කිරීමෙන් විය. එසේ වුණේ නුඹලාගේ ඇදහිල්ල දෙවියන්වහන්සේගේ බලයෙන් මිස මනුෂ්‍යයන්ගේ ප්‍රඥාවෙන් නොපිහිටන පිණිසය.** (1 කොරින්ති 2:4-5)
>
> **දෙවියන්වහන්සේගේ රාජ්‍යය (ප්‍රකාශවන්නේ) කථාවෙන් නොව බලයෙන්ය.**
> (1 කොරින්ති 4:20) බව පාවුලුතුමා හැඳිනගත්තේය.

දේව රාජ්‍යය පිළිබඳ ශුභාරංචිය ලෝකය වෙත ගෙනයෑමේ මහඟු සේවය යේසුස්වහන්සේ ඇදහිලිවතුන් වෙත තැබූ සේක. මෙම කාර්යය වචනයෙන් පමණක් සාක්ෂාත් කරගත නොහැකි වේ. මුල් සභාවේ මෙන් දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීමක් ද ඒ සඳහා තිබිය යුතුය. බොහෝ අය දේව වචනය දනිති. එහෙත් දේව බලය අත්දැක නැත. ඔවුන් සැබවින්ම ශුභාරංචියේ බලය අවබෝධ කරගෙන නැත. අද බොහෝ දේවගැතිවරු ඉතා හොඳ උගත්තු වෙති. ඔවුහු මනුෂ්‍ය ප්‍රඥාවෙන් සිත් ඇදගන්නා සුලු වචනවලින් කතා කරති. එහෙත් ශුද්ධාත්මයාණන්වහන්සේ හෝ බලය හෝ ප්‍රදර්ශනය කිරීමක් සිදු නොවේ.

ඇතැම් සභාවල භාස්කම්, සදහා මනුෂ්‍යයන් විසින් ඉල්ලා සිටින හේතු දැක්වීම් හා තාර්කානුක=ල පැහැදිලි කිරීම් මගින් ප්‍රතිස්ථාපනය වී ඇත. භාස්කම් අදටද නැතහොත් මුල් සභාවටද යන දේවධාර්මික විවාදවලින් බලය ප්‍රතිස්ථාපනය වී ඇත. භාස්කම් හේතු දැක්වීම් හා විවාද වලින් ප්‍රතිස්ථාපනය වු කළ දෙවියන් වහන්සේගේ ජීවිතයේ ගැලීම මනුෂ්‍යා සෑදූ ආගමෙන් ප්‍රතිස්ථාපනය වේ. මනුෂ්‍යයා ආගමෙන් හා ඒ හා සමග බැඳුනු චාරිත්‍රවලින් පිරී ඇත. දැන් ඔවුන්ට සත්‍යතාව අත්දැකීම අවශ්‍යය. ඔවුන්ට දෙවියන්වහන්සේගේ බලය ප්‍රකාශ වීම දෘශ්‍යමානව දැකගැනීම අවශ්‍යය.

ඔබගේ ඇදහිල්ල මනුෂ්‍ය ප්‍රඥාව මත නොව දෙවියන්වහන්සේගේ බලය මත පිහිටුවන්නේ නම් මුල් සභාව මෙන් ඔබ ද එම බලයේ ගැලීමම අත්දැකිය යුතුය. මුල් සභාවේ ඇදහිලිවන්තයෝ :

> **... පිටත්ව ගොස් සියලු තැන්වලට දේශනා කළෝය. ස්වාමීන්වහන්සේද ඔවුන් සමග ක්‍රියා කරමින් ඔවුන් අතින් සිදු වූ ලකුණුවලින් වචනය ස්ථිර කළ සේක (මාක් 16:20).**

දෙවියන්වහන්සේ *උදෙසා* වැඩ කිරීම පිළිබඳව අප කතා කර ඇත. අපගේ සේවය අප සැලසුම් කරන අතර ඊට ආශිර්වාද කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටිමු. එහෙත් ඵලදායි සේවයක් සඳහා බයිබලීය ක්‍රමය වන්නේ ස්වාමින්වහන්සේ අප සමග වැඩ කරමින් උන්වහන්සේගේ වචනය හාස්කම්වල සලකුණු තුළින් සහතික කිරීම වේ.

ඔබ දෙවියන්වහන්සේ වෙනුවෙන් කුමක් කරන්නේද යන්න පිළිබඳව ලෝකයාගේ උනන්දුවක් නැත. එහෙත් ශුභාරංචියේ බලයෙන් ඔබගේ ජිවිතය වෙනස් වීමෙන් ඇතිවන්නාවූ ප්‍රතිඵල දැකීමෙන් ලෝකයා යේසුස්වහන්සේ වෙතට ඇදී එයි. දෙවියන්වහන්සේගේ ආත්මික බලය මගින් උන්වහන්සේගේ වචනය හාස්කම් හා ලකුණු වලින් සනාථ වීම ප්‍රදර්ශනය වීම තුළින් ලෝකයා ඇදී එයි.

මෙම පාඨමාලාවෙන් උගන්වනු ලබන බලය පිළිබඳ මූලධර්ම බයිබලයේ උගන්වා ඇති ආත්මික බලය අත්දැකීමට ඔබට උපකාරී වනු ඇත. ආගමට නොව සත්‍යතාවට සාගින්නක් ඇතිවූවන්ගේ හද පත්ලෙන් නැගෙන හඬට මෙම පාඨමාලාව පිළිතුරු සපයයි. එය ඔබ දෙවියන්වහන්සේගේ බලය නිරීක්ෂණය කරන්නෙකු නොව ප්‍රදර්ශනය කරන්නෙකු බවට පත් කරයි.

# පාඨමාලාවේ අරමුණු

මෙම පාඨමාලාව අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට:

- සැබෑ ආත්මික බලයේ ප්‍රභවය හඳුනාගැනීමට
- සතුරාගේ ව්‍යාජ බලය හඳුනා ගැනීමට
- දෙවියන්වහන්සේ විසින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේට පැවරූ බලයන් සාරාංශ කිරීමට
- යේසුස්වහන්සේ ඇදහිලිවතුන්ට පැවරූ ආධිපත්‍යය ලබා ගැනීමට
- ආත්මික බලයේ බයිබලීය පරමාර්ථය හඳුනාගැනීමට
- පහත දැක්වෙන බලය පිළිබඳ මූලධර්ම පැහැදිලි කිරීමට හා ව්‍යවහාර කිරීමට
    - ශුභාරංචියේ බලය
    - ප්‍රේමයේ බලය
    - ශුද්ධාත්මයේ බලය
    - ආලේප කිරීමේ බලය
    - බලය, ඇදහිල්ල හා ක්‍රියාවන්
    - යේසුස්වහන්සේගේ නාමය
    - යාච්ඤාවේ බලය
    - වචනයේ බලය
    - ආධිපත්‍යය යටතේ සිටින අතර ආධිපත්‍යය ඇතිව සිටීම
    - උන්වහන්සේගේ පුනරුජ්ජීවනයේ (නැවත නැගිටීමේ) බලය
    - උන්වහන්සේගේ දුක්විඳීමේ සහභාගිත්වය

- ඔබගේ ජීවිතයට හා සේවයට දෙවියන්වහන්සේගේ බලය ලබාගන්නේ කෙසේද යන්න පැහැදිලි කිරීමට
- බලය අසාර්ථකවීමේ හේතු හඳුනා ගැනීමට
- ඔබගේ ආත්මික ආධිපත්‍යය සාතන් විසින් අභියෝගයට ලක් කළ විට ඔහුව පරාජය කිරීමට හා විරෝධතාවනට මුහුණ දීමට
  හැකිවනු ඇත.

# පළමුවන පරිච්ඡේදය

## ආගමෙන් පසු ජීවිතය

### අරමුණු:

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ආගම සහ දෙවියන්වහන්සේගේ බලය සැබෑ ලෙස ප්‍රදර්ශනය කිරීම අතර වෙනස පැහැදිලි කිරීමට
- ලෞකික බල ව්‍යුහයන් හඳුනා ගැනීමට
- ලෞකික හා බයිබලීය බලය අතර වෙනස පැහැදිලි කිරීමට බයිබලීය යොමු කිරීම් ඉදිරිපත් කිරීමට
- බයිබලීය බලය යන්න අර්ථ විග්‍රහ කිරීමට
- බයිබලීය ආධිපත්‍යය යන්න අර්ථ විග්‍රහ කිරීමට
- ආත්මික බලයේ ප්‍රභවයන් වන අධිස්වභාවික බල හඳුනාගැනීමට
- සෑම බයිබලීය පොරොන්දුවකම ඇති කොටස් දෙක හඳුනාගැනීමට
- දෙවියන්වහන්සේගේ පොරොන්දු අයත් කර ගැනීමේ පියවර ලයිස්තුගත කිරීමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

> **දෙවියන්වහන්ස, ඔබ මාගේ දෙවියන්වහන්සේය, අලුයම ඔබ සොයන්නෙමි. වතුර නැති වියලුනු වෙහෙස උපදවන්නාවූ දේශයක දී මාගේ ආත්මය ඔබ කෙරෙහි පිපාසා ඇත්තේය. මාගේ මාංශය ඔබ කෙරෙහි ආශා ඇත්තේය.**
>
> **මෙසේ ඔබගේ බලයත් ඔබගේ මහිමයත් දකින පිණිස ශුද්ධස්ථානයේදී ඔබ දෙස බලා සිටියෙමි (ගීතාවලිය 63:1-2).**

### හැඳින්වීම

අධික ශීතල නිසා මිනිසෙකු වෙත මරණය පැමිණෙන විට ඔහුට රැවටිලිකාර උණුසුමක් හා නින්දක් දැණෙන්නාක් මෙන්, ආත්මික ලෝකයේ ද ඒ දෙයම සිදුවේ. මිනිසුන් ආත්මිකව මරණයට පත්වන විට සිහි මුළා ගතියක් හා කිසි දෙයක් ගැන සැලකිල්ලක් නොදක්වන ආකල්පයක් ඇති වේ.

ආගම යනු මිනිසා දෙවියන්වහන්සේ දැන ගැනීමට ගන්නා උත්සාහයකි. එය බලයත් නොමැති චාරිත්‍ර හා ව්‍යවස්ථාවන්ද, වැඩ හා වචන ද වේ. ආගම ආත්මික මරණය ගෙන දේ.

දෙවියන්වහන්සේගේ බලය යනු, තමන්වහන්සේ මිනිසාට එළිදරව්වීමේ උන්වහන්සේගේ කැමැත්ත දෘශ්‍යමානව විදහා දැක්වීම වේ. ආත්මික බලය යනු දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ ක්‍රියාකාරී වීමය. එය ආත්මික ජීවිතය ළඟා කරයි.

බොහෝ දෙනෙක් ආගම අත්දැක ඇත්තාහ. ඔවුහු විවිධ ලබ්ධි භේද හා නිකායන්වලට සම්බන්ධය. මෙම සංවිධාන ඔවුන් තුළ හැඟීම් රහිත ආත්මික ආකල්ප ඇති කර ඇත. තම ජීවිත වෙනස් කළ හැකි ශුභාරංචියේ බලය ඔවුන් අත්දැක නැත. ඔවුහු පරාජිතව අධෛර්යට පත්වී, තුවාළ වී සිටිති. ඔවුහු ආත්මිකව මරණයට පත් වෙමින් සිටිති. ඔවුන්ගේ හදවතින් කෙරෙන කෑ ගැසීම මෙසේ ලියූ ගීතිකාකාර දාවිත්ගේ මෙනි.

> **දෙවියන්වහන්ස, ඔබ මාගේ දෙවියන්වහන්සේය, අලුයම ඔබ සොයන්නෙමි. වතුර නැති වියලුනු වෙහෙස උපදවන්නාවූ දේශයක දී මාගේ ආත්මය ඔබ කෙරෙහි පිපාසා ඇත්තේය. මාගේ මාංශය ඔබ කෙරෙහි ආශා ඇත්තේය.**

> **මෙසේ ඔබගේ බලයත් ඔබගේ මහිමයත් දකින පිණිස ශුද්ධස්ථානයේදී ඔබ දෙස බලා සිටියෙමි (ගීතාවලිය 63:1-2).**

මේ සෙනඟ ආගමෙන් පසු ජීවිතය අත්දැකිය යුතුය.

## බල වර්ග

අද ලෝකයේ විවිධ බල වර්ග තිබේ.

**දේශපාලන බලය** අල්ලාගෙන සිටින්නේ සංවිධාන, ගෝත්‍ර, ගම්, නගර, පළාත් හා මුළු දේශයම පාලනය කරන්නෝ වෙති.

**බුද්ධිමය බලය** නිසා අලුත් නිපදවීම්ද, සාහිත්‍යමය හා සංගීතමය නිර්මාණ ද, බිහිවන අතර අධ්‍යාපන ආයතන ද පිහිටුවනු ලැබේ.

**ශාරීරික බලය** ශක්තිමත් මිනිසුන්ට ඇති අතර ඔවුහු බොහෝ දෙනෙක් වෘත්තිමය ක්‍රීඩකයෝ වෙති.

**මූල්‍ය බලය** බැංකුකරුවන් හා ව්‍යාපාරිකයන් සතු අතර ඔවුහු සමාගම්වල හා විශාල මූල්‍යමය අධිරාජ්‍යවල නායකයෝ වෙති.

**යුදමය බලය** විශාල හමුදාවන්ට අයත් වන අතර දේශය ආරක්ෂා කිරීමට හා අලුත් ප්‍රදේශ අල්ලා ගැනීමට භාවිත කෙරේ.

**විවිධ ශක්තීන්ගේ බලය** මිනිසා විවිධාකාරයෙන් ප්‍රයෝජනයට ගනී. එය උණුසුම ලබා ගැනීමට භාවිත කරන සුළු ගින්නේ සිට මුළු නගරයටම සේවය කෙරෙන විදුලිය දක්වා ව්‍යාප්ත වේ.

**ආගමික බලය** නිසා විශිෂ්ට නිකායන් හා ආගමික සංස්කෘතීන් ඇති වේ

මේ සියල්ල අද ලෝකයේ ක්‍රියා කරන මහත් වූ බලයන් වේ. එහෙත් යේසුස්වහන්සේගේ කැඳවීම ලෞකික බලය සඳහා නොවේ. එය ආත්මික බලය සඳහාය. එය ,මා පාලකයෙකු වන්නේ කෙසේද? "යන්න නොව" මා සේවකයෙකු වන්නේ කෙසේද?, යන ප්‍රශ්නය අසන බලයක් වේ.

## ව්‍යුහයේ වෙනස

ලෝකයේ බල ව්‍යුහයත්, දේව රාජ්‍යයේ බල ව්‍යුහයත් අතර වෙනස යේසුස්වහන්සේ පැහැදිලි කළ සේක. උන්වහන්සේ මෙසේ පැවසිය.

> **... අන්‍යජාතීන්ගේ ආණ්ඩුකාරයින් ඔවුන් කෙරේ අධිපතිකම් කරන බවත් ඔවුන්ගේ උත්තමයන් ඔවුන් කෙරේ බලය පවත්වන බවත් නුඹලා දනිහුය.**
> **නුඹලා අතරේ එසේ නොවන්නේය. නුඹලා අතරේ යමෙක් උතුම් වෙන්ට කැමති නම් ඔහු නුඹලාගේ සේවකයා වන්නේය.**
> **නුඹලා අතරේ යමෙක් ප්‍රධානියා වෙන්ට කැමති නම් ඔහු නුඹලාගේ දාසයා වන්නේය.**
> **එසේම මනුෂ්‍ය පුත්‍රයා සේවය ලබන්ට නොව සේවය කරන්ට ද බොහෝ දෙනෙක් උදෙසා මිදීමේ මිලයක් කොට තමන්ගේ ජීවිතය දෙන්ට ද ආවේය. (මතෙව් 20:25-28)**

යේසුස්වහන්සේගේ කැඳවීම වන්නේ, දුක් විඳින, නැතිවූ, මියයන ලෝකයාට සේවය කිරීම සඳහා දෙනු ලැබූ ආත්මික බලය වෙනුවෙන් ලෞකික බලය අත්හරින ලෙස වේ.

## ආත්මික බලය

මෙම පාඨමාලාවේ අප බලය ගැන කතා කරන විට මිනිසා සෑදූ ආගමික නිකායන් ගැන හෝ ආගමික සංවිධාන ගැන හෝ කතා නොකරමු. බහුතරයක ඡන්දයක් මගින් දෙන ලද ආධිපත්‍යයක්

ගැන ද කතා නොකරමු. එය නාමයක් හෝ නිලයක් හෝ මගින් දෙන ලද ආධිපත්‍යයක් ද නොවේ. එය අධ්‍යාපනය හෝ හැකියාව හෝ මත පදනම්වූ බලයක් ද නොවේ.

මෙම පාඨමාලාවේ බලය ගැන අප කතා කරන විට අප අදහස් කරන්නේ ආත්මික බලය පිළිබඳ බයිබලීය සංකල්පයක් වේ. බලය, යන වචනයේ බයිබලීය අදහස වන්නේ ආත්මික ශක්තිය, හැකියාව හා බලය ආදියයි. එය මහත් වූ ක්‍රියාවන් හා හාස්කම්වලට තුඩු දෙන අස්වාභාවික ආධිපත්‍යයකි.

ඊට සමාන වචනයක් වන, අධිකා×ය, යන්න ද මෙම පාඨමාලාවේ භාවිත කෙරේ. බයිබලයේ එය බලය, යන වචනය හා බැඳී ඇති අතර ඊට සමාන අදහසක් ගෙන දෙයි. අධිකා×ය යන්නෙන් අදහස් වන්නේ තවත් කෙනෙක් වෙනුවෙන් ක්‍රියා කිරීමට දී ඇති නීතිමය බලය වේ. අධිකා×ය ලබා ගැනීම යනු බලය පෙන්නුම් කිරීමේ ක්‍රියාව වේ. දෙන ලද සීමාවන් තුළ පවරා ඇති බලය භාවිත කිරීමේ අයිතිය ඊට අයත් වේ.

## ආත්මික බලයේ බලවේග

ආත්මික බලය තුළ ක්‍රියා කරන විවිධ අස්වාභාවික බලවේග කිහිපයක් තිබේ. බයිබලයට අනුව ආත්මික බලය වන්නේ ශුද්ධ වූ බයිබලය මගින් එළිදරව් කර ඇති සැබෑවූ ජීවමාන දෙවියන් වහන්සේ වේ. දෙවියන් වහන්සේ පියවූ දෙවිදුන්ගෙන් ද යේසුස් ක්‍රිස්තුස් නම් පුත්‍රවූ දෙවිදුන්ගෙන් ද ශුද්ධාත්ම දෙවිදුන්ගෙන් ද සමන්විත ත්‍රි එක පුද්ගලයෙකි. පියවූ දෙවියන් වහන්සේ බලයේ උල්පතය.

> **බලය ලත් රාජ්‍ය පාලකයන්ට සෑම දෙනාම කීකරු වෙත්වා. දෙවියන්වහන්සේගෙන් ලැබෙන බලය හැර අන් බලයක් නැත. දැනට සිටින රාජ්‍ය පාලකයෝ දෙවියන් වහන්සේ විසින් පත් කරනු ලැබූ අය වෙති. (රෝම 13:1- නව අනුවාදය)**

දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ පුත්‍ර යේසුස් ක්‍රිස්තුස්වහන්සේට බලය පවරා ඇත.

> **යේසුස්වහන්සේ ඔවුන් ළඟට ඇවිත් කථා කොට: ස්වර්ගයේද පොළොවෙහි ද සියලු බලය මට දී තිබේ. (මතෙව් 28:18)**

යේසුස්වහන්සේ ආත්මික බලය ඇදහිලිවතුන්ට පවරා ඇත. මෙම බලය ශුද්ධාත්මයාණන්වහන්සේ මගින් ක්‍රියා කරනු ලැබේ.

> **නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය. (ක්‍රියා 1:8)**

ආත්මික බලයේ තවත් බලවේගයක් ඇත. එහෙත් එය ඍණාත්මක බලවේගයකි. එය නපුරු ආත්මික බලයේ ප්‍රභවය වන අතර හූනියම් කොඩිවිණ ආදි දුෂ්ට ක්‍රියාවන් සඳහා වග කිව යුතු වේ. එම බලවේගය සාතන්ය. සාතන් යනු ආත්මික බලයකි. එහෙත් ඔහුගේ බලය නපුරුය. අයහපත්ය.

> **මක්නිසාද අපේ පොරබැඳීම වනාහි මාංශයට හා රුධිරයට විරුද්ධව නොව, අධිපතිකම් වලටත් පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාරයේ ලෝක මුලාදෑනීන්ටත් ස්වර්ගීය ස්ථාන වල සිටින දුෂ්ටකමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධවය. (එපීස 6:12)**

ඔබ දෙවියන්වහන්සේගේ බලයේ මෙම "ව්‍යාජ අභියෝගය" පිළිබඳව තෙවන පරිච්ඡේදයෙන් තව දුරටත් ඉගෙන ගන්නවා ඇත.

## බලය ප්‍රදර්ශනය කිරීම

යේසුස්වහන්සේ උන්වහන්සේගේ ප්‍රසිද්ධ සේවය ආරම්භ කළ විට එය හාස්කම් පිළිබඳ සේවයක් විය. උන්වහන්සේගේ සේවය සාර්ථක වූයේ විශිෂ්ට සංවිධානයක් නිසා නොවේ. උන්වහන්සේ ශ්‍රාවකයින් දොළොස් දෙනෙකුගෙන් සේවය ආරම්භ කළ අතර අවසන් වූයේ එකොළොස්

දෙනෙකුගෙනි. එය ජනප්‍රිය වූ නිසා සාර්ථක වූයේ නැත. අවසානයේදී උන්වහන්සේගේම අනුගාමිකයන් ඇතුළුව සියලු දෙනම උන්වහන්සේට විරුද්ධ වූහ. සමූහයා වෙතට උන්වහන්සේගේ සේවය පැමුණුනේ බලය ප්‍රදර්ශනය කිරීම නිසා වේ.

**උන්වහන්සේගේ වචනය බලයෙන් යුක්තවූ බැවින් උන්වහන්සේගේ ඉගැන්වීමට ඔවුහු විස්මිත වූවෝය. (ලූක් 4:32)**

**සියල්ලෝ විස්මිතව: මේ වචනය කිමෙක්ද? මක්නිසාද උන්වහන්සේ බලයෙන්ද අනුහාවයෙන්ද ශුද්ධාත්මයන්ට අණදෙන සේක. ඔවුහු පිටවෙතියි ඔවුනොවුන් අතර කථා කරගත්තෝය. (ලූක් 4:36)**

**... දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන් ද බලයෙන් ද නාසරීය යේසුස්වහන්සේ ආලේප කළ බවත් දෙවියන්වහන්සේ උන්වහන්සේ සමග සිටි බැවින් උන්වහන්සේ යහපත්කම් කරමින් ද යක්ෂයා විසින් පීඩා කරන ලද සියල්ලන් සුවකරමින් ද හැසුරුණු බවත්ය. (ක්‍රියා 10:38)**

මුල් සභාව බිහිවූයේ බලය ප්‍රදර්ශනය කිරීමෙනි. ඔවුන් පිළිබඳව මෙසේ පවසා ඇත.

**... ලෝකය පෙරළුවාවූ මොවුහු මෙහිත් ඇවිත් සිටිති. (ක්‍රියා 17:6)**

මුල් සභාවේ බලපෑම නගර හා මුළු දේශය කෙරෙහිම විය. එහෙත් ඔවුන් එය සිදු කළේ දේශනා කිරීමෙන්ම පමණක් නොවේ. සෙනඟ සවන් දුන් අතර ඔවුන්ගේ ජීවිත වෙනස් විය. ඒ ඔවුන් දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කෙරෙනු දුටු බැවිනි.

**සමූහයෝ ඇහුම්කන්දී පිලිප් කළ ආශ්චර්යයන් දුටු කළ, ඔහු කී කරුණු එක්සිත්ව සැලකූවෝය.**

**කුමක් හෙයින් ද අශුද්ධාත්මයන් වැහී සිටි බොහෝ දෙනෙකුගේ ඒ ආත්මයෝ මහත් හඬින් මොර ගසමින් අහක්ව ගියෝය. බොහෝ අංශභාග රෝගීහු ද කොරු ද සුවකරනු ලැබූවෝය.**

**ඒ නුවර මහත් ප්‍රීතියක් වූයේය. (ක්‍රියා 8:6-8)**

පේතෘස්තුමා ලිද්දාවට පැමිණි විට අට අවුරුද්දක් ඔත්පළව සිටි අයිනෙයස් නම් මනුෂ්‍යයෙක් ඔහුට මුණ ගැසිනි.

**පේතෘස් ඔහුට කථාකොට: අයිනෙයස්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබ සුව කරන සේක. නැගිට නුඹේ ඇඳ සකස් කරගන්නැයි කිවේය. එකෙණෙහිම ඔහු නැගිට්ටේය.**

**ලිද්දායෙහි ද ෂාරොනෙහි ද විසූ සියල්ලෝ ඔහු දැක ස්වාමින්වහන්සේ වෙතට හැරුණෝය (ක්‍රියා 9:34-35)**

යොප්පාවෙහිදී පේතෘස් දොර්කස් නම් ස්ත්‍රියක මරණයෙන් නැගිටුවීය. මේ හාස්කම සිදුවූ විට:

**... එය යොප්පාව මුළුල්ලෙහි ප්‍රකාශ විය. බොහෝ දෙනෙක් ස්වාමින්වහන්සේ කෙරෙහි අදහාගත්තෝය. (ක්‍රියා 9:42)**

දෙවියන්වහන්සේගේ බලය පෙන්වන සෑම විශ්මයජනක සිදුවීමක්ම ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අවධානය යොමු කළේය. බලය ක්‍රියා කළ සෑම සිද්ධියකින්ම සභාව වර්ධනය විය.

ලෝකයා වෙත ශුභාරංචිය ගෙන යෑමට අවශ්‍ය වන්නේ දේශපාලන බලපෑමක් නොවේ. මුල් සභාවට පේතෘස් සිරගෙට යෑම නැවැත්වීමට තරම් බලපෑමක් කළ නොහැකි විය. එහෙත් යාච්ඤාව මගින් සිරගෙයින් එළියට ගැනීමට ප්‍රමාණවත් බලයක් ඔවුන්ට තිබිණි. ලෝකයා දිනාගැනීම සඳහා අවශ්‍ය වන්නේ තව තවත් දේශනා කිරීම නොවේ. මුල් සභාව දවස් ගණනාවක් යාච්ඤා කළේය. දේශනා කළේ මිනිත්තු කීපයකි. එමගින් ආත්ම 3000ක් ගළවා ගැනීමට හැකිවිය (ක්‍රියා 1-2). අද අපි මිනිත්තු දහයක් යාච්ඤා කරන්නෙමු. දින දහයක් පිබිදීම ගැන දේශනා

කරන්නෙමු. අප ගළවාගනු ලබන්නේ තිස් දෙනෙක් පමණි. සේවය වෙනුවෙන් වැඩි මුදලක් වැය කිරීමෙන් ශුභාරංචි පණිවුඩය ලෝකයා වෙත යන බව අපට සහතික කළ නොහැකිය. දේව සේවයේ විවිධ වැඩ කටයුතු සඳහා මුදල් අවශ්‍ය බව සැබෑවක් වුවද අත්‍යවශ්‍යම දෙය එය නොවේ.

යෙරුසලමේ දේවමාලිගාවේ දොරටුව අසලින් පේතෘස් හා යොහන් ගමන් කරමින් සිටින විට කොරෙකු ඔවුන්ගෙන් සිඟමන් ඉල්ලීය. පේතෘස් හා යොහන්ට එසේ දීමට සුළු මුදලක් හෝ නොතිබිණ. එහෙත් ඔවුහු සතු දේ දුන්හ.

> **පේතෘස්ද: රන් රිදී මට නැත; නුමුත් මට ඇති දේ නුඹට දෙමි. නාසරීය යේසුස්වහන්සේගේ නාමයෙන් ඇවිදපන්නැයි කියා ඔහුගේ දකුණත අල්ලා ඔහු නැගිටෙවුවේය. එකෙණෙහිම ඔහුගේ පාද හා ඇස්වට සවි විය.**
>
> **ඔහු පැන නැගී කෙලින් සිට, ඇවිදින්නට පටන් ගත්තේය; ඇවිදිමින්ද, පැන නගිමින්ද දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමින් ද ඔහු ඔවුන් සමග දේවමාලිගාවට ඇතුල් වුණෝය. (ක්‍රියා 3:6-8)**

ඔවුන්ට තිබුණේ යේසුස්වහන්සේගේ නාමයෙන් බලය හා අධිකාරිය වේ. යෙරුසලමට දැනගැනීම සඳහා ඔවුන්ට ප්‍රචාරය කිරීමේ අය වැය වාර්තාවක් නොතිබිණි. ඔවුන්ට මුද්‍රණය කරන ලද අත් පත්‍රිකා හෝ බයිබල් හෝ නොවීය. රූපවාහිනි ජාලයක් නොවීය. එහෙත් ඔවුන්ට බලය තිබිණි. දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීම මගින් මුළු නගරයම ශුභාරංචි පණිවුඩයෙන් කැළඹිණි. (ක්‍රියා 3-4)

දේව රාජ්‍යය පිළිබඳ ශුභාරංචිය වචනයෙන් පමණක්ම නොව බලයක් ද බව මුල් සභාව වටහා ගත්තේය.

> **මක්නිසාද දෙවියන්වහන්සේගේ රාජ්‍යය (ප්‍රකාශවන්නේ) කථාවෙන් නොව බලයෙන්ය. (1 කොරින්ති 4:20)**

## තෝරාගැනීමේ බලය

දෙවියන්වහන්සේ ලෝකය මැවූ විට, විවිධාකාර සතුන් ද මැවූ සේක. උන්වහන්සේ සිවුපාවුන්, මත්ස්‍යයන්, කෘමින් හා පක්ෂීන් මැවූ සේක. (උත්පත්ති 1)

එහෙත් දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨතම මැවිල්ල වූයේ තමන්වහන්සේගේම ස්වරූපයෙන් මවන ලද මිනිසා වේ. සියලුම සතුන් අතුරින් මිනිසා සුවිශේෂී වේ. මන්ද ඔහුට ශරීරයක් ද ප්‍රාණයක් ද ආත්මයක් ද ඇති බැවිනි. ඔහු මවන ලද්දේ ජීවමාන සැබෑ දෙවියන්වහන්සේ සමග සහභාගිකමින් හා නමස්කාරයෙන් යුතුව ජීවත්වීමට වේ. (උත්. 2-3)

මිනිසා සැබවින්ම සැබෑවූ ජීවමාන වූ දෙවියන්වහන්සේගේ හා භාස්කම් කරන පියාණන්වහන්සේගේ සහකාරයා වේ. මිනිසා දෙවියන්වහන්සේගේ හුස්මය සහිතව හා උන්වහන්සේගේ ස්වරූපය ඇතිව මවන ලද අතර වෙනත් කිසිම සත්වයෙකුට වඩා බලයකින් යුක්තය. භාස්කම් කිරීමේ ස්වභාවය මිනිසාගේ ස්වභාවික ස්වභාවය විය යුතුය.

දෙවියන්වහන්සේ මැවූ සියලු සත්වයන් අතුරින් ඉතාමත්ම බලවත් හා බුද්ධිමත් මනස ඇත්තේ මිනිසාට වේ. මිනිසාට තෝරාගැනීමේ බලය ඇත. යහපත හෝ අයහපත හෝ තෝරාගැනීමට පුළුවන. දෙවියන්වහන්සේට හෝ සාතන්ට හෝ කීකරුවීම තෝරා ගැනීමට ඔහුට පුළුවන. ඒදන් උයනේදී සාතන් විසින් මිනිසා පළමුවරට පරීක්ෂා කරනු ලැබූ අවස්ථාවේ අවධානය යොමු වූයේ මෙම තෝරාගැනීමේ බලය වෙතය (උත්පත්ති 3). පව් කිරීමේ වැරදි තෝරාගැනීම නිසා, ආදම් හා ඒවගෙන් මුළු මනුෂ්‍ය සංහතියටම මූලික පාපී ස්වභාවය ලැබී ඇත.

## ආත්මික බලයේ පදනම

සැබෑ ආත්මික බලය අත්දකින්නට නම් මිනිසා දෙවියන්වහන්සේට සේවය කිරීම තෝරාගත යුතුය. සියලු දෙනාම පව්කාරයන් බැවින් සියලු දෙනාටම සමාව අවශ්‍යය.

**මක්නිසාද සියල්ලෝම පව් කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති. (රෝම 3:23)**

කමාව ලැබෙන්නේ පශ්චාතාපවීමෙන් හා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීමෙන්ය.

**අපට පාපය නැතැයි කියමු නම්, අපි අපම රවටා ගනිමු. සැබෑව ද අප තුළ නැත.**

**අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමා කරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර කරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක. (1 යොහන් 1:8-9)**

ආත්මික බලයේ පදනම වන්නේ පාපය පිළිබඳව පාපෝච්චාරණය කිරීම වේ, පාපය නමැති ආත්මික මරණයේ ඔබ සිටිනතාක්කල් ඔබට දෙවියන්වහන්සේගේ බලය අත්දැකීමට නොහැකි වේ.

එක්තරා නගරයක ගෝලයන් දේශනාකරමින් සිටින විට සිමියොන් නැමැත්තෙක් දෙවියන්වහන්සේගේ බලය ක්‍රියාත්මක වනු දුටුවේය. ඔහු පේතෘස්ට මුදල් පිරිනමමින් මෙසේ පැවසීය.

**... යමෙකු පිට මම අත් තබම්ද, ඔහුට ශුද්ධාත්මය ලැබෙන පිණිස මේ බලය මටත් දෙන්න. (ක්‍රියා 8:19)**

පේතෘස් මෙසේ පැවසීය.

**දෙවියන්වහන්සේගේ දීමනාව මුදලට ගන්ට නුඹ සිතූ බැවින් නුඹේ මිල සමග විනාශවේවා. මේ කාරණයෙහි කොටසක්වත් පංගුකාරකමක්වත් නුඹට නැත. මක්නිසාද දෙවියන්වහන්සේ ඉදිරියෙහි නුඹේ සිත හරි නැත.**

**ඒ නිසා නුඹේ සිතේ කල්පනාව නුඹට කමාකරනු ලැබේදෝ කියා බලන පිණිස, නුඹේ මේ දුෂ්ටකම ගැන පශ්චාතාපව, ස්වාමින්වහන්සේට යාච්ඤා කරන්න.**

**මක්නිසාද තික්තකමේ පිතේද අයුතුකම් නැමැති බැම්මේද සිටින බව මට පෙනේ. (ක්‍රියා 8:20-23)**

සැබෑ ආත්මික බලයේ පදනම වන්නේ පශ්චාතාප වීම වේ. පශ්චාතාපවීම පළමුව අත්දැක නොමැති නම් ඔබ කිසි දිනෙක දෙවියන්වහන්සේගේ බලය අත් නොදකිනු ඇත.
පාපයෙන් ගැළවීම ලැබීම, දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කෙරෙන ශ්‍රේෂ්ඨතම ක්‍රමය වේ.

දෙවියන්වහන්සේ, තමන්වහන්සේගේ බලය පාපී භාජනවලට වත් කරන්නේ නැත. තමාගේම ආයාසයෙන් දියුණුවීමට උත්සාහ කරන අය තුළින් උන්වහන්සේ ක්‍රියා කරන්නේ නැත. (මතෙව් 9:16-17) දෙවියන්වහන්සේ තම බලය ප්‍රදර්ශනය කරනු ලබන්නේ පශ්චාතාප වී උන්වහන්සේට සේවය කරන ශුද්ධවූ භාජන තුළිනි.

## පොරොන්දු හිමිකර ගැනීම

ඇදහිලිවතුන්ට ආත්මික බලය දෙන බවට පොරොන්දුවක් ඇත. එහෙත් දෙවියන්වහන්සේගේ පොරොන්දුවලට කොටස් දෙකක් තිබේ.

**පොරොන්දුව:** අන්තර්ගතය පොරොන්දුවේ සැබෑ වචන හා තේරුම වේ.

**එම පොරොන්දුව හිමි කර ගැනීම:** ඔබට අහිමි දෙයක් ඔබට භාවිත කළ නොහැකිය. දෙවියන්වහන්සේගේ පොරොන්දු ඔබගේ ජීවිතයට අදාළ කර ගැනීම සඳහා ඒවා ඔබ ඉල්ලුම් කළ යුතුය.

ඔබ දෙවියන්වහන්සේගේ පොරොන්දු ඉල්ලුම් කරන්නේ කෙසේද? එහි පියවර මෙසේය.

## 1. එසේ කිරීමට ඔබ තෝරාගත යුතුය.

දෙවියන්වහන්සේගේ පොරොන්දු පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ නොසලකා හැරීමට හෝ ඔබට බලය ඇත. බොහෝ දෙනෙක් ආත්මික බලයේ පොරොන්දුව ප්‍රතික්ෂේප කර ඇත්තාහ. එය මුල් සභාවට පමණක් බව ඔවුහු විශ්වාස කරති. අනෙක් අය එය නොසලකා හැර ඇත. ඔවුහු බයිබලයේ සඳහන් පොරොන්දු කියවති. එහෙත් ඒ අනුව ක්‍රියා නොකරති. මොවුන්ට තම ජීවිතයේ දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කෙරෙන්නේ නැත. මක්නිසාද ඔවුන් ඔවුන්ගේම තේරීමේ බලය භාවිත කර ඇති නිසා සහ පොරොන්දුව ඉල්ලීමට අසමත් වූ නිසා වේ.

කුමන අවස්ථාවක හෝ ඔබගේ ජීවිතයේ සාක්ෂාත් නොවූ දේව වචනයේ සඳහන් පොරොන්දුවක් තිබේ නම් ඉන් අදහස් වන්නේ එය අසත්‍ය බව හෝ එය ඔබට නොවන්නක් බව හෝ නොවේ. ඔබගේම අත්දැකීම් මත බයිබලය අර්ථ විවරණය නොකරන්න. දෙවියන්වහන්සේගේ පොරොන්දුවක් ඔබ අත්දැක නොමැති නිසාම එය සත්‍ය වලංගු පොරොන්දුවක් නොවන බවක් අදහස් නොකෙරේ. බලය පිළිබඳ පොරොන්දුව දෙවියන්වහන්සේගේ දීමනාවකි. එහෙත් එය පිළිගැනීමට ඔබ තෝරාගත යුතුය.

## 2. එම මූලධර්ම ඔබ අවබෝධ කරගත යුතුය.

ඕනෑම බයිබලීය පොරොන්දුවක් හිමිකර ගැනීමට එය පදනම් වූ මූලධර්ම ඔබ අවබෝධ කරගත යුතුය. දෙවියන්වහන්සේගේ පොරොන්දු සෑම විටම මිනිසාගේ ප්‍රතිචාරයක් හා සැබැඳි ඇතැම් මූලධර්ම මත පදනම් වේ.
නිදසුනක් වශයෙන් දෙවියන්වහන්සේගේ බොහෝ පොරොන්දු "නම්/එවිට" යන මූලධර්මය මත පදනම් වේ. "ඔබ යම් යම් දේ කරන්නෙහි නම්" එවිට ඔබට පොරොන්දුව ඉටුවේ (මෙම මූලධර්මය සඳහා ද්විතිය කථාව 28, මේ සඳහා බලන්න).

ආත්මික බලයේ පොරොන්දුව අත්දැකීමට නම්, බලය පිළිබඳ බයිබලීය මූලධර්ම ඔබ අවබෝධ කරගත යුතුය. එය සාමාන්‍යයෙන් යම් ආම්පන්නයක් නිවැරදිව භාවිත කරන ආකාරය ඉගෙනීමට ඒ සමග ඇති උපදෙස් පත්‍රිකාව කියවීම හා සාමානය. නැතහොත් යම් කෑමවර්ගයක් පිළියෙල කිරීමට අදාළ වට්ටෝරුව බලනවා වැනිය.

## 3. ඔබ එම මූලධර්ම ව්‍යවහාර කළ යුතුය.

සාමාන්‍ය ලෝකයේ ඔබට යම් කෙනෙක් අගනා තෑග්ගක් දුන්නේ යයි සිතමු. එය භාර ගැනීම හෝ නොගැනීම ඔබගේ තෝරා ගැනීමකි. ඒ සමග උපදෙස් තිබිය හැකිය. ඒ උපදෙස් හොඳින් අවබෝධ කරගැනීමට ඔබට පුළුවන. එහෙත් එම උපදෙස් ඔබ අනුගමනය නොකළහොත්, එම නිපැයුමෙන් ඔබට ප්‍රයෝජනයක් නැත. මෙම පාඨමාලාවෙන් උගන්වනු ලබන බයිබලීය බල පිළිබඳ මූලධර්ම අවබෝධ කර ගැනීම පමණක් ප්‍රමාණවත් නොවේ. එම මූලධර්ම ඔබගේ ජීවිතයට හා සේවයට යොදා ගත යුතු වේ.

## ආශිර්වාදවලින් ඔබ්බට ගොස් බලය ලැබීම

බොහෝ ඇදහිලිවතුන් බලය අත් නොදකින්නේ ඔවුන් ආශිර්වාදවලින් ඔබ්බට නොයන නිසා වේ. ඔවුන් තුළ ශුද්ධාත්මයාණන්වහන්සේ ක්‍රියා කරනු ඔවුන්ට දැනී ඔවුහු මහත් ප්‍රීතියට පත්වෙති. එය ගැයීමෙන්, නැටීමෙන්, කෑ ගැසීමෙන් හෝ ඇඬීමෙන් ප්‍රකාශ කළ හැකිය. දෙවියන්වහන්සේගෙන් ඔවුන් ආශිර්වාද ලබා ඇති අතර ඔවුන් ඊට හැඟීම්බරව ප්‍රතිචාර දක්වා ඇත.

මෙය වරදක් නොවේ. මෙවැනි ආත්මීන අත්දැකීම්වලින් බයිබලය පිරී ඇත. එහෙත් දෙවියන්වහන්සේට අවශ්‍ය උන්වහන්සේගේ සෙනඟ ආශිර්වාදවලින් ඔබ්බට ආත්මික බලය වෙත හැඟීම්වලින් ඔබ්බට එය ප්‍රදර්ශනය කිරීම වෙත ගෙන යෑම වේ.

මෙම සත්‍යතාව පැහැදිලි කෙරෙන කතාන්දරයක් පැරණි ගිවිසුමේ ඇත. එමෙන්ම එය පොරොන්දුවක් හා පොරොන්දුව හිමිකර ගැනීම අතර සබඳතාව ද පැහැදිලි කරයි. ඉශ්රායෙල් ජනතාව මිසරයේ සිට දෙවියන්වහන්සේ පොරොන්දුවූ දේශයට කාන්තාරය තුළින් මාස ගණනාවක් ගමන් කළහ. ඔවුන් පොරොන්දු දේශයේ සීමාවට පැමිණි කල, එම දේශය පරීක්ෂා කර බැලීම

සඳහා මෝසෙස් ඔත්තුකරුවන් යැවීය. ඔවුන්ගෙන් දස දෙනෙක් ගෙන ආවේ සෘණ ප්‍රතිඵල වේ. එම දේශයේ යෝධයින් සිටින බවත් එය හිමිකර ගැනීමට කෙසේවත් ඉශ්‍රායෙල්වරුන්ට නොහැකි බවත් ඔවුහු පැවසූහ. එහි ගොස් දෙවියන්වහන්සේගේ පොරොන්දුව ලෙස එම දේශය හිමිකර ගන්නා ලෙස ඉල්ලා සිටියේ ඔත්තුකරුවන් දෙදෙනෙකුට පමණි.

ඉශ්‍රායෙල් ජනතාව තෝරාගත්තේ සෘණ වාර්තාවලට සවන් දීමටය. එම නිසා, පොරොන්දු දේශයට දින එකොළහකින් යා හැකි තැනක ඔවුන් කූඩාරම් තනාගෙන සිටියද ඒ ගමන යෑමට ඔවුන්ට අවුරුදු හතළිහක් ගත විය. (ද්විතීය කතාව 1:2)

ආශිර්වාද ලබාගත හැකි තැනට දෙවියන්වහන්සේ ඉශ්‍රායෙලය ගෙන ආ සේක. ඔවුහු පොරොන්දු දේශයේ සීමාවේ සිටියහ. සතුරා අල්ලා ගැනීමට අවශ්‍ය දෙවියන්වහන්සේගේ බලය ඔවුන්ට තිබිණි. එහෙත් දෙවියන්වහන්සේගේ බලය ඇතිව ඉදිරියට යෑම ඔවුහු ප්‍රතික්ෂේප කළහ. පොරොන්දුවේ කිසිදු වරදක් නැත. ගැටලුව වූයේ එය හිමිකර ගැනීම ඉශ්‍රායෙලය ප්‍රතික්ෂේප කිරීම වේ.

ඔබගේ ජීවිතයේ ආශිර්වාද ලබා ගැනීමේ ස්ථානයට පැමිණි විට ඔබ නොනැවතිය යුතුය. ඔබ එය බිඳගෙන ආත්මික බලය ඇති තැනට පැමිණිය යුතුය. ඔබ එසේ නොකළහොත් වියළි, බලය රහිත පැවැත්මක් ඇති ආත්මික පාළුකරයක නිරන්තරයෙන්ම ගැවසෙනු ඇත.

ඔබ, ආශිර්වාද ඇති ස්ථානයෙන් ඔබ්බට ආත්මික බල ප්‍රදේශයට යා යුතුය. ඔබ නිරීක්ෂකයෙකු නොව ප්‍රදර්ශකයෙකු බවට ද, සවන් දෙන්නෙකු නොව ක්‍රියාකරන්නෙකු බවට ද පත්විය යුතුය. ඔබ එසේ කළ විට, දෙවියන්වහන්සේගේ බලය සැබෑ ලෙස ගලා යෑම ඔබ අත්දකිනු ඇත. ඔබ මින් පෙර කිසිඳු නුදුටු ජීව බලවේගයක් හා ඔබ තුළ ආලේපයක් අත්දකිනු ඇත. එමෙන්ම ආගමෙන් පසු ජීවිතයක් ඔබ අත්දකිනු ඇත.

## සාමාන්‍ය සෙනඟ

ඔබට නිසි අධ්‍යාපනයක් නොමැති නිසා මෙම බලය අත්දැකිය නොහැකියයි ඔබට සිතෙන්නට පුළුවන. ඇතැම්විට ඔබට යම් නිකායක දේවගැති තනතුරක් ලබා නොතිබිය හැකිය. ඔබ කිතුනු විද්‍යාලයකින් බොහෝ ඈත බයිබල් විද්‍යාල අධ්‍යාපනයක් ලබා ගැනීමට අසීරු ගමක ජීවත්වනවා විය හැකිය. මේ කිසිදු දෙයක් ආත්මික බලය ලබා ගැනීම සඳහා බාධාවක් නොවේ. දෙවියන්වහන්සේ, සාමාන්‍ය මිනිසුන් හා ස්ත්‍රීන් ප්‍රබල ලෙස උන්වහන්සේගේ සේවය උදෙසා භාවිතයට ගත් ආකාරය පිළිබඳ නිදසුන් බොහෝමයකින් බයිබලය පිරී ඇත.

**ආබ්‍රහම්:** බිය වූ නිසා සාරා තම බිරිඳ නොවන බවට බොරු කීවේය. එහෙත් දෙවියන්වහන්සේ ඔහුව ශ්‍රේෂ්ඨ ජාතියක් වූ ඉශ්‍රායෙලයේ නිර්මාතෘවරයා කිරීමට යොදා ගත් සේක.

**මෝසෙස්:** හොඳ කථිකයෙකු නුවූ අතර තරහ ගොස් මිසර ජාතිකයෙකු ඝාතනය කළේය. එහෙත් දෙවියන්වහන්සේ ඔහු පොරොන්දු දේශය කරා මිලියන දෙදහසකට අධික සෙනඟක් සහිත ජාතියකට මඟිපෙන්වීමට යොදාගත් සේක.

**පේතෘස්:** ජලය මත ඇවිදින විට ඔහු ගිලුනේය, සෑම විටම වැරදි දෙය වැරදි තැනක ප්‍රකාශ කළේය. අවසානයේදී යේසුස්වහන්සේව නොදන්නා බව පැවසීය. එහෙත් මේ සාමාන්‍ය මාළු අල්ලන්නා ප්‍රාණ 3000ක් ගැළවීමට තුඩු දුන් බලවන්ත සාක්ෂියක් පෙන්තකොස්ත දිනයේදී දුන්නේය.

**ගිඩියොන්:** ගොයම් පැගීමට බියෙන් සැඟවී සිටි තරුණයෙකු වූ අතර මුළු ජාතියක් ඔවුන්ට පීඩා දෙමින් යටත්කර සිටි අයගෙන් බේරා ගැනීමට කැඳවනු ලැබීය.

**දාවිත් රජතුමා:** කාමමිථ්‍යාචාරයේ යෙදුනේය, වෙනත් කෙනෙකුගේ භාර්යාවක් ගෙන ඒ මිනිසා මරා දැමීමට කටයුතු කළේය. එසේ වුවද ඔහු ඉශ්‍රායෙලයේ ශ්‍රේෂ්ඨතම රජ වූ අතර දෙවියන්වහන්සේගේම හදවතට සමීපවූ මිනිසෙකු ලෙස හැඳින්වීය.

**පේතෘස් හා යොහන්:** දෙදෙනාම දුප්පත් මාළු අල්ලන්නන් වූහ. මිල මුදල් හෝ අධ්‍යාපනයක් හෝ නොතිබිණි. එහෙත් නගර මුළුමණින්ම කැළඹීමට සමත් දෙවියන්වහන්සේගේ සුවකිරීමේ බලය ඔවුන් තුළින් ගලා ගියේය.

**ප්‍රේරිත වූ පාවුල්:** ඔහුගේ ලිපි බලවත් බවත් එහෙත් ශාරීරිකව දුර්වල බවත් කතාවට අදක්ෂ බවත් පැවසේ (2 කොරින්ති 10:10).

**යාකොබ්: ...** රැවටිලිකාරයෙකි, බොරු කියන්නෙකි, කුමන්ත්‍රණකාරයෙකි. එහෙත් දෙවියන්වහන්සේ ඔහුව ස්පර්ශ කළ විට ඔහු "දෙවියන්වහන්සේ ද මිනිසා ද සමග බලය ලත් කුමාරයෙකු" බවට පත්විය.

මෙවැනි අය වෙත දෙවියන්වහන්සේගේ හා මිනිසාගේ ආත්මික බලය පිළිබඳව විශ්වාසවන්තකම තැබිය හැකි නම්, ඔබගේ මානුෂික දුර්වලතා මධ්‍යයේ ඔබට ද එසේ විය හැකිය. දෙවියන්වහන්සේ සාමාන්‍ය මිනිසුන් හා ස්ත්‍රීන් කැඳවා ඔවුන් අධිසාමාන්‍ය අය බවට පත් කරන සේක. ඔබ, ඔබවම දකින ආකාරයට උන්වහන්සේ ඔබව දකින්නේ නැත. ඔබව අනිත් අය දකින ආකාරයට උන්වහන්සේ ඔබව දකින්නේ නැත. දෙවියන්වහන්සේ ඔබව දකින්නේ, ඔබ ආත්මික බලයෙන් පිරවූ විට ඔබ සිටින ආකාරයෙනි. දෙවියන්වහන්සේ සාමාන්‍ය මිනිසුන්, බයිබලයේ ඇති ආකාරයට "මැටි බඳුන්" භාවිත කරන සේක. එවිට "ඒ බලයේ ඉතා උතුම්කම අපට නොව දෙවියන්වහන්සේට අයිති වේ." (2 කොරින්ති 4:7)

## ස්වයං පරීක්ෂණය

1. මතකයෙන් ප්‍රධාන පදය ලියන්න.

2. ආගමේ හා දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීමේ වෙනස කුමක්ද?

3. මෙම පාඩමේ සඳහන් ලෞකික බල ව්‍යුහයන් සමහරක් නම් කරන්න.

4. ලෞකික හා බයිබලීය බල ව්‍යුහයන් අතර වෙනස්කම්, යොමුවීම් ඇතිව පැහැදිලි කරන්න.

5. බලයේ සහ අධිකාරියේ බයිබලීය අර්ථ විග්‍රහය දෙන්න.

6. ආත්මික බලයේ ප්‍රභවයන් වන අධිස්වභාවික බල හඳුනාගන්න.

7. සෑම බයිබලීය පොරොන්දුවකම කොටස් දෙක මොනවාද?

8. දෙවියන්වහන්සේගේ පොරොන්දු හිමිකර ගැනීම සඳහා මෙම පාඩමේ දී ඇති පියවර තුනක් ලැයිස්තුගත කරන්න.

9. ආත්මික බලයේ පදනම වන්නේ.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ පරීක්ෂණ වලට පිළිතුරු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යනය කිරීම සඳහා

1. ආත්මික බලයෙන් පූර්ණ වී ඇති, බයිබලයේ වාර්තාගත පළමු මිනිසා යාකොබ් වේ. ඔහුට දෙවියන්වහන්සේත් මිනිසාත් සමග බලය තැබූ බව කියැවේ. මෙම අත්දැකීම් පිළිබඳව උත්පත්ති 32 හා හොෂෙයා 12:3-4 හි ඇති වාර්තා අධ්‍යයනය කරන්න. මේ කොටස්වලින් ඔබ උගත් දේ සාරාංශ කරන්න.

________________________________________________

________________________________________________

________________________________________________

2. යේසුස්වහන්සේ ලෞකික බලය ප්‍රතික්ෂේප කළ සේක. ලූක් 4:1-13; යොහන් 6:15; හා යොහන් 7:2-6 බලන්න. මේ කොටස්වලින් ඔබ උගත් දේ සාරාංශ කරන්න.

________________________________________________

________________________________________________

________________________________________________

# දෙවන පරිච්ඡේදය

## බලයේ ප්‍රභවය

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- බලයේ ප්‍රභවය හඳුනාගැනීමට
- දෙවියන්වහන්සේ පොළොවේදී උන්වහන්සේගේ බලය එළිදරව් කරන ආකාර අටක් ලයිස්තුගත කිරීමට
- දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ බලය පොළොවේදී එළිදරව් කරන්නේ මන්ද යන්න පැහැදිලි කෙරෙන ශුද්ධලියවිලි යොමුවක් දීමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

> **දෙවියන්වහන්සේ එක්වරක් කී සේක. මම දෙවරක් ඇසීමි; එනම් බලය දෙවියන්වහන්සේට අයිති බවය (ගීතාවලිය 62:11)**

### හැඳින්වීම

බලය පිළිබඳ මූලධර්ම නිවැරදිව අවබෝධ කර ගැනීමට අපි මුල සිටම ආරම්භ කළ යුතුය. බලයේ ප්‍රභවය අප සොයාගත යුතුය. යම් දෙයක ප්‍රභවය එහි ආරම්භය වේ. නැතහොත් එය පටන් ගන්නා ස්ථානයයි. ශුද්ධ බයිබලයෙන් එළිදරව් කෙරෙන සත්‍යවූත් ජීවමානවූත් දෙවියන්වහන්සේ සියලු බලයේ ප්‍රභවය ලෙස මෙම පරිච්ඡේදය ඉදිරිපත් කරයි. දාවිත් මෙසේ ලියා ඇත.

> **දෙවියන්වහන්සේ එක්වරක් කී සේක. මම මෙය දෙවරක් ඇසීමි; එනම් බලය දෙවියන්වහන්සේට අයිති බවය. (ගීතාවලිය 62:11)**

දෙවියන්වහන්සේ යම් දෙයක් නැවත නැවත පවසන්නේ එය ඉතා වැදගත් බැවිනි.

### බලයේ ප්‍රභවය

කිසි දෙයක් පැවැත්මට පෙර දෙවියන්වහන්සේ සිටි සේක. ලෝකයේ හා සියලු ජීවීන්ගේ ආරම්භය උත්පත්ති 1-2 හි වාර්තා වේ. දෙවියන්වහන්සේ ලෝකය මැවුවේ උන්වහන්සේගේ බලයෙනි.

> **උන්වහන්සේ තමන්ගේ බලයෙන් පොළොව සෑදූ සේක. තමන්ගේ ප්‍රඥාවෙන් ලෝකය පිහිටුවා, තමන්ගේ ඥානයෙන් අහස දිගහැරිය සේක. (යෙරමියා 10:12)**

> **මමම මාගේ මහත් බලයෙන්ද දිගුකළ මාගේ හස්තයෙන්ද පොළොව හා පොළොව මතුපිට සිටින මනුෂ්‍යයාත් තිරිසනාත් මැවුවෙමි; මට හරිව පෙනෙන ලෙස මම කැමති අයට එය දෙමි. (යෙරමියා 27:5)**

> **මක්නිසාද සිංහාසන වේවා; ස්වාමිකම් වේවා, අධිපතිකම් වේවා, බල පරාක්‍රම වේවාණි ස්වර්ගවල සහ පොළොවෙහිත් ඇති පෙනෙන්නාවූ දේවල්ද නොපෙනෙන්නාවූ දේවල්ද යන සියල්ල උන්වහන්සේ තුළ මවන ලද්දේය. සියලු දේ උන්වහන්සේ කරණකොටගෙනද උන්වහන්සේ උදෙසාද මවා තිබේ. (කොලොස්සි 1:16)**

දෙවියන්වහන්සේ සියලු දේ මැවූ බැවින් උන්වහන්සේගේ බලයෙන් එපිට කිසි දෙයක් නැත.

**අහෝ ස්වාමිවූ දෙවියන්වහන්ස, ඔබගේ මහත් බලයෙන්ද දිගුකළ ඔබගේ හස්තයෙන්ද ඔබ අහසත් පොළොවත් මැවූ සේක. ඔබට බැරිවූ කිසිදෙයක් නැත්තේය. (යෙරමියා 32:17)**

වර්තමානයේ පවතින සියල්ලෙහි, පිටුපස පවතින බලයෙහි ප්‍රභවය දෙවියන්වහන්සේ වේ.

**ඔබ ප්‍රශංසාවත් ගෞරවයත් බලයත් ලබන්ට වටින තැනන්වහන්සේය. මක්නිසාද ඔබ සියලු දේ මැවූ සේක. ඔබගේ කැමැත්ත නිසා ඒවා තිබුණේය, ඒවා මවන ලද්දේයයි කියති. (එළිදරව් 4:11)**

**මක්නිසාද සියල්ල උන්වහන්සේ කෙරෙන්ය. උන්වහන්සේ කරණකොටගෙනය, උන්වහන්සේ උදෙසාය. උන්වහන්සේට සදාකල්ම මහිමය වේවා. (රෝම 11:36)**

**උන්වහන්සේ දෙවියන්වහන්සේගේ මහන්තත්වයේ ප්‍රභාවයද උන්වහන්සේගේ දේවත්වයේ ස්වරූපයද වනසේක්, තමන්ගේ බලපරාක්‍රමයේ වචනයෙන් සියල්ල දරමින්... (හෙබ්‍රෙව් 1:3)**

සියලු කාලයන් හා සෘතු දෙවියන්වහන්සේගේ බලය යටතේ පවතී.

**පියාණන්වහන්සේ තමන්ගේම බලය යටතේ තබාගත් කාලයන්ද ප්‍රස්තාවන්ද දැනගැනීම නුඹලාට අයිති නැත. (ක්‍රියා 1:7)**

පොළොව හා එහි ඇති සියල්ල ස්වාමීන්වහන්සේට අයත් වේ.

**පොළොව හා එහි සම්පූර්ණත්වයද ලෝකය හා එහි වැසියෝද ස්වාමීන්වහන්සේය. (ගීතාවලිය 24:1)**

අහසත් පොළොවත් හිමි තැනන්වහන්සේ දෙවියන්වහන්සේ ලෙස හැඳින්වෙන බව උත්පත්ති 14:22 හි සඳහන් වේ. යම් දෙයක් හිමි කර ගැනීම යනු ඒ කෙරෙහි බලය තිබීම වේ.

මේ ලෝකයේ බොහෝ රාජ්‍යයන් හා ආණ්ඩු තිබේ. එහෙත් දෙවියන්වහන්සේගේ රාජ්‍යය පරමබලධාරී වේ. මින් අදහස් වන්නේ උන්වහන්සේ සියල්ල පාලනය කරන බවය.

**ස්වාමීන්වහන්සේ තමන් සිංහාසනය ස්වර්ගයෙහි පිහිටෙවූ සේක. උන්වහන්සේගේ රාජ්‍යය ද සියල්ල කෙරෙහි බලපවත්වයි. (ගීතාවලිය 103:19)**

**ස්වාමීන්වහන්ස, මහන්තත්වය ද පරාක්‍රමය ද තේජස ද ජය ද මහිමය ද අයත් ඔබටය. මක්නිසාද ස්වර්ගයෙහිත් පොළොවෙහිත් ඇති සියල්ල ඔබගේය. රාජ්‍යයත් ස්වාමීන්වහන්ස ඔබට අයිතිය. ඔබ සියල්ල කෙරෙහි හිස මෙන් උසස්ව සිටින සේක.**
**වස්තුව ද ගෞරවය ද පැමිණෙන්නේ ඔබගෙන්ය, ඔබ සියල්ල කෙරෙහි ආණ්ඩුකරන බලය ද පරාක්‍රමය ද ඔබගේ අතෙහිය; සියල්ලන් උසස් කරන්ටත් ශක්තිමත් කරන්ටත් බලය තිබෙන්නේ ඔබ අතෙහිය. (1 ලේකම් 29:11-12)**

දෙවියන්වහන්සේ මනුෂ්‍යා මැවූ බැවින්, මනුෂ්‍යයාගේ ආත්මය කෙරෙහි බලය ඇත්තේ උන්වහන්සේට පමණය.

**ප්‍රාණය නවත්වා ගන්න හැටියට ප්‍රාණය කෙරෙහි බලය ඇති කෙනෙක් නැත. මරණයේ දවස කෙරෙහි බලය ඇති කෙනෙකුත් නැත.. (දේශනාකාරයා 8:8)**

මරණයට කැපවූවන් රක්ෂා කිරීමේ බලය දෙවියන්වහන්සේට ඇත.

**හිරකාරයාගේ සුසුම්ලීම ඔබ ඉදිරියට පැමිණේවා; මරණයට කැපවූවන් ඔබගේ බලයේ උතුම්කම ලෙස රක්ෂා කළ මැනව. (ගීතාවලිය 79:11)**

ක්ලාන්තවූවන්ට බලය දෙන්නේ දෙවියන්වහන්සේය.

**උන්වහන්සේ ක්ලාන්ත වූ අයට ශක්තිය දෙන සේක. බලය නැත්තාට සවිය වැඩි කරන සේක. (යෙසායා 40:29)**

**ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේම ස්වකීය සෙනඟට ශක්තියත් බලයත් දෙන සේක. (ගීතාවලිය 68:35)**

මිනිසාගේ බලය හෝ මිනිසාට බලයක් නොමැතිකම හෝ දෙවියන්වහන්සේගේ බලය කෙරෙහි බලපෑමක් ඇති නොකරයි.

**ස්වාමීන්වහන්ස, බලසම්පන්න අයත් බෙලහීන අයත් අතරේ පිහිට වෙන්ට ඔබ හැර කිසිවෙක් නැත්තේය. (2 ලේකම් 14:11)**

මුදවා ගැනීමේ බලය දෙවියන්වහන්සේට ඇත. අවශ්‍ය අවස්ථාවන්හිදී දෙවියන්වහන්සේ අධිස්වභාවිකව සෙනඟ මුදවාගත් වාර්තාවලින් බයිබලය පිරී තිබේ. දානියෙල්ගේ පොතේ ඒ පිළිබඳව හොඳ උදාහරණ දෙකක් ඇත. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සේවකයන් ගිනි උදුනෙන් මුදවාගත් අයුරු දානියෙල් 3 නේ හා සිංහයන්ගෙන් මුදවාගත් අයුරු දානියෙල් 6 ත් කියවා බලන්න.

උන්වහන්සේගේ බලය අසීමිතය;

**ස්වාමින්වහන්සේ ඉවසිලිවන්තව බලයෙන් මහත්ව සිටින සේක. (නාහුම් 1:3)**

උන්වහන්සේගේ බලය උත්කෘෂ්ටය

**සර්වපරාක්‍රමයාණන්වහන්සේ නම් අපට සොයා දැනගන්නට බැරි කෙනෙක්ය; උන්වහන්සේ පරාක්‍රමයෙන් ද යුක්තිය හා සම්පූර්ණ ධර්මිෂ්ඨකමෙන්ද උතුම්ව සිටින සේක... (යෝබ් 37:23)**

දෙවියන්වහන්සේගේ බලය සදාතනිකය. පාවුල්තුමා මෙසේ ලියා ඇත. දෙවියන්වහන්සේ

**කිසිවෙකුට ළඟාවෙන්ට බැරි ආලෝකයෙහි වසන්නාවූ, කිසි මනුෂ්‍යයෙකු විසින් නුදුටුවාවූ දකින්ටත් බැරිවූ තැනන්වහන්සේය .. උන්වහන්සේට ගෞරවයත් සදාකාලයටම පරාක්‍රමයත් වේවා. (1 තිමෝති 6:16)**

බයිබලයේ අවසාන පොතෙහි ස්වර්ගයෙහි සිදුවෙන්නාවූ අනාගත සිදුවීමක් අපි කියවමු.

**දෙවියන්වහන්සේගේ තේජස සහ බලයෙන් නිකුත්වූ ධූමයෙන් දේවමාළිගාව පිරුණේය... (එළිදරව් 15:8)**

**සියලු දේවදූතයෝ .... දෙවියන්වහන්සේට නමස්කාර කරමින්: ආමෙන්, ප්‍රශංසාව ද තේජස ද ප්‍රඥාව ද ස්තුතිය ද ගෞරවය ද බලය ද පරාක්‍රමය ද සදාකාලේටම අපේ දෙවියන්වහන්සේට වේවා. ආමෙන් යයි කීවෝය. (එළිදරව් 7:12)**

**මින්පසු ස්වර්ගයෙහි සිටින මහත් සමූහයෙකුගේ හඬ මෙන් මහත් හඬක් මට ඇසුණේය. ඔවුහු කථාකොට: හාලේලූයා! ගැළවීම ද මහිමය ද බලය ද අපගේ දෙවියන්වහන්සේට අයිතිය. (එළිදරව් 19:1)**

බයිබලය මුල සිට අගටම, නැවත නැවතත් දෙවියන්වහන්සේ බලයේ ප්‍රභවය බව අවධාරණය කරයි.

## දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ බලය එළිදරව් කළ ආකාරය

බයිබලය යනු දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ බලය පොළොවෙහි එළිදරව් කළ ආකාරය පිළිබඳ වාර්තාවකි. දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ බලය එළිදරව් කරන විවිධ ආකාරයන් මෙසේය:

### ස්වභාවධර්මය

දෙවියන්වහන්සේ ස්වභාවධර්මයෙන් තමන්වහන්සේව එළිදරව් කර ඇත. ශාක හා සත්ත්වයන් ද කඳු හෙල් ද ජලාශයන් හා කාන්තාර ද එපමණක් නොව ඉහළින් ඇති ආකාශය ද උන්වහන්සේගේ නිර්මාණාත්මක බලය පිළිබඳ දෘශ්‍යමාන ලකුණු වේ.

> **ස්වාමින්වහන්සේට ප්‍රශංසා කරව්, දෙවියන්වහන්සේගේ ශුද්ධස්ථානයෙහි ද උන්වහන්සේට ප්‍රශංසා කරව්. (ගීතාවලිය 150:1)**

> **උන්වහන්සේ බලය නමැති ඉඟපටියෙන් සැරසුණුසේක්, තමන් ශක්තියෙන් කඳු ස්ථිරකොට පිහිටුවන සේක.**
> **උන්වහන්සේ මුහුදු ඝෝෂාව ද එහි රැළ ඝෝෂාව ද ... සංසිඳුවන සේක. (ගීතාවලිය 65:6-7)**

දෙවියන්වහන්සේ සුළඟ ද, මුහුද හා කඳු ද  වන සේක.

> **උන්වහන්සේ අහසෙහි පෙරදිග සුළඟ හමන්ට සැලැස්වූ සේක. ස්වකීය බලයෙන් දකුණු දිග සුළඟ ගෙනා සේක. (ගීතාවලිය 78:26)**

> **ස්වාමින්වහන්සේගේ මාර්ගය සුළි සුළඟෙහි ද කුණාටුවෙහි ද ඇත්තේය. වළාකුල් උන්වහන්සේගේ පාදවල ධූලිය.  උන්වහන්සේ මුහුදට තරවුකොට, හින්දවා, සියලු ගංගා ද හින්දවන සේක...**
> **කඳු උන්වහන්සේට භයින් වෙවුලති, හෙල්ද දියවෙති, උන්වහන්සේ ඉදිරියෙහි පොළොව ද ලෝකය සහ එහි වාසයකරන සියල්ලෝ ද කම්පා වෙති. (නාහුම් 1:3-5)**

උන්වහන්සේ ස්වභාවධර්මයේ සියලු මූලිකාංග පාලනය කරන සේක.

> **උන්වහන්සේ ස්වකීය හඬ පවත්වන කල, අහසෙහි ජල ඝෝෂාවක් තිබෙයි. උන්වහන්සේ පොළෝ කෙළවරෙන් වලාකුල් නැගී එන්නට සලස්වන සේක. වර්ෂාවට විදුලි සාදන සේක. තමන්ගේ ගබඩාවලින් සුළඟ ගෙනෙන සේක. (යෙරමියා 10:13)**

ස්වභාවික ලෝකයේ දෙවියන්වහන්සේ එළිදරව් වන ආකාරය පිළිබඳව විස්තරාත්මක වාර්තාවක් යෝබ් 38-40 පරිච්ඡේදවල සපයා ඇත. දෙවියන්වහන්සේ, තමන්වහන්සේගේ බලය ඉතා පැහැදිලිව ස්වභාවධර්මය මගින් එළිදරව් කර ඇති බැවින් උන්වහන්සේව විශ්වාස නොකිරීමට කිසිඳු හේතුවක් මනුෂ්‍යයාට නැත.

> **මක්නිසාද ලෝකය මැවූ තැන් පටන් දෙවියන්වහන්සේගේ අදෘශ්‍යමාන දේ වන උන්වහන්සේගේ සදාකාලික වූ බලය හා දෙව්කම මවන ලද දේවලින් තේරුම් ගොස් පැහැදිලි ලෙස පෙනියන්නේය; එබැවින් ඔවුහු නිරුත්තරව සිටිති. (රෝම 1:20)**

## උන්වහන්සේගේ ලිඛිත වචනය

ආරම්භයේ සිට අවසානය දක්වා, දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය, උන්වහන්සේගේ බලය එළිදරව් කරයි. එය ආරම්භ කෙරෙන්නේ මැවීම සඳහා වූ උන්වහන්සේගේ බලයෙනි. එය අවසාන කෙරෙන්නේ විනාශ කිරීමට, විනිශ්චය කිරීමට, හා නැවත මැවීමට ඇති උන්වහන්සේගේ බලයෙනි. උත්පත්ති හා එළිදරව් අතර ඇති දෙවියන්වහන්සේගේ වචනයෙන් මේ ලෝකයෙත්, මනුෂ්‍යයන් තුළත් නිරන්තරයෙන්ම ක්‍රියා කරන උන්වහන්සේගේ බලය පිළිබඳව වාර්තා කර ඇත.

දෙවියන්වහන්සේගේ බලය පෙන්නුම් කෙරෙන්නේ උන්වහන්සේගේ වචනයේ සඳහන් කතාන්දරවලින් පමණක්ම නොවේ; ඒවා පවසන වචන ද ඉතා බලවත්ය.

> **මක්නිසාද දෙවියන්වහන්සේගේ වචනය ජීවමානය, බලවත්ය, කොයිම දෙමුහත් කඩුවකටත් වඩා තියුණුය, ප්‍රාණය හා ආත්මය ද සන්ධි හා ඇටමිදුළුද වෙන් කරන තරමට කාවදින්නේය, සිතේ සිතිවිලි ද අදහස් ද විමසන්නේය. (හෙබ්‍රෙව් 4:12)**

## විනිශ්චය

දෙවියන්වහන්සේගේ විනිශ්චයයන් මගින් උන්වහන්සේගේ බලය එළිදරව් කෙරේ. උන්වහන්සේගේ බලය පළමුව ප්‍රදර්ශනය වූයේ, ආදම් හා ඒව පව් කළ පසු උන්වහන්සේ දෙන ලද විනිශ්චයෙනි. (උත්පත්ති 3)

එය ඊටත් වඩා ප්‍රබල ලෙස එළිදරව් වූයේ නෝවාගේ දවස්වල දෙවියන්වහන්සේ මුළු ලෝකයම ජලගැල්මෙන් විනාශ කළ අවස්ථාවේදිය. (උත්පත්ති 6-9)

බයිබලය යනු පාපය විනිශ්චය කිරීම තුළින් දෙවියන්වහන්සේගේ බලය එළිදරව් කෙරෙන අඛණ්ඩ වාර්තාවකි. මිනිසුන් පව්කළ විට දෙවියන්වහන්සේ ඔවුන්ව විනිශ්චය කළ සේක. එමෙන්ම උන්වහන්සේ දුෂ්ට දේශයන් ද විනිශ්චය කළ සේක. මේ පිළිබඳව විනිශ්චයකාරයන්ගේ පොතේ ද දිවැසිවරුන් ලියා ඇති පොත්වල ද සඳහන් වේ.

දෙවියන්වහන්සේ විනිශ්චයන් දුන් සෑම අවස්ථාවකම එහි පරමාර්ථය උන්වහන්සේගේ බලය පිළිබඳව මිනිසුන් දැනුවත් කිරීම බව උන්වහන්සේ පැහැදිලිවම පෙන්වා ඇත. (නිදසුනක් ලෙස, නික්මයාම 7:17 බලන්න)

## මුදාගැනීම

ඉතිහාසය මුළුල්ලේම, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ බලය විශ්මයජනක ලෙස කරන ලද මුදවාගැනීම් මගින් එළිදරව් කළ සේක.

දෙවියන්වහන්සේ ආදම් හා ඒව විනිශ්චය කළද ඔවුන්ට ගැළවීමේ මාර්ගයක් උන්වහන්සේ සැපයූ සේක (උත්පත්ති 3:15). උන්වහන්සේ දුෂ්ට පොළොව ජල ගැල්මෙන් විනාශ කළ ද ආරක්ෂක නැවක් සැපයූ සේක (උත්පත්ති 6-9).

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ බලයෙන් ඉශ්රායෙල්වරුන් මිසරයේ වහල්බවින් මුදාගත් සේක.

> **උන්වහන්සේ නුඹේ පියවරුන්ට ප්‍රේම කළ බැවින් ඔවුන්ට පසුව ඔවුන්ගේ වංශය තෝරාගෙන, ස්වකීය මහත් බලය කරණකොටගෙන නුඹ මිසරයෙන් පිටතට ගෙනා සේක. (ද්විතීය කථාව 4:37)**

දෙවියන්වහන්සේ විනිශ්චයකාරයන් ද රජවරුන් හා දිවැසිවරුන් ද උපදවා උන්වහන්සේගේ සෙනඟ සතුරන්ගෙන් මුදවා ගැනීමට ඔවුන්ව යොදාගත් සේක. නෙහෙමියා ඉශ්රායෙල් ගැන මෙසේ පවසයි.

> **ඔවුහු වනාහි ඔබගේ මහත් බලයෙන්ද බලවත් හස්තයෙන් ද ඔබ විසින් මුදාගත් ඔබගේ මෙහෙකරුවන් හා සෙනඟත්ය. (නෙහෙමියා 1:10)**

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සෙනඟ මුදාගත් සෑම අවස්ථාවකම, ඒ සඳහා උන්වහන්සේට පරමාර්ථයක් තිබිණි. එම පරමාර්ථය නම් උන්වහන්සේගේ බලය එළිදරව් කිරීම වේ.

> **එසේ වුවත් උන්වහන්සේ තම බලපරාක්‍රමය දක්වන පිණිස ස්වකීය නාමය නිසා ඔවුන් ගැළවූසේක. (ගීතාවලිය 106:8)**

## යේසුස් ක්‍රිස්තුස්වහන්සේ

මිදීම සඳහා වූ දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨතම සැලැස්ම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් එළිදරව් කළ අතර සියලු මනුෂ්‍යයන්ට ගැළවීම උන්වහන්සේ මගින් සදහටම ලබාගත හැකිය.
යේසුස්වහන්සේගේ උපත හා විශ්මයජනක උපත පිළිබඳ දිවැසිවැකි මගින් දෙවියන්වහන්සේගේ බලය එළිදරව් විය. එය ස්වාමින්වහන්සේගේ ජීවිතය, ඉගැන්වීම් හා සේවය මගින් පමණක් නොව උන්වහන්සේගේ මරණයෙන් හා නැවත නැගිටීමෙන් ද පැහැදිලි වේ.
දෙවියන්වහන්සේගේ බලය මහත් සේ එළිදරව්වූයේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළිනි.

> **අපගේ දෙවියන්වහන්සේගේ ගැළවීමද බලයද රාජ්‍යයද තමන් ක්‍රිස්තුස්වහන්සේගේ ආණ්ඩු බලය ද දැන් පැමුණුනේය. මක්නිසාද අපගේ දෙවියන්වහන්සේ ඉදිරිපිට රෑ දවල් අපේ සහෝදරයන්ට වරද තබන්නාවූ, ඔවුන්ගේ වරද තබන්නා පහත හෙළනු ලැබුවේය. (එළිදරව් 12:10)**

දෙවියන්වහන්සේගේ බලය යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් එළිදරව් වූ අන්දම විස්තරාත්මකව ඔබ පාඩමාලාවේ හතරවන පරිච්ඡේදයෙන් අධ්‍යයනය කරන්නෙහිය.

## ශුද්ධාත්මයාණන්වහන්සේ

යේසුස්වහන්සේ උන්වහන්සේගේ අනුගාමිකයන්ට මෙසේ පොරොන්දුවූ සේක.

> **.. ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කළ නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහි ද මුළු යුදයෙහි ද සමාරියෙහි ද පොළොවේ සීමාව දක්වා ද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය. (ක්‍රියා 1:8)**

ක්‍රියා 2, යේසුස්වහන්සේ පොරොන්දු වූ ලෙස දෙවියන්වහන්සේ විසින් එවනු ලැබූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ පැමිණීමේ වාර්තාව වේ. ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් දෙවියන්වහන්සේ උන්වහන්සේගේ බලය නිරන්තරයෙන්ම එළිදරව් කරන සේක. එය සිදුවන ආකාරය, ඔබ මෙම පාඩමාලාව තුළින් ශුද්ධාත්මයාණන්වහන්සේ ගැන හදාරණ විට ඉගෙන ගන්නවා ඇත.

## ආශ්චර්යමත් ලකුණු

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ බලය එළිදරව් කරන්නේ විනිශ්චයෙන් හා තමන්වහන්සේගේ සෙනඟ මුදවාගැනීමෙන් බව දැනටමත් ඉගෙන ගෙන ඇත. එහෙත් දෙවියන්වහන්සේ වෙනත් ආශ්චර්යමත් ක්‍රියා මගින් ද උන්වහන්සේගේ බලය එළිදරව් කරන සේක.
"ආශ්චර්යමත්" යන්නෙහි තේරුම ස්වභාවික ලෝකයේ බලයට ඔබ්බෙන් යන්න වේ. එය මිනිසාගේ බලයෙන් කළ නොහැකි දෙයකි.

දෙවියන්වහන්සේගේ බලය, විශ්මයජනක සුවකිරීම් මගින් ද, යක්ෂාවේශ බලවේග වලින් මුදවා ගැනීම මගින් ද, මළගියවුන් නැවත නැගිටුවීමෙන්ද... එපමණක් නොව අහසින් ගිනි ලැබීමෙන් ද එළිදරව් වී ඇත. මුළු බයිබලයම දෙවියන්වහන්සේ උන්වහන්සේගේ බලය ආශ්චර්යමත් ලකුණු මගින් එළිදරව් කිරීමේ වාර්තාවකි. දෙවියන්වහන්සේගේ බලය අද වුවද එවැනි ලකුණු මගින් එළිදරව් වේ.

## ඇදහිලිවන්තයෝ

එවැනි බලවත් ලකුණු ඇදහිලිවන්තයන් තුළින් දෙවියන්වහන්සේ දක්වන බව යේසුස්වහන්සේ පැවසූ සේක.

> **අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්: ඔවුහු මාගේ නාමයෙන් යක්ෂයන් දුරු කරන්නෝය; අන් භාෂාවලින් කතා කරන්නෝය; සර්පයන් අල්ලා ගන්නෝය; යම් මරණීය වස ජාතියක් බීවත් එයින් කිසිසේත් ඔවුන්ට අනතුරු නොවන්නේය. ඔවුන් රෝගීන් පිට අත් තැබූ කල්හි ඔවුහු සුවය ලබන්නෝය. (මාක් 16:17-18)**

උන්වහන්සේගේ ලිඛිත වචනයේ ආරම්භයේ සිටම, දෙවියන්වහන්සේ මේ ලෝකයේ ක්‍රියා කළේ පිරිමින් හා ස්ත්‍රීන් තුළින් වේ. මවන ලද අනෙකුත් සත්ත්වයන් මෙන් නොව මිනිසාට බලය සඳහා ධාරිතාවක් ඇත. දෙවියන්වහන්සේගේ විනිශ්චය පැමිණියේ නපුරු මිනිසුන් හා ගැහැණුන් මගිනි. ගැළවීම පැමිණියේ භක්තිවන්ත විනිශ්චයකරුවන්, දිවැසිවරුන්, රජවරුන් හා අවසානයේ දී යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළිනි.

දෙවියන්වහන්සේගේ බලය ප්‍රකාශ කිරීමට යේසුස්වහන්සේ මොළොවට පැමිණි විට, උන්වහන්සේ ඉපදුනේ මනුෂ්‍යාකාර ස්ත්‍රියකගෙනි. සියලු කාලයන්හි ශ්‍රේෂ්ඨතම ගැළවීම, පාපයෙන් මිදීම පැමිණියේ මනුෂ්‍යාකාරයෙන් සැදූ කෙනෙකු තුළිනි.

යේසුස්වහන්සේ නැවත ස්වර්ගයට ගිය පසු, දෙවියන්වහන්සේ පොළොවෙහිදී තමන්වහන්සේගේ බලය විද්‍යාමාන කළේ පිරිමින් හා ස්ත්‍රීන් තුළිනි. ක්‍රියා පොත ඇදහිලිවතුන් තුළින් දෙවියන්වහන්සේගේ බලය ක්‍රියාත්මක කිරීමේ වාර්තාවකි.

**ඔවුහු පිටත්ව ගොස් සියලු තැන්වල දේශනා කළෝය. ස්වාමින්වහන්සේ ද ඔවුන් සමග ක්‍රියා කරමින් ඔවුන් අතින් සිදුවූ ලකුණුවලින් වචනය ස්ථිර කළ සේක. (මාක් 16:20)**

දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කරනු ලැබුවේ මිනිසුන්ගේ ජීවිත වෙනස් කළ ශුභාරංචියේ බලයෙනි. එය හාස්කම් හා මුදවාගැනීම් මගින් ප්‍රදර්ශනය කෙරිනි. දුක්විඳීම් හා පීඩාවන් මධ්‍යයේ උන්වහන්සේගේ බලය පෙන්වනු ලැබීය.

කෙදිනක හෝ දෙවියන්වහන්සේ මිනිසෙකු හෝ සේවයක් හෝ නැගිටවූ විට, එය උන්වහන්සේගේ බලය පෙන්වීම සඳහා වේ. දෙවියන්වහන්සේ මෝසෙස්ට මෙසේ පැවසූ සේක.

**සැබවින් මා විසින් නුඹ ආරක්ෂා කළේ නුඹට මාගේ බලයව පෙන්වන පිණිසත් මාගේ නාමය මුළු පොළොවෙහි ප්‍රකාශවන පිණිසත්ය. (නික්මයාම 9:16)**

දෙවියන්වහන්සේ අද වුවද සැබෑ සභාවේ කොටස්කරුවන් වන ඇදහිලිවතුන් මාර්ගයෙන් උන්වහන්සේගේ බලය එළිදරව් කරන සේක. සභාව තුළ සිටින විශේෂ නායකයන් මගින් හා ඇදහිලිවතුන්ට දී ඇති ආත්මික දීමනා තුළින් උන්වහන්සේ තමන්වහන්සේ බලය පෙන්වන සේක. ඔබ මේ පිළිබඳව තවදුරටත් "පවරන ලද අධිකාරී බලය" නමැති පස්වන පරිච්ඡේදයෙන් ඉගෙන ගන්නෙහිය.

## දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ බලය එළිදරව් කරන්නේ මන්ද?

දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ බලය පොළොවෙහි එළිදරව් කරන්නේ මන්ද? උන්වහන්සේ ආශ්චර්යමත් ලකුණු මනුෂ්‍ය වර්ගයාට පෙන්වන්නේ මන්ද? දෙවියන්වහන්සේගේ බලය පොළොවෙහි ක්‍රියා කිරීම සඳහා පරමාර්ථ බොහෝමයක් ඇත. "බලයේ පරමාර්ථය" නමැති හයවන පරිච්ඡේදය මගින් ඔබ මේවා ඉගෙන ගන්නෙහිය.

එහෙත් දෙවියන්වහන්සේගේ බලයේ පරමාර්ථ බොහෝමයක් එක් ප්‍රධාන පරමාර්ථයක් මගින් සාරාංශ කළ හැකිය. ආරම්භයේ සිටම, මෙම පරමාර්ථය වූයේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් පාපී මනුෂ්‍ය වර්ගයා මුදවා ගැනීම වේ. උන්වහන්සේගේ බලය එළිදරව් කිරීමේ පරමාර්ථය යේසුස්වහන්සේ තුළින් සියලුම මනුෂ්‍යයන් උන්වහන්සේ වෙතට ඇද ගැනීම වේ.

**එසේ කළේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ ඒකරාශි කරන්නට තමන්වහන්සේ තුළ අදහස් කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වා දීමෙන්ය. (එපීස 1:9-10)**

**... අපගේ ස්වාමිවූ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ විසින් අභිප්‍රාය කරන ලද සදාකාල අභිප්‍රායේ ප්‍රකාරයටය. (එපීස 3:10)**

## අධිකාරී බලයේ අනෙකුත් මට්ටම්

සියලු බලයේ ප්‍රභවය දෙවියන්වහන්සේ වේ. විශ්වයේ උත්තරීතර හා උසස්තම අධිකාරී බලය උන්වහන්සේය.

වෙනත් මට්ටමේ අධිකාරී බලයයන් දෙවියන්වහන්සේ මෙළොව පිහිටුවා ඇත. උන්වහන්සේ තමන්වහන්සේගේ පුත්‍රයාට, යේසුස් ක්‍රිස්තුස්වහන්සේට අධිකාරී බලය දුන් සේක. ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් ඇදහිලිවතුන්ට උන්වහන්සේ අධිකාරී බලය දෙන සේක. දෙවියන්වහන්සේ සමාජයේත් රජයේත් ව්‍යාපාර තුළත් නිවසේ හා සභාවේත් අධිකාරී බලයේ මට්ටම් පිහිටුවා ඇත. අධිකාරී බලයේ මෙම මට්ටම් වැදගත් වේ. ආත්මික බලයේ මූලධර්ම හොඳින් අවබෝධ කරගැනීමට, දෙවියන්වහන්සේ විසින් පිහිටුවා ඇති අධිකාරී බලයේ ව්‍යුහය ඔබ හඳුනාගත යුතුය. මේ සෑම එකක්ම මෙම පාඨමාලාවෙහි දී ඔබ අධ්‍යයනය කරන්නෙහිය.

එහෙත් පළමුවෙන්, බයිබලයෙන් එළිදරව් කර ඇති වැදගත් සත්‍යයකට ඔබගේ අවධානය යොමු කළ යුතුය. දෙවියන්වහන්සේ බලයේ ප්‍රභවය වුවද උන්වහන්සේගේ අධිකාරී බලයට අභියෝග පැමිනේ . එමෙන්ම උන්වහන්සේ මේ ලෝකයේ පිහිටුවා ඇති අධිකාරී බල මට්ටම් ද

අභියෝගවලට ලක් නොවන්නේ නැත. දෙවියන්වහන්සේගේ අධිකාරී බලයෙන් අභියෝග කෙරෙන නපුරු බලවේග ඇත. එක් අතකින් ඒවා උන්වහන්සේගේ අධිකාරී බලයට තර්ජනයක් නොවේ. එහෙත් කෙසේවුවද ඒවා නිරන්තරයෙන්ම ඒ හා සමග යුද වදී. ඔබ ඔබගේ ජීවිතයට බයිබලීය "බල මූලධර්ම" ඇතුලත් කරගතහොත් මෙම බලවේගයන්ම ඔබට අභියෝග කරනු ඇත. "ව්‍යාජ අභියෝග" නමැති ඊළඟ පරිච්ඡේදය මෙම විෂය ගැන වේ.

## ස්වයං පරීක්ෂණ

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න

______________________________________________

______________________________________________

2. යම් දෙයක "ප්‍රභවය" යනු කුමක්ද?

______________________________________________

3. සියලු බලයන්ගේ ප්‍රභවය කුමක්ද?

______________________________________________

4. දෙවියන්වහන්සේ පොලොවෙහි උන්වහන්සේගේ බලය එළිදරව් කරන ක්‍රම අටක් ලයිස්තුගත කරන්න.

______________________ ______________________

______________________ ______________________

______________________ ______________________

5. මෙම ප්‍රකාශය සත්‍ය ද අසත්‍යය ද? "විශ්වයේ ඇති එකම බලය දෙවියන්වහන්සේය. වෙනත් බල මට්ටම් නැත." මෙම ප්‍රකාශය ______________________

6. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ බලය මෙලොවට එළිදරව් කිරීමේ ප්‍රධාන පරමාර්ථය පැහැදිලි කෙරෙන ශුද්ධලියවිලි පාඨයක් සඳහන් කරන්න.

______________________________________________

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ පරීක්ෂණ වලට පිළිතුරු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. ඉශ්‍රායෙල් ජාතිය පාලනය කළ ශ්‍රේෂ්ඨතම රජතුමා දාවිත් වේ. ඔහු බලයේ ප්‍රභවය දෙවියන්වහන්සේ ලෙස පිළිගත්තේය.

   2 සාමුවෙල් 22:23; ගීතාවලිය 59:11, 16; 62:11; 63:2; 65:6; 68:35; 78:26; 79:11; 90:11; 106:8; 110:3; 111:6; 145:11; 150:1.

   මෙම ශුද්ධ ලියවිලි පාඨ තුළින් ඔබ උගත් දේ සාරාංශ කරන්න.

___

___

2. දෙවියන්වහන්සේගේ බලය හා සබැඳි පෞද්ගලික ආශාවක් දාවිත් පවසා ඇත. ගීතාවලිය 71:18 න් ප්‍රකාශ කර ඇති එම ආශාව කුමක්ද?

___

___

3. ඔබ බයිබලය අධ්‍යයනය කරන අතරතුර දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ බලය පහත සඳහන් ඒවා තුළින් එළිදරව් කරන ආකාරය පිළිබඳව වාර්තාවක් තබා ගන්න.

   ස්වභාව ධර්මය
   විනිශ්චය
   මිදීම
   උන්වහන්සේගේ ලිඛිත වචනය
   යේසුස් ක්‍රිස්තුස්වහන්සේ
   ශුද්ධාත්මයාණන්වහන්සේ
   අධිස්වභාවික ලකුණු
   ඇදහිලිවතුන්

# තෙවන පරිච්ඡේදය

## අභියෝග කරන්නාවූ ව්‍යාජ දේ

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- දෙවියන්වහන්සේගේ සැබෑ බලයේ ව්‍යාජ අභියෝග කරන්නා ලෙස සාතන් හඳුනා ගැනීමට.
- "උසස් තැන්වල ආත්මික දුෂ්ඨකම" යන්නෙහි අදහස පැහැදිලි කිරීමට.
- උසස් තැන්වල ඇති ආත්මික දුෂ්ටකම් මගින් සාතන් දෙවියන්වහන්සේගේ බලය අනුකරණය කරන ආකාරය සාරාංශ කිරීමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**ඒක පුදුමයක් නොවේ; මක්නිසාද සාතන් පවා ආලෝකයේ දූතයෙකුගේ වෙස් ගනියි. එබැවින් ඔහුගේ සේවකයෝ ධර්මිෂ්ඨකමේ සේවකයන්ගේ වෙස් ගනිත් නම් ඒක පුදුමයක් නොවේ; ඔවුන්ගේ අන්තිමය ඔවුන්ගේ ක්‍රියා ලෙස වන්නේය.** (2 කොරින්ති 11:14-15)

### හැඳින්වීම

දෙවියන්වහන්සේ බලයේ ප්‍රභවය බවත් උන්වහන්සේ පොළොවෙහි උන්වහන්සේගේ බලය එළිදරව් කරන ආකාරයත් පසුගිය පරිච්ඡේදයෙන් ඔබ උගත්තෙහිය. එහෙත් දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ බලය අභියෝගයට ලක් නොවන්නේ නොවේ. අද ලෝකයේ බල අරගලයක් තිබේ. එය මස් හා ලේ සහිත යුද්ධයක් නොවේ. එය දෙවියන්වහන්සේට එරෙහිව කැරලිගසන්නා වූ ව්‍යාජ අභියෝග කරන්නෙකුගේ අරගලයකි.

### ව්‍යාජ අභියෝග කරන්නා

සාතන් නිරන්තරයෙන්ම විශ්වයේ පවතින දෙවියන්වහන්සේගේ බලය අභියෝග කරයි. ඔහු දෙවියන්වහන්සේට සැබෑ තර්ජනයක් නොවන නිසා ව්‍යාජ අභියෝග කරන්නෙකු වේ. එය සැමවිටම එසේම නොවීය. සාතන් මුලින් මවනු ලැබුවේ ලූසිෆර් නමැති අලංකාර දේවදූතයෙකු ලෙසය. ඔහුගේ මුල් තත්වය පිළිබඳව එසකියෙල් 28:12-17 හි කියවන්න.

එහෙත් සාතන් දෙවියන්වහන්සේගේ බලය හා අධිකාරිත්වයට එරෙහිව සටන් කළේය. ඔහුට දෙවියන්වහන්සේ බවට පත්විය යුතු විය. ඔබට ඔහුගේ කැරලිගැසීම ගැන එසකියෙල් 28:17 හි සහ යෙසායා 14:12-15 හි කියවිය හැකිය. මෙවැනි කැරලි ගැසීමක් නිසා සාතන්ට පහර දී මරාදැමීමට වුවත් දෙවියන්වහන්සේට කළ හැකිව තිබිණි. එහෙත් උන්වහන්සේ ඒ පළමු සතුරා ඒ ආකාරයෙන් පරාජය කළේ නම් තවත් කැරැල්ලක් ඇති වීමට ඉඩ තිබුණු අතර එවිට ස්වර්ගයේ ඉතිහාසය මෙවැනි කැරලිගැසීම්වලින් අඳුරු වනු ඇත.

ඒ වෙනුවට දෙවියන්වහන්සේ සාතන්ව ස්වර්ගයෙන් පලවා හැර බලය සඳහා වූ ඔහුගේ ඉල්ලීම සම්පූර්ණයෙන්ම පොළොවෙහි දී අත්හදා බැලීමට ඉඩ හැරිය සේක. එමෙන්ම සාතන්ගේ කැරලිවලට සහභාගී වූ අනෙකුත් දේවදූතයන් ද දෙවියන්වහන්සේ පලවා හැරි සේක. ඔවුහු දැන් "යක්ෂයන්" ලෙස හැඳින්වෙන නපුරු දේවදූතයෝ වෙති.

දෙවියන්වහන්සේ පළමු මිනිසා හා ස්ත්‍රිය මැවූ පසු පොළොවෙහි සටන ඇරඹිනි. පළමුවන අභියෝගය ගැන ඔබට උත්පත්ති 3 හි කියවිය හැකිය. ආදම් හා ඒව පාපයට වැටීම, දෙවියන්වහන්සේගේ බලයට හා ආධිපත්‍යයට එරෙහිව කෙරෙන කැරැල්ල හා සම්බන්ධය. ආදම් හා ඒව දෙවියන්වහන්සේ හා සමාන ඥාණයක් සෙවූහ. එවැනි ඥාණයක් සමග බලය ලැබේ.

මේ කාලයේ සිටම, සාතන් පොළොවෙහි වූ දෙවියන්වහන්සේගේ ආධිපත්‍යයට අභියෝග කළේය. පාපය තුළින් සාතන් සෙව්වේ මිනිසුන් දෙවියන්වහන්සේට නොව තමාට පක්ෂපාත වීම වේ. හාවස්ට්ටයිම් ආයතනයේ *"ආත්මික උපක්‍රමික: ආත්මික සටන සඳහා අත්පොත"* යන කෘතියෙහි සාතන් හා නපුර ගැන සාකච්ඡා කෙරේ. යෝජනා කර ඇති අනුපිළිවෙළ අනුව ඔබ මෙම ආයතනයේ පාඨමාලාවන් අධ්‍යයනය කරන්නෙහි නම්, ඔබ මෙම පාඨමාලාව දැනටමත් අධ්‍යයනය කර අවසන් වේ. එසේ නොමැති නම්, මෙම සතුරා තේරුම් ගැනීමටත්, ඔහුගේ බලය පරාජය කිරීමේ ආත්මික උපක්‍රම සෙවීමටත් එය ලබා ගන්නා ලෙස අපි යෝජනා කරමු.

දෙවියන්වහන්සේගේ බලය අභියෝගයට ලක් කෙරෙන සාතන්ගේ එක් ප්‍රධාන ක්‍රමයක් නම් එය අනුකරණය කිරීම වේ. අනුකරණය යනු යම් දෙයක් ඒ ආකාරයෙන්ම කිරීම වන අතර, එමගින් රැවටීමක් සැලසුම්ගතය. උදාහරණයක් වශයෙන් ව්‍යාජ මුදල් නෝට්ටු, සැබෑ නෝට්ටුවල අනුකරණයකි. අපරාධකාරයින් මේවා සැබෑ මුදල් නෝට්ටු ලෙස භාවිත කරමින් අන් අය රවට්ටති.

සාතන්, දෙවියන්වහන්සේගේ බලය අනුකරණය කරයි. මිනිසුන්ව රැවටීම සඳහා ඔහු දෙවියන්වහන්සේගේ බලය ඒ ආකාරයෙන්ම යොදනු ලැබේ. මෙම ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට ඔහු ඔහුගේ දේවදූතයන් (යක්ෂයන්) යොදා ගනී. සාතන් හා ඔහුගේ යක්ෂයින් ඇතැම්විට අයහපත් ලෙස ක්‍රියා කරනු වෙනුවට යහපත් ලෙස ක්‍රියා කරනු ඇත. අපට මෙසේ අවවාද කෙරේ.

> **ඒක පුදුමයක් නොවේ; මක්නිසාද සාතන් පවා ආලෝකයේ දූතයෙකුගේ වෙස් ගනියි. එබැවින් ඔහුගේ සේවකයෝ ධර්මිෂ්ඨකමේ සේවකයන්ගේ වෙස් ගනිත් නම් ඒක පුදුමයක් නොවේ; ඔවුන්ගේ අන්තිමය ඔවුන්ගේ ක්‍රියා ලෙස වන්නේය. (2 කොරින්ති 11:14-15)**

ලෝකයේ සිටින අවසන් දවස්වල, සාතන් විසින් කරනු ලබන මෙම දෙවියන්වහන්සේගේ බලය අනුකරණය වැඩිවනු ඇත. ලකුණු හා පුදුම දේ මගින් ඔහු බොහෝ දෙනෙකුව රවටන්නේය.

> **ඔහුගේ ඊම සාතන්ගේ ක්‍රියා කිරීමේ හැටියට බොරුවූ සියලු ආකාර ආශ්වර්යවලින්ද ලකුණුවලින්ද පුදුමවලින්ද, විනාශ වෙන්නවුන්ට අධර්මිෂ්ඨකමේ සියලු රැවටීම්වලින්ද යුක්ත වේ; මක්නිසාද ගැළවෙන පිණිස ඔවුහු සැබෑකමට ප්‍රේම වීම පිළි නොගත්තෝය.**
> **මේ නිසා සැබෑව විශ්වාස නොකොට අධර්මිෂ්ඨකමට ප්‍රසන්නවූ සියල්ලන්ම විනිශ්චය කරනු ලබන පිණිස, බොරුව විශ්වාස කරන හැටියට දෙවියන්වහන්සේ මුළාවේ ක්‍රියා කිරීමක් ඔවුන්ට එවන සේක. (2 තෙසලෝනික 2:9-11)**

සාතන් ක්‍රියා කරන ආකාරය මෙම ශුද්ධලියවිලි පාඨයෙන් එළිදරව් වේ. ඔහු "සියලු බල හා ලකුණු හා ව්‍යාජ ආශ්වර්යයන්" මගින් දෙවියන්වහන්සේගේ බලය අනුකරණය කරයි. ඔහුගේ රැවටිල්ල සොයා ගත හැකි එකම ක්‍රමය දේව වචනයේ සත්‍යයෙනි.

## අධිපතිකම් හා පරාක්‍රමධාරීන්

> **මක්නිසාද අපේ පොරබැඳීම වනාහි මාංසයට හා රුධිරයට විරුද්ධව නොව, අධිපතිකම්වලටත් පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාරයේ ලෝක මුලාදෑනීන්ටත් ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධවය. (එපීස 6:12)**

දෙවියන්වහන්සේගේ බලයට එරෙහි සාතන්ගේ කැරැල්ලේ ගැටුමෙහි මිනිසා අසු වී සිටී. අපි සාතන්ගේ අදෘශ්‍යමාන බලයේ බල අරගලයක නිරතව සිටින්නෙමු. එහෙත් දෙවියන්වහන්සේගේ බලය "සිංහාසනද, ස්වාමිකම්ද අධිපතිකම්ද බලපරාක්‍රමවලටද" (කොලො 1:16) වඩා වැඩිය. එමෙන්ම "අධිපතිකම්වලටත් පරාක්‍රමධාරීන්ටත්" (එපීස 6:12) වඩා වැඩිය. එහෙත් දෙවියන්වහන්සේගේ බලය අනුකරණය කෙරෙන සාතන්ගේ රැවටිලිකාර බලය පිළිබඳව ඔබ අවදිව සිටීම අවශ්‍යය. ඔබ මේ දේවල් ගැන දැනුවත්ව සිටීම අවශ්‍යය.

# උසස් තැන්වල ඇති ආත්මික දුෂ්ටකම්

පාවුලුතුමා "උසස් තැන්වල ඇති ආත්මික දුෂ්ටකම්" ගැන කතා කරන විට, ඔහු අදහස් කරන්නේ ලෝකයේ ආගමික පද්ධතියට ඊංගා ඇති දුෂ්ට ආත්ම ගැනය. සාතන් තම නපුරු බලවේග සංවිධානය කර ඇත්තේ දෙවියන්වහන්සේගේ සැබෑ සභාවල සංවිධානයන් හා සමානවම වේ. සමහර අවස්ථාවල "සාතන්ගේ සභාව" හෝ "භූත විද්‍යාව" ලෙස හැඳින්වෙන සමූහයක් ඔහුට ඇත. ඔහු සංවිධානාත්මක ආගම්වල ආත්මික "උසස් තැන්වල" නමස්කාර ක්‍රමයක් පිහිටුවා ඇත.

එමෙන්ම "නොදැනුවත්වම රිංගාගත්" (ජුද් 4) දුෂ්ට සෙනඟ තුළින් සාතන් තම පද්ධතිය සැබෑ සභාව අභ්‍යන්තරයේම පිහිටුවා ඇත. සාතන්ට, සභාව තුළම තම බලය ප්‍රදර්ශනය කෙරෙන අනුකරණ කරන්නන් ඇත. එහෙත් එය දෙවියන්වහන්සේගේ බලය නොවේ. ආගමික උසස් තැන්වල සාතන් පිහිටුවා ඇති ව්‍යුහය රැවටිල්ල හා අනුකරණය මත පදනම් වී ඇත.

## සාතන්ට ඔහුගේම ත්‍රිත්වය ඇත.

දෙවියන්වහන්සේ පියාණන්, පුත්‍රයාණන් හා ශුද්ධාත්මයාණන් ඇතුළත් ත්‍රිත්වය වේ. සාතන්ගේ ත්‍රිත්වයේ ඇත්තේ තමා එනම් සාතන්, මෘගයා හා ව්‍යාජ දිවැසිවරු වේ.

## සාතන්ට තමාගේම සභාව තිබේ.

යේසුස්වහන්සේ මූලිකයා වන්නාවූ "ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය" ලෙස හැඳින්වෙන සැබෑ සභාව දෙවියන්වහන්සේ පිහිටුවා ඇත.

> **නුඹලා ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය ද වෙන් වෙන් වශයෙන් එහි අවයවයෝ ද වෙති.**
> **(1 කොරින්ති 12:27)**

"සාතන්ගේ සිනයෝගය" ලෙස හැඳින්වෙන සාතන්ගේම සභාවක් සාතන්ට ඇත.

> **යුදෙව්වන් නොවන නමුත් තුමු යුදෙව්වෝයයි කියන සාතන්ගේ සිනගෝගයක්ව සිටින්නන්ගේ අපහාසය ද දනිමි. (එළිදරව් 2:9)**

"සාතන්ගේ සිනගෝගය" යන නම සැම විටම විවෘතව භාවිත නොකෙරේ. එහෙත් ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සැබෑ ශුභාරංචිය දේශනා නොකෙරෙන ඕනෑම ස්ථානයක ඔහුගේ සිනගෝගය පිහිටුවා ඇත.

## සාතන්ට දේව ධර්මයක් තිබේ

දෙවියන්වහන්සේට දේව ධර්මයක් ඇති අතර, එය උන්වහන්සේගේ ශුද්ධ වූ වචනයෙන් එනම් බයිබලයෙන් එළිදරව් වේ.

> **දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ... ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ.**
> **(2 තිමෝති 3:16)**

සාතන්ගේ දර්ශනය "යක්ෂයින්ගේ දර්ශනය" ලෙස හැඳින්වේ.

> **එහෙත් පසු කාලවලදී සමහරු මුළාකරවන ආත්මයන් ද යක්ෂයන්ගේ ගුරුකම් ද සලකා ඇදහිල්ලෙන් අහක්ව යනවා ඇතැයි ආත්මයාණන්වහන්සේ පැහැදිලි ලෙස කියන සේක.**
> **(1 තිමෝති 4:1)**

යක්ෂයන්ගේ ධර්මය වන්නේ, දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය සමග එකඟ නොවන සත්‍යයක් ලෙස පෙනෙන ඕනෑම ඉගැන්වීමකි.

## සාතන්ට පූජා කිරීමේ ක්‍රමයක් ඇත.

අපවම දෙවියන්වහන්සේට ජීවමාන යාගයක් ලෙස ඔප්පු කරන ලෙස රෝම 12:1 හි අපට පවසා ඇත. මින් අදහස් වන්නේ අප දෙවියන්වහන්සේට පූර්ණ පක්ෂපාති කමින් යුක්තව යටත්විය යුතු බවය. සාතන් ද පූජාකිරීම් ඉල්ලා ඇත.

> **නුමුත් මිථ්‍යාදෘෂ්ටීන් පූජා කරන දේ ඔවුන් පූජා කරන්නේ දෙවියන්වහන්සේට නොව යක්ෂයන්ට යයි කියමි. නුඹලා යක්ෂයන් සමග සහභාගිව සිටිනවාට නොකැමැත්තෙමි. (1 කොරින්ති 10:20)**

සාතන්, ශරීරයෙන්, ප්‍රාණයෙන් හා ආත්මයෙන් පූර්ණ පක්ෂපාතකම බලාපොරොත්තු වේ. සාතන්ගේ සේවයට තමන් විසින්ම කැපවෙන මිනිසුන් හා ස්ත්‍රීන් සිටින සැබෑ පූජාවීමේ සේවයන් තිබේ. මනුෂ්‍ය හා සත්ත්ව ලේ පූජා කිරීමද ඇත.

## සාතන්ට ඔහුගේම සහභාගිකම ඇත.

ශුද්ධ වූ සහභාගිකමේ රොටි හා මිදියුෂ බෙදා ගැනීම යේසුස්වහන්සේ විසින් ආරම්භ කරන ලද අතර එය සියලු මනුෂ්‍ය වර්ගයාගේ පාප උදෙසා උන්වහන්සේගේ කුරුස පූජාව සිහිවීම පිණිස කරන ලද්දකි. (1 කොරින්ති 11:23-24) සාතන් ඔහුගේම සහභාගිකමේ මෙහෙයක් මගින් මෙය අනුකරණය කරයි.

> **නුඹලාට ස්වාමින්වහන්සේගේ කුසලානෙන් ද යක්ෂයන්ගේ කුසලානෙන් ද බොන්ට නුපුළුවන. ස්වාමින්වහන්සේගේ මේසයට ද යක්ෂයන්ගේ මේසයට ද පංගුකාරයන්වන්ට නුඹලාට නුපුළුවන. (1 කොරින්ති 10:21)**

## සාතන්ට සේවකයන් ඇත.

ශුභාරංචිය ප්‍රකාශ කිරීම මගින් තමන්වහන්සේගේ සභාවේ පූජකවරුන් හා දේවගැතිවරුන් වීමට දෙවියන්වහන්සේ ඇතැම් ඇදහිලිවතුන්ව කැඳවා ඇත. ( 1 කොරින්ති 12:28) සාතන්ට ද සේවකයන් ඇත.

> **ඒක පුදුමයක් නොවේ. මක්නිසාද සාතන් පවා ආලෝකයේ දූතයෙකුගේ වෙස් ගනියි. එබැවින් ඔහුගේ සේවකයෝ ධර්මිෂ්ඨකමේ සේවකයන්ගේ වෙස් ගනිත් නම් ඒක පුදුමයක් නොවේ; ඔවුන්ගේ අන්තිමය ඔවුන්ගේ ක්‍රියා ලෙස වන්නේය. (2 කොරින්ති 11:14-15)**

සාතන්ගේ සේවකයෝ ඔහුගේ "ශුභාරංචිය" ප්‍රකාශ කරති. එය ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචියට වෙනස් වේ.

> **සමහරු නුඹලා කලඹා, ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය පෙරළන්ට කැමතිවා මිස ඒක වෙන ශුභාරංචියක් නොවේ.**
> **නුමුත් අප විසින් නුඹලාට ප්‍රකාශ කළ ශුභාරංචිය හැර වෙන ශුභාරංචියක් අපවත් ස්වර්ගයෙන් දේවදූතයෙක්වත් නුඹලාට ප්‍රකාශකරතොත් ඔහු ශාප ලද්දෙක් වේවා. (ගලාති 1:7-8)**

ප්‍රබල ශෛලයකින් පණිවුඩයක් ඉදිරිපත් කළ පමණින්ම එය සැබෑ ශුභාරංචිය පිළිබඳ පණිවුඩයක් වන්නේ නැත.

## සාතන්ට සිංහාසනයක් ඇත.

දෙවියන්වහන්සේට ස්වර්ගයෙහි සිංහාසනයක් ඇත. සාතන්ටට ද සිංහාසනයක් තිබුණ ද එය පිහිටි ස්ථානය පවසා නැත.

> **මා දුටු මෘගයා අඳුන්දිවියෙකුට සමානය; උගේ පාද වළසෙකුගේ පාද වැනිය. උගේ කට සිංහයෙකුගේ කට වැනිය, මහා සර්පයා (සාතන්) තමාගේ පරාක්‍රමයත් තමාගේ සිංහාසනයත් මහත් බලයත් ඌට දුන්නේය. (එළිදරව් 13:2)**

## සාතන්ට නමස්කාර කරන්නන් ඇත.

සැබෑ දෙවිඳුන් නමස්කාර කරන බොහෝ අය සිටිති. සාතන් නමස්කාර කරන්නන් ද ඇත.

> **ඔවුහු මෘගයාටත් නමස්කාර කොට; මෘගයාට සමාන කවුදෑයි ... කීවෝය. (එළිදරව් 13:4)**

සාතන්ට නමස්කාර කරන සමහරු යේසුස්වහන්සේගේ අනුගාමිකයෝ ලෙස පෙනී සිටිති.

> **කෙතනම් ලෝකයය. හොඳ බීජ නම් රාජ්‍යයේ පුත්‍රයෝය; කිරිඳි නම් නපුරන්ගේ පුත්‍රයෝය. ඒවා වපුළ සතුරා නම් යක්ෂයාය. කපන කාලය නම් ලෝකාන්තිමයය; කපන්නෝ නම් දේවදූතයෝය. (මතෙව් 13:38-39)**

සාතන් නරක "බීජ" සමඟ හොඳ "බීජ" (සැබෑ ඇදහිලිවතුන්) කලවම් කරයි.

## සාතන්ට දිවැසිවරු ඇත.

දෙවියන්වහන්සේ දිවැසිවරුන්, එනම් උන්වහන්සේගේ පණිවුඩයක් සෘජුවම සභාව වෙතට ගෙන ඒම සඳහා විශේෂිත ලෙස ආලේප කරන ලද අය, සභාවේ තබා ඇත. (1 කොරින්ති 12:28) සාතන්ට ද ව්‍යාජ දිවැසිවරු ඇත.

> **නොයෙක් බොරු අනාගතවක්තෘවරු නැගිට බොහෝ දෙනෙකු මුළාකරන්නෝය. (මතෙව් 24:11)**

## සාතන්ට ගුරුවරු ඇත.

දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ වචනය අන් අයට පැහැදිලි කිරීම සඳහා ඇතැමුන්ව ගුරුවරුන් ලෙස ආලේප කර ඇත (1 කොරින්ති 12:28). එහෙත් සියලු ගුරුවරුන් දෙවියන්වහන්සේගෙන් නොවේ. සාතන්ට ද ඔහුගේ ධර්මය පතුරුවන ව්‍යාජ ගුරුවරු සිටිති.

> **නුමුත් සෙනඟ අතරේ බොරු ප්‍රොපේතවරු ද සිටියෝය; එලෙසම විනාශක ධර්ම භේද රහසින් උපදවමින් ද තමුන්ම මිලේටගත් ආචාරීන්වහන්සේව එපා කරමින් ද නුමුත් පිටට ශීඝ්‍ර විනාශය පමුණුවන්නාවූ බොරු ගුරුවරු නුඹලා අතරෙන් වන්නෝය. ඔවුන්ගේ සල්ලාලකම් අනුව බොහෝ දෙනෙක් යනවා ඇත; ඔවුන් නිසා සත්‍යතාවේ මාර්ගයට අපහාස පැමිණෙන්නේය.**
> **තණ්හාව නිසා ඔවුන් වංචා වචනවලින් නුඹලා වෙළඳාමක් කර ගන්නවා ඇත. (2 පේතෘස් 2:1-3)**

සාතන්ගේ ගුරුවරු "නින්දා සහගත දුර්මත" එනම් භේද ඇති කරන ව්‍යාජ ඉගැන්වීම් පතුරුවති. ඔවුහු බොරු කියන අතර සත්‍යය හා අසත්‍යය මිශ්‍රකර අසත්‍යයද සත්‍යයක් සේ පෙනෙන සේ ඉදිරිපත් කිරීමට අති දක්ෂයෝ වෙති.

## සාතන්ට ප්‍රේරිතවරු ඇත.

ප්‍රේරිතවරයෙකු යනු ශුභාරංචිය පතුරුවා සභාවන් පිහිටුවන්නෙකු වේ (1 කොරින්ති 12:28). සාතන්ට ද ලොව පුරා ඔහුගේ වැඩ කටයුතු කරන ප්‍රේරිතයෝ සිටිති. සත්‍ය ප්‍රොපේතවරුන්ව අනුකරණය කරමින් ඔවුහු මිනිසුන් රවටති.

> **එබඳු මනුෂ්‍යයෝ බොරු ප්‍රේරිතයෝය. ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේරිතයන්ගේ වෙස්ගන්නාවූ වංචාකාර සේවකයෝය. (2 කොරින්ති 11:13)**

සාතන්ගේ ප්‍රේරිතයෝ ව්‍යාජ ලබ්ධිවල නායකයන් වී සභාවන් තුළට රිංගා ඇතැම්විට සභා නායකයෝ බවට ද පත්වෙති.

## සාතන් ව්‍යාජ ක්‍රිස්තුස්වහන්සේලා නැගිටුවයි.

ව්‍යාජ ක්‍රිස්තුස්වහන්සේලා නැගිටුවමින් සාතන් ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව ද අනුකරණය කර ඇත. යේසුස්වහන්සේ මෙසේ අනතුරු ඇඟවූ සේක.

> **... කිසිවෙක් නුඹලා මුළා නොකරන ලෙස බලාගනිල්ලා. මක්නිසාද බොහෝ දෙනෙක් මම ක්‍රිස්තුස්ය කියා මාගේ නමින් ඇවිත් බොහෝ දෙනෙකු මුළා කරන්නෝය. (මතෙව් 24:4-5)**

මේ ව්‍යාජ ක්‍රිස්තුස්වහන්සේලා යේසුස්වහන්සේගේ නම පාවිච්චි කිරීමට ඉඩ තිබේ. ඔවුන් බොහෝ ලකුණු හා හාස්කම් කරනු ඇත. එහෙත් ඔවුහු දෙවියන්වහන්සේගේ බලය අනුකරණය කරන්නෝ වෙති.

## සාතන්ට සන්නිවේදන පද්ධතියක් තිබේ.

බයිබලය, අතීතයේදී දෙවියන්වහන්සේ මිනිසාට කතාකළ අයුරු සඳහන් වාර්තාවකි. දෙවියන්වහන්සේ අද වුවද මිනිසුන්ට කතා කරන සේක, සාතන් ද මිනිසාට කතා කරයි. ඔහුගේ පළමු වචනවලින් මිනිසා පාපයට වැටුණි (උත්පත්ති 3 පරිච්ඡේදය).

ඇදහිලිවන්තයෝ තම අවශ්‍යතාවන් වෙනුවෙන් දෙවියන්වහන්සේට යාච්ඤා කරති. දෙවියන්වහන්සේ ධර්මිෂ්ඨයන්ගේ යාච්ඤාවලට ප්‍රතිචාර දක්වන සේක (යාකොබ් 5:16). සාතන්ගේ අනුගාමිකයෝ ද ඔහුට යාච්ඤා කරන අතර දුෂ්ට ආත්ම සමඟ පණිවුඩ හුවමාරු කර ගනිති. ඇතැම්විට සාතන් හඬවල් විවිධ දේ සෙලවීම් වැනි අධිස්වභාවික සිදුවීම් මගින් ප්‍රතිචාර දක්වයි. සාතන්ට සැබෑ බලයක් ඇති අතර මෙලොවදී එම බලය දෘශ්‍යමාන ලෙස ප්‍රදර්ශනය කළ හැකිය.

දෙවියන්වහන්සේ තම ලිඛිත වචනය වන බයිබලයෙන් මිනිසාට සන්නිවේදනය කර ඇත. සාතන්ගේ පණිවුඩය ද අසභ්‍ය සඟරා, පොත්, චිත්‍රපට හා සංගීතය ද වැනි ලිඛිත වචනවලින් සන්නිවේදනය වේ. ලිඛිත හා වාචික වචනය මගින් කෙරෙන දෙවියන්වහන්සේගේ සන්නිවේදනයෙන් මිනිසාගේ එදිනෙදා ජීවිතයට මඟපෙන්වීම් ලැබේ.

පහත දැක්වෙන ආකාරයේ ක්‍රම මගින් ව්‍යාජ මඟපෙන්වීම් සාක්ෂාත් කරගන්නා පද්ධතියක් සාතන්ට ඇත.

**නක්ෂත්‍රය හා කේන්ද්‍රය**: ඉදිරි සිදුවීම් පෙරයුම් කිරීමට හා මඟපෙන්වීමක් ලබාදීමට මෙහිදී තාරකා භාවිත කෙරේ.

### තේ ගස්වල පත්‍ර, පින්තූර, හිසේ ඇති ඉදිමුම්, අල්ලේ රේඛා හා පළිඟු කැට කියවීම

තේ ගසේ පත්‍ර සැදී ඇති ආකාරය, මනුෂ්‍යයාගේ අල්ලේ ඇති රේඛා, පළිඟු කැට හා පින්තූර ආදියේ මඟපෙන්වීම් ඇතැයි පවසනු ලැබේ.

**හූනියම්:** වශී ගුරුකම්, බන්ධන, පිළිවෙත්, ජේනකිම්, අන්ජනම් එළි, දර්ශන ආදී බයිබලයට පටහැනි ක්‍රම මඟපෙන්වීම් ලබා ගැනීමට භාවිත කෙරේ.

## සාතන්ට අධි ස්වභාවික බලයක් ඇත.

යේසුස්වහන්සේ උන්වහන්සේගේ අනුගාමිකයන්ට පොරොන්දු වූයේ ශුද්ධාත්මයාණන් ඔවුන් පිරුණු පසු ඔවුන්ට අධිස්වභාවික බලයක් ලැබෙන බව වේ (ක්‍රියා 1:8). සාතන්ද අධිස්වභාවික බලයක් හා ආධිපත්‍යයක් ලබා දෙයි (එළිදරව් 13:2). ඔහුගේ යක්ෂයෝ අධිස්වභාවික බලයක් හා ශක්තියක් මවති. සාතන් යේසුස්වහන්සේ මෙන්, බලය ද අධිකාරීත්වය ද දෙන්නේය (එළිදරව් 13:2). සාතන්ට බොහෝ අධිස්වභාවික ලකුණු හා හාස්කම් කළ හැකිය.

> **ඔවුන් ... හාස්කම් කරන්නාවූ යක්ෂයන්ගේ ආත්මයෝය. (එළිදරව් 16:14)**

යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක.

> **ස්වාමිනි, ස්වාමිනි ඔබගේ නාමයෙන් අනාගත වචන නොකියෙමුද? ඔබගේ නාමයෙන් යක්ෂයන් දුරු නොකෙළෙමුද? ඔබගේ නාමයෙන් නොයෙක් බලවත් ක්‍රියා නොකෙළෙමුද,?යි මට කියනවා ඇත.**

**එවිට මම: කිසි කලෙකත් නුඹලා නොහැඳින්නෙමි, අධර්මිෂ්ඨකම් කරන්නෙනි මා කෙරෙන් අහක්ව පලයල්ලා යයි ඔවුන්ට කියන්නෙමි. (මතෙව් 7:22-23)**

"කිසිකලෙකත් නුඹලා නොහැඳින්නෙමි" යි යේසුස්වහන්සේ පැවසූ සේක. මේ මිනිසුන්ගේ සිත් ගන්නා සුළු ලෙස පෙන්වූ බලය කිසි දිනෙක දෙවියන්වහන්සේගෙන් නොවිය. ඒවා රැවටිලිකාර අනුකරණයන් විය.

## ශ්‍රේෂ්ඨ බලය

සාතන් සැබවින්ම අභියෝගාත්මක ලෙස අනුකරණය කරන්නෙකි. ඔහුට බලවත් සංවිධානයක් ඇත. ඔහුගේ අනුගාමිකයන්ට බලවත් ක්‍රියා කළ හැකිය. ඔහුගේ බලය ගැන යේසුස්වහන්සේ අනතුරු ඇඟවූ සේක.

**නුමුත් නුඹලා භයවිය යුතු කාටදැයි නුඹලාට පෙන්වමි. නැසුවායින් පසු නිරයෙහි හෙළන්ට බලය ඇත්තාවූ තැනැන්වහන්සේට භය වෙයල්ලා; එසේය උන්වහන්සේට භය වෙයල්ලායයි නුඹලාට කියමි. ^ලූක් 12:5&**

එහෙත් දෙවියන්වහන්සේට වඩාත් බලයක් ඇත. යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක.

**ලෝකයෙහි සිටින තැනැත්තාට වඩා නුඹලා තුළ සිටින තැනැන්වහන්සේ උතුම් බැවින්, නුඹලා ඔවුන්ගෙන් ජයගෙන සිටින්නෝය. (1 යොහන් 4:4)**

සාතන්ගේ දුෂ්ට ක්‍රියාවන් විනාශ කිරීමට යේසුස්වහන්සේ, වඩා බලයක් හා අධිකාරිත්වයක් ඇතිව පැමිණි ආකාරය ගැන ඔබ ඊළඟ පරිච්ඡේදයෙන් ඉගෙන ගන්නෙහිය. සතුරාගේ සියලු බලයන්ට ඉහළින් යේසුස්වහන්සේ ඇදහිලිවතුන්ට බලය පැවරූ ආකාරය ඉදිරි පරිච්ඡේදවලින් ඔබ ඉගෙන ගන්නෙහිය.

## අභියෝග කරන රැවටිලිකරුට මුහුණ දීම

අභියෝගී කරන රැවටිලිකරුගේ බලයට මුහුණ දීම සඳහා බයිබලීය මාර්ගෝපදේශ සමහරක් මෙසේ වේ.

### අනුකරණය කරන්නෙකු ලෙස සාතන් හඳුනාගන්න.

සාතන්ගේ බලය පරාජය කෙරෙන පළමු පියවර වන්නේ සාතන්, දෙවියන්වහන්සේගේ බලය අනුකරණය කරන බව හැඳිනගැනීම වේ.

### විමසා බැලීමේ හැකියාව භාවිත කරන්න.

ආත්මයන් විමසා බැලීම ලෙස හැඳන්වෙන ශුද්ධාත්මයාණන්වහන්සේගේ විශේෂ දීමනාවක් ඇත. එය තවත් කෙනෙකුගේ ආත්මය සැණෙකින් විමසා බලා නිර්ණය කිරීම සඳහා දෙවියන්වහන්සේ දී ඇති විශේෂ හැකියාවක් වන අතර එමගින් ආත්මය යහපත් ද අයහපත් දැයි දැනගත හැකිය. ඔබට මෙම ආත්මික දීමනාව තිබේනම් එය, මිනිසුන්ගේ ආත්මයන් දෙවියන්වහන්සේගෙන් ද නැතහොත් සාතන්ගෙන්දැයි තිරණය කිරීමට භාවිත කරන්න.

ඔබට මෙම දීමනාව නොමැතිනම්, එය සොයාගැනීමේ වෙනත් ක්‍රම දෙවියන්වහන්සේ දී ඇත. 2 ජේතෘස් 2 හි හා යූද් පොතෙහි දූෂිත ආත්ම ඇති මිනිසුන්ගේ ගති ලක්ෂණ ඔබගේ ප්‍රයෝජනය සඳහා ලැයිස්තුගත කර ඇත. යම් කෙනෙක් කෙතරම් ආත්මික බවක් හෝ බලගතුබවක් හෝ පෙන්නුව ද ඔහුව දෙවියන්වහන්සේගේ වචනය පදනම් කරගෙන ඇගයීමට ලක් කරන්න.

### අධිස්වභාවිකත්වය එහි ඵලයෙන් ඇගයීමට ලක් කරන්න.

සාතන්, දෙවියන්වහන්සේගේ බලය, හාස්කම් ලකුණු හා විශ්මයජනක දේ අධිස්වභාවික පෙන්නුම් කිරීම් මගින් අනුකරණය කරන බැවින් දෙවියන්වහන්සේ සේවාවන් ඇගයීමට මාර්ගයක් සපයා ඇත. යේසුස්වහන්සේ මිනිසුන් පළතුරු ගස්වලට සම කළ සේක.

**හොඳ ගහක නරක එලවත් නරක ගහක හොඳ පලවත් හටගන්නට බැරිය. එබැවින් ඔවුන්ගේ එලවලින් නුඹලා ඔවුන් ඇඳිනගන්නහුය. (මතෙව් 7:18,20).**

ආත්මික දීමනා හා දෙවියන්වහන්සේගේ බලය අනුකරණය කිරීමට සාතන්ට පුළුවන. එහෙත් ඔහුට පහත දැක්වෙන දේ ද අයත්වන ශුද්ධ ජීවිතයක් සඳහා වූ ශුද්ධාත්මයාණන්ගේ එල අනුකරණය කළ නොහැකිය.

**... ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම, විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියා කිරීම ... (ගලාති 5:22-23)**

සේවය, ඇගයීම සඳහා බලය අධිස්වභාවික ලෙස ප්‍රකාශකිරීම නොව ආත්මික එල භාවිත කරන්න.

## දේව වචනය අධ්‍යයනය කරන්න

සාතන්ට අයත් ගුරුවරුන්ගේ, ප්‍රේරිතවරුන්ගේ දිවැසිවරුන්ගේ හා සේවාවන්ගේ ව්‍යාජ ඉගැන්වීම් හඳුනාගැනීමට, දේව වචනයේ උගන්වා ඇති දේ ඔබ දත යුතුය. පාවුලුතුමා තිමෝතිට මෙසේ පැවසිය.

**සැබෑවේ වචනය හරි ආකාර පහදා දෙන්නාවූ, ලජ්ජාවෙන්ට ඕනෑ නැත්තාවූ වැඩ කාරයෙක්ව, දෙවියන්වහන්සේට ඒත්තු වුණාවූ කෙනෙකු මෙන් පෙනෙන්නට උත්සාහ කරන්න (2 තිමෝති 2:15).**

පාවුලුතුමා මුල් සභාවේ ශ්‍රේෂ්ඨ ආත්මික නායකයෙකු වුවද බෙරියා නගරයේ සිටි ඇදහිලිවන්තයෝ ඔහු පැවසූ සෑම දෙයක්ම දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය හා සසඳා බැලූහ.

**ඔවුහු තෙසලෝනිකයෙහි අයවලුන්ට වඩා උතුම් වූවෝය. මක්නිසාද ඔවුහු මේ කාරණා මෙසේදැයි දැනගන්නා පිණිස දවස් පතා ලියවිලි සොයමින් සිතේ මුළු කැමැත්තෙන් වචනය පිළිගත්තෝය. (ක්‍රියා 17:11)**

සාතන්ගේ බලයෙන් රැවටීමට අසු නොවන පිණිස, උගන්වනු ලබන සෑම දෙයක්ම දේව වචනය සමග පරීක්ෂා කර බලන්න. බලවත් ධර්මයෙන් උගන්වන හෝ ලකුණු හා විශ්මයජනක දේ පෙන්වන හෝ අයගේ ජීවිත ඇගයීමට ලක් කරන්න.

දේව වචනය හා සුසංගත නොවන කිසිඳු ඉගැන්වීමක්, ධර්මයක්, එළිදරව් කිරීමක් නැතහොත් භාස්කමක් පිළි නොගන්න. සාතන්ගේ බලය බොහෝවිට "නව සත්‍යයේ විශේෂ එළිදරව්වීම" ලෙස හැඳින්වෙන දෙය තුළින් ඇදහිලිවතුන්ව ආකර්ෂණය කෙරේ. මිනිස්සු විශේෂ සිහින, දේවදූතයන් පහළවීම, දර්ශන, හඬ හෝ වෙනත් අධිස්වභාවික සිද්ධීන් දැක ඇතැයි පවසති. එහෙත් පාවුලුතුමා මෙසේ අනතුරු ඇඟවීය.

**... සමහරු නුඹලා කළඹා, ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය පෙරළන්ට කැමතිවා මිස, ඒක වෙන ශුභාරංචියක් නොවේ. නුමුත් අප විසින් නුඹලාට ප්‍රකාශ කළ ශුභාරංචිය හැර වෙන ශුභාරංචියක් අපවත් ස්වර්ගයෙන් දේවදූතයන්වත් නුඹලාට ප්‍රකාශ කරතොත් ඔහු ශාපලද්දෙක් වේවා. (ගලාති 1:7-8)**

ඇදහිල්ල සමග නිවැරදි සබඳතාවක් නොමැති (රෝම 12:6) හා ඉටු නොවන (ද්විතීය කථාව 18:22) දිවැසිවැකි යයි පවසන කිසිවක් පිළි නොගන්න. එමෙන්ම ඔබ දෙවියන්වහන්සේගෙන් හා උන්වහන්සේගේ වචනයෙන් ඈත් කෙරෙන කිසිඳු එළිදරව් වීමක් පිළි නොගන්න. (ද්විතීය කතාව 13:1-5)

**ප්‍රඥාවේ මාර්ගයෙන් මුළාව යන මනුෂ්‍යයා මළවුන්ගේ සමාගමේ වන්නේය.
(හිතෝපදේශ 21:16)**

## සෑම සාතනික බලපෑමක්ම මඟ හරින්න

ඕනෑම ආකාරයේ සාතනික බලපෑමකින් මඟහරින ලෙස දෙවියන්වහන්සේ පැවසීය.

> **... ඔවුන්ගේ සියලු රූප සහිතවූ කැටයම් ගල්ද ඔවුන්ගේ සියලු වාත්තු පිළිම ද නැතිකර දමා ඔවුන්ගේ සියලු උස්තැන් නටබුන් කරන්න (ගණන් කතාව 33:52).**

දෙවියන්වහන්සේ දුන් අමතර උපදෙස් ද්විතිය කථාව 18:9-14 හි කියවන්න. සාතන්ගේ ඕනෑම ආකාරයක ක්‍රියාවන් සමග කිසිඳු සබඳතාවක් ඉශ්රායෙල් තබා නොගත යුතු වේ.

හූනියම් හෝ යක්ෂයාගේ ක්‍රියාවන් හෝ සමග ඔබට ඇති සියලු සබඳතා විනාශ කරන්න. මේවාට පිළිම, වශිකරණ, යන්ත්‍ර, පළිඟු කැට, ජේනකීම් ආදී සියල්ල අයත් වේ. දෙවියන්වහන්සේ මහිමයට පත් නොකරන සියලුම ලියකියවිලි හා සංගීත විනාශ කරන්න. අලුත් ගිවිසුමේ මිනිසුන් ඔවුන් ඇදහිලිවන්තයන් වූ විට කළේ මේ දේ වේ.

> **යන්ත්‍ර මන්ත්‍ර අභ්‍යාස කළ බොහෝ දෙනෙක් ද තමුන්ගේ පොත් එක්කොට ගෙනැවිත් සියල්ලන් ඉදිරියෙහි පුළුස්සා දැමුවෝය. ඒවායේ මිල ගණන් බලා රිදී මිල පණසේ දහසක් බව දැනගත්තෝය. (ක්‍රියා 19:19)**

නපුරු බලපෑම් ඇති කිසි තැනක කාලය ගත නොකරන්න. දෙවියන්වහන්සේ, තමන්වහන්සේවම ප්‍රකාශ කළේ පැරණි ගිවිසුමේ සඳහන් දේවමාලිගාව හා පෙන්තකොස්ත දිනයේ එක් නිවෙසක උඩුමහල් කාමරයක වැනි විශේෂ ස්ථානවල බව බයිබලයේ සඳහන් වේ. ඒ ආකාරයෙන්ම සාතන්ගේ බලය යක්ෂයාට කැප කළ විශේෂ ස්ථානවල ප්‍රකාශ විය හැකිය. මේවා අතර අසභ්‍ය පින්තූරු ඇති තැන්, මත්පැන් පානය කරන හා කලකෝලහාල කරන තැන්, මළවුන් සමඟ කතා කරන්නේයයි විශ්වාස කරන තැන්, සාතන්ට නමස්කාර කරන තැන් වැනි පාපි ක්‍රියාවන් සිදුවන තැන් වේ. එවැනි වටපිටාවන් මග හරින්න, මන්ද ඒ තැන්වල විශේෂයෙන්ම සාතන්ගේ බලය ප්‍රබලය. ඔබට "අප පරීක්ෂාවට නොපමුණුවන්නැ"යි යාච්ඤා කර ඉන්පසු එවැනි තැන්වල සිටිය නොහැකිය.

> **නුඹලා යක්ෂයන් සමග සහභාගිව සිටිනවාට නොකැමැත්තෙමි (1 කොරින්ති 10:20).**

ව්‍යාජ නායකයන්, ගුරුවරුන්, දිවැසිවරයන්, දේවගැතිවරුන් හෝ ප්‍රේරිතයන් සමග සමාගම් නොපවත්වන්න.

> **සියලු අන්දමේ නපුරෙන් වැළකියල්ලා (1 තෙසලෝනික 5:22)**

## දෙවියන්වහන්සේගේ බලය සාතන්ගේ බලයට වඩා වැඩි බව පිළිගන්න

දෙවියන්වහන්සේගේ සංවිධානය, සැබෑ සභාව, සාතන්ගේ ඒවාට වඩා බලවත්ය.

> **(දෙවියන්වහන්සේ) සියලු දේවල් උන්වහන්සේගේ (යේසුස්වහන්සේගේ) පාදවලට යටත්කොට, සභාව උදෙසා සියල්ලට ප්‍රධානියා වෙන්ට උන්වහන්සේ නියම කළ සේක. ඒ සභාව නම් ... උන්වහන්සේගේ (යේසුස්වහන්සේගේ) ශරීරයය. (එපීස 1:22-23)**

> **ස්වර්ගිය ස්ථානවල අධිපතීන්ටත් බලධාරීන්ටත් මේ කාලයෙහි සභාව කරණකොටගෙන උන්වහන්සේගේ අනේකවිධ ප්‍රඥාව දැනගන්ට ලැබෙන පිණිසය. (එපීස 3:10)**

සභාවේ හිස යේසුස්වහන්සේ වේ. ඇදහිලිවන්තයෝ ශරීරය වෙති. සියලු දේ (සාතන් හා ඔහුගේ ආගමික ව්‍යුහය ඇතුළුව) යේසුස්වහන්සේගේ පාද යට තිබේ නම් ඒවා අපගේ පාද යටද විය යුතුය. මන්ද අප ශරීරය බැවිනි. "පාද යට" යන්නෙන් අදහස් වන්නේ ඒවා දෙවියන්වහන්සේ අපට පවරා ඇති බලය හා අධිකාරිත්වය යටතේ ඇති බවය.

"සතුරාගේ මුළු ශක්තිය" (ලූක් 10:19) මැඩ පැවැත්වීමේ බලය අපට ඇතැයි යේසුස්වහන්සේ පැවසූ සේක. උස් තැන්වල ඇති ආත්මික දුෂ්ටකම් මීට අයත් වේ. සාතන් හා ඔහුගේ සේනාව

දෙවියන්වහන්සේගේ බලයට අභියෝග කරති. එහෙත් ඔවුන් උන්වහන්සේට හෝ උන්වහන්සේගේ සෙනඟට හෝ තර්ජනයක් නොවේ. සභාව සැබවින්ම මේ අධිපතීන්ට හා බලධාරීන්ට දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කළ යුතුය.

## බයිබලීය බල මූලධර්මයන් ඉගෙනගන්න

මෙම පාඨමාලාවෙහි ඔබ බයිබලීය මූලධර්මයන් ඉගෙන ගන්නෙහිය. ඔබ දෙවියන්වහන්සේගේ බලයේ මූලධර්ම අවබෝධ කර ගන්නෙහි නම්, සාතන්ගේ ව්‍යාජ අනුකරණවලින් ඔබ රැවටෙන්නේ නැත.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "උස්තැන්වල ආත්මික දුෂ්ටකම" යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

3. උස්තැන්වල ආත්මික දුෂ්ටකම මගින් සාතන්, දෙවියන්වහන්සේගේ බලය ව්‍යාජ ලෙස අනුකරණය කිරීම පිළිබඳව ඔබට මතක සියලු දේ සාරාංශ කරන්න.

4. අභියෝගිකරන අනුකරණය කරන තැනැත්තා පරාජය කිරීමට මෙම පරිච්ඡේදයේ දී ඇති බයිබලීය උපක්‍රමික අටක් ලැයිස්තුගත කරන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ පරීක්ෂණ වලට පිළිතුරු සපයා ඇත)

## තව දුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. 2 පේතෘස් 2 වන පරිච්ඡේදය හා යූද් පොත අධ්‍යයනය කරන්න. මෙම පරිච්ඡේද සභාවේ සාතන්ව අනුකරණය කරන්නන් සොයා ගැනීමට උපකාරී වනු ඇත.

2. *"ආත්මික උපක්‍රමික: ආත්මික සටන සඳහා අත්පොත"* නමැති හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාව ලබාගන්න. එය ඔබට අභියෝගාත්මක අනුකරණය කරන්නා පිළිබඳව වැඩිපුර ඉගෙනීමට උපකාරී වන අතර ඔහුගේ බලය පරාජය කිරීමට සුවිශේෂී උපක්‍රම සපයනු ඇත.

3. දෙවියන්වහන්සේගේ බලය අනුකරණය කරන්නෙකු වශයෙන්, සාතන් අද ලෝකයා රැවටීමට මාර්ග සොයයි. "රැවටීම" යනු වැරදි මාර්ගයක් පෙන්වීම හෝ සත්‍ය නොවන දෙයක් පිළිගැනීමට යම් කෙනෙකුව පෙළඹවීම වේ.
   - සාතන් පුද්ගයන් පමණක් නොව ජාතීන් ද රවටයි. එළිදරව් 20:8-10.
   - "අධර්මිෂ්ඨකමේ සියලු රැවටිලි" සමග සාතන් ක්‍රියා කරයි. 2 තෙසලෝනික 2:10
   - රැවටිලිකාරකම වර්ධනය වන බවට අපට අනතුරු අඟවා ඇත. 2 තිමෝති 3:13
   - රැවටිලිකාරකම වර්ධනය වන නිසා ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පැමිණීම ගැන දැනුවත්ව සිටින ලෙස අපට උපදෙස් ලැබී ඇත. මතෙව් 24; මාක් 13; 2 තෙසලෝනික 2:3
   - රැවටීම උදෙසා සාතන් යොදා ගන්නා අය ගැන අපට අනතුරු අඟවා ඇත. 2 කොරින්ති 11:13; තීතස් 1:10; 2 පේතෘස් 2:13; 2 යොහන් 7
   - මිනිසාගේ සිත රැවටිලිකාරය. යෙරමියා 17:9
   - ගැළවීම නොලත් සෑම මනුෂ්‍යයෙක්ම රැවටී ඇත. 2 කොරින්ති 4:4; හෙබ්‍රෙව් 3:13;
   - දේව වචනය හා එකඟ නොවන රැවටිලිකාර "සාධාරණ කතා" පිළිනොගන්න. රෝම 16:18; 2 කොරින්ති 4:2.
   - ඔබ නොවටිනා දර්ශනවලට සවන් දුනහොත්: කොලොස්සි 2:8
   - ඔබ පොහොසත්කම කෙරෙහි විශ්වාසය තබා මාංශයේ තෘෂ්ණාවලට ඉඩ දුනහොත්: මතෙව් 13:22; මාක් 4:19; එපීස 4:22;
   - ඔබ දේව වචනය අසන්නෙක් මිස පිළිපදින්නෙක් නුවුවහොත්: යාකොබ් 1:22
   - ඔබ, ඔබට පාපය නැතැයි පැවසුවොත්: 1 යොහන් 1:8
   - ඔබ නපුරු මිනිසුන්ට සවන් දුනහොත්: 2 තිමෝති 3:13
   - ඔබ කිසිත් නොවන කෙනෙක්ව සිටියදීත් ඔබ වැදගත් කෙනෙක් යයි සිතුවොත්: ගලාති 6:3
   - ඔබ වපුරන දේ නොකපන්නේයයි සිතුවොත්: ගලාති 6:7
   - අධර්මිෂ්ඨයන් දේව රාජ්‍යය උරුම කරගන්නේ යයි ඔබ සිතුවොත්: 1 කොරි. 6:9
   - ඔබට මෙලොව ප්‍රඥාව ඇති බැවින් ඔබ ප්‍රඥාවන්තයයි සිතුවොත්: 1 කොරි. 3:18
   - ඔබ ආත්මිකයයි ඔබ සිතුව ද පාලනය කරගත නොහැකි ඔබගේ දිව ඔබේ සැබෑ තත්වය එළිදරව් කළොත්: යාකොබ් 1:26
   - යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මාංශවත් වූ බව ඔබ විශ්වාස නොකළොත්: 2 යොහන් 7
   - පාපය සමග සැබඳකම් ඇති කර ගැනීමෙන් ඔබට කිසිදු බලපෑමක් ඇති නොවන බවක් ඔබ සිතුවොත්: 1 කොරින්ති 15:33

ඔබ රැවටී ඇත.

# හතරවන පරිච්ඡේදය

## "උන්වහන්සේ මෙන් කිසිවෙක් කතා නොකළේය"

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- යේසුස්වහන්සේගේ බලයේ ප්‍රභවය හඳුනාගැනීමට
- යේසුස්වහන්සේගේ බලය හා ආධිපත්‍යය පිළිබඳව බයිබලය උගන්වන දේ සාරාංශ කිරීමට

ඔබට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**යේසුස්වහන්සේ ඔවුන් ළඟට ඇවිත් කථා කොට: ස්වර්ගයෙහි ද පොළොවෙහි ද සියලු බලය මට දී තිබේ.** (මතෙව් 28:18)

### හැඳින්වීම

දෙවියන්වහන්සේ පියාණන්, පුත්‍රයාණන් හා ශුද්ධාත්මයාණන්ගෙන් සමන්විත ත්‍රිත්ව පෞරුෂත්වයකි. බලයේ ප්‍රභවය වන්නේ පියවූ දෙවියන්වහන්සේය. දෙවියන්වහන්සේ ස්වකීය පුත්‍රයාණන් වූ යේසුස්වහන්සේට බලය පැවරූ සේක. ශුද්ධාත්මයාණන්වහන්සේ පසුව පුත්‍රයාණන් විසින් පවරන ලද බලය ඇදහිලිවතුන්ට පවරන ලදී.

මෙම පරිච්ඡේදයෙන් ඔබ යේසුස්වහන්සේගේ බලය හා ආධිපත්‍යය ගැන ඉගෙන ගන්නවා ඇත. එය කෙතරම් බලවත් ද යත් උන්වහන්සේගේ කාලයේ සිටි ආගමික නායකයෝ "මනුෂ්‍යයෙක් කිසි කලෙක මෙසේ කථා කළේ නැතැ"යි (යොහන් 7:46) පැවසූහ.

### බලය ඇතිව ඉපදීම

යේසුස්වහන්සේ ඉපදුනේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයෙනි.

**ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹ කෙරෙහි පැමිණෙන සේක. මහෝත්තමයාණන්ගේ ආනුභාවය ද නුඹ වසාගන්නේය. ඒ නිසා උපදින්න සිටින තැනැත්තේ ශුද්ධය. දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝයයි කියනු ලබන සේක.** (ලූක් 1:35)

යේසුස්වහන්සේ, දෙවියන්වහන්සේගේ බලය දෘශ්‍ය ප්‍රකාශනය වේ.

**නුමුත් කැඳවනු ලැබූවනට... දෙවියන්වහන්සේගේ බලය සහ දෙවියන්වහන්සේගේ ප්‍රඥාවය.** (1 කොරින්ති 1:24)

### බලය සහිතව බව්තිස්ම කරනු ලැබීම

යේසුස්වහන්සේගේ බලය යොහන්තුමා හැඳිනගත්තේය. ඔහු මෙසේ පැවසීය.

**මට වඩා බලවත් කෙනෙක් මට පසුව එන සේක, මම නැමී උන්වහන්සේගේ වහන්වල පටිය මුදන්ටවත් නොවටිමි.**

**මම නුඹලා වතුරෙන් බව්තිස්ම කෙළෙමි, නුමුත් උන්වහන්සේ නුඹලා ශුද්ධාත්මයාණන්ගෙන් බව්තිස්ම කරන සේක. (මාක් 1:7-8)**

යොහන්තුමා යේසුස්වහන්සේව යොර්දාන් ගඟේ බව්තිස්ම කළ පසු, ශුද්ධාත්මයාණන්වහන්සේ පරෙවියෙකුගේ ආකාරයෙන් උන්වහන්සේ පිටට පැමිණි සේක.

**තවද යොහන් සාක්ෂි දෙමින්: ආත්මයාණන් පරෙවියෙකු මෙන් අහසින් බසිනවා දුටිමි; එය උන්වහන්සේ පිට නැවතුණේය. (යොහන් 1:32)**

ශුද්ධාත්මයාණන්වහන්සේ පරෙවියෙකු මෙන් යේසුස්වහන්සේ පිට නැවතිම මගින් මෙය සනාථ විය. යේසුස්වහන්සේ, ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයෙන් පූර්ණ වූවා පමණක්ම නොව, උන්වහන්සේ බලයෙන් යුක්තව බව්තිස්ම කරනු ඇත.

## ඔප්පුකරන ලද බලයක්

උන්වහන්සේගේ බව්තිස්මය අවසන් වූ විගස, සාතන් මගින් පරීක්ෂාකරනු ලැබීම පිණිස පාළුකරයට ගිය සේක.

**යේසුස්වහන්සේ ශුද්ධාත්මයෙන් පූර්ණව යොර්දානෙන් හැරී ඇවිත් ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන වනයෙහි ගෙනයනු ලැබූ සේක. (ලූක් 4:1)**

ඔබට මේ පිළිබඳව ¨ක් 4:1-13 හි කියවීමට පුළුවන.

බලය පරීක්ෂා කිරීම මගින් ඔප්පු කරනු ලැබේ. සාතන් විසින් කරන ලද සෑම පරීක්ෂාවකින්ම යේසුස්වහන්සේගේ බලය හා ආධිපත්‍යය අභියෝගයට ලක් කෙරේනි. යේසුස්වහන්සේ මේ සෑම එකක්ම සාර්ථකව පරාජය කළ අතර...

**... ආත්මයාණන්වහන්සේගේ බලයෙන් යුක්තව ගලිලයට හැරී ආ සේක. උන්වහන්සේ ගැන කීර්තියක් ද අවට මුළු පළාතෙහිම පතලව ගියේය. (ලූක් 4:14)**

## උන්වහන්සේගේ බලයේ ප්‍රභවය

යේසුස්වහන්සේගේ බලයේ හා ආධිපත්‍යයේ ප්‍රභවය පියවූ දෙවියන්වහන්සේ මෙසේ පැවසූ සේක.

**ස්වාමින්වහන්සේගේ ආත්මය මා කෙරෙහිය; මක්නිසාද දිළිඳුන්ට ශුභාරංචිය දේශනා කරන්ට උන්වහන්සේ මා ආලේප කළ සේක. වහලුන්ට මිදීම හා අන්ධයන්ට පෙනීම ලැබෙන බව ප්‍රකාශ කරන්ට ද මඩනාලද්දවුන් නිදහස් කර හරින්ට ද ස්වාමීන්වහන්සේගේ පිළිගත යුතු අවුරුද්ද ප්‍රකාශකරන්ට ද උන්වහන්සේ මා එවූ සේක. (ලූක් 4:18-19)**

යේසුස්වහන්සේ. පියවූ දෙවියන්වහන්සේගෙන් ස්වාධිනව බලය කි%යා නොකල සේක. උන්වහන්සේගේ මෙලොව සේවය මුළුල්ලේම. නිරන්තරයෙන්ම තම බලයේ ප්‍රභවය දෙවියන්වහන්සේ බව පිළිගත් සේක.

**යේසුස්වහන්සේ ඔවුන්ට උත්තර දෙමින්: පියාණන්වහන්සේගෙන් බොහෝ යහපත් ක්‍රියා නුඹලාට දැක්වීමි. (යොහන් 10:32)**

## අසීමිත බලය

ක්‍රිස්තුස්වහන්සේගේ බලයට සීමාවක් නොතිබුණි. උන්වහන්සේට ස්වර්ගයෙත් පොළොවේත් සියලු බලය දී තිබිණි.

**යේසුස්වහන්සේ ඔවුන් ළඟට ඇවිත් කථා කොට: ස්වර්ගයෙහිද පොළොවෙහිද සියලු බලය මට දී තිබේ. (මතෙව් 28:18)**

යේසුස්වහන්සේට බලය ඇත.

**සියලු අධිපතිකමටත් බලයටත් පරාක්‍රමයටත් ස්වාමිකමෙහි මේ ලෝකයෙහි පමණක් නොව පරලෝකයෙහිත් සඳහන් කරනලද සියලු නම්වලටත් වඩා උසස්කොට ස්වර්ගීය ස්ථානවල තමන් දකුණු පැත්තෙහි හිඳුවා, සියලු දේවල් උන්වහන්සේගේ පාදවලට යටත් කොට. සභාව උදෙසා සියල්ලට ප්‍රධානියා වෙන්ට උන්වහන්සේ නියම කළ සේක. (එපීස 1:21-22)**

අනෙකුත් සියලු බලවල ප්‍රධානියා යේසුස්වහන්සේ වේ.

**සියලු අධිපතිකමේද බලයේද හිස වන උන්වහන්සේ තුළ නුඹලා පූර්ණව සිටින්නහුය. (කොලොස්සි 2:10)**

යේසුස්වහන්සේට අසීමිත බලය ඇත. උන්වහන්සේ සතු බලයන්:

## ආධිපත්‍යය ඇතිව ඉගැන්වීමේ බලය

ලියන්නන් තම ආධිපත්‍යය පදනම් කරගත්තේ පැරණි ගිවිසුමේ ශුද්ධ ලියවිලි මතය. යේසුස්වහන්සේ තම ආධිපත්‍යය පදනම් කරගත්තේ දෙවියන්වහන්සේම මතය.

**උන්වහන්සේගේ ඉගැන්වීම් ගැන ඔවුහු විස්මිතවූවෝය. මක්නිසාද උන්වහන්සේ ලියන්නන් මෙන් නොව බලය ඇති කෙනෙකු මෙන් ඉගැන්වූ සේක. (මාක් 1:22)**
**උන්වහන්සේගේ වචනය බලයෙන් යුක්තවූ බැවින් උන්වහන්සේගේ ඉගැන්වීමට ඔවුහු ස්මිත වූවෝය. (ලූක් 4:32)**

## පාපය කෙරෙහි බලය:

පපයට සමාව දීමේ බලය යේසුස්වහන්සේට තිබිණි.

**නුමුත් පොළොවේදී පව් කමාකරන්ට මනුෂ්‍ය පුත්‍රයාට බලය තිබෙන බව නුඹලා විසින් දැනගන්නා පිණිසය. (මතෙව් 9:6)**

## ලෙඩ රෝග කෙරෙහි බලය:

**සවස්වූ කල යක්ෂාවේශ වූ බොහෝ දෙනෙක් උන්වහන්සේ වෙතට ගෙනෙන ලද්දෝය. උන්වහන්සේ වචන මාත්‍රයකින් ආත්මය දුරුකළ සේක. රෝගාතුරවූ සියල්ලන් සුවපත් කළ සේක. (මතෙව් 8:16)**

## ස්වභාවධර්මය කෙරෙහි බලය:

**උන්වහන්සේ නැගිට සුළඟට තරවටු කොට: නිශ්ශබ්ද වෙව, නිශ්චල වෙවයි මුහුදට කී සේක. එවිට සුළඟ නැවති මහත් නිශ්චලයක් විය. (මාක් 4:39)**

## සියලු මාංශය කෙරෙහි බලය:

**ඔබගේ පුත්‍රයාට ඔබ දුන් සියල්ලන්ට ඔහු විසින් සදාකාල ජීවනය දෙන පිණිස ඔබ සියලු මනුෂ්‍යයන් කෙරෙහි ඔහුට බලය දුන් ලෙස ... (යොහන් 17:2)**

## උන්වහන්සේගේ සතුරන් කෙරෙහි බලය:

**නුඹ මට කථාකරන්නේ නැද්ද? නුඹ මුදාහරින්ට බලයද නුඹ කුරුසියෙහි ඇණ ගසන්ට බලයද මට ඇති බව නුඹ දන්නේ නැද්දැයි පිලාත් උන්වහන්සේට කීවේය. යේසුස්වහන්සේ ඔහුට උත්තර දෙමින්: ඉහළින් එය නුඹට නොදෙන ලද්දේ නම් මට විරුද්ධව නුඹට කිසි බලයක් නැත. (යොහන් 19:10-11)**

## මරණය කෙරෙහි බලය

යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක.

**නැවත නැගිටීම ද ජීවනය ද මමය. මා කෙරෙහි අදහාගන්නා මළ නමුත් ජීවත් වන්නේය. (යොහන් 11:25)**

යේසුස්වහන්සේ, තමන්ගේම මරණයෙන් හා නැවත නැගිටීමෙන්...

**... තමන් කෙරෙන් අධිපතීන් ද බලය ලත්තන් ද පහකොට, ප්‍රසිද්ධයෙන් ඔවුන් දක්වා ... ඔවුන් කරණකොටගෙන ඔවුන්ගෙන් ජයගත් බව ප්‍රකාශ කළ සේක. (කොලොස්සි 2:15)**

## තමන්වහන්සේගේම ජීවිතය කෙරෙහි බලය:

යේසුස්වහන්සේ තමන්ගේ ජීවිතය පිළිබඳව මෙසේ විස්තර කළ සේක.

**කිසිවෙක් ඒක මගෙන් උදුරාගන්නවා නොව මමම ඒක දෙමි. ඕක දෙන්ට මට බලය තිබේ, නැවත ගන්ටද මට බලය තිබේ. (යොහන් 10:18)**

## විනිශ්චය කිරීමේ බලය:

විනිශ්චය කිරීමේ බලය දෙවියන්වහන්සේ විසින් යේසුස්වහන්සේට දී ඇත.

**ඔහු මනුෂ්‍ය පුත්‍රයා බැවින් විනිශ්චය කරන්ට ද බලය දුන් සේක. (යොහන් 5:27)**

## යක්ෂයන් කෙරෙහි බලය:

යක්ෂාවේශ බලවේග කෙරෙහි බලය හා ආධිපත්‍යය යේසුස්වහන්සේට තිබිණි.

**සියල්ලෝ විස්මිතව: මේ වචනය කිමෙක්ද? මක්නිසාද උන්වහන්සේ බලයෙන්ද ආනුභාවයෙන්ද අශුද්ධාත්මයන්ට අණ දෙන සේක, ඔවුහු පිටවෙතියි ඔවුනොවුන් අතරෙහි කථාකර ගත්තෝය. (ලූක් 4:36)**

**එකල ඔවුන්ගේ පුදුමය කෙතරම්විද යත්, සියල්ලෝම: මේ කිමෙක්ද? අලුත් ඉගැන්වීමක්ය. මුන්වහන්සේ බලයෙන් යුක්තව අශුද්ධාත්මයන්ට පවා අණ කරන සේක. ඔවුහු උන්වහන්සේට කීකරු වෙතියි ඔවුනොවුන් අතරේ කථාකර ගත්තෝය. (මාක් 1:27)**

**දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන් ද බලයෙන් ද නාසරීය යේසුස්වහන්සේ ආලේප කළ බවත්, දෙවියන්වහන්සේ උන්වහන්සේ සමඟ සිටි බැවින් උන්වහන්සේ යහපත්කම් කරමින්ද යක්ෂයා විසින් පීඩා කරන ලද සියල්ලන් සුවකරමින්ද හැසුරුණ බවත්... (ක්‍රියා 10:38)**

## සතුරාගේ සියලු ක්‍රියාවන් කෙරෙහි බලය:

යේසුස්වහන්සේ මේ ලෝකයට පැමිණියේ යක්ෂයාගේ සියලු ක්‍රියා විනාශ කිරීම පිණිස වේ.

**දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් ප්‍රකාශ කරනු ලැබුවේ මේ පිණිසය. එනම් යක්ෂයාගේ ක්‍රියා විනාශ කරන පිණිසය. (1 යොහන් 3:8)**

## දැන් පවතින බලය

යේසුස්වහන්සේගේ මරණයෙන් හා නැවත නැගිටීමෙන් පසු උන්වහන්සේ ස්වර්ගයට ගිය සේක. එහි උන්වහන්සේ දෙවියන්වහන්සේගේ දකුණු භාගයෙහි සිටිමින් බලයෙන් හා ආධිපත්‍යයෙන් යුතුව තව දුරටත් සේවය කරන සේක.

> **... මෙතැන් පටන් මනුෂ්‍ය පුත්‍රයා දෙවියන්වහන්සේගේ පරාක්‍රමයේ දකුණු පැත්තේ වැඩ හිඳිනවා ඇත. (ලූක් 22:69)**
>
> **බලව, ස්වර්ගය විවරවී තිබෙනවාත් මනුෂ්‍ය පුත්‍රයා දෙවියන්වහන්සේගේ දකුණු පැත්තෙහි නැගිට සිටිනවාත් මට පෙනේ යයි කීවේය. (ක්‍රියා 7:56)**

ඇදහිලිවතුන්ට පවරා ඇති බලය තුළින් යේසුස්වහන්සේ තවමත් සේවය කරන සේක. යේසුස්වහන්සේ ස්වර්ගයට යෑමට පෙර, උන්වහන්සේගේ අනුගාමිකයන්ට බලය හා ආධිපත්‍යය පැවරූ සේක. ඔවුන් උන්වහන්සේ කළ ක්‍රියා හා ඊටත් වඩා දේ කළ යුතු වේ (යොහන් 14:12). මෙම පවරන ලද බලය පිළිබඳව ඔබ ඊළඟ පරිච්ඡේදයෙන් ඉගෙන ගත්තෙහිය.

## අනාගත බලය

යම් කිසි දිනෙක, යේසුස්වහන්සේ මහත් බලයෙන් හා මහිමයෙන් යුක්තව මෙලොවට නැවත පැමිණෙන සේක.

> **එකල මනුෂ්‍ය පුත්‍රයාගේ ලකුණ අහසේ පෙනෙන්නේය. එවිට පොළොවේ සියලු ගෝත්‍රයෝ වැලපෙන්නෝය, ඔවුහු මනුෂ්‍ය පුත්‍රයා බලයෙන් ද මහත් තේජසින් ද අහසේ වලාකුල් පිට එනවා දකින්නෝය. (මතෙව් 24:30)**

ඒ අවස්ථාවේ ස්වර්ගයේ හා පොළොවේ සියලු බල යේසුස්වහන්සේට භාර දෙනු ඇත.

> **එවිට කෙළවර පැමිණේ; උන්වහන්සේ සියලු අධිපතිකම් ද බලය ද පරාක්‍රමය ද නැතිකළ කල්හි, උන්වහන්සේ රාජ්‍යය පියවූ දෙවියන්වහන්සේට භාර දෙන සේක. (1 කොරින්ති 15:24)**

මුළු විශ්වයම පියවූ දෙවියන්වහන්සේගේත් පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේත් බලය පිළිගන්නවා ඇත.

> **ඔවුහු කථාකොට: මරනු ලැබූ බැටළුපැටවාණෝ බලයත් ධනයත් ප්‍රඥාවත් පරාක්‍රමයත් ගෞරවයත් තේජසත් ප්‍රශංසාවත් ලබන්ට වටින තැනන්වහන්සේයයි මහත් හඬකින් කීවෝය.**
>
> **තවද ස්වර්ගයෙහිත් පොළොවෙහිත් පොළොවෙන් යට සහ මුහුද පිටත් ඇත්තාවූ සියලු මැවිලි වන එහි ඇති සියල්ලෝ: සිංහාසනයෙහි වැඩ ඉන්න තැනන්වහන්සේටත් බැටළුපැටවාණන්ටත් ප්‍රශංසාව ද ගෞරවය ද මහිමය ද පරාක්‍රමය ද සදාකාලේටම වේවයි කියනවා ඇසීමි. (එළිදරව් 5:12-13)**

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. යේසුස්වහන්සේගේ බලයේ සීමාවන් කවරේද?

3. යේසුස්වහන්සේගේ බලයේ ප්‍රභවය හා ආධිපත්‍යයේ කවුද?

4. යේසුස්වහන්සේගේ බලය හා ආධිපත්‍යය පිළිබඳව ඔබ මෙම පරිච්ඡේදයෙන් උගත් දේ සාරාංශ කරන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ පරීක්ෂණ වලට පිළිතුරු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

යේසුස්වහන්සේගේ බලය හා ආධිපත්‍යය පිළිබඳව, මතෙව්. මාක්, ලූක් හා යොහන් පොත්වල ඇති උන්වහන්සේගේ ජීවිතය හා සේවය ගැන අධ්‍යයනය කිරීමෙන්, තව දුරටත් ඉගෙන ගන්න.

යේසුස්වහන්සේ උන්වහන්සේගේ බලය පියවූ දෙවියන්වහන්සේ වෙත යොමු කෙරෙන වාර ගණන සටහන් කරන්න.

ඉගැන්වීමේදී, සුවකිරීමේදී යකුන් පලවා හැරීමේදී, හාස්කම් කිරීමේදී. ස්වභාව ධර්මය පාලනය කිරීමේදී ආදී වශයෙන් උන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීම පිළිබඳ වාර්තාවක් සකස් කරන්න. ඒ සඳහා පහත දැක්වෙන සටහන භාවිත කරන්න.

| යොමුව | බලය ප්‍රදර්ශනය කළ ආකාරය | ප්‍රතිඵල |
|---|---|---|

# පස්වන පරිච්ඡේදය

## පවරන ලද අධිකාරී බලය

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ආත්මික අධිකාරී බලය අපට ලැබෙන ප්‍රභවය කවුරුන් ද යන්න හඳුනා ගැනීමට
- වගකීම හා අධිකාරී බලය අතර සබඳතාව පැහැදිලි කිරීමට
- යේසුස්වහන්සේ තම අනුගාමිකයිනට පැවරූ වගකීම පැහැදිලි කිරීමට
- බලය සඳහා වන ග්‍රීක වචන දෙකක් අර්ථ දැක්වීමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

> **බලව, සර්පයන්ද ගෝනුස්සන් ද පාගන්ටත් සතුරාගේ මුළු ශක්තිය මැඩපවත්වන්ටත් මා විසින් නුඹලාට බලය දී තිබේ. කොයි දෙයකින්වත් නුඹලාට අන්තරායක් නොවන්නේය.**
> (ලූක් 10:19)

### හැඳින්වීම

බලයේ ප්‍රභවය දෙවියන්වහන්සේ වේ. උන්වහන්සේ "සියලු බලය" උන්වහන්සේගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට පැවරූ සේක. ඉන්පසු යේසුස්වහන්සේ ආත්මික බලය උන්වහන්සේගේ අනුගාමිකයන්ට පැවරූ සේක. මෙම බලය නිසා ඔවුන්ට පවරන ලද මහත්වූ වගකීම ඉටු කිරීමට ඔවුන්ට හැකියාව ලැබිණි.

### වගකීම හා අධිකාරී බලය

යේසුස්වහන්සේ උන්වහන්සේගේ පොළොවේ සේවය අවසන් කර නැවත ස්වර්ගයට ගිය පසු, උන්වහන්සේගේ අනුගාමිකයනට මහත්වූ වගකීමක් භාරදුන් සේක. උන්වහන්සේ මෙසේ පැවසිය.

> **එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරන්න. පියාණන්ගේත් පුත්‍රයාණන්ගේත් ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බව්තිස්ම කරන්න. මා විසින් නුඹලාට අණ කළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වන්න. මම ද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමඟ සිටිමි.** (මතෙව් 28:19-20)

යේසුස්වහන්සේ උන්වහන්සේගේ අනුගාමිකයනට දුන් වගකීම වන්නේ දේව රාජ්‍යය පිළිබඳ ශුභාරංචිය සමඟ මුළු ලෝකයා වෙතට යෑමය.

වගකීම හා අධිකාරී බලය අතර නිශ්චිත සබඳතාවක් තිබේ. යම් කෙනෙකුට යම් දෙයක් කිරීමට වගකීම පැවරූ විට ඔහුට එය කිරීම සඳහා අධිකාරී බලය ද තිබිය යුතුය. එම අධිකාරී බලය පැවරිය යුත්තේ ඔහුට වඩා උසස් කෙනෙකු විසිනි.

නිදසුනක් වශයෙන් නගරයක හෝ ග්‍රාමයක හෝ නීතිය රැක ගැනීමට පොලිසියේ නිලධාරියෙකුට වගකීම දිය යුතුය. එම වගකීම ඉටුකිරීමේ අධිකාරී බලය ඔහුට රජය විසින් දී තිබේ. ඔහුගේ කාර්යය සාක්ෂාත් කිරීමට අවශ්‍ය බලය ලබාදීම සඳහා ආයුධයක් ගෙන යෑමේ අධිකාරී බලය ඔහුට ඇත. එම පොලිස් නිලධාරියාට තමන්ගේම අධිකාරී බලයක් නැත. එම අධිකාරී බලය ඔහුට පවරාදී ඇත්තේ ඔහුගේ උසස් නිලධාරීන් විසිනි. ඔහු රජය නියෝජනය කරයි.

ශුභාරංචිය ලොව පුරා ගෙන යෑමේ වගකීම යේසුස්වහන්සේ සිය අනුගාමිකයන්ට දුන් සේක. මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය අධිකාරී බලය ද උන්වහන්සේ ඔවුන්ට දුන් සේක. යම් වගකීමක් ඉටු කිරීමට අවශ්‍ය අධිකාරී බලය නොදී යම් කෙනෙකුට වගකීමක් දිය නොහැකිය. මේ අධිකාරී බලය කුමක්ද? එය ආත්මික බලය වේ. යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක.

> **... ස්වර්ගයෙහි ද පොළොවෙහි ද සියලු බලය මට දී තිබේ. (මතෙව් 28:18)**

ඉන්පසු උන්වහන්සේ මෙසේද පැවසූ සේක.

> **එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරන්න. පියාණන්ගේත් ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බව්තිස්ම කරන්න. මා විසින් නුඹලාට අණ කළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වන්න. මම ද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමඟ සිටිමි. (මතෙව් 28:19-20)**

## පැවරීමට ඇති අධිකාරී බලය

යේසුස්වහන්සේ මෙලොවට පැමිණියේ බලය සහ ආධිපත්‍යය ඇතිවය. දෙවියන්වහන්සේ විසින් පවරන ලද "සියලු බලය" යේසුස්වහන්සේට තිබිණි. මේ නිසා උන්වහන්සේට (යේසුස්වහන්සේට) බලය හා වගකීම උන්වහන්සේගේ අනුගාමිකයනට පැවරීමේ ආධිපත්‍යය තිබිණි.

> **තවද උන්වහන්සේ තමන් ගෝලයන් දොළොස් දෙනා තමන් ළඟට කැඳවා, අශුද්ධාත්මයන් දුරු කරන්ට ඔවුන් කෙරෙහි ද සියලු ආකාර ලෙඩ සහ සියලු ආකාර රෝග සුව කිරීමට ද ඔවුන්ට බලය දුන් සේක. (මතෙව් 10:1)**

ගෝලයන් දොළොස් දෙනා උන්වහන්සේ සමග සිටින පිණිසත් දේශනා කිරීම සඳහා යවන පිණිසත් උන්වහන්සේ ඔවුන්ව පත් කළ සේක.

> **... යක්ෂන් දුරු කිරීමේ බලය දරන පිණිසත් වේ. (මාක් 3:14-15)**

> **එකල උන්වහන්සේ දොළොස් දෙනා තමන් ළඟට කැඳවා, ඔවුන් දෙදෙන දෙදෙනා බැගින් යවන්ට පටන්ගෙන, අශුද්ධාත්මයන් කෙරෙහි ඔවුන්ට බලය දුන් සේක. (මාක් 6:7)**

> **එකල උන්වහන්සේ දොළොස් දෙනා කැඳවා සියලු යක්ෂයන් කෙරෙහි ද රෝග සුව කරන්ට ද බලය සහ වරය ඔවුන්ට දුන් සේක. (ලූක් 9:1)**

යේසුස්වහන්සේ උන්වහන්සේගේ ගෝලයන්ට පවරන ලද්දේ හැඟීම් බර දෙයක් හෝ ද්‍රව්‍යමය ආශිර්වාද හෝ නොවේ. උන්වහන්සේ ජෙරුසලමේ සංවිධානාත්මක පදනමක් පිහිටුවේ නැත. මේවායින් පමණක් උන්වහන්සේගේ කාර්යය ඉටු නොවන බව උන්වහන්සේ දත් සේක. උන්වහන්සේ ඔවුන්ට පවරන ලද්දේ බලය වේ.

තෙවන පරිච්ඡේදයෙන් සාතන්ගේ බලය පිළිබඳව උගත්තෙහිය. යේසුස්වහන්සේ උන්වහන්සේගේ අනුගාමිකයන්ට පවරන ලද බලය සතුරාගේ බලයට වඩා බලවත්ය.

> **බලව, සර්පයන්ද ගෝනුස්සන් ද පාගන්ටත් සතුරාගේ මුළු ශක්තිය මැඩපවත්වන්ටත් මා විසින් නුඹලාට බලය දී තිබේ. කොයි දෙයකින්වත් නුඹලාට අන්තරායක් නොවන්නේය. (ලූක් 10:19)**

සාතන් ඔබට බිය නැත. ඔහු ඔබට ගරුකරන්නේ නැත. එහෙත් ඔහු දෙවියන්වහන්සේ විසින් ඔබට දෙන ලද අධිකාරී බලයට බිය වේ.

අධිකාරී බලය සබඳිතා මත රඳා පවතී. නිදසුනක් වශයෙන් පොලිස් නිලධාරියෙකුට බලය ඇත්තේ ඔහු රජය සමඟ පවත්වන සබඳතාවය නිසාය. ඔබගේ අධිකාරී බලයේ පදනම වන්නේ ඔබ හා ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අතර ඇති සබඳතාවය වේ. ඔබ පසු පස යේසුස්වහන්සේ "සියලු බලය" ඇතිව සිටින සේක. ඔබ මේ සත්‍යය හැඳිනගත් විට ඔබගේ ජීවිතය වෙනස්වනු ඇත. යේසුස්වහන්සේ ගෝලයන්ට මෙසේ පැවසූ සේක.

> **බලව, මම මාගේ පියාණන්වහන්සේගේ පොරොන්දුව නුඹලා වෙතට එවමි. නුමුත් ඉහළින් නුඹලා බලයෙන් සරසනු ලබන තුරු නුවර නැවතී සිටින්න. (ලූක් 24:49)**

ගෝලයන් මේ බලය ලැබූ විට, බියසුළු, නොඇදහිලිවත්, අවිශ්වාස බවින් අධිකාරී බලය ඇති අය බවට වෙනස් වූහ.

> **ඔවුහු පිටත්ව ගොස්, සියලූ තැන්වල දේශනා කළෝය. ස්වාමීන්වහන්සේ ද ඔවුන් සමග ක්‍රියාකරමින් ඔවුන් අතින් සිදුනු ලකුණුවලින් වචනය ස්ථිර කළ සේක. (මාක් 16:20)**

ඇදහිලිවතුන්ගේ ජීවිත තුළ ආත්මික බලය සම්පූර්ණ වූ ආකාරය ක්‍රියා පොතේ සඳහන් වේ. මේ පොතේ විස්තර කර ඇති හාස්කම්, ලකුණු හා පුදුම දේ සිත්ගන්වන සුළුය. දෙවියන්වහන්සේගේ බලය ප්‍රකාශ කෙරෙන සෑම ක්‍රියාවක්ම, ලෝකය වෙත ශුභාරංචිය ගෙන යෑමේ වගකීම ඉටු කළ ආකාරය පෙන්වයි.

## බලය සඳහා වචන දෙකක්

නව ගිවිසුමේ ග්‍රීක් වචන දෙකක් ඉංග්‍රීසි බයිබලයේ පරිවර්තනය කර ඇත්තේ බලය (power) යන තනි වචනයෙනි. ඊම් අදහස් දෙක පහත දැක්වෙන පදයෙන් පැහැදිලි කෙරේ.

> **බලව, සර්පයන් ද ගෝනුස්සන් ද පාගන්ටත් සතුරාගේ මුළු ශක්තිය (power exousia) මැඩපවත්වන්ටත් මා විසින් නුඹලාට බලය ( power - dunomis) දී තිබේ. (ලූක් 10:19)**

" exousia " යන ග්‍රීක් වචනයේ තේරුම පවරන ලද බලය හෝ ආධිපත්‍යය වේ. " dunomis " යන වචනයේ තේරුම සහජයෙන්ම ලබාගත් බලය යන්නය. " සහජයෙන්ම ලබාගත් බලය" මනසින් හා තමන්ගෙන්ම ලැබේ. සහජයෙන්ම ලබාගත් බලය (dunomis) මෙම පදයේ භාවිත කර ඇත්තේ සාතන්ගේ බලය විස්තර කිරීමටය. පවරන ලද බලය (exousia) යන්න භාවිත කර ඇත්තේ දෙවියන්වහන්සේ විසින් පවරන ලද යේසුස්වහන්සේගේ බලය විස්තර කිරීමට වේ. දෙවියන්වහන්සේ විසින් පවරන ලද මේ බලය, සතුරාගේ බලයට වඩා වැඩිය. ඇදහිලිවතුන්ට දෙනු ලබන්නේ මෙම පවරන ලද බලය වේ. ඔබ මෙම බලය ඇතිව ඉපදී නැත. ඔබට එය දෙමවුපියන්ගෙන් උරුම නොවේ. එය ඔබට පවරා ඇත්තේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විසිනි.

## බලය සඳහා වගකීම

යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට දී ඇති බලය සමඟ වගකීමක් ද ඇත. එය ශුභාරංචිය මුළු ලෝකයා වෙතම ගෙන යෑම සඳහා භාවිත කළ යුතුය.

> **නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කළ නුඹලා, බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහි ද මුළු යුදයෙහි ද සමාරියෙහි ද පොළොවේ සීමාව දක්වා ද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය. (ක්‍රියා 1:8)**

මෙම බලයේ පරමාර්ථය වන්නේ ශුභාරංචිය ලෝකයේ ජාතීන් වෙත පැතිරවීම වේ. මෙම සත්‍යය පැහැදිලි කිරීම සඳහා යේසුස්වහන්සේ මාක් 13 හි උපමාවක් භාවිත කරන සේක. උන්වහන්සේ මෙසේ පැවසූ සේක.

**ඒ වනාහි තමාගේ දාසයන්ට බලය දී එකිනෙකාට තම තමාගේ වැඩ ද දී, අවදිව සිටින්නැයි දොරටුපාලයාට අණ දී, තමාගේ ගෙදරින් පිටත්ව ගොස් අන් රටක නැවති සිටි මනුෂ්‍යයෙකුට සමානය. (මාක් 13:34)**

යම් කාර්යයක් ඉටු කිරීම සඳහා අධිකාරී බලයක් දී ඇත. එම කාර්යය නම් ශුභාරංචිය ලෝකයේ ජාතීන් වෙත පැතිරවීම වේ.

## එය අතීතය ද?

ඇතැමුන් පවසන්නේ, මේ මහත් ආත්මික බලය පැවරීම මුල් සභාවට පමණක් සීමා වූවක් බවය. මෙය ගෝලයන්ට පමණක් කළ නියමයක් ලෙස ඔවුහු පවසති. ඔවුන් පවසන්නේ හාස්කම් කිරීමේ කාලය අතීතය බවය.

එහෙත් මෙම ප්‍රශ්නය සලකා බලන්න. මුළු ලෝකය පුරාම ශුභාරංචිය ගෙන ගොස් තිබේද? යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට බාර කළ කාර්යය තවමත් අවසන් නැත. දේව රාජ්‍යය පිළිබඳ ශුභාරංචිය ලොව පුරා පැතිරවීමේ වගකීම තවමත් අප සතුය. වගකීම සම්පූර්ණයෙන්ම ඉටු කරන තුරු යේසුස්වහන්සේ අධිකාරී බලය ආපසු නොගන්නා සේක.

යොහන් 11 ඇති ලාසරස්ගේ මරණය හා පුනරුත්ථාපනය පිළිබඳ කතාන්දරය කියවන්න. යේසුස්වහන්සේ පැමිණෙන විටත් ලාසරස් මැරී සිටි අතර, මාර්තා උන්වහන්සේ මුණ ගැසී මෙසේ පැවසූ සේක.

**ස්වාමිනි, ඔබ මෙහි සිටි සේක් නම් මාගේ සහෝදරයා නොමැරෙයි. (යොහන් 11:20)**

යේසුස්වහන්සේ ඇයට මෙසේ පැවසූ සේක.

**නුඹේ සහෝදරයා නැවත නැගිටින්නේය. (යොහන් 11:23)**

මාර්තා මෙසේ කීවාය:

**අන්තිම දවසේ නැවත-නැගිටීමේදී ඔහු නැවත නැගිටින බව දනිමි. (යොහන් 11:24)**

එවිට යේසුස්වහන්සේ ඇයට මෙසේ පැවසූ සේක:

**නැවත නැගිටීම ද ජීවනය ද මමය. මා කෙරෙහි අදහාගන්නා මළ නමුත් ජීවත්වන්නේය. (යොහන් 11:25)**

මාර්තා විශ්වාස කළේ යේසුස්වහන්සේට ලාසරුස්ව අතීතයේදී මළවුන්ගෙන් නැගිටවිය හැකිව තිබූ බවය (... "ඔබ මෙහි සිටිසේක් නම්") අනාගතයේදී ද ඔහුව නැගිටුවීමට යේසුස්වහන්සේට හැකි බව ඇය විශ්වාස කළාය ("අන්තිම දවසේ") එහෙත් යේසුස්වහන්සේ ඉතා වැදගත් සත්‍යයක් මෙහි දී පැවසූ සේක. "මම ය" යන්න වර්තමාන කාලයේ ප්‍රකාශයකි. ඉන්පසු උන්වහන්සේ ලාසරුස්ව මළවුන්ගෙන් නැගිටවූ සේක.

අතීත දිනවල හාස්කම් යනුවෙන් දෙයක් නැත. අනාගත දිනවල හාස්කම් යනුවෙන් දෙයක් ද නැත. සෑම යුගයකම මිනිසුන්ගේ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා හාස්කම් කිරීමට බලයක් ඇත. සෑම දිනකම හා යුගයකම, දෙවියන්වහන්සේ තම බලය ප්‍රකාශකරන සේක. උන්වහන්සේ ඔබට පවසන්නේ "මම ය" යනුවෙනි-වර්තමාන කාලයෙනි.

## මිදිවැලෙන් ලැබෙන ජීවය

> **මිදිවැල මමය, නුඹලා අතුය. යමෙක් මා තුළෙහි පවතින්නේද, මම ඔහු තුළෙහි පවතිම් ද, ඒ තැනැත්තේ බොහෝ ඵල දරයි. මක්නිසාද මාගෙන් වෙන්ව කිසිවක් කරන්නට නුඹලාට බැරිය. (යොහන් 15:5)**

ස්වභාවික ලෝකයේ ජීවය ලැබෙන්නේ මිදි වැලෙන්ය. ඵල ඇතිවීම සඳහා මිදිවැලෙන් අතුවලට ජීවය ගලා එයි. අතු, ස්වාධීනව ඵල නොදරයි. එය ප්‍රධාන වැලෙන් වෙන් කළහොත්, ඵල දැරීම නැවතෙන අතර අවසානයේ දී මිය යනු ඇත.

ආත්මික ලෝකයේ දෙවියන්වහන්සේගේ බලය ගලායෑම පැහැදිලි කිරීමට යේසුස්වහන්සේ යොදාගත් උපහැරණය එය වේ. ඵල දරන අතු අපි වෙමු. මිදිවැල යේසුස්වහන්සේය. ඔබ ඵල නිපදවන්නේ නැත, දරනවා පමණි. (යොහන් 15 බලන්න)

නව ගිවිසුම් යුගයේ ප්‍රබල හාස්කම් පේදුරුතුමාගේ හාස්කම් නොවේ. ඒවා පාවුලුතුමා අතින් සිදුවූයේ ද නැත. ඒවා, ආත්මික අතුවලින් ආත්මික ඵල ලැබෙන්නාක් මෙන් දෙවියන්වහන්සේගේ ජීවය ඔවුන් තුළින් ගලායෑමේ ප්‍රතිඵලයකි.

මේ අය, දෙවියන්වහන්සේ ඔවුන්ට අණ කළ ලෙස කටයුතු කළහ. ඔවුහු වචනය දේශනා කළහ. ඔවුහු රෝගීන් මත අත තැබූහ. මිනිසුන්ගේ හා ස්ත්‍රීන්ගේ ජීවිතයෙන් ඉවත් වන ලෙස ඔවුහු යක්ෂයින්ට අණ කළහ. ඔවුහු කීකරුවී ප්‍රතිඵල දෙවියන්වහන්සේට බාර කළහ.

දෙවියන්වහන්සේට කීකරු වී, ප්‍රතිඵල දෙවියන්වහන්සේගේ අතේ තබන්න. හාස්කම් කරන්නේ ඔබ නොවේ. බලයේ ප්‍රභවය දෙවියන්වහන්සේය. ඔබ දෙවියන්වහන්සේට කීකරුවී උන්වහන්සේගේ වචනය මත ක්‍රියා කරන විට, ඉතිරිය උන්වහන්සේට බාරය. උන්වහන්සේ ඔබ තුළින් බලය නිපදවන සේක.

"දෙවියන්වහන්සේගේ වැඩ ඉෂ්ටකරන පිණිස අප විසින් කුමක් කටයුතුද," යි ගෝලයන් ඇසූ විට යේසුස්වහන්සේ මෙසේ පිළිතුරු දුන් සේක.

> **දෙවියන්වහන්සේගේ වැඩය නම් උන්වහන්සේ එවූ තැනැත්තා කෙරෙහි නුඹලා විසින් අදහාගැන්මය. (යොහන් 6:29)**

ඔබ තුළින් ක්‍රියාකරන තැනැන්වහන්සේ යේසුස්වහන්සේ වේ. අධිකාරී බලය පවරා ඇති තැනැන්වහන්සේ උන්වහන්සේය. ඔබ බලය ලබාගැනීමට හැඟීම් තුළින් ක්‍රියා කළ යුතු නැත. "යාච්ඤා කිරීමට" අවශ්‍ය නැත. එය ඔබ තුළ හා ඔබ මගින් දෙවියන්වහන්සේගේ බලය ක්‍රියා කිරීම වේ.

> **ඔවුන් පිටත්ව ගොස්, සියලු තැන්වල දේශනා කළෝය. ස්වාමින්වහන්සේ ද ඔවුන් සමඟ ක්‍රියාකරමින් ඔවුන් අතින් සිදුවූ ලකුණුවලින් වචනය ස්ථිර කළ සේක. (මාක් 16:20)**

බොහෝ අවස්ථාවල සේවය කිරීමේදී මේ රටාව ක්‍රියාත්මක වේ. බොහෝ දෙනෙක් දෙවියන්වහන්සේ *වෙනුවෙන්* වැඩ කිරීමට උත්සාහ කරති. එහෙත් ප්‍රබල ප්‍රතිඵල ගෙන එන ක්‍රමය වන්නේ "ස්වාමීන්වහන්සේ ඔවුන් *සමඟ* ක්‍රියා කිරීම" වේ.

යේසුස්වහන්සේ ගෝලයන්ට මෙසේ පැවසූ සේක.

> **බලව, මම මාගේ පියාණන්වහන්සේගේ පොරොන්දුව නුඹලා වෙතට එවමි. නුමුත් ඉහළින් නුඹලා බලයෙන් සරසනු ලබනතුරු නුවර නැවතී සිටින්න. (ලූක් 24:49)**

බොහෝ සේවයන් අසාර්ථක වන්නේ ආත්මික බලය පැවරීමට පෙර සෙනඟ පිටත්ව යන බැවිනි. යේසුස්වහන්සේ අපට දී ඇති මහත් වූ වගකීමේ අභියෝගවලට මුහුණ දීමට නම්, අප එය කළ යුත්තේ දෙවියන්වහන්සේගේ බලය හා ආධිපත්‍යය ඇතිවය.

## පරමාර්ථය

හේතුවක් නොමැතිව අන් අයට බලය පවරන්නේ නැත. අධිකාරී බලය පවරන සෑම අවස්ථාවකම ඊට හේතුවක් ඇත.

ආත්මික බලයේ ප්‍රධාන පරමාර්ථය ශුභාරංචිය පැතිරවීම බව ඔබ මෙම පරිච්ජේදයෙන් ඉගෙනගත්තෙහිය. එහෙත් මේ පවරන ලද බලයට වෙනත් වැදගත් පරමාර්ථ ඇත. බලය සඳහා වූ එම පරමාර්ථ ඊළඟ පරිච්ජේදයෙන් ඔබ ඉගෙන ගන්නෙහිය.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

___

___

___

2. ඇදහිලිවතුන් ආත්මික අධිකාරීබලය ලබා ගන්නේ කාගෙන්ද?

___

3. වගකීම හා අධිකාරී බලය අතර සබඳතාව කවරෙක්ද?

___

___

4. යේසුස්වහන්සේ තම අනුගාමිකයින්ට පැවරූ ශ්‍රේෂ්ඨතම වගකීම කුමක්ද?

___

5. බලය සඳහා ග්‍රීක වචන දෙකක් ඇත.
" dunomis " යන්නෙන් අදහස් වන්නේ කුමක්ද? ______________________________
" exousia " යන්නෙන් අදහස් වන්නේ කුමක්ද? ______________________________

6. මෙම ප්‍රකාශනය හරිද වැරදිද?

"හාස්කම් අතීතයේ සිදුවූ දේ වේ. ගෝලයන් අත්දුටු බලයේ ප්‍රකාශවීම් අද අපට නැත"

මෙම ප්‍රකාශනය ______________________________________________

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ පරීක්ෂණ වලට පිළිතුරු සපයා ඇත)

## තව දුරටත් අධ්‍යයනය කිරීම සඳහා

යේසුස්වහන්සේ විසින් පවරන ලද අධිකාරී බලය සමඟ වගකීම ද ගෝලයන් විසින් ඉටු කළ ආකාරය පිළිබඳව ක්‍රියා පොතේ කියවන්න.

දෙවියන්වහන්සේගේ අධිස්වභාවික බලය ප්‍රදර්ශනය කළ සෑම අවස්ථාවකම යොමුව පහත දැක්වෙන සටහනේ පළමු තීරුවේ සටහන් කරන්න. දෙවැනි තීරුවේ සිදුවූ දෙය ඉතා කෙටියෙන් සාරාංශගත කරන්න. දෙවියන්වහන්සේගේ බලයේ ප්‍රතිඵල තෙවැනි තීරුවේ පැහැදිලි කරන්න.

නිදසුනක් එහි සපයා ඇත.

ලෝකයා වෙත ශුභාරංචිය ගෙන යෑමේ උන්වහන්සේ දුන් වගකීම ඉටු කිරීම සඳහා යේසුස්වහන්සේ විසින් පවරන ලද අධිකාරී බලය ගෝලයන් උපයෝගී කර ගත ආකාරය ඔබට ඉන් පැහැදිලි වනු ඇත.

## ක්‍රියාවන්

| යොමුව | දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය වූ අයුරු | ප්‍රතිඵල |
|---|---|---|
| ක්‍රියා 2 | ශුද්ධාත්මයාණන්වහන්සේ ප්‍රදානය කෙරීන | බියසුළු මිනිසෙකුව සිටි පේතෘස් බලගතු සාක්ෂියක් දුන් අතර, එමගින් 3000 දෙනෙක් ගැළවීම ලැබූහ. |

# හයවන පරිච්ඡේදය

## බලයේ පරමාර්ථයන්

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ආත්මික බලය ලෞකික බලයෙන් වෙනස් වන අයුරු පැහැදිලි කිරීමට
- ලෝකයේ ප්‍රතිපත්ති හා දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති එකිනෙකට ප්‍රතිවිරුද්ධ බව සහතික කිරීමට බයිබලිය යොමුවක් දීමට
- ආත්මික බලයේ පරමාර්ථ හඳුනාගැනීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**ඔවුහු පිටත්ව ගොස්, සියලු තැන්වල දේශනා කළෝය. ස්වාමින්වහන්සේ ද ඔවුන් සමග ක්‍රියාකරමින් ඔවුන් අතින් සිදුවූ ලකුණුවලින් වචනය ස්ථිර කළ සේක. (මාක් 16:20)**

### හැඳින්වීම

යොමු නොකළ බලය අන්තරාදායකය. මහත් ගංඟාවක බලය යහපත් කටයුතු සඳහා යොදා ගත හැකිය. ගොවියන්ට ජලය සැපයීමට පුළුවන. විශාල නෞකා වලට එහි ජලය මත ගමන් කළ හැකිය. "විද්‍යුතය" නමින් හැඳින්වෙන බලගතු ශක්තියක් නිපදවීමට ඇතැම් සමාජ එය ප්‍රයෝජනයට ගනී.

හ× ලෙස යොමු නොකළහොත්, මෙම ගංගාවම ගලා ගොස් මහත් විනාශයක් කළ හැකිය. ඊට වගාවන් විනාශ කළ හැකිය. නිවෙස් කඩාබිඳ දැමිය හැකිය. ජීවිත නැති කළ හැකිය. මේ එකම ගංගාවමය, එකම බලයමය. නිවැරදි පරමාර්ථයක් කරා යොමු කළ විට ගංගාවක් ධනාත්මක බලයකි. එසේ නොකළ විට එය විනාශකාරීය.

ආත්මික බලය වැරදි පරමාර්ථයන් සඳහා යෙදවූ කල, පාලනය කළ නොහැකි ගලා ගිය ගංගාවක් මෙන්ම අන්තරාදායකය. මේ නිසා ආත්මික බලයේ දේව වචනය ත=ළ ඇති පරමාර්ථයන් අවබෝධ කර ගැනීම වැදගත් වේ.

### ලෞකික පරමාර්ථ

මෙම පාඩමාලාවේ හැඳින්වීමෙන් ඔබ උගත් පරිදි, අද ලෝකයේ ක්‍රියාත්මක වන විවිධ බල තිබේ. මිනිස්සු මෙම බලය විවිධ පරමාර්ථයන් සඳහා භාවිත කරති.

**දේශපාලනික බලය** සංවිධානවල, ගෝත්‍රවල, ගම් හා නගරවල, රාජ්‍යවල, පළාත්වල හා මුළු ජාතියේම නායකත්වය ලබා ගැනීම සඳහා භාවිත කෙරේ.

**බුද්ධිමය බලය** ශ්‍රේෂ්ඨ නිපදවීම් කිරීමටත්, සාහිත්‍යමය හා සංගීතමය නිර්මාණයන් සඳහාත්, අධ්‍යාපනික ආයතන පිහිටුවීමත් භාවිත කෙරේ.

**ශාරීරික බලය** ලෝක මලල ක්‍රීඩා තරඟවලදී ප්‍රසිද්ධිය ලබා ගැනීමට භාවිත කෙරේ.

**මූල්‍යමය බලය** වාසිදායක ව්‍යාපාර, සමාගම් හා මූල්‍යමය අධිරාජ්‍ය නිර්මානය කරයි.
**හමුදාමය බලය** දේශ සීමාවන් ආරක්ෂා කර ගැනීමටත්, පුළුල් කර ගැනීමට භාවිත කෙරේ.

**බල ශක්තීන්** විවිධාකාරයෙන් ප්‍රයෝජනයට ගැනේ. ලිපක ගිනි දැල්වීමේ සිට සම්පූර්ණ නගරයකට විදුලිය සැපයීම දක්වා භාවිත කෙරේ.

**ආගමික බලය** ශ්‍රේෂ්ඨ නිකායන් හා ආගමික ලබ්ධි නිර්මාණය කෙරේ.

එහෙත් මේ කිසිවක් බලය සඳහා වූ බයිබලීය පරමාර්ථයන් නොවේ.

## විජාතීන් මෙන් නොවේ

නායකත්වය පිළිබඳව යේසුස්වහන්සේ තම ගෝලයන්ට උගන්වන එක් අවස්ථාවක මෙසේ පැවසූ සේක.

> **... අන්‍යජාතීන්ගේ ආණ්ඩුකාරයන් ඔවුන් කෙරේ අධිපතිකම් කරන බවත් ඔවුන්ගේ උත්තමයන් ඔවුන් කෙරේ බලය පවත්වන බවත් නුඹලා දනිහුය. නුඹලා අතරේ එසේ නොවන්නේය. නුඹලා අතරේ යමෙක් උතුම් වෙන්ට කැමති නම් ඔහු නුඹලාගේ සේවකයා වන්නේය.**
> **නුඹලා අතරේ යමෙක් ප්‍රධානියා වෙන්ට කැමති නම් ඔහු නුඹලාගේ දාසයා වන්නේය. (මතෙව් 20:25-27)**

නායකත්වයට අමතරව වෙනත් බොහෝ ක්ෂේත්‍රවල භාවිත කළ හැකි වැදගත් මූලධර්මයක් යේසුස්වහන්සේ සිය අනුගාමිකයන්ට උගන්වමින් සිටි සේක. "අන්‍යජාතීන්" යන වචනය භාවිත කර ඇත්තේ දෙවියන්වහන්සේගේ නොවන සෙනඟ හා ජාතීන් හඳුනාගැනීමට වේ. දේව රාජ්‍යය ක්‍රියාත්මක වන්නේ ලෝකයේ ඇති මූලධර්මවලට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් ඒවා මත බව යේසුස්වහන්සේ පැහැදිලි කළ සේක.

බලය යන විෂය අදාළව ද මෙම මූලධර්මය සත්‍යයකි. බලය සඳහා වූ ලෞකික පරමාර්ථ හා බලය සඳහා දේව රාජ්‍යයේ පරමාර්ථ සමාන නොවේ. ලෝකයේ බලය භාවිත කරන්නේ ආත්මාර්ථකාමී පරමාර්ථයන් සඳහා වේ. දේව රාජ්‍යයේ එය භාවිත කරන්නේ ආත්මාර්ථකාමී නොවන පරමාර්ථයන් උදෙසා, දේව රාජ්‍යය ඉදිරියට ගෙනයාම සඳහාය.

ඇතැම් අය ආත්මික බලය අනිසි ලෙස භාවිත කරන අතර මහත් ආගමික හා නිකායවාදී සංවිධාන නිර්මාණය කිරීමට එය යොදා ගනිති. මූල්‍යමය අධිරාජ්‍යයන් නිර්මාණය කිරීමට හා පෞද්ගලික ප්‍රසිද්ධිය ලබා ගැනීමට ද ඔවුහු ඒවා භාවිත කරති. එහෙත් ඒවා ආත්මික බලය සඳහා වූ දේව වචනය තු=ළ ඇති පරමාර්ථයන් නොවේ. ඒවා ඇදහිලිවතුන්ට යේසුස්වහන්සේ විසින් පවරන ලද අධිකාරී බලයේ සත්‍ය පරමාර්ථයන් අනිසි ලෙස භාවිත කිරීමක් වේ. ආත්මික බලය අනිසි ලෙස භාවිත කිරීම පිළිබඳ නිදසුනක් වන්නේ නව ගිවිසුම් යුගයේ සිටි ලියන්නන් සහ පරිසිවරුන්ය. යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක.

> **පරිසිවරුනි, නුඹලාට දුක්වේ. මක්නිසාද නුඹලා සිනගෝගවලදී ප්‍රධාන ආසනවලට ද වෙළඳාම්පළවලදී ආචාර ලැබීමට ද කැමති වන්නහුය.**
> **නුඹලාට දුක්වේ. මක්නිසාද නුඹලා නොපෙනෙන සොහොන් ගෙවලට සමානය, ඒවා උඩ ඇවිදින මිනිස්සු ඒවා නොදනිති. (ලූක් 11:43-44)**

ලියන්නෝ ද පරිසිවරු ද බලගතු ආගමික නායකයෝ වූහ. ඔවුහු මේ බලය පෞද්ගලික අවශ්‍යතාවන් සඳහා යොදා ගත්හ. ඔවුහු සිනගෝගයේ දී ඉතා අනර්ඝ ආසනවල ඉඳගත්හ. වෙළඳාම්පොළවලදී විශේෂ ආචාර ලබාගැනීමට ඔවුහු ක්‍රියා කළහ. එමෙන්ම සෙනඟ පාලනය කිරීමට ද ඔවුහු මෙම බලය යොදා ගත්හ.

> **ලියන්නෙනි, පරිසිවරුනි, වංචාකර වූ නුඹලාට දුක්වේ. මක්නිසාද නුඹලා මනුෂ්‍යයන්ට එන්ට නොදී ස්වර්ග රාජ්‍යය වසා, නුඹලාට ඇතුල් වෙන්නේවත් ඇතුල්වෙමින් සිටින්නන්ට ඇතුල්වෙන්ට ඉඩ නොදෙන්නේවත් නැත. (මතෙව් 23:13)**

> **ලියන්නෙනි, පරිසිවරුනි, වංචාකාර වූ නුඹලාට දුක්වේ. මක්නිසාද නුඹලා එක්කෙනෙකු හරවාගන්න පිණිස මුහුදත්, ගොඩත් හැමතැනම ඇවිදින්නහුය; හරවා ගත්තාම නුඹලාටත් වඩා දෙගුණයක් ඔහු නිරයේ පුත්‍රයෙකු කරන්නහුය. (මතෙව් 23:15)**

පරිසිවරු ආගමික බලය මහත් සේ බාහිරව පෙන්වූහ. එහෙත් එය භාවිත කළේ පෞද්ගලික වාසි සඳහා වේ.

> **ලියන්නෙනි, පරිසිවරුනි, කෛරාටිකයෙනි ඔබට වන විපතක මහත! මන්ද ඔබ බොරු පෙනුමට දිගින් දිගට යාච්ඤා කරතත්, ඔබ වැන්දඹුවන්ගේ ගේ දොර කා දමති. ඔබට ඉතා බරපතල දඬුවමක් ලැබෙනු ඇත. (මතෙව් 23:14)**

ඔවුන්ට ආගමික බලය තිබුණ ද සැබෑ ආත්මික බලය තිබුණේ නැත. ඔවුන් ලකුණු නොකරන ලද සොහොන් ගෙවලට සමාන බවත්, එතරම්ම මළ මිනී මෙන් බල රහිත බැවින් මිනිසුන් ඔවුන් මත ඇවිදින බවත් යේසුස්වහන්සේ පැවසූ සේක.

## බලය සඳහා වන බයිබලීය පරමාර්ථ

ආත්මික බලය සඳහා බයිබලීය පරමාර්ථ මෙසේය:

### ගැළවීම

ගැළවීම ආත්මික බලයේ මූලික පරමාර්ථයකි.

> **යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිගත්තෝ ද එනම් උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහාගත්තෝ ද ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන් වෙන්ට උන්වහන්සේ බලය දුන් සේක. (යොහන් 1:12)**

> **මක්නිසාද කුරුසියේ වචනය විනාශ වන්නන්ට මෝඩ කමය; නුමුත් ගැළවෙන්නාවූ අපට ඒක දෙවියන්වහන්සේගේ බලයය. (1 කොරින්ති 1:18)**

දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීමේ ප්‍රතිඵලය, ගැළවීම වේ. ලිද්දා හා ෂෙරොන් ගම්වල සෙනඟ ස්වාමීන්වහන්සේ වෙතට හැරුණේ, අට අවුරුද්දක් අංගභාග රෝගියෙක්ව ඔත්පළව හුන් අයිනෙයස් නම් මනුෂ්‍යයෙකුගේ සුවවීම නිසා වේ (ක්‍රියා 9)

### සාක්ෂිදීම

ඇදහිලිවතුන්ට පවරන ලද ආත්මික බලයේ ප්‍රධාන පරමාර්ථයක් දෙනු ලැබුයේ, යේසුස්වහන්සේ පළමුවරට මෙම බලය පොරොන්දු වූ විට වේ.

> **නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණී කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමේ ද මුළු යුදයෙහි ද සමාරියෙහි ද පොළොව සීමාව දක්වා ද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය. (ක්‍රියා 1:8)**

ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය පිළිබඳව තව දුරටත් ඉදිරියේ දී මෙම පාඨමාලාවෙන් ඉගෙන ගන්නෙහිය.

යේසුස්වහන්සේ සිය අනුගාමිකයන්ට පැවරූ බලය ඔවුන් වෙත ලැබෙන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ පැමිණීමෙන් පසුව වේ. බලයේ පරමාර්ථය වන්නේ බලවත්වූ ශුභාරංචිය පිළිබඳ සාක්ෂිය යෙරුසලමෙන් පටන්ගෙන පොළොවේ සීමාව දක්වා පැතිරවීමය.

මෙම ආත්මික බලයේ පළමු ප්‍රදර්ශනය ප්‍රේරිතවූ පේතෘස්තුමා තුළින් දක්නට ලැබිණි. ශුද්ධාත්මයාණන්වහන්සේ ලද පසු ඔහු ශුභාරංචිය පිළිබඳ ප්‍රබල සාක්ෂියක් දුන් අතර ඉන් 3000ක් පමණ සෙනඟ ගැළවීම ලැබූහ. යේසුස්වහන්සේ අල්ලාගනු ලැබූ අවස්ථාවේ පැන ගියේද මෙම පේතෘස්මය. ස්වාමීන්වහන්සේව හඳුනන්නේ නැති බව පැවසුවේද මෙම පේතෘස්මය. සිදුවූයේ කුමක්ද?

පේතෘස්තුමාට ආත්මික බලය පැවරිණි. ඔහුට යේසුස්වහන්සේ ප්‍රකාශ කළ ''ඔබ මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය'' යන බලයේ පරමාර්ථය මතක් විය. ඔහුට බලය ලැබුණු විට ඔහු එම බලය නිවැරදි පරමාරථය උදෙසා, එනම් ගැළවීම නොලද මනුෂ්‍යයන්ට ශුභාරංචිය පැතිරවීමට භාවිත කළේය.

විනිශ්චය ශාලාවේදී ''සාක්ෂිකරුවෙකු''ට කරුණු දෙකක් ගැන සැලකිලිමත් විය යුතුය. වාචික සාක්ෂිය හා සාධකය වේ. ආත්මික ක්ෂේත්‍රයේ ද මෙය සත්‍යයකි. ශුභාරංචිය පිළිබඳ අපගේ සාක්ෂියේ වාචික සාක්ෂියත් සාධකයත් තිබිය යුතුය. සාධකය යනු දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීමකි.

> **ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත නැගිටීම ගැන ප්‍රේරිතයෝ මහත් බලයකින් සාක්ෂි දුන්නෝය. මහත් අනුග්‍රහය ඔවුන් සියල්ලන් කෙරෙහි තිබුණේය. (ක්‍රියා 4:33)**

පාවුල්තුමා මෙසේ ලියා ඇත.

> **මක්නිසාද අපේ ශුභාරංචිය නුඹලා වෙතට පැමුණුණේ වචනයෙන් පමණක් නොව බලයත්... ඇතුවය. (1 තෙසලෝනික 1:5)**

සෑම කෙනෙකුටම සාක්ෂිකරුවන් වන පිණිස ලෝකයට යන ලෙස දෙන ලද ආඥාව ඉටු කරන අය සමඟ වැඩ කිරීමට යේසුස්වහන්සේ පොරොන්දු වූ සේක. ඇතැම් අය ඔවුන්ගේ දේව සේවයෙහි බලවත් ලකුණු බලාපොරොත්තු වෙති. එහෙත් ලෝකයට යන ලෙස දෙන ලද ආඥාව ඔවුන් ඉටු කරන්නේ නැත. යේසුස්වහන්සේ පොරොන්දු වූ බලය ලැබෙන්නේ මේ ආඥාව ඉටුකරන අයට වේ.

## නිර්භීතකම

> **මක්නිසාද දෙවියන්වහන්සේ අපට දුන්නේ බයාදුකමේ ආත්මයක් නොව බලයේත්, ප්‍රේමයේත් හික්මවීමේත් ආත්මයක්ය. (2 තිමෝති 1:7)**

මුල් සභාවෙන් ශුභාරංචිය නිර්භීත ලෙස පැතිරවීමට හේත= වූයේ පවරන ලද ආත්මික බලය නිසා වේ.

> **ඔවුන් යාච්ඤා කළ පසු, ඔවුන් රැස්ව සිටි ස්ථානය කම්පා විය; ඔවුන් සියල්ලෝ ද ශුද්ධාත්මයෙන් පූර්ණව, දෙවියන්වහන්සේගේ වචනය නිර්භීත ලෙස කථා කළෝය. (ක්‍රියා 4:31)**
>
> **නුමුත් බාර්ණබස් ඔහු (පාවුලුතුමා) ගෙන ප්‍රේරිතයන් ළඟට කැඳවාගෙන ගොස් ... ඔහු නිර්භීත ලෙස දේශනා කළ හැටි ඔවුන්ට කියා දුන්නෝය (ක්‍රියා 9:27)**
>
> **ඔහු සිනගෝගයේදී නිර්භීතව කථාකරන්ට පටන් ගත්තේය. (ක්‍රියා 18:26)**
>
> **ඔහු සිනගෝගයේදී ඇතුල්ව දෙවියන්වහන්සේගේ රාජ්‍යය සම්බන්ධ කාරණා ගැන තර්කකරමින් ද උගන්වමින් ද තුන් මසක් අතරතුරේ භය නැතුව කථා කළේය. (ක්‍රියා 19:8)**
>
> **... දෙවියන්වහන්සේගේ ශුභාරංචිය නුඹලාට කියා දෙන්ට අපගේ දෙවියන්වහන්සේ තුළ නිර්භීත වුණෙමුව. (1 තෙසලෝනික 2:2)**

## දෙවියන්වහන්සේගේ කාර්යයන් කිරීම

යේසුස්වහන්සේගේ බලවන්ත ක්‍රියා ගැන ගෝලයෝ පුදුම වූහ.

> **උන්වහන්සේ (යේසුස්වහන්සේ) එතැනින් පිටත්ව ගොස් තමන්ගේම රටට පැමිණි සේක. ගෝලයෝ උන්වහන්සේ කැටුව ගියෝය.**
> **සබත්දවස පැමිණිකල උන්වහන්සේ සිනගෝගයෙහි උගන්වන්ට පටන්ගත් සේක. බොහෝ දෙනෙක් ඒ අසා මවිතව, මොහුට මේ දේවල් කොයින්ද? මොහුට දී තිබෙන ප්‍රඥාව කිමෙක්ද? මොහුගේ අතින් කරන ලද බලවත් ක්‍රියාවලින් හැඟෙන්නේ කිමෙක්ද? (මාක් 6:1-2)**

යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක.

> **දහවල්ව තිබියදී මා එවූ තැනැන්වහන්සේගේ වැඩ අප විසින් කටයුතුය. රාත්‍රිය පැමිණෙයි, එවිට කිසිවෙකුට වැඩකරන්න නුපුළුවන. (යොහන් 9:4)**

යේසුස්වහන්සේට නිශ්චිත පරමාර්ථයක් තිබිණි. උන්වහන්සේ දෙවියන්වහන්සේගේ වැඩ කළ යුතුය. මෙය උන්වහන්සේගේ පෙළඹවීම වේ. ස්වල්ප කාලයක් මේ දේවල් දුටු පසු, ගෝලයෝ යේසුස්වහන්සේ ළඟට පැමිණ මෙසේ ප්‍රශ්නය ඇසූහ.

> **... දෙවියන්වහන්සේගේ වැඩ ඉෂ්ට කරන පිණිස අප විසින් කුමක් කටයුතුද? (යොහන් 6:28)**

යේසුස්වහන්සේ මෙසේ පිළිතුරු දුන් සේක.

> **... දෙවියන්වහන්සේගේ වැඩය නම් උන්වහන්සේ එවූ තැනැත්තා කෙරෙහි නුඹලා විසින් අදහාගැන්මය. (යොහන් 6:29)**

දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨතම ක්‍රියා යේසුස්වහන්සේ තුළින් ප්‍රකාශ විනි. ස්වාමීන්වහන්සේ සිය ගෝලයන්ගේ අවධානය යොමු කළේ මෙම කරුණ ගැන මිස ලකුණු හා හාස්කම් පිළිබඳ දෘශ්‍ය ප්‍රදර්ශනය ගැන නොවේ. සත්‍ය හාස්කම් සැමවිටම යේසුස්වහන්සේ උසස් කරයි. මෙය දෙවියන්වහ්සේගේ ක්‍රියාවකි.

පසුව, යේසුස්වහන්සේ උන්වහන්සේගේ අනුගාමිකයන්ට මෙසේ පැවසූ සේක.

> **සැබවක් සැබවක් නුඹලාට කියමි. මා කෙරෙහි අදහාගන්නා මා කරන ක්‍රියාත් කරන්නේය, මා පියාණන්වහන්සේ ළඟට යන නිසා මීට වඩා මහත් ක්‍රියාත් ඔහු කරන්නේය. (යොහන් 14:12)**

උන්වහන්සේගේ අනුගාමිකයන් ද උන්වහන්සේ කළ වැඩ ම කළ යුතු විය. බලය ක%ියා කි×මේ හැකියාව අතීතයෙන් අවසන් වී නැත. අනුගාමිකයන් මහත් දේ කරන්නේය. යේසුස්වහන්සේ නැවත ස්වර්ගයට යන බැවින් මේ ක%ියා ප්‍රමාණයෙන් මිස ගුණාත්මක බවින් වැඩි නොවේ.

උන්වහන්සේගේ පොරොන්දුව සත්‍ය විය. ඇදහිලිවන්තයන් කරන්නාවූ දෙවියන්වහන්සේගේ කාර්යයන් ක්‍රියා පොත පුරාම අපට දැකගත හැකිය. රෝගීන් සුව කෙරේ, යක්ෂයන් පලවා හරිනු ලැබේ, සිරගෙවල දොරවල් විවෘත වේ සහ මළවුන් නැවත නැගිටවනු ලැබේ.

## දෙවියන්වහන්සේ එළිදරව්වීම

දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ බලය පොළොවේ ප්‍රදර්ශනය කිරීමට එක් හේතුවක් වන්නේ තමන්වහන්සේවම මනුෂ්‍යයාට එළිදරව් කිරීමට බැව් ඔබ උගත්තෙහිය. ඇදහිලිවතුන්ට ආත්මික බලය පවරන්නේ ද මේ නිසාම වේ.

> **නුමුත් සමූහයෝ ඒ දැක භයවී, මෙබඳු බලය මනුෂ්‍යයන්ට දුන් දෙවියන්වහන්සේට ගෞරව කළෝය. (මතෙව් 9:8)**

බලගතු සභාවක් තුළින් මුළු විශ්වයටම තමන්වහන්සේව එළිදරව් කිරීම දෙවියන්වහන්සේගේ කැමැත්ත වේ.

> **එසේ වූයේ, මේ කාලයේදී, ශුද්ධ සභාව මගින් ස්වර්ග ලෝකවල අධිපතීන්ටත්, බලධාරීන්ටත්, දෙවියන්වහන්සේගේ විවිධාකාර ප්‍රඥාව දන්වනු ලබන පිණිසය. (එපීස 3:10- නව අනුවාදය)**

බලය තුළින් මේ එළිදරව්වීමේ පරමාර්ථය වන්නේ;

> **... මා කෙරෙහි ඇදහිමෙන් ඔවුන් පව්කමාවද පිරිසිදු කරනු ලැබූ අයවලුන් අතරේහි උරුමයක්ද ලබන පිණිස, ඔවුන් අන්ධකාරයෙන් ආලෝකයට ද සාතන්ගේ බලයෙන් දෙවියන්වහන්සේ වෙතට ද හැරෙන ලෙස ඔවුන්ගේ ඇස් පහදවන්ට ඔවුන් වෙත නුඹ යවමියි කීසේක. (ක්‍රියා 26:17-18)**

## දේවරාජ්‍යය එළිදරව් කිරීම

දේව රාජ්‍යය ප්‍රකාශ කිරීමත් එය ප්‍රදර්ශනය කිරීමත් යේසුස්වහන්සේ එකට සම්බන්ධ කළ සේක. "එන්නාවූ තැනැත්තේ ඔබ ද"යි (ලූක් 7:19) යේසුස්වහන්සේගෙන් ප්‍රශ්න කළ විට උන්වහන්සේ වාදයෙන් හෝ තර්කයෙන් හෝ පිළිතුරු නුදුන් සේක. උන්වහන්සේ මෙසේ පැවසීය.

> **නුඹලා ඇසූ දුටු දේ ගොස් යොහන්ට දන්වාපල්ලා; බිහිරන්ට ඇසෙයි, මළාහු නැගුටුවනු ලබති, අන්ධයෝ පෙනීම ලබති, කොරු ඇවිදිති, කුෂ්ඨ රෝගීහු පවිත්‍ර කරනු ලබති, දිළිඳුන්ට ශුභාරංචිය ප්‍රකාශ කරනු ලැබේ. (ලූක් 7:22)**

දේවරාජ්‍යයේ ක්‍රියාකාරිත්වය බලය මගින් පෙන්නුම් කෙරේ. දේව රාජ්‍යය අත ළඟ බව යේසුස්වහන්සේ කළ හාස්කම්වලින් පෙන්නුම් කෙරේ. අලුත් අහසත් අලුත් පොළොවත් මැවූ විට දේව රාජ්‍යයේ දෘශ්‍ය ආකාරය මේවායින් පැහැදිලි කෙරේ.

- යක්ෂයින් පලවා හැරීමෙන් පෙන්නුම් කෙරෙන්නේ සාතන්ගේ රාජ්‍යය දෙවියන්වහන්සේ ආක්‍රමණය කිරීම හා ඔහුගේ අවසාන විනාශයයි: මතෙව් 12:29; මාක් 3:27; ලූක් 11:21; යොහන් 12:31; එළිදරව් 20:1;

- රෝගීන් සුවකිරීම, සියලු දුක් විඳීම් අවසන් වන දිනයේ පැමිණීම බලාපොරොත්තු වේ. එළිදරව් 21:4

- ආහාර ආශ්චර්යමත් ලෙස සැපයීම, සියලු මනුෂ්‍ය අවශ්‍යතාවන් අවසන් වන දිනය පිළිබඳව පවසයි. එළිදරව් 7:1

- කුණාටු නිශ්චල කිරීම, පොළොවට තර්ජනය කිරීම සඳහා ස්වභාවධර්මය භාවිත කෙරෙන බලය පරාජය කර ලබන ජයග්‍රහණය බලාපොරොත්තු වේ. එළිදරව් 21:1

- මළවුන් නැගුටුවීම, මරණය සඳහටම නැති කරන බව දන්වයි. 1 කොරින්ති 15:26

## වචනය සහතික කිරීම

බලවන්ත ලකුණු හා විශ්මයජනක දේ මගින් දේව වචනය ස්ථිර කෙරේ.

> **එහෙයින් ඔවුහු ස්වාමීන්වහන්සේ තුළ නිර්භීතව කථාකරමින් බොහෝ කලක් නැවතී සිටියෝය. උන්වහන්සේ ඔවුන්ගේ අත්වලින් හාස්කම් ද පුදුම ද කරවමින් ස්වකීය අනුග්‍රහයේ වචනයට සාක්ෂි දැරූ සේක. (ක්‍රියා 14:3)**

**දැනුදු ස්වාමිනි, ඔවුන්ගේ තර්ජන බලා සුව කිරීමට ඔබගේ අත දිගුකරන කල, ඔබගේ වචනය නිර්භීතකමින් කථාකරන්ටත් ඔබගේ ශුද්ධ සේවකයා වූ යේසුස්වහන්සේගේ නාමය කරණකොටගෙන හාස්කම් ද පුදුම ද කරන්ටත් ඔබගේ දාසයන්ට වර දුන මැනවයි කීවෝය.** (ක්‍රියා 4:29-30)

**ඔවුහු පිටත්ව ගොස්, සියලු තැන්වල දේශනා කළෝය. ස්වාමින්වහන්සේ ද ඔවුන් සමග ක්‍රියා කරමින් ඔවුන් අතින් සිදුවූ ලකුණුවලින් වචනය ස්ථිර කළ සේක.** (මාක් 16:20)

## අන් අයට කරන සේවය

සේවය සඳහා යේසුස්වහන්සේව සන්නද්ධ කිරීමට දෙවියන්වහන්සේගේ බලය උන්වහන්සේ මත වූ සේක.

**ප්‍රඥාව හා නුවණේ ආත්මය ද, මන්ත්‍රණය හා බලයේ ආත්මය ද දැනගැන්ම හා ස්වාමින්වහන්සේ කෙරෙහි භයවීමේ ආත්මය ද උන්වහන්සේ කෙරේ පිහිටන්නේය.** (යෙසායා 11:2)

**ස්වාමිවූ දෙවියන්වහන්සේගේ ආත්මය මා කෙරෙහිය; මක්නිසාද දිළිඳුන්ට ශුභාරංචිය දේශනා කරන්ට ස්වාමින්වහන්සේ මා ආලේප කළ සේක; බිඳුනු සිත් ඇත්තන් සුව කරන්ට ද වහලුන්ට නිදහසත් හිරකාරයන්ට හිරගෙයින් මිදීමත් ප්‍රකාශ කරන්ට ද... උන්වහන්සේ මා එවූ සේක** (යෙසායා 61:1).

**දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන් ද බලයෙන් ද නාසරීය යේසුස්වහන්සේ ආලේප කළ බවත්, දෙවියන්වහන්සේ උන්වහන්සේ සමග සිටින බැවින් උන්වහන්සේ යහපත්කම් කරමින්ද යක්ෂයා විසින් පීඩාකරන ලද සියල්ලන් සුව කරමින්ද හැසුරුණු බවත්ය.** (ක්‍රියා 10:38)

**උන්වහන්සේගේ ඉගැන්වීම් ගැන ඔවුහු විශ්මිත වූවෝය. මක්නිසාද උන්වහන්සේ ලියන්නන් මෙන් නොව බලය ඇති කෙනෙකු මෙන් ඉගැන්වූ සේක.** (මාක් 1:22)

මෙම බලයම, මුල් සභාවේ ඇදහිලිවතුන්ගේ සේවය තුළින් පෙන්නුම් කළේය. පාවුලුතුමා මෙසේ පැවසිය.

**දෙවියන්වහන්සේගේ බලයේ ක්‍රියාකිරීමේ ප්‍රකාරයට මට දෙන ලද උන්වහන්සේගේ ඒ කරුණාවේ දීමනාව හැටියට මම ඒ ශුභාරංචියේ සේවකයෙක් කරනු ලැබුයෙමි.** (එපිස 3:7)

ඔබ තුළ දෙවියන්වහන්සේගේ බලය කාර්යක්ෂමව ක්‍රියා කිරීම ඔබගේ සේවයේ ප්‍රතිඵලයකි. ඔබගේ සේවයේ ආරම්භයත් දෙවියන්වහන්සේගේ බලය තුළින් එය පරිණතභාවයට වර්ධනයවීමත් සිදු වේ. පාවුලුතුමා මෙසේ පැවසිය.

**මාගේ කථාවත් මාගේ දේශනාකිරීමත් ප්‍රඥාවේ සිත් පොළඹන්නාවූ වචනවලින් නොව ආත්මයාණන්වහන්සේගේ ද බලයේ ද ප්‍රකාශ කිරීමෙන් විය.**
**එසේ වූණේ නුඹලාගේ ඇදහිල්ල දෙවියන්වහන්සේගේ බලයෙන් මිස මනුෂ්‍යයාගේ ප්‍රඥාවෙන් නොපිහිටින පිණිසය.** (1 කොරින්ති 2:4-5)

මුල් සභාව බිහිවූයේ දෙවියන්වහන්සේගේ බලය ප්‍රකාශ කිරීමෙන් මිස ශ්‍රේෂ්ඨ කතා වලින් හෝ දේවධාර්මික විවාදවලින් හෝ නොවේ. මේ නිසා ඔවුන් විශ්වාසය තැබුවේ දක්ෂ කතා පැවැත්වීමේ හැකියාව මත නොව දෙවියන්වහන්සේ වෙතය.

දෙවියන්වහන්සේගේ බලය, ආත්මික සේවයේ සෑම ක්ෂේත්‍රයක් කෙරෙහිම බලපෑමක් ඇති කරයි. ඒවා අතර ශුභාරංචිය පැතිරීම ද රෝගීන්ට, පීඩාවට පත්වූවන්ට හා යක්ෂාවේශ බලවේගවලින් බැඳුනවුන්ට සේවය කිරීමද වේ.

**යේසුස්වහන්සේ ඔවුන් ළඟට ඇවිත් කථා කොට: ස්වර්ගයෙහි ද පොළොවෙහි ද සියලු බලය මට දී තිබේ. එබැවින් නුඹලා ගොස් සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා. (මතෙව් 28:18-19)**

**අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්: ඔවුහු මාගේ නාමයෙන් යක්ෂයන් දුරු කැන්නෝය; අන් භාෂාවලින් කථා කරන්නෝය; සර්පයන් අල්ලා ගන්නෝය, යම් මරණීය වස ජාතියක් බීවත් එයින් කිසිසේත් ඔවුන්ට අනතුරක් නොවන්නේය; ඔවුන් රෝගීන් පිට අත් තැබූ කල්හි, ඔවුහු සුවය ලබන්නෝය. (මාක් 16:17-18)**

**තවද උන්වහන්සේ තමන් ගෝලයන් දොළොස්දෙනා තමන් ළඟට කැඳවා, අශුද්ධාත්මයන් දුරුකරන්ට ඔවුන් කෙරෙහි ද සියලු ආකාර ලෙඩ සහ සියලු ආකාර රෝග සුව කිරීමට ද ඔවුන්ට බලය දුන් සේක. (මතෙව් 10:1)**

ඔබ දේව සේවකයෙකු ලෙස අනුමැතිය ලබන්නේ දෙවියන්වහන්සේගේ බලය තුළිනි.

**සත්‍යතාවේ වචනයෙන් ද දෙවියන්වහන්සේගේ බලයෙන් ද...**
**මේ සියල්ලෙන් අපි දෙවියන්වහන්සේගේ සේවකයන් මෙන් අපට පිළිගන්වමු. (2 කොරින්ති 6:7,10)**

## ආත්මික යුද සංග්‍රාමයක් සඳහා

ශුභාරංචිය පැතිරවීම සඳහා දී ඇති බලයේ පරමාර්ථය ඔබ සාක්ෂාත් කරන විට ඔබට සාතන්ගේ විරෝධතාවට මුහුණ දීමට සිදුවේ. ආත්මික සංග්‍රාමය වෙනුවෙන් ඔබට යේසුස්වහන්සේ බලය පවරා ඇත. උන්වහන්සේ ඔබට සියලු සතුරු බලවේග ජයගැනීමට බලය දී තිබේ.

**බලව සර්පයන් ද ගෝනුස්සන් ද පාගන්ටත් සතුරාගේ මුළු ශක්තිය මැඩපවත්වන්ටත් මා විසින් නුඹලාට බලය දී තිබේ. කොයි දෙයකින්වත් නුඹලාට අන්තරායක් නොවන්නේය. (ලූක් 10:19)**

**ඉතින් ස්වාමින්වහන්සේ තුළ ද උන්වහන්සේගේ ශක්තියේ බලවත්කමෙහි ද බලවත් වෙයල්ලා. යක්ෂයාගේ උපායවලට විරුද්ධව සිටින්ට නුඹලාට පුළුවන් වන පිණිස දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ පැළඳගනිල්ලා.**
**මක්නිසාද අපේ පොර බැඳීම වනාහි මාංසයට සහ රුධිරයට විරුද්ධව නොව, අධිපතිකම්වලටත් පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාරයේ ලෝක මුලාදෑනීන්ටත් ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධවය. (එපීස 6:10-12)**

## ආත්මික වැරදි වලක්වා ගැනීම

මනුෂ්‍යයන් ආත්මික වැරදිවලට අසුවන්නේ හේතු දෙකක් නිසාය.

**යේසුස්වහන්සේ උත්තර දෙමින්: නුඹලා ශුද්ධලියවිලිවත් දෙවියන්වහන්සේගේ බලයවත් නොදැන වරද්දාගන්නහුය. (මතෙව් 22:29)**

ඔබ දේව වචනය නොදන්නෙහි නම් ප්‍රතිඵලය ආත්මික වරද වේ. මක්නිසාද ඔබ රැවටිලිකාර ධ[1]මයන් හා සාවද්‍ය ඉගැන්වීම්වලට විවෘතවන බැවිනි. එමෙන්ම ඔබ දෙවියන්වහන්සේගේ බලය නොදන්නෙහි නම් ආත්මික වැරදි සිදුවේ. ඔබ සතුරාගේ රැවටිලිකාර බලයට විවෘතය. සතුරාගේ බලයට එරෙහිවීම සඳහා ඔබට ආත්මික බලය නොමැති විට ඔබ ඔබට විරුද්ධව ක්‍රියා කරන ඔහුගේ බලයට ගොදුරු වේ.

සමහරු එක්තරා ආකාරයකින් භක්තිමත්ය, ශුභාරංචිය ද දනිති. එහෙත් ඔවුන් දෙවියන්වහන්සේගේ බලය ප්‍රතික්ෂේප කරති. බයිබලය මේ අය ගැන අනතුරු අඟවයි.

**... දේව භක්තියේ වේසය දරන නමුත්, එහි බලය එපාකළ අයව සිටින්නෝය. එබඳු අයගෙන් අහක් වෙයන්න. (2 තිමෝති 3:5)**

## පාපය පරදවා ජයග්‍රහණය කිරීම

ආත්මික බලය පාපය පරදවයි.

**පාපය නුඹ කෙරෙහි අධිපතිකම් නොකරන්නෝය. (රෝම 6:14)**

## ගොඩනැඟීම

පාවුලුතුමා කොරින්තිවරුන්ට මෙසේ ලියා ඇත.

**නුඹලා බිඳහෙළීම පිණිස නොව ගොඩනැගීම පිණිස ස්වාමින්වහන්සේ අපට දුන් බලය ගැන මම ටිකක් වැඩියෙන් පාරට්ටුකරතත් ලජ්ජා නොවන්නෙමි. (2 කොරින්ති 10:8)**

**මේ නිසා බිඳ හෙළීමට නොව ගොඩනැගීම පිණිස ස්වාමින්වහන්සේ මට දුන් බලය ලෙස මා නුඹලා ළඟ සිටින විට සැරකම පාවිච්චි නොකරන පිණිස ඈත්ව සිටින විට මේ දේවල් ලියා එවමි. (2 කොරින්ති 13:10)**

තමාට රිසි පරිදි මිනිසුන් පාලනය කිරීමට හෝ විනාශ කිරීමට හෝ තම අධිකාරී බලය යොදා නොගත යුතු බව පාවුලුතුමා දැනගෙන සිටියේය. තියුණු ලෙස කතා කිරීමේ ප්‍රවණතාවක් ඔහුට තිබුණු බව පෙනේ, එබැවින් ඔහු අසිරු දේ පිළිබඳව කොරින්තිවරුන්ට ලිවේය. දෙවියන්වහන්සේ ඔහුට දී ඇති ආත්මික බලය අනිසි ලෙස භාවිත කිරීමට ඔහුට අවශ්‍ය නොවීය. පාවුලුතුමාට දෙවියන්වහන්සේගෙන් බලය ලැබුණේ අන් අයව ගොඩනැගීමට මිස විනාශ කිරීමට නොවේ. "ගොඩනැඟීම" යනු ධෛර්යමත් කිරීමක් සහ ආත්මික වර්ධනයට අනුබලදීමක් වේ.

සභාව තුළ නියමාකාර විනයක් තබාගැනීමේ බලයක් අපට නැතැයි මින් අදහස් නොකෙරේ. නායකයන්ට අධිකාරී බලය දී ඇත්තේ දේව වචනයේ දී ඇති උපදෙස් අනුව විනයක් පවත්වාගෙන යාමට වේ.

## කැමැත්ත ඇති කිරීම

සෑම පුද්ගලයෙකුටම තමාගේම වූ කැමැත්ත තිබේ. එම කැමැත්ත නම් තෝරාගැනීමේ බලය වේ. බලය ප්‍රදර්ශනය කිරීමෙන් දෙවියන්වහන්සේ කෙරෙහි ඇති කැමැත්ත හෝ විවෘතභාවය හෝ ඇති කෙරේ.

**... ඔබගේ පරාක්‍රමයේ දවසේ දී ඔබගේ සෙනඟ කැමැත්තෙන් පූජා වෙති. (ගීතාවලිය 110:3)**

## දෙවියන්වහන්සේට ක්‍රියා කිරීමට අවස්ථාව දීම

දෙවියන්වහන්සේ ක්‍රියා කරන්නේ ඔබ තුළ උන්වහන්සේගේ බල ක්‍රියා කිරීමට ඔබ ඉඩ දී ඇති ප්‍රමාණය අනුව වේ.

**ඉතින් අප තුළ ක්‍රියා කරන්නාවූ බලයේ හැටියට අපි ඉල්ලන නොහොත් සිතන සෑම දේට වඩා අධික ලෙස කරන්ට බලය ඇත්තාවූ තැනැන්වහන්සේටම... ගෞරවය වේවා. (එපීස 3:20)**

ඔබ දෙවියන්වහන්සේගෙන් ඉල්ලන සෑමදේම ආත්මික සත්‍යයන් පිළිබඳව ඔබ සිතන සෑම දෙයක්ම – ඔබ තුළ ක්‍රියා කරන දෙවියන්වහන්සේගේ බලය නිසා බලපෑමක් ඇති වේ.

## ආත්මික ශක්තිය

දෙවියන්වහන්සේගේ බලය යනු ඔබ තුළින් ක්‍රියා කරන බලයක් පමණක්ම නොවේ. ඔබ පැවැත්මට ලැබෙන්නාවූ ශක්තිය ද වේ. පාවුලුතුමා මෙසේ පැවසිය.

**ප්‍රීතිය ඇතුළ සියලු ආකාර ස්ථිර කමටත් ඉවසිලිවන්ත කමටත් උන්වහන්සේගේ තේජසේ පරාක්‍රමයේ හැටියට සියලූ ආකාර බලයෙන් ශක්තිමත් වෙමින්ද ... (කොලොස්සි 1:11)**

විවිධ අවස්ථාවල, ඔබ දුක් විඳින අවස්ථාවල ඉවසීම අවශ්‍ය වූ විට, දෙවියන්වහන්සේගේ බලය ඔබ ශක්තිමත් කරයි. උන්වහන්සේගේ මහිමාන්විත බලය ඔබ තුළ ක්‍රියාකරන බැවින් ඔබට අසිරු අවස්ථාවන්ට මුහුණ දිය හැකිය. එය ඔබගේ (සීමිත) ශක්තිය මැන බැලීමක් නොවේ. ඔබ "සියලු .. ආකාර බලයෙන්" ශක්තිමත් කරනු ලැබේ. එනම් දෙවියන්වහන්සේ තුළින් ගලා එන සියලු බලයත් ශක්තියත් අවශ්‍යතාවන් ඇතිවිට ඔබට ඇත්තාවූ අභ්‍යන්තර සම්පත් වේ. එය ඔබ තුළ ක්‍රියා කරන උන්වහන්සේගේ බලයේ වැදගත් පරමාර්ථයක් වේ.

**උන්වහන්සේද, මාගේ කරුණාව නුඹට සෑහේය, මක්නිසාද දුර්වලකමේදී මාගේ බලය සම්පූර්ණ වන්නේයයි මට කීසේක, එබැවින් ක්‍රිස්තුස්වහන්සේගේ ශක්තිය මා කෙරෙහි පිහිටන පිණිස මාගේ දුර්වලකම් ගැන ඉතා සන්තෝෂයෙන් පාරට්ටු කරන්නෙමි.** (2 කොරින්ති 12:9)

## රැකගැනීම

මෙම යුගයේ අවසානය තෙක් ඔබ අපේක්ෂා කරනු ලබන්නේ දෙවියන්වහන්සේගේ බලය මගිනි.

**දෙවියන්වහන්සේගේ විමුක්තිදායක අරමුණ එළිදරව් කරන්නට යන අන්තිම කාලය දක්වා, ඔබගේ ඇදහිල්ල නිසා දෙවියන්වහන්සේගේ බලය කරණකොටගෙන ඔබ ආරක්ෂා කරනු ලබන්නහුය.** (1 පේතෘස් 1:5 – නව අනුවාදය)

## නැවත නැගිටුවීම – පුනරුත්ථාපනය

ඔබ ජීවත්වන්නේ මැරෙණ සුළු ශරීරයක් ඇතිවය; එය යේසුස්වහන්සේ මොලොවට නොපැමිණියහොත්, මියයනු ඇත. පුනරුත්ථාපනයේදී ඔබගේ මැරෙණ සුළු ශරීරය නැගිටුවනු ලබන්නේ ආත්මික බලය මගිනි.

**(ශරීරය) අගෞරවයෙන් යුතුව වපුරනු ලැබේ; තේජසින් යුතුව නැගුටුවනු ලැබේ. දුර්වලකමෙන් යුක්තව වපුරනු ලැබේ; බලයෙන් යුක්තව නැගුටුවනු ලැබේ.** (1 කොරින්ති 15:43)

**දෙවියන්වහන්සේ ස්වාමින්වහන්සේව නැගිටෙවූ සේක. අපත් තමන්වහන්සේගේ බලයෙන් නැගුටුවන සේක.** (1 කොරින්ති 6:14)

## සදාතන ජීවනය

දෙවියන්වහන්සේගේ බලයෙන් නොනිමි ජීවිතයක් ලැබේ.

**මාංසයට අයිති ආඥාපනතේ හැටියට නොව පහ නොවන ජීවිතයක හැටියට නැගිටින්නේ නම්...** (හෙබ්‍රෙව් 7:15)

## සියලු දේ සඳහා

ජීවිතයට හා භක්තිවන්තකමට අදාළ සියලු දේ ඔබට දී ඇත්තේ දෙවියන්වහන්සේගේ බලය මගිනි.

**තමන්වහන්සේගේ මහිමයෙන් හා ගුණවන්තකමෙන් අප කැඳවාගත් තැනැන්වහන්සේ දැනගැනීම කරණකොටගෙන උන්වහන්සේගේ දිව්‍ය බලයෙන් ජීවිතයටත් දේව භක්තියටත් අදාළ වූ සියලු දේ අපට දී තිබේ.** (2 පේතෘස් 1:3)

ජීවිතයට අදාළ බොහෝ දේ ගැන සිතා බලන්න. දේවභක්තියට අදාළ බොහෝ සත්ගුණයන් ගැන සිතා බලන්න. උන්වහන්සේගේ දිව්‍යමය බලයේ පරමාර්ථය වන්නේ ඔබට මේ දේ - සියලු දේ දීම වේ.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. ආත්මික බලය, ලෞකික බලයෙන් වෙනස්වන්නේ කෙසේද?

3. ලෝකයේ මූලධර්ම දේවරාජ්‍යයේ ඒවාට වඩා ප්‍රතිවිරුද්ධ බව උගන්වන බයිබල් යොමුවක් දෙන්න.

4. ආත්මික බලය සඳහාවූ පරමාර්ථ බොහොමයක් ඔබ මේ පාඩමෙන් උගත්තෙහිය. මේ පරමාර්ථ අතුරින් තුනක් පිළිබඳව ඔබ උගත් දේ ඉතා කෙටියෙන් සාරාංශ කර ජේදයක් ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ජේදය අවසානයේ පරීක්ෂණ වලට පිළිතුරු සපයා ඇත)

## තවදුරටත් ඉගෙනීම සඳහා

1. යේසුස්වහන්සේ කළ වැඩ ඇදහිලිවතුන් ද කරන බව උන්වහන්සේ පැවසූ සේක. මතෙව්, මාක්, ලූක් හා යොහන් ශුභාරංචි කියවන්න. යේසුස්වහන්සේ කළ සියලු ක්‍රියාවන්ගේ ලයිස්තුවක් සකස් කරන්න. දෙවියන්වහන්සේගේ බලය තුළින් ඔබට කළ හැකි ක්‍රියාවන් ද මේවාම වේ.

2. පහතින් දැක්වෙන්නේ, මෙම පරිච්ඡේදයේ සාකච්ඡා කළ බලයේ පරමාර්ථයන් වේ. ඔබගේ ආත්මික මට්ටම ද තක්සේරු කරන්න. මේවා අතුරින් ඔබගේ ජීවිතයේ හා සේවයේ දැනටමත් ප්‍රකාශ කෙරෙන්නාවූ පරමාර්ථයන් මොනවාද? දැනට එසේ ප්‍රකාශ කෙරෙන ඒවා ඉදිරියෙන් (+) ලකුණක් යොදන්න. ප්‍රකාශ කළ යුතුව ඇති ඒවා ඉදිරියෙන් (-) ලකුණක් යොදන්න.

ගැළවීම
සාක්ෂි දැරීම
නිර්භීතකම
දෙවියන්වහන්සේගේ කාර්යයන් කිරීම
දෙවියන්වහන්සේ එළිදරව් කිරීම
දේව රාජ්‍යය එළිදරව් කිරීම
දේව වචනය ස්ථිර කිරීම
අන් අයට සේවය කිරීම
ආත්මික සංග්‍රාමය
ආත්මික වැරදි වළක්වා ගැනීම
පාපය පරාජය කිරීම
ගොඩනැගීම
කැමැත්ත ඇති කිරීම
ඔබ තුළ ක්‍රියා කිරීමට දෙවියන්වහන්සේට ඉඩ දීම
ආත්මික ශක්තිය
ආරක්ෂා කිරීම
නැවත නැගුටුවීම – පුනරුජ්ජීවනය
සදාතන ජීවිතය
ජීවිතයට අදාළ සියලු දේ

3. ගීතාවලියේ දාවිත් රජතුමා බොහෝවිට දෙවියන්වහන්සේගේ ක්‍රියා ගැන කතා කර ඇත. පහත දැක්වෙන යොමුවීම් අධ්‍යයනය කරන්න.

   8:6; 9:1; 14:1; 26:7; 28:5; 33:4,15; 40:5; 46:8; 66:3,5; 71:17; 73:28; 75:1; 77:11; 78:4,7,11,32; 86:8; 92:4,5; 103:22; 104:13,24,31; 105:2,5; 106:13,22,35,39; 107:8,15,21,22,24,31; 111:2,4,6,7; 118:17; 119:27; 138:8; 139:14; 141:4; 143:5; 145:4,5,9,10,17;

මෙම කොටස් තුළින් ඔබ උගත් දේ සාරාංශගත කරන්න.

# හත්වන පරිච්ඡේදය

## බලය පිළිබඳ පළමුවන මූලධර්මය: ශුභාරංචියේ බලය

### අරමුණු:

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- 'ශුභාරංචිය' යන්න අර්ථවිග්‍රහ කිරීමට
- ශුභාරංචියේ මූලික කරුණු සාරාංශගත කෙරෙන ශුද්ධලියවිලි පාඨ හඳුනාගැනීමට
- ශුභාරංචිය බලවත් මන්දැයි පැහැදිලි කිරීමට
- යේසුස්වහන්සේගේ ලේවල බලයේ ලාභ-ප්‍රයෝජන හඳුනාගැනීමට
- ශුභාරංචියේ බලය ලබා ගැනීම සඳහා ඇදහිල්ල අවශ්‍ය බව හඳුනාගැනීමට
- ශුභාරංචියේ බලය අත්දැකීමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**මක්නිසාද මම ශුභාරංචිය ගැන ලජ්ජා නොවෙමි. අදහන්නාවූ සියල්ලන්ටම, එනම් පළමුකොට යුදෙව්වාට ද එසේම ග්‍රීකයාට ද, ගැළවීම පිණිස එය දෙවියන්වහන්සේගේ බලයව තිබෙන නිසාය. (රෝම 1:6)**

### හැඳින්වීම

ඔබගේ ජීවිතය තුළ තිබෙන්නාවූ බලයේ වැදගත්කම ඔබ උගත්තෙහිය. දෙවියන්වහන්සේ තුළ බලයේ ප්‍රභවය ඔබ සොයා ගත් අතර යේසුස් ක්‍රිස්තුස්වහන්සේට පවරා ඇති බලය පිළිබඳව ඔබ අධ්‍යයනය කළෙහිය. ඇදහිලිවතුන්ට ආත්මික බලය පවරා ඇති අන්දම ඔබ පසුගිය පරිච්ඡේදයෙන් උගත්තෙහිය. එහෙත් මෙම බලය ඔබ ලබාගන්නේ කෙසේද? ඔබගේම ජීවිතයට හා සේවයට ඔබ එය ලබාගන්නේ කෙසේද? එය ක්‍රියාත්මක කෙරෙන ආත්මික මූලධර්ම මොනවාද? 'බලය පිළිබඳ මූලධර්ම' නමැති මාතෘකාව යටතේ පාඩම් මාලාවක් මෙම පරිච්ඡේදයෙන් ඇරඹේ. ආත්මික බලය ඔබට ලබා ගැනීමට හා පවත්වාගෙන යැමට අවශ්‍ය විවිධ මූලධර්මයන් එක් එක් පාඩමෙන් විමර්ශනය කෙරේ. පළමුවන මූලධර්මය 'ශුභාරංචියේ බලය' යන්නය.

### ශුභාරංචිය

"ශුභාරංචිය" යන වචනයේ තේරුම "ශුභ ආරංචිය" යන්න වේ. අප බයිබලය පසුබිම් කරගෙන ශුභාරංචිය ගැන කතා කරන විට, එය පෙන්වන්නේ දේව රාජ්‍යයේ හා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් ලබන ගැළවීමේ ශුභ ආරංචිය පිළිබඳවය. ශුභාරංචියේ මූලික හරය ප්‍රේරිතවූ පාවුලුතුමා මෙසේ සාරාංශ කර ඇත.

**ඉතින් මාත් ලබාගත් දේ සියල්ලට පළමුවෙන් නුඹලාට භාර දුනිමි, එනම් ලියවිලිවල ප්‍රකාරයට අපේ පව් නිසා ක්‍රිස්තුස්වහන්සේ මැරුණු බවත්, උන්වහන්සේ තැන්පත් කරනු ලැබූ බවත්, ලියවිලිවල ප්‍රකාරයට තුන් වෙනිදා උන්වහන්සේ නැගුටුවනු ලැබූ බවත්ය. (1 කොරින්ති 15:3-4)**

ශුභාරංචියේ මූලික කරුණුවලින් අවධාරණය කෙරෙන්නේ යේසුස්වහන්සේගේ ජීවිතය හා සේවය පිළිබඳව වේ. සියලු මනුෂ්‍යවර්ගයාගේ පාපය උදෙසා වූ උන්වහන්සේගේ මරණය, උන්වහන්සේ භූමදාන කිරීම, හා දේව වචනයේ ලියා ඇති පරිදි උන්වහන්සේ නැවත නැගිටීම මීට ඇතුළත් වේ. ශුභාරංචි පණිවුඩයේ මහත්වූ බලයක් ඇත. පාවුලුතුමා මෙසේ පවසයි.

**මක්නිසාද මම ශුභාරංචිය ගැන ලජ්ජා නොවෙමි. අදහන්නාවූ සියල්ලන්ට, එනම් පළමුකොට යුදෙව්වාට ද එසේම ග්‍රීකයාට ද, ගැළවීම පිණිස එය දෙවියන්වහන්සේගේ බලයව තිබෙන නිසාය.**
**කුමක්හෙයින් ද ධර්මිෂ්ඨයා ඇදහිල්ලෙන් ජීවත්වේයයි ලියා තිබෙන ලෙස, ඇදහීමෙන් පැමිණෙන දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ඇදහීම පිණිස එහි එළිදරව් වී තිබේ.**
**මක්නිසාද සත්‍යය අධර්මිෂ්ඨකමින් වළක්වන්නාවූ මනුෂ්‍යයන්ගේ සියලු අභක්තියට ද අධර්මිෂ්ඨකමට ද විරුද්ධව දෙවියන්වහන්සේගේ උදහස ස්වර්ගයෙන් එළිදරව් වී තිබේ.**
**මක්නිසාද දෙවියන්වහන්සේ ගැන දැනගන්ට පුළුවන් දේ ඔවුන් තුළ ප්‍රකාශව තිබේ. කුමක්හෙයින් ද දෙවියන්වහන්සේ එය ඔවුන්ට ප්‍රකාශ කළ සේක. (රෝම 1:16-19)**

මෙම පදවලින් ශුභාරංචිය බලවත් මන්දැයි එළිදරව් වේ. එය බලවත් වන්නේ:

- එය දෙවියන්වහන්සේගේ බලය මනුෂ්‍යයාට එළිදරව් වීම නිසාය.
- එය සියලු මනුෂ්‍ය වර්ගයාට, වර්ගය, වර්ණය හෝ ජාතිය කුමක් වුවත් ගැළවීම ගෙන දෙන නිසාය.
- එය දෙවියන්වහන්සේ පිළිබඳව මනුෂ්‍යයා දතයුතු දේ එළිදරව් කරන නිසාය
- එය පාපයට එරෙහි දෙවියන්වහන්සේගේ කෝපය හා විනිශ්චය එළිදරව් කරන නිසාය
- එය දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම එළිදරව් කරන නිසාය
- එය ඇදහිල්ල තුළින් ධර්මිෂ්ඨ කෙරෙන ආකාරය පෙන්වන නිසාය
- එය අප ජීවත්වන විශ්වාසයේ පදනම වන නිසාය

## ලෙයෙහි බලය

කුරුසිය මරණයේ උපකරණයයි, යේසුස්වහන්සේ මැරුණේ ලී වලින් කළ ඒ නිර්මාණය මත වේ. ශුභාරංචියේ බලය කුරුසියේ බලයෙන් හා ඒ මත වැගිරවූ ලේවල බලයෙන් වෙන් කළ නොහැකිය.

කුරුසියේ බලය ලී ව්‍යුහය තුළ නොවේ. එමෙන්ම එම බලය අප පළඳින හෝ දේවස්ථාන මුදුනේ සවිකරන හෝ කුරුසියේ සංකේතය තුළ ද නොවේ, කුරුසියේ බලය වන්නේ කුරුසිය මත සිදු වූ ක්‍රියාව වේ. එය සියලු මනුෂ්‍ය වර්ගයාගේ පව් වෙනුවෙන් කුරුසිය මත වැගිරවූ යේසුස්වහන්සේගේ ලේවල පවතින්නකි.

මනුෂ්‍යයාගේත් සත්ත්වයින්ගේත් ජීවය රඳාපවත්නේ ලේ වල බව බයිබලය අපට උගන්වයි (ලෙවී කථාව 17:11, 14). පාපයේ ඇඩුවම මරණය නිසාත් (රෝම 6:23) ජීවය පවත්නේ ලේවල නිසාත්, පාපය සඳහා කමාව ලැබෙන්නේ ලේ වැගිරවීමෙන් පමණක්ය යන මූලධර්මය දෙවියන්වහන්සේ පිහිටවූ සේක.

**ව්‍යවස්ථාවේ ප්‍රකාරයට සියලු දේවල්ම ලෙයින් පවිත්‍රකරනු ලැබේ යයි කියන්ට පුළුවන්වා වාගේ පෙනේ, ලේ වැගිරීමක් ද නැතුව ක්ෂමාකිරීමකුත් නැත. (හෙබ්‍රෙව් 9:22)**

පැරණි ගිවිසුමේ, පාපය වෙනුවෙන් කෙරෙන පූජාව වූයේ සත්ත්වයින්ගේ ලේ වේ. මනුෂ්‍යයා පාපයේ යෙදුනු ඕනෑම අවස්ථාවක ලේ පූජාව නැවත නැවත සිදු කෙරිනි. එහෙත් නව ගිවිසුමේ සියලු පාපයන් වෙනුවෙන් එක් වරක් රුධිරය වැගිරවීමට දෙවියන්වහන්සේ යේසුස්වහන්සේව එවූ සේක. එබැවින් පාපය වෙනුවෙන් පූජාවක් ලෙස සත්ත්වයිනගේ රුධිරය තවත් අවශ්‍ය නැත.

**එළුවන්ගේත් වස්සන්ගේත් ලේ කරණකොටගෙන නොව තමන්ගේම ලේ කරණකොටගෙන, අප උදෙසා සදාකාල මිදීම ලබාගෙන එකම වරක් ශුද්ධස්ථානයට ඇතුල්වූ සේක. (හෙබ්‍රෙව් 9:12)**

කුරුසියේ බලය ඇත්තේ යේසුස්වහන්සේගේ ලේ තුළ වේ, ලේ වල ඇත්තේ කුමන ආත්මික බලයක් ද?

ලේ ...

- බොහෝ දෙනෙකුගේ පාප කමාව උදෙසා වගුරුවන ලදි. මතෙව් 26:28
- පාපයෙන් ගැළවීම ලබා දුනි. එපීස 1:7; 2:13; 1 පේතෘස් 1:2,18-19; එළිදරව් 5:6-9.
- අප ගළවනු ලැබූ නිසා ඉතා අගනේය: 1 පේතෘස් 1:18-19
- අප පාපයෙන් පවිත්‍ර කරනු ලබයි: 1 යොහන් 1:7
- පාපයෙන් අපගේ හෘද සාක්ෂිය පිරිසිදු කරයි: හෙබ්‍රෙව් 9:14
- අප වෙනුවෙන් කතා කරයි. යේසුස්වහන්සේ අපගේ මැදහත්කාරයාණන් වන අතර උන්වහන්සේගේ රුධිරය අප වෙනුවෙන් කතා කරයි. හෙබ්‍රෙව් 12:24
- අපට දෙවියන්වහන්සේ වෙතට ළඟාවිය හැකිවන සේ උන්වහන්සේගේ වැඩසිටීම කෙරෙහි ප්‍රවේශයන් ගෙන දෙයි: හෙබ්‍රෙව් 9:12; 10:19-22; එපීස 2:13;
- දෙවියන්වහන්සේ හා මිනිසා අතර යේසුස්වහන්සේ මැදහත්කරු කරයි: හෙබ්‍රෙව් 12:24
- අපව පිරිසිදු කරයි: හෙබ්‍රෙව් 13:12-13
- ධර්මිෂ්ට කරනු ලබන මාර්ගය වේ. රෝම 3:24-25
- ආත්මික ආශිර්වාදවල කුසලානය: 1 කොරින්ති 10:16
- පාපයෙන් හා රෝගවලින් මුදවාගනී: යෙසායා 53:4
- ක්‍රිස්තුස්වහන්සේගේ පොරොන්දුවලට අනුබල දෙයි: යේසුස්වහන්සේ මිදියුස කුසලාන ගෙන "මේ කුසලාන නුඹලා උදෙසා වගුරුවන මාගේ ලෙයෙහි අලුත් ගිවිසුමය" යි පැවසූ විට උන්වහන්සේ අදහස් කළේ "එම ගිවිසුමේ සෑම පොරොන්දුවක්ම මාගේ ජිවරුධිරයේ මිලෙන් ඉටු කරන බලය" ලෙසය. ලූක් 22:20
- යේසුස්වහන්සේගේ නැවත නැගිටීම පසුපස ඇති බලය වේ. හෙබ්‍රෙව් 13:20
- ජීවය ගෙන දෙයි: යොහන් 6:53-57
- දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටුකිරීමට අපට හැකියාව ලබා දෙයි. හෙබ්‍රෙව් 13:20-21
- සතුරාගේ සියලු බලය පරාජය කිරීමේ හැකියාව ලබා දෙයි. එළිදරව් 12:11
- ආරක්ෂාව ලබාදෙයි. මිසරයේදී ඉශ්‍රායෙල්වරුන්ගේ දොරවල පාස්කු බැටළු පැටවාගේ ලේ තැවරූ විට, නපුරට ඇතුළුවිය නොහැකි විය. නික්මයාම 12:21-23

මෙබැවින් පාවුලුතුමා පැවසූ වේ.

> **මක්නිසාද කුරුසියේ වචනය විනාශවන්නන්ට මෝඩකමය; නුමුත් ගැළවෙන්නාවූ අපට ඒක දෙවියන්වහන්සේගේ බලයය. (1 කොරින්ති 1:18)**

## තෝරා ගැනීමකි

යේසුස්වහන්සේ කුරුසියෙහි ඇණගැසුණු ලැබුවේ නම්, ඉන් අදහස් වන්නේ උන්වහන්සේට වඩා උන්වහන්සේ සතුරන්ට බලය තිබූ බවක්ද? මක්නිසාද ඔවුහු උන්වහනසේට මහත් පීඩා ගෙන දුන් අතර අවසානයේ උන්වහන්සේව මරා දැමූහ. මේ පිළිබඳව බයිබලයේ ඇති වාර්තා කියවන්න.

> **නුඹ මට කථාකරන්නේ නැද්ද? නුඹ මුදාහරින්ට බලය ද නුඹ කුරුසියෙහි ඇණ ගසන්නට බලය ද මට ඇති බව නුඹ දන්නේ නැද්දැයි පිලාත් උන්වහන්සේට කීවේය.**
> **යේසුස්වහන්සේ ඔහුට උත්තර දෙමින්: ඉහළින් එය නුඹට නොදෙන ලද්දේ නම් මට විරුද්ධව නුඹට කිසි බලයක් නැත. එහෙයින් මා නුඹට පාවාදුන් තැනැත්තාගේ පාපය වඩා මහත්යයි කීසේක (යොහන් 19:10-11)**

> **කිසිවෙක් ඒක මාගෙන් උදුරාගන්නවා නොව මම ඒක දෙමි. ඒක දෙන්ට මට බලය තිබේ; නැවත ගන්ටද මට බලය තිබේ. මේ ආඥාව මාගේ පියාණන්වහන්සේගෙන් ලදිමි. (යොහන් 10:18)**

යේසුස්වහන්සේගේ සතුරන්ට උන්වහන්සේට වඩා වැඩි බලයක් තිබුණේ නැත. දෙවියන්වහන්සේගේ සැලැස්ම අනුව සියලු මනුෂ්‍ය වර්ගයාගේ පාපය වෙනුවෙන් තමන්වහන්සේගේ ජීවිතය පූජාකිරීමට යේසුස්වහන්සේ තෝරාගත් සේක. යේසුස්වහන්සේ එය කළ යුතුවම තිබුණේ නැත. කුරුසියෙන් තමන්වහන්සේව ගළවාගැනීමේ බලය උන්වහන්සේට තිබිණි. උන්වහන්සේ සිය කැමැත්තෙන්ම තම ජීවිතය පූජා කළ සේක.

## නැවත නැගිටීම

කුරුසිය මත සිදුවූ යේසුස්වහන්සේගේ මරණය කතාන්දරයේ අවසානය නොවේ. ශුභාරංචියේ බලය ද මෙතැනින් අවසන් නොවේ. උන්වහන්සේ මිය යෑමෙන් තෙදිනකට පසු යේසුස්වහන්සේ නැගුටුවනු සේක. ඔබට මේ පිළිබඳව ලූක් 24:1-12 හි කියවිය හැකිය.

> **නුමුත් දෙවියන්වහන්සේ මරණ වේදනාවෙන් උන්වහන්සේ මුදා නැගිටෙවූ සේක. කුමක්හෙයින් ද උන්වහන්සේ නවතාගෙන සිටින්ට මරණයට නුපුළුවන් විය.** (ක්‍රියා 2:24)

දෙවියන්වහන්සේගේ බලය ශ්‍රේෂ්ඨතම ලෙස පෙන්නුම් කරනු ලැබුවේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත නැගිටීම මගිනි.

> **උන්වහන්සේ දුර්වලකමින් කුරුසියෙහි ඇණ ගසනු ලැබූ නුමුත් දෙවියන්වහන්සේගේ බලයෙන් ජීවත්වන සේක. එසේම අපිද උන්වහන්සේ තුළෙහි දුර්වලව සිටින නුමුත් උන්වහන්සේ සමඟ දෙවියන්වහන්සේගේ බලයෙන් නුඹලා උදෙසා ජීවත් වන්නෙමු.** (2 කොරින්ති 13:4)

යේසුස්වහන්සේගේ නැවත නැගිටීම ශුභාරංචියේ බලය පිළිබඳ වැදගත් අංගයකි. මන්ද එමගින් ...

> **සියලු අධිපතිකමේ ද බලයේ ද හිස වන උන්වහන්සේ තුළ නුඹලා පූර්ණව සිටින්නහුය. උන්වහන්සේ තමන් කෙරෙන් අධිපතිකම් ද බලයලත්තන් ද පහකොට, ප්‍රසිද්ධියෙන් ඔවුන් දක්වා, කුරුසිය කරණකොටගෙන ඔවුන්ගෙන් ජයගත් බව ප්‍රකාශ කළ සේක.** (කොලොස්සි 2:10,15)

යේසුස්වහන්සේ, උන්වහන්සේගේ නැවත නැගිටීම තුළින් සතුරාගේ බලය ජයගත් සේක. ඒ නිසා සතුරාගේ සියලු බලයට වඩා අපට බලය තිබේ. අපට මරණය වුවද පරාජය කිරීමේ බලය තිබේ. මක්නිසාද අපගේ මැරෙන සුළු ශරීර වුවද නැවත නැගිටීම අත්දකිනු ඇති බැවිනි. නැවත නැගිටීමේ විශාල බලයක් ඇත. නැවත නැගිටීමේ බලය තුළ යේසුස්වහන්සේ දනගැනීම පිළිබඳව පාවුලුතුමා පැවසීය (පිලිප්පි 3:10). ඔබ "උන්වහන්සේගේ නැවත නැගිටීමේ බලය" නමැති දහසය වැනි පරිච්ඡේදයෙන් මේ මූලධර්මය පිළිබඳව තවදුරටත් ඉගෙන ගනු ඇත.

## ඇදහිල්ලේ සාධකය

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලේවල ඇති බලගතු වාසි අත්දැකීම සඳහා එක් සාධකයක් අත්‍යවශ්‍ය වේ. එනම් රුධිරය කෙරෙහි ඔබ විශ්වාසය තැබිය යුතුය.

> **ඔවුහු උන්වහන්සේගේ අනුග්‍රහයෙන් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ තිබෙන මිදීම කරණකොටගෙන නොමිලයේ ධර්මිෂ්ඨකරනු ලබන්නෝ වෙති.**
> **ඇදහිම කරණකටෙගෙන උන්වහන්සේ ස්වකීය ලෙයින් පව් නසන පූජාවක් වෙන්ට දෙවියන්වහන්සේ නියම කළ සේක. කුමකටද? දෙවියන්වහන්සේ තමන් ඉවසිලිවන්ත නිසා, පසුගිය පව් ගණන් නොගෙන හැරීම කරණකටෙගෙන, තමන්වහන්සේගේ ධර්මිෂ්ඨකම පෙන්වන පිණිසය.**
> **එනම් තමන්වහන්සේ ධර්මිෂ්ඨ වෙන හැටියට ද, යේසුස්වහන්සේ කෙරෙහි ඇදහිලි ඇත්තා ධර්මිෂ්ඨකරන්නා හැටියටද තමන්වහන්සේගේ ධර්මිෂ්ඨකම මේ කාලයේදී දක්වන පිණිසය.**
> **එහෙයින්, මනුෂ්‍යයෙන ව්‍යවස්ථාවෙහි ක්‍රියා නැතුව ඇදහීමෙන් ධර්මිෂ්ඨකරනු ලැබේයයි අපි ගණන්ගනිමුව.** (රෝම 3:24-26,28)

ශුභාරංචියේ බලය තිබීම පමණක් ප්‍රමාණවත් නොවේ. ඔබ එම බලය ඔබගේම ජීවිතයට අදාළ කරගත යුතුය. ඔබ මෙය ඇදහිල්ලෙන් කළ යුතුය. මූලිකව ඇදහිල්ල යනු විශ්වාසය වේ. ඔබ ශුභාරංචියේ බලය අත්දැකීම සඳහා එය විශ්වාස කළ යුතුය. ඇදහිල්ල හා බලය අතර ඇති සබඳතාව පිළිබඳව ඉදිරියේදී මෙම පාඩමාලාවෙන් තවදුරටත් ඉගෙන ගන්නෙහිය.

## ශුභාරංචියේ බලය අත්දැකීම

ඔබ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම පෞද්ගලික ගැළවුම්කරු ලෙස පිළිගෙන නැත්නම් හා ඔබගේ පව්වලට කමාව ලබාගෙන නැත්නම් ඔබට ශුභාරංචියේ බලය අත්දැකිය නොහැකිය. ශුභාරංචියේ බලය අත්දැකීම සඳහා ඔබ

1. **පව්කළ බව පිළිගත යුතුය**

 **මක්නිසාද සියල්ලෝම පව්කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනවී සිටිති. (රෝම 3:23)**

2. **ඔබගේ පව් වෙනුවෙන් යේසුස්වහන්සේ මැරුණු බව විශ්වාස කළ යුතුය.**

 **මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයා දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්නා සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය.**
 **මක්නිසාද දෙවියන්වහන්සේ පුත්‍රයාණන් ලෝකයට එව්වේ ලෝකය විනිශ්වය කරන පිණිස නොව ලෝකයා උන්වහන්සේ කරණකොටගෙන ගළවනු ලබන පිණිසය. (යොහන් 3:16-17)**

3. **ඔබගේ පව් දෙවියන්වහන්සේ කියා දී කමාව ඉල්ලා සිටින්න**

 **අපට පාපය නැතැයි කියමු නම්, අපි අපම රවටා ගනිමුව, සැබැවද අප තුළ නැත. අපේ පාපවල් කියාදෙමු නම් අපේ පව් කමා කරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර කරන්ටත් උන්වහන්සේ විශ්වාසව, ධර්මිෂ්ඨව සිටින සේක. (1 යොහන් 1:8-9)**

4. **වෙනස්වූ ජීවිතයක් අත්දකින්න**

ඔබගේ පැරණි ජීවිත රටාවෙත්, ඔබගේ පාපී ක්‍රියාත් ආකල්ප හා සිතිවිලිත් වෙනස් කිරීම සඳහා ශුභාරංචියේ බලය ඔබ තුළ ක්‍රියා කිරීමට ඉඩ හරින්න.

 **එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය පරණ දේ පහව ගියේය; මෙන්න මේ සියල්ල අලුත් වී තිබේ. (2 කොරින්ති 5:17)**

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

______________________________________________

______________________________________________

2. "ශුභාරංචිය" යන වචනය අර්ථවිග්‍රහ කරන්න.

______________________________________________

3. ශුභාරංචියේ මූලික කරුණු සාරංශ ගත කෙරෙන ශුභාරංචි පාඨ මොනවාද?

______________________________________________

4. ශුභාරංචිය මෙතරම් බලවත් මන්ද?

______________________________________________

5. යේසුස්වහන්සේගේ ලේවල බලය පිළිබඳව ඔබ උගත් දේ සාරාංශගත කරන්න.

______________________________________________

6. ශුභාරංචියේ බලය ඉල්ලීම සඳහා අවශ්‍ය මොනවාද?

______________________________________________

7. ශුභාරංචියේ බලය අත්දැකිය හැක්කේ කෙසේද?

______________________________________________

8. මේ ප්‍රකාශය සත්‍යද? අසත්‍යද? "යේසුස්වහන්සේගේ සතුරන්ට උන්වහන්සේට වඩා බලයක් තිබිණි. මක්නිසාද උන්වහන්සේ මරාදැමීමට ඔවුන්ට හැකිවූ බැවිනි. මේ ප්‍රකාශය ____________________

(මෙම අත්පොතේ අවසාන පරිච්ජේදය අවසානයේ පරීක්ෂණ වලට පිළිතුරු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

ශුභාරංචිය පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කරන්න. පහත දැක්වෙන ශුභාරංචි පාඨ උගන්වන දේ සාරාංශගත කරන්න.

මතෙව් 4:23; 9:35; 24:14

මාක් 1:14

ක්‍රියා 20:24

රෝම 1:1-3, 9, 15:16; 19

2 කොරින්ති 4:4

එපීස 1:13; 6:15;

1 තෙසලෝනික 2:2, 9

2 තෙසලෝනික 1:8

1 තිමෝති 1:11

1 පේතෘස් 4:17

එළිදරව් 14:6

# අටවන පරිච්ඡේදය

## බලය පිළිබඳ දෙවන මූලධර්මය: ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ශුද්ධාත්මයාණන්වහන්සේ හා බලය අතර ඇති සබඳතාව එළිදරව් කෙරෙන බයිබලීය යොමුවක් දීමට
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයේ ප්‍රධාන පරමාර්ථය හඳුනාගැනීමට
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා හඳුනාගැනීමට
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල ලයිස්තුගත කෙරෙන බයිබල් යොමුවක් දීමට
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තිස්මය ලබා ගැනීමේ බයිබලීය මඟපෙන්වීම් ලයිස්තුගත කිරීමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**බලව, මම මාගේ පියාණන්වහන්සේගේ පොරොන්දුව නුඹලා වෙතට එවමි. නුමුත් ඉහළින් නුඹලා බලයෙන් සරසනු ලබනතුරු නුවර නැවතී සිටින්න. (ලූක් 24:49)**

### හැඳින්වීම

යේසුස්වහන්සේ ආත්මික බලය පිළිබඳව වැදගත් පොරොන්දුවක් සිය අනුගාමිකයන්ට දුන් සේක.

**බලව, මම මාගේ පියාණන්වහන්සේගේ පොරොන්දුව නුඹලා වෙතට එවමි. නුමුත් ඉහළින් නුඹලා බලයෙන් සරසනු ලබනතුරු නුවර නැවතී සිටින්න. (ලූක් 24:49)**

බලය පිළිබඳ බයිබලීය සංකල්පය අවබෝධ කරගැනීම සඳහා ශුභාරංචියේ බලය හා ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය යන ප්‍රධාන මූලධර්ම දෙක ගැන දැන ගත යුතුය. ආත්මික බලය ලබාගැනීමට මේ දෙකේම අත්දැකීම් අවශ්‍යය. ශුභාරංචියේ බලයේ වැදගත්කම ගැන ඔබ දැනටමත් ඉගෙනගෙන ඇත. එහෙත් ඔබ ලබාගත යුතු තවත් වැදගත් ආත්මික අත්දැකීමක් තිබේ. ඒ යේසුස්වහන්සේ පොරොන්දු වූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය වේ. මෙම පරිච්ඡේදයෙන් එම වැදගත් මූලධර්මය සාකච්ඡා කෙරේ. මෙම පරිච්ඡේදයෙන් ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳව හැඳින්වීමක් පමණක් කෙරෙනු ලැබේ. මෙම විෂය ගැඹුරෙන් අධ්‍යයනය කිරීම සඳහා හාවස්ටයිම් ජාත්‍යාන්තර ආයතනයේ "ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය" නමැති පාඨමාලාව ලබා ගන්න.

### බලය පිළිබඳ පොරොන්දුව

යේසුස්වහන්සේ උන්වහන්සේගේ අනුගාමිකයන්ට මෙසේ පැවසූ සේක.

**මම පියාණන්වහන්සේගෙන් ඉල්ලන්නෙමි, එවිට උන්වහන්සේ නුඹලා සමග සදාකල්ම සිටින පිණිස වෙන සැනසිලිකාරයකු නුඹලාට දෙන සේක.**
**ඒ සැනසිලිකාරයාණෝ සත්‍යතාවේ ආත්මයාණන්වහන්සේය. උන්වහන්සේ පිළිගන්ට ලෝකයාට බැරිය; මක්නිසාද ලෝකයා උන්වහන්සේව දකින්නේවත් අඳුනන්නේවත් නැත. නුඹලා උන්වහන්සේ අඳුනන්නහුය; මක්නිසාද උන්වහන්සේ නුඹලා සමග නැවතී සිටින සේක. (යොහන් 14:16-17)**

යේසුස්වහන්සේ කතාකළ ආත්මය ත්‍රිත්වයේ තෙවෙනි පුද්ගලයා වන ශුද්ධාත්මයාණන්වහන්සේ වේ. ශුද්ධාත්මයාණන්වහන්සේ ගෝලයන්ට ආත්මික බලය "පවරනු" ඇත. නැතහොත් වචනාර්ථයෙන් "පළඳනු" ඇත.

**බලව, මම මාගේ පියාණන්වහන්සේගේ පොරොන්දුව නුඹලා වෙතට එවමි. නුමුත් ඉහළින් නුඹලා බලයෙන් සරසනු ලබනතුරු නුවර නැවතී සිටින්න. (ලූක් 24:49)**

## ශුද්ධාත්මයාණන්වහන්සේ හා බලය අතර සම්බන්ධය

මෙම ශ්‍රේෂ්ඨ ආත්මික බලය අත්දකිනු ලබන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේ ලැබීමෙන් පසුව වේ.

**නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වා ද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය. (ක්‍රියා 1:8)**

බලය ආත්මයකි.

**මක්නිසාද දෙවියන්වහන්සේ අපට දුන්නේ බයාදුකමේ ආත්මයක් නොව බලයේත් ප්‍රේමයේත් හික්මවීමේත් ආත්මයක්ය. (2 තිමෝති 1:7)**

**එවිට යේසුස්වහන්සේ ආත්මයාණන්වහන්සේගේ බලයෙන් යුක්තව ගලිලයට හැරී ආසේක. උන්වහන්සේ ගැන කීර්තියක් ද අවට මුළු පලාතෙහි පතළව ගියේය. (ලූක් 4:14)**

මෙම "ආත්මයාණන්වහන්සේගේ බලය" ශුද්ධාත්මයාණන්වහන්සේ වේ.

**දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන් ද බලයෙන් ද නාසරීය යේසුස්වහන්සේ ආලේප කළ බවත්, දෙවියන්වහන්සේ උන්වහන්සේ සමග සිටි බැවින් උන්වහන්සේ යහපත්කම් කරමින්ද යක්ෂයා විසින් පීඩාකරන ලද සියල්ලන් සුවකරමින්ද හැසුරුණු බවත්ය (ක්‍රියා 10:38)**

## මෙම බලයේ පරමාර්ථය

ශුද්ධාත්මයාණන්වහන්සේ, ඇදහිලිවතුන්ගේ ජීවිතය තුළ විවධාකාරයෙන් බලවත් ලෙස ක්‍රියා කරයි. ශුද්ධාත්මයාණන්වහන්සේ:

**ඔහු තුළ වාසය කරයි :** 1 කොරින්ති 6:19) අප සැබවින්ම ශුද්ධාත්මයාණන්වහන්සේගේ මාලිගාවය නැතහොත් වාසස්ථානයය.

**දෙවියන්වහන්සේ හා අනෙකුත් ඇදහිලිවන්තයන් සමග ඔහු එකම ආත්මයකින් එක් කරයි:** (1 කොරින්ති 6:17) බාබෙල් කොත පිළිබඳ කතාන්තරයෙන් පෙන්නුම් කෙරෙන පරිදි එක්සත්කමේ මහත් බලයක් ඇත. (උත්පත්ති 11 බලන්න; විශේෂයෙන් 6 පදය ගැන සැලකිලිමත් වන්න)

**ඔහු වෙනුවෙන් මැදහත්කම් කරයි :** (රෝම 8:26) මේ ප්‍රබල මැදහත්කරු දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව අප වෙනුවෙන් යාච්ඤා කරයි.

**ඔහුට මඟපෙන්වයි:** (යොහන් 16:13) ශුද්ධාත්මයාණන්වහන්සේ අප ව්‍යාකූලත්වය තුළ නොව බලය තුළ ගමන් කිරීමට හැකියාව ලබා දෙන සේක. උන්වහන්සේ අපව බලය ඇති ස්ථානයට, දෙවියන්වහන්සේගේ පූර්ණ කැමැත්තට මඟපෙන්වන සේක.

**ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය ඔහු වෙතට හා ඔහු තුළින් අන් අයට වගුරුවයි.** (රෝම 5:5) ප්‍රේමයේ බලය පිළිබඳව ඔබ ඊළඟ පරිච්ඡේදයෙන් තව දුරටත් ඉගෙනගන්නවා ඇත.

**බයිබලිය සත්‍යයන් ඔහුට එළිදරව් කරයි :** (1 කොරින්ති 2:10) බලවත් ආත්මික එළිදරව්වීම් පැමිණෙන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේ තුළිනි.

**ඔහුට සැනසිල්ල ගෙන දෙයි :** (ක්‍රියා 9:31 හා යොහන් 14:17,26) කණගාටුවෙන් සිටින අවස්ථාවලදී උන්වහන්සේ අප සනසන සේක.

**ක්‍රිස්තුස්වහන්සේගේ ස්වරූපයට අනුරූප කරන සේක:** (2 කොරින්ති 3:18) ක්‍රිස්තුස්වහන්සේගේ ස්වරූපය ලැබෙන සේ අපවම වෙනස් කර ගැනීමට අපට නොහැකිය. ස්වයං දියුණුවීමේ සැලසුම් අසාර්ථක වනු ඇත. එහෙත් ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය තුළින් යේසුස්වහන්සේගේ ස්වරූපය අපට ලබා ගත හැකිය.

**ඔහුට උගන්වයි:** (යොහන් 14:26) ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය අප තුළට පැමිණි විට ශ්‍රේෂ්ඨතම ගුරුවරයා අප තුළ වැඩ විසීමට පැමිණෙනු ඇත. දැනුම බලගතු වන අතර ශුද්ධාත්මයාණන්වහන්සේ ආත්මික දැනුම ලබා දෙන සේක.

**සැබෑ නමස්කාරයට ඔහු පොළඹවයි:** (යොහාන් 4:24) ප්‍රශංසාව හා නමස්කාරය ප්‍රබල ආත්මික උපක්‍රමික දෙකකි. පැරණි ගිවිසුමේ සඳහන් ඇතැම් සටන් වලදී දෙවියන්වහන්සේගේ සතුරන්ට එරෙහිව භාවිත කළ ප්‍රධාන ක්‍රම මේවා වේ.

**ඔහුව ප්‍රාණවත් කරයි** (රෝම 8:11) යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටවූ බලයම අපව ප්‍රාණවත් කිරීමට ද ක්‍රියා කරනු ඇත. මින් අදහස් වන්නේ අප මැරෙන සුළු ශරීරයෙන් සිටියදීම නැවත-නැගිටුවීම වැනි බලයක් අපට ලැබෙන බව වේ.

**ඔහුට පවිත්‍ර කරනු ලබයි** (2 තෙසලෝනික 2:13-14) ශුද්ධ ජීවිතයක් ගත කිරීමට ස්වයං-ආයාසයක් යෙදීමට අප උත්සාහ කළ යුතු නැත. අපගේ සිතිවිලි හා ක්‍රියාවන් ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයෙන් පවිත්‍ර කරනු ලබයි. ශුද්ධ ජීවිතයක් ගත කිරීමේ හැකියාව උන්වහන්සේ ලබා දෙයි.

**ඔහුව වෙනස් කරයි** (තිතස් 3:5) වෙනසක් කිරීමට බලය අවශ්‍ය වන අතර ධනාත්මක වෙනස් කිරීම් ඇති කිරීම සඳහා අවශ්‍ය බලය ශුද්ධාත්මයාණන්වහන්සේ ලබා දෙයි.

**ඔහුගේ වැරදි පෙන්වා දෙයි** (යොහාන් 16:8-11) පාපයේ ප්‍රතිඵලයක් ලෙස ආත්මික බලය නැතිවන බව ඔබ පසුව මෙම පාඩමාලාවෙන් ඉගෙනගන්නෙහිය. ශුද්ධාත්මයාණන්වහන්සේ වැරදි පෙන්වා දී පසුතැවිලිවීමට අපට මඟපෙන්වන සේක. ඒ නිසා දෙවියන්වහන්සේගේ බලය අඛණ්ඩව අප වෙත ගලා ඒමට ඉඩ සැලසේ.

**ගැළවීම සහිතික කරයි** (රෝම 8:16) ඔබගේ තත්වය දැනගැනීමෙන් ඔබට බලය ලැබේ. දෙවියන්වහන්සේ තුළ ඔබගේ තත්වය ශුද්ධාත්මයාණන්වහන්සේ සහතික කරන සේක.

**ඔහුට නිදහස ලැබේ** (රෝම 8:2) බලය සඳහා හොඳම අවස්ථාව නිදහස මගින් ලබා දෙයි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් නිදහස ශුද්ධාත්මයාණන්වහන්සේ ලබා දෙන සේක.

**ඔහු තුළින් කතා කරයි:** (මාක් 13:11) අපගේම කතා කිරීමේ හැකියාව මගින් අප සීමා කර නොමැත. ශුද්ධාත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ වචනයේ බලය හා ආධිපත්‍යය අප තුළින් ප්‍රකාශ කරන සේක.

**දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කරයි** (1 කොරින්ති 2:4) ජීවිතයේ සෑම ක්ෂේත්‍රයකම දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීමේ හැකියාව ශුද්ධාත්මයාණන්වහන්සේ ලබා දෙයි.

**ඔහු ශක්තිමත් කරයි :** (එපිස 3:16) ඔබ දුර්වල වූ විට, දෙවියන්වහන්සේගේ ශක්තිය ප්‍රකාශ කරනු ලබයි.

## ශ්‍රේෂ්ඨතම පරමාර්ථය

මේ සියල්ල වැදගත් පරමාර්ථයන් වේ. එහෙත් ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයේ එක් ප්‍රධාන පරමාර්ථයක් ඇත. ශුද්ධාත්මයාණන්වහන්සේගේ සියලුම පරමාර්ථ මේ ශ්‍රේෂ්ඨ පරමාර්ථය සාක්ෂාත් කර ගැනිම සඳහා ඉලක්ක කොට තිබේ. මෙම ශ්‍රේෂ්ඨතම පරමාර්ථය යේසුස්වහන්සේගේ පොරොන්දුව තුළින් එළිදරව් වේ.

> **නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වා ද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය. (ක්‍රියා 1:8)**

යේසුස්වහන්සේ වෙනුවෙන් සාක්ෂිකරුවන් වීමේ බලය ශුද්ධාත්මයාණන්වහන්සේගේ සැබෑ සාක්ෂිය වේ. එය පෙ%රිතවූ පේතෘස්තුමාගේ ජිවිතයේ ක්ෂණයකින් දැකගත හැකි විය. ශුද්ධාත්මයාණන්වහන්සේගේ අත්දැකීමට පෙර පේතෘස්තුමා බියවී යේසුස්වහන්සේ නොදන්නා බව පැවසුවේය. ශුද්ධාත්මයාණ්වහන්සේගේ බලය ලැබීමෙන් පසු, මිනිසුන් 3000ක් ගැළවීම ලද ශුභාරංචිය පිළිබඳ බලගතු සාක්ෂිය ප්‍රකාශ කළේය.

ලොව පුරා ශුභාරංචිය පැතිරවීමට මුල් සභාවට හැකිවුයේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය නිසාය. ක්‍රියා පොත ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තිස්මය පිළිබද පෙන්නුම් කෙරෙන බලගතු සාක්ෂියේ වාර්තාවකි.

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තිස්මය

මෙම බලය පැවරීම පැමිණෙන්නේ "ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තිස්මය" නමැති අත්දැකීම තුළිනි. යේසුස්වහන්සේ මේ අත්දැකීම ගැන කතාකළ සේක.

> **මක්නිසාද යොහන් වතුරෙන් බව්තිස්ම කළේය; නුමුත් නුඹලා මෙයින් නොබෝ දවසක් ගිය පසු ශුද්ධාත්මයෙන් බව්තිස්ම කරනු ලබන්නහුය. (ක්‍රියා 1:5)**

පේතෘස්තුමා ද මෙම බව්තිස්මය ගැන කතා කළේය:

> **යොහන් වතුරෙන් බව්තිස්ම කෙළේය; නුඹලා ශුද්ධාත්මයෙන් බව්තිස්ම ලබන්නහුයයි ස්වාමින්වහන්සේ කී වචනය මට මතක් විය. (ක්‍රියා 11:16)**

## භෞතික ලකුණු

ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තිස්මය සැබෑ ලෙස පෙන්නුම් කෙරෙන්නේ ආත්මික බලයෙනි. එහෙත් මේ අත්දැකීම සමග භෞතික ලකුණු ද තිබේ. ශුද්ධාත්මයෙන් බව්තිස්මය ලැබූ පසු සෙනඟට සිදු වූ දේ පිළිබඳව නව ගිවිසුමේ තැන් තුනක සඳහන් වේ. මේවා ක්‍රියා 2:2-4 හි සඳහන් පළමුවෙන්ම ශුද්ධාත්මයාණන්වහන්සේ දුන් අවස්ථාව; ක්‍රියා 10:44-45 හි ඇති කොර්නේලියස්ගේ නිවසේ සිද්ධිය; ක්‍රියා 19:6 හි සඳහන්ව ඇති එපීසයේ දෙවියන්වහන්සේ වෙතට හැරුණවුන් වෙත ශුද්ධාත්මයාණන්වහන්සේ ලැබීම වේ.

මෙම කොටස් සංසන්දනය කිරීමේදී අවස්ථා තුනටම පොදු එක් භෞතික ලකුණක් තිබේ. එනම් ශුද්ධාත්මය ලැබූ අය තමාගේ භාෂාව හැර වෙනත් භාෂාවලින් කතා කළහ. මේවා ඔවුන් උගත් භාෂාවන් නොවේ. ඒවා ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය තුළින් දෙන ලද ඒවාය. ශුද්ධාත්මයාණන්වහන්සේගේ "අන්‍යභාෂා" මොලොව භාවිත කරන සැබෑ භාෂා විය හැකිය.

> **ඔවුන් සියල්ල විස්මිතව පුදුම වී; බලව මේ කථා කරන සියල්ලෝ ගලීලයෝ නොවෙත්ද?**
> **අප උපන් දේශවල අප එකිනෙකාගේම භාෂාවෙන් කථාකරනවා කෙසේ අසමුද?**
> **(ක්‍රියා 2:7-8)**

අන්‍ය භාෂාවන් මිනිසුන් නොදන්නා භාෂාවන්ද විය හැකිය. මෙය "අන්‍ය භාෂා" ලෙස හැඳින්වේ.

> **මක්නිසාද අන් භාෂාවකින් කථා කරන්නා මනුෂ්‍යයන්ට නොව දෙවියන්වහන්සේට කථා කරන්නේය; ඔහු ආත්මයෙන් රහස් කථාකරන නුමුත් කාටවත් තේරෙන්නේ නැත.**
> (1 කොරින්ති 14:2)

## අන්‍ය භාෂාවල පරමාර්ථය

ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් දෙනු ලබන අන්‍ය භාෂා ඇදහිලිවතුන්ගේ ජීවිතයේ ප්‍රබල පරමාර්ථයන් ඉටු කරයි. 1 කොරින්ති 14 හි සඳහන් අන්‍ය භාෂාවල පරමාර්ථ සමහරක් මෙසේ වේ.

- **දෙවියන්වහන්සේට යාච්ඤා කිරීම:** 2 පදය

- **ස්වයං-වර්ධනය:** වර්ධනය යනු තමාම මහිමයට පත්කර ගැනීම නොව, ධෛර්යමත් කිරීම, දියුණුවීම හා සංවර්ධනය වීම වේ. 4 පදය

- **පරිවර්තනය කළවිට ඉන් සභාව වර්ධනය වේ:** 12 පදය

- **මැදිහත් යාච්ඤා:** 14 පදය, රෝම 8:26-27 ද බලන්න

- **ප්‍රශංසාව:** 15,17 පද

- **අනාවැකි සම්පූර්ණ කිරීම:** 21 පදය. යෙසායා 28:11-12 ද බලන්න

- **නොඅදහන්නන්ට ලකුණක්:** 22 පදය. කියා 2 ද බලන්න

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා

ඁපාලොවේ සීමාන්තය දක්වා ශුභාරංචිය පැතිරවීමේ වගකීම යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට පැවරූ සේක.

> **එබැවින් නුඹලා ගොස් සියලු ජාතීන් ගෝලයන් කරන්න. පියාණන්ගේත් පුත්‍රයාණන්ගේත් ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බව්තිස්ම කරන්න.**
> **මා විසින් නුඹලාට අණ කළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වන්න. මමද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමග සිටිමි (මතෙව් 28:19-20).**

ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය දෙන ලද්දේ මෙම කාර්යය ගෝලයන් විසින් ඉටු කරන පිණිසය (ක්‍රියා 1:8)

ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙම බලයේ කොටසක් ආත්මික දීමනාවන් වේ. ඇදහිලිවතුන්ට මෙම දීමනා ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් දෙනු ලබන්නේ ඔවුන්ගේ සේවය කාර්යක්ෂමව කිරීම සඳහා වේ. ස්වභාවික හැකියාවන් මගින් මේ කාර්යය ඉටු කිරීම පහසු නැත.

මෙම ආත්මික දීමනාවන් ස්වභාවික දක්ෂතාම නොවේ. ස්වභාවික දක්ෂතාවන් හා හැකියාවන් උපතින්ම ලැබෙන අතර ඒවා ස්වෝත්සාහයෙන් වර්ධනය කරගත හැකිය. සේවයේ දී යොදා ගත හැකිය, එහෙත් ඒවා ආත්මික දීමනා නොවේ.

ආත්මික දීමනා යනු සේවයේ කාර්යයන් ඉටු කර ගැනීම සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් දෙනු ලබන බලගතු හැකියාවන් වේ. ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා දෙවියන්වහන්සේ විසින් දෙනු ලබන දක්ෂතාවන්ය.

**එසේ දුන්නේ ඇදහිමේද දෙවියන්වහන්සේගේ පුත්‍රයා දැනගැනීමේද එකමුතු කමටත්, සම්පූර්ණ පුරුෂකමටත්, ක්‍රිස්තුස්වහන්සේගේ සම්පූර්ණ වූ උස මහතේ ප්‍රමාණයටත් අප සියල්ලන් පැමිණෙන තෙක් ශුද්ධවන්තයන්ගේ සම්පූර්ණවීම සඳහා සේවය කිරීමේ වැඩය පිණිසත් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වර්ධනය වීම පිණිසත්ය.**

**තවද අපි තවත් මනුෂ්‍යයන්ගේ වංචාවෙන් ද ප්‍රයෝගයෙන් ද රැවටිලි සහිත උපමාරුවෙන් ද හටගන්නා සියලු ආකාර ඉගැන්වීම් නමැති සුළඟින් ඇතමැත විසිවෙමින් ගෙනයනු ලබන්නාවූ බාලයන් නොවන පිණිසත්, ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කථා කරමින්, හිසව සිටින ක්‍රිස්තුස්වහන්සේ උදෙසා සියලු දේවල දී වැඩෙන පිණිසත්ය. (එපිස 4:12-15)**

ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් ඇදහිලිවතුන්ට ලබාගත හැකි ආත්මික දීමනා සඳහන් ප්‍රධාන කොටස් වන්නේ: රෝම 12:1-8; 1 කොරින්ති 12:1-31; එපිස 4:1-16; 1 පේතෘස් 4:7-11 ය.

ආත්මික දීමනා ලයිස්තුවක් පහත දැක්වේ (මෙහි දී ඇති ආකාරයට මේවා බයිබලයේ වර්ග කර නැත මෙසේ කාණ්ඩ කර ඇත්තේ අධ්‍යයනය කිරීමේ පහසුව සඳහා පමණි)

**විශේෂ දීමනා**

ප්‍රේරිතවරු
ප්‍රොපේතවරු
එවැන්ජලිස්තවරු
පූජකවරු
ගුරුවරු

**කතා කිරීමේ දීමනා**

අනාවැකි පැවසීම
ඉගැන්වීම
උපදෙස් දීම
ප්‍රඥාවේ වචන
දැනීමේ වචන

**සේවය කිරීමේ දීමනා**

ආත්ම විමසීම, දීම
නායකත්වය, උපකාර කිරීම
පරිපාලනය, සේවය කිරීම
ඇදහිල්ල, ආගන්තුක සත්කාරය, කරුණාව

**දීමනා ලකුණු**

හාස්කම්
සුවකිරීම්
අන්‍යභාෂා
අන්‍යභාෂා පරිවර්තනය කිරීම

හාවස්ටයිම් ජාත්‍යාන්තර ආයතනයේ "*ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය*" නමැති පාඨමාලාවේ මේ සෑම දීමනාවක්ම සවිස්තරව පැහැදිලි කරයි. ඔබගේ ආත්මික දීමනා අනාවරණය කර ගැනීමට එය ඔබට උපකාරී වනු ඇත. ආත්මික දීමනා නිසියාකාරව භාවිත කිරීම ආත්මික බලයේ කාර්යක්ෂමතාවට දොරටුව වේ. ඒවා නොමැතිවීම, සාමාන්‍ය ලෝකයේ නිසි උපකරණ නොමැතිව යම් වැඩක් කිරීමට ගන්නා උත්සාහයක් මෙන් වේ.

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල

ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය ලැබීමෙන් ඔබට ක්‍රිස්තුසවහන්සේට සමාන දිවියන් ගත කිරීමට හැකියාව ලැබේ. මෙය සිදුවන්නේ ඔබගේ ජීවිතය තුළ වර්ධනය වන්නාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ ගුණාංග තුළිනි. මෙම ගුණාංග ආත්මික ඵල ලෙස හැඳින්වේ. ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල යොමු කෙරෙන්නේ ඇදහිලිවන්තයෙකුගේ ජීවිතය තුළින් පෙන්නුම් කෙරෙන ශුද්ධාතේමයාණන්වහන්සේගේ ස්වභාවය කෙරෙහිය. ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵලවල ලැයිස්තුවක් පහත දැක්වේ.

**නුමුත් ආත්මයාණන්වහන්සේගේ ඵල නම්-ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම, විශ්වාසකම, මෘදුකම, පමණදැන ක්‍රියා කිරීම යන මේවාය. (ගලාති 5:22-23)**

ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල විස්තරාත්මකව "*ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය* " යන පාඩමාලාවේ සාකච්ඡා කෙරේ. මේ ගුණාංග, ඔබට යේසුස්වහන්සේ වාගේ වීමට අවශ්‍ය ආත්මික බලය ලබා දෙයි.

## බලයේ පැවරීම ලබාගැනීම

යේසුස්වහන්සේ පොරොන්දු වූ පරිදි ගෝලයන් ජෙරුසලමේ සිටියදී පියාණන්වහන්සේ විසින් ශුද්ධාත්මය ප්‍රදානය කරන ලදී (ක්‍රියා 2). ශුද්ධාත්මයාණන්වහන්සේ දැනටමත් ප්‍රදානය කර ඇත. එහෙත් සෑම ඇදහිලිවන්තයෙක්ම මේ බලය ලබාගත යුත්තේ පෞද්ගලිකවම ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තිස්මය අත්දැකීම මගිනි.

ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තිස්මය ලබාගැනීම සඳහා වූ බයිබලීය මාර්ගෝපදේශ මෙසේය:

### පශ්චාත්තාප වී බව්තිස්මය ලබන්න

ශුභාරංචියේ බලය ඔබ පළමුව අත්දැකිය යුත්තේ පාපය පිළිබඳව පශ්චාත්තාප වී යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබගේ පෞද්ගලික ගැළවුම්කරු ලෙස පිළිගැනීමෙනි. ඔබ ජලයෙන් බව්තිස්මය ලැබිය යුතු බවටද යෝජනා කෙරේ.

> **පේතෘස්: නුඹලා සියල්ලෝම පසුතැවිලි වී, පව් කමාව පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් බව්තිස්මය ලබන්න; එවිට ශුද්ධාත්ම දීමනාව නුඹලා ලබන්නහුය. (ක්‍රියා 2:38)**

### එය ඔබට බව විශ්වාස කරන්න:

> **මක්නිසාද ඒ පොරොන්දුව නුඹලාටත්, නුඹලාගේ දරුවන්ටත් අපගේ ස්වාමිවූ දෙවියන්වහන්සේ යම් පමණ දෙනෙකු උන්වහන්සේ වෙතට කැඳවනසේක්ද... (ක්‍රියා 2:39)**

### ඊට ආශාවන්න

> **යේසුස්වහන්සේ නැගිට ශබ්ද පවත්වමින්: යමෙකුට පිපාසා ඇත්නම් ඔහු මා ළඟට ඇවිත් බීවාවේ.**
> **මා කෙරෙහි අදහන්නා තුළින් ලියවිල්ලෙහි කියා තිබෙන හැටියට ජීවනදායක වතුර ඇති ගංගා ගලන්නේයයි කී සේක.**
>
> **(උන්වහන්සේ මෙසේ කීවේ තමන් අදහාගත්තවුන් විසින් ලබන්ට සිටිය ආත්මයාණන් ගැනය. මක්නිසාද යේසුස්වහන්සේ ඒතාක්ම මහිමයට නොපැමිණි බැවින් ඒතාක්ම ආත්මයාණන් නොදෙන ලද්දේය.) (යොහන් 7:37-39)**

### එය ත්‍යාගයක් බව අවබෝධ කරගන්න

ශුද්ධාත්මයාණන්වහන්සේ දැනටමත් ප්‍රදානය කර ඇත. එය සභාවට ප්‍රදානය කරනු ලැබුවේ ක්‍රියා 2 හි සඳහන් පරිදි පෙන්තකොස්ත දිනයේදීය. එය ත්‍යාගයක් බැවින්, එය ලබා ගැනීම සඳහා ඔබට කිසිවක් කළ නොහැකිය. ශුද්ධාත්ම දීමනාව ගැන දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීමට හා තුති දීමට පටන් ගන්න.

### දෙවියන්වහන්සේට අවනත වන්න

ශුද්ධාත්ම දීමනාව ගැන ඔබ දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන විට, ක්‍රියා 2 හි සඳහන් පරිදි පෙන්තකොස්ත දිනයේදී මෙන් ඔබගේ ප්‍රශංසාවත් ශබ්ද නගා පවසන්න. ඔබ ශබ්ද නගා දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන විට ඔබ පළමුව ගොත ගසනු ඇත. ඔබගේ දිව ශුද්ධාත්මයානන්වහන්සේට යටත් කරන්න. එවිට උන්වහන්සේ ඔබ තුළින් ඔබට නොතේරෙන

විදේශිය භාෂවකින් කතා කරනු ඇත. ඔබගේ ගොතගසන තොල්, ඔබ දෙවියන්වහන්සේට නොකඩවා ප්‍රශංසා කරන විට, භාෂාවක් නිර්මාණය කරනු ඇත .

**උන්වහන්සේ වියවුල් තොල්වලින්ද වෙන භාෂාවකින් ද මේ සෙනඟට කථා කරනවා ඇත. (යෙසායා 28:11)**

**ඔවුන් සියල්ලෝ ශුද්ධාත්මයෙන් පූර්ණවල ආත්මයාණන් ඔවුන්ට කථා කරන්ට පුළුවන්කම දුන් ප්‍රකාරයට අන්‍ය භාෂාවලින් කථා කරන්ට පටන්ගත්තෝය. (ක්‍රියා 2:4)**

## අනෙකුත් ඇදහිලිවතුන්ගේ යාච්ඤාවන් ඉල්ලා සිටින්න.

ඇදහිලිවතුන්ගේ අත් තැබීම මගින් ද ශුද්ධාත්මයාණන්වහන්සේ ලබාගත හැකිය. ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තිස්මය ඔබ අත්දැකීමට ආත්මයෙන් පිරී ඇදහිලිවතුන්ට ඔබට උපකාර කළ හැකි ආකාරය ක්‍රියා 8. 9 හා 19 මගින් පෙන්නුම් කෙරේ.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න

2. ශුද්ධාත්මයාණන්වහන්සේ හා බලය අතර ඇති සබඳතාව එළිදරව් කෙරෙන බයිබල් යොමුවක් සඳහන් කරන්න.

3. ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයේ ප්‍රධාන පරමාර්ථය කුමක්ද?

4. ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල සඳහන් බයිබල් යොමවුක් දෙන්න.

5. ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය ලබාගැනිම සඳහා, මෙම පරිච්ඡේදයේ දී ඇති බයිබලිය මාර්ගෝපදේශ හයක් සඳහන් කරන්න.

6. ඇදහිලිවතුන්ට ලබා ගත හැකි ශුද්ධාත්ම දීමනා ලයිස්තුගත කිරීමට පහත දැක්වෙන යොමු කිරීම් භාවිත කරන්න. රෝම 12:1-8; 1 කොරින්ති 12:1-31; එපිස 4:1-16; 1 පේතෘස් 4:7-11.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ පරීක්ෂණ වලට පිළිතුරු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. ක්‍රියා 8:14-17 කියවන්න. සමාරියේ සෙනඟට ගැළවීම ලැබුනේ පිලිප්ගේ සේවය තුළිනි. ඔවුන් ශුද්ධාත්මයාණන්ගේ බව්තිස්මය ලැබුවේ පේතෘස් හා යොහන්ගේ සේවයෙනි.

   ශුද්ධාත්මයාණන්ගේ බව්තිස්මය ලැබීමේ අත්දැකීම ගැළවීම ලැබීමට වඩා වෙනස්ය. ශුභාරංචියේ බලයත් ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයත් සේවයේදී එක්ව ක්‍රියා කිරීම මෙමගින් පෙන්නුම් කෙරේ.

   ක්‍රියා 19:1-6 ද බලන්න. පාවුලුතුමාගේ ප්‍රශ්නය ද බලන්න. "නුඹලා අදහාගත් කල ශුද්ධාත්මයාණන්වහන්සේ ලැබුවාහුද?"

2. භාවස්ටයිම් ජාත්‍යාන්තර ආයතනයේ "ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය" නමැති පාඨමාලාව ලබාගන්න. මෙය ඇදහිලිවතුන්ගේ ජීවිතයේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලගතු සේවය පිළිබඳ විස්තරාත්මක අධ්‍යයනයකි. ආත්මික බලය සඳහා ප්‍රධාන වන්නේ ඔබගේ ආත්මික දීමනා හඳුනාගැනීම හා ඔබගේ ජීවිතයේ ආත්මික ඵල වර්ධනය කරගැනීම වේ. එම පාඨමාලාව මේවා පිළිබඳව ඔබට සහාය වනු ඇත.

   එහි යෝජනා කර ඇති ආකාරයට ඔබ එම ආයතනයේ පාඨමාලාව හදාරන්නේ නම් දැනටමත් "*ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය*" යන්න අධ්‍යයනය කර ඇත. බලගතු සේවයක් සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවතුන්ව සන්නද්ධ කරන අයුරු හඳුනාගැනීමට එය නැවත බලන්න.

# නව වන පරිච්ඡේදය

## බලය පිළිබඳ තෙවන මූලධර්මය: ප්‍රේමයේ බලය

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- " පෙ%්‍රමය" අර්ථවිග්‍රහ කිරීමට
- "ත්‍යාගශීලි" යන වචනය අර්ථවිග්‍රහ කිරීමට
- ආත්මික බලයේ ශ්‍රේෂ්ඨතම මූලධර්මය පෙ%්‍රමය ලෙස හඳුනාගැනීමට
- පළමුවන හා දෙවන ශ්‍රේෂ්ඨතම ආඥා හඳුනාගැනීමට
- අප ඇදහිලිවතුන් බව ලෝකයා දැනගන්නා ආකාරය පැහැදිලි කිරීමට

ඔබට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

> **දැන් පවතින්නේ ඇදහිල්ල, බලාපොරොත්තුව, ප්‍රේමය යන මේ තුනය. මෙයින් ඉතා උතුම් එක නම් ප්‍රේමයය.** (1 කොරින්ති 13:13)

### හැඳින්වීම

ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය පිළිබඳව ඔබ පසුගිය පරිච්ඡේදයෙන් අධ්‍යයනය කළෙහිය. ඇදහිලිවන්තයෙකුගේ ජීවිතය තුළ ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් උපදවන බලයේ ප්‍රකාශවීම, ආත්මික ඵලය බව උගත්තෙහිය. මේවා අතුරින් එක් ආත්මික ඵලයක් වන්නේ ක්‍රිස්තුස්වහන්සේ-ආකාර පෙ%්‍රමයේ ගුණාංගය වේ. එය ගලාති 5:22-23 ඇති ලයිස්තුගත කිරීමේ පළමු ඵලය වේ.

> **නුමුත් ආත්මයාණන්වහන්සේගේ ඵල නම්-ප්‍රේමය ... යන මේවාය.** (ගලාති 5:22-23)

### ශ්‍රේෂ්ඨතම බලය

මෙම පරිච්ඡේදය අධ්‍යයනයට පෙර 1 කොරින්ති 13:1-13 කියවන්න. මෙම කොටසේ "ත්‍යාගශීලි යන්නෙහි තේරුම ප්‍රේමය වේ. ආත්මික බලයේ එක් ශ්‍රේෂ්ඨතම මූලධර්මයක් මෙම පරිච්ඡේදයෙන් අවධාරණය කෙරේ. ඒ ප්‍රේමයේ බලයයි. ප්‍රේමයේ බලය මේවාට වඩා ශ්‍රේෂ්ඨ වේ.

**ශුද්ධාත්මයාණන්වහන්සේ දී ඇති අන්‍ය-භාෂා කතා කිරීමේ බලය:** කවදා හෝ මෙම බලය පහව යනු ඇත. ඔබ මනුෂ්‍යයන් දන්නා හෝ නොදන්නා හෝ භාෂාවලින් කතා කළද, ප්‍රේමය නොමැතිව එය ඵල රහිතය. (1 හා 8 පදයන්)

**දැනුම හා අවබෝධය:** දැනුම බලගතුය, එහෙත් කෙදිනක හෝ මානුෂික දැනුම නැතිවන්නේය. එහෙත් ප්‍රේමය පහව නොයන්නේය. (2 හා 8 පදයන්)

**අනාවැකි කීමේ දීමනාව:** අනාවැකි කීම එනම් දෙවියන්වහන්සේගේ පණිවුඩය සෘජුවම පැවසීමට හා අනාගත සිදුවීම් කලින් කීමට හැකිවීම කෙතරම් බලවත් දීමනාවක් ද එහෙත් අනාවැකි කීමේ දීමනාව කවදා හෝ පහව යන්නේය. (2 හා 8-12 පදයන්)

**ඇදහිල්ල:** කඳු පහකරන තරම් ඇදහිල්ලක් ඔබට තිබුණ ද ප්‍රේමය ඔබට නොමැති නම් ඉන් පලක් නැත. (2 පදය)

**දන්දීම:** ඔබ කුමන දෙයක් අන් අයට දුන්නද එය ප්‍රේමයෙන් නොදෙන්නේ නම් ඉන් ප්‍රයෝජනයක් නැත. (3 පදය)

**ජීවිත පූජාව** : ශුභාරංචිය වෙනුවෙන් ඔබ ජීවිතය පූජා කළ ද එය ප්‍රේමයෙන් නොකරන්නේ නම් එහි කිසි වටිනාකමක් නැත. (3 පදය)

**බලාපොරොත්තුව :** බලාපොරොත්තුව ඉතා වැදගත්ය. මක්නිසාද බලාපොරොත්තු රහිත ජීවිතයක් නිෂ්ඵලය. එහෙත් ප්‍රේමය බලාපොරොත්තුවට වඩා වැදගත් වේ. (13 පදය)

ඔබ ආත්මික බලය පිළිබඳව මෙම පාඨමාලාවෙන් ඉගෙනගෙන ඇති අතර ඉදිරියේදී තවදුරටත් ඉගෙනගන්නෙහිය. එහෙත් මේ දෙය මතක තබාගන්න.

අත්මික බලය පිළිබඳ අනෙකුත් සියලුම මූලධර්ම, සියලු ආත්මික දීමනා, සියලු දේව සේවාවන් මේ සියල්ල ක්‍රියාත්මක විය යුත්තේ ප්‍රේමයේ බලයෙනි. නැතහොත් එවායින් කිසි ප්‍රයෝජනයක් නොමැත. අනෙක් සියල්ල අසාර්ථක වූ විට, ප්‍රේමයේ බලය සාර්ථක වනු ඇත.

## ප්‍රේමයේ අර්ථවිග්‍රහය හා ගතිලක්ෂණ

ප්‍රේමය යනු ගැඹුරු ඇල්ම, සැලකිල්ල හා චින්තාවෙන් යුක්තවීම පිළිබඳ බලවත් හැඟීමක් වන අතර එය ශුද්ධාත්මයාණන්වහන්සේ මගින් වර්ධනය වේ. එය ඔබටම වර්ධනය කරගත හැකි ආකාරයේ ප්‍රේමයක් නොවේ. එය ශුද්ධාත්මයාණන්වහන්සේ මාර්ගයෙන් පමණක් වර්ධනය කරගත හැකි දිව්‍යමය ආකාරයේ ප්‍රේමයකි.

> **ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේගේ ප්‍රේමය අපගේ හෘදවල වගුරුවන ලද්දේය. (රෝම 5:5)**

1 කොරින්ති 13 හි සඳහන් දිව්‍යමය ප්‍රේමයේ ගති ලක්ෂණ බලන්න.

**4 පදය**

ප්‍රේමය බොහෝ ඉවසිලිවන්තය
ප්‍රේමය ගුණවන්තය
ප්‍රේමය ඊර්ෂ්‍යාවන්නේ නැත
ප්‍රේමය පාරට්ටුකරගන්නේ නැත, උඩඟුවන්නේ නැත.

**5 පදය**

ප්‍රේමය අශෝභන ලෙස හැසිරෙන්නේ නැත (අන් අය කෙරෙහි නරක ලෙස හැසිරීම)
ප්‍රේමය තමාගේම කාරණා සොයන්නේ නැත (ආත්මාර්ථකාමී නොවේ)
ප්‍රේමය පහසුවෙන් කෝපවන්නේ නැත (තරහ ඇතිවන්නේ නැත)
ප්‍රේමය අන් අය පිළිබඳ නපුරු ලෙෂ සිතන්නේ නැත" නපුර ගණන්ගන්නේ නැත.

**6 පදය**

ප්‍රේමය අධර්මිෂ්ඨකමට ප්‍රීතිවන්නේ නැත (අන් අයට වැරදි කිරීමෙන් හෝ අන් අයගේ වැරදි ඇසීමෙන් හෝ සන්තෝෂ නොවේ).
ප්‍රේමය සැබෑව සමග ප්‍රිතිවන්නේය (බොරු කියන්නේ හෝ ප්‍රලාප පවසන්නේ හෝ නැත)

**7 පදය**

ප්‍රේමය සියල්ල දරාගන්නේය (අසිරු දේ පවා)
ප්‍රේමය සියල්ල විශ්වාස කරන්නේය (අන් අය විශ්වාස කරන්නේය)
ප්‍රේමය සියල්ල බලාපොරොත්තු වන්නේය (කුමන අවස්ථාවක වුවත් දෙවියන්වහන්සේ හෝ අන් අය හෝ කෙරෙහි බලාපොරොත්තුව අත්හරින්නේ නැත.).
ප්‍රේමය සියල්ල ඉවසන්නේය.

**8 පදය**

ප්‍රේමය කිසිකලෙක පහවන්නේ නැත (අවස්ථාව කුමක් හෝ විය හැකිය)

## ප්‍රේමය පිළිබඳව බයිබලය උගන්වන්නේ කුමක්ද?

ප්‍රේමයේ බලය අවබෝධ කරගැනීම සඳහා බයිබලය මේ පිළිබඳව උගන්වන දේ ඔබ දැනගත යුතුය. ප්‍රේමයේ ආත්මික එලය, මේ ප්‍රබල බලය, ලෝකයා පෙන්නුම් කරන ලිංගික හෝ මානුෂික හෝ ප්‍රේමය නොවේ. එය 'අව්‍යාජ' ප්‍රේමයකි. එනම් ශුද්ධ ප්‍රේමයකි. ඔබ අන් අයට දැක්විය යුත්තේ අව්‍යාජ ප්‍රේමයකි.

> **සහෝදරයන්ට අවංක කමින් ප්‍රේම කරන පිණිස සත්‍යතාවට කීකරුවීමෙන් නුඹලාගේ ආත්ම පිරිසිදු කරගත් බැවින් සිතින් එකිනෙකාට උනන්දු ලෙස ප්‍රේම කරන්න. (1 පේතෘස් 1:22)**

පළමු හා ශ්‍රේෂ්ඨතම ආඥාව වන්නේ ඔබ දෙවියන්වහන්සේට ප්‍රේම කිරීම වේ.

ප්‍රධාන එක නම්

> **නුඹේ මුළු හෘදයෙන් ද නුඹේ මුළු ආත්මයෙන් ද නුඹේ මුළු බුද්ධියෙන් ද නුඹේ මුළු ශක්තියෙන් ද නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේට ප්‍රේම කරන්න. (මාක් 12:30)**

(ද්විතීය කථාව 6:5; ලූක් 10:27; 1 යොහන් 2:5, 15; 3:11-17; 4:7-20; 5:2; 2 යොහන් 1:5-6 බලන්න)

දෙවියන්වහන්සේ කෙරෙහි ඇති ඔබගේ පෙ%ේමය ඔබ උන්වහන්සේට දක්වන කීකරුකම මගින් පරීක්ෂාකර බලනු ලැබේ.

> **යේසුස්වහන්සේ ඔහුට උත්තර දෙමින්: යමෙක් මට ප්‍රේමකරන්නේ නම්, ඔහු මාගේ වචනය රක්ෂාකරන්නේය. මාගේ පියාණන්වහන්සේ ද ඔහුට ප්‍රේම කරන සේක. අපි ඔහු ළඟට ඇවිත් ඔහු සමග වාසය කරමුව. (යොහන් 14:23)**
>
> **නුමුත් යමෙක් උන්වහන්සේගේ වචනය පවත්වන්නේද, ඔහු තුළ සැබැවටම දෙවියන්වහන්සේගේ ප්‍රේමය සම්පූර්ණ වී තිබේ. අපි උන්වහන්සේ තුළ සිටින බව එයින් දනිමුව. (1 යොහන් 2:5)**

දෙවන ශ්‍රේෂ්ඨතම ආඥාව වන්නේ අන් අය කෙරෙහි දක්වන ප්‍රේමය වේ.

> **දෙවෙනි එක නම්: නුඹට මෙන් නුඹේ අසල්වාසියාටත් ප්‍රේම කරන්න යනුය. මේවාට වඩා උතුම් වූ අන්කිසි ආඥාවක් නැත. (මාක් 12:31)**

උන්වහන්සේ ඔබට ප්‍රේමකරන්නාක් මෙන් ඔබත් අන් අයට ප්‍රේම කිරීම උන්වහන්සේට අවශ්‍යය.

> **මා නුඹලාට ප්‍රේම කළාක් මෙන් නුඹලාත් එකිනෙකාට ප්‍රේම කරන ලෙස, එකිනෙකාට ප්‍රේම කරන්න කියා අලුත් ආඥාවක් මම නුඹලාට දෙමි. (යොහන් 13:34)**

**පියාණන්වහන්සේ මට ප්‍රේම කලාක් මෙන්ම මමත් නුඹලාට ප්‍රේම කෙළෙමි. මාගේ ප්‍රේමයෙහි පවතින්න.**
**මාගේ ආඥාව නම් මා නුඹලාට ප්‍රේමකළාක් මෙන් නුඹලාත් එකිනෙකාට ප්‍රේම කරන්න. (යොහන් 15:9,12)**

**ඔබ මා කෙරෙහි ඇතුව සිටි ප්‍රේමය ඔවුන් තුළෙහි ද මාත් ඔවුන් තුළෙහිද වන පිණිස ඔබගේ නාමය ඔවුන්ට දැන්වීමි, තවත් දන්වන්නෙමි. (යොහන් 17:26)**

ඔබ ඇදහිලිවන්තයෙකු ලෙස හඳුනාගන්නේ පෙ%්‍රමය මගිනි.

**නුඹලා මාගේ ගෝලයෝ බව එයින් සියල්ලන් දැනගන්නවා ඇත. (යොහන් 13:35)**

**අප සහෝදරයන්ට ප්‍රේම කරන බැවින් අප මරණින් ජීවනයට පැමිණ සිටින බව අපි දනිමු. ප්‍රේම නොකරන තැනැත්තේ මරණයෙහි පවතියි. (1 යොහන් 3:14)**

ඔබ අනෙකුත් ඇදහිලිවතුන්ට ප්‍රේම නොකරන්නේ නම් දෙවියන්වහන්සේගේ ප්‍රේමය ඔබ තුළ නැත.

**ආලෝකයෙහි පවතිමියි කියමින් තමාගේ සහෝදරයාට වෛර වෙන්නා මේතාක් අඳුරෙහි සිටියි.**
**තමාගේ සහෝදරයාට ප්‍රේමවෙන්නා ආලෝකයෙහි පවතියි. පැකිලීමට කාරණයක් ද ඔහු තුළ නැත. (1 යොහන් 2:9-10)**

(මෙය ඉතා වැදගත් සත්‍යයකි. ඒ පිළිබඳව තව දුරටත් යොහන් 13:34; 14:15,21,23,31; 15:9-17; 17:26; 21:15-17 න් අධ්‍යයනය කරන්න)

අන් ඇදහිලිවතුන් කෙරෙහි දක්වන ප්‍රේමයෙන් ඉතා ප්‍රබල බලයක් වූ ආත්මික ඒකත්වය ඇතිවේ. ඔවුන් යාච්ඤාවෙන් එක්සත්ව සිටින විට පෙන්තකොස්තය සිදුවිය (ක්‍රියා 2). ඔවුහු 'එක සිතකින් හා එක ආත්මයකින්' යුක්ත වූහ (ක්‍රියා 4:32). එමෙන් බලයෙන් යුක්තව තව දුරටත් සාක්ෂි දුන්හ (ක්‍රියා 4:33). ඔවුහු සහභාගිකමේ එකමුතුකමට කැපවුනු අතර (ක්‍රියා 2:42) බොහෝ පුදුම ද හාස්කම් ද කළහ (ක්‍රියා 2:43).

ඔබගේ සතුරන්ට ප්‍රේම කළ යුතුය.

**නුමුත් අසන්නාවූ නුඹලාට මම කියමි. නුඹලාගේ සතුරන්ට ප්‍රේම කරන්න. නුඹලාට වෛර කරන්නන්ට යහපත කරන්න.**
**නුඹලාට ශාපකරන්නන්ට ආශිර්වාද කරන්න. නුඹලාට නින්දා කරන්නවුන් උදෙසා යාච්ඤා කරන්න.**
**නුඹලාට යහපත කරන්නන්ටම නුඹලාත් යහපත කරනවා නම් නුඹලාට කවර ස්තුතියක් ද? මක්නිසාද පව්කාරයෝ පවා එසේම කරති.**
**නුමුත් නුඹලාලෙග් සතුරන්ට ප්‍රේම කරන්න. යහපත කරන්න. (ලූක් 6:27,28,33,35)**

**තාගේ අසල්වැසියාට ප්‍රේම කරන්න, තාගේ සතුරාට වෛර කරන්නයි කී බව නුඹලා අසා තිබේ. නුමුත් මම නුඹලාට කියමි. නුඹලාගේ සතුරාට ප්‍රේම කරන්න. නුඹලාට පීඩාකරන්නන් උදෙසා යාච්ඤා කරන්න. (මතෙව් 5:43-44)**

ඔබේ ප්‍රේමය බහුලව තිබිය යුතුය. ඉන් අදහස් වන්නේ එය නිරන්තරයෙන් වර්ධනය වන බවයි.

**නුඹලාගේ ප්‍රේමය දැනගැන්මෙන් හා සියලු ආකාර විමසීමෙන් තව වඩ වඩා බොහෝ වන පිණිස යාච්ඤා කරමි. (පිලිප්පි 1:11)**

**අප නුඹලාට ප්‍රේම කරන්නාක් මෙන්ම ස්වාමින්වහන්සේ නුඹලාගෙන් එකිනෙකා කෙරෙහිත් අනික් සියල්ලන් කෙරෙහිත් නුඹලාගේ ප්‍රේමය වැඩි කර... (1 තෙසලෝනික 3:12)**

ඔබ ප්‍රේමය තු=ළ මුල් බැස සිටිය යුතුය.

**ඇදහිල්ල කරණාකටෙගෙන ක්‍රිස්තුස්වහන්සේ නුඹලාගේ සිත්තුළ වාසය කරන පිණිසත් නුඹලාගේ ප්‍රේමයෙහි මුල් ඇද පිහිටා සිට,**
**දෙවියන්වහන්සේගේ මුළු පූර්ණකමට පූර්ණ වන පිණිස සියලු ශුද්ධවන්තයන් සමග ක්‍රිස්තුස්වහන්සේගේ දැනගත නොහැකි ප්‍රේමය දැනගෙන,**
**එහි පළල, දිග, උස ගැඹුර කිමෙක්ද කියා තේරුම්ගන්ට නුඹලාට පුළුවන් වන පිණිසත් උන්වහන්සේගේ මහිමයේ සම්පතේ හැටියට නුඹලාට දෙන මෙන් යාච්ඤා කරමි.**
**(එපීස 3:17-19)**

ඔබ දෙවියන්වහන්සේගේ සම්පූර්ණත්වයෙන් හා උන්වහන්සේගේ බලයෙන් පිරී තිබීමට අවශ්‍ය නම්, ඔබට ප්‍රේමය තිබිය යුතුය. එය බලයට වැදගත්ය, මක්නිසාද එය බිය ඉවත්කරන බැවිනි.

**ප්‍රේමයෙහි භය ඇත්තේ නැත. සම්පූර්ණ ප්‍රේමය භය දුරුකරයි. මක්නිසාද භය දඬුවමින් යුක්තය. භයවන තැනැත්තේ ප්‍රේමයෙන් සම්පූර්ණ නොවී සිටියි. (1 යොහන් 4:18)**

ඔබ ප්‍රේමයෙන් ගමන් කළ යුතුය.

**ක්‍රිස්තුස්වහන්සේ නුඹලාට ප්‍රේම කොට, මිහිරි සුවඳක් පිණිස දෙවියන්වහන්සේට පූජාවක් ද යාගයක් ද කොට අප වෙනුවට තමන්ව පාවාදුන්නාක් මෙන් නුඹලාත් ප්‍රේමයෙන් හැසිරියල්ලා (එපීස 5:2).**

ඔබ "ඉවසිය" යුතුය. එනම් අන් අය සමඟ ප්‍රේමයෙන් සබඳතා ඇතිකර ගත යුතුය.

**සියලු ආකාර යටහත් කමින්ද මොළොක් ගුණයෙන් ද ඉවසිලිවන්තකමෙන් ද හැසිර, එකිනෙකා ගැන ප්‍රේමයෙන් ඉවසා, (එපීස 4:2)**

ඔබ ප්‍රේමයේ පැවතිය යුතුය.

**... දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙහි පැවතියල්ලා (යුද් 21)**

**... ධර්මිෂ්ඨකම ද භක්තිවන්තකම ද ඇදහිල්ල ද ප්‍රේමයේ ස්ථිරකම ද මොළොක්ගුණය ද පස්සේ යන්න. (1 තිමෝති 6:11)**

බලයට ඉතා වැදගත් වූ ඇදහිල්ල ක්‍රියාත්මක වන්නේ ප්‍රේමයෙනි.

**ප්‍රේමය කරණකොටගෙන ක්‍රියාකරන ඇදහිල්ලෙන් මිස... (ගලාති 5:6)**

ස්වාමින්වහන්සේ සඳහා වූ ඔබගේ ක්‍රියාවන් ප්‍රේමයේ සේවයක් විය යුතුය.

**නුඹලාගේ ඇදහිල්ලේ ක්‍රියාව ද ප්‍රේමයේ වීර්යය ද ... නොකඩවා සිහිකරමින්**
**(1 තෙසලෝනික 1:2)**

**මක්නිසාද නුඹලාගේ වැඩය ද නුඹලා ශුද්ධවන්තයන්ට කළාවූ කරන්නාවූ උපස්ථානයෙන් දෙවියන්වහන්සේගේ නාමයට පෙන්වූ පෙ%ිමය ද මතක නැති කරන්ට උන්වහන්සේ අධර්මිෂ්ඨ නැත. (හෙබ්‍රෙව් 6:10)**

මෙම පොළොවේ කාලයේ අවසානයට අප ළංවන විට, බොහෝ දෙනෙකුගේ ප්‍රේමය නොපවතිනු ඇත. එය "හින වන්නේය" එනම් මිනිසුන් නොසැලකිලිමත් වනු ඇත.

**අධර්මිෂ්ඨකම බෝවන බැවින් බොහෝ දෙනාගේ ප්‍රේමය හිනවන්නේය. (මතෙව් 24:12)**

එහෙත් දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් අප වෙන් කළ හැකි කිසිවක් නොමැති බවට අපට සහතිකයක් ලැබී ඇත.

> **ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයෙන් අප වෙන්කරන්නේ කවුද? විපතවත්, සිත් වේදනාවවත්, පීඩාවවත්, දුර්භික්ෂයවත්, නිර්වස්ත්‍රකමවත්, උපද්‍රවයවත්, කඩුවවත් අප වෙන්කරන්නේද? මක්නිසාද මරණයටවත්, ජීවනයටවත්, දූතයන්ටවත්, අධිපතිකම්වලටවත්, දැන් පවතින දේවලටවත්, පරාක්‍රමවලටවත් උසටවත් ගැඹුරටවත් අන්කිසි මැවිල්ලකටවත් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇත්තාවූ දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් අප වෙන් කරන්නට නොහැකිවන්නේ යයි ඒකාන්තයෙන්ම දනිමි.** (රෝම 8:35, 38-39)

## ශ්‍රේෂ්ඨතම ප්‍රේමය

ශ්‍රේෂ්ඨතම ප්‍රේමය වන්නේ පාපී ලොවට දෙවියන්වහන්සේ දැක්වූ ප්‍රේමය වේ. මැරෙන පිණිස යේසුස්වහන්සේ එවීමෙන් උන්වහන්සේ එම ප්‍රේමය පෙන්වූ සේක.

> **මක්නිසාද ස්වාමින්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්නා හැම දෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය.** (යොහන් 3:16)

යේසුස්වහන්සේ මේ ශ්‍රේෂ්ඨ ප්‍රේමය කුරුසිය මත සිය කැමැත්තෙන්ම උන්වහන්සේගේ ජිවිතය පූජා කිරීම මගින් පෙන්වූ සේක.

> **යමෙක් තමාගේ මිත්‍රයන් උදෙසා තමාගේ ජීවිතය දීමට වඩා මහත් ප්‍රේමයක් කිසිවෙකුට නැත** (යොහන් 15:13).

> **ධර්මිෂ්ඨයෙකු උදෙසා යමෙකු මැරෙන්ට කැමතිවීම දුර්ලභය. සමහරවිට සත් පුරුෂයෙකු උදෙසා මැරෙන්ට යමෙකු ධෛර්යය ඇතුව සිටින්ට පුළුවන.**
> **නුමුත් දෙවියන්වහන්සේ අප කෙරෙහි ඇති තමන්වහන්සේගේ ප්‍රේමය පෙන්වන්නේ අප පව්කාරයෙක්ව සිටියදීම අප වෙනුවට ක්‍රිස්තුස්වහන්සේගේ මරණය විඳීමෙන්ය.**
> (රෝම 5:7-8)

ඔබගේ ජිවිතය තුළ වර්ධනය කිරීමට ශුද්ධාත්මයාණන්වහන්සේට අවශ්‍ය වන්නේ ප්‍රේමයේ මෙම බලගතු බලය වන දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ බලය වේ.

> **මක්නිසාද, අපට දෙන ලද ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේගේ ප්‍රේමය අපගේ හෘදවල වගුරුවන ලද්දේය.** (රෝම 5:5)

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

______________________________________________

______________________________________________

2. ප්‍රේමය යනු කුමක්ද?

______________________________________________

3. පළමුවන හා දෙවන ශ්‍රේෂ්ඨ ආඥා කවරේද?

______________________________________________

______________________________________________

4. අප ඇදහිලිවතුන් බව ලෝකයා දන්නේ කෙසේද?

______________________________________________

5. මෙම වගන්තිය සම්පූර්ණ කරන්න.

"ආත්මික බලයේ අනෙකුත් සියලුම මූලධර්ම, සියලු ආත්මික දීමනා, සියලු සේවයන් ක්‍රියාත්මක විය යුත්තේ ____________________ බලයෙනි, නැතහොත් මේවා නිෂ්ඵලය.

6. ආත්මික බලයේ ශ්‍රේෂ්ඨතම මූලධර්මය කුමක්ද?

______________________________________________

7. 1 කොරින්ති 13 හි "ප්‍රේමය" යන වචනයේ තේරුම කුමක්ද?

______________________________________________

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ පරීක්ෂණ වලට පිළිතුරු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. ප්‍රේමය පිළිබඳව බොහෝ දේ දාවිත් ලියා ඇත. ගීතාවලිය 18:1; 31:23; 40:16; 97:10; 116:1; 119:97; 113, 119, 127, 132, 159, 163, 165, 167, 122:6; 145:20 බලන්න.

2. 1 යොහන් පොත අධ්‍යනය කරන්න. මෙම පොතේ ප්‍රධාන තේමාව වන්නේ ප්‍රේමයය.

3. බයිබලයේ 1 කොරින්ති 13 කියවන්න.

මම මනුෂ්‍යයන්ගේද දේවදූතයන්ගේද භාෂාවලින් කථාකරන්නෙම් නුමුත් මට ප්‍රේමය ^ත¹ක කළ හැකි , හිතා මතා, අධ්‍යාත්මික භක්තියෙන් යුත= දෙවියන්වහන්සේගේ ප්‍රේමය& නැත්තම්, හඬනගන පිත්තලට නොහොත් ශබ්ද පවත්වන අත්තලකට සමාන වී සිටිමි.

මට අනාගතවාක්‍ය කීමේ දිමනාව ඇතුව ^දිව්‍ය කැමැත්ත හා අරමුණු ප×ව¹තනය කල හැකි දිමනාව& සියලු රහස්ද සියලු දැනගැන්මද දනිමි නුමුත්, කඳු පහකරන තරම් සියලු ඇදහිල්ල ඇතුව සිටිමි නුමුත් මට ප්‍රේමය ^දෙවියන්වහන්සේගේ ප්‍රේමය& නැත්නම් මම හිස්වෙමි.

මා සන්තක සියල්ල දිළිඳුන් පෝෂණය කරන පිණිස දෙතත්, මාගේ ශරීරය දවන්ට භාර දෙතත්, ^මා මහිමයට පත්වන ප×දි& මට ප්‍රේමය^දෙවියන්වහන්සේගේ ප්‍රේමය& නැත්නම් මට කිසි ප්‍රයෝජනයක් නැත.

ප්‍රේමය බොහෝ ඉවසිලිවන්තය, ගුණවන්තය, ප්‍රේමය ඊර්ෂ්‍යා වෙන්නේ නැත, ප්‍රේමය පාරට්ටුකරගන්නේ නැත, උඩඟුවෙන්නේ නැත,

අශෝභන ලෙස හැසිරෙන්නේ නැත, තමාගේම කාරණා සොයන්නේ නැත, කෝපවෙන්නේ නැත, නපුර ගණන් ගන්නේ නැත, අධර්මිෂ්ඨකමට ප්‍රීති නොවී සැබෑව සමග ප්‍රීති වන්නේය, සියල්ල දරාගන්නේය, සියල්ල විශ්වාස කරන්නේය, සියල්ල බලාපොරොත්තු වන්නේය, සියල්ල ඉවසන්නේය. ^¥¹වල නොවි&

ප්‍රේමය කිසි කලෙක පහවන්නේ නැත. අනාගතවාක්‍යකීම් වුවත් ^දිව්‍ය කැමැත්ත හා අරමුණු ප×ව¹තනය කල හැකි දිමනාව& නැතිවන්නේය, භාෂා වුවත් නවතින්නේය, දැනගැන්ම වුවත් නැතිවන්නේය. ^¡ත්‍යය සියල්ල අභිබවා යන බැවින් දැනගැන්මේ වටිනාකම නැතිවී යයි&

මක්නිසාද අපේ දැනගැන්ම මඳය,^අසම්පු¹ණ හා ප×පු¹K නොවු& අනාගතවාක්‍යකීමත් මඳය. නුමුත් සම්පූර්ණ එක පැමුණුනාම මඳක්ව තිබෙන දේ නැතිවන්නේය.

මම බාලයෙක්ව සිටිය කල බාලයෙකු මෙන් කථා කළෙමි, බාලයෙකු මෙන් සිතුවෙමි, බාලයෙකු මෙන් කල්පනා කෙළෙමි. දැන් මම වැඩි වයසට පැමිණ සිටින බැවින් බාලයාගේ දේවල් අත්හැර සිටිමි.

එසේය, දැන් අපට කැඩපතකින් අඳුරු ලෙස ^නොපැහැදිලි& පෙනෙන්නේය: නුමුත් මතු මුහුණට මුහුණ පෙනෙනවා ඇත. දැන් මාගේ දැනගැනීම අඩුය ^අසම්පු¹ණය&" නුමුත් මා දැනගනු ලැබූ ලෙසම මතු මම දැනගන්නෙමි.

දැන් පවතින්නේ ඇදහිල්ල, බලාපොරොත්තුව, ප්‍රේමය යන මේ තුනය: මෙයින් ඉතා උතුම් එක නම් ප්‍රේමයය.

# දසවන පරිච්ඡේදය

## බලය පිළිබඳ සිවුවන මූලධර්මය: ආලේප කිරීමේ බලය

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- පැරණි ගිවිසුමේ සඳහන් ශුද්ධවූ ආලේපයේ පරමාරථය පැහැදිලි කිරීමට
- පැරණි ගිවිසුමේ ශුද්ධවූ ආලේපය භාවිත කළ අයුරු දැක්වීමට නිදසුන් දීමට
- "ක්‍රිස්තුස්" යන නමේ තේරුම පැහැදිලි කිරීමට
- බලය ආලේප කිරීමේ පරමාර්ථය සාරාංශගත කිරීමට
- සේවයේ දී ඔබගේ සුවිශේෂී අලේපය සොයාගැනීමේ වැදගත්කම පැහැදිලි කිරීමට
- බලයේ ආලේපය ලබාගන්නා ආකාරය පැහැදිලි කිරීමට
- ආත්මික ආලේපයේ ප්‍රභවය හඳුනාගැනීමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

> **නුඹලා උන්වහන්සේගෙන් ලැබූ ආලේපය නුඹලා තුළ පවතින්නේය. යමෙකු විසින් නුඹලාට ඉගැන්වීම් ඕනෑ කරන්නේ නැත; එම ආලේපය සියල්ල ගැන නුඹලාට උගන්වන ලෙසද, එය බොරු නොව සත්‍යව තිබෙන ලෙසද, එයින් නුඹලාට ඉගැන්වූ ප්‍රකාරයට ද උන්වහන්සේ තුළ පවතින්න.** (1 යොහන් 2:27)

### හැඳින්වීම

මෙම පරිච්ඡේදයෙන් සලකණු ලබන්නේ, ඵලදායි සේවයක් සඳහා පිරිමින් හා ස්ත්‍රීන් බලගතු කෙරෙන දෙවියන්වහන්සේගේ ආලේප කිරීම පිළිබඳව වේ. එමෙන්ම මෙම බලයේ ආලේපය ලබා ගැනීම සඳහා මඟපෙන්වීමක් ද ඉන් සපයනු ඇත.

### ආලේප කිරීමේ පුරුද්ද

"ආලේපකිරීම" යන්නෙහි තේරුම යම් පුද්ගලයෙකුට හෝ යම් දෙයකට හෝ තෙල් ගෑම වේ. එය පැරණි ගිවිසුම් කාලයේ ආරම්භ කළ පුරුද්දකි. මුල් කාලයේ ආලේප කිරීම් වර්ග තුනක් තිබී ඇත. ඒවා නම් සාමාන්‍ය, වෛද්‍ය හා ශුද්ධ ආලේප වේ.

**සාමාන්‍ය ආලේප කිරීම,** යම් කෙනෙකුගෙන් හොඳ සුවඳක් නික=ත්වීමට කෙරෙන පෞද්ගලික පවිත්‍රකිරීම හා සම්බන්ධය. එහි භාවිතය පිළිබඳව ඔබට මෙම කොටස්වලින් කියවිය හැකිය. රූත් 3:3; ගීතාවලිය 104:15 හා හිතෝපදේශ 27:9" ගරු කිරීමක් වශයෙන් අමුත්තන්ව ආලේප කරන ලදී (ලූක් 7:46). එමෙන්ම මළගිය අය භූමදානය සඳහා සූදානම් කළේ ආලේප කිරීම මගිනි (මාක් 14:8; 16:1).

**වෛද්‍ය ආලේප කිරීම:** රෝගී වුවන්ට හා තුවාලකරුවන්ට උපකාරයක් ලෙස භාවිත විය. නිදසුනක් සඳහා ලූක් 10:34 බලන්න.

**ශුද්ධ ආලේප කිරීම:** මෙම තෙවෙනි ආකාර ආලේප කිරීම මෙම පරිච්ඡේදයේ මාතෘකාව වේ. එය ශුද්ධ හෝ ආත්මික හෝ දේ සඳහා කෙරෙන ආලේපයකි. එය, යම් දේවල් හෝ පුද්ගලයන් හෝ දෙවියන්වහන්සේට කැපකිරීම සඳහා යොදා ගැණින.

## පැරණි ගිවිසුමේ උදාහරණ

පැරණි ගිවිසුමේ වාර්තාකර ඇති ආත්මික පරමාර්ථයන් සඳහා වූ පළමු ආලේපකිරීම උත්පත්ති 28:18 හි ඇත. ජාකොබ්, දෙවියන්වහන්සේගෙන් මහත් වූ දර්ශනයක් දුටු පසු, ඔහු

> **... අලුයම නැගිට තමාගේ හිසට තබන ලද ගල රැගෙන කණුවක් කොට සිටුවා එහි මුදුනේ තෙල් වත්කොට**
> **ඒ ස්ථානයට බෙතෙල් (දෙවියන්වහන්සේගේ ගෘහය) යයි නම් තැබීය. (උත්පත්ති 28:18-19)**

දෙවියන්වහන්සේ මේ සිද්ධිය ගැන පසුව කතා කරමින් මෙසේ පැවසිය.

> **මම වනාහි නුඹ කණුවක් ආලේප කර භාරයක් වුණු ස්ථානය වූ බෙතෙල්හී දී ප්‍රකාශවූ දෙවියන්වහන්සේය (උත්පත්ති 31:13).**

පසුව දෙවියන්වහන්සේ පූජකවරුන්, රජවරුන් හා දිවැසිවරුන්, ඔවුන්ව ආත්මික පරමාර්ථයන් සඳහා වෙන් කිරීමට, ආලේප කිරීම පිළිබඳව උපදෙස් දුන් සේක. නමස්කාර කෙරෙන දේවස්ථානයේ ඇති දේද ආලේප කළ යුතු විය. ඔබට මේ පිළිබඳව "තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා" යන කොටසින් බොහෝ දේ උගත හැකිය.

පුද්ගලයන් හා ද්‍රව්‍ය අලේප කිරීමේ පරමාර්ථය වූයේ, දෙවියන්වහන්සේගේ සේවය සඳහා විශේෂ කැපකිරීමකින් යුතුව වෙන් කර තැබීමය. මේ ආත්මික දේ සඳහා ශුද්ධ තෙලය භාවිත කෙරිනි.

> **එයින් ශුද්ධවූ ආලේපය පිණිස තෙල මිශ්‍රකරන විධියට ඒවා මිශ්‍රකර ශුද්ධ තෙලයක් සාදාපන්න. ඒ ශුද්ධ ආලේපය තෙලයක් වන්නේය.**
> **නුඹ ඉශ්රායෙල් පුත්‍රයන්ට කථාකොට මේවා නුඹලාගේ පරම්පරාවලටම ශුද්ධ ආලේප තෙලයක් වන්නේය. (නික්මයාම 30:25,31)**

## යේසුස්වහන්සේ ආලේප කිරීම

දෙවියන්වහන්සේ සංස්ථාපිත කළ ක්‍රමය අනුගමනය කරමින් සේවය සඳහා යේසුස්වහන්සේව ආලේප කරන ලදී. යේසුස්වහන්සේ මෙසේ පැවසූසේක.

> **ස්වාමින්වහන්සේගේ ආත්මය මා කෙරෙහිය; මක්නිසාද දිළිඳුන්ට ශුභාරංචිය දේශනාකරන්ට උන්වහන්සේ මා ආලේපකළ සේක; වහලුන්ට මිදීම සහ අන්ධයන්ට පෙනීම ලැබෙන බව ප්‍රකාශකරන්ටද මඩනාලද්දවුන් නිදහස්කර හරින්ටද ස්වාමින්වහන්සේගේ පිළිගත යුතු අවුරුද්ද ප්‍රකාශකරන්ට ද උන්වහන්සේ මා එවූසේකැයි (ලූක් 4:18-19)**

මෙය යෙසායා 61:1 දී ඇති අනාවැකිය සම්පූරණ කිරීමකි.

මේ දේ ගෝලයෝ පිළිගත්හ.

> **දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන් ද බලයෙන් ද නාසරීය යේසුස්වහන්සේ ආලේපකළ බවත්, දෙවියන්වහන්සේ උන්වහන්සේ සමග සිටි බැවින් උන්වහන්සේ යහපත්කම් කරමින් ද යක්ෂයා විසින් පීඩාකරන ලද සියල්ලන් සුවකරමින්ද හැසුරුණු බවත්ය. (ක්‍රියා 10:38)**

## ආලේපකිරීමේ ප්‍රභවය

ආත්මික ආලේප කිරීමේ බලය ඇත්තේ තෙල්වල නොවේ. එමෙන්ම ඒ බලය, ආලේප කරන තැනැත්තා හෝ එය ලබන තැනැත්තා හෝ මත රඳාපවත්තේ නැත. ආලේප කිරීමේ බලය ගලාගෙන එන ප්‍රභවය වන්නේ පියවූ දෙවියන්වහන්සේය. යේසුස්වහන්සේ පැවසූ දෙය බලන්න. "ස්වාමින්වහන්සේගේ ආත්මය මා පිට වේ. මන්ද උන්වහන්සේ මා ආලේප කර ඇත.

පාවුලුතුමා මෙසේ පැවසිය:

> **ඉඳින් නුඹලා සමග අප ක්‍රිස්තුස්වහන්සේ තුළ ස්ථිරකරන්නෙත් අප ආලේපකළෙත් දෙවියන්වහන්සේය.** (2 කොරින්ති 1:21)

ක්‍රිස්තුස්වහන්සේ ආලේප කිරීමේ ප්‍රභවය වූයේ දෙවියන්වහන්සේය. තවමත් ආලේප කිරීමේ ප්‍රභවය උන්වහන්සේමය. තෙල් මේ ආලේප කිරීම නියෝජනය කෙරෙන ස්වභාවික සංකේතය පමණි. යේසුස්වහන්සේ විසින් ආලේප කිරීමේ ක්‍රමය භාවිත කළ නමුත් සෑම විටම තෙල් භාවිත කලේ නැත. යේසුස්වහන්සේ සුවකළ අන්ධ මිනිසෙක් මෙසේ පැවසිය:

> **ඔහු උත්තරදෙමින්: යේසුස් නම් මනුෂ්‍යයා මඩ සාදා මාගේ ඇස්වල ගා නුඹ සිලෝවම්ට ගොස් සෝදාගනින්නැයි මට කීවේය. මම ගොස් සෝදාගෙන පෙනීම ලැබීමියි කීවේය.** (යොහන් 9:11)

මෙම පදයෙන් සහතික කෙරෙන්නේ, ඵලදායි වන්නේ ආලේප කිරීම පසුපස ඇති බලය මිස, භාවිත කළ ද්‍රව්‍යය නොවන බවය. පිරිමින් හා ගැහැණුන් සංකේතාත්මකව මිනිසෙකු විසින් තෙලින් ආලේප කළ ද, සැබෑ ආලේප කිරීමේ බලය ලැබුනේ දෙවියන්වහන්සේගෙනි. දාවිත් රජතුමා ගැන දෙවියන්වහන්සේ මෙසේ පැවසූ සේක.

> **මාගේ මෙහෙකරුවූ දාවිත් සොයාගෙන මාගේ ශුද්ධ තෙලයෙන් ඔහු ආලේප කෙළෙමි.** (ගීතා 89:20)

දාවිත්ව, මිනිසෙකු විසින් ආලේප කිරීමට අවුරුදු ගණනාවකට පෙර දෙවියන්වහන්සේ විසින් ඔහුව ආලේප කළ සේක.

> **එවිට නාතාන් දාවිත්ට කථාකොට, ඉශ්‍රායෙල්ගේ දෙවි ස්වාමින්වහන්සේ මෙසේ කියන සේක. මම නුඹ ඉශ්‍රායෙල් කෙරෙහි රජකොට ආලේප කර ...** (2 සාමුවෙල් 12:7)

## ආලේප කිරීමේ පරමාර්ථ

දෙවියන්වහන්සේගේ ආත්මයෙන් ආලේප කරනු ලැබීම මිනිසෙකුගේ ජීවිතයට හා සේවයට ඉතා වැදගත් වේ. ආලේප කිරීමේ පරමාර්ථ කීපයක් මෙසේය.

### සේවය

දෙවියන්වහන්සේගේ ආලේප කිරීම සාවුල් වෙත පැමිණි විට, ඔහු ඉශ්‍රායෙලයේ රජ ලෙස කටයුතු කිරීම සඳහා වෙනස්වූ මිනිසෙක් බවට පත්විය.

> **එවිට සාමුවෙල් තෙල් කුලාව රැගෙන සාවුල්ගේ හිසේ වත්කොට ඔහු සිඹ ස්වාමින්වහන්සේගේ උරුමය කෙරෙහි අධිපතියා කොට නුඹ ආලේප කළසේක් නොවේ. ස්වාමින්වහන්සේගේ ආත්මය ආනුභාව සම්පන්නව නුඹ කෙරෙහි බලවත් ලෙස පැමිණෙන්නේය. නුඹ ඔවුන් සමග ධර්මවාක්‍ය පවසමින් අන්‍යාකාර මනුෂ්‍යයෙක් වන්නේය.**
> (1 සාමුවෙල් 10:1,6)

සේවය උදෙසා දෙවියන්වහන්සේ, යේසුස්වහන්සේව ආලේප කළ සේක.

**ස්වාමින්වහන්සේගේ ආත්මය මා කෙරෙහිය; මක්නිසාද දිළිඳුන්ට ශුභාරංචිය දේශනාකරන්ට උන්වහන්සේ මා ආලේප කළසේක; වහලුන්ට මිදීම සහ අන්ධයන්ට පෙනීම ලැබෙන බව ප්‍රකාශකරන්ටද මඩනාලද්දවුන් නිදහස්කර හරින්ටද ස්වාමින්වහන්සේගේ පිළිගත යුතු අවුරුද්ද ප්‍රකාශකරන්ටද උන්වහන්සේ මා එවූසේකැයි ලියා තිබෙන ස්ථානය සොයාගෙන, පොත අකුළා සේවකයාට දී, වැඩහුන් සේක.** (ලූක් 4:18-19)

**දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන් ද බලයෙන් ද නාසරීය යේසුස්වහන්සේ ආලේප කළ බවත්, දෙවියන්වහන්සේ උන්වහන්සේ සමග සිටි බැවින් උන්වහන්සේ යහපත්කම් කරමින් ද යක්ෂයා විසින් පීඩාකරනලද සියල්ලන් සුවකරමින්ද හැසිරුණු බවත්ය.** (ක්‍රියා 10:38)

සේවය සඳහා ආලේප කිරීමේ පරමාර්ථයන් ලයිස්තුවක් මෙම පදවලින් ලැබේ. ආලේප කිරීම නිසා ඔබට පහත දැක්වෙන දේ කළ හැකිය.

- ශුභාරංචිය දේශනා කිරීම
- දුප්පතුන්ට සේවය කිරීම
- බිඳුනු සිත් ඇත්තන් සුව කිරීම
- ශාරීරිකව රෝගී වී සිටින අය සුවකිරීම (යාකොබ් 5:14-15 හා මාක් 6:13 බලන්න)
- ආත්මික වහල්බවේ සිටිනවුන්ට ඉන් මිදීමට දේශනා කිරීම
- ආත්මික අන්ධයින්ගේ දෙනෙත් පෑදීම
- සතුරාගේ සිරීම් හා තුවාල වීම ලද අය නිදහස් කිරීම
- ස්වාමින්වහන්සේගේ පිළිගත හැකි වර්ෂය දේශනාකිරීම (2 කොරි. 6:2 බලන්න)
- යහපත් දේ කිරීම
- යක්ෂයා විසින් පීඩාවට පත් කරන ලද සියල්ලන් සුව කිරීම

## වගකීම

දෙවියන්වහන්සේ ඇදහිලිවතුන්ව ආලේප කරන්නේ ආත්මික වගකීම් අතිවය. උන්වහන්සේ යම් වැඩක් ඔබට භාර දෙන්නේ, එය කුඩා වුවද විශාල වුවද, ඔබගේ හැකියාවන් නිසා නොවේ. ඔබගේ අධ්‍යාපනය, පෞරුෂත්වය හෝ සමාජ තත්වය නිසාද නොවේ. ඔබට ආත්මික වගකීම් ලැබෙන්නේ ආලේප කිරීම මගිනි.

**ස්වාමින්වහන්සේ ආරොන්ට කතාකොට: බලව මාගේ එසවීමේ පූජාවල භාරය, එනම් ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ කැපකරන ලද සියලුම දේවල් නුඹට සහ නුඹේ පුත්‍රයන්ට ද ආලේප කිරීම හේතු කොටගෙන සදාකාලයටම නියම කොටසක් කොට මා විසින් දී තිබේ.**
(ගණන් කථාව 18:8)

## උපදෙස්

ආලේප කිරීම ඔබට උගන්වයි.

**නුඹලා ගැන වනාහි නුඹලා උන්වහන්සේගෙන් ලැබූ ආලේපය නුඹලා තුළ පවතින්නේය. යමෙකු විසින් නුඹලාට ඉගැන්වීම ඕනැකරන්නේ නැත; එම ආලේපය සියල්ල ගැන නුඹලාට උගන්වන ලෙසද, එය බොරු නොව සත්‍යව තිබෙන ලෙසද, එයින් නුඹලාට ඉගැන්වූ ප්‍රකාරයටද උන්වහන්සේ තුළ පැවතියල්ලා,** (1 යොහන් 2:27)

ශුභාරංචිය පිළිබඳ ඉගැන්වීම් වෙනත් අයගෙන් ලබාගත යුතු නැතැයි මින් අදහස් නොකෙරේ. දෙවියන්වහන්සේ සභාවන් තුළ ගුරුවරුන් තබා ඇත්තේ ඒ සඳහාය (එපීස 4:11). දේව වචනය ඉගැන්වීමට ශුද්ධාත්මයාණන්වහන්සේ ඔවුන්ව ආලේප කරන සේක. එහෙත් දෙවියන්වහන්සේ විසින් තෝරාගනු ලැබූ එවන් අයගේ සේවය ලබාගැනීමට ඔබට අවස්ථාවක් නොමැති වුවද ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආලේප කිරීම ඔබට උගන්වනු ඇත.

මෙම ආලේප කිරීම නිසා, ඔබ වෙනත් අයගෙන් ඉගෙනගන්නා දෙයෙහි සත්‍යය තක්සේරු කිරීමට ඔබට හැකිවනු ඇත. එමෙන්ම එමගින් ඔබට නොතේරෙන සත්‍යතා එළිදරව් වන අතර දෙවියන්වහන්සේගේ ලිඛිත වචනයේ එළිදරව්වීම් ඔබට පැහැදිලිව විවෘත වනු ඇත. ආලේප කිරීම අපට "සියලු දේ" උගන්වන බව මතක තබාගන්න. ආලේප කිරීමේ බලය කෙතරම් ප්‍රබල ද යත් එය ඔබගේ ජීවිතයේ හා සේවයේ සෑම ක්ෂේත්‍රයකටම අවශ්‍ය උපදෙස් සපයනු ඇත.

## තුළ පැවතිම

දෙවියන්වහන්සේගේ ආලේප කිරීම නිසා ඔබට යේසුස්වහන්සේ තුළ පැවතිය හැකිය. ඔබ දැන උගත් පදයේ මෙම කොටස දෙස බලන්න.

> **යමෙකු විසින් නුඹලාට ඉගැන්වීම ඕනැකරන්නේ නැත; එම ආලේපය සියල්ල ගැන නුඹලාට උගන්වන ලෙසද, එය බොරු නොව සත්‍යව තිබෙන ලෙසද, (1 යොහන් 2:27)**

යේසුස්වහන්සේ ඔබගේ ගැළවුම්කරු ලෙස පිළිගැනීම එක් දෙයකි. උන්වහන්සේ තුළ පවතින්නේ කෙසේද යන්නත් උන්වහන්සේගේ වචනය හා කැමැත්ත අනුව කීකරුකමින් යුතුව ගමන් කිරීමටත් ඉගෙනීම තවත් දෙයකි. මෙය කරන ආකාරය ආලේප කිරීම මගින් උගන්වයි.

## නිදහස

වහල්බවේ වියගහ ආලේප කිරීම මගින් විනාශ කරනු ලබයි. පැරණි ලෝකයේ සෑම තැනකම පාහේ කෙත්වතුවල වැඩ කිරීම සඳහා සතුන් එකට බැඳ තැබීමට වියගස් භාවිත කෙරිණ. අද වුවද බොහෝ රටවල වියගස් භාවිත කරනු ලැබේ. යේසුස්වහන්සේ වියගහ ගැන මෙසේ පැවසූ සේක.

> **වෙහෙසවෙන්නාවූ බර උසුලන්නාවූ සියල්ලෙනි, මා වෙතට වරෙල්ලා මම නුඹලාට සහනය දෙමි.**
> **මම සිතින් මෘදුව යටහත්ව සිටින බැවින් මාගේ වියගහ නුඹලා පිටට ගෙන. මාගේන් ඉගෙන ගනිල්ලා, එවිට නුඹලාගේ ආත්මවලට සහනය ලැබෙන්නේය.**
> **මක්නිසාද මාගේ වියගහ පහසුය, මාගේ බරද සැහැල්ලුයයි කීසේක. (මතෙව් 11:28-30)**

අප සියලු දෙනම යම්කිසි ආකාරයක වියගහක බර උසුලන්නෙමු. ඔබ දෙවියන්වහන්සේගේ හෝ සාතන්ගේ හෝ වියගහ උසුලයි. සාතන්ගේ වහල්බවේ වියගහ තෙආකාරය:

### 1. පාපයේ වියගහ

> **මම වනාහි නුඹලා මිසරවරුන්ගේ වහලුන්ව නොසිටින පිනිස, මිසර දේශයෙන් නුඹලා පිටතට ගෙනාවාවූ, නුඹලාගේ දෙවිවූ ස්වාමින්වහන්සේය, මම නුඹලාගේ විය ගහෙන් බැඳුම් බිඳ නුඹලාට කෙළින් යන්ට සැලැස්වීමි. (ලෙවී කථාව 26:13)**

"මිසරයේ වියගහ" යන්නෙහි තේරුම පාපයේ වියගහ වේ. ඔබ යේසුස්වහන්සේගේ වියගහ යටට පැමිණීමට නම් ඒ වියගහ කඩා-බිඳ දැමිය යුතුය.

### 2. මමත්වයේ වියගහ

පාවුලුතුමා මමත්වයේ වියගහ සමග පොරබැඳුවේය.

> **මක්නිසාද මා කරන දේ මම නොදනිමි. මා කරන්නේ මා කැමති දේ නොව මා ද්වේෂකරන දේය. (රෝම 7:15)**

## 3. මිනිසාගේ වියගහ

මිනිසාගේ වියගහ යනු වෙනත් අය ඔබ මත දමන ලද වහල්බව වේ.

> **එසේය, ඔවුහු උසුලන්ට අමාරු මහත් බර බැඳ මනුෂ්‍යයන්ගේ කරේ තබති නුමුත් තමුන්ගේ ඇඟිල්ලවත් ඒවාට තබන්ට කැමති නොවෙති. (මතෙව් 23:4)**

මිනිසාගේ වියගහ ත=ළ වරදක් කළ බවට සැකය, සම්ප්‍රදාය, නිකාය භේදය, වෙනත් අය ඔබගෙන් බලාපොරොත්තු වන, එහෙත් තැබිය නොහැකි චර්යාවේ ප්‍රමිතීන් වැනි වහල්භාවයන් ද ඇතුලත් විය හැකිය; ඔබගේ ජීවිතයේ ද, ඔබගේ සේවය ලබන අයගේ ජීවිතයේ ද ඇති මේ බලකොටු බිඳ දමන්නේ කෙසේද? ඒවා ආලේප කිරීම මගින් බිඳ දමනු ලැබේ.

> **තවද ඒ දවසේදී ඔහුගේ බර නුඹේ කරෙන්ද ඔහුගේ වියගහ නුඹේ බෙල්ලෙන්ද පහවන්නේය. නුඹේ තරකම නිසා වියගහද කැඩෙන්නේය. (යෙසායා 10:27)**

ඔබගේම බලයෙන් සාතන්ගේ වියගහ බිඳ දැමිය නොහැකිය. ඔබගේ ප්‍රඥාවේ වචනවලින් එය කළ නොහැකිය. සෑම වියගහක්ම, මිනිසාගේ සෑම බන්ධනයක්ම, ආලේපකිරීම මගින් බිඳ දමනු ලැබේ.

## ප්‍රීතිය

යේසුස්වහන්සේ ප්‍රීතියේ තෙලින් ආලේප වී සිටිසේක.

> **නුමුත් පුත්‍රයා ගැන කථාකොට.. ඔබ ධර්මිෂ්ඨකමට ප්‍රියව අධර්මිෂ්ඨකමට ද්වේෂකළ සේක; එබැවින් දෙවියන්වහන්සේ, ඔබගේ දෙවියන්වහන්සේ, ඔබගේ සහකාරයන්ට වඩා ප්‍රීතිය නමැති තෙලයෙන් ඔබ ආලේපකළසේකැයි (හෙබ්‍රෙව් 1:8-9).**

ධර්මිෂ්ඨකමට ප්‍රේමකර නපුරට වෛරකරන්නාට ද එම ප්‍රීතියේ ආලේපයෙන් ආලේප කරනු ඇත. දෙවියන්වහන්සේගේ ආලේප කිරීම ඔබගේ ජීවිතයට මහත් ප්‍රීතියක් ගෙන දෙයි. දෙවියන්වහන්සේගේ සේවය සඳහා ඔබ බලවත් කරන්නේ ස්වාමින්වහන්සේ තුළ ඇති ප්‍රීතිය ය.

## සුවිශේෂී ආලේපකිරීම්

ඔබ ඉහත උගත් ආලේප කිරීමේ පරමාර්ථ සියලු ඇදහිලිවතුන්ට වේ. එහෙත් සුවිශේෂී සේවයන් හා කාර්යයන් සඳහා ද දෙවියන්වහන්සේ ඇතැම් අය ආලේප කරන සේක. සමහරුන් එවැන්ජලිස්තවරු ලෙස ද සමහරු ගුරුවරු ලෙස ද ආලේප කරනු ලබති. ඇතැමුන් පූජකවරුන් වන අතර තවත් සමහරෙක් දිවැසිවරු වෙති. දෙවියන්වහන්සේ ඇදහිලිවතුන්ට දෙන්නාවූ විවිධාකාර ආලේපකිරීම් ඇත.

මිනිසුන්ගේ පාපයන් සඳහා මියයෑමේ සුවිශේෂී අලේප කිරීමක් දෙවියන්වහන්සේගෙන් යේසුස්වහන්සේට තිබිණි. "ක්‍රිස්තුස්" යන්නෙහි තේරුම "ආලේප ලද තැනැත්තා" වන අතර යේසුස් යන නමෙහි තේරුම "ගැළවුම්කරු" වේ. "යේසුස් ක්‍රිස්තුස්" යන නම භාවිත කරන විට, එහි තේරුම වන්නේ ලෝකයාගේ ගැළවීම උදෙසා දෙවියන්වහන්සේගෙන් ආලේප ලද තැනැන්වහන්සේ වන්නේ උන්වහන්සේ බවය. උන්වහන්සේගේ මරණයට පෙර ඉතා වටිනා තෙලයකින්, ස්ත්‍රියක් යේසුස්වහන්සේව ආලේප කළාය. එවිට යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක.

> **ඈ මේ තෙල මාගේ ශරීරයේ වත්කළේ මා තැන්පත්කිරීමට සූදානම් කරන පිණිසය. (මතෙව් 26:12)**

මිනිසුන්ගේ පාප උදෙසා මියයාමට දෙවියන්වහන්සේ තමන්වහන්සේව ආලේප කර ඇති බව යේසුස්වහන්සේ දැනගෙන සිටි සේක. මේ සුවිශේෂ ආලේපය කිසිදා කිසිවෙකු ලබා තිබුණේ නැත.

සුවිශේෂී සේවයන් උදෙසා දෙවියන්වහන්සේ මිනිසුන්ව ආලේප කර ඇති බවට බයිබලිය වාර්තා ඇත (2 ලේකම් 22:7 බලන්න). මිනිසුන් දෙවියන්වහන්සේගේ ආලේපය නොලබා සුවිශේෂී සේවාවන් කිරීමට උත්සාහ ගන්නා විට ගැටලු පැන නැඟේ. මේ පිළිබඳව නිදසුනක් සඳහා ගණන්කථාව 12 හි සඳහන් මිරියම් හා ආරොන්ගේ කතාව කියවන්න. මෝසෙස් ලද ආලේපයම තමන්ට ඇතැයි ද ඒ නිසා ඉශ්‍රායෙල් ජනතාවට මඟ පෙන්විය හැකියයි ද මිරියම් හා ආරොන් සිතූහ. ඔවුන්ට අසිරුතා ඇතිවිය. ගණන්කථාව 16 මේ පිළිබඳ තවත් නිදසුනක් ඇත. මෝසෙස් ලද ආලේපය ලබා ගැනීමට කෝරා කළ උත්සාහය පිළිබඳ කතාව එහි සඳහන් වේ.

ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය තුළ එකඟත්වයක් නොමැතිකම බොහෝ විට පැමිණෙන්නේ ආලේපයක් නොලද ක්ෂේත්‍රවල සේවය කිරීමට උත්සාහ කරන අයගෙනි. දෙවියන්වහන්සේ සුවිශේෂී ආකාරයකින් එක් අයෙකුව ආලේප කළ විට සෑම කෙනෙක්ම පාහේ ඔහුගේ සේවය අනුකරණය කිරීමට උත්සාහ කරති. එහෙත් ඒ අයට එම ප්‍රබල ප්‍රතිඵලම ලැබෙන්නේ නැත. එවිට ඔවුහු ඒ ගැන පුදුම වෙති. ඔවුන් වෙනත් කෙනෙකු කරන ආකාරයෙන්ම කටයුතු කළද ප්‍රතිඵල ඒ හා සමාන නැත. මීට පිළිතුර ඇත්තේ ආලේපය ලද බලය මතය. ඒ සුවිශේෂී කාර්යය සඳහා දෙවියන්වහන්සේ ආලේප කළේ එක් අයෙක් මිස අනෙක් අය නොවේ. එබැවින් ඔහු සාර්ථක වන අතර අනෙක් අය අසාර්ථක වන්නෝය.

ගලාති 5:20 හි සඳහන් මාංශයන්ගේ පාපයන්ගෙන් එකක් වන්නේ "සමවෙන්න" ගන්න උත්සාහයයි. එය අන් අයව අනුකරණය කිරීම මගින් ප්‍රදර්ශනය කෙරෙන එක්තරා ආකාරයක ඊර්ෂ්‍යාවකි. එම ඊර්ෂ්‍යාවට ආශිර්වාද කිරීමට දෙවියන්වහන්සේට නොහැකිය. දෙවියන්වහන්සේ සොයන්නේ ඊර්ෂ්‍යාව නමැති පාපයෙන් ඉවත්වී බලය ආලේප කිරීම මගින් එළිදරව්වීම වෙත යන අය වේ.

## ආලේප කිරීම ලබාගන්නේ කෙසේද?

ඔබ මේ ආලේප කිරීමේ බලය ලබාගන්නේ කෙසේද?

### ප්‍රභවය හඳුනාගන්න

ඔබ මෙම පාඩමෙන් උගත් ආකාරයට ආත්මික බලයෙන් ආලේප කිරීමේ ප්‍රභවය වන්නේ දෙවියන්වහන්සේය. ඔබට ඔබගේ අධ්‍යාපනය, පෞරුෂත්වය හෝ සමාජ තත්වය මත විශ්වාසය තැබිය නොහැකිය. ඔබට ඔබගේ ආලේප කිරීම වෙනත් කෙනෙකුගෙන් ලැබෙන්නේ නැත.

ආලේප කිරීම ඔබට කිසිදු ආකාරයකින් උපයා ගන්නට නොහැකිය. හැඟීම් මගින් එය ලබාගත නොහැකිය. ආත්මික ආලේපය ලැබීමේ එකම ප්‍රභවය දෙවියන්වහන්සේ වේ. එවැනි ආලේප කිරීමක් ලබා ගැනීමට, ඔබ පළමුවෙන්ම එය ගලා එන උල්පත හඳුනාගත යුතු වේ.

### නැවත ඉපදීමේ අත්දැකීම

මෙය දෙවියන්වහන්සේගේ උල්පත තුළින් ගලන්නාවූ ආත්මික බලය බැවින්, එය ලබා ගැනීම සඳහා ඔබ ආත්මිකව නැවත ඉපදිය යුතුය. මීට හේතුව වන්නේ:

> **ජම්මික මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේගේ කාරණා පිළි නොගනියි. ඒවා ඔහුට මෝඩකමය; ඒවා ආත්මික ලෙස විමසිය යුතු බැවින් ඒවා දැනගන්ට ඔහුට බැරිය.**
> **(1 කොරින්ති 2:14)**

මෙම බලයේ ආලේපය ගලා එන්නේ දෙවියන්වහන්සේගේ ආත්මයෙනි. මාංශික (පව්කාර) මිනිසාට එය ලබාගත නොහැකිය. ඔබ ආත්මික මනුෂ්‍යයෙකු නොවන්නේ නම් ඔබට එය ලබාගත නොහැකිය.

## දේව වචනය කියවා යාච්ඤා කරන්න

ආලේපයේ උල්පත දෙවියන්වහන්සේ බැවින්, ඔබ උන්වහන්සේ සමග යාච්ඤාවෙන් (එහිදී ඔබ උන්වහන්සේ සමග කතා කරයි) හා දේව වචනයෙන් (එය තුළින් උන්වහන්සේ ඔබට කතාකරන සේක) සබඳතා පැවැත්විය යුතුය. ඔබ උන්වහන්සේගේ වචනය තුළ පවතින්නේ නම් හා ඔබ තුළ පවතින්නේ නම්, ඔබගේ ජීවිතය තුළට වඩාත් ආලේපය ගලා එනු ඇත.

## වියගහ බිඳ දමන්න

අලේපය ලැබීමේ එක් පරමාර්ථයක් වහල්බවේ වියගස් බිඳ දැමීම බව ඔබ මෙම පරිච්ඡේදයෙන් උගත්තෙහිය. පාපයේ හෝ මමත්වයේ හෝ මිනිසා පවරන ලද හෝ සෑම වියගහක්ම බිඳ දමන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න. ඔබගේම ජීවිතයේ වියගහ බිඳ දැමීමේ අත්දැකීම, එය ඔබ තුළින් අන් අයට ගලා යෑමට පෙර, ඔබ ලබාගත යුතු වේ.

## ශුද්ධාත්මයාණන්වහන්සේ ලබා ගන්න

> **දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන්ද බලයෙන්ද නාසරීය යේසුස්වහන්සේ ආලේප කළ බවත්, දෙවියන්වහන්සේ උන්වහන්සේ සමග සිටි බැවින් උන්වහන්සේ යහපත්කම් කරමින්ද යක්ෂයා විසින් පීඩාකරන ලද සියල්ලන් සුවකරමින්ද හැසිරුණු බවත්ය.** (ක්‍රියා 10:38)

ඔබගේ ජීවිතයේ ඇති ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලගතු ක්‍රියාවන් දෙවියන්වහන්සේගේ ආලේප කිරීම හා සම්බන්ධ වන්නේ කෙසේදැයි මෙම පදයෙන් පෙන්නුම් කෙරේ. ආලේප කිරීමේ බලය අත්දැකීමට ඔබ ශුද්ධාත්මයාණන්වහන්සේ ලබාගත යුතුය. ඔබ දැනටමත් අටවන පරිච්ඡේදයෙන් "ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය" ගැන ඉගෙන ගෙන ඇත.

## ඔබට කළ නොහැකි දේ පිළිබඳ අවධානය නොයොදන්න

බොහෝ අය බලයේ ආලේපයන් තමාට කල හැකි දේවල් ගැන නොසිතා තමන්ට කල නොහැකි දේ ගැන සිතමින් සිටිති. දාවිත් රජතුමා මෙසේ පවසා ඇත.

> **මම රජමෙන් ආලේප ලත්තෙමි නුමුත් අද දුර්වලව සිටිමි ...** (2 සාමුවෙල් 3:39)

තමා රජතුමා වුවද, තමා දුර්වල බව දාවිත් තේරුම් ගත්තේය. ඔහු අත්දුටු බලය ආලේපයෙන් ලැබුවකි. එය ඔහුගේ දුර්වලතා, ශක්තිය බවට පත් කළේය. ඔහු ඔහුට කල නොහැකි දේ ගැන නොසිතා, බලයේ ආලේපයෙන් ලද හැකියාවන් ගැන සිතුවේය. ඔහුට මෙසේ පවසිය හැකිවූයේ එබැවිනි.

> **මක්නිසාද ඔබ කරණකොටගෙන හමුදාවකට විරුද්ධව දුවමි. මාගේ දෙවියන්වහන්සේ කරණකොටගෙන පවුරකින් පනිමි.** (ගීතාවලිය 18:29)

ගෝලයෝ ආරම්භයේදී බියසුළු හා නොඇදහිලිවන්ත අය වූහ. යේසුස්වහන්සේට ඔවුන් අවශ්‍ය වූ අවස්ථාවේ, ඔවුහු සියල්ලෝම උන්වහන්සේ අත්හැර ගියෝය. එක් කෙනෙක් උන්වහන්සේව නොහඳුනන බව පැවසීය. ශුභාරංචිය ලෝකයේ අස්සක් මුල්ලක් නැර ගෙනයෑමේ වගකීම යේසුස්වහන්සේ පැවරුවේ මේ අයටමය. යේසුස්වහන්සේ ඔවුන්ගේ නොහැකියාවන් ගැන අවධාරණය යොමු කළේ නැත. ඔවුන්ගේ අධ්‍යාපනයේ අඩුපාඩුකම් හෝ සමාජ තත්වයන් හෝ ගැන සිතුවේ නැත. ඔවුන්ගේ අතීත අසාර්ථකවීම් දෙස බැලුවේ නැත. උන්වහන්සේ දුටුවේ බලයේ ආලේපයෙන් ඔවුන්ගේ ජීවිත වෙනස්වීමට ඔවුන් ඉඩදුන් විට ඔවුන් කවුරුන් බවට පත්වන්නේද යන්න ගැන වේ. උන්වහන්සේ දුටුවේ ශුද්ධාත්මයාණන්වහන්සේ ලබාගත් පසු ඔවුන් පත්වන තත්වය ගැන වේ.

තමන්ගැනම අවධානය යොමු කිරීම නවත්වන්න. ඔබ තුළ දෙවියන්වහන්සේගේ ආත්මය ඇති බව පිළිගන්න. එය උන්වහන්සේගේ වැඩකි. උන්වහන්සේගේ සේවයය, උන්වහන්සේගේ භාස්කම්ය, උන්වහන්සේගේ ආලේපයය. ඔබ තුළින් ආලේපය ගලා යෑමට ඉඩ දෙන ලෙස උන්වහන්සේගෙන් අයදින්න. සේවය තුළින් අන් අය වෙතට ළඟාවන්න. එවිට ඔබ තුළින් බලයේ ආලේපය ගලා යන බව ඔබට දැනෙනු ඇත.

දේවස්ථානය පසුපස ආසනයක අක්‍රියව වාඩි වී සිටීම සඳහා දෙවියන්වහන්සේ ඔබව ආලේප කරන්නේ නැත. බලයේ ආලේපය දෙනු ලබන්නේ ඔබ හයවන පරිච්ඡේදයෙන් උගත් සුවිශේෂි පරමාර්ථ සඳහා වේ. ඔබ මේ පරමාර්ථ කෙරෙහි ඔබගේ ශක්තීන් යොමු කරන විට ඔබ තුළින් වඩාත් බලයේ ආලේපය ගලායනු ඇත.

## ඔබගේ සුවිශේෂි ආලේප කිරීම සොයා ගන්න

සේවය සඳහා වන ඔබගේ සුවිශේෂි ආලේප කිරීම නිර්ණය කිරීම සඳහා, ඔබට දෙවියන්වහන්සේ දී ඇති ආත්මික දීමනාවන් සොයා ගත යුතු වේ. මේ සඳහා හාවස්ටයිම් ජාත්‍යාන්තර ආයතනයේ "ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය" නමැති පාඨමාලාව බලන්න.

## ආලේපලත් තැනැත්තාගේ ස්ථානය

දෙවියන්වහන්සේ තුළින් ආලේපය ලැබීම නිසා ඔබ ආත්මික සටනේ ඉදිරියේම සිටින්නෙහිය. දෙවියන්වහන්සේ විසින් බලයෙන් ආලේප කළ අය සතුරාගේ විරෝධතාවනට ලක්වන බව බයිබලය එළිදරව් කරයි.

> **ස්වාමින්ටද උන්වහන්සේගේ අභිෂේකලත් තැනැත්තාණන්ටද විරුද්ධව පොළොවේ රජවරු සැරසෙති. අධිපතියෝද එක්ව මන්ත්‍රණය කෙරෙති.**
> **අප ඔවුන්ගේ බැමි කඩා දමා, ඔවුන්ගේ ලණු අප කෙරෙන් ඉවත ළමු යයි කියති (ගීතාවලිය 2:2-3).**

දාවිත් මෙසේ පැවසීය:

> **ස්වාමිනි, ඔබගේ සතුරෝ නින්දා කළෝය. ඔබගේ අභිෂේකලත් තැනැත්තාගේ පා සලකුණුවලට නින්දා කළෝය. (ගීතාවලිය 89:51)**

එහෙත් දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ ආලේප ලත් තැනැත්තාට විරුද්ධවන අය පිළිබඳව මෙසේ පැවසූ සේක.

> **ස්වර්ගයෙහි හිඳින තැනැන්වහන්සේ සිනාසෙනසේක. ස්වාමින්වහන්සේ ඔවුන්ට පරිහාස කරන සේක.**
> **එකල්හි උන්වහන්සේ කෝපයෙන් ඔවුන්ට කතාකොට තමන් උදහසින් ඔවුන් කළඹන සේක. (ගීතාවලිය 2:4-5)**

එවන් විරෝධතාවලට මුහුණ දෙන විට ඔබගේ ශක්තිය වන්නේ දෙවියන්වහන්සේය.

> **ස්වාමින්වහන්සේ ඔවුන්ගේ ශක්තියය, උන්වහන්සේ තමන්ගේ අභිෂේකලත් තැනැත්තාට ගැළවීමේ බලකොටුවක් වන සේක. (ගීතාවලිය 28:8)**

> **ස්වාමින්වහන්සේ තමන් අභිෂේකලත් තැනැත්තා ගළවන බව දැන් දනිමි. උන්වහන්සේ තමන් ස්වර්ගයේ සිට, තමන් දකුණතේ ගැළවීමේ ශක්තියෙන් ඔහුට උත්තර දෙන සේක. (ගීතාවලිය 20:6)**

ආලේපලත් අනෙක් ඇදහිලිවතුන් පිළිබඳව ඔබ පවසන දේ ගැන ප්‍රවේසම්වන්න. ඔබට ඉහලින් සිටින ආලේපලත් අයට ගරු කරන්න. බලයෙන් ආලේපකිරීම දෙවියන්වහන්සේ ඉතා වැදගත් සේ සලකන සේක.

> **මාගේ අභිෂේක ලද්දවුන්ට අත නොගසව්, මාගේ ප්‍රොපේතවරුන්ට අනතුරු නොකරව් (1 ලේකම් 16:22).**

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. පැරණි ගිවිසුමේ සඳහන් ශුද්ධ ආලේපයේ පරමාර්ථය කුමක්ද?

3. පැරණි ගිවිසුමේ ශුද්ධ ආලේප කිරීම භාවිත කළ ආකාරය පිළිබඳව නිදසුන් දෙන්න.

4. "ක්‍රිස්තුස්" යන නාමයෙහි තේරුම කුමක්ද?

5. බලයෙන් ආලේප කිරීමේ පරමාර්ථ පිළිබඳව ඔබ උගත් දේ සාරාංශ කරන්න.

6. සේවයේ ඔබගේ සුවිශේෂී ආලේප කිරීම කවරෙක්දැයි සොයා ගැනීම වැදගත් වන්නේ මන්ද?

7. බලයේ ආලේපය ඔබ ලබාගන්නේ කෙසේද?

8. ආත්මික ආලේපයේ ප්‍රභවය කවුරුන්ද?

(මෙම අත්පොතේ අවසාන පරිච්ජේදය අවසානයේ පරීක්ෂණ වලට පිළිතුරු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. පැරණි ගිවිසුමේ ඇති ආලේප කිරීමේ ආත්මික පරමාර්ථ ගැන තවදුරටත් අධ්‍යයනය කරන්න.

   - පූජකයින් ආලේප කිරීම: ලෙවී කතාව 8:12,30; නික්මයාම 28:41; 29:7; 30:30;

   - කූඩාරම සහ එහි ඇති අනෙකුත් දේ ආලේප කිරීම: නික්මයාම 30:22-29; 40:9-11;

   - රජවරුන් ආලේප කිරීම: මේ පිළිබඳ වාර්තා බොහෝමයක් ඇත. නිදසුනක් ලෙස 1 සාමුවෙල් 9:16; 10:1; 16:1,12,13; 2 සාමුවෙල් 2:7; 1 රාජාවලිය 1:33-34;

   - දිවැසිවරු ආලේප කිරීම: 1 රාජාවලිය 19:16; 1 ලේකම් 16:22

2" දෙවියන්වහන්සේ එක්තරා කාලෙක සාතන්වද ආලේප කළ සේක. මේ පිළිබඳව එසකියෙල් 28:14 කියවන්න.

3" ඔබ දෙවියන්වහන්සේගේ ආලේප ලත් තැනැත්තෙකු නිසා පාපයට ඳඬුවම් නොලැබේයයි නොසිතන්න. ගීතාවලිය 89:38 කියවන්න.

4" ආලේප ලත් තැනැත්තාගේ මුහුණ දෙස දෙවියන්වහන්සේ බලන සේක" ඔහු ගැන උන්වහන්සේ සලකන සේක (ගීතාවලිය 84:9). ඔහුට උන්වහන්සේ කරුණාව දක්වන සේක (ගීතාවලිය 18:50).

5. දෙවියන්වහන්සේගේ ආලේප ලත් තැනැත්තාට විරුද්ධව කි%යා නොකි×ම පිළිබඳව දාවිත් වටහාගත්තේය. 1 සාමුවෙල් 24, 26 හා 2 සාමුවෙල් 1:16, 21 බලන්න"

6. මෙම පරිච්ජේදයේ ඇදහිලිවතුන් සේවය සඳහා බලගතු කරන ආලේප කිරීමේ පරමාර්ථ ලයිස්තුගත කර ඇත. මේ පරමාර්ථවලට අදාළව ඔබගේම සේවය තක්සේරු කරන්න. ඔබගේ සේවයේ ඉන් කොපමණ දැකගත හැකිද?

   - ශුභාරංචිය දේශනා කිරීම
   - දුප්පතුන්ට සේවය කිරීම
   - ශාරීරිකව රෝගී අය සුව කිරීම
   - බලාපොරොත්තු සුන්වූ අය සුව කිරීම
   - ආත්මික වහල්බවේ සිටින අයට මිදීම දේශනා කිරීම
   - ආත්මික අන්ධ අයගේ දෙනෙත් විවෘත කිරීම
   - සතුරා මගින් තුවාළ ලැබූවන් නිදහස් කිරීම
   - පිළිගත හැකි ස්වාමින්වහන්සේගේ වසර ගැන දේශනා කිරීම (2 කොරින්ති 6:2 බලන්න. මෙය ගැළවීමේ පණිවුඩය පිළිබඳවය)
   - යහපත් දේ කරන්න
   - යක්ෂයාගෙන් පීඩා ලැබූවන් සුව කරන්න

# එකොළොස්වන පරිච්ජේදය

## බලය පිළිබඳ පස්වන මූලධර්මය: බලය, ඇදහිල්ල හා ක්‍රියාවන්

### අරමුණු

මෙම පරිච්ජේදය අධ්‍යයනයෙන් පසු ඔබට:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ඇදහිල්ල අර්ථවිග්‍රහ කිරීමට
- ඇදහිල්ලේ මට්ටම් හඳුනාගැනීමට
- ඇදහිලි වර්ග හඳුනාගැනීමට
- ඇදහිල්ල වර්ධනය කරගත හැකි ආකාරය පැහැදිලි කිරීමට
- බලය, ඇදහිල්ල හා ක්‍රියාවන් අතර සම්බන්ධතාව සාරාංශගත කිරීමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

> **ස්තේපන් අනුග්‍රහයෙන් ද බලයෙන් ද පූර්ණව, පුදුම ද හාස්කම් ද සෙනඟ අතරේ සිදු කෙළේය. (ක්‍රියා 6:8)**

### හැඳින්වීම

ළමයෙකු තුළ වූ යක්ෂයෙකු පලවා හැරීමට ගෝලයන් උත්සාහ කළ ද ඔවුහු අසමත් වූහ. මතෙව් 17 හි එය සඳහන් වේ.

"ඔහු දුරු කරන්ට අපට බැරිවුණේ මක්නිසාද,යි (ගෝලයෝ) ඇසුවෝය" යේසුස්වහන්සේ මෙසේ උත්තර දුන් සේක.

> **නුඹලාගේ ඇදහිල්ලේ මදිකම නිසාය. සැබවක් නුඹලාට කියමි. අබ ඇටයක් පමණ ඇදහිල්ල නුඹලාට ඇත්නම්, මේ කන්දට කථාකොට: මෙතැනින් අහක්ව එතැනට යවයි කීවත් ඒක යන්නේය. කිසිවක් නුඹලාට බැරි නොවන්නේය (මතෙව් 17:20)**

මේ සිද්ධියේ දී යේසුස්වහන්සේ ආත්මික බලය පිළිබඳ වැදගත් මූලධර්මයක් බෙදාගත් සේක. දෙවියන්වහන්සේගේ වැඩ කිරීම සඳහා බලය ඇදහිල්ල තුළ ක්‍රියාත්මක විය යුතුය. ඇදහිල්ල යනු දෙවියන්වහන්සේගේ බලයට මිනිසා දක්වන ප්‍රතිචාරය වේ.

> **...විශ්වාස කරන්නාට සියල්ල පුළුවන. (මාක් 9:23)**

මෙම පරිච්ජේදයේ සාකච්ඡා කෙරෙන්නේ බලය, ඇදහිල්ල හා ක්‍රියාවන් අතර සම්බන්ධතාව ගැන වේ.

### අර්ථ විග්‍රහය

ඇදහිල්ල යනු විශ්වාස කි×ම හා යම් කිසි දෙයක් පිළිබඳව ඇති සහතිකය වේ. විශ්වාස කි×ම යනුවෙන් අදහස් කෙරෙන්නේ කිසි දෙයක් පිළිබඳව ඇති සහතිකය වේ. "ඇදහිල්ල, විශ්වාසය" යන වචනවල තේරුම ශුභාරංචියට අදාළව එකම වේ.

**ඇදහිල්ල නම් බලාපොරොත්තුවන දේවල් ගැන සහතිකයය, නොදන්නා දේවල් ගැන ඔප්පුවය. (හෙබ්‍රෙව් 11:1)**

සවිස්තරාත්මක බයිබලයේ මේ අර්ථවිග්‍රහ පුළුල් කර ඇත.

**ඇදහිල්ල නම් බලාපොරොත්තුවන දේවල් ගැන සහතිකයය. ස්ථිර කිරීම, ඔප්පුවය, අප නොදකින දේවල් පිළිබඳව ඒවා සත්‍ය බව අපට ඒත්තුගන්වන අතර ඒවා ඔප්පු කෙරේ. ඇදහිල්ල, අපගේ ඉන්ද්‍රියයන්ට නොදැනෙන දේ සත්‍ය බවට පෙන්නුම් කරයි. (හෙබ්‍රෙව් 11:1)**

අනාගතයේ පොරොන්දු දේද නොදන්නා දේවල් ද සත්‍ය බවට ඇදහිල්ල සහතික වේ. ඇදහිල්ල යනු ඇතැම් ආගම්වල උගන්වන්නාක් මෙන් "ද්‍රව්‍යය අභිබවන මනස" නොවේ. "ද්‍රව්‍යය අභිබවන මනස" චින්තනයෙන් උගන්වනු ලබන්නේ ස්වභාවික ලෝකයේ (ද්‍රව්‍යමය ලෝකය) සියˬ ගැටලු මනස, තර්ක-විතර්ක හෝ අධිෂ්ඨානය මගින් ජයගත හැකි බවය. මේ ඉගැන්වීම් මනුෂ්‍ය-කේන්ද්‍රිය වේ. ඒවා විශ්වාසය තබන්නේ තමා මත මිස දෙවියන්වහන්සේ මත නොවේ. "ද්‍රව්‍යය අභිබවන මනස" චින්තනය දේව වචනය මත පදනම් නොවේ. ඇදහිල්ල දේව-කේන්ද්‍රිය වේ. මනුෂ්‍ය-කේන්ද්‍රිය නොවේ. ඇදහිල්ල තමාගේම බුද්ධිමය හැකියාවන්ගෙන් මිනිසා නිපදවන දෙයක් නොවේ.

බයිබලය පවසන ඇදහිල්ල, අත්දැකීම් මගින් විශ්වාසයක් තැබිය හැකි බවට ඔබ උගත් ස්වභාවික ලෝකයේ දේවල් ගැන ඇති ස්වභාවික විශ්වාසය නොවේ. නිදසුනක් වශයෙන් ඔබ ඉඳගෙන සිටින පුටුව කඩා නොවැටෙන බවට ඇති ඔබගේ විශ්වාසය.

## බයිබලයේ සඳහන් ඇදහිලි වර්ග

ශුභාරංචියේ විවිධ වර්ගයේ ඇදහිලි විස්තර කර ඇත.

### ගළවනු ලබන ඇදහිල්ල

**එබැවින් අපි ඇදහිල්ලෙන් ධර්මිෂ්ඨකරනු ලැබ, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේ හා සමග සමාදානය ඇතුව සිටිමු. (රෝම 5:1)**

ගළවනු ලබන ඇදහිල්ල පව් ගැන පසුතැවිලිවීම හා සම්බන්ධය. ඔබ සවන් දිය යුතුය, විශ්වාස කළ යුතුය, එමෙන්ම ශුභාරංචි පණිවුඩය පිළිගත යුතුය. ගළවනු ලබන ඇදහිල්ල සඳහා දෙවියන්වහන්සේ කෙරෙහි පෞද්ගලික ප්‍රතිචාරයක් දැක්වීම අවශ්‍යය. ඇදහිල්ල, මනුෂ්‍යයට ගැළවීම ලබාගත හැකිවීම පිණිස දෙවියන්වහන්සේ විසින් දෙනු ලබන ත්‍යාගයකි.

**මක්නිසාද ඇදහිල්ල කරණකොටගනෙ ඒ අනුග්‍රහයෙන් නුඹලා ගැළවී සිටින්නහුය. එය නුඹලාගෙන්ම නොව දෙවියන්වහන්සේගේ දීමනාවය. කිසිවෙක් පාරට්ටුකර නොගන්න. (එපීස 2:8)**

ඇදහිල්ල නොමැතිව ඔබට ගැළවීම ලබාගත නොහැකිය.

**අදහාගන්නාවූ බව්තිස්මය ලබන්නාවූ තැනැත්තේ ගළවනු ලබන්නේය; නුමුත් අදහා නොගන්නා තැනැත්තේ වරදට පත්කරනු ලබන්නේය. (මාක් 16:16)**

**නුමුත් ඇදහිල්ල නැතුව උන්වහන්සේව ප්‍රසන්නකරන්ට නුපුළුවන. මක්නිසාද දෙවියන්වහන්සේ වෙතට ළඟාවෙන්නා විසින් උන්වහන්සේ විද්‍යාමාන බවත්, උන්වහන්සේ සොයන්නන්ට විපාකදෙන කෙනෙකු බවත් විශ්වාසකරන්ට ඕනෑය. (හෙබ්‍රෙව් 11:6)**

## පාරිශුද්ධිකරණ ඇදහිල්ල

> **මම ක්‍රිස්තුස්වහන්සේ සමග කුරුසියෙහි ඇණගසනු ලැබ සිටි; එසේවී නුමුත් මම ජීවත්වෙමි; නුමුත් තවත් මා නොව ක්‍රිස්තුස්වහන්සේ මා තුළ ජීවත්වන සේක. තවද මා දැන් මාංසයෙහි ජීවත්වන ජීවිතය මට ප්‍රේමකළාවූ, මා උදෙසා තමන්ම පාවාදුන්නාවූ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත්වෙමි.** (ගලාති 2:20)

යේසුස්වහන්සේ ඔබගේ ගැළවුම්කරු ලෙස පිළිගත් පසු ඔබට ශුද්ධ ජීවිතයක් ගත කිරීමට පාරිශුද්ධිකරණ ඇදහිල්ල උපකාරී වේ. පාරිශුද්ධිකරණ ඇදහිල්ල ලබාගැනීම සඳහා ඔබ ගළවනු ලබන ඇදහිල්ල අත්දැකිය යුතුය.

## ආරක්ෂක ඇදහිල්ල

ඇදහිල්ල ඔබගේ ආත්මික සතුරා වූ සාතන්ගෙන් ආරක්ෂාවීමට භාවිත කෙරෙන එක් ආයුධයකි.

> **ඇදහිල්ල නමැති පලිහ අරගනිල්ලා, එයින් නපුරාගේ සියලු ගිනිහෙල්ල නිවන්ට නුඹලාට පුළුවන්වන්නේය. (එපීස 6:16)**

සාතන් ඔබගේ ඇදහිල්ලට පහර දීම සඳහා ඔබගේ මනසෙහි අවිශ්වාසය ඇති කරන ඊතල එවනු ලැබේ. මේ ප්‍රහාරයන්ගෙන් ආත්මික ආරක්ෂාවක් ලැබීමට දෙවියන්වහන්සේ කෙරෙහි ඇති ඇදහිල්ල උපකාරී වේ.

## ඇදහිල්ලේ ත්‍යාගය

ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් දෙනු ලබන ආත්මික ඇදහිල්ලේ  දීමනාව ක් ඇත.

> **ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන ... කෙනෙකුට ඇදහිල්ල ... දෙන ලද්දේය.**
> (1 **කොරින්ති** 12:8-10)

ඇදහිල්ලේ ආත්මික දීමනාව සහිත පුද්ගලයෙකුට දෙවියන්වහන්සේ විශ්වාස කිරීමේ විශේෂ හැකියාවක් ඇත. කළ නොහැකි දේ දෙවියන්වහන්සේ කරන බව ඔහු දනී. තමා වටා සිටින අනෙක් අය විශ්වාස නොකළ ද ඔහු මෙම ඇදහිල්ල තුළ ක්‍රියාකරයි.

## ඇදහිල්ලේ ඵල

ඇදහිල්ල ඔබටම වර්ධනය කරගත හැකි දෙයක් නොවේ. එය ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් ඔබගේ ජීවිතය තුළ වර්ධනය කරන ආත්මික ඵලයකි.

> **නුමුත් ආත්මයාණන්වහන්සේගේ ඵල නම්... විශ්වාසකම ...ය.** (ගලාති 5:22)

ඵලයක් ලෙස ගත් කළ ඇදහිල්ල ගති ලක්ෂණයකි. ඔබ දෙවියන්වහන්සේ වෙත දැක්වෙන ඇදහීල්ලේ ආකල්පයකි. එය ඔබ තුළ උන්වහන්සේගේ ජීවිතයෙන් ගෙනෙන ආත්මික වර්ධනයේ ක්‍රියාවලියෙන් වර්ධනය වේ.

සෑම කෙනෙකුටම ආත්මික ඇදහිල්ලේ දීමනාව නොමැති වුවද, ඇදහිල්ලේ ඵල සෑම ඇදහිල්වන්තයෙකුගේ ජීවිත තුළින් දැක ගත හැකි වනු ඇත. ආත්මික බලය අත් දැකීමට මෙය අත්‍යවශ්‍ය ගුණාංගයක් වේ.

## ඇදහිල්ලේ මට්ටම්

ඇදහිල්ලේ විවිධ මට්ටම් ඇති බව බයිබලය පෙන්වා දෙයි. තමාගේ ඇදහිල්ල භාවිත නොකළ අය පිළිබඳව යේසුස්වහන්සේ පැවසුවේ ඔවුන් ඇදහිලි නැති (මතෙව් 17:17) අය ලෙසය. අදහිල්ල මඳ අය ගැනත් (මතෙව් 6:30; 8:26; 14:31; ලූක් 12:28) මහත් ඇදහිල්ලක් ඇති අය ගැනත් (මතෙව් 8:10; 15:28; ලූක් 7:9) උන්වහන්සේ කතා කළේය.

බයිබලය උගන්වන්නේ සම කෙනෙකුටම ඇදහිල්ල යම් කිසි ප්‍රමාණයක් ඇති බවත් එය දෙවියන්වහන්සේ විසින් ත්‍යාගයක් ලෙස දෙන ලද බවත් වේ.

> **... දෙවියන්වහන්සේ එකිනෙකාට බෙදා දුන් ඇදහිල්ලේ ප්‍රමාණය ලෙස (රෝම 12:3)**

එහෙත් මේ ඇදහිල්ලේ ප්‍රමාණය, දෙවියන්වහන්සේගේ බලය ගලා යෑමට සලස්වන මට්ටමකට ඔබ වැඩිකර ගන්නේ කෙසේද?

## ඇදහිල්ල වැඩිකර ගන්නේ කෙසේද?

ඇදහිල්ල වැඩිකරගන්නා අන්දම බයිබලය අපට පවසයි.

> **ඇසීමෙන් ඇදහිල්ල ද ක්‍රිස්තුස්වහන්සේගේ වචනයෙන් ඇසීම ද පැමිණෙන්නේය. (රෝම 10:17)**

ඇදහිල්ල වැඩිකර ගන්නේ දේව වචනයට සවන් දීමෙනි. මේ ඇදහිල්ල ලැබෙන්නේද දේව වචනයට සවන් දීමෙනි. පාපය පිළිබඳව පසුතැවිලි වී යේසුස්වහන්සේ ගැළවුම්කරු ලෙස පිළිගැනීමට ඔබ පළමුවෙන්ම දේව වචනයට සවන් දිය යුතුය. ගැළවීමේ ඇදහිල්ල ඔබ අත්දැක නොමැති නම් ආත්මික බලය ඔබට අත්දැකිය නොහැකිය.

ඔබ ගැළවීම ලැබූ පසු, බයිබලීය ඉගැන්වීම් හා දේශනාවන් ඔබේ ඇදහිල්ල නොනවත්වාම වැඩි කරනු ඇත.

ඔබ දේව වචනයට සවන් දෙන තරමට ඔබේ ඇදහිල්ල වැඩිවනු ඇත. ඒ ඇදහිල්ල පාරිශුද්ධිකරණ ක්‍රියාවලිය මගින් යේසුස්වහන්සේගේ ස්වරූපයට නොනවත්වාම ගෙන එන්නෝය.

පාරිශුද්ධිකරණය යනු ශුද්ධ ජීවිතයක් ගත කිරීම වේ. ආත්මික බලය අත්දැකීම සඳහා ඔබ ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කළ යුතුය. දන්නා පාපයක නිතර නිරත වීමෙන් දෙවියන්වහන්සේගේ බලය ඔබේ ජීවිතයට ගලා ඒම වැළකේ.

ඇදහිල්ල වැඩිවන තරමට ශුද්ධ ජීවිතයක් ගත කිරීම හා සතුරාගේ ආත්මික පහරවලින් ආරක්ෂාවීම පහසුවනු ඇත. බල රහිත කිතුනුවෝ පරාජය වූ කිතුනුවෝ වෙති.

ස්වල්ප ඇදහිල්ලක් මහත් සේ බලවත්ය.

> **උන්වහන්සේ කියනසේක් සැබවක් නුඹලාට කියමි. අබ ඇටයක් පමණ ඇදහිල්ල නුඹලාට ඇත්නම්, මේ කන්දට කථාකොට: මෙතැනින් අහක්ව එතැනට යවයි කීවත් ඒක යන්නේය. කිසිවක් නුඹලාට බැරි නොවන්නේය (මතෙව් 17:20)**

## ඇදහිල්ල, ක්‍රියාවන් හා බලය

ඔබගේ ජීවිතයට දෙවියන්වහන්සේගේ බලය ගලා ඒම කෙරෙහි ඇදහිල්ල බලපාන ආකාරය දැකීම පහසු වේ. ඇදහිල්ල නොමැතිව ඔබට සිදුවන්නේ වචනවල බලය අත් නොදැක ඒවාට සවන්දීමේ අනතුරට මුහුණ දීමටය.

**මක්නිසාද ඔවුන්ට මෙන් අපටත් ශුභාරංචිය දේශනා කරනලද්දේය. නුමුත් ඇසූවන් සමග ඔවුන් ඇදහිල්ලෙන් එක්සත් නොවූ බැවින් ඇසූ වචනය ඔවුන්ට ප්‍රයෝජනවත් නොවීය. (හෙබ්‍රෙව් 4:2)**

එහෙත් ඇදහිල්ල, ක්‍රියාවන් හා බලය අතර වැදගත් සබඳතාවක් තිබේ. බලය අත්දැකීමට ඔබට ඇදහිල්ල තිබිය යුතුය. බලය ප්‍රදර්ශනය කිරීමට ඔබට ඇදහිල්ල තිබිය යුතුය. ශුභාරංචිය පැතිරවීම සඳහා ඇදහිල්ල හා බලය ඵලදායි වීමට ඒවා ක්‍රියාවන් තුළින් ප්‍රදර්ශනය කළ යුතුය. යාකොබ් මෙසේ ලියා ඇත.

**මාගේ සහෝදරයෙනි, තමාට ඇදහිල්ල ඇතැයි යමෙක් කියන නමුත්, ක්‍රියාවල් නැත්නම් මොන ප්‍රයෝජනයක්ද? ඒ ඇදහිල්ල නිසා ඔහුට ගැළවෙන්ට පුළුවන්ද?**
**එසේම ඇදහිල්ල ක්‍රියා නැතුව තනියම තිබේ නම් මැරිලාය.**
**එසේය, යමෙක් කටාකොට: නුඹට ඇදහිල්ල තිබේ. මට ක්‍රියාවල් තිබේ. ක්‍රියා නැතුව නුඹේ ඇදහිල්ල මට පෙන්වාපන්න, මම මාගේ ක්‍රියාවලින් මාගේ ඇදහිල්ල පෙන්වමි.**
**ආත්මය නැති ශරීරය මැරී තිබෙන්නාක් මෙන්ම ක්‍රියාවලින් වෙන්වූ ඇදහිල්ල ද මැරී තිබේ. (යාකොබ් 2:14, 17-18, 26)**

ඇදහිල්ල හා ක්‍රියාවන් අතර සබඳතාව ආත්මය හා ශරීරය අතර සබඳතාව තරමටම සමීපය.

ස්තේපන්ට ප්‍රබල ක්‍රියා කිරීමේ හැකියාව ලැබුණේ ඔහු ඇදහිල්ලෙන් හා බලයෙන් පූර්ණව සිටි බැවිනි.

**ස්තේපන් අනුග්‍රහයෙන් ද බලයෙන් ද පූර්ණව, පුදුම ද හාස්කම් ද සෙනඟ අතරේ සිදු කළේය. (ක්‍රියා 6:8)**

ඇදහිල්ලේ ක්‍රියාවන් කරනු ලබන්නේ බලය මගිනි.

**නුඹලාගේ කැඳවීමට සුදුස්සෝයයි අපගේ දෙවියන්වහන්සේ විසින් ඒත්තුගෙන, යහපත්කමේ සියලු ආශාද ඇදහිල්ලේ සියලු ක්‍රියා ද ස්වකීය බලයෙන් සම්පූර්ණකරන මෙන් අපි නිතරම නුඹලා ගැන යාච්ඤාකරමුව. (2 තෙසලෝනික 1:12)**

ඇදහිල්ලේ ක්‍රියා බලය සහිතව ඔබ තුළ හා ඔබ මගින් කිරීමට දෙවියන්වහන්සේට අවශ්‍යය. ඔබ ඇදහිල්ල භාවිත කරන විට එය දෙවියන්වහන්සේගේ බලය ඔබේ ක්‍රියාවන් හා සම්බන්ධ කරයි. "අදහන්නාට සියල්ල කළ හැකිය" යි යේසුස්වහන්සේ පැවසූ සේක.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. බයිබලයට අදාළව ඇදහිල්ල අර්ථවිග්‍රහ කරන්න

3. යේසුස්වහන්සේ කතාකළ ඇදහිල්ලේ මට්ටම් හඳුන්වන්න.

4. මෙම පාඩමේ සාකච්ජා කළ බයිබලීය ඇදහිලි වර්ග ලයිස්තුගත කරන්න.

5. ඇදහිල්ල වැඩිකර ගන්නේ කෙසේද?

6. ඔබ මෙම පාඩමෙන් උගත් බලය, ඇදහිල්ල හා ක්‍රියාවන් අතර සම්බන්ධතාව සාරාංශගත කරන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ජේදය අවසානයේ පරීක්ෂණ වලට පිළිතුරු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. බයිබලයේ "ඇදහිල්ලේ පරිච්ඡේදය" ලෙස හැඳින්වෙන හෙබ්‍රෙව් 11 පරිච්ඡේදය කියවීම මගින් ඇදහිල්ලේ බලය පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කරන්න. මෙම නිදසුන් මගින් ඇදහිල්ලේ බලය පිළිබඳව ඔබ උගත් දේ සාරාංශගත කරන්න.

2. ආබ්‍රහම්, ඇදහිල්ල පිළිබඳ බයිබලයේ සඳහන් ශ්‍රේෂ්ඨ නිදසුනකි.

   - ඇදහිල්ල නිසා ආබ්‍රහම් ධර්මිෂ්ඨ ලෙස සැලකිය. යාකොබ් 2:23
   - ඔහුගේ ඇදහිල්ල නිසා දෙවියන්වහන්සේගේ පොරොන්දු පිළිබඳ පූර්ණ සහතිකයක් ලැබුණේය. (රෝම 4:18-21)
   - ආබ්‍රහම්ගේ සිත විශ්වාසී බව දෙවියන්වහන්සේ දුටු සේක. නෙහෙමියා 9:8
   - ඔහුව අනුගමනය කරන ඇදහිලිවන්තයෝ ද ඇදහිල්ලේ සෙනඟ වෙති. රෝම 4:11-12

මෙම පදවලින් ආබ්‍රහම් පිළිබඳව ඔබ උගත් දේ සාරාංශගත කරන්න.

# දොළොස්වන පරිච්ඡේදය

## බලය පිළිබඳ හයවන මූලධර්මය: යේසුස්වහන්සේගේ නාමයේ බලය

### අරමුණු:

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට:

- ප්‍රධාන පද මතකයෙන් ලිවීමට
- බයිබල් යුගයේ තිබූ නම්වල වැදගත්කම පැහැදිලි කිරීමට
- සියලු නම්වලට වඩා ශ්‍රේෂ්ඨතම නාමය හඳුනාගැනීමට
- "යේසුස්" යන නමේ අදහස හඳුනාගැනීමට
- යේසුස්වහන්සේට උන්වහන්සේගේ නම ලැබුණු ආකාරය පැහැදිලි කිරීමට
- යේසුස් යන නම භාවිත කිරීම සඳහා වූ බයිබලිය මඟපෙන්වීම් හඳුනාගැනීමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේව ඉතා උසස්කොට, සියලු නාමවලට වඩා උසස් නාමය උන්වහන්සේට දුන්සේක.**
**එසේ කළේ, ස්වර්ගයෙහිද පොළොවෙහිද පොළොව යටද සියල්ලන් යේසුස් යන නාමයෙන් දණ නමන පිණිසත්,**
**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වාමින්වහන්සේ බව පියවූ දෙවියන්වහන්සේගේ ගෞරවය සඳහා සියලු දිව්වලින් ඒත්තුගන්න පිණිසත්ය.** (පිලිප්පි 2:9-11)

### හැඳින්වීම

දෙවියන්වහන්සේ විසින් යේසුස්වහන්සේට දෙන ලද බලය හා ආධිපත්‍යය පිළිබඳව ද මෙම බලයම යේසුස්වහන්සේ ඇදහිලිවතුන්ට පැවරූ ආකාරය ද ඔබ උගත්තෙහිය. මේවා අතුරින් එක් ප්‍රබල ආත්මික මූලධර්මයක් වන්නේ උන්වහන්සේගේම නම භාවිත කිරීමය. මෙම පරිච්ඡේදයෙන් අවධාරණය කෙරෙන්නේ යේසුස් යන නාමයේ බලය පිළිබඳව වේ.

### නම්වල ඇති වැදගත්කම

අද නොමැති වැදගත්කමක් බයිබල් යුගයේ නම්වලට තිබිණි. අද බොහෝ සංස්කෘතීන් තුළ, නමක් බොහෝවිට භාවිත කෙරෙන්නේ පෞද්ගලික ලේබලයක් වශයෙනි. බයිබල් යුගයේ පුද්ගලයෙකුගේ නමකට මහත් වැදගත්කමක් ඇඳී තිබිණි. දෙනලද නාමය බොහෝ විට තීරණය වූයේ උපන් වේලාවේ වාතාවරණය අනුවය (උත්පත්ති 19:22). ඇතැම්විට නමකින් ප්‍රකාශ වූයේ බලාපොරොත්තුවක් හෝ අනාවැකියන් හෝ වේ (යෙසායා 8:1-4; හොසියා 1:4).

බයිබල් යුගයේදී නම්වලට තිබූ වැදගත්කම නිසා, බොහෝ දෙනෙකුගේ නම් දෙවියන්වහන්සේ වෙනස් කළ සේක. උන්වහන්සේ ආබ්‍රම් යන නම ආබ්‍රහම් ලෙස, ඔහුගේ ඉදිරි ඉරණම අනුව වෙනස් කළ සේක.

**නුඹේ නාමය තවත් ආබ්‍රම් යයි කියනු නොලබන්නේය; නුඹේ නාමය ආබ්‍රහම් වන්නේය; මක්නිසාද මම නුඹ බොහෝ ජාතීන්ගේ පියා කෙළෙමි.** (උත්පත්ති 17:5)

ආබ්‍රහම් යන නමේ අදහස "සමූහයක පියාණෝය" යන්න වේ. මෙවැනි හේතු නිසාම දෙවියන්වහන්සේ සාරායි-සාරා ලෙස ද යාකොබ්-ඉශ්‍රායෙල් ලෙස ද වෙනස් කළ සේක. අලුත්

ගිවිසුමේ ද මේ රටාවම ඇත. සිමියොන් "පේතෘස්" ලෙසත් සාවුල් "පාවුල්" ලෙසත් හැඳින්විය. දෙවියන්වහන්සේගේ සැලැස්මේ ඔවුන්ගේ ඉරණම ඔවුන්ගේ නම් මගින් පෙන්නුම් කෙරේ.

නම්වල ඇති වැදගත්කම නිසා දෙවියන්වහන්සේ තමන්ගේ එකම පුත්‍රයාට ඇති විශේෂ නමක් තෝරාගත් සේක.

## යේසුස්වහන්සේගේ නාමය

යේසුස්වහන්සේගේ නම, දෙවියන්වහන්සේගේ පුත්‍රයාට උන්වහන්සේ මනුෂ්‍යාකාරයෙන් මෙලොවට පැමිණි විට දෙන ලදි. එය දෙන ලද්දේ යේසුස්වහන්සේගේ මව වූ මරියාගේ ස්වාමිපුරුෂයා වූ යෝසෙප්ට දේව දූතයෙකු විසින් දෙන ලද ආඥාවක් අනුවය.

> **ඈ පුත්‍රයෙකු වදන්නිය; උන්වහන්සේට යේසුස් යන නාමය තබාපන්න; මක්නිසාද තමන්ගේ සෙනඟ ඔවුන්ගේ පාපවලින් ගළවන්නේ උන්වහන්සේයයි කීවේය.** (මතෙව් 1:21)

"යේසුස්" යන නමේ තේරුම "ගැළවුම්කරු" වේ. යේසුස්වහන්සේට තවත් නම් තිබිණි. සාමාන්‍යයෙන් උන්වහන්සේ යේසුස් ක්‍රිස්තුස්, ක්‍රිස්තුස් යේසුස්, ස්වාමිවූ යේසුස්, ස්වාමින් ලෙස හැඳින්විනි. මේ සියලු නම් "ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ" ලෙස එකට ඈඳා ද භාවිත කෙරිණි. "ක්‍රිස්තුස්" යන්නෙහි තේරුම "ආලේපලත් තැනැත්තා" වේ.

වරක් යේසුස්වහන්සේ "එම්මානුවෙල්" ලෙස හැඳින්විය. එහි තේරුම "දෙවියන්වහන්සේ අප සමඟය" යන්න වේ. යේසුස්වහන්සේ තමන්වහන්සේව "මනුෂ්‍ය පුත්‍රයා" ලෙස හැඳින්වූ අතර බොහෝ අවස්ථාවල නව ගිවිසුමේ උන්වහන්සේ "දෙවියන්වහන්සේගේ පුත්‍රයා" ලෙස හඳුන්වා ඇත. යොහන් උන්වහන්සේට “වාක්‍යාණෝ” හා "දෙවියන්ගේ බැටළු පැටියාණෝ. ලෙස හඳුන්වයි.

යේසුස්වහන්සේ තවත් බොහෝ නම්වලින් හැඳින්වේ, "ජීවනරියක කෑම", "ලෝකයේ ආලෝකය" ඉන් සමහරකි. මේ නම් ලයිස්තුවක් හාවස්ටයිම් ජාත්‍යාන්තර ආයතනයේ *“ආත්මික උපක්%ම: ආත්මික සටන සඳහා අත්පොත”* නම් පාඨමාලාවේ දී ඇත. යේසුස්වහන්සේට දී ඇති මේ සෑම නමක්ම, උන්වහන්සේගේ ස්ථානය හා සේවය අවබෝධ කරගැනීමට වැදගත් වේ.

එහෙත් නව ගිවිසුම මුළුල්ලේම පාහේ අපගේ ස්වාමින්වහන්සේ සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන්නේ "යේසුස්" යන නමිනි. නාමයේ බලය නැමැති මෙම පරිච්ඡේදයේ අප යොමුවන්නේ මෙම නමට වේ. ක්‍රියා පොතේ ඇදහිලිවන්තයන් තුළින් දෙවියන්වහන්සේගේ බලය ප්‍රකාශ කිරීම සඳහා භාවිත වන්නේ යේසුස් යන නම හා ඇතැම්විට ඒ හා සමඟ උන්වහන්සේගේ අනෙක් නම්වල ඒකාබද්ධ කිරීමක් වේ.

## නම් ලබාගන්නා ආකාරය

ශ්‍රේෂ්ඨ පුද්ගලයන් නම් ලබාගන්නා ආකාර තුනක් ඇත.

### උත්පත්තියෙන්

ඇතැම් අය ශ්‍රේෂ්ඨ නම් ඇතිව උත්පත්තිය ලබති. ඔවුන් උපදින්නේ කුමාරයෙකු කුමාරිකාවක හෝ ශ්‍රේෂ්ඨ ගෝත්‍ර නායකයෙකුගේ දරුවෙකු ලෙසය. මහත් වස්තුවක් හෝ දේශපාලන බලයක් හෝ පිළිබඳව ප්‍රසිද්ධියක් උසුලන නමක් ඇති පවුලකට ඔවුන් ඉපදිය හැකිය. ඔවුන්ට මේ ශ්‍රේෂ්ඨ නම උරුම වන්නේ ඔවුන්ගේ දෙමවුපියන්ගෙනි.

### කි%යාවන් නිසා

ඇතැම් අය පෞද්ගලික කි%යාවන් තුළින් ශ්‍රේෂ්ඨ නම් ලබති. ඔවුහු ශ්‍රේෂ්ඨ ලේඛකයෝ අලුත් දේ සොයාගන්නෝ, දේශපාලඥයෝ හා නායකයෝ වෙති.

## ප්‍රදානයන් මගින්

අනෙක් අය ශ්‍රේෂ්ඨ නම් ලබන්නේ ඒවා ඔවුන්ට ප්‍රදානය කරන බැවිනි. ඔවුන්ට තවත් පුද්ගලයෙකු මගින් ශ්‍රේෂ්ඨ නමක් ලැබේ. නිදසුනක් ලෙස දුප්පත් ස්ත්‍රියකට, ධනවත් දේශපාලඥයෙකුගේ නමක් ඔහු හා සමග විවාහවීම නිසා ලැබේ. රජ කෙනෙකු හෝ ගෝත්‍රික නායකයෙකු හෝ තම රාජ්‍යයේ හෝ ගෝත්‍රයේ හෝ පුද්ගලයෙකුට වැදගත් නමක් ඇති තනතුරක් පිරිනැමිය හැකිය.

### යේසුස්වහන්සේට උන්වහන්සේගේ නම ලැබුණු ආකාරය

යේසුස්වහන්සේට, තමන්වහන්සේගේ නම ලැබුනේ ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක් නම් ලබන තෙආකාරයෙන්ම වේ.

## උත්පත්තියෙන්

යේසුස්වහන්සේට උත්පත්තියෙන් තමන්වහන්සේගේ නම ලැබුණේ තම පියාණන්වහන්සේගේ උරුමයෙනි.

> **දෙවියන්වහන්සේ ආදි කාලයෙහි බොහෝ කොටස්වලින්ද බොහෝ අන්දම්වලින්ද ප්‍රොපේතවරුන් ලවා පියවරුන්ට කථාකරවා,**
> **මේ දවස්වල කෙළවරදී තමන්වහන්සේගේ පුත්‍රයාණන් ලවා අපට කථාකෙරෙවූ සේක. උන්වහන්සේව සියල්ලට උරුමක්කාරයා කළ සේක. උන්වහන්සේ කරණකොටගෙන ලෝකවල් සෑදූ සේක.**
> **උන්වහන්සේ දෙවියන්වහන්සේගේ මහත්තත්වයේ ප්‍රභාවද උන්වහන්සේගේ දේවත්වයේ ස්වරූපය ද වනසේක්, තමන්ගේ බලපරාක්‍රමයේ වචනයෙන් සියල්ල දරමින්, පව් ගැන පවිත්‍රවීමක් කළ පසු, උසස්ථානවල මහෝත්තමයාණන්වහන්සේගේ දකුණු පැත්තේ හිඳගත්සේක.**
> **මෙසේ දේවදූතයන්ට වඩා උත්කෘෂ්ඨ නාමයක් උන්වහන්සේට උරුමව තිබෙන ලෙසම ඔවුන්ට වඩා එපමණ උතුම්වූ සේක. (හෙබ්‍රෙව් 1:1-4)**

විශ්වයේ අන් කිසිවෙකුටත් නොමැති ශ්‍රේෂ්ඨ නාමයක් යේසුස්වහන්සේට උරුම විය. උන්වහන්සේගේ නම, ඕනෑම රජ කෙනෙකු ජනාධිපතිවරයෙකු හෝ ගෝත්‍රික නායකයෙකුගේ නමට වඩා උතුම්ය. ස්වර්ගයෙහි සිටින ඕනෑම දේවදූතයෙකුගේ නමට වඩා ශ්‍රේෂ්ඨය.

## කි%යාවන් නිසා

එමෙන්ම යේසුස්වහන්සේට කි%යාවන් නිසා ද උන්වහන්සේගේ නම ලැබිණි. මක්නිසාද උන්වහන්සේ සතුරාගේ සියලු බලය පරාජය කළ බැවිනි.

> **උන්වහන්සේ තමන් කෙරෙන් අධිපතීන් ද බලයලත්තන් ද පහකොට, ප්‍රසිද්ධියෙන් ඔවුන් දක්වා, කුරුසිය කරණකොටගෙන ඔවුන්ගෙන් ජයගත් බව ප්‍රකාශකළ සේක.**
> **(කොලොස්සි 2:15)**

## ප්‍රදානයෙන්

තමන්වහන්සේ වෙත ප්‍රදානය කරනු ලැබීම නිසාද යේසුස්වහන්සේට තම නම ලැබිණි.

> **එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේට ඉතා උසස්කොට, සියලු නාමවලට වඩා උසස් නාමය උන්වහන්සේට දුන් සේක.**
> **එසේ කළේ, ස්වර්ගයෙහි ද පොළොවෙහි ද පොළොව යටද සියල්ලන් යේසුස් යන නාමයෙන් දණ නමන පිණිසත්,**

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වාමින්වහන්සේ බව පියවූ දෙවියන්වහන්සේගේ ගෞරවය සඳහා සියලු දිව්වලින් ඒත්තුගන්න පිණිසත්ය. (පිලිප්පි 2:9-11)**

## ශ්‍රේෂ්ඨතම නාමය

යේසුස්වහන්සේගේ නම මුළු විශ්වයේම බලවත්ම නම වේ. එය සියලු නම්වලට වඩා උසස්ය.

**එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේට ඉතා උසස්කොට, සියලු නාමවලට වඩා උසස් නාමය උන්වහන්සේට දුන් සේක. (පිලිප්පි 2:9)**

**සියලු අධිපතිකමටත් බලයටත් පරාක්‍රමයටත් ස්වාමිකමටත් මේ ලෝකයෙහි පමණක් නොව පරලෝකයෙහිත් සඳහන් කරන ලද සියලු නම්වලටත් වඩා උසස්කොට ස්වර්ගීය ස්ථානවල තමන් දකුණු පැත්තෙහි හිඳුවා. (එපීස 1:21)**

## නමේ ඇති බලය

යේසුස්වහන්සේ උන්වහන්සේගේ අනුගාමිකයන්ගෙන් වෙන්ව ගියේ, ලෝකය පුරා ශුභාරංචිය පැතිරවීමේ ශ්‍රේෂ්ඨ මෙහෙය පවරමිනි. මේ මෙහෙය ඉටු කිරීමට අවශ්‍ය විශේෂ බලය ද උන්වහන්සේ ඔවුන්ට පැවරූ සේක. උන්වහන්සේ තමන්වහන්සේගේ නම භාවිත කිරීමේ බලය ද ඔවුන්ට දුන් සේක.

**යේසුස්වහන්සේ ඔවුන් ළඟට ඇවිත් කථාකොට: ස්වර්ගයෙහි ද පොළොවෙහි ද සියලු බලය මට දී තිබේ.**
**එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා, පියාණන්ගේත් පුත්‍රයාණන්ගේත් ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බව්තිස්මකරපල්ලා.**
**මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වාපල්ලා. මමද ලෝකාන්තිමය දක්වා සැම කල්හිම නුඹලා සමග සිටිමියි කීසේක. (මතෙව් 28:18-20)**

යම් පුද්ගලයෙකු තමන්ගේම නම තවත් කෙනෙකුට දුන් විට, ඉන් අදහස් වන්නේ ඔවුන් දෙදෙන එකිනෙකාට සමීප සම්බන්ධතාවක් ඇතිව එක්වූ බවකි. දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ නම ඉශ්‍රායෙලයට දීම මීට නිදසුනකි.

**ස්වාමින්වහන්සේ නුඹට දිවුල ලෙස, උන්වහන්සේටම ශුද්ධ සෙනඟක් කොට නුඹ ස්ථිර කරන සේක.**
**ස්වාමින්වහන්සේගේ නාමය නුඹ කෙරෙහි තබා තිබෙන බව පොළොවේ සියලු මනුෂ්‍ය වර්ගයෝ දැක නුඹට භයවන්නෝය. (ද්විතීය කථාව 28:9-10)**

යම් කෙනෙකුගේ නමින් යවනු ලැබීම හෝ කතා කරනු ලැබීම හෝ යනු ඔහුගේ අධිකාරී බලය තිබීම වේ.

**නුඹ අප අතින් මැරුම් නොකන පිණිස ස්වාමින්වහන්සේගේ නාමයෙන් අපට අනාගතවාක්‍ය නොකියන්නැයි කියා නුඹේ ප්‍රාණය හානිකරන්ට සොයන්නාවූ අනාතොත්හි මනුෂ්‍යයන් ගැන ස්වාමින්වහන්සේ මෙසේ කියනසේක. බලව මම ඔවුන්ට දඬුවම් කරන්නෙමි.**
**(යෙරමියා 11:21-22)**

දුෂ්ට මිනිසුන් යෙරමියා මරන්නට සෙව්වේ ඔහු ස්වාමින්වහන්සේගේ නාමයෙන් අනාවැකි පැවසූ අතර ඔහුගේ අනාවැකිවල දෙවියන්වහන්සේගේ ආධිපත්‍යය තිබූ බව ඔවුන් දන්නා බැවිනි.

ආත්මික බලයේ ප්‍රධානතම අංගයක් වන්නේ යේසුස්වහන්සේගේ නාමයයි. බොහෝ විට අපගේ සේවය අසාර්ථක වන්නේ යම් කෙනෙකු මුදවා ගැනීමට අපගේම හැකියාවන් කෙරෙහි විශ්වාසය තබන බැවිනි. බලය ඇත්තේ අපගේ නමේ, තත්වයේ හෝ ආධිපත්‍යයේ නොවේ. අපගේ බලය ඇත්තේ යේසුස්වහන්සේගේ නාමයේ වේ.

එම නම නැවත නැවත සජ්ජායනය කිරීම, පිළිවෙතකට වඩා වැඩිමනත් දෙයක් නොවිය හැකිය. එය බයිබල් යුගයේ පරිසිවරුන් හා ලියන්නන් නියැලුනු පල ප්‍රයෝජනයක් නොමැති පුරුද්දක් බවට පත්වනු ඇත. යේසුස්වහන්සේගේ නාමය එක්තරා ආකාරයක මන්ත්‍රයක් නොවේ. ඒ නාමය කෙරෙහි ඔබ විශ්වාසය තැබිය යුතුය. ක්‍රියා 3 සඳහන් ප්‍රබල සුවකිරීමකට පසු ගෝලයෝ මෙය අවධාරණය කළහ.

> **උන්වහන්සේගේ නාමය කෙරෙහි ඇදහිල්ල කරණකොටගෙන උන්වහන්සේගේ නාමයම නුඹලා දකින්නාවූ අඳුනන්නාවූ මේ මනුෂ්‍යයා සවිකෙළේය. (ක්‍රියා 3:16)**

අපි යේසුස්වහන්සේගේ නාමය පිළිවෙතක් ලෙස සජ්ජායනය කර ඇත්තෙමු. එහෙත් ඒ නාමය කෙරෙහි ඇති අපගේ විශ්වාසය දුර්වල වී ඇත. මෙය නිවැරදි කරගන්නේ කෙසේද? යේසුස්වහන්සේගේ නාමය නැවත නැවත ප්‍රකාශ කිරීමෙන් ඔබ්බට ගොස්, නාමය කෙරෙහි විශ්වාසය ඇතිකර ගන්නේ කෙසේද? එහි ප්‍රතිඵලය වන්නේ බලය අත්වීමය. බයිබලය මෙසේ පවසයි.

> **මෙසේ ඇසීමෙන් ඇදහිල්ලද ක්‍රිස්තුස්වහන්සේගේ වචනයෙන් ඇසීමද පැමිණෙන්නේය. (රෝම 10:17)**

යේසුස්වහන්සේගේ නාමය කෙරෙහි ඇති ඔබේ ඇදහිල්ල, ඒ නම පිළිබඳව දේව වචනය ප්‍රකාශ කරන දෙයට සවන් දීමෙන් වැඩිකරගත හැකිය. වචනය තුළින්, ඒ නාමය පසුපස ඇති ආධිපත්‍යයත් උන්වහන්සේගේ නාමය නිසියාකාර භාවිත කිරීම සඳහා බයිබලීය මඟපෙන්වීමත් ඔබට අවබෝධ කරගත හැකිය.

## යේසුස්වහන්සේගේ නාමයෙන්

යේසුස්වහන්සේගේ නම පහත දැක්වෙන දේ සඳහා භාවිත වේ.

### ගැළවීම ලබා ගැනීම සඳහා

යේසුස්වහන්සේගේ නාමයේ ප්‍රබලම බලය වන්නේ පාපයෙන් ගළවනු ලබන බලය වේ. ගැළවීම පැමිණෙන්නේ උන්වහන්සේගේ නාමය තුළින් පමණි.

> **ඈ පුත්‍රයෙකු වදන්නිය; උන්වහන්සේට යේසුස් යන නාමය තබාපන්න; මක්නිසාද තමන්ගේ සෙනඟ ඔවුන්ගේ පාපවලින් ගළවන්නේ උන්වහන්සේයයි කීවේය. (මතෙව් 1:21)**
>
> **උන්වහන්සේ කෙරෙහි අදහාගන්නා විනිශ්චය කරනු නොලැබේ. අදහා නොගන්නා දෙවියන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයාණන්ගේ නාමය කෙරෙහි අදහා නොගෙන සිටින බැවින් දැනටම විනිශ්චය කරනු ලැබව සිටියි. (යොහන් 3:18)**
>
> **වෙන කිසිවෙකු තුළ ගැළවීම නැත්තේය. මක්නිසාද අපේ ගැළවීමට අවශ්‍යවූ, මනුෂ්‍යයන් අතරේ දෙනලද වෙන කිසි නාමයක් ස්වර්ගයෙන් යට නැත්තේයයි කීවේය. (ක්‍රියා 4:12)**

යේසුස්වහන්සේගේ නාමය තුළින් හැර අන් කිසිදු ක්‍රමයකින් ඔබගේ පාපවලට ඔබට සමාව ලබාගත නොහැකිය. යේසුස්වහන්සේ තුළින් හැර දෙවියන්වහන්සේ වෙතට යෑමට ඔබ අන් කිසිදු මාර්ගයක් නොමැත.

> **යේසුස්වහන්සේ ඔහුට කියනසේක්; මාර්ගයද සැබෑවද ජීවනයද මමය. මා කරණකොටගෙන මිස කිසිවෙක් පියාණන්වහන්සේ වෙතට පැමිණෙන්නේ නැත. (යොහන් 14:6)**

ශුභාරංචිය ඉදිරිපත් කිරීමේදී ගැළවීම ලැබෙන්නේ යේසුස්වහන්සේගේ නාමයෙන් පමණක් බව අවධාරණය කිරීම ඉතා වැදගත් වේ. ගැළවීම ලැබීම සඳහා යේසුස්වහන්සේගේ නාමයෙන් පාපෝච්චාරණය කිරීම වැදගත් වේ.

> **කුමක්හෙයින්ද, යේසුස්වහන්සේ ස්වාමින්වහන්සේයයි නුඹේ මුඛයෙන් ප්‍රකාශ කරන්නෙහි නම්, දෙවියන්වහන්සේ විසින් උන්වහන්සේව මළවුන්ගෙන් නැගිටවූ බව සිතින් අදහන්නෙහි නම්, නුඹ ගළවනු ලබන්නෙහිය. (රෝම 10:9-10)**

දෙවියන්වහන්සේගේ දරුවෙකු වීමට අවශ්‍ය බලය ලැබෙන්නේ යේසුස්වහන්සේගේ නාමයෙනි.

> **නුමුත් යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිගත්තෝද, එනම් උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහාගන්නෝද, ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන්වෙන්ට උන්වහන්සේ බලය දුන් සේක. (යොහන් 1:12)**

## පාරිශුද්ධිකරණය

ඔබ යේසුස්වහන්සේගේ නාමයෙන් පාපයෙන් පිරිසිදු වී ධර්මිෂ්ඨවනවා පමණක් නොව පාරිශුද්ධිකරණය ද වේ. පාරිශුද්ධිකරණය සිදුවන්නේ දෙවියන්වහන්සේගේ බලය තුළින් වන අතර ඔබට ශුද්ධ ජීවිතයක් ගත කිරීමට හැකිවන පිණිස ගැළවීම ලැබුවායින් පසු එය ඔබ තුළ නොනවත්වාම ක්‍රියා කරයි. 1 කොරින්ති 6 හි පාවුලුතුමා පාපයේ නපුර ගැන කතා කරයි. ඔහු මෙසේ පවසයි.

> **නුඹලාගෙන් සමහරු එබන්දෝව සිටියෝය. නුමුත් ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් ද අපගේ දෙවියන්වහන්සේගේ ආත්මයාණන් තුළද නුඹලා සෝදනු ලැබුවහුය, ශුද්ධකරනු ලැබුවහුය, ධර්මිෂ්ඨකරනු ලැබුවහුය. (1 කොරින්ති 6:11)**

මීට පෙර මෙම කොරින්තිවරුන් ජීවත්වූයේ පාපී ක්‍රියාවන් තුළය. දැන් ඔවුන්ට යේසුස්වහන්සේගේ නාමය තුළින් පැමිණෙන පාරිශුද්ධිකරණය මගින් ශුද්ධ ජීවිත ගත කළ හැකිය.

## යාච්ඤාවේදී

> **මේ දක්වා මාගේ නාමයෙන් නුඹලා කිසිවක් ඉල්ලුවේ නැත. නුඹලාගේ ප්‍රීතිය සම්පූර්ණවන පිණිස ඉල්ලාපල්ලා, එවිට නුඹලාට ලැබෙන්නේය. (යොහන් 16:24)**

"මේ දක්වා" එනම් යේසුස්වහන්සේ මේ වචන කතා කළ වේලාව දක්වා, උන්වහන්සේගේ අනුගාමිකයෝ උන්වහන්සේගේ නාමයෙන් කිසිවක් නොඉල්ලූහ. මේ අවස්ථාවේ උන්වහන්සේ ඔවුන් සමඟ අලුත් සබඳතාවක් පිහිටුවන සේක. උන්වහන්සේ ඔවුන්ට පැවසුවේ උන්වහන්සේගේ නාමයෙන් දෙවියන්වහන්සේගෙන් ඕනෑම දෙයක් ඉල්ලන ලෙසය.

> **සැබවක් සැබවක් නුඹලාට කියමි. පියාණන්වහන්සේගෙන් නුඹලා යමක් ඉල්ලුවොත්, උන්වහන්සේ මාගේ නාමයෙන් ඒ දේ නුඹලාට දෙන සේක. (යොහන් 16:23)**

කෙතරම් බලවත් පොරොන්දුවක්ද? උන්වහන්සේගේ නාමයෙන් අප ඉල්ලන ඕනෑම දෙයක් අපට ලැබෙනු ඇත.

එහෙත් මේ පොරොන්දුව බයිබලයෙන් උගන්වන අනෙකුත් යාච්ඤාවේ මූලධර්ම සමඟ එකට ගත යුතු වේ. යම් විෂයක් පිළිබඳව ඇති එක් පදයක් ඒ පිළිබඳව දේව වචනයෙන් උගන්වා ඇති අනෙක් දේවලින් වෙන් කොට තනිව නොගත යුතුය. ආත්මාර්ථකාමීව නොඉල්ලිය යුතු බව බයිබලය අපට උගන්වයි.

**නුඹලා ඉල්ලන නමුත් නුඹලාගේ තෘෂ්ණා ගැන වියදම්කරන පිණිස වැරදි ලෙස ඉල්ලන බැවින් ලැබෙන්නේ නැත . (යාකොබ් 4:3)**

ඔබ දෙවියන්වහන්සේ ඉදිරියේ ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කළ යුතුය. ඔබ පාපයේ නියැලුනොත් පසුතැවිලි වී යාච්ඤාවෙන් කමාව ඉල්ලිය යුතුය.

**එබැවින් නුඹලාගේ වරද එකිනෙකාට කියාදී, සුවය ලබන පිණිස එකිනෙකා උදෙසා යාච්ඤා කරපල්ලා. ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙක් ඔප්පුකරන කන්නලව්ව කරණකොටගෙන මහත් දේ ඉෂ්ට වෙයි. (යාකොබ් 5:16)**

ඔබ පාපයේ ජීවත්වෙමින් යේසුස්වහන්සේගේ නාමයෙන් ඉල්ලූ නිසාම ඔබගේ ඉල්ලීම් ඉටුවේවයි නොසිතිය යුතුය. දෙවියන්වහන්සේ පිළිතුරු දෙන්නේ ධර්මිෂ්ඨ අයගේ යාච්ඤාවලට වේ.

**නුඹලා මා තුළෙහි පවතින්නෝ නම්, මාගේ වචනය නුඹලා තුළෙහි පවතී නම්, නුඹලා කැමති දෙයක් ඉල්ලාපල්ලා, එවිට නුඹලාට ලැබේ. (යොහන් 15:7)**

මින් අදහස් වන්නේ ඔබ ක්‍රිස්තුස්වහන්සේ තුළ පවතින්නේ නම් ඔබ ඉල්ලූ දෙයක් ලැබෙන බවය. ඔබ දේව වචනයට අවනතව සිටින්නෙහි නම්, ඔබට යේසුස්වහන්සේගේ නාමයෙන් ඉල්ලිය හැකිය.

යේසුස්වහන්සේගේ නාමයෙන් යාච්ඤා කිරීම ද දේව කැමැත්තට යටත් වීමකි. යේසුස්වහන්සේ මෙසේ යාච්ඤා කළ සේක.

**පියාණෙනි, ඔබ කැමතිසේක් නම්, මේ කුසලාන මාගෙන් පහකළ මැනව, එසේවී නුමුත් මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවයි කී සේක. (ලූක් 22:42)**

මිනිස් මාංශයේ දුර්වලතාවන් තුළ යේසුස්වහන්සේට දුක් විඳීමට අවශ්‍ය නොවීය. උන්වහන්සේට අවශ්‍ය වූයේ දුක්විඳීමේ කුසලාන ඉවත්කර ගැනීමටය. එහෙත් උන්වහන්සේ දෙවියන්වහන්සේගේ කැමැත්තට යටත් වූසේක.

ශුභාරංචියේ පැහැදිලිව විග්‍රහකර ඇති ඇතැම් දේවල, අපි දේව කැමැත්ත දන්නා අතර යාච්ඤා කළ යුතු ආකාරය ද පැහැදිලිව දනිමු. එහෙත් තවත් සමහර දේ පිළිබඳව යේසුස්වහන්සේ කළාක් මෙන් අපේ කැමැත්ත අපට ප්‍රකාශ කළ හැක. ඉන්පසු යේසුස්වහන්සේගේ නාමයෙන් අපගේ කැමැත්ත උන්වහන්සේගේ කැමැත්තට යටත් කරන්නෙමු.

යේසුස්වහන්සේගේ නාමයෙන් කරන ඉල්ලීම් මහෝත්තම වූ දෙවියන්වහන්සේගේ කැමැත්තට යටත්ය. අප ඉල්ලන්නේ මනුෂ්‍ය තර්ක-විතර්කවලට අනුකූලව වන අතර සෑම විටම දෙවියන්වහන්සේගේ උසස් පරමාර්ථ අපට නිර්ණය කළ නොහැකිය.

**මක්නිසාද මාගේ යෝජනා නුඹලාගේ යෝජනා නොවේය. නුඹලාගේ මාර්ග ද මාගේ මාර්ග නොවේ යයි ස්වාමින්වහන්සේ කියන සේක.
අහස පොළොවට වඩා උස්ව තිබෙන්නාක් මෙන් මාගේ මාර්ග නුඹලාගේ මාර්ගවලටත් මාගේ යෝජනා නුඹලාගේ යෝජනාවලටත් වඩා උසස්ව තිබේ. (යෙසායා 55:8-9)**

ඔබ දේව කැමැත්ත සැමවිටම නොදන්නෙහිය, එබැවින් යාච්ඤා කළ යුතු ආකාරය ද නිශ්චිතව නොදන්නෙහිය. ඔබ සහතිකවම දේව කැමැත්ත නොදන්නා විට එය ශුද්ධාත්මයාණන්වහන්සේගේ භාෂාවෙන් යාච්ඤා කිරීමට උචිත අවස්ථාව වේ. එවිට දේව කැමැත්තට අනුකූලව ශුද්ධාත්මයාණන්වහන්සේ අප වෙනුවෙන් මැදහත්කම් කරන සේක.

**එලෙසම ආත්මයාණන්වහන්සේත් අපගේ දුර්වලකම්වලදී උපකාරකරන සේක. මක්නිසාද යුතුලෙස යාච්ඤා කරන්ට අපි නොදනිමුව; නුමුත් ආත්මයාණන්වහන්සේම කිය නොහැකි කෙඳිරිගෑම්වලින් අප උදෙසා මැදහත්කම් කරන සේක.**

**ඒ ආත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස ශුද්ධවන්තයන් උදෙසා මැදහත්කම් කරන බැවිනි, සිත් විමසන තැනැන්වහන්සේ උන්වහන්සේගේ අදහස කුමක්දැයි දන්නාසේක.** (රෝම 8:26-27)

ඇතැම් අය මෙම බයිබලීය ඉගැන්වීම සමඟ එකඟ නොවනු ඇත. ඔවුන් පවසන්නේ, ඔබ දෙවියන්වහන්සේගේ නාමයෙන් ඕනෑම දෙයක් ඉල්ලූ විට එය ඉටුකරන බවය. ඔබ උද්දච්ච කමින් යුතුව ඔබගේ ඉල්ලීම් දේව කැමැත්තට යටත් නොකර ඉල්ලූ විට, ඔබගේ ඉල්ලීම්වලට දෙවියන්වහන්සේ පිළිතුරු දීමට ඉඩ ඇත. එහෙත් ඒ ඔබගේ යහපත සඳහා නොවන්නට පුළුවන. ඉශ්‍රායෙල් ජාතිය වෙනුවෙන් උන්වහන්සේ එසේ කළ සේක.

**උන්වහන්සේ ඔවුන්ගේ ඉල්ලීම් ඉෂ්ට කළ සේක; නුමුත් ඔවුන්ගේ ආත්මය කෘශභාවයට පැමිණවූ සේක.** (ගීතාවලිය 106:15)

ඔබ තවත් කෙනෙකු වෙනුවෙන් ඉල්ලීම් කළ විට, ඔවුන්ගේ කැමැත්ත ද මේ අවස්ථාවට ඇතුළත් වන බවද ඔබ මතක තබා ගත යුතුය. යේසුස්වහන්සේගේ නාමයෙන් කරන යාච්ඤාවක් මගින් කිසිවෙකුට වෙනත් කෙනෙකු වෙනුවෙන් ඔහු අකමැති දෙයක් කිරීමට නොහැකි වේ. දෙවියන්වහන්සේ මිනිසාගේ නිදහස් කැමැත්ත ඉවත් නොකරන සේක. වෙනත් කෙනෙකුගේ කැමැත්ත හා ඔහුගේ අවිශ්වාසය, ඔවුන් වෙනුවෙන් ඔබ කරන යාච්ඤාවනට බලපෑ හැකිය.

දෙවියන්වහන්සේ තමන්වහන්සේට දුන් ගෝලයන් හා සම්බන්ධව යේසුස්වහන්සේ කළ බලවත් යාච්ඤාවක් යොහන් 17 හි තිබේ. මේ සියලු මනුෂ්‍යයෝ එකම පුහුණුව ලැබූහ. එකම භාස්කම් දුටුවෝය. එකම දේව වචනය ලැබුවෝය. එහෙත් එක් අයෙක් නැති විය. යූදස්ට ඔහුගේම කැමැත්ත තවමත් තිබුණු අතර ඔහු දුටු හා ඇසූ සියල්ල මධ්‍යයේ දේව වචනය අවිශ්වාසයෙන් යුතුව ප්‍රතික්ෂේප කළේය.

යාච්ඤාවේදී උන්වහන්සේගේ නාමයෙන් අන් අය හා එකඟවීමේ බලය පිළිබඳව යේසුස්වහන්සේ පවසා ඇත.

**නැවතත් නුඹලාට කියමි; පොළොවේදී නුඹලාගෙන් දෙදෙනෙක් තමුන් ඉල්ලන යමක් ගැන එක්සිත්වන්නෝනම්, ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේගෙන් ඒ දේ ඔවුන්ට ලැබෙන්නේය.**
**මක්නිසාද දෙදෙනෙක් හෝ තුන්දෙනෙක් හෝ මාගේ නාමයෙන් යම් තැනක රැස්ව සිටිත් නම් මම එතැන ඔවුන් මැද සිටිමියි කීසේක.** (මතෙව් 18:19-20)

යාච්ඤාවේ කොටසක් වශයෙන්, යේසුස්වහන්සේගේ නාමයෙන් තුති පිදිය යුතුය.

**අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් සියලු දේ ගැන පියවූ දෙවියන්වහන්සේට නිතරම ස්තුතිකරපල්ලා.** (එපීස 5:20)

එමෙන්ම ඔබ යේසුස්වහන්සේගේ නාමයට ද තුති පිදිය යුතුය.

**එබැවින් දෙවියන්වහන්සේගේ නාමයට ස්තුතිකරන තොල්වල ඵල වන ප්‍රශංසාව නැමැති පූජාව උන්වහන්සේම කරණකොටගෙන නිතරම දෙවියන්වහන්සේට ඔප්පු කරමු.**
(හෙබ්‍රෙව් 13:15)

යාච්ඤාවේ බලය පිළිබඳව ඔබ ඊළඟ පරිච්ඡේදයෙන් තවදුරටත් ඉගෙන ගන්නෙහිය.

### සේවයේ සෑම ක්ෂේත්‍රයකම

සේවයේ සෑම ක්ෂේත්‍රයකම යේසුස්වහන්සේගේ නම භාවිත කළ යුතු වේ.

**යේසුස්වහන්සේ ඔවුන් ළඟට ඇවිත් කථාකොට: ස්වර්ගයෙහි ද පොළොවෙහි ද සියලු බලය මට දී තිබේ,**

**එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා, පියාණන්ගේත් පුත්‍රයාණන්ගේත් ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බව්තිස්ම කරපල්ලා.**
**මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වාපල්ලා. මම ද ලෝකාන්තිමය දක්වා සැම කල්හිම නුඹලා සමඟ සිටිමියි කීසේක.** (මතෙව් 28:18-20)

**අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්: ඔවුහු මාගේ නාමයෙන් යක්ෂයන් දුරුකරන්නෝය; සර්පයන් අල්ලාගන්නෝය,**
**යම් මරණීය වස ජාතියක් බීවත් එයින් කිසිසේත් ඔවුන්ට අනතුරක් නොවන්නේය; ඔවුන් රෝගීන් පිට අත් තැබූ කල්හි, ඔව්හු සුවය ලබන්නෝයයි කී සේක.** (මාක් 16:17-18)

මේ පදවලට අදාළව, පහත දැක්වෙන සේවයන් යේසුස්වහන්සේගේ නාමයෙන් කෙරෙනු ඇත.

## ලකුණු හා හාස්කම්

යේසුස්වහන්සේගේ නාමයෙන් මහා බලගතු ලකුණු හා හාස්කම් කෙරෙනු ඇත. ගෝලයෝ මෙසේ යාච්ඤා කළහ.

**දැනුදු ස්වාමිනි, ඔවුන්ගේ තර්ජන බලා සුවකිරීමට ඔබගේ අත දිගුකරන කල, ඔබගේ වචනය නිර්භීතකමින් කථාකරන්ටත් ඔබගේ ශුද්ධ සේවකයාවූ යේසුස්වහන්සේගේ නාමය කරණකොටගෙන හාස්කම් ද පුදුම ද කරන්ටත් ඔබගේ දාසයන්ට වර දුන මැනවයි කීවෝය.** (ක්‍රියා 4:29-30)

## දේශනාකිරීම හා ඉගැන්වීම

සියලු බලය හා ආධිපත්‍යය උන්වහන්සේට දී ඇති බවත් මේ බලය මගින් උන්වහන්සේගේ නාමයෙන් ශුභාරංචිය දේශනා කිරීමට හා ඉගැන්වීමට බලය පවරා ඇති බවත් යේසුස්වහන්සේ පැවසූ සේක.

**එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා, පියාණන්ගේත් පුත්‍රයාණන්ගේත් ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බව්තිස්ම කරපල්ලා.**
**මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වාපල්ලා. මම ද ලෝකාන්තිමය දක්වා සැම කල්හිම නුඹලා සමඟ සිටිමියි කීසේක.** (මතෙව් 28:19-20)

**මෙසේ ක්‍රිස්තුස්වහන්සේ වධවිඳින්ටත්, තුන්වෙනිදා මළවුන්ගෙන් නැගිටින්ටත්, යෙරුසලමේ පටන් සියලු ජාතීන්ට පසුතැවිල්ල සහ පව්කමාව ද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශකරනු ලබන්ටත් යුතුයයි ලියා තිබේ.** (ලූක් 24:46-47)

යේසුස්වහන්සේගේ නාමයේ බලය ඔවුන් දැනගත් බැවින්, ශුභාරංචි පණිවුඩයේ සතුරෝ ගෝලයන්ට අනතුරු ඇඟවූහ.

**නුමුත් සෙනඟ අතරේ එය තවත් දුරට පතළ නොවන පිණිස, මින්මතු කාටවත් මේ නාමයෙන් කථා නොකරන්ට ඔවුන්ට තර්ජනය කරමුයයි කීවෝය.**
**තවද ඔවුහු ඔවුන් ගෙන්වා, යේසුස්වහන්සේගේ නාමයෙන් කොහෙත්ම කථා නොකරන ලෙස ද නුගන්වන ලෙසද ඔවුන්ට අණ කළෝය.** (ක්‍රියා 4:17-18)

එහෙත් පේතෘස්තුමා මෙසේ පිළිතුරු දුන්නේය.

**මක්නිසාද අප ඇසූ දුටු දේ ගැන කථා නොකර සිටින්ට අපට නුපුළුවන.** (ක්‍රියා 4:20)

දෙවියන්වහන්සේගේ බලය පිළිබඳව ගෝලයෝ සාක්ෂි දැරූහ. යේසුස්වහන්සේගේ නාමයෙන් ඔවුන් ඇසූ දුටු දේ, ඔවුන්ගේ සේවය සම්පූර්ණ කිරීම සඳහා ඔවුන්ව තල්ලු කළ මහත් බලයක් විය.

ඔබ යේසුස්වහන්සේගේ නාමයෙන් ඉගැන්විය යුතු අතරම ඒ නාමය පිළිබඳව ද ඉගැන්විය යුතුය.

> **නුමුත් ඔවුහු දෙවියන්වහන්සෙටග් රාජ්‍යය ද යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමය ද ගැන ශුභාරංචිය දේශනා කළාවූ පිලිප් විශ්වාසකොට, පුරුෂයෝ ද ස්ත්‍රීහු ද බව්තිස්මකරනු ලැබුවෝය. (ක්‍රියා 8:12)**

## බව්තිස්මය

අලුතින් හැරුනු අය පියාණන්වහන්සේගේ ද, පුත්‍රවූ යේසුස්වහන්සේගේ ද ශුද්ධාත්මයාණන්වහන්සේගේ ද නාමයෙන් ජලයෙන් බව්තිස්ම කළ යුතුය.

> **එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා, පියාණන්ගේත් පුත්‍රයාණන්ගේත් ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බව්තිස්ම කරපල්ලා. (මතෙව් 28:19)**

> **ඔවුහු ඒ අසා ස්වාමිවූ යේසුස්වහන්සේගේ නාමයට බව්තිස්මකරනු ලැබුවෝය. (ක්‍රියා 19:5)**

එම නම පදනම් කරගෙන, ඇදහිලිවන්තයෝ ශුද්ධාත්ම දීමනාව ලැබූහ.

> **පේතෘස්: නුඹලා සියල්ලෝම පසුතැවිලිව, පව්කමාව පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් බව්තිස්මය ලබාපල්ලා; එවිට ශුද්ධාත්ම දීමනාව නුඹලා ලබන්නහුය. (ක්‍රියා 2:38)**

## යක්ෂයන් පලවා හැරීම

යක්ෂයෝ සාතන්ගේ දේවදූතයෝ වෙති. ඔවුන් කලින්, දෙවියන්වහන්සේගේ දේවදූතයන්ව සිටි අතර පසුව දෙවියන්වහන්සේට විරුද්ධව කැරලි ගසා සාතන්ට එක් වූහ. ඔවුහු දැන් මෙලොව විවිධ නපුරු ක්‍රියාවල නිරත වන්නාවූ සාතන්ගේ බලවේගයේ කොටස් කරුවෝ වෙති.

යක්ෂයින්ට නොඇදහිලිවතුන් තුළට ඇතුළු විය හැකි අතර ඔවුන්ව සැබවින්ම අයත් කර ගත හැකිය. යක්ෂ බලවේගවලට ඇදහිලිවතුන්ට පීඩා කළ හැකි වුවද ඔවුන්ව අයත් කරගත නොහැකිය. ඔවුන්ගේ සාතනික බලයන් යේසුස්වහන්සේගේ නාමයෙන් බිඳ දමනු ලැබේ.

> **අදහන්නන්ට ඇත්තාවූ ලකුනු නම්: ඔවුහු මාගේ නාමයෙන් යක්ෂයන් දුරුකරන්නෝය; (මාක් 16:17)**

යක්ෂාවේශ වු ස්ත්‍රියක් පාවුලුතුමාට හමුවු විට, ඔහු ඒ ආත්මයට මෙසේ පැවසිය.

> **යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් ඇගෙන් අහක්වී යන්ට නුඹට අණකරමියි කීවේය. ඒ පැයේදීම ආත්මය අහක්ව ගියේය. (ක්‍රියා 16:18)**

යක්ෂයින් පිළිබඳ විස්තරාත්මක ඉගැන්වීම් හා ඔවුන්ගේ බලය හා බලපෑම් යටතේ සිටිනවුන් මුදවාගත හැකි ආකාරය, හාවස්ටයිම් ජාත්‍යාන්තර ආයතනයේ ""*ආත්මික උපක්%ම: ආත්මික සටන සඳහා අත්පොත*" පාඨමාලාවේ දී ඇත.

## ශුද්ධාත්මයාණන්වහන්සේ තුළ සේවය කිරීම

ශුද්ධාත්මයාණන්වහන්සේ දෙනු ලැබුවේ යේසුස්වහන්සේගේ නාමයෙනි.

> **නුමුත් මාගේ නාමයෙන් පියාණන්වහන්සේ එවන සැනසිලිකාරයාණන්වහන්සේ, එනම් ශුද්ධාත්මයාණන්වහන්සේ, නුඹලාට සියල්ල උගන්වමින්, මා විසින් නුඹලාට කියනලද සියල්ල නුඹලාට සිහිකරවන සේක. (යොහන් 14:26)**

ශුද්ධාත්මයාණන්වහන්සේ මගින් විවිධ භාෂාවලින් කතා කිරීම, උන්වහන්සේගේ විවිධ සේවාවන් සඳහා නිදසුනක් ලෙස මෙම පදයෙන් ඉදිරිපත් කර ඇත.

> **අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්: ඔවුහු මාගේ නාමයෙන් යක්ෂයන් දුරුකරන්නෝය; අන් භාෂාවලින් කථා කරන්නෝය;** (මාක් 16:17)

ශුද්ධාත්මයාණන්වහන්සේගේ සියලු බලගතු දීමනා යේසුස්වහන්සේගේ නාමයෙන් ක්‍රියාත්මක වේ. අන්‍ය භාෂාවලින් කතාකිරීම බොහෝ ආත්මික දීමනාවලින් එකකි. එය මෙහි භාවිත කර ඇත්තේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ සියලු සේවයන් නියෝජනය කිරීම පිණිස වේ. මන්ද, ශුද්ධාත්මයාණන්වහන්සේ දෙනු ලැබූ විට අත්දුටු පළමු දීමනාව එය බැවිනි.

## සුවකිරීම

රෝගීන් සුවකිරීම සඳහා යේසුස්වහන්සේගේ නාමය භාවිත කෙරෙනු ඇත.

> **අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්: ඔවුහු මාගේ නාමයෙන් යක්ෂයන් දුරුකරන්නෝය; අන් භාෂාවලින් කථා කරන්නෝය; ඔවුන් රෝගීන් පිට අත් තැබූ කල්හි, ඔවුහු සුවය ලබන්නෝයයි කීසේක.** (මාක් 16:17,18)

> **නුඹලා අතරෙහි යමෙක් රෝගාතුරව සිටින්නේද? ඔහු සභාවේ වැඩිමහල්ලන්ට හඬගසාවා; ඔවුහු ස්වාමින්වහන්සේගේ නාමයෙන් ඔහුට තෙල් ආලේපකොට, ඔහු උදෙසා යාච්ඤාකරත්වා.** (යාකොබ් 5:14)

යේසුස්වහන්සේ කුරුසියෙහි මැරුණු විට, උන්වහන්සේ දුක්වින්දේ ඔබගේ පාපය සඳහා පමණක්ම නොවේ, උන්වහන්සේගේ දුක්විඳීම හා මරණය තුළින් ඔබට සුවය ලබා දීම සඳහා ද වේ.

> **නුමුත් උන්වහන්සේ තුවාල ලැබුවේ අපේ අපරාධ නිසාය, පොඩි කරනු ලැබුවේ අපේ අයුතුකම නිසාය. අපට සමාදානය ගෙනදෙන දඬුවම උන්වහන්සේ පිටට පැමුණුනේය; උන්වහන්සේගේ පහරවලින් අපට සුවය ලැබී තිබේ.** (යෙසායා 53:5)

> **මෙසේ වූයේ: උන්වහන්සේම අපේ දුර්වලකම් ගත්සේක. අපේ රෝග උසුලාගත්සේකැයි අනාගතවක්තෘවූ යෙසායා කරණකොටගෙන කියන ලද කාරණාව සම්පූර්ණ වන පිණිසය.** (මතෙව් 8:17)

> **අප පාපවලට නැසී ධර්මිෂ්ඨකමට ජීවත්වන පිනිස, උන්වහන්සේම තමන්ගේ ශරීරයෙන් ගස පිටදී අපගේ පාපයන් ඉසුලූ සේක; උන්වහන්සේගේ තුවාල වලින් නුඹලා සුවකරනු ලැබුවහුය.** (1 පේතෘස් 2:24)

උන්වහන්සේගේ නාමයෙන් පාපයෙන් ගැළවීම ලැබෙන බව පිළිගැනීම අපට පහසු වුවත් උන්වහන්සේගේ නාමයෙන් සුවය පිළිගැනීම අපට අපහසු වන්නේ මන්ද?

දේව මාලිගාවේ දොරටුව අසලදී කොර මිනිසෙකු ගෝලයන්ට හමුවූ විට, පේතෘස් මෙසේ පැවසීය.

> **රන් රිදී මට නැත; නුමුත් මට ඇති දේ නුඹට දෙමි. නාසරීය යේසුස්වහන්සේගේ නාමයෙන් ඇවිදින්න.** (ක්‍රියා 3:6)

යේසුස්වහන්සේගේ නාමයේ බලය පේතෘස්තුමා දැන සිටියේය. ඒ නාමයේ සුවවීම ඇති බව ඔහු දැන සිටියේය. ඒ නම පාවිච්චි කිරීමට තමාට අධිකාරී බලය ඇති බව ඔහු දැන සිටියේය... "මට ඇති දේ", ඒ නාමය පසුපස ඇති බලය යේසුස්වහන්සේ විසින් ඔහුට පවරා තිබිණි.

සේවයේ විවිධ කාර්යයන් සඳහා මිලමුදල් අවශ්‍යය. එහෙත් මුදල් හිඟකම දෙවියන්වහන්සේගේ බලය පිළිබඳ සැබෑ සේවය අත්හිටවීමට හේතුවක් නොවේ. පේතෘස්ට හා යොහන්ට රන්-රිදී තිබුණේ නැත. එහෙත් ඔවුහු යේසුස්වහන්සේගේ නාමයෙන් බලයෙන් යුක්තව තවදුරටත් සේවය කළහ.

මේ මිනිසුන්ට තම සේවය පිළිබඳව ජෙරුසලම් නගරයේ ප්‍රචාරය කිරීමට මුදල් නොතිබිණි. එහෙත් දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීම තුළින් මුළු නගරයම ඒ පිළිබඳව දැනුවත්ව සිටියේය. ඔබට මේ පිළිබඳව ක්‍රියා 3 හා 4 පරිච්ජේද කියවීම තුළින් දැනගත හැකිය.

අද බොහෝ සේවයන් තුළ වැඩි අවධානයක් යොමු කෙරෙන්නේ මුදල් උපදවීම ගැන මිස යේසුස්වහන්සේගේ නාමයේ ඇති බලය ගැන නොවේ. සේවය සඳහා මුදල්වල ඇති වැදගත්කම පිළිගනිමු. එහෙත් වැඩියෙන් අවධාරණය කළ යුත්තේ දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීම ගැන වේ. මුදල් තිබුණ ද නොතිබුණ ද එය යේසුස්වහන්සේගේ නාමයෙන් ලැබෙන බලය කෙරෙහි බලපෑමක් ඇති නොවේ.

### ආරක්ෂාව සඳහා

> **අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්: ඔවුහු මාගේ නාමයෙන් යක්ෂයන් දුරුකරන්නෝය; අන් භාෂාවලින් කථා කරන්නෝය; ඔවුන් රෝගීන් පිට අත් තැබූ කල්හි, ඔවුහු සුවය ලබන්නෝයයි කීසේක.** (මාක් 16:17,18)

ප්‍රේරිතවූ පාවුල්තුමාට සර්පයෙකු දෂ්ට කළද එහුට හානියක් නොවීය. මේ පිළිබඳව ඔබට ක්‍රියා 28 හි කියවිය හැකිය.

### සියලු කටයුතුවලදී

ඔබ කරන සෑම දෙයක්ම යේසුස්වහන්සේගේ නාමයෙන් කළ යුතු බව බයිබලයේ සඳහන් වේ.

> **තවද නුඹලා වචනයෙන් හෝ ක්‍රියාවෙන් හෝ මොකක් කරතත් සියල්ලම ස්වාමිවූ යේසුස්වහන්සේගේ නාමයෙන් කරමින්, උන්වහන්සේ කරණකොටගෙන පියවූ දෙවියන්වහන්සේට ස්තුති කරපල්ලා; (කොලොස්සි 3:17)**

ඔබ සෑම දෙයක්ම යේසුස්වහන්සේගේ නාමයෙන් කරනවිට සේවයේ ඉතා සරල කාර්යයක් වුවද ඉතා බලවත් ආත්මික අත්දැකීමක් බවට පත්වනු ඇත. ඔබට යේසුස්වහන්සේගේ නාමයෙන් දේවස්ථානයේ පොළොව අතුගෑමට පුළුවන. ඔබට යේසුස්වහන්සේගේ නාමයෙන් ඔබගේ පවුල වෙනුවෙන් ආහාර පිළියෙල කළ හැකිය. ඔබ කරන වැඩය එය ඔබ කරන ආකාරය තරම් වැදගත් නොවේ. එය ඔබ යේසුස්වහන්සේගේ නාමයෙන් කරන්නෙහිද?

## නාමය වෙනුවෙන් දුක්විඳීම

> **මා කී වචනය සිහිකරපල්ලා, ඔවුහු මට පීඩාකළෝ නම් නුඹලාටත් පීඩා කරන්නෝය; මාගේ වචනය රක්ෂා කළෝ නම් නුඹලාගේ වචනයත් රක්ෂා කරන්නෝය.**
>
> **නුමුත් ඔවුන් මා එවූ තැනැන්වහන්සේව නාඳුනන බැවින් මාගේ නාමය නිසා මේ සියල්ල නුඹලාට කරනවා ඇත. (යොහන් 15:20-21)**

ශුභාරංචිය වෙනුවෙන් ගෝලයන්ට දුක් විඳීමට සිදුවූ විට.

> **ඔවුහු ඒ නාමය නිසා නින්දා විඳින්ට තුමු වටින්නෝයයි ගණන්ගනු ලැබූ බැවින් සන්තෝෂව, සභාව ඉදිරියෙන් පිටත්ව ගොස්, දවස්පතාම දේව මාලිගාවේදීත් ගෙදරදීත් ඉගැන්වීමෙන් ද යේසුස්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේයයි දේශනාකිරීමෙන්ද නොනැවතුණෝය. (ක්‍රියා 5:41-42)**

ගෝලයෝ යේසුස්වහන්සේගේ නාමය වෙනුවෙන් තම ජීවිතය අවදානමට ලක්කළ අය වූහ.

> **අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමය නිසා තමුන්ගේ ජීවිත උපද්‍රවයට පැමිණවූ, අපගේ ප්‍රේමණීය බාර්ණබස් ද පාවුල් ද සමග මනුෂ්‍යයන් තෝරාගන නුඹලා ළඟට එවීම යහපතැයි එක්සිත්ව රැස්වූ අපට පෙනීගියේය.** (ක්‍රියා 15:25-26)

සේවයේ යෙදී සිටින විට ආරක්ෂාව සපයන බවට යේසුස්වහන්සේ පොරොන්දු වුවද ගෝලයන් දුක් නොවිඳි බවක් ඉන් අදහස් නොවේ. පේතෘස්තුමා පාවුලුතුමා හා සිලස් යන සියලු දෙනම සිරගත වූහ. මේ ගෝලයන්ට ගල්ගසන ලදී, පහර දෙන ලදී. වරක් පාවුලුතුමාව ඔහුගේ සතුරන් විසින් ශුභාරංචිය වෙනුවෙන් ඔහු මැරෙන්නට ඇතැයි සිතා දමා යන ලදී. ඔවුන්ගේ සේවයන් අවසන් වූ පසු ගෝලයෝ බොහෝ දෙනෙක් ශුභාරංචිය වෙනුවෙන් ජීවිතය පූජා කළහ. සිරගෙයින් මිදී ආ පේතෘස්ම පසුව ශුභාරංචිය වෙනුවෙන් මිය ගියේය.

ඇදහිල්ල තුලින් මිදීම ලබූ ශ්‍රේෂ්ඨ මිනිසුන් හා ගැහැණුන් පිළිබඳව හෙබ්‍රෙව් 11 හි සඳහන් වේ. එමෙන්ම තම සේවය අවසන් කළ පසු ශුභාරංචිය වෙනුවෙන් ඇදහිල්ලෙන් යුතුව මියගිය අය පිළිබඳව ද එහි සඳහන්ව ඇත. පේතෘස්තුමා මෙසේ පවසා ඇත.

> **ක්‍රිස්තුස්වහන්සේගේ නාමය නිසා නින්දාකරනු ලබන්නහු නම් නුඹලා ආශීර්වාදලද්දහුය; මක්නිසාද මහිමයේ ආත්මයාණන්වහන්සේ වන දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි රඳන සේක.** (1 පේතෘස් 4:14)

ඔබ උන්වහන්සේගේ දුක්විඳීමේ සහභාගිත්වයේ බලය පිළිබඳව තවදුරටත් දාහත්වන පරිච්ඡේදයෙන් ඉගෙන ගන්නෙහිය.

## නාමය මගින් පාලනය කිරීම

යේසුස්වහන්සේගේ නාමය තුළින් ඔබ දේව රාජ්‍යයේ කොටස්කරුවෙක් වන්නෙහිය.

> **ආලෝකයේ සිටින ශුද්ධවන්තයන්ගේ උරුමයෙන් කොටසකට අප සුදුස්සන් කළාවූ පියාණන්වහන්සේට ස්තුතිකරමින්ද පියාණන්වහන්සේ අන්ධකාරයේ බලයෙන් අප මුදා, තමන් ප්‍රේමයේ පුත්‍රයාණන්ගේ රාජ්‍යයට අප පමුණුවාගත් සේක.** (කොලොස්සි 1:12-13)

යේසුස්වහන්සේගේ රාජ්‍යයේ කොටස්කරුවෙකු ලෙස, ඔබගේ ජීවිතය පාලනය කිරීමට ඔබ බලයේ උරුමය ලබන්නෙහිය.

> **මක්නිසාද එක්කෙනාගේ වරද නිසා ඒ එක්කෙනා කරණකොටගෙන මරණය රජකම් කළේවී නම්, කරුණාවේද ධර්මිෂ්ඨකම නමැති දීමනාවේද බහුලත්වය ලබන අය, එක්කෙනාවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන ඊට වඩා ජීවනයේ රජකම්කරන්නෝය.** (රොම 5:17)

ඔබ යේසුස්වහන්සේගේ නාමයෙන් ඔබගේ ජීවිතය පාලනය කළ යුතුය. ඔබගේ ජීවිතයේ සෑම අවස්ථාවන්ද ඔබ යේසුස්වහන්සේගේ නාමයෙන් පාලනය කළ යුතුය. එමෙන්ම යේසුස්වහන්සේගේ නාමයෙන් සතුරාගේ සියලු ප්‍රබල බලවේග ඔබ පාලනය කළ යුතුය.

## අවසාන යොමු කිරීම්

යේසුස්වහන්සේගේ නාමයට කෙරෙන අවසාන බයිබලීය යොමු කිරීම් එළිදරව් පොතේ ඇත. එහි සඳහන්ව ඇත්තේ, අලුත් ස්වර්ගයේ දී හා පොළොවේ දී ඔවුන්ගේ ගැළවුම්කරු අභිමුඛයේ ඇදහිලිවතුන් පෙනී සිටින දිනය පිළිබඳවය.

> **කිසි ශාපයක් තවත් නොවන්නේය, එහි දෙවියන්වහන්සේගේ ද බැටළුපැටවාණන්ගේ ද සිංහාසනය වන්නේය. උන්වහන්සේගේ මෙහෙකරුවෝ උන්වහන්සේට මෙහෙකරන්නෝය;**

**ඔවුහු උන්වහන්සේගේ මුහුණ දකින්නෝය; උන්වහන්සේගේ නාමය ද ඔවුන්ගේ නළල්වල තිබෙන්නේය. (එළිදරව් 22:3-4)**

- ඒ නම අපි අගය කළෙමු.

- ඒ නම සේවය සඳහාත් යාච්ඤාව සඳහාත් අධිකාරී බලයෙන් යුතුව අපි භාවිත කෙළෙමු

- ඒ නමින් අපගේ ජීවිත පාලනය කෙළෙමු

- යේසුස්වහන්සේගේ නාමය සදාකල්හිම අපගේ අනන්‍යතාවේ කොටසක් වනු ඇත.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න

2. බයිබල් යුගයේ නම්වල ඇති වැදගත්කම පැහැදිලි කරන්න

3. යේසුස්වහන්සේට නම තැබීමට යෝසෙප්ට අණ කළේ කවුද?

4. මුළු විශ්වයටම ශ්‍රේෂ්ඨතම නාමය කුමක්ද?

5. යේසුස්වහන්සේට උන්වහන්සේගේ නම ලැබුනේ කෙසේද?

6. යේසුස්වහන්සේගේ නාමය හා එහි බලය පිළිබඳව ඔබගේ ඇදහිල්ල වර්ධනය කරගන්නේ කෙසේද?

7. පහත දැක්වෙන ප්‍රකාශ කියවා, වචනය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය අකුර ලියන්න.

අ. යේසුස්වහන්සේගේ නම ගැ_ _ _ සඳහා අවශ්‍ය වේ

ආ. අප රෝගවලින් සු _ _ _ _ සඳහා යාච්ඤා කරන විට එය යේසුස්වහන්සේගේ නාමයෙන් කළ යුතුය.

ඇ. පා _ _ _ _ _ _ _ _ _ ලැබෙන්නේ යේසුස්වහන්සේගේ නාමය තුළිනි

ඈ. අප ඉ _ _ _ _ හා දේ _ _ _ _ _ කළ යුත්තේ යේසුස්වහන්සේගේ නාමයෙනි

ඉ. ය _ _ _ _ පලවා හැරිය යුත්තේ යේසුස්වහන්සේගේ නාමයෙනි

ඊ. අප බ _ _ _ _ කළ යුත්තේ පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද හා ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙනි

8. මේ සෑම ප්‍රකාශයක්ම සත්‍ය ද අසත්‍ය ද යන්න වරහන් තුළ ලියන්න

අ. _______________ සියලු දේවලදී අප යේසුස්වහන්සේගේ නාමයෙන් ස්තුති කළ යුතුය

ආ. _______________ ශුද්ධාත්මයාණන්වහන්සේ දෙනු ලැබුවේ යේසුස්වහන්සේගේ නාමයෙනි

ඇ. _______________ යේසුස්වහන්සේගේ නාමයෙන් ආරක්ෂාව ලැබීම යන්නෙන් අදහස් වන්නේ අප උන්වහන්සේ වෙනුවෙන් කිසිදිනක දුක් නොවිඳින බව වේ.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ පරීක්ෂණ වලට පිළිතුරු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

නව ගිවිසුමේ, යේසුස්වහන්සේගේ නාමය සඳහන් කෙරෙන සියලු ශුභාරංචි යොමුවන් පහත දැක්වෙන ලැයිස්තුවේ ඇත. මෙය භාවිත කරමින් යේසුස්වහන්සේගේ නාමයේ බලය ගන තවදුරටත් ඉගෙනගන්න.

**මතෙව්:** 1:21; 1:23; 1:24,25; 10:22; 12:18-21; 18:5; 18:19,20; 19:29; 28:19;

**මාක්:** 9:38-41; 16:17-18;

**ලූක්:** 10:17; 24:46-47

**යොහන්:** 1:12; 2:23; 3:18; 14:13 -14; 14:26; 15:16; 15:20-21; 16:23,24,26; 20:31;

**ක්‍රියා:** 2:21; 2:38; 3:6; 3:16; 4:7,8,10,12,17,18; 4:29-30; 5:28, 40-42; 8:12; 9:14-16; 9:21,27,29; 10:43; 10:48; 15:25-26; 16:18; 19:5;

**රෝම:** 1:5; 10:13;

**1 කොරින්ති:** 1:2; 1:10; 6:11;

**එපීස:** 5:20;

**පිලිප්පි:** 2:9-11;

**කොලොස්සි:** 3:17;

**2 තෙසලෝනික:** 1:12;

**2 තිමෝති:** 2:19;

**හෙබ්‍රෙව්:** 1:4; 6:10; 13:15;

**යාකොබ්:** 5:14;

**1 පේතෘස්:** 4:14;

**1 යොහන්:** 2:12; 3:23; 5:13;

**එළිදරව්:** 19:12,13,16; 22:3-4;

# දහතුන්වන පරිච්ඡේදය

## බලය පිළිබඳ සත්වන මූලධර්මය : යාච්ඤාවේ බලය*

**අරමුණු :**

- ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.
- යාච්ඤාව හා නිරාහාරව සිටීම මගින් දෙවියන්වහන්සේගේ බලය මුදාහරින්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.
- යාච්ඤාව යන්න අර්ථ විග්‍රහ කරන්න.
- යාච්ඤාවේ විවිධ මට්ටම් හඳුනාගන්න.
- විවිධ යාච්ඤා වර්ග හඳුනාගන්න.
- යාච්ඤාවට ඇතිවන බාධාවන් හඳුනාගන්න.
- නිරාහාරව සිටීම යන්න අර්ථ විග්‍රහ කරන්න.
- නිරාහාරව සිටීමේ ක්‍රම දෙකක් හඳුනාගන්න.
- නිරාහාරව සිටීමේ පරමාර්ථය පැහැදිලි කරන්න.

**ප්‍රධාන පදය:**

**ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙක් ඔප්පු කරන කන්නලව්ව කරණකොටගෙන මහත් දේ ඉෂ්ට වෙයි.** (යාකොබ් 5:16 )

### හැඳින්වීම

ඔබ යේසුස්වහන්සේගේ නාමයේ ඇති බලය පිළිබඳව ඉගෙන ගත්විට පියාණන්වහන්සේගෙන් ඉල්ලීම් කිරීම සඳහා ඇදහිලිවතුන්ට යාච්ඤාවේදී ඒ නාමය භාවිතා කළ හැකි බවද උගත්තෙහිය. මෙම පාඩමෙන් විමසා බලන්නේ යේසුස්වහන්සේගේ නාමයෙන් කෙරෙන යාච්ඤාවේ බලය පිළිබඳව වේ. එමෙන්ම, මෙය ඒ හා සම්බන්ධ නිරාහාරව සිටීම ගැනද කරුණු ඉදිරිපත් කරයි. යාච්ඤාව හා නිරාහාරව සිටීම ඇදහිලිවතුන්ගේ ජීවිත තුළ දෙවියන්වහන්සේගේ බලය නිදහස් කෙරෙන බලවත් මූලධර්මයන් වේ.

### යාච්ඤාවේ අර්ථ විග්‍රහය

යාච්ඤාව යනු දෙවියන්වහන්සේ සමඟ සෘජු සංවාදයකි. එය විවිධාකාර වුවද, මූලිකවම මිනිසා දෙවියන්වහන්සේ සමගත් දෙවියන්වහන්සේ මිනිසා සමගත් කතා කරන විට සිදු වේ. යාච්ඤාව පහත දැක්වෙන ආකාරයෙන් විස්තර කර ඇත.

| | |
|---|---|
| ස්වාමින්වහන්සේගේ නාමය හඬ ගසා යාච්ඤා කිරීම: | උත්පත්ති 12:8 |
| දෙවියන්වහන්සේට මොරගැසීම: | ගීතාවලිය 27:7; 34:6 |
| දෙවියන්වහන්සේට ළංවීම: | ගීතාවලිය 73:28; හෙබ්‍රෙව් 10:22 |
| දෙවියන්වහන්සේ දෙස බලා සිටීම: | ගීතාවලිය 5:3 |
| ආත්මය එසවීම: | ගීතාවලිය 25:1 |
| සිත් එසවීම: | විලාප ගී 3:41 |
| සිත් වැගිරවීම: | ගීතාවලිය 62:8 |
| ආත්මය වැගිරවීම: | 1 සාමුවෙල් 1:15 |
| ස්වර්ගයට මොරගැසීම: | 2 ලේකම් 32:20 |
| ස්වාමින්වහන්සේට කන්නලව් කිරීම: | නික්මයාම 32:11 |
| දෙවියන්වහන්සේ සෙවීම: | යෝබ් 8:5 |

* මෙම පාඩමෙහි සඳහන් සමහර ඉගැන්වීම් “ආත්මික උපක්‍රම :ආත්මික සටන සඳහා අත්පොත” නම් පොතෙහි යාච්ඤාව හා නිරාහාර යාච්ඤාව යන පරිච්ඡේදයේද සඳහන් වේ, එහි සඳහන් ක්‍රියාකාරකම් ආත්මික සටන සඳහා ආයුධ පමණක් නොවන අතර බල මූලධර්මයන්ද වේ, ඒ හේතුවෙන් එම සමහර ඉගැන්වීම් මෙම පරිච්ඡේදයේද සඳහන් කර ඇති අතර නව ඉගැන්වීම්ද ඇතුළත් කර ඇත,

ස්වාමින්වහන්සේගේ මුහුණ සෙවීම: ගීතාවලිය 27:8
කන්නලව් කිරීම: යෝබ් 8:5; යෙරමියා 36:7

## යේසුස්වහන්සේගේ යාච්ඤා ජීවිතය

යාච්ඤාව, ස්වාමිවූ යේසුස්වහන්සේගේ ජීවිතයේ ප්‍රබල ආයුධයක් විය.

**යේසුස්වහන්සේ යාච්ඤාවට ප්‍රමුඛස්ථානයක් දුන්සේක**

දිවා-රාත්‍රි ඕනෑම වේලාවක උන්වහන්සේ යාච්ඤා කළසේක: ලූක් 6:12-13
කෑමට වඩා යාච්ඤාවට ප්‍රමුඛස්ථානයක් දුන්සේක: යොහන් 4:31-32
වැඩවලට වඩා යාච්ඤාවට ප්‍රමුඛස්ථානයක් දුන්සේක: යොහන් 4:31-32

**ඕනෑම වැදගත් සිද්ධියක් හා සමඟ යාච්ඤාව බැඳී පැවතියේය**

උන්වහන්සේගේ බව්තිස්මයේදී: ලූක් 3:21-22
සේවය සඳහා ගිය පළමු ගමනේදී: මාක් 1:35; ලූක් 5:16
ගෝලයන් තේරීමට පෙර: ලූක් 6:12-13
5000 කට කන්ට දීමට පෙර හා පසු: මතෙව් 14:19, 23; මාක් 6:41, 46; යොහන් 6:11; 14-15
4000 කට කන්න දෙන අවස්ථාවේ: මතෙව් 15:36; මාක් 8:6, 7
පේතෘස්ගේ ප්‍රකාශයට පෙර: ලූක් 9:18
අන්වෙසක් වීමට පෙර: ලූක් 9:28, 29
සැත්තෑ දෙනා ආපසු පැමිණි අවස්ථාවේ: මතෙව් 11:25; ලූක් 10:21
ලාසරස්ගේ සොහොනේදී: යොහන් 11:41-42
ළමයින්ට ආශිර්වාද කළ අවස්ථාවේ: මතෙව් 19:13
ඇතැම් ග්‍රිකයන් පැමිණි අවස්ථාවේ: යොහන් 12:27-28
උන්වහන්සේ මහත් සංතාපයෙන් සිටියදී: මතෙව් 26:26-27; මාක් 14:22-23; ලූක් 22:17-19
පේතෘස් වෙනුවෙන්: ලූක් 22:32
ශුද්ධාත්මයාණන්වහන්සේ දීම වෙනුවෙන්: යොහන් 14:16
එම්මාවුස් නගරයට යන මාර්ගයේදී: ලූක් 24:50-53
ස්වර්ගාරෝහණයට පෙර: ලූක් 24:50-53
උන්වහන්සේගේ අනුගාමිකයන් වෙනුවෙන්: යොහන් 17

## යාච්ඤාවේ මට්ටම්

සැමවිටම "සියලු යාච්ඤා වලින්" (එපිස 6:18) යාච්ඤා කරන ලෙස පාවුලුතුමා ඇදහිලිවතුන්ගෙන් ඉල්ලා සිටී. තවත් පරිවර්තනයක සඳහන් වන්නේ "සෑම ආකාරයේම යාච්ඤාවකින් යාච්ඤා කරන" ලෙසය. මෙය යොමු කෙරෙන්නේ විවිධ ආකාරයේ හා මට්ටමේ යාච්ඤාවලටය.

යාච්ඤාවේ තීව්‍රතා මට්ටම් තුනක් ඇත. ඒ ඉල්ලන්න, සොයන්න හා තට්ටුකරන්න යනුවෙනි.

> **ඉල්ලාපල්ලා, එවිට නුඹලාට දෙනු ලැබේ; සොයාපල්ලා, එවිට නුඹලාට සම්බ වේ; තට්ටුකරපල්ලා, එවිට නුඹලාට දොර හරිනු ලැබේ. මක්නිසාද ඉල්ලන්නාවූ සියල්ලන්ට ලැබේ; සොයන්නාට සම්බ වේ; තට්ටුකරන්නාට දොර හරිනු ලැබේ. (මතෙව් 7:7-8)**

යාච්ඤාවේ පළමු මට්ටම ඉල්ලන්න වේ. එය දෙවියන්වහන්සේගෙන් යම් ඉල්ලීමක් කිරීම හා සැනෙකින් ඊට පිළිතුරක් ලැබීමය. ලැබීම සඳහා අවශ්‍ය වන්නේ ඉල්ලීමය.

> **... නුඹලා නොඉල්ලන බැවින් නුඹලාට නොලැබෙන්නේය. (යාකොබ් 4:2)**

අපට ප්‍රබල ආත්මික ආයුධයක් තිබේ, ඒ යාච්ඤාවයි. එහෙත් බොහෝ දෙනෙක් එය ප්‍රයෝජනයට නොගනිති. ඔව්හු නොඉල්ලති, ඒ නිසා ඔවුන්ට නොලැබේ.

සෙවීම, යාච්ඤාවේ වඩාත් ගැඹුරු මට්ටමකි. මෙම මට්ටමේදී ඉල්ලීමේදී මෙන් සැනෙකින් පිළිතුරු නොලැබේ. 120 දෙනා උඩුමහල් මැදුරේ එක්රැස්වී නොනවත්වා යාච්ඤාවේ යෙදී සිටීම, සෙවීම සඳහා නිදසුනකි. මොවුන් ශුද්ධාත්මයාණන්වහන්සේ දෙන බවට දුන් පොරොන්දුව සම්පූර්ණ වීම සෙවූ අතර පිළිතුරු ලැබෙන තෙක් සෙවීමේ නිරත වූහ (ක්‍රියා 1-2).

තට්ටුකිරීම ඊටත් වඩා ගැඹුරු මට්ටමකි. එය, පිළිතුරු ලැබීම ප්‍රමාද වන විට නොනවත්වා කෙරෙන යාච්ඤාව වේ. එය ලූක් 11:5-10 යේසුස්වහන්සේ පැවසූ උපමා කතාවෙන් පැහැදිලි වේ. තට්ටුකිරීමේ මට්ටම, ආත්මික සටන් යාච්ඤාවේ ප්‍රබලතම මට්ටම වේ. දානියෙල්ගේ නොනවත්වා කළ උත්සාහයෙන් එය පෙන්නුම් කෙරේ. ප්‍රතිඵලයක් පේන තෙක් මානයේ නොතිබුණද, ඔහු නොනවත්වාම තට්ටු කළේය (දානියෙල් 10).

## යාච්ඤා වර්ග

ස්වාමින්වහන්සේ විසින් දෙන ලද යාච්ඤා ආකෘතිය (මතෙව් 6:9-13) මගින් පැහැදිලි වන පරිදි විවිධ වර්ගයේ යාච්ඤා ඇත. පහත දැක්වෙන්නේ ඉන් සමහරකි.

### 1. නමස්කාරය හා ප්‍රශංසාව

ඔබ දෙවියන්වහන්සේගේ අභිමුඛයට පැමිණෙන්නේ නමස්කාරයෙන් හා ප්‍රශංසා කිරීමෙනි.

> **ස්තුති කරමින් උන්වහන්සේගේ දොරටුවෙන් ඇතුල්ව, ප්‍රශංසා කරමින් උන්වහන්සේගේ මණ්ඩපවලට පැමිණෙමි. (ගීතාවලිය 100:4)**

නමස්කාරය යනු ගෞරව කිරීම හා භක්තිය වේ. ප්‍රශංසා කිරීම යනු ස්තුති කිරීම හා දෙවියන්වහන්සේ ඔබට කළ දේට පමණක් නොව , උන්වහන්සේ දෙවියන්වහන්සේ නිසා කෘතඥතාව පළ කිරීම වේ. ඔබ ආත්මයෙන්ද සැබෑකමින්ද දෙවියන්වහන්සේට නමස්කාර කළ යුතුය.

> **නුමුත් සැබෑ නමස්කාර කරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑකමෙන්ද පියාණන්වහන්සේට නමස්කාර කරන කාලය පැමිණෙන්නේය, දැනටම පැමිණ තිබේ. මක්නිසාද පියාණන්වහන්සේ තමන්ට නමස්කාර කරන්නන් වන පිණිස එබඳු වුවන් සොයනසේක. දෙවියන්වහන්සේ ආත්මයක්ය. උන්වහන්සේට නමස්කාර කරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑකමෙන්ද නමස්කාර කළ යුතුය. (යොහන් 4:23-24)**

ප්‍රශංසා කිරීම හා නමස්කාරය මෙසේ කළ හැකිය :

| | |
|---|---|
| ගී ගැයීමෙන් | ගීතාවලිය 9:2,11; 40:3; මාක් 14:26 |
| හඬ නගා ප්‍රශංසාවෙන් | ගීතාවලිය 103:1 |
| මොරගැසීමෙන් | ගීතාවලිය 47:1 |
| දෑත් එසවීමෙන් | ගීතාවලිය 63:4; 134:2; 1 තිමෝති 2:8 |
| අත්පුඩි ගැසීමෙන් | ගීතාවලිය 47:1 |
| සංගීත භාණ්ඩ වලින් | ගීතාවලිය 150:3-5 |
| නැගිට සිටීමෙන් | 2 ලේකම් 20:19 |
| නැවී වැඳීමෙන් | ගීතාවලිය 95:6 |
| නටමින් | ගීතාවලිය 149:3 |
| දණ නවමින් | ගීතාවලිය 95:6 |
| බිම දිගා වෙමින් | ගීතාවලිය 149:5 |

### 2. කැපවීම

මෙය ඔබගේ ජීවිතය හා කැමැත්ත දෙවියන්වහන්සේට කැප කිරීමේ යාච්ඤාවකි. ඊට පූජා වීමේ හා කැප වීමේ යාච්ඤා අන්තර්ගතය.

### 3. අයැදීම

අයැදීමේ යාච්ඤා ඉල්ලීම් වේ. ඉල්ලීම් කළ යුත්තේ උන්වහන්සේගේ ලිඛිත වචනයෙන් එළිදරව් වන පරිදි දෙවියන්වහන්සේගේ කැමැත්ත පරිදිය. අයැදීම් ඉල්ලීම, සෙවීම හෝ තට්ටු කිරීම යන ඕනෑම මට්ටමක තිබිය හැකිය. යැදීම්ද මේ ආකාරයේ යාච්ඤා වලට තවත් වචනයකි. යැදීම

යන්නෙහි තේරුම "දෙවියන්වහන්සේගෙන් ඉල්ලීම හෝ අවශ්‍යතාවක් වෙනුවෙන් උන්වහන්සේට කන්නලව් කිරීම" වේ.

## 4. පාපොච්චාරණය හා පශ්චාත්තාපවීම

පාපොච්චාරණයේ යාච්ඤාවක් යනු පශ්චාත්තාපවීමක් හා පාපය වෙනුවෙන් කමාව ඉල්ලීම වේ.

> **අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමා කරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර කරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටිනසේක. (1 යොහන් 1:9)**

## 5. මැදිහත් යාච්ඤාව

මැදිහත් යාච්ඤා යනු අන් අය වෙනුවෙන් කරන යාච්ඤාවකි. මැදිහත්කරුවෙකු යනු තවත් කෙනෙකුගේ තැනක් ගන්නා හෝ වෙනත් කෙනෙකු වෙනුවෙන් අයාචනා කරන හෝ තැනැත්තෙකි.

එක්තරා අවස්ථාවක දෙවියන්වහන්සේ පොළොව දෙස බැලූ බවත් එවිට මැදිහත්කරුවෙකු නොදුටු බවත් බයිබලයේ සඳහන් වේ.

> **උන්වහන්සේ කිසිවෙක් නැති බව දැක, මැදහත්කාරයෙක් නැති බැවින් පුදුම වූසේක. ඒ නිසා උන්වහන්සේගේම බාහුව තමන්වහන්සේට ගැළවීම ගෙනායේය; උන්වහන්සේගේම ධර්මිෂ්ඨකම උන්වහන්සේම ඉසුලුවේය. (යෙසායා 59:16)**

දෙවියන්වහන්සේ මැදහත්කාරයෙක් නුදුටු විට උන්වහන්සේ අවශ්‍යතාව සම්පූර්ණ කළසේක. උන්වහන්සේ යේසුස්වහන්සේ එවූසේක.

> **මක්නිසාද ඇත්තේ එක දෙවි කෙනෙක් සහ දෙවියන්වහන්සේටත් මනුෂ්‍යයන්ටත් අතරේ එක මැදහත්කාර කෙනෙකුත්ය. (1 තිමෝති 2:5)**

> **මැරුණෙත්, ඒ ඇර මළවුන්ගෙන් නැගුටුවනු ලැබුවෙත්, දෙවියන්වහන්සේගේ දකුණු පැත්තෙහි සිට අප උදෙසා මැදහත්කම් කරන්නෙත් ක්‍රිස්තුස්වහන්සේය. (රෝම 8:34)**

> **එබැවින් උන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේ වෙතට ළඟාවෙන්නන් උදෙසා මැදහත්කම් කරන පිණිස උන්වහන්සේ නිරතුරුවම ජීවත්වන හෙයින්, ඔවුන් කෙළවර දක්වාම ගළවන්ට උන්වහන්සේට පුළුවන. (හෙබ්‍රෙව් 7:25)**

> **මාගේ ප්‍රිය දරුවෙනි, මේ කාරණා නුඹලාට ලියා එවන්නේ නුඹලා පව් නොකරන පිණිසය. යමෙක් පව් කළොත් ධර්මිෂ්ඨ වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වන මැදහත්කාරයෙක් පියාණන්වහන්සේ වෙත අපට සිටිනසේක. (1 යොහන් 2:1)**

උසාවියක නීතිඥයෙක් තවත් කෙනෙකු වෙනුවෙන් ආයාචනා කරන නීති උපදේශකවරයෙකි. ආත්මික සටනේ මැදහත්වීමක් යනු තවත් කෙනෙකු වෙනුවෙන් දෙවියන්වහන්සේට යාච්ඤා කිරීම වේ. ඇතැම්විට අවබෝධයක් ඇතිව මැදහත්වීම සිදු කෙරේ. මැදහත්වීම සිදුකෙරෙන්නේ ඔහුගේම භාෂාවෙනි.

> **ඉතින් අප විසින් සියලු ආකාර භක්තියෙන් සහ සන්සුන්කමින් සමාදාන වූ නිශ්චල ජීවිතයක් ගත කරන පිණිස රජවරුන් හා උසස් තනතුරු දරන සියල්ලන් ඇතුළුව සියලු මනුෂ්‍යයන් උදෙසා ඉල්ලීම්ද යාච්ඤාද මැදහත්කම්ද ස්තුතිදීම්ද පවත්වන්ට සියල්ලන්ට පළමුවෙන් අවවාද කරමි. (1 තිමෝති 2:1-2)**

අනෙක් අවස්ථාවල මැදහත්කිරීම සිදු කෙරෙන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේ මගිනි. එය ඇතැම්විට විශාල ආත්මික බරක් නිසා ඇතිවන කෙඳිරිගෑම් සහිතව විය හැකිය. ඇතැම්විට එය නොදන්නා භාෂාවකින් විය හැකිය. එය ඇතැම්විට අනෙක් කෙනෙකු වෙනුවෙන් කෙරෙන මැදහත්වීමක් හෝ ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ වෙනුවෙන් කරන මැදහත්වීමක් හෝ විය හැකිය. මෙය සිදුවූ විට, ශුද්ධාත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුරූපව ඍජුවම දෙවියන්වහන්සේට

යාච්ඤා කරමින් ඔබ තුළින් කතා කරනු ඇත. මේ ආකාරයේ මැදහත්වීමකදී ඔබට සියල්ල නොතේරෙ[1].

> **එලෙසම, ආත්මයාණන්වහන්සේත් අපගේ දුර්වලකම් වලදී උපකාර කරනසේක. මක්නිසාද යුතු ලෙස යාච්ඤා කරන්ට අපි නොදනිමුව; නුමුත් ආත්මයාණන්වහන්සේම කිය නොහැකි කෙඳිරිගෑම් වලින් අපි උදෙසා මැදහත්කම් කරනසේක. (රෝම 8:26)**

## ආදර්ශක යාච්ඤාව

යේසුස්වහන්සේ මෙලොව සේවයේ යෙදී සිටියදී උන්වහන්සේගේ ගෝලයෝ වරක් උන්වහන්සේ වෙතට පැමිණ උද්යෝගමත් ප්‍රශ්නයක් ඇසුවෝය.

> **... ගෝලයන්ගෙන් එක්කෙනෙක් කතාකොට ස්වාමිනි ... අපටත් යාච්ඤා කරන්ට ඉගැන්නුව මැනවයි කිවේය. (ලූක් 11:1)**

දේශනා කරන්නේ හෝ හාස්කම් කරන්නේ හෝ කෙසේදැයි ගෝලයේ නොඇසූහ. නොබිඳෙන සම්බන්ඳතා ගොඩනැගීමට උගන්වන ලෙස නොකීහ. ශාරීරික සුව කිරීමේ හාස්කම ගැන නොඇසූහ. ඔවුන්ගේ ඉල්ලීම වූයේ යාච්ඤා කරන ආකාරය උගන්වන ලෙසය. මේ ආශාව ඇතිවූයේ කෙසේද? එය යේසුස්වහන්සේගේ ජීවිතයේ හා සේවයේ ඔවුන්ට දෘශ්‍යමාන වූ යාච්ඤාවේ ප්‍රතිඵල වේ. මෙම ආත්මික උපක්‍රමයේ ක්‍රියා වල ප්‍රබල ප්‍රතිඵල ගෝලයින් දැක තිබිණි.

ආදර්ශක යාච්ඤාව කියවා අප මෙහි සාකච්ඡා කරන විවිධාකාර යාච්ඤාවන් නිරීක්ෂණය කරන්න.

| | |
|---|---|
| ස්වර්ගයෙහි වැඩ සිටින අපගේ පියාණනි, ඔබගේ නාමයට ගෞරව වේවා. | ප්‍රශංසාව හා නමස්කාරය |
| ඔබගේ රාජ්‍යය ඒවා, ඔබගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් පොළොවෙහිද කරනු ලැබේවා. | කැපවීම |
| අපේ දවස්පතා භෝජනය අපට අද දුන මැනව. | ඉල්ලීම් |
| අපේ ණයකාරයන්ට අප කමා කළාක් මෙන් අපේ ණයත් අපට කමා කළ මැනව. | පාපොච්චාරණය, මැදහත්වීම |
| අප පරීක්ෂාවට නොපමුණුවා, නපුරාගෙන් අප ගැළෙව්ව මැනව. | ඉල්ලීම |
| මක්නිසාද රාජ්‍යයත්, බලයත්, මහිමයත් සදහටම ඔබවහන්සේගේය. | ප්‍රශංසාව හා නමස්කාරය |

## යාච්ඤා කරන ආකාරය

පහත දක්වා ඇති සෑම යොමුවක්ම ඔබගේ බයිබලයේ බලන්න. මේ බයිබල් පාඨ යාච්ඤා කරන ආකාරය ඔබට උගන්වනු ඇත.

- යාච්ඤාව දෙවියන්වහන්සේට කළ යුතුය: ගීතාවලිය 5:2
- හිස් පුනරුක්තිය නොකළ යුතුය, එහෙත් උනන්දුවෙන් කරන පුනරුක්තිය තිබිය හැකිය: මතෙව් 6:7; දානියෙල් 6:10; ලූක් 11:5-13; 18:1-8
- අන් අය වෙනුවෙන් යාච්ඤා කිරීම අතපසු කිරීමෙන් ඔබ පව් කරනු ඇත: 1 සාමුවෙල් 12:23
- අවබෝධයෙන් යුතුව යාච්ඤා කරන්න (තමාගේම භාෂාවෙන්): එපීස 6:18
- ආත්මයෙන් යාච්ඤා කරන්න: රෝම 8:26; ජුද් 20
- දේව කැමැත්තට අනුකූලව යාච්ඤා කරන්න: 1 යොහන් 5:14-15
- රහසිගතව යාච්ඤා කරන්න: මතෙව් 6:6

- ප්‍රමාණාත්මක බව නොව ගුණාත්මක බව අවධාරණය කෙරේ. බොහෝ සේ කතා කිරීම නිසා යාච්ඤාව සාර්ථක නොවේ: මතෙව් 6:7
- සෑමවිටම යාච්ඤා කරන්න: ලූක් 21:36; එපීස 6:18
- අඛණ්ඩව යාච්ඤා කරන්න: රෝම 12:12
- නොනවත්වා යාච්ඤා කරන්න: 1 තෙසලෝනික 5:17
- පියාණන්වහන්සේට, යේසුස්වහන්සේගේ නාමයෙන් යාච්ඤා කරන්න: යොහන් 15:16
- පිබිදී සිටීමේ ආකල්පයක් ඇති කරගන්න: 1 පේතෘස් 4:7
- ආදර්ශ යාච්ඤාව නිදර්ශකයක් ලෙස ගන්න: මතෙව් 6:9-13
- සමාව දීමේ ආත්මයකින් යාච්ඤා කරන්න: මාක් 11:25
- නිහතමානීව යාච්ඤා කරන්න: මතෙව් 6:7
- ඇතැම් අවස්ථාවල නිරාහාරව යාච්ඤා කරන්න: මතෙව් 17:21
- ඉතා ළැදිව යාච්ඤා කරන්න: යාකොබ් 5:16; කොලොස්සි 4:12
- දෙවියන්වහන්සේට යටත් වෙමින් යාච්ඤා කරන්න: ලූක් 22:42
- යාච්ඤාවේදී බැඳීමේ හා මිදීමේ උපක්‍රමික භාවිතා කරන්න: මතෙව් 16:19

## ඔබ කුමක් වෙනුවෙන් යාච්ඤා කළ යුතුද?

- යෙරුසලමේ සාමය: ගීතාවලිය 122:6
- අස්වැන්න නෙළන කම්කරුවන්: මතෙව් 9:38
- පරීක්ෂාවට නොවැටෙන පිණිස: ලූක් 22:40-46
- ඔබව අවමානය සඳහා යොදාගන්නවුන් (ඔබගේ සතුරන්): ලූක් 6:28
- සියලු ශාන්තුවරුන්: එපීස 6:18
- රෝගී වූවන්: යාකොබ් 5:14
- එකිනෙකා වෙනුවෙන් (අනෙක් කෙනාගේ බර කරට ගනිමින්): යාකොබ් 5:16
- සියලු මනුෂ්‍යයන්නී රජවරුන් හා සියලු බලධාරීන් සඳහා: 1 තිමෝති 2:1-4
- අපගේ දෛනික අවශ්‍යතාවන් සඳහා: මතෙව් 6:11
- ප්‍රඥාව සඳහා: යාකොබ් 1:5
- සුවවීම සඳහා: යාකොබ් 5:14-15
- සමාව සඳහා: මතෙව් 6:12
- දෙවියන්වහන්සේගේ කැමැත්ත හා දේවරාජ්‍යය පිහිටුවීම සඳහා: මතෙව් 6:10
- දුකින් මිදීම සඳහා: යාකොබ් 5:13

## පොරොන්දු ගැන යාච්ඤා කරන්න

**නුඹලා නොඉල්ලන නුමුත්, නුඹලාගේ තෘෂ්ණා ගැන වියදම් කරන පිණිස වැරදි ලෙස ඉල්ලන බැවින් ලැබෙන්නේ නැත. (යාකොබ් 4:3)**

දෙවියන්වහන්සේ යාච්ඤා වලට පිළිතුරු දෙන්නේ උන්වහන්සේගේ පොරොන්දු පරිදිය. මෙම පොරොන්දු පදනම් කරගෙන ඔබ නොඉල්ලන විට, ඔබගේ යාච්ඤා වලට පිළිතුරු නොලැබේ. මෙය පියෙකු හා දරුවෙකු අතර සම්බන්ධතාවට සමානය. ළමයින් ඉල්ලන ඕනෑම දෙයක් දීමට දෙමාපියන් සූදානම් නැත. ඔහු ඇතැම් දේ කරන බවටත් තවත් සමහර දේ නොකරන බවටත් පැහැදිලි කර දෙයි. මේ සීමාවන් අතර පියා තම දරුවන්ගේ ඉල්ලීම් ඉටු කර දෙන්නේය.

දෙවියන්වහන්සේ හා සමඟද එසේම වේ. යාච්ඤාවේ නිවැරදි පදනම උන්වහන්සේගේ පොරොන්දු මගින් සැකසේ. දෙවියන්වහන්සේ පොරොන්දු වී ඇති දේ දැනගෙන ඒ අනුව යාච්ඤා කරන්න. මෙය කිරීමට එක් හොඳ ක්‍රමයක් නම්, බයිබලය අධ්‍යයනය කරමින් ඒ සියලු පොරොන්දු ලකුණු කරන්න. යාච්ඤා කරන විට, ඔබගේ එම බයිබලය භාවිතා කරමින් ඒ පොරොන්දු පදනම් කරගෙන යාච්ඤා කරන්න.

## යාච්ඤාවට ඇතිවන බාධා

ඔබගේ යාච්ඤාවට බාධා ඇති කෙරෙන සමහර දේ මෙසේ වේ:

- ඕනෑම ආකාරයක පාප: යෙසායා 59:1-2; ගීතාවලිය 66:18; යෙසායා 1:15; හිතෝපදේශ 28:9

- සිත්වල ඇති දේවරූප: එසකියෙල් 14:1-3
- කමාව නොදෙන ආත්මයක්: මාක් 11:25; මතෙව් 5:23
- ආත්මාර්ථකාමී බව, වැර චේතනාවන්: හිතෝපදේශ 21:13; යාකොබ් 4:3
- බලයට ඇති කෑදරකම, තම වාසියට සකස් කළ යාච්ඤාවන්: යාකොබ් 4:2,3
- විවාහ වූ සහකරුට / සහකාරියට වැරදි ලෙස සැලකීම: 1 පේතෘස් 3:7
- තමා ධර්මිෂ්ඨකම: ලූක් 18:10-14
- අවිශ්වාසය: යාකොබ් 1:6-7
- ක්‍රිස්තුස්වහන්සේ හා උන්වහන්සේගේ වචනය මත නොපැවතීම: යොහන් 15:7
- අනුකම්පාව නොමැති වීම: හිතෝපදේශ 21:13
- කෙරාටිකකමණී උඩඟුකම, තේරුමක් නැති පුනරුක්තිය: මතෙව් 6:5; යෝබ් 35:12-13
- දේව කැමැත්ත අනුව නොඉල්ලීම: යාකොබ් 4:3
- යේසුස්වහන්සේගේ නාමයෙන් නොඉල්ලීම: යොහන් 16:24
- යක්ෂයාගේ බාධා: දානියෙල් 10:10-13; එපීස 6:1
- පළමුව දේවරාජ්‍යය නොසෙවීම: ඔබට අනෙක් දේ පොරොන්දු වන්නේ ඔබ පළමුව දේව රාජ්‍යය සෙවූ විට වේ: මතෙව් 6:33
- ඔබගේ ඉල්ලීම් නොදෙන්නේ දෙවියන්වහන්සේට ඊට වඩා උසස් පරමාර්ථයක් ඇති බැවිනි: 2 කොරින්ති 12:8-9
- ඔබ යාච්ඤා කළ යුතු ආකාරයට යාච්ඤා කිරීමට නොදන්නා විට යාච්ඤාවට බාධා ඇති වේ. ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ තුළින් යාච්ඤා කිරීම වැදගත් වන්නේ එබැවිනි: රෝම 8:26

## යාච්ඤා නොකළ යුතු අවස්ථාව

ක්‍රියා කිරීමට පෙර ස්වාමින්වහන්සේගේ මගපෙන්වීම ලැබෙන තෙක් යාච්ඤාවෙන් සිටිය යුතු ආකාරය දැනගැනීම වැදගත් වේ. එමෙන්ම යාච්ඤා නොකළ යුතු අවස්ථාව දැනගැනීමද ඒ හා සමානව වැදගත්ය. දෙවියන්වහන්සේ ඔබට ක්‍රියා කිරීමට කැඳවූ විට ඔබ ක්‍රියා කළ යුතුය - අවශ්‍ය යාච්ඤාවෙන් සිටීම නොවේ.

නිදසුනක් ලෙස මාරා හි තිත්ත වතුර තිබූ තැන මෝසෙස් දෙවියන්වහන්සේට මොර ගැසුවේය. වතුර රස කිරීමට කළ යුතු දේ දෙවියන්වහන්සේ ඔහුට පෙන්වූසේක. එහිදී ස්වාමින්වහන්සේට තවදුරටත් යාච්ඤා කරමින් සිටීම අවශ්‍ය නැත. දෙවියන්වහන්සේ එළිදරව් කළ ලෙස මෝසෙස් ක්‍රියා කළ යුතු වේ. ආයි හිදී ඉශ්‍රායලයේ පරාජය පිළිබඳව යෝෂුවාගේ යාච්ඤාවේදීද මෙය සත්‍ය වේ. ඉශ්‍රායෙල් ජනතාව අතර පාපය ඇති බව දෙවියන්වහන්සේ එළිදරව් කළසේක. උන්වහන්සේ යෝෂුවාට පැවසුවේ:

> **නැගිටින්න, මක්නිසාද මෙසේ මුහුණින් වැතිර ඉන්නෙහිද? ඉශ්‍රායෙල්වරු පව් කළෝය ... නැගිට සෙනග පවිත්‍ර කරපන්න. (යෝෂුවා 7:10,11,13 පදවල කොටස්)**

එය යාච්ඤා කිරීමේ වේලාව නොවේ. එය යාච්ඤාව මගින් දුන් මගපෙන්වීම අනුව ක්‍රියා කළ යුතු වේලාවය. ඇතැම් අය දෙවියන්වහන්සේ පැවසූ ආකාරයට ක්‍රියා කිරීමෙන් හා අවශ්‍ය කටයුතු කිරීමෙන් වැළකී සිටීමට යාච්ඤාව භාවිතා කරති. ඇතැම් අය දෙවියන්වහන්සේ පිළිතුරු දුන් පසුත් යාච්ඤා කරති. ඒ, ඔවුන් එම පිළිතුරට අකමැති බැවිනි. ගණන් කතාව 22 බාලාම්ගේ කතාව කියවන්න. විශේෂයෙන්ම 18-19 පද බලන්න. එම කරුණම සමග දෙවියන්වහන්සේ වෙතට යැමට බාලාම්ට කිසිදු අයිතියක් නොතිබිණි, මක්නිසාද ඒ දෙය නොකරන ලෙස දෙවියන්වහන්සේ ඔහුට කී බැවිනි (12 පදය).

## යාච්ඤාව නිරාහාරව සිටීම හා සම්බන්ධ කිරීම

නිරාහාරව සිටීම හා එකට ගත් කල යාච්ඤාව තවත් බලවත් වේ. නිරාහාරව සිටීම යනු සරලවම ගත් කල ආහාර නොගෙන සිටීමය.

### නිරාහාරව සිටීමේ ක්‍රම

බයිබලයට අනුව නිරහාරව සිටීමේ ක්‍රම දෙකක් ඇත. සම්පූර්ණ නිරහාර ක්‍රමය නම්, ඔබ කිසිවක් නොකා නොබී සිටීමය. මේ පිළිබඳ නිදසුනක් ක්‍රියා 9:9හි ඇත. අර්ධ නිරහාර ක්‍රමය නම්, ආහාර සීමා කිරීමය. මේ පිළිබඳ නිදසුනක් දානියෙල් 10:3හි තිබේ.

## ප්‍රසිද්ධව හා පුද්ගලිකව නිරාහාරව සිටීම

නිරාහාරව සිටීම දෙවියන්වහන්සේ හා පුද්ගලයෙකු අතර ඇති පෞද්ගලික කරුණකි. එය අප්‍රසිද්ධියේ කළ යුතු අතර එය පුරසාරම් දෙඩීමට හේතුවක් නොවේ.

> **තවද නුඹලා නිරාහාරයෙන් ඉන්න කල්හි වංචාකාරයන් මෙන් දුක්ඛිත මුහුණක් ඇතුව නොසිටිල්ලා. ඔව්හු නිරාහාරයෙන් ඉන්න බව මනුෂ්‍යයන්ට පෙනෙන පිණිස තමුන්ගේ මුහුණු විරූප කරගනිති. සැබවක් නුඹලාට කියමි: ඔවුන්ගේ විපාකය ඔවුන්ට ලැබී තිබේ. නුමුත් නුඹ නිරාහාරයෙන් ඉන්න කල්හි රහසිගතව වසන නුඹේ පියාණන්වහන්සේට මිස නුඹ නිරාහාරයෙන් ඉන්න බව මනුෂ්‍යයන්ට නොපෙනෙන පිණිස නුඹේ හිසේ තෙල් ගා, මුහුණ සෝදා ගනින්න. එවිට රහසින් දකින නුඹේ පියාණන්වහන්සේ නුඹට විපාක දෙනසේක. (මතෙව් 6:16-18)**

මුළු සභා සමූහයටම නිරාහාරව සිටින සේ සභා නායකයන්ට ප්‍රසිද්ධියේ ඉල්ලීමට පුළුවන.

> **සියොන්හි හොරණෑව පිඹ, ශුද්ධ වූ උපවාසයක්ද රැස්වීමක්ද ප්‍රසිද්ධ කරන්න. (යෝවෙල් 2:15)**

## නිරාහාරව සිටීමේ පරමාර්ථ

නිරාහාරව සිටීම සඳහා සුවිශේෂී ආත්මික පරමාර්ථ තිබේ. මේවා අවබෝධ කරගැනීම වැදගත්ය, මක්නිසාද වැරදි දෙයක් සඳහා නිරාහාරව සිටියහොත් එය අසාර්ථක වනු ඇත. නිරාහාරව සිටීමේ පරමාර්ථ පිළිබඳව පහත දැක්වෙන යොමු කිරීම අධ්‍යයනය කරන්න. ආත්මික සටනේදී නිරාහාරව සිටීමේ මහත් වූ බලය ඒවා මගින් එළිදරව් වේ. ඔබ නිරාහාරව සිටින්නේ:

- නිහතමානී වීමටය: ගීතාවලිය 35:13; 69:10
- පාපය සඳහා පසුතැවිලි වීමටය: යෝවෙල් 2:12
- එළිදරව් ලබාගැනීම සඳහා: දානියෙල් 9:2; 3:21-22
- දුෂ්ඨකමේ විලංගු මුදාහැරීමට, මහා බර ඉවත් කිරීමට, පීඩාවට පත්වූවන් නිදහස් කිරීමට හා සියලු බන්ධන බිඳ දැමීමට වේ: යෙසායා 58:6
- දුප්පතුන්ට ශාරීරික හා ආත්මික ආහාර සැපයීමටය: යෙසායා 58:7
- දෙවියන්වහන්සේ අපව අසන පිණිස: 2 සාමුවෙල් 12:16-22; යෝනා 3:5,10

නිරාහාරව සිටීමෙන් දෙවියන්වහන්සේ වෙනස් නොවේ. එය ඔබ වෙනස් කරයි. ඔබ දෙවියන්වහන්සේ හා සමග ඇති සම්බන්ධතාව අනුව උන්වහන්සේ ඔබට ප්‍රකාශ වනසේක. ඔබ වෙනස් වූ විට දෙවියන්වහන්සේ ඔබ සමග කටයුතු කරන ආකාරය කෙරෙහි බලපෑමක් ඇති වේ. ඔබ නිරාහාරව සිටින්නේ දෙවියන්වහන්සේ වෙනස් කිරීමට නොවේ. මන්ද දෙවියන්වහන්සේ වෙනස් නොවන බැවිනි. එහෙත් උන්වහන්සේ ඔබ සමග කටයුතු කරන ආකාරය නිරාහාරව සිටීම නිසා වෙනස්වනු ඇත. නිදසුනක් සඳහා යෝනා පොත කියවන්න.

## නිරාහාරව සිටීමේ කාලයේ ප්‍රමාණය

ඔබ නිරාහාරව සිටින කාලය, දෙවියන්වහන්සේ ඔබගේ ආත්මයට පවසන දේ මත රඳා පවතී. කෙටි කාලයක් හෝ දිගු කාලයක් හෝ නිරාහාරව සිටීමට උන්වහන්සේ ඔබට මගපෙන්වනු ඇත. ඒසව් හා යාකොබ්ගේ කතාන්දරය ඔබට මතකද? යාකොබ් ආහාර වේලක් පිළියෙල කළේ ඔහුට කෑමටය. එහෙත් කුළුඳුල්කමේ උරුමය ලබාගැනීම සඳහා ඔහු එය කෑවේ නැත. ඒසව් ඒ ආහාර වේල නොගෙන සිටියේ නම්, කෙතරම් යහපතක්ද!

## ස්වයං-පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. ඇදහිලිවතුන්ගේ ජීවිත තුළ දෙවියන්වහන්සේගේ බලය නිදහස් කෙරෙන මූලධර්ම දෙක මොනවාද?

_______________ සහ _______________

3. මේ පාඩමේ සාකච්ජා කළ යාච්ඤාවේ මට්ටම් තුන කවරේද?

4. ආදර්ශ යාච්ඤාවෙන් පැහැදිලි කෙරෙන යාච්ඤා වර්ග ලයිස්තුගත කරන්න.

5. මේ පරිච්ජේදයේ සාකච්ජා කරන ලද යාච්ඤාවට ඇතිවන බාධා ලයිස්තුගත කරන්න.

6. යාච්ඤාව අර්ථ විග්‍රහ කරන්න.

7. නිරාහාරව සිටීම අර්ථ විග්‍රහ කරන්න.

8. නිරාහාරව සිටීමේ ක්‍රම දෙක මොනවාද?

_______________ සහ _______________

9. නිරාහාරව සිටීමේ පරමාර්ථය සාරාංශගත කරන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ජේදය අවසානයේ පරීක්ෂණ වලට පිළිතුරු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. යාච්ඤා වලට පිළිතුරු දෙනු ලබන්නේ:

- ක්ෂණිකව විය හැකිය — යෙසායා 65:24; දානියෙල් 9:21-23
- පසු වී විය හැකිය — ලූක් 18:7
- අපගේ ආශාවන්ට වෙනස්ව විය හැකිය — 2 කොරින්ති 12:8-9
- අපගේ බලාපොරොත්තු වලට වඩා විය හැකිය — යෙරමියා 33:3; එපීස 3:20

මතක තබාගන්න: ගෙත්සෙමන උයනේදී යේසුස්වහන්සේ කළ යාච්ඤාවෙන් දෙවියන්වහන්සේගේ කැමැත්ත වෙනස් වූයේ නැත. එහෙත් ඉන් දෙවියන්වහන්සේගේ කැමැත්ත පැහැදිලි විය (හෙබ්‍රෙව් 5:7-9). අපගේ යාච්ඤා වලට පිළිතුරු නොලැබෙන්නේ, අපට අවශ්‍ය ආකාරයට පිළිතුරු දෙනු නොලබන බැවිනි. පිළිතුරු නොලද යාච්ඤා ලෙස අප සිතන ඒවා බොහෝවිට උසස් පරමාර්ථයන් වෙත ගෙන යයි.

2. ස්වාමින්වහන්සේගේ යාච්ඤාවේ ආකාරයට අප යාච්ඤා කළ විට එමගින් නිවැරදි ආකල්ප දිරිගැන්වේ.

| අප යාච්ඤා කරන විට... | අප පෙන්නුම් කරන්නේ ... |
|---|---|
| ස්වර්ගයෙහි වැඩ සිටින අපගේ පියාණනි | ළමයෙකුගේ වැනි ආකල්පයක් |
| ඔබගේ නාමයට ගෞරව වේවා | ගරු කිරීමේ ආකල්පයක් |
| ඔබගේ රාජ්‍යය ඒවා | බලාපොරොත්තු වීමේ ආකල්පයක් |
| ඔබගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් පොළොවෙහිද කරනු ලැබේවා. | යටත්වීමේ ආකල්පයක් |
| අපේ දවස්පතා භෝජනය අපට අද දුන මැනව | විශ්වාසයේ ආකල්පයක් |
| අපේ ණයකාරයන්ට කමා කළාක් මෙන් | කමාව දීමේ ආකල්පයක් |
| අපේ ණය අපට කමා කළ මැනව | පශ්චාත්තාපවීමේ ආකල්පයක් |
| පරීක්ෂාවට නොපමුණුවා නපුරාගෙන් අප ගළවාගත මැනව | ජයග්‍රාහි ආකල්පයක් |
| රාජ්‍යයත්, බලයත්, මහිමයත් ඔබවහන්සේගේය | නමස්කාරයේ ආකල්පයක් |

3. යාකොබ් 5:17-18 කියවන්න. මෙය බලය හා ඇදහිල්ල සඳහා වූ ආදර්ශ යාච්ඤාවකි.

- එය දෙවියන්වහන්සේගේ සුවිශේෂී පොරොන්දුවක් මත පදනම් වේ: 1 රාජාවලිය 18:1
- එය පොරොන්දුවේ කොන්දේසි සපුරාලයි: 1 රාජාවලිය 18:2
- අහිතකර වාර්තා තිබියදීත් ඔහු උත්සාහය අත් නොහැරියේය: 1 රාජාවලිය 18:43

4. බයිබලයේ සඳහන් පහත දැක්වෙන ප්‍රබල යාච්ඤාවන් සඳහා උදාහරණ අධ්‍යයනය කරන්න.

## උත්පත්ති

යාච්ඤා ඉතිහාසයේ ආරම්භය: 4:26
ආත්මික වර්ධනය සහ යාච්ඤාව: 5:21-24
අල්තාරය සහ යාච්ඤාව: 12-13
උරුමක්කාරයෙක් උදෙසා යාච්ඤාව: 15
යාච්ඤාව, මොරගැසීමේ භාෂාව: 16
යාච්ඤාව සහ එළිදරව්ව: 17
දුෂ්ට වූ නගරයක් උදෙසා යාච්ඤාව: 18-19
කාලයකට පසු යාච්ඤාව: 20
කීකරුකමේ යාච්ඤාව: 22
භාර්යාවක් උදෙසා යාච්ඤාව: 24
වඳ භාර්යාවක් උදෙසා යාච්ඤාව: 25:19-23
යාච්ඤාව නොයෙක් දේවල් වෙනස් කරයි: 26
යාච්ඤාව පොරොන්දුවක් ලෙස: 28
වැරදි කළ සහෝදරයෙක් ගැන යාච්ඤාව: 32

යාච්ඤාව, සැඟවුනු ගින්න: 39-41; 45:5-8; 50:20,24
ගෝත්‍ර වෙනුවෙන් ආශිර්වාද උදෙසා යාච්ඤාව: 48-49

## නික්මයාම

යාච්ඤාව කෙඳිරියක් ලෙස ප්‍රකාශ කිරීම: 1-2
යාච්ඤාව දෙබසක් ලෙස: 3-4
යාච්ඤාව චෝදනාවක් ලෙස: 5-7
සර්වබලධාරී තැනැන්වහන්සේ සමග සම්බන්ධව යාච්ඤා කිරීම: 8-10
යාච්ඤාව ප්‍රශංසාවක් ලෙස: 15
උපද්‍රව අවස්ථාවක යාච්ඤාව: 17
අවශ්‍යතා ඇති අයගේ යාච්ඤාව: 22:22-24
ලැබිය යුතු විනිශ්චයේ ප්‍රමාදය උදෙසා යාච්ඤාව: 32
ඉශ්‍රායෙල් උදෙසා මෝසෙස්ගේ පළමු යාච්ඤාව: 32:9-14
මෝසෙස්ගේ දෙවන යාච්ඤාව: 32:30-34
මෝසෙස්ගේ තෙවන යාච්ඤාව: 33:12-23
යාච්ඤාව සහ රූප විපර්යාසය: 34

## ගණන් කථාව

යාච්ඤාව ආශිර්වාදයක් ලෙස: 6:24-27
සුරක්ෂිතබාවය හා ආරක්ෂාව උදෙසා යාච්ඤාව: 10:35-36
විනිශ්චයෙන් මිදීම උදෙසා යාච්ඤාව: 11:1-2
අධෛර්යමත් වූ හදවතේ යාච්ඤාව: 11:10-35
මෘදු මනුෂ්‍යයෙකුගේ යාච්ඤාව: 12
දිව්‍යමය ගෞරවය එසවීම සඳහා යාච්ඤාව: 16
කැරලිගැසීමට එරෙහිව දිව්‍ය ක්‍රියා උදෙසා යාච්ඤාව: 16
මරණයෙන් මිදීම උදෙසා යාච්ඤාව: 21
යාච්ඤාව සහ අනාගතවාක්‍ය: 23-24
නව නායකයෙක් උදෙසා යාච්ඤාව: 27

## ද්විතිය කථාව

වරප්‍රසාද ලත් කාර්යයක් උදෙසා යාච්ඤාව: 3:23-29
සමීප කෙනෙක් උදෙසා යාච්ඤාව: 4:7
විනිශ්චය අත් සිටුවීම උදෙසා යාච්ඤාව: 9:20, 26-29
ආශිර්වාදයක් ලෙස යාච්ඤාව: 21:6-9
ස්තුතිදීමක් ලෙස යාච්ඤාව : 26
යාච්ඤාව ගීතයක් ලෙස: 32-33

## යෝෂුවා

යාච්ඤාව අභියෝගයක් ලෙස: 5:13-15
දෙවියන්වහන්සේ පිළිතුරු නොදෙන යාච්ඤාව: 7
නරක ප%තිඵල නිසා නෙිසලකා හ×න ලද යාච්ඤාව: 9:14
හාස්කමක් සිදුකරන යාච්ඤාව: 10

## විනිශ්චයකාරයන්ගේ පොත

මගපෙන්වීමක් උදෙසා යාච්ඤාව: 1
යුද වකවානුවක යාච්ඤාව: 4-5
ලකුණු උදෙසා යාච්ඤාව: 6
විපත්ති අවස්ථාවල යාච්ඤාව: 10:10-16
වැඩි වාසි ඉල්ලා යාච්ඤාව: 11:30-40
නොඉපදුනු ළමයෙකු ලෙස යාච්ඤාව: 13

මරණය අභිමුඛයේ යාච්ඥාව: 16:28-31
ඍජුව පිළිතුරු ලැබූ යාච්ඥාව: 20:23-28
නැතිවූ ගෝත්‍රයකට යාච්ඥාව: 21:2-3

## 1 සාමුවෙල්

වචන රහිත යාච්ඥාව: 1
දිවැසිවර පෙනුමක් ඇති යාච්ඥාව: 2:1-10
ශුද්ධ භූමියේ යාච්ඥාව: 3
දේශයේ අර්බුධ අවස්ථාවේ යාච්ඥාව: 7
රජතුමෙකු වෙනුවෙන් යාච්ඥාව: 8
නිෟස් කි×ම වෙනුවෙන් යාච්ඥාව: 12
වේදනාවට පත් රජතුමෙකුගේ යාච්ඥාව: 14
දුක්වෙන හදවතකට යාච්ඥාව: 15:11
සිහින් හඬක් මෙන් යාච්ඥාව: 16:1-12
ධෛර්යයේ රහස ලෙස යාච්ඥාව: 17
සොයාබැලීම සඳහා කෙරෙන යාච්ඥාව: 23
බිහිරි කන් සඳහා යාච්ඥාව: 28:7
යුද්ධයෙන් කොල්ලකා ගත් දේ වෙනුවෙන් යාච්ඥාව: 30

## 2 සාමුවෙල්

හිමිකම් සඳහා යාච්ඥාව: 2:1
ජයග්‍රාහික ලකුණු වෙනුවෙන් යාච්ඥාව: 5:19-25
නිවෙසක් හා රාජධානියක් සඳහා ආශිර්වාද කෙරෙන යාච්ඥාව: 7:18-29
රෝගී දරුවෙකුට කරන යාච්ඥාව: 12
ව්‍යාජ ලෙස යාච්ඥාව: 5:7-9
පීඩාවන් අවබෝධ කරගැනීමේ යාච්ඥාව: 21:1-12
ගීතිකාවක් ලෙස යාච්ඥාව: 22
උඩඟුකම ගැන පාපොච්චාරණය කෙරෙන යාච්ඥාව: 24:10-17

## 1 රාජාවලිය

ප්‍රඥාවන්ත හදවතක් සඳහා යාච්ඥාව: 3
කැපවීමේ යාච්ඥාව: 8:12-61
වියළි අතක් සඳහා යාච්ඥාව: 13:6
වැසුනු අහසක් සඳහා යාච්ඥාව: 17
මියගිය දරුවෙකු නැවත නැගුටුවීම සඳහා යාච්ඥාව: 17:20-24
දිව්‍යමය ගෞරවයක් සඳහා යාච්ඥාව:  18:16-41
නොපසුබට උත්සාහයක් සඳහා යාච්ඥාව: 18:45
මරණය සඳහා යාච්ඥාව: 19

## 2 රාජාවලිය

මියගිය දරුවෙකු සඳහා යාච්ඥාව: 4:32-37
දර්ශනයක් සඳහා යාච්ඥාව: 6:13-17
උඩඟු සතුරෙකු මුදවා ගැනීමේ යාච්ඥාව: 19
දිගු ජීවිතයක් සඳහා යාච්ඥාව: 20:1-11

## 1 ලේකම්

ආත්මික සමෘධිය සඳහා යාච්ඥාව: 4:9-10
විශ්වාසය සඳහා යාච්ඥාව: 5:20
බිය සඳහා යාච්ඥාව: 13:12
ගිවිසුම පිහිටුවීම සඳහා යාච්ඥාව: 17:16-27

ගින්නෙන් පිළිතුරු ලද යාච්ඤාව: 21
මුරකරු සඳහා යාච්ඤාව: 23:30
දීම සඳහා යාච්ඤාව: 29:10-19

## 2 ලේකම්

ජාතික අනතුරකදී යාච්ඤාව: 14:11
ප්‍රතිසංස්කරණය සඳහා යාච්ඤාව: 15
ඉතිහාසයට ආයාචනා කිරීම හා යාච්ඤාව: 20:3-13
පශ්චාත්තාපයේ යාච්ඤාව: 33:13

## එස්රා

තුති දීමේ යාච්ඤාව: 7:27-28
නිරාහාරව සිටීම හා යාච්ඤාව: 8:21-23
පාපොච්චාරණය කිරීමේ යාච්ඤාව: 9:5-10:4

## නෙහෙමියා

සිත්තැවුල සඳහා යාච්ඤාව: 1:4-11
අසීරු අවස්ථාවක යාච්ඤාව: 2:4
දෝෂාරෝපණය සඳහා යාච්ඤාව: 4:1-6
කේන්තිය ජයගැනීමේ යාච්ඤාව: 4:7-9
ප්‍රතිස්ථාපනය සඳහා යාච්ඤාව: 5
කපටිකමට විරුද්ධව යාච්ඤාව: 6:9-14
වචනය හා යාච්ඤාව: 8:1-13
දෙවියන්වහන්සේගේ යහපත්කම සඳහා යාච්ඤාව: 9
මතක තබාගැනීම සඳහා යාච්ඤාව: 13:14,22,29,31

## යෝබ්

ඉල්ලා අස්වීම සඳහා යාච්ඤාව: 1:20-22
අනුකම්පාව සඳහා යාච්ඤාව: 6:8-9; 7:17-21
සාධාරණීකරණය සඳහා යාච්ඤාව: 9
අසාධාරණයට එරෙහිව යාච්ඤාව: 10
දුරාචාරය පෙන්වීම සඳහා යාච්ඤාව: 14:13-22
ලාභය හා යාච්ඤාව: 21:14-34
හේතු දැක්වීම හා යාච්ඤාව: 23
සුළි සුළඟකින් පිළිතුරු ලද යාච්ඤාව: 38
පාපොච්චාරණය කිරීමේ යාච්ඤාව: 40:3-5; 42:1-6
මැදහත් යාච්ඤාව: 42:7-10

## ගීතාවලිය

කැරලිකාරුකමෙන් උපන් යාච්ඤාව: 3
ශුද්ධවන්තකමේ යාච්ඤාව: 4
උදෑසන යාච්ඤාව: 5
දිව්‍යමය ක්‍රියාවන් සඳහා යාච්ඤාව: 7
දිව්‍යමය ක්‍රියාවන්ට ප්‍රශංසා කිරීම සඳහා යාච්ඤාව: 8
දැනුත් මතුවටත් ආරක්ෂාව සඳහා යාච්ඤාව: 16
කුරුසියේ යාච්ඤාව: 22
එඬේර රැකවරණය සඳහා යාච්ඤාව: 23
දිව්‍යමය මහිමය සඳහා යාච්ඤාව: 24
දෙවියන්වහන්සේට නැගීම සඳහා යාච්ඤාව: 25
ඇදහිලිමත් හදවතක යාච්ඤාව: 27

ක්‍රිස්තුස්වහන්සේගේ පුද්ගලයකු= ලෙස යාච්ඤාව: 31
කෘතඥතාපූර්වක ආත්මයක් සඳහා යාච්ඤාව: 32
සතුරන්ගෙන් ආරක්ෂා වීම සඳහා යාච්ඤාව: 35
ප්‍රේමණීය කරුණාවන්තකම සඳහා ප්‍රශංසා කිරීමේ යාච්ඤාව: 36
වන්දනාකරුවෙකුගේ යාච්ඤාව: 39,90,91
යාච්ඤාව හා ප%තිMල : 40
සිත්තැවුල ඇතිවීමේදී යාච්ඤාව: 41
බලාපොරොත්තුවේ දොරටුවක් ලෙස යාච්ඤාව: 42-43
දිව්‍යමය උපකාරය සඳහා යාච්ඤාව: 44
පිළිසරණය සඳහා යාච්ඤාව: 46
බිඳුනු හදවතක් සඳහා යාච්ඤාව: 51
සෑම කාලයකටම යාච්ඤාව: 55
සිත්තැවුල සඳහා යාච්ඤාව: 57
විශ්වාස සඳහා යාච්ඤාව: 71
දෙවියන්වහන්සේ වෙනුවෙන් යාච්ඤාව: 73
දෙවියන්වහන්සේගේ මහිමය සඳහා ප්‍රශංසා කිරීමේ යාච්ඤාව: 96
පරීක්ෂාවන්ගෙන් බේරීම සඳහා යාච්ඤාව: 102-103, 105
සිහිකිරීමේ යාච්ඤාව: 106
මුහුදේ විනාශයට පත්වීමට යන අයට යාච්ඤාව: 107
ශුද්ධ ලියවිල්ලට එකඟවීම හා යාච්ඤාව: 19, 119
හදවත සෙවීමේ යාච්ඤාව: 139

## හිතෝපදේශ

යාච්ඤාව ප්‍රඥාවේ මාර්ගයක් ලෙස පොත අවධාරණය කරයි.

## දේශනාකාරයා

දෙව වාදය හා යාච්ඤාව පිළිබඳව පොත සාකච්ඡා කරයි.

## සලමොන්ගේ ගීතිකාව

යාච්ඤාවේ රහස්

## යෙසායා

දෙවියන්වහන්සේ සවන් නොදෙන යාච්ඤාව: 1:15; 16:12
පවිත්‍ර කිරීම හා යාච්ඤාව: 6
ලකුණක් සඳහා යාච්ඤාව: 7:11
උසස් කිරීමේ යාච්ඤාව: 12
ජයග්‍රහණය සඳහා ප්‍රශංසා කිරීමේ යාච්ඤාව: 25
සාමය සඳහා යාච්ඤාව: 26
විශ්වාසය හා යාච්ඤාව: 41
පුරුදු හා යාච්ඤාව: 55
බොහෝ දෙනෙක් අතර ජනප්‍රිය නොමැති යාච්ඤාව: 59
දිව්‍යමය බලය ප්‍රදර්ශනය කරන ලස යාච්ඤාව: 63-64

## යෙරමියා

නොහැකියාව පාපොච්චාරණය කිරීමේ යාච්ඤාව: 1
පසුබටවීම වෙනුවෙන් දුක්වීමේ යාච්ඤාව: 2
පැමිණිලි කිරීමක් වශයෙන් යාච්ඤාව: 4:10-31
කැරලිකාරකමට කෘතඥ වීමේ යාච්ඤාව: 5
සිරගෙදර සිට කරන යාච්ඤාව: 6
නොකළ යුතු යාච්ඤාව: 7:16

සාධාරණය සඳහා යාච්ඤාව: 10:23-25
ව්‍යාකූලතාවේ යාච්ඤාව: 12:1-4
පාපයෙන් හා නියගයෙන් මුදවා ගැනීමේ යාච්ඤාව: 14:7-22
දිව්‍යමය පළිගැනීමේ යාච්ඤාව: 15:15-21
සතුරන් ව්‍යාකූල කරන ලෙස ඉල්ලීමේ යාච්ඤාව: 16:19-21; 17:13-18
දුෂ්ඨ මන්ත්‍රණ සභාව පලවා හැරීමේ යාච්ඤාව: 18:18-23
බලාපොරොත්තු රහිත හදවතක යාච්ඤාව: 20:7-13
දිව්‍ය යහපත සඳහා තුති දීමේ යාච්ඤාව: 32:16-25
ඉතිරි ඇදහිලිවතුන් වෙනුවෙන් යාච්ඤාව: 42

## විලාප ගී

වේදනාව සඳහා යාච්ඤාව: 1:20-22
අනුකම්පාව සඳහා යාච්ඤාව: 2:19-22
පැමිණිලි කිරීමේ යාච්ඤාව: 3
පීඩාවට පත්වූවන් උදෙසා යාච්ඤාව: 5

## එසකියෙල්

විරෝධය දැක්වීමේ යාච්ඤාව: 4:14
ඉතිරිව සිටින අය ආරක්ෂා කිරීම සඳහා යාච්ඤාව: 9:8-11
සිද්ධස්ථානයක් සඳහා යාච්ඤාව: 11:13-16

## දානියෙල්

අර්ථ නිරූපණය සඳහා යාච්ඤාව: 2:17-18
ආඥාවකට විරෝධය දැක්වීමේ යාච්ඤාව: 6:10-15
පාපොච්චාරණයේ යාච්ඤාව: 9
යාච්ඤාව හා එහි ආත්මික ප්‍රතිඵල: 10
ජීවිතයේ සංක්ෂිප්තතාව පිළිබඳ යාච්ඤාව: 12:8-13

## හොසියා

පසුතැවිලි වීමේ යාච්ඤාවක් කරන ලෙස පසුබටවූ ජාතියෙන් දෙවියන්වහන්සේ ඉල්ලා සිටීම

## යෝවෙල්

හදිසි අවස්ථාවක යාච්ඤාව: 1:19-20
වැලපීම හා යාච්ඤා කිරීම: 2:17

## ආමොස්

විශ්‍රාමය හා කමාවීම සඳහා යාච්ඤාව: 7:1-9

## යෝනා

මිථ්‍යාදෘෂ්ටි නාවිකයන් සඳහා යාච්ඤාව: 1:14-16
නිරයෙන් පිටත ඒමේ යාච්ඤාව: 2
පශ්චාත්තාප වූ නගරයක යාච්ඤාව: 3
නොසතුටු දිවැසිවරයෙකුගේ යාච්ඤාව: 4

## මීකා

ස්වාමින්වහන්සේගේ වචනය සම්පූර්ණ කරන පිණිස උන්වහන්සේ කෙරෙහි බලාසිටීමේ යාච්ඤාව

## හබක්කුක්

පළිගැනීමේ සහ පැමිණිලි කිරීමේ යාච්ඤාව: 1:1-4,12-17
ඇදහිල්ලේ යාච්ඤාව: 3

## මලාකි

යාච්ඤාව - විරෝධතාව 1: 1:2
යාච්ඤාව - විරෝධතාව 2: 1:6
යාච්ඤාව - විරෝධතාව 3: 1:7,13
යාච්ඤාව - විරෝධතාව 4: 2:17
යාච්ඤාව - විරෝධතාව 5: 3:17
යාච්ඤාව - විරෝධතාව 6: 3:8

## මතෙව්

යාච්ඤාව හා කමාවදීමේ අවශ්‍යතාව: 5:22-26; 6:12,14-15
කුහකකම හා යාච්ඤාව: 6:5-7
ක්‍රිස්තුස්වහන්සේ ඉගැන්වූ යාච්ඤාව: 6:8-13
ක්‍රිස්තුස්වහන්සේ නියම කළ යාච්ඤාව: 7:7-11
කුෂ්ඨ රෝගියෙකුගේ යාච්ඤාව: 8:1-4
ශතාධිපතිගේ යාච්ඤාව: 8:5-13
උපද්‍රවයකදී යාච්ඤාව: 8:23-27
උන්මත්තකයන්ගේ යාච්ඤාව: 8:28-34
යයිරස්ගේ යාච්ඤාව: 9:18-19
රෝගී ස්ත්‍රියකගේ යාච්ඤාව: 9:20-22
අන්ධ මිනිසුන් දෙදෙනෙකුගේ යාච්ඤාව: 9:27-31
කම්කරුවන්ගේ යාච්ඤාව: 9:37-39
දෙවියන්වහන්සේට කෘතඥතාව පළ කිරීමේ ක්‍රිස්තුස්වහන්සේගේ යාච්ඤාව: 11:25-27
කන්දකදී කළ යාච්ඤාව: 14:23
පේතෘස් අසීරුතාවයට පත්වූ විට කළ යාච්ඤාව: 14:28-30
සීදොන්හි කානානියේ ස්ත්‍රියකගේ යාච්ඤාව: 15:21-28
අපස්මාර රෝගීවූ ළමයා වෙනුවෙන් යාච්ඤාව: 17:14-21
එක්සත්කම සඳහා යාච්ඤාව: 18:19-20
උපමාවෙන් කළ යාච්ඤාව: 18:23-25
වරප්‍රසාද ලත් තත්වයක සඳහා කරන යාච්ඤාව: 20:20-28
අන්ධ බව සුව කිරීමේ යාච්ඤාව: 20:29-34
ඇදහිල්ලේ යාච්ඤාව: 21:18-22
ව්‍යාජ යාච්ඤාව: 28:14,25
ගනන් දීමේ යාච්ඤාව: 25:20,22,24
තම කැමැත්ත ඉවත දමා කෙරෙන යාච්ඤාව: 26:26,36-46
කල්වරියේ කළ යාච්ඤාව: 27:46,50

## මාක්

යක්ෂයෙකුගේ යාච්ඤාව: 1:23-28, 32-34
ක්‍රිස්තුස්වහන්සේගේ යාච්ඤා කිරීමේ පුරුදු: 1:35 6:41,46
ගොළු හා බිහිරි අය සඳහා යාච්ඤාව: 7:31-37
නිරාහාරව සිටීමේ යාච්ඤාව: 2:18; 9:29
තරුණ පාලකයාගේ යාච්ඤාව: 10:17-22

## ලූක්

සාකෙවුස්ගේ යාච්ඤාව: 1:8,13,67-80

නමස්කාරයක් ලෙස යාච්ඤාව: 1:46-55
ගෞරව කිරීමේ යාච්ඤාව: 2:10-20,25-38
සේවය කිරීමේ දොරටුවේ කළ යාච්ඤාව: 3:21-22
ජනප්‍රිය බවින් බේරීයාම සඳහා යාච්ඤාව: 5:16
යාච්ඤාව හා දොළොස්දෙනා: 6:12-13,20,28
අන්වෙසක්වීම හා යාච්ඤාව: 9:28-29
යාච්ඤාව උපමාකාරයෙන්: 11:5-13
අකීකරු පුත්‍රයාගේ යාච්ඤාව: 15:11-24,29-30
නිරයෙන් පිටවීමේ යාච්ඤාව: 16:22-31
කුෂ්ඨ රෝගීන් දස දෙනාගේ යාච්ඤාව: 17:12-19
යාච්ඤාව උපමාකාරයෙන්: 18:1-8
පරිසියාගේ හා ආදායම් අයකරන්නාගේ යාච්ඤාව: 18:9-14
පේතෘස්ගේ ආරක්ෂා කිරීමේ යාච්ඤාව: 22:21-31
වේදනාවේ යාච්ඤාව: 22:39-46
මලවුන්ගෙන් නැගුටුනු ස්වාමින්වහන්සේ හා යාච්ඤාව: 24:30,50-53

**යොහන්**

ආත්මය වෙනුවෙන් යාච්ඤාව: 4:9,15,19,28; 7:37-39; 14:16
උත=ම් පුද්ගලයෙකුගේ යාච්ඤාව: 4:46-54
ජීවනයේ රොටි උදෙසා යාච්ඤාව: 6:34
යාච්ඤාව හා සහතික කිරීම: 11:40-42
දෙයාකාරයකින් කළ යාච්ඤාව: 12:27-28
වරප්‍රසාදයක් ලෙස යාච්ඤාව: 14:13-15; 15:16; 16:23-26
සියලු යාච්ඤාවන්ගේ යාච්ඤාව: 17

**ක්‍රියා**

උඩුමහල් මැදුරේ යාච්ඤාව: 1:13-14
පදවියට පත්වුවෙකුට යාච්ඤාව: 1:15-26
නමස්කාරය හා යාච්ඤාව: 2:42-47
පිළිපැදීමක් ලෙස යාච්ඤාව: 3:1
සාක්ෂිදැරීමේ නිර්භිතකම ගැන යාච්ඤාව: 4:23-31
වචනයේ සේවය හා යාච්ඤාව: 6:4-7
ජිවිත පූජාව කළ පළමු තැනැත්තා වෙනුවෙන් යාච්ඤාව: 7:55-60
සමාරිතයන් හා මායාකාරයා සඳහා කළ යාච්ඤාව: 8:9-25
දෙවියන්වහන්සේ වෙතට හැරුනු අයෙකු සඳහා යාච්ඤාව: 9:5-6,11
දොර්කස් වෙනුවෙන් යාච්ඤාව: 9:36-43
කොර්නේලියස්ගේ යාච්ඤාව: 10:2-4,9,31
සිරගෙදර සිටි පේතෘස් වෙනුවෙන් යාච්ඤාව: 12:5,12-17
හස්තාලේපනය සඳහා යාච්ඤාව: 13:2-3, 43
නිරාහාරව සිටීම සමග යාච්ඤාව: 13:2-3; 14:15,23,26
ගඟ අසබඩ යාච්ඤාව: 16:13,16
අඳුරු හිරගෙයිහිදී කළ යාච්ඤාව: 16:25,34
කැපවීමේ යාච්ඤාව: 20:36
නැව අනතුරට පත්වූ විට කළ යාච්ඤාව: 27:33,35
උණ සෑදුනු කෙනෙකුගේ යාච්ඤාව: 28:8,15,28

**රෝම**

සාර්ථක ගමනක් සඳහා යාච්ඤාව: 1:8-15
ආත්මයෙන් ආනුභාවය ලද යාච්ඤාව: 8:15,23,26-27
ඉශ්‍රායලය වෙනුවෙන් යාච්ඤාව: 10:1; 11:26
සේවයේ අඛණ්ඩතාව සඳහා යාච්ඤාව: 12:12
එක්සිත් ඇත්තන් සඳහා යාච්ඤාව: 15:5-6,30-33

සාතන් යටත් කිරීම සඳහා යාච්ඤාව: 16:20,24-27

## 2 කොරින්ති

අනුග්‍රහය ලෙස යාච්ඤාව: 1:2-4
කටුව ඉවත් කරන ලෙස කළ යාච්ඤාව: 12:7-10

## එපීස

ඇදහිලිවන්තයෙකුගේ ස්ථානය හා යාච්ඤාව: 1:1-11
සංජානනය හා බලය වෙනුවෙන් යාච්ඤාව: 1:15-20
දෙවියන්වහන්සේට ප්‍රවේශයක් ලෙස යාච්ඤාව: 2:18; 3:12
අභ්‍යන්තර පූර්ණත්වය සඳහා යාච්ඤාව: 3:13-21
අභ්‍යන්තර මිහිර සඳහා යාච්ඤාව: 5:19-20
යුද භටයෙකු ලෙස කරන යාච්ඤාව: 6:18-19

## පිලිප්පි

ප්‍රීතිය අයැදීම සලසා කෙරෙන යාච්ඤාව: 1:2-7
සිතේ සාමය හා යාච්ඤාව: 4:6-7,19-23

## කොලොස්සි

පාපාතිත්වය සඳහා ප්‍රශංසා කිරීමක් ලෙස යාච්ඤාව: 1:1-8
සත් ආකාරයේ ආශිර්වාද සඳහා යාච්ඤාව: 1:9-14
සහභාගිකමේ යාච්ඤාව: 4:2-4,12,17

## 1 තෙසලෝනික

සිහි කිරීමේ යාච්ඤාව: 1:1-3
නැවත පැමිණීම වෙනුවෙන් යාච්ඤාව: 3:9-13
යාච්ඤාව, ප්‍රශංසා කිරීම හා පරිපූර්ණතාව 5:17-18,23-24,28

## 2 තෙසලෝනික

කැඳවීමේ වටිනාකම වෙනුවෙන් යාච්ඤාව: 1:3,11-12
පහසුව හා ස්ථායීතාව සඳහා යාච්ඤාව: 2:13,16-17
වචනය හා ආරක්ෂාව වෙනුවෙන් යාච්ඤාව: 3:1-5

## 2 තිමෝති

තිමෝතිගේ සේවය සඳහා යාච්ඤාව: 1:2-7
ඔනෙසිපොරස්ගේ නිවෙස වෙනුවෙන් යාච්ඤාව: 1:6-18
ව්‍යාජ මිතුරන් සඳහා යාච්ඤාව: 4:14-18

## හෙබ්‍රෙව්

මැවීම සඳහා ප්‍රශංසා කිරීමට යාච්ඤාව: 1:10-12
කරුණාව හා අනුග්‍රහය වෙනුවෙන් යාච්ඤාව: 4:16
ක්‍රිස්තුස්වහන්සේගේ සේවය හා යාච්ඤාව: 5:7-8; 7:24-25
දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටුකිරීමේ යාච්ඤාව: 12:9,12,15
පරිපූර්ණතාව සඳහා යාච්ඤාව: 13:20-21

## යාකොබ්

ප්‍රඥාව සඳහා යාච්ඤාව: 1:5-8,17
ඉලක්කය වැරදෙන යාච්ඤාව: 4:2-3
පවතින යාච්ඤාව: 5:13-18

## 1 පේතෘස්

කෘතඥතාවය හා උරුමය සඳහා යාච්ඤාව: 1:3-4
විවාහක තත්වයේ යාච්ඤාව: 3:7-12
යාච්ඤා කිරීම සඳහා පිබිද සිටීම: 4:7
කිතුනු ස්ථායිතාව සඳහා යාච්ඤාව: 5:10-11

## 2 පේතෘස්

කරුණාව හා සාමය දෙගුණ තෙගුණ වීමේ යාච්ඤාව: 1:2

## 3 යොහාන්

කි1;sfha miqìu ;=< යාච්ඤාව: 1-4,12

## යූද්

ආත්මය තුළ යාච්ඤාව: 20

## එළිදරව්

මිදීමේ බැටළු පැටියාට ප්‍රශංසා කිරීමක් ලෙස යාච්ඤාව: 5:9
සුගන්ධයෙන් පිරුණු රන්පාත්‍ර සඳහා යාච්ඤාව: 5:8: 8:3
ජීවිත පූජා කළ සෙනගගේ යාච්ඤාව: 6:10
විදේශික සෙනගගේ යාච්ඤාව: 7:9-12
වැඩිමහල්ලන්ගේ යාච්ඤාව: 11:15-19
මෝසෙස්ගේ යාච්ඤාව: 15:3-4
මහිමයට පත් ශුද්ධවන්තයන්ගේ යාච්ඤාව: 19:1-10
බයිබලය අවසන් කිරීමේ යාච්ඤාව 22:17,20

# දහහතරවන පරිච්ඡේදය

## බලය පිළිබඳ අටවන මූලධර්මය : දේව වචනයේ බලය

### අරමුණු :

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට ...

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- වචනයේ බලයේ ප්‍රභවය හඳුනාගැනීමට
- දෙවියන්වහන්සේගේ වචන වන "රෙහ්මා" හා "ලෝගොස්" අර්ථ විග්‍රහ කිරීමට
- වචනයේ බලයෙන් සාතන්ගේ අභියෝග වලට යේසුස්වහන්සේ මුහුණ දුන් අයුරු පැහැදිලි කිරීමට
- දෙවියන්වහන්සේගේ බලවත් වචනය සඳහා ඔබගේ වගකීම පැහැදිලි කිරීමට
- දේව වචනයේ ප්‍රබල පරමාර්ථ සාරාංශගත කිරීමට
- ආත්මික බලයට අදාළව ඔබගේ වචන වැදගත් වන්නේ මන්දැයි පැහැදිලි කිරීමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදය:

> **මක්නිසාද දෙවියන්වහන්සේගේ වචනය ජීවමානය, බලවත්ය, කොයිම දෙමුවහත් කඩුවකටවත් වඩා තියුණුය, ප්‍රාණය හා ආත්මයද සන්ධි හා ඇටමිදුළුද වෙන්කරන තරමට කාවදින්නේය, සිතේ සිතිවිලිද අදහස්ද විමසන්නේය. (හෙබ්‍රෙව් 4:12)**

### හැඳින්වීම

ශුද්ධ බයිබලය සැබෑ හා ජීවමාන එකම දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය වේ. දෙවියන්වහන්සේගේ මේ වචන වලට සුවිශේෂී බලයක් ඇත.

> **මක්නිසාද දෙවියන්වහන්සේගේ වචනය ජීවමානය, බලවත්ය, කොයිම දෙමුවහත් කඩුවකටවත් වඩා තියුණුය, ප්‍රාණය හා ආත්මයද සන්ධි හා ඇටමිදුළුද වෙන්කරන තරමට කාවදින්නේය, සිතේ සිතිවිලිද අදහස්ද විමසන්නේය. (හෙබ්‍රෙව් 4:12)**

> **මාගේ මුඛයෙන් නික්මෙන මාගේ වචනයත් මා වෙතට හිස්ව හැරී නැවිත් මා කැමති දෙය සිදුකොට මා නියම කළ කාරණය සඵල කරනවා ඇත. (යෙසායා 55:11)**

ඔබ දෙවියන්වහන්සේගේ වචනයේ බලය අත්දකින තුරු ඔබට කිසි දිනෙක දෙවියන්වහන්සේගේ බලයේ පූර්ණත්වය නොලැබෙනු ඇත.

### වචනයේ ප්‍රභවය

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ බලයෙන් උන්වහන්සේගේ වචනයෙන් ප්‍රභවය වේ. මේ නිසා දේව වචනය බලවත් වේ.

> **ස්වාමින්වහන්සේ වචනය දෙනසේක. ආරංචිය පතුරුවන ස්ත්‍රීහු මහත් සේනාවක්ය. (ගීතාවලිය 68:11)**

> **එසේහෙයින් නුඹලා පණිවිඩයේ වචනය, එනම් දෙවියන්වහන්සේගේ වචනය අපෙන් ලැබූ කල, නුඹලා පිළිගත්තේ මනුෂ්‍යයන්ගේ වචනය නොව ඇත්තෙන්ම දෙවියන්වහන්සේගේ වචනයව තිබෙන්නාවූ, අදහස නුඹලා තුළ ක්‍රියාද කරන්නාවූ වචනය බැවින් අපිත් නොකඩව දෙවියන්වහන්සේට ස්තුති කරමුව. (1 තෙසලෝනික 2:13)**

දෙවියන්වහන්සේ ලෝකය මවන ලද්දේ උන්වහන්සේගේ වචනයෙනි.

**දෙවියන්වහන්සේගේ වචනයෙන් ලෝකවල් මවනු ලැබූ බවද, මෙසේ දකින දේවල් පෙනෙන දේවලින් හට නොගත් බවද ඇදහිල්ලෙන් තේරුම්ගනිමුව. (හෙබ්‍රෙව් 11:3)**

දෙවියන්වහන්සේ ආකාශය මවන ලද්දේ උන්වහන්සේගේ වචනයෙනි.

**ස්වාමින්වහන්සේගේ වචනයෙන් ආකාශය ... මවන ලද්දේය. (ගීතාවලිය 33:6)**

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනයේ බලයෙන් ලෝකය හා එහි ඇති සියල්ල ඒ ආකාරයෙන් නොනවත්වාම ඔසවනසේක.

**උන්වහන්සේ දෙවියන්වහන්සේගේ මහත් තත්වයේ ප්‍රභවයද උන්වහන්සේගේ දේවත්වයේ ස්වරූපයද වනසේක, තමන්ගේ බලපරාක්‍රමයේ වචනයෙන් සියල්ල දරමින්, පව් ගැන පවිත්‍රවීමක් කළ පසු උසස් ස්ථානවල මහෝත්තමයාණන්වහන්සේගේ දකුණු පැත්තේ හිඳ ගත්සේක. (හෙබ්‍රෙව් 1:3)**

## "රෙහ්මා" හා "ලෝගොස්"

දේව වචනය සඳහා එකිනෙකට වෙනස් ග්‍රීක වචන දෙකක් බයිබලයේ භාවිතා කර ඇත. ඉන් එකක් "ලෝගොස්" වන අතර එය දෙවියන්වහන්සේගේ කියමන් සියල්ල වෙත යොමුවකි. එය දෙවියන්වහන්සේ ප්‍රකාශ කළ දෙයෙහි සම්පූර්ණයෙන් එළිදරව්වකි.

දෙවන වචනය වන "රෙහ්මා" සුවිශේෂීව විශේෂ අවස්ථාවකට යොදන, දෙවියන්වහන්සේගේ විශේෂ ප්‍රකාශයකට යොමුවකි. දේව වචනයේ පූර්ණ "ලෝගොස්" එළිදරව්ව බලවත්ය, එහෙත් දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ලිඛිත වචනයෙන් "රෙහ්මා" වචනයක් කඩිනම් කළවිට එය විශේෂීව බලවත් වේ. දෙවියන්වහන්සේ "රෙහ්මා" වචනයක් පා%ණවත් කළවිට, ඔබ කලින් බොහෝ වරක් කියවා ඇති පදයක් එක්වරම අලුත් තේරුමක් ගෙන දෙයි. ඔබ මුහුණ දෙන සුවිශේෂී අවස්ථාවකට එය යොදන අයුරු ඔබට පෙනෙනු ඇත. ඒ අවස්ථාවේ ඔබට අවශ්‍ය පිළිතුර, එළිදරව්ව හෝ සහනය "රෙහ්මා" වචනයෙන් ඔබට ලැබෙනු ඇත.

## යේසුස්වහන්සේගේ පරීක්ෂාවන්

දෙවියන්වහන්සේගේ බලය යේසුස් ක්‍රිස්තුස්වහන්සේට පවරන ලදි. එහෙත් එම බලය පරීක්ෂාවට භාජනය කළ යුතුය. මක්නිසාද පීඩනය යටතේ ශක්තිය වැඩි වන බැවිනි. ක්‍රිස්තුස්වහන්සේගේ මෙලොව සේවය ආරම්භයේදීම යේසුස්වහන්සේගේ බලය හා සාතන්ගේ බලය අතර ප්‍රබල ඝට්ටනයක් ඇතිවිය. මෙම පාඩම තවදුරටත් අධ්‍යයනය කිරීමට පෙර මේ හමුවීම පිළිබඳව මතෙව් 4:1-11; මාක් 1:12-13 හා ලූක් 4:1-13හි කියවන්න.

පළමුව, යේසුස්වහන්සේ ලවා ගල් රොටි කරවීමට සාතන් උත්සාහ කළේය. ජලය මිදි යුෂ බවට හැරවූ යේසුස්වහන්සේගේ බලය සැබවින්ම ගල් රොටි කිරීමට ප්‍රමාණවත්ය. එහෙත් මේ අවස්ථාවේදී එවැනි දෙයක් කිරීමට දෙවියන්වහන්සේගෙන් ස්වාධීනව කටයුතු කිරීමක් වන අතර එය තමන්වහන්සේගේ බලය පෞද්ගලික ප්‍රයෝජනයක් සඳහා භාවිතා කිරීමක් වේ.

ඊළඟට තමන්වහන්සේගේ බලය පෙන්වීමට දේවමාළිගාව මුදුනේ සිට පනින මෙන් සාතන් යේසුස්වහන්සේගෙන් ඉල්ලා සිටියේය. එසේ කිරීමට බල කිරීම සඳහා සාතන් ශුද්ධ ලියවිල්ල වැරදි ලෙස උපුටා දැක්විය.

තෙවෙනි සිදුවීමේදී සාතන් යේසුස්වහන්සේ පරීක්ෂා කළේ ලෞකික බලය භාවිතා කරන ලෙස ඉල්ලමිනි. සාතන් පැවසුයේ යේසුස්වහන්සේ සාතන්ට නමස්කාර කළහොත් ඔහු ලෝකයේ සියලුම රාජ්‍යයන් අත්හරින බවය.

මේ බල අරගලයේදී යේසුස්වහන්සේ සියලු අභියෝගවලට මුහුණ දුන්නේ දේව වචනය මගිනි. ඒ අවස්ථාවට අදාළ ශුද්ධ ලියවිලි පාඨ යේසුස්වහන්සේ උපුටා දැක්වූසේක. උන්වහන්සේ දෙවියන්වහන්සේගේ "රෙහ්මා" වචනය භාවිතා කළසේක.

## බලයේ වචනය භාවිතා කිරීම

දේව වචනයේ බලය ඇති බව පමණක් දැනගැනීම ප්‍රමාණවත් නොවේ, එය ඵලදායි වීමට යේසුස්වහන්සේ කළාක් මෙන් වචනය භාවිත කළ යුතුය. තමන්වහන්සේ භාවිතා කළ වචන තමන්ගේම වචන නොවන බව යේසුස්වහන්සේ පැහැදිලිව පෙන්වූසේක. ඒවා දෙවියන්වහන්සේගේ වචන වේ (යොහන් 3:34; 14:10,24; 17:8,14).

යේසුස්වහන්සේ දේව වචනය බලයෙන් යුක්තව ප්‍රකාශ කළසේක.

> **උන්වහන්සේගේ වචනය බලයෙන් යුක්ත වූ බැවින් උන්වහන්සේගේ ඉගැන්වීමට ඔව්හු විස්මිත වූවෝය. (ලූක් 4:32)**
>
> **සියල්ලෝ විස්මිතව: මේ වචනය කිමෙක්ද? මක්නිසාද උන්වහන්සේ බලයෙන්ද ආනුභාවයෙන්ද අශුද්ධාත්මයන්ට අණ දෙන සේක, ඔව්හු පිටවෙතියි ඔවුනොවුන් අතරෙහි කථා කරගත්තෝය. (ලූක් 4:36)**

වියළි අතක් ඇති මිනිසෙකුට යේසුස්වහන්සේ වචනය ප්‍රකාශ කළවිට, ඔහු සුව විය (මාක් 3:1-5). කුෂ්ඨ රෝගියෙකුට වචනය ප්‍රකාශ කළ විට, ඔහු පවිත්‍ර විය (මතෙව් 8:2-3). උන්වහන්සේ මෙසේ පැවසූසේක.

- පොකුණ ළඟ සිටි කොර මිනිසාට “නැගිටින්න” (යොහන් 5:8)
- අන්ධ මිනිසාට “බලන්න” (ලූක් 7:21)
- යක්ෂයින්ට “එළියට එන්න” (මතෙව් 9:32-33)
- බිහිරන්ට “අසන්න” (මාක් 7:32-35)
- මියගිය අය “පිටතට එන්න” (යොහන් 11:44)

දේව වචනයේ බලය ඇති බව යේසුස්වහන්සේ දන්නාසේක. එමෙන්ම ඵලදායි වීමට මිනිසුන් එම වචනයට සවන් දී ප්‍රතිචාර දැක්විය යුතු බවද උන්වහන්සේ දන්නාසේක. දෙවියන්වහන්සේගේ වචන වූ යේසුස්වහන්සේගේ වචන කෙතරම් ප්‍රබලද යත් ඈතක සිට වුවද ඒවා ක්‍රියා කළේය. යේසුස්වහන්සේ ගැටළුව ඇති තැන සිටීම වුවද අවශ්‍ය වූයේ නැත. රෝගී මෙහෙකාරයෙකු සිටි එක්තරා මිනිසෙක් මෙසේ පැවසීය:

> **ස්වාමිනි, මාගේ පියස්ස යටට ඔබගේ ඊමට මම නොවටිමි. වචන මාත්‍රයක් කිව මැනව, එවිට මාගේ මෙහෙකරුවාට සුව වන්නේය.**
> **යේසුස්වහන්සේ සියයකට මුළාදෑනියාට කථාකොට, පලයන්න; නුඹ අදහාගත් ලෙසම නුඹට වේවයි කීසේක. ඒ පැයේදීම මෙහෙකරුවා සුවපත්විය. (මතෙව් 8:8,13)**

මේ මිනිසා දෙවියන්වහන්සේගේ වචනයේ බලය විශ්වාස කළේය. එය කෙතරම් බලවත්ද යත් කාලය, ස්ථානය හෝ මිනිසාගේ වෙනයම් ඕනෑම සීමාවක් මගින් බලපෑමක් කළ නොහැකි බව ඔහු දැනගෙන සිටියේය. එහෙත් එය තමාගේ ජීවිතයේදී හා අවස්ථාවේදී ඵලදායි වීමට ඔහු එය ඉල්ලිය යුතුය. බලයේ ප්‍රයෝජන ලබාගැනීමට නම් ඔහු දේව වචනය භාවිතා කළ යුතුය.

මුල් සභාව දෙවියන්වහන්සේගේ වචනයේ බලය භාවිතා කළේය. පාවුලුතුමා මෙසේ පැවසීය:

> **මාගේ කථාවත් මාගේ දේශනාකිරීමත් ප්‍රඥාවේ සිත් පොලඹවන්නාවූ වචන වලින් නොව ආත්මයාණන්වහන්සේගේද බලයේද ප්‍රකාශ කිරීමෙන් විය. එසේ වුනේ නුඹලාගේ ඇදහිල්ල දෙවියන්වහන්සේගේ බලයෙන් මිස මනුෂ්‍යයන්ගේ ප්‍රඥාවෙන් නොපිහිටන පිණිසය.**
> **(1 කොරින්ති 2:4,5)**
>
> **නුමුත් ස්වාමින්වහන්සේ කැමතිසේක් නම් මම නුඹලා ළඟට වහාම ඇවිත් උඩඟුවූවන්ගේ කථාව නොව බලය දැනගන්නෙමි. (1 කොරින්ති 4:19)**

## වචනයේ බලය

යේසුස්වහන්සේගේ වචනය පසුපස බලය දෙවියන්වහන්සේ වේ:

**මාගේ මුඛයෙන් නික්මෙන මාගේ වචනයත් මා වෙතට හිස්ව හැරී නැවිත් මා කැමති දෙය සිදුකොට මා නියම කළ කාරණය සඵල කරනවා ඇත. (යෙසායා 55:11)**

**... මාගේ වචනය ඉෂ්ට කරන පිණිස මම ඒ ගැන පිබිද සිටිමි. (යෙරමියා 1:12)**

දේව වචනය මහත් ආත්මික බලයක් ගෙන දෙයි.

**මක්නිසාද දෙවියන්වහන්සේගේ වචනය ජීවමානව, බලවත්ය, කොයිම දෙමුවහත් කඩුවකටත් වඩා තියුණුය, ප්‍රාණය හා ආත්මයද සන්ධි හා ඇටමිදුළුද වෙන්කරන තරමට කා වදින්නේය, සිතේ සිතිවිලිද අදහස්ද විමසන්නේය. (හෙබ්‍රෙව් 4:12)**

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනයට උන්වහන්සේගේ නමට වඩා ගෞරව කරනසේක.

**ඔබගේ ශුද්ධ මාළිගාව දෙසට නමස්කාර කරමින්, ඔබගේ කරුණා ගුණය සහ සත්‍යය නිසා ඔබේ නාමයට ස්තුති කරන්නෙමි. මක්නිසාද ඔබගේ මුළු නාමයට ඉහළින් ඔබගේ වචනය උතුම් කළසේක. (ගීතාවලිය 138:2)**

දෙවියන්වහන්සේගේ වචනයෙන් සාක්ෂාත් කරන්නාවූ ප්‍රබල පරමාර්ථයන් කවරේද? පහත දැක්වෙන පද අධ්‍යයනය කරන්න. දෙවියන්වහන්සේගේ වචනය:

- ඉගැන්වීමටත්, තරවටුවටත්, හික්මවීමටත්, ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ය: 2 තිමෝති 3:16
- ශුභාරංචි පණිවිඩය පිළිබඳව විශ්වාසය ගෙන එයි: ක්‍රියා 4:4
- පවිත්‍ර කරයි: යොහාන් 15:3; එපිස 5:26
- අප ඊට සවන් දී විශ්වාස කළහොත් -සදාතන ජීවනය ගෙන එයි : යොහාන් 5:24
- සදාතන විනිශ්චයේ පදනම වේ: යොහාන් 12:48
- අශුද්ධාත්මයන් පලවා හැරීමට භාවිත කෙරේ: මතෙව් 8:16; ලූක් 4:36
- ආශ්චර්යමත් ලකුණු පසුපස එන අතර ශුභාරංචියේ සත්‍යතාව ඒත්තු ගන්වයි: මාක් 16:20
- ගැළවීම පිළිබඳ සහතිකයක් ගෙන දෙයි: 1 යොහාන් 1:2-6
- නැවත ඉපදීමේ අත්දැකීම ගෙන දෙයි: 1 පේතෘස් 1:23; ගීතාවලිය 119:41
- ශුභාරංචියේ සත්‍යතාව ගැන සාක්ෂි දරයි: 1 යොහන් 5:7
- ඇදහිලිවන්තයා පාරිශුද්ධීකරණය කරයි: 1 තිමෝති 4:5
- බලාපොරොත්තුව ගෙන දෙයි: ගීතාවලිය 130:5; 119:48,81
- සුවවීම ගෙන දෙයි: ගීතාවලිය 107:20
- විනාශ කරන්නාගේ මාර්ගයෙන් අප ඈත් කර තබයි: ගීතාවලිය 17:4
- ජීවය හා ආත්මය වේ: යොහන් 6:63
- සතුට මා ප්‍රීතිමත් වීම ගෙන දෙයි: යෙරමියා 15:16
- ඇදහිල්ල වැඩි කරයි: රෝම 10:17
- සහනය ලබාදෙයි: 1 තෙසලෝනික 4:18; ගීතාවලිය 119:50,52
- ආත්මික පෝෂණය ගෙනදෙයි: 1 තිමෝති 4:6
- පිළිතුරු ලත් යාච්ඤාවන් ලබාදෙයි: යොහන් 15:7
- සාර්ථකත්වයට මූලික වේ: යොෂුවා 1:8
- අප ඊට සවන් දී එය පිළිපදින විට, ආශිර්වාද කරයි: ලූක් 11:28
- වචනයෙ අනුව වැඩ කළහොත් ආශිර්වාදද එසේ නොකළහොත් ශාපයද දේ: ද්විතිය කථාව 28
- පරීක්ෂාවන්හිදී ආයුධයකි: මතෙව් 4
- ආත්මය දෙවියන්වහන්සේ වෙතට හරවයි: ගීතාවලිය 19:7
- සරල පුද්ගලයා ප්‍රඥාවන්ත කරයි: ගීතාවලිය 19:7
- ආලොකමත් කරයි: ගීතාවලිය 19:8
- අනතුරු හඟවයි: ගීතාවලිය 19:11
- වචනය අනුව කටයුතු කළවිට, මහත් ප්‍රතිලාභ ගෙනදෙයි: ගීතාවලිය 19:11
- ස්වර්ගයට දොර විවෘත කරයි: එළිදරව් 22:14
- ධර්මිෂ්ඨකමේ මාර්ගයේ ගමන් කිරීම මගින් ආශිර්වාද ගෙන දේ: ගීතාවලිය 119:1-3

- අපගේ සතුරන්ට, ගුරුවරුන්ට හා වැඩිමහල්ලන්ට වඩා ප්‍රඥාවන්ත කරයි: ගීතාවලිය 119:98-104
- ප්‍රාණවත් කරයි: ගීතාවලිය 119:25
- ශක්තිමත් කරයි: ගීතාවලිය 119:28
- උන්වහන්සේ කරුණාවේ පදනමය: ගීතාවලිය 119:58
- ප්‍රීතිය ගෙන දෙයි: ගීතාවලිය 119:92
- අවබෝධය ගෙන දෙයි: ගීතාවලිය 119:130,104,169
- මුදනු ලබයි: ගීතාවලිය 119:170

## වචනය වෙනුවෙන් වගකීම

දේව වචනය එතරම්ම බලවත් බැවින් එය ලෝකයා වෙත ගෙන යෑමේ වගකීම ඇදහිලිවතුන්ට තිබේ. මුල් සභාව, දේව වචනයේ මේ වගකීම බාරගත්තේය. ඔවුහු එය සෑම තැනම දේශනා කළහ (ක්‍රියා 8:4; 12:24; 13:49). උන්වහන්සේගේ වචනය ප්‍රකාශ කිරීමට නිර්භීතකම ඉල්ලා සිටියහ (ක්‍රියා 4:29,31). ඔවුන්ගේ විශ්වාසවන්තකම නිසා දේව වචනය, ලොව මුළුල්ලේම පතල විය (ක්‍රියා 6:7; 19:20).

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනය පසුව පැමිණෙන්නාවූ ලකුණු වලින් සනාථ කරනසේක. වචනයට පෙර ලකුණු ලැබෙන තෙක් යම් කෙනෙකුට බලා සිටිය නොහැකිය. මේ බලවත් වචනය ලොව පතල කිරීමේ වගකීම ඔබ සතුවේ. පහත දැක්වෙන ශුද්ධ ලියවිලි පාඨ අධ්‍යයනය කිරීම මගින් ඔබගේ වගකීම ඉගෙන ගන්න.

- අන් අයට ප්‍රකාශ කිරීම සඳහා දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනය ඔබ තුළ තබනසේක: ද්විතිය කථාව 18:18-19; යෙසායා 51:16; යෙරමියා 1:9; 3:12; 5:14; 26:12; එසකියෙල් 2:7-8

- ඔබ දෙවියන්වහන්සේගේ වචනය ඉගෙන ගන්නෙහි නම්, එය අන් අයට උගැන්වීමේ වගකීම ඔබට ඇත: ගලාති 6:6

- ඔබ ලොව මුළුල්ලේම දේව වචනය දේශනා කළ යුතුය: ලූක් 24:47; මාක් 16:15; 2 තිමෝති 4:2

- ඔබ, ඔබගේ වචන නොව උන්වහන්සේගේ වචන ප්‍රකාශ කළ යුතුය: යෙසායා 58:13

- ඔබ දේව වචනය ගැන ලජ්ජා නොවිය යුතුය: මාක් 8:38

- ඔබ, ඔබගේ දරුවන්ට එය උගැන්විය යුතුය: ද්විතිය කථාව 6:6-9

## ඔබගේම වචන

දේව වචනයට දිව්‍යමය බලයක් ඇත. මක්නිසාද ඒවා සැබෑ ජීවමාන දෙවියන්වහන්සේගේ වචන බැවිනි. එහෙත් ඔබගේ වචනද බලවත්ය. ඒ, විශේෂයෙන් ඔබ දේව වචනය ප්‍රකාශ කරන විට වේ. ඔබට දේව වචනය තුළින් සාතන් පරාජය කළ හැකිය.

**ඔව්හු බැටළුපැටවාණන්ගේ ලේ නිසාද තමුන්ගේ සාක්ෂියේ වචන නිසාද ඔහුගෙන් ජයගත්තෝය; ඔව්හු මරණය විඳින තරමට පවා තමුන්ගේ ජීවිතයට ප්‍රේම නොකර සිටියෝය. (එළිදරව් 12:11)**

ඔබගේ මුඛයෙන් කෙරෙන පාපොච්චාරණය ගැළවීම ලැබීමේ කොටසක් වේ.

**තවත් කුමක් කියන්නේද? වාක්‍යය නුඹ ළඟය, නුඹේ මුඛයේද නුඹේ සිතේද තිබේය කියාය. එනම්, අප විසින් ප්‍රකාශ කරන ඇදහිල්ලේ වාක්‍යයය.**
**කුමක් හෙයින්ද යේසුස්වහන්සේ ස්වාමින්වහන්සේ යයි නුඹේ මුඛයෙන් ප්‍රකාශ කරන්නෙහි නම්, දෙවියන්වහන්සේ විසින් උන්වහන්සේව මළවුන්ගෙන් නැගිටවූ බව සිතින් අදහන්නෙහි නම්, නුඹ ගළවනු ලබන්නෙහිය.**

**මක්නිසාද මනුෂ්‍යයා ධර්මිෂ්ඨකම පිණිස සිතින් අදහාගන්නේය; ගැළවීම පිණිස මුඛයෙන් කියා දෙන්නේය. (රෝම 10:8-10)**

ඔබ අන් අයට සේවය කරන විට, ආත්මික මරණය හෝ ජීවනය හෝ ගෙන ඒමේ බලය ඔබගේ දිවට ඇත.

**මරණයත් ජීවනයත් දිවේ වසඟයෙහි ඇත්තාහ ... (හිතෝපදේශ 18:21)**

ඔබගේම වචන වලින් ඔබ උගුලකට අසුවිය හැකිය. ඔබ ප්‍රකාශ කරන දෙයින් ඔබ අසීරු තත්වයකට පත්විය හැකිය.

**නුඹේ මුඛයේ කීම් වලින් පටලැවී, නුඹේ මුඛයේ කීම් වලින් අසුවී සිටින්නෙහි නම් ... (හිතෝපදේශ 6:2)**

නුඹේ වචන නිසා දෙවියන්වහන්සේගේ බලය පිළිගැනීම වැළකෙන්නට ඉඩ තිබේ.

**අපේ දිවෙන් ජයගන්නෙමුව; අපේ තොල් අපේමය; අපට ස්වාමියා කවුද? (ගීතාවලිය 12:3)**

ඔබ පවසන දේ ඔබගේ ආත්මය බිඳ දැමීමට සාතන් යොදා ගනු ඇත. බිඳුම, සාතන්ට ඇතුළු විය හැකි විවරයකි.

**ශාන්තිදායක දිව ජීවන වෘක්ෂයක්ය; එහෙත් එහි වංචාව ආත්මය පොඩි කිරීමක්ය. (හිතෝපදේශ 15:4)**

ඔබ පවසන දෙයින් ඔබගේ ප්‍රාණයට බලපෑමක් ඇති කරයි.

**අඥානයාගේ මුඛය ඔහුට විනාශයක්ය, ඔහුගේ තොල්ද ඔහුගේ ප්‍රාණයට මලපතක්ය. (හිතෝපදේශ 18:7)**

**තමාගේ මුඛයත් දිවත් රැකවල් කරගන්නා තමාගේ ප්‍රාණය විපත්ති වලින් රැකගන්නේය. (හිතෝපදේශ 21:23)**

ඔබගේ වචන ඔබගේ මුළු ශරීරය කෙරෙහිම බලපාන්නේය.

**දිවද ගින්නක්ය. එය අපේ අවයවයන් අතරේ අධර්මිෂ්ඨකමේ ලෝකයක්ය. ඒක මුළු ශරීරය කිලුටු කොට, සකල ලෝකයට ගිනි අවුලවයි. ඒකට ගිනි ඇවිලෙන්නේ නිරයෙන්ය. (යාකොබ් 3:6)**

ඔබේ වචන ඔබගේ මුළු ජීවිතය කෙරෙහිම බලපවත්වයි.

**කට රැකගන්නා තමාගේ ජීවිතයද රැකවල් කරගනියි; එහෙත් බොහෝ සෙයින් කට අරින්නා විනාශයට පැමිණෙයි. (හිතෝපදේශ 13:3)**

ඇදහිලිවන්තයා තමන්ගේම වචන වලින් දෙවියන්වහන්සේගේ බලය තමා තුළට පැමිණීම වළක්වා ගනිති. ඔවුහු තෘෂ්ණාව සහිත, වැදගැම්මකට නැති, මෝඩ වචන කතා කරති. ඔවුන් ශුභාරංචියේ සත්‍යයෙන් මිනිසුන් ඈත් කෙරෙන මනුෂ්‍ය ආඥාවන් පිළිබඳව වාද කරති. ඔවුහු අන් අය ගැන නපුරු කතා කරන අතර, පැමිණිලි කරති, උඩඟු වෙති, බොරු කියති. ඔවුහු භේද භින්න ඇති කෙරෙන වචන කතා කරන අතර ශාප කිරීමේ හා තිත්ත කතා පවසති.

ඉන්පසු තමන් බල රහිත මන්දැයි සිතමින් පුදුම වෙති.

මතක තබාගන්න: ඔබගේ ජීවිතය තුළ දෙවියන්වහන්සේගේ බලය ගලා යෑම කෙරෙහි බලපවත්වන්නේ උන්වහන්සේගේ වචනයේ බලය පමණක් නොව ඔබගේ වචනයේ බලයද වේ.

## ස්වයංපරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. බලය සහිත වචනයේ ප්‍රභවය කවුරුන්ද?

3. "රෙහ්මා" දේව වචනය කවරක්ද?

4. "ලෝගෝස්" දේව වචනය කවරක්ද?

5. යේසුස්වහන්සේ සාතන්ගේ අභියෝග වලට මුහුණ දුන්නේ කෙසේද?

6. බලය සහිත දේව වචනය පිළිබඳව ඔබ මෙම පාඩමෙන් උගත් ඔබගේ වගකීම සාරාංශගත කරන්න.

7. දේව වචනයේ බලවත් පරමාර්ථ පිළිබඳව ඔබ මෙම පාඩමෙන් උගත් දේ සාරාංශගත කරන්න.

8. මෙම ප්‍රකාශය සත්‍යයද, අසත්‍යයද? "ආත්මික බලය කෙරෙහි ඔබගේ වචන වලට කිසිදු බලපෑමක් නැත".

   මෙම ප්‍රකාශය: ________________________

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ පරීක්ෂණ වලට පිළිතුරු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. උත්පත්ති 1 පරිච්ඡේදය කියවන්න. දෙවියන්වහන්සේගේ වචනයේ නිර්මාණාත්මක බලය හඳුනාගන්න. "දෙවියන්වහන්සේ ... කීසේක" යන වාක්‍ය ඛන්ඩ යටින් ඉරක් අඳින්න.

2. ඔබගේම දිවේ බලය පිළිබඳව හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ "ආත්මික උපක%ම: ආත්මික සටන සඳහා අත්පොත " යන පාඨමාලාවෙන් තවදුරටත් අධ්‍යයනය කරන්න. ඔබගේ දිව පාලනය කරගත හැකි උපක්‍රමික එම පාඨමාලාවේ දී ඇත.

3. මනුෂ්‍ය ආකාරයෙන් දේව වචනය ලෙස යේසුස්වහන්සේ හඳුන්වනු ලබයි. යොහන් 1 කියවන්න.

4. දෙවියන්වහන්සේගේ වචන මනුෂ්‍යයන් විසින් පළමුවෙන්ම ලියන ලද වාර්තාව නික්මයාම 20:1-17හි දක්නට ලැබේ.

5. දෙවියන්වහන්සේගේ වචනයේ ප්‍රධාන බෙදුම් දෙකක් ඇත: වචනයේ කිරි හා වචනයේ මාංශ වශයෙනි. වචනයේ කිරි යනු පහසුවෙන් අවබෝධ කරගත හැකි මූලික සත්‍යයන් වන අතර වචනයේ මාංශ දේව වචනයේ ගැඹුරු ඉගැන්වීම් වේ. ඒවා ආත්මික පරිණතභාවය ගෙන දේ. මේ බෙදුම් පිළිබඳව හෙබ්‍රෙව් 5:13-14හි හා 1 පේතෘස් 2:2හි කියවන්න.

# පහළොස්වන පරිච්ඡේදය

## බලය පිළිබඳ නවවන මූලධර්මය: අධිකාරී බලය

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- අධිකාරී බලය ක්‍රියාත්මක කිරීම සඳහා අධිකාරී බලය යටතේ සිටිය යුතු මන්දැයි පැහැදිලි කිරීමට
- යේසුස්වහන්සේ අධිකාරී බලය යටතේ අධිකාරී බලය සහිතව සිටි මනුෂ්‍යයෙකු වූ ආකාරය පැහැදිලි කිරීමට
- සභාවේ දෙවියන්වහන්සේ පිහිටුවා ඇති අධිකාරී ව්‍යුහයන් හඳුනාගැනීමට
- නිවසේ දෙවියන්වහන්සේ පිහිටුවා ඇති අධිකාරී ව්‍යුහයන් හඳුනාගැනීමට
- වැඩ සම්බන්ධතා අතර දෙවියන්වහන්සේ පිහිටුවා ඇති අධිකාරී ව්‍යුහයන් පැහැදිලි කිරීමට
- රජයේ අධිකාරීන් හා ඇදහිලිවතුන් අතර ඇති සබඳතාව පැහැදිලි කෙරෙන යොමුවක් දැක්වීමට

### ප්‍රධාන පදය

> **හැමදෙනාම බලය ලත් මුලාදෑනීන්ට යටත් වෙත්වා. මක්නිසාද දෙවියන්වහන්සේගෙන් මිස කිසි මුලාදෑනිකමක් නැත්තේය; ඇත්තාවූ මුලාදෑනිකම් දෙවියන්වහන්සේ විසින් නියම කර තිබේ. (රෝම 13:1)**

### හැඳින්වීම

ලෝකය මැවීමේ සිටම දෙවියන්වහන්සේ ව්‍යාකුල තත්වයකින් ක්‍රමවත් බවක් ඇති කිරීමට ක්‍රියා කළසේක. මේ සඳහා එක් ක්‍රමයක් වූයේ ජීවිතයේ සෑම ක්ෂේත්‍රයකම අධිකාරී ව්‍යුහයන් පිහිටුවීමයි. ශ්‍රේෂ්ඨතම හා උසස්ම අධිකාරීත්වයන් වන්නේ දෙවියන්වහන්සේ, පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හා ශුද්ධාත්මයාණන්වහන්සේ වේ.

ඔබගේ ජීවිතයට බලපෑම් කෙරෙන අධිකාරී ව්‍යුහයන්ද දෙවියන්වහන්සේ පිහිටුවා ඇත. ඔබට ආත්මික බලය අවශ්‍ය නම්, මේ අධිකාරීන් වැදගත් වේ. ඔබ අධිකාරී බලයක් යටතේ නොසිටින්නේ නම් ඔබට අධිකාරී බලය ක්‍රියාත්මක කළ නොහැක.

### අධිකාරී බලය යටතේ සිටින මිනිසෙක්

එක් දිනක් කපර්ණවුමේදී හමුදා නායකයෙකු සහ යේසුස්වහන්සේ අතර වැදගත් හමුවීමක් සිදුවිය. ඒ නායකයාගේ නම අපි නොදනිමු. අප දන්නේ ඔහු ශතාධිපතියෙකු බවත් බලවත් ලෙස රෝගාතුර වූ සේවකයෙකු ඔහුට සිටි බවත් පමණි. මෙම පාඩම තවදුරටත් අධ්‍යයනය කිරීමට පෙර ශතාධිපතියාගේ කතාව මතෙව් 8:5-13හි සහ ලූක් 7:1-10හි කියවා බලන්න.

මේ ශතාධිපති රෝම අධිකාරී බලය යටතේ සිටි මිනිසෙකි. ඔහුටද මිනිසුන් 100 කට නායකයෙකු වූ බැවින් අධිකාරී බලය තිබිණි. මේ නිසා පියාණන්වහන්සේ සමග යේසුස්වහන්සේට තිබූ ආත්මික සබඳතාව ඔහුට සැනෙකින් වැටහිණි. එය ශතාධිපතියෙකු ලෙස ඔහුට ඔහුගේ අණදෙන නිලධාරී සමග තිබූ සබඳතාවට සමානය.

යේසුස්වහන්සේ අධිකාරී බලය සහිත මිනිසෙකු වූසේක. උන්වහන්සේ ක්‍රියා කළේ අධිකාරී බලය ඇතිවය. උන්වහන්සේ පාපයට කමාව දුන්සේක, රෝගීන් සුව කළසේක, යක්ෂයන් පළවා හැරිසේක,

එමෙන් විවිධ භාස්කම් කළසේක. එහෙත් යේසුස්වහන්සේද අධිකාරී බලය යටතේ සිටි කෙනෙකි. උන්වහන්සේ පියාණන්වහන්සේගේ අධිකාරී බලය යටතේ සිටිසේක.

> **එබැවින් යේසුස්වහන්සේ උත්තර දෙමින්: සැබවක් සැබවක් නුඹලාට කියමි - පියාණන්වහන්සේ යමක් කරනවා පුත්‍රයා දක්නේද ඒ දේ මිස තනියම කිසිවක් කරන්ට ඔහුට බැරිය. මක්නිසාද උන්වහන්සේ යමක් කරනසේක්ද පුත්‍රයාත් ඒ දේ එසේම කරන්නේය. (යොහන් 5:19)**
>
> **මක්නිසාද පියාණන්වහන්සේ තමන් තුළම ජීවනය ඇතුව සිටින්නාක් මෙන් පුත්‍රයාටත් තමන් තුළම ජීවනය ඇතුව සිටින්ට උන්වහන්සේ වරය දුන්සේක. ඔහු මනුෂ්‍ය පුත්‍රයා බැවින් විනිශ්චය කරන්ටද බලය දුන්සේක. (යොහන් 5:26-27)**
>
> **මක්නිසාද මා ස්වර්ගයෙන් බැස ආවේ මාගේ කැමැත්ත නොව මා එවූ තැනැන්වහන්සේගේ කැමැත්ත කරන පිණිසය. (යොහන් 6:38)**
>
> **මාගේ ඉගැන්වීම මාගේ නොව මා එවූ තැනැන්වහන්සේය. (යොහන් 7:16)**
>
> **මා එවූ තැනැන්වහන්සේ මා සමග සිටිනසේක; උන්වහන්සේ මා තනියම සිටින්ට නෑරියසේක; මක්නිසාද උන්වහන්සේට ප්‍රසන්න වූ දේවල් මම නිතරම කරමි. (යොහන් 8:29)**

මේ අධිකාරීත්ව ව්‍යුහයේ බලය ශතාධිපති තේරුම්ගත් අතර, ඒ නිසාම ඔහුගේ සේවකයා සුවකිරීමට යේසුස්වහන්සේ ඔහුගේ නිවසට පැමිණීමේ අවශ්‍යතාවක් නොමැති බව හැඟී ගියේය. වචනයක් ප්‍රකාශ කළ පමණින්ම, ඔහුගේ සේවකයා සුවවීමට ප්‍රමාණවත් බලයක් යේසුස්වහන්සේට ඇති බව ඔහු දැනගත්තේය. යේසුස්වහන්සේ ශතාධිපතිට ප්‍රශංසා කොට ඔහුගේ සේවකයා සුව කළේය.

අධිකාරී බලය පෙන්වන සෑම අවස්ථාවකම (ක්‍රමවත්) ආඥා දාමයක් තිබේ. පරිසිවරුන් හා ලියන්නන් යේසුස්වහන්සේගෙන් ඇසුවේ ඒ නිසාය: "නුඹ මේ දේ කරන්නේ මොන බලයකින්ද?" (මතෙව් 21:23). බලයෙන් හා අධිකාරීත්වයෙන් පිරි ජීවිත මිනිසුන් දුටු විට එහි ප්‍රභවය දැනගැනීම ඔවුන්ට අවශ්‍යය.

## යේසුස්වහන්සේ අධිකාරී බලය යටතේ විසීම

තමන්වහන්සේගේ අධිකාරී බලය යටතේ විසීමට දෙවියන්වහන්සේ යම් කෙනෙකු සෙවූ සේක.

> **එවිට: මම කවරෙකු යවම්ද? අප උදෙසා යන්නේ කවුදැයි කියන්නාවූ ස්වාමින්වහන්සේගේ හඬ මට ඇසුණේය ... (යෙසායා 6:8)**

දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ අධිකාරී බලයෙන් යම් ප්‍රමාණයක් පැරණි ගිවිසුම් යුගයේ විසූ ඇතැම් පිරිමින්ට හා ස්ත්‍රීන්ට දුන්සේක: එහෙත් උන්වහන්සේගේ අධිකාරී බලය පූර්ණව එළිදරව් වූයේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළිනි. යේසුස්වහන්සේ, තමන්වහන්සේට මෙම අධිකාරී බලය ඇති බව දත්සේක.

> **යේසුස්වහන්සේ ඔවුන් ළඟට ඇවිත් කථාකොට: ස්වර්ගයෙහිද පොළොවෙහිද සියලු බලය මට දී තිබේ. (මතෙව් 28:18)**

තමන්වහන්සේට අධිකාරී බලය ඇති බව උන්වහන්සේ ප්‍රදර්ශනය කළසේක.

> **නුමුත් පොළොවෙහිදී පව් කමා කරන්ට මනුෂ්‍ය පුත්‍රයාට බලය තිබෙන බව නුඹලා විසින් දැනගන්නා පිණිස යයි කියා: නැගිට නුඹේ ඇඳ අරගෙන නුඹේ ගෙදරට පලයන්න ... (මතෙව් 9:6)**

යේසුස්වහන්සේ, උන්වහන්සේගේ අධිකාරී බලය ලැබුවේ දෙවියන්වහන්සේගෙනි. එමගින් උන්වහන්සේ සතුරාගේ සියලු බලවේගයන් පරාජය කළසේක.

යේසුස්වහන්සේ සියලු අධිපතීන්ගේද බලය ලත් තැනැත්තන්ගේද ප්‍රධානියා වන සේක (කොලොස්සි 2:10). මන්ද ...

> **උන්වහන්සේ තමන් කෙරෙන් අධිපතීන්ද බලය ලත්තන්ද පහකොට, ප්‍රසිද්ධයෙන් ඔවුන් දක්වා කුරුසිය කරණකොටගෙන ඔවුන්ගෙන් ජයගත් බව ප්‍රකාශ කළසේක. (කොලොස්සි 2:15)**

යේසුස්වහන්සේ, දෙවියන්වහන්සේගේ අධිකාරී බලය යටතේ සිටින අතර අනෙකුත් සියලු බලයන්ගේද ආධිපත්‍යයන්ගේද අධිකාරී බලය වේ. ඔබ කලින් උගත් පරිදි යේසුස්වහන්සේ සිය අධිකාරී බලය ඔබට පවරා ඇත.

> **ඒ වනාහි තමාගේ දාසයන්ට බලයද එකිනෙකාට තම තමාගේ වැඩද දී, අවදිව සිටින්නැයි දොරටු පාලයාට අණ දී, තමාගේ ගෙදරින් පිටත්ව ගොස් අන් රටක නැවතී සිටින මනුෂ්‍යයෙකුට සමානය. (මාක් 13:34)**

ඔබ, යේසුස්වහන්සේගේ අධිකාරී බලය යටතට එන්නෙහිය. එසේ කිරීම මගින් ඔබ පියාණන්වහන්සේගේ අධිකාරී බලය යටතටද පැමිණේ. ඇදහිවන්තයා යනු ආත්මික බලය ඇති අය වන අතර ඔවුන්ද අධිකාරී බලය යටතේ සිටින අය වේ.

## දෙවියන්වහන්සේ විසින් පිහිටුවන ලද ආධිපත්‍යයන්

දෙවියන්වහන්සේ බලයේ ප්‍රභවය බව ඔබ දැනටමත් උගත්තෙහිය.

> **මක්නිසාද සිංහාසන වේවා, ස්වාමිකම් වේවා, අධිපතිකම් වේවා, බලපරාක්‍රම වේවා, ස්වර්ගවල සහ පොළොවෙහිත් ඇති පෙනෙන්නාවූ දේවල්ද නොපෙනෙන්නාවූ දේවල්ද යන සියල්ල උන්වහන්සේ තුළ මවන ලද්දේය: සියලු දේ උන්වහන්සේ කරණකොටගෙනද උන්වහන්සේ උදෙසාද මවා තිබේ. (කොලොස්සි 1:16)**

එමෙන්ම දෙවියන්වහන්සේ විසින් ලෝකයේ පිහිටුවන ලද සියලු අධිකාරී ව්‍යුහයන් පිටුපස බලයද උන්වහන්සේම වේ.

> **හැමදෙනාම බලය ලත් මුලාදෑනීන්ට යටත්වෙත්වා. මක්නිසාද දෙවියන්වහන්සේගෙන් මිස කිසි මුලාදෑනිකමක් නැත්තේය: ඇත්තාවූ මුලාදෑනිකම් දෙවියන්වහන්සේ විසින් නියම කර තිබේ. (රෝම 13:1)**

දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨතම අධිකාරී බලයට අමතරව, ඇදහිලිවන්තයන් උන්වහන්සේ විසින් පිහිටුවන ලද වෙනත් අධිකාරී ව්‍යුහයන්ටද යටත් වෙති. මේවා නිවෙසෙහි, සභාවෙහි, වැඩ කරන ස්ථානයෙහි හා රජයේ අධිකාරී බලයන් වේ.

එක් අයෙකුගේ තත්වය වෙනත් කෙනෙකුට වඩා වෙනස් වේ. ඇතැම් ස්ත්‍රීන්ට ස්වාමි පුරුෂයන් නැත. ඇතැම් අය රැකියාවක් නොකරන බැවින් ස්වාමියෙකු හෝ සේව්‍යයෙකු හෝ නොමැත. එබැවින් ඔව්හු මෙම අධිකාරීත්ව ව්‍යුහයන්ට අයත් නොවෙති. එහෙත් ඔබට අදාළ ව්‍යුහයන් හඳුනාගැනීම වැදගත් වේ, මක්නිසාද ඒවා පිහිටුවා ඇත්තේ දෙවියන්වහන්සේ බැවිනි. ඔබ අධිකාරී බලයෙන් යුක්තව ක්‍රියා කිරීමට නම්, උන්වහන්සේ විසින් පිහිටුවන ලද අධිකාරී බලය යටතේ සිටිය යුතුය. නීත්‍යානුකූල අධිකාරී බලය සැමවිටම කිසියම් තැනකින් පැවරුණකි.

ඔබ අධිකාරී බලයක් යටතේ සිටින විට, ඔබට අධිකාරී බලය ලැබෙන්නාවූ නීත්‍යානුකූල ප්‍රභවයක් ඇත. නිදසුනක් ලෙස ගෙදර සිටින භාර්යාව සිය අධිකාරී බලය ලබාගන්නේ ස්වාමි පුරුෂයාගෙනි. සභාවේ සිටින උපස්ථායකයන් හා වැඩිමහල්ලන් ඔවුන්ගේ අධිකාරී බලය ලබාගන්නේ දෙවියන්වහන්සේ විසින් ඔවුන්ට ඉහළින් තබා ඇති ආත්මික නායකයන්ගෙන් වේ. සේවකයෙකුට, සේව්‍යයා විසින් පනවා ඇති අධිකාරී බලයේ සීමාවන් තිබේ. එහෙත්, මේ සියලු ආඥා දාම අවසානයේ කෙළවර වන්නේ සියලුම අධිකාරී බලයන්ගේ උල්පත වූ දෙවියන්වහන්සේගෙනි.

සියලු ආධිපත්‍යයන් පිහිටුවන්නේ දෙවියන්වහන්සේ විසිනි. අධිකාරී බලයේ මුල් ප්‍රභවය සොයා යන විට, එය සැමවිටම අවසන් වන්නේ දෙවියන්වහන්සේගෙන් වේ. මේ නිසා ආධිපත්‍යයට විරුද්ධව කැරලි ගැසීම මගින් දෙවියන්වහන්සේගේ බලය ඔබ තුළට ගලා ඒමට බාධා පැමිණේ. ඔබ

අධිකාරී බලයේ සිටින අයට එරෙහිව කැරලි ගැසීම යනුවෙන් අදහස් වන්නේ ඔබ සැබවින්ම දෙවියන්වහන්සේට විරුද්ධව කැරලි ගසන බවය.

**හැමදෙනාම බලය ලත් මුලාදෑනීන්ට යටත්වෙත්වා. මක්නිසාද දෙවියන්වහන්සේගෙන් මිස කිසි මුලාදෑනිකමක් නැත්තේය: ඇත්තාවූ මුලාදෑනිකම් දෙවියන්වහන්සේ විසින් නියම කර තිබේ. එබැවින් මුලාදෑනිකමට විරුද්ධව සිටින්නා දෙවියන්වහන්සේගේ නියෝගයට විරුද්ධව සිටියි. විරුද්ධව සිටින්නෝ තමුන් පිටට දඬුවම් පමුණුවා ගන්නෝය. (රෝම 13:1-2)**

අධිකාරී බලය ඇති පුද්ගලයෙකු වීමට නම්, ඔබ දෙවියන්වහන්සේගේ හා දෙවියන්වහන්සේ විසින් ඔබට වඩා උසස් තැනක තබා ඇති අයගේ අධිකාරී බලයට යටත් විය යුතුය. දෙවියන්වහන්සේ විසින් පිහිටුවා ඇති ඇතැම් අධිකාරීත්ව ව්‍යුහයන් සමහරක් මෙසේය:

## නිවසේ අධිකාරී බලය

දෙවියන්වහන්සේ විසින් පිහිටුවා ඇති මූලික අධිකාරීත්ව ව්‍යුහය නම් නිවසය (උත් 1-3). නිවස සඳහා දෙවියන්වහන්සේගේ ව්‍යුහය පහත දක්වේ .

**ස්වාමිපුරුෂයන්**

නිවසේ ප්‍රධානියා විය යුත්තේ ස්වාමිපුරුෂයා බව බයිබලය උගන්වයි. නිවසෙහි ස්වාමි පුරුෂයාගේ අධිකාරී බලය ප්‍රේමය මත පදනම් විය යුත්තකි.

**මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ සභාවේ හිසව සිටින්නා සේම පුරුෂයාත් භාර්යාවගේ හිසව සිටියි. උන්වහන්සේ වනාහි ශරීරයේ ගැළවුම්කාරයාය. එබැවින් සභාව ක්‍රිස්තුස්වහන්සේට යටත් වෙන්නාක් මෙන් භාර්යාවෝද සියලු දේවලදී තමුන්ගේ පුරුෂයන්ට යටත්වෙත්වා. පුරුෂයෙනි, ක්‍රිස්තුස්වහන්සේ සභාවට ප්‍රේමකොට, ඈ උදෙසා තමන්ම පාවාදුන්නාක් මෙන්ම, නුඹලාත් නුඹලාගේ භාර්යාවන්ට ප්‍රේම කරපල්ලා. (එපීස 5:23,25)**

**භාර්යාවන්**

භාර්යාවන් ස්වාමිපුරුෂයාගේ ප්‍රේමණීය අධිකාරී බලය යටතේ සිටිය යුතුය.

**භාර්යාවෙනි, ස්වාමින්වහන්සේ මෙන් නුඹලාගේ පුරුෂයන්ට යටත්ව සිටපල්ලා. (එපීස 5:22)**

**දෙමවුපියන්**

භාර්යාව හා ස්වාමිපුරුෂයා එක්ව දරුවන් කෙරෙහි ආධිපත්‍යය ඇතිව සිටිය යුතුය.

**දරුවෙනි, නුඹලාගේ දෙමවුපියන්ට ස්වාමින්වහන්සේ තුළ කීකරුවෙයල්ලා. මක්නිසාද එසේ කරන්ට යුතුය. නුඹට වැඩසිද්ධවන පිණිසද, නුඹ පොළොවෙහි බොහෝ කල් ජීවත් වන පිණිසද, නුඹේ පියාටත් මවුටත් ගෞරව කරපන්න. (එපීස 6:1-3)**

එහෙත් දෙමවුපියන්ට අනතුරු ඇඟවීමක් කර තිබේ.

**පියවරුනි, නුඹලාගේ දරුවන්ට කෝප නූපදවා, ස්වාමින්වහන්සේගේ හික්මවීමෙන්ද අවවාදයෙන්ද ඔවුන් ඇති කරපල්ලා. (එපීස 6:4)**

සෑම අධිකාරී බලයක් හා සමගම වගකීමක් තිබේ. දෙමවුපියන් ප්‍රේමය ඇතිව දිව්‍යමය අධිකාරී බලය භාවිතා කළ යුතුය. ස්වාමිපුරුෂයන්ගේ අධිකාරී බලය, සභාව වෙනුවෙන් ක්‍රිස්තුස්වහන්සේ දක්වන නායකත්වය මෙන් විය යුතුය. ඔවුන් කෲර නොවිය යුතු අතර භාර්යාව හා දරුවන් වහලුන් මෙන් ක්‍රියා කිරීමද බලාපොරොත්තු නොවිය යුතුය. යේසුස්වහන්සේ සභාවට දැක්වූ සබඳතාව ඔවුන් සිය පවුලට දැක්විය යුතුය.

භාර්යාවන් දෙවියන්වහන්සේගේ ත්‍යාගයක් හා "සහකාරියක්" නිසා ස්වාමිපුරුෂයන් ඔවුන්ට ඇහුම්කන් දිය යුතුය. තමාට ඇහුම්කන් නොදෙන හා තමාගේ මත පහත් කොට සලකන

ස්වාමිපුරුෂයෙකුට භාර්යාවක් උපකාර කරන්නේ කෙසේද? තම භාර්යාවට ඇහුම්කන් දෙන ලෙස දෙවියන්වහන්සේ මිනිසුන්ට කී අවස්ථා බයිබලයේ සඳහන් වේ (ආබ්‍රහම්ට). එමෙන්ම, ඇතැම් අවස්ථාවල දෙවියන්වහන්සේ ස්වාමිපුරුෂයාට පෙර භාර්යාවට කතා කර ඇත (මනෝවා). ස්වාමිපුරුෂයෙකු හා භාර්යාවක එකිනෙකාට නිසියාකාරව ප්‍රතිචාර දැක්වීම වැදගත් වන්නේ මේ නිසාය. දෙවියන්වහන්සේ ආබ්‍රහම් සේවයට කැඳවීමේ එක් හේතුවක් වන්නේ ඔහුගේ නිවසෙහි ක්‍රමවත් බවක් තිබීම විශේෂත්වයකි.

සෑම අධිකාරිත්ව ව්‍යුහයක්ම සාධාරණ හා ප්‍රේමණීය විය යුතුය. අවාසනාවකට සෑම ව්‍යුහයකම පාහේ අධිකාරී බලය වැරදි ලෙස භාවිතා ඇති අතර මිනිසුන් සෑම විටම ප්‍රේමයෙන් හා සාධාරණව ක්‍රියා කරන්නේ නැත. දෙවියන්වහන්සේ නිවසෙහි පිහිටුවා ඇති අධිකාරිත්ව ව්‍යුහය සේවය කෙරෙහි ප්‍රබලව බලපායි. නිවස ක්‍රමවත්ව නොමැති නම්, ඊට වඩා වගකීමක් දැරිය යුතු සේවය, මනා නායකත්වයකින් පාලනය කළ නොහැකිය. සභා නායකත්වය දැරීම සඳහා එක් අවශ්‍යතාවක් ලෙස දෙවියන්වහන්සේ ක්‍රමවත් නිවසක් පිහිටුවූයේ එබැවිනි.

> **එහෙයින් නායක තෙමේ, තමාගේම පවුල හොඳින් හසුරුවා ගනිමින් සියලු ආකාර සන්සුන්කම ඇතුව ස්වකීය දරුවන් හික්මවාගන්නාවූ තැනැත්තෙක්ව සිටිය යුතුය. (නුමුත් යමෙක් තමාගේම පවුල හසුරුවා ගන්ට නොදන්නේ නම්, ඔහු දෙවියන්වහන්සේගේ සභාව ප්‍රවේසම් කරන්නේ කෙසේද?) (1 තිමෝති 3:2,4-5)**
>
> **එක භාර්යාවකට පුරුෂයාව, අවකල් ක්‍රියාව ගැන දෝෂාරෝපණය නොලත් කීකරු වූ ඇදහිලිවන්ත දරුවන් ඇතුව සිටින්ට ඕනෑය. (තීතස් 1:6)**

භාර්යාව හා ස්වාමිපුරුෂයා අතර එකඟතාවයක් නොමැති නම්, යාච්ඤාවටද බාධා ඇතිවන බව බයිබලයේ සඳහන් වේ.

## සභාවේ අධිකාරිත්වය

සභාවේ අධිකාරිත්ව ව්‍යුහය ගැන අප කතා කරන විට, අප අදහස් කරන්නේ මිනිසාගේ සංවිධානයන් පිළිබඳව නොවේ. විවිධ නිකායන් ගැන හෝ ඒවා සංවිධානය වී ඇති ආකාරය ගැන හෝ ඒවායේ නායකයන් තෝරන පිළිවෙල ගැන හෝ අපි කතා නොකරන්නෙමු. අප අදහස් කරන්නේ සභාව සඳහා දෙවියන්වහන්සේ විසින් පිහිටුවා ඇති බයිබලීය ව්‍යුහය ගැන වේ.

සභාවේ ප්‍රධානියා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වන අතර ඇදහිලිවන්තයෝ...

> **... ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයද වෙන් වෙන් වශයෙන් එහි අවයවයෝද වෙති. (1 කොරින්ති 12:27)**

දෙවියන්වහන්සේ සභාවේ සුවිශේෂී නායකත්ව දීමනා පිහිටුවන සේක.

> **උන්වහන්සේ සමහරුන් ප්‍රේරිතයන්ද සමහරුන් අනාගතවක්තෘවරුන්ද සමහරුන් ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්ද සමහරුන් සභාපාලකයන්ද සමහරුන් ගුරුවරුන්ද කොට දුන්සේක. (එපීස 4:11)**

මේ නායකත්ව දීමනා දෙවියන්වහන්සේ විසින් සභාවේ පිහිටුවන ඒවා වේ. ඔබ යම් සභාවක කොටස්කරුවෙකු වූ විට, ඔබ ඒ සහභාගිකමේ නායකයන් ලෙස දෙවියන්වහන්සේ පත් කර ඇති මනුෂ්‍යයන්ගේ අධිකාරී බලය යටතට පැමිණේ. මේ විශේෂ නායකයන්ට උපකාර කිරීම සඳහා ඔවුන්ගේ මඟපෙන්වීම යටතේ ක්‍රියාකිරීමට වැඩිමහල්ලන් හා / හෝ උපස්ථායකයන් පත්කෙරේ. මේ පුද්ගලයන් සඳහා අවශ්‍ය සුදුසුකම් හා ඔවුන්ගේ කාර්යයන් 1 තිමෝති 3හි හා තීතස් 1හි සඳහන්ව ඇත.

එමෙන්ම දෙවියන්වහන්සේ ආත්මයෙන් පිරී සෑම ඇදහිලිවන්තයෙකුටම ආත්මික දීමනා දෙනසේක. මේ දීමනා දී ඇත්තේ, නායකත්වයේ අධිකාරී බලය යටතේ සභාවේ සේවය කිරීමේ හා ධෛර්යවත් කිරීමේ පරමාර්ථ උදෙසා වේ. මේ දීමනා පිළිබඳව පහත දැක්වෙන කොටස් වලින් කියවා ගත හැකිය: රෝම 12:1-8; 1 කොරින්ති 12:1-31; එපීස 4:1-16; 1 පේතෘස් 4:7-11. ඔබට මේ විශේෂ දීමනා පිළිබඳව සවිස්තරව හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ "ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවය" නම් පාඨමාලාවෙන් අධ්‍යයනය කළ හැකිය.

සභාව, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මික ශරීරය වේ. මනුෂ්‍ය ශරීරයේ අවයව මෙන් සභාවේ සෑම සාමාජිකයෙකුටම විවිධ වගකීම් ඇත. සෑම කොටසක්ම සභාවේ නායකයා වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මඟපෙන්වීමට යටත් වේ.

මනුෂ්‍ය ශරීරයේ සෑම අවයවයක්ම මඟපෙන්වීම ලබාගන්නේ හිසෙනි. සභාවේ ආත්මික ශරීරය පිළිබඳවද මේ දෙය සත්‍යයකි. ප්‍රධානියා (හිස) වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අධිකාරිය නොමැතිව සභාවේ (ශරීරයේ) එකමුතු කමක් තිබිය නොහැකිය.

ස්වභාවික ශරීරයේ මෙන්, සභාවේ සාමාජිකයන් (ශරීරයේ අවයව) එකිනෙකාට යටත් විය යුතුය. නිදසුනක් ලෙස ස්වභාවික ශරීරයේ කියවීම සඳහා ඇස ආධිපත්‍යය ගනී. ගමන් කරන විට ආධිපත්‍යය කකුලේ වේ. ආත්මික ශරීරයේ සාමාජිකයෝද ඒ ආකාරයෙන්ම ඵලදායි සේවයක් ලබාදීම සඳහා එකිනෙකාට යටත් විය යුතුය.

## වැඩපොළේ අධිකාරීත්වය

සේවය කරන්නන් ලෙස හෝ සේවය ලබන්නන් ලෙස හෝ සිටින අයට අධිකාරීත්ව ව්‍යුහයක් බයිබලයේ දී ඇත. සේවය ලබන්නා සේවකයන් බාරව සිටින, ස්වාමියා නැතහොත් අධිපතියා වේ. සේවය කරන්නා කුලියට ගත් කෙනෙකු වන අතර එක්තරා වැඩක් කිරීමේ වගකීම ඔහුට ඇත.

බයිබලය මෙසේ උගන්වයි:

> **දාසයෙනි, ක්‍රිස්තුස්වහන්සේට මෙන් මාංසාකාරයෙන් නුඹලාගේ ස්වාමිවරුන්ව සිටින්නන්ට භයෙනුත් වෙවුලුමෙනුත් නුඹලාගේ සිත්වල ඒකාන්තකමින් කීකරු වෙයල්ලා; මනුෂ්‍යයන් සතුටු කරන්නන් මෙනි පෙනීමට වැඩ නොකොට, ක්‍රිස්තුස්වහන්සේගේ දාසයන් මෙන් සිතින් දෙවියන්වහන්සේගේ කැමැත්ත කරපල්ලා. දාසයෙක් වේවා, නිර්දාසයෙක් වේවා, එක් එක් අය කරන්නාවූ යම් යහපතක් ඇද්ද, ඊට ස්වාමින්වහන්සේගෙන් නැවත විපාක ලැබෙන බව දැන, මනුෂ්‍යයන්ට නොව ස්වාමින්වහන්සේට මෙන් කැමැත්තෙන් මෙහෙ කරපල්ලා (එපීස 6:5-8)**

සේවකයෙකු නොහොත් සේවය කරන්නා වැඩ කළ යුත්තේ තමා ස්වාමින්වහන්සේට එය කරන්නාක් මෙනි, මක්නිසාද දෙවියන්වහන්සේ සියලු බලයේ උල්පතය. ස්වාමියාට නැතහොත් සේව්‍යයාටද උපදෙස් දී ඇත. අධිකාරී බලය ඇති අය හා අධිකාරී බලය යටතේ සිටින අය සම්බන්ධ ව්‍යුහය මෙම කොටසින් නැවතත් පැහැදිලි වේ.

> **ස්වාමිවරුනි, නුඹලාගෙත් ඔවුන්ගෙත් ස්වාමින්වහන්සේ ස්වර්ගයෙහි සිටින බවද උන්වහන්සේ මනුෂ්‍යයන්ගේ තරාතිරම් නොබලන බවද දැන, තර්ජන කිරීමෙන් වැලකී, ඔවුන්ට එම දේවල් කරපල්ලා. (එපීස 6:9)**

සේව්‍යයා තම සේවකයාට සාධාරණව සැලකිය යුතුය. ඒ, තම සියලු බලය ලබා ගන්නා දෙවියන්වහන්සේ ඔවුන්ට සාධාරණව සලකන්නාක් මෙනි.

## රජයේ අධිකාරීත්වය

මතෙව් 20:25-28හි ඇති ආකාරයට ලෝකයේ බල ව්‍යුහය දේව රාජ්‍යයේ බල ව්‍යුහය මෙන් නොවේ. අප ඇදහිලිවන්තයන් හා දේව රාජ්‍යයේ කොටස්කරුවන් වුවද දැන් අප තවමත් ජීවත් වන්නෙ මේ ලෝකයේ වේ. අප සෑම කෙනෙක්ම ජීවත් වන්නේ ගමක හෝ නගරයක හෝ වන අතර එය විශාල පළාතක හෝ දේශයක් හෝ රටක හෝ කොටසක් වේ. අප සෑම කෙනෙක්ම ජීවත් වන්නේ ප්‍රාදේශීය සභාව හා ජාතික රජය යටතේය. ඒවායේ නීති හා නායකයන් ඇති අතර ඒ අධිකාරී බලය යටතේ අපි සිටිමු.

සියලු බලයේ ප්‍රභවය දෙවියන්වහන්සේ ලෙස බයිබලය උගන්වන බව ඔබ ඉහත උගත්තෙහිය. මෙය රජයේ බලධාරීන්ට සම්බන්ධ වන ආකාරය රෝම 13 පැහැදිලි කරයි. ඔබගේ බයිබලය එම පරිච්ජේදයට පෙරළන්න.

1 **පදය** උගන්වන්නේ - සියලු බලයේ ප්‍රභවය දෙවියන්වහන්සේ වන අතර ඔබ මේ බල වලට යටත් වන්නෙහිය යන්න වේ.

**2 පදයෙන්** පෙන්වන්නේ ඔබ මේ බල වලට එරෙහිව කැරලි ගසන විට, ඔබ සැබවින්ම දෙවියන්වහන්සේට එරෙහිව කැරලි ගසන බවය.

**3-4 පදවලින්** පැහැදිලි කෙරෙන්නේ ඔබ රජයේ නායකයන්ට බිය වන්නේ ඔබ ඔවුන්ට අකීකරු වන විට බවය. ඔවුන් දෙවියන්වහන්සේගේ සේවකයන්ට සමාන කර තිබේ.

රජයේ නායකයන් බලයට ගෙනෙන්නේ දෙවියන්වහන්සේ වන අතර උන්වහන්සේගේ කැමැත්ත පරිදි ඔවුන් බලයෙන් පහකළ හැකිය.

> **කාලවල්ද ප්‍රස්තාවල්ද වෙනස් කරන්නේත් රජවරුන් පහ කරන්නේත් රජවරුන් පත් කරන්නේත් ප්‍රඥාවන්තයන්ට ප්‍රඥාවද නුවණ ඇත්තන්ට දැනුමද දෙන්නේත් උන්වහන්සේය.** (දානියෙල් 2:21)

> **මනුෂ්‍යයන්ගේ රාජ්‍යය කෙරෙහි මහෝත්තමයාණන්වහන්සේ බලය පවත්වා, තමන් කැමති කෙනෙකුට ඒක දී මනුෂ්‍යයන්ගෙන් නිචයෙකු නුමුත් එය කෙරෙහි පත්කරන බව ජීවත්ව සිටින අය දැනගන්නා පිණිස ...** (දානියෙල් 4:17)

නෙබුකද්නෙසර් නමැති රජතුමෙකු ගැන දානියෙල් කතාන්දරයක් පවසන අතර දෙවියන්වහන්සේ ඔහුට උගන්වන තුරු ඔහුගේ බලයේ ප්‍රභවය ඔහු හැඳින ගත්තේ නැත.

> **එහෙත් ඔහුගේ සිත උසස් වී, උඩඟුකම් කරන ලෙස ඔහුගේ ආත්මය දැඩි වූ කල, ඔහු තමාගේ රාජාසනයෙන් පහත් කරනු ලැබුවේය, ඔහුගේ මහිමයද ඔහුගෙන් පහකරනු ලැබීය.**
> **මහෝත්තම දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ගේ රාජ්‍යය කෙරෙහි බල පවත්වා, උන්වහන්සේ කැමති කෙනෙකු එය කෙරෙහි පත්කරන බව ඔහු දැනගන්නා තුරු ...** (දානියෙල් 5:20-21)

දෙවියන්වහන්සේ, අමශියා රජතුමා වෙත ඔහු සටනට යෑමට සැලසුම් කරන අවස්ථාවේ උපදෙස් දෙන පිණිස දිවැසිවරයෙකු එවුසේක.

> **නුමුත් දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෙක් ඔහු වෙතට අවුත්: රජ්ජුරුවෙනි, ... ඉශ්‍රායෙල්වරුන් සමග ස්වාමින්වහන්සේ නොසිටින නිසා ඉශ්‍රායෙල් යුධ සේනාව ඔබ සමග නොයත්වා.**
> **නුමුත් ඔබ යන්නෙහි නම්, ශක්තිමත් වී සටනට බලවත් වෙයන්න; දෙවියන්වහන්සේ සතුරා ඉදිරියෙහි ඔබ හෙළා දමනසේක. මක්නිසාද උපකාර කරන්ටත්, හෙළාදමන්ටත් දෙවියන්වහන්සේට බලය ඇත්තේය.** (2 ලේකම් 25:7-8)

රජයේ නායකත්වය පිහිටුවන්නේ දෙවියන්වහන්සේ බව මෙම පදවලින් පැහැදිලිව පෙනේ. මෙලොව සටන් වලදීත්, එක්කෙනෙක්ව උසස් කරමින්ද තවත් කෙනෙක් පහත් කරමින්ද උන්වහන්සේ ක්‍රියා කරන සේක. අවාසනාවකට නිවසේදී හා සභාවන්හිදී අධිකාරිත්ව ව්‍යුහය අනිසි ලෙස භාවිතා කරන්නා සේම රජයද ඒවා අනිසි ලෙස භාවිතා කරයි. දුෂ්ට හා අනුකම්පා රහිත නායකයෝ බොහෝ රටවල බලය අල්ලාගෙන ඇත්තාහ. බලයේ උල්පත දෙවියන්වහන්සේ බව පිළිගැනීම ඔවුන් ප්‍රතික්ෂේප කරන අතර එනිසා ඇදහිලිවතුන් දුක්විඳීමට පත්ව ඇත. ඕනෑම රජයක් හෝ නීතියක් හෝ දේව වචනයෙන් උගන්වන දේට පටහැනිව ක්‍රියා කරන විට, ඔබ මිනිසාට නොව දෙවියන්වහන්සේට අවනත විය යුතුය. යේසුස්වහන්සේගේ නාමයෙන් දේශනා නොකරන ලෙස ගෝලයන්ට පැවසූ විට ...

> **පේතෘස්ද ප්‍රේරිතයෝද උත්තරදෙමින්: මනුෂ්‍යයන්ට වඩා දෙවියන්වහන්සේට අප විසින් කීකරු විය යුතුය.** (ක්‍රියා 5:29)

මෙම ඉල්ලීම, මුළු ලෝකයාටම ශුභාරංචිය දේශනා කරන ලෙස යේසුස්වහන්සේ දුන් ආඥාවට පටහැනි බව ඔව්හු තේරුම් ගත්හ. අනෙකුත් ක්ෂේත්‍රයන්හි ඔබ ...

> **එබැවින් උදහස නිසා පමණක් නොව හෘදයසාක්ෂිය නිසාද යටත්වෙන්ට ඕනෑය.**
> **එසේය, නුඹලා සුංගම් දෙන්නෙත් මේ නිසාය. මක්නිසාද ඔව්හු මේ කාරණයෙහිම නොකඩව යෙදී සිටින්නාවූ දෙවියන්වහන්සේගේ සේවකයෝය. එබැවින් සියල්ලන්ට දෙන්ට යුතු දේ දීපල්ලා. සුංගම් දෙන්ට නිස්සාට සුංගම්ද අයබදු දෙන්ට නිස්සාට අයබදුද දීපල්ලා; භය වෙන්ට නිස්සාට භය වෙයල්ලා; ගෞරව ලබන්ට නිස්සාට ගෞරව කරපල්ලා.** (රෝම 13:5-7)

ඔවුන්ගේ මහත් වගකීම හා ඔවුන් බලය අනිසි ලෙස භාවිතා කිරීමට ඇති ඉඩ කඩ නිසා ඔබ ...

> **සියලු ආකාර භක්තියෙන් සහ සන්සුන්කමින් සමාදාන වූ නිශ්චල ජීවිතයක් ගතකරන පිණිස රජවරුන් හා උසස් තනතුරු දරන සියල්ලන් ඇතුළුව, සියලු මනුෂ්‍යයන් උදෙසා යාච්ඤා කළ යුතුය. (1 තිමෝති 2:2)**

## සියලු බලයන් දෙවියන්වහන්සේගේ බලයෙන් වේ

ස්වාභාවික හා ආත්මික ලෝකයන්හි සියලු බලයේ ප්‍රභවය දෙවියන්වහන්සේ වේ. සියලුම බලයන් උන්වහන්සේ පවරන ලද ඒවාය. උන්වහන්සේ මෙම බලය පවරන ලද්දේ නිවසේ, සභාවේ, වෙළඳම්පළේ, සමාජයේ හා ජාතියේ එම ව්‍යුහය පිහිටුවන පිණිසය. එහෙත් පවරන ලද සියලු බලය නැවත උන්වහන්සේගේම බලය බවට පත්වන දිනයක් අනාගතයේදී පැමිණෙනු ඇත.

> **එවිට කෙළවර පැමිණේ: උන්වහන්සේ සියලු අධිපතිකම්ද බලයද පරාක්‍රමයද නැතිකළ කල්හි, උන්වහන්සේ රාජ්‍යය පියවූ දෙවියන්වහන්සේට භාරදෙනසේක. (1 කොරින්ති 15:24)**

> **තවද සියල්ල උන්වහන්සේට යටත් කරනු ලැබූවාම, දෙවියන්වහන්සේ සියල්ලන් තුළ සියල්ල වන පිණිස පුත්‍රයාණන්වහන්සෙත් තමන්ට සියල්ල යටත් කළ තැනැන්වහන්සේට යටත්වනසේක. (1 කොරින්ති 15:28)**

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න

2. අධිකාරී බලය ක්‍රියාත්මක කිරීම පිණිස, ඔබ අධිකාරී බලය යටතේ සිටිය යුත්තේ මන්ද?

3. යේසුස්වහන්සේ අධිකාරී බලයට යටත්ව අධිකාරී බලය සහිත මිනිසෙකු වූයේ කෙසේදැයි පැහැදිලි කරන්න.

4. දෙවියන්වහන්සේ විසින් සභාවෙහි පිහිටුවා ඇති, අධිකාරිත්ව ව්‍යුහයන් පිළිබඳව ඔබ උගත් දේ සාරාංශගත කරන්න.

5. දෙවියන්වහන්සේ විසින් නිවෙසෙහි පිහිටුවා ඇති අධිකාරිත්ව ව්‍යුහයන් පිළිබඳව ඔබ උගත් දේ සාරාංශගත කරන්න.

6. වැඩ සබඳතා අතර දෙවියන්වහන්සේ පිහිටුවා ඇති අධිකාරිත්ව ව්‍යුහය පහදන්න.

7. රජයේ නිලධාරීන් හා ඇදහිලිවතුන් අතර සබඳතාව පැහැදිලි කෙරෙන බයබලීය යොමුවක් දෙන්න.

8. ඔබට ඉහළින් සිටින නිලධාරියෙකුට එරෙහිව ඔබ කැරලි ගැසුවහොත්, ඔබ සැබවින්ම කැරලි ගසන්නේ කවරෙකුට එරෙහිවද?

(මේ පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදය අවසානයේ ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. සභා සංවිධානය තුළ ක්‍රියාත්මක වන අධිකාරී බලයට නිදසුනක් සඳහා ක්‍රියා 6:1-6 අධ්‍යයනය කරන්න. මෙම කොටසින් අධිකාරී බලය පිළිබඳව ඔබ උගත් දේ සාරාංශගත කරන්න.

2. එවෝදියා හා සින්දිකී අතර සමාදානය ඇතිකර ගන්නා ලෙස පාවුලුතුමා පිලිප්පි 4:2හි ඉල්ලා ඇත. අර්බුදය කුමක්දැයි අපට පවසා නැත. එහෙත් එවැනි ගැටළුවක් ඇති විට, කෙනෙකුට නිසියාකාරව අධිකාරී බලයට යටත්විය නොහැකිය.

3. 1 සාමුවෙල් 13 කියවන්න. මෙම කතාවේදී රජු ලෙස තමාට නිත්‍යානුකූලව අයත් නොවන අධිකාරී බලයක් සාවුල් රජතුමා බාරගත්තේය. දෙවියන්වහන්සේගේ දිව්‍යසිවරයෙකුට පමණක් කළ හැකි පූජාවක් ඔහු ඔප්පු කළේය.

   1 සාමුවෙල් 15 කියවන්න. මෙහිදී අමලෙක්වරුන් සමග කළ සටනේදී කොල්ලා කා ගත් දේ අතරින් ඇතැම් දේ විනාශ නොකරමින් සාවුල් රජතුමා දෙවියන්වහන්සේගේ නියෝගයට එරෙහි විය.

   සාවුල් රජතුමා අකීකරුකමේ ප්‍රතිඵල මොනවාද? (1 සාමුවෙල් 13:13-14 හා 15:26 කියවන්න)

4. යොහන් 19:10-11 කියවන්න. යේසුස්වහන්සේ කෙරෙහි බලය ඇති බව පිලාත් සිතුවේය. මෙය සත්‍යයක්ද?

5. 1 කොරින්ති 7හි භාර්යාවන්ට හා ස්වාමිපුරුෂයන්ට දී ඇති උපදෙස් සාරාංශගත කරන්න.

6. ක්‍රියා 23හි සඳහන් පාවුලුතුමා තමා කතා කරන්නේ දෙවියන්වහන්සේගේ උත්තම පූජකයාට බව දැනගත් විට, ඔහු අධිකාරී බලයට යටත් වූ ආකාරය කියවන්න. ඔහු ප්‍රතිචාර දැක්වූයේ කෙසේද?

# දහසය වන පරිච්ඡේදය

## බලය පිළිබඳ දසවන මූලධර්මය: උන්වහන්සේගේ නැවත නැගිටීමේ බලය

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් ඔබට:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- නැවත-නැගිටීම අර්ථ විග්‍රහ කිරීමට
- යේසුස්වහන්සේගේ නැවත-නැගිටීමේ වැදගත්කම පැහැදිලි කිරීමට
- ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයේ නැවත-නැගිටීමේ බලයේ වර්තමාන කාර්යයන් සාරාංශ කිරීමට
- නැවත-නැගිටීමේ බලයේ ප්‍රභවය හඳුනාගැනීමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදයන්

> **යම් අන්දමකින් මළවුන්ගෙන් නැගිටීමට පැමිණෙන ලෙස, උන්වහන්සේ සහ උන්වහන්සේගේ නැවත-නැගිටීමේ බලයත් උන්වහන්සේගේ දුක්වල පංගුකාරකමත් දැනගන්නා පිණිසත්ය. (පිලිප්පි 3:10,11)**

### හැඳින්වීම

යේසුස්වහන්සේගේ මාර්ගයෙන් ආත්මික බලය අත්දැකිය හැකි ක්‍රම දෙකක් ගැන පාවුලුතුමා පැවසීය.

> **යම් අන්දමකින් මළවුන්ගෙන් නැගිටීමට පැමිණෙන ලෙස, උන්වහන්සේ සහ උන්වහන්සේගේ නැවත-නැගිටීමේ බලයත් උන්වහන්සේගේ දුක්වල පංගුකාරකමත් දැනගන්නා පිණිසත්ය. (පිලිප්පි 3:10,11)**

ඇදහිලිවතුන් තුළ ඇත්තාවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත-නැගිටීමේ බලය පිළිබඳව මෙම පරිච්ඡේදයෙන් අවධාරණය කෙරේ. ඊළඟ පරිච්ඡේදයේ සඳහන් වන්නේ උන්වහන්සේගේ දුක්විඳීමේ සහභාගිකමේ බලය පිළිබඳව වේ. යේසුස්වහන්සේගේ නැවත නැගිටීම පිළිබඳ අධ්‍යයනය කෙරෙහි සාතන් දක්වන වෛරය තරම් වෛරයක් වෙනත් නැති තරම්ය. මක්නිසාද බයිබලයේ සඳහන් වෙනත් කිසිඳු සිදුවීමකට වඩා මෙමගින් ක්‍රිස්තුස්වහන්සේ පරාජය කිරීමට ඔහුට ඇති නොහැකියාව පෙන්වන බැවිනි.

### නැවත-නැගිටීම යන්නෙහි අර්ථවිග්‍රහය

"නැවත-නැගිටීම" යන්නෙහි තේරුම මරණයෙන් නැවතත් ජීවනයට පැමිණීම හෝ මරණයෙන් නැගිටීම වේ.

### යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත-නැගිටීම

සියලු මනුෂ්‍ය වර්ගයාගේ පාපය වෙනුවෙන් උන්වහන්සේ මැරුණු පසු, දෙවියන්වහන්සේ යේසුස්වහන්සේව මළවුන්ගෙන් නැගිටවූ සේක.

> **ජීවනයේ අධිපතියාව මැරුවහුය. දෙවියන්වහන්සේ උන්වහන්සේව මළවුන්ගෙන් නැගිටෙවූ සේක. අපි ඊට සාක්ෂිකාරයෝය. (ක්‍රියා 3:15)**

**නුඹලා උන්වහන්සේ සමග බව්තිස්මයෙහි තැන්පත්කරනු ලැබ, උන්වහන්සේව මළවුන්ගෙන් නැගිටෙවුවාවූ දෙවියන්වහන්සේගේ ක්‍රියාකිරීම කෙරෙහි ඇදහිම කරණකොටගෙන, උන්වහන්සේ සමග නැගුටුවනු ලැබුවහුය. (කොලොස්සි 2:12)**

**උන්වහන්සේව මළවුන්ගෙන් නැගුටුවා, උන්වහන්සේට මහිමය දුන්නාවූ දෙවියන්වහන්සේ කෙරෙහි උන්වහන්සේ කරණකොටගෙන අදහන්නාවූ නුඹලා උදෙසා, උන්වහන්සේ කාලවල කෙළවරදී ප්‍රකාශකරනු ලැබූ සේක. (1 පේතෲස් 1:21)**

යේසුස්වහන්සේගේ නැවත-නැගිටීම පිළිබඳ කතාව මතෙව් 28, මාක් 16, ලූක් 24 හා යොහන් 20 හි ඔබට කියවිය හැකිය.

## යේසුස්වහන්සේගේ නැවත නැගිටීමේ වැදගත්කම

යේසුස්වහන්සේගේ නැවත-නැගිටීම ප්‍රබල සත්‍යයකි. මක්නිසාද එය අපගේ ඇදහිල්ලට මූලික වේ.

**මළවුන්ගේ නැගිටීමක් නැත්නම්, ක්‍රිස්තුස්වහන්සේත් නැගුටුවනු නොලැබූ සේක. ඉඳින් ක්‍රිස්තුස්වහන්සේ නැගුටුවනු නොලැබුසේක් නම්, අපගේ දේශනාකිරීම නිෂ්ඵලය. නුඹලාගේ ඇදහිමත් නිෂ්ඵලය. (1 කොරින්ති 15:13-14)**

ගැළවීම උදෙසා යේසුස්වහන්සේගේ නැවත-නැගිටීම විශ්වාස කිරීම අවශ්‍යය.

**යේසුස්වහන්සේ ස්වාමින්වහන්සේයයි නුඹේ මුඛයෙන් ප්‍රකාශකරන්නෙහි නම්, දෙවියන්වහන්සේ විසින් උන්වහන්සේව මළවුන්ගෙන් නැගිටවූ බව සිතින් අදහන්නෙහි නම්, නුඹ ගළවනු ලබන්නෙහිය. (රෝම 10:9)**

ඇදහිලිවතුන් සාධාරණ බව යේසුස්වහන්සේගේ නැවත-නැගිටීමෙන් ස්ථිර කෙරේ.

**උන්වහන්සේ** (යේසුස්වහන්සේ) **වනාහි අපේ වරද නිසා පාවාදෙනු ලැබ, අප ධර්මිෂ්ඨකොට ගණන්ගනු ලැබීම සඳහා නැගුටුවනු ලැබූසේක. (රෝම 4:25)**

නැවත නැගිටීම යන්නෙහි තේරුම මරණය පරාජය කළ බවය.

**එහෙයින් දරුවන් ලේ හා මාංසයට පංගුකාරයන්ව සිටින නිසා උන්වහන්සේත් එම ආකාරයෙන්ම ඒවාට පංගුකාරයෙන් වූසේක. එසේ කළේ මරණය කෙරෙහි බලය ඇත්තා වන යක්ෂයාව මරණය කරණකොටගෙන බල නැති කොට (හෙබ්‍රෙව් 2:14)**

යේසුස්වහන්සේගේ නැවත-නැගිටීම මගින් උන්වහන්සේ සියලු මැවිල්ලට වඩා උත්තරීතර බව සහතික කෙරේ.

**උන්වහන්සේගේ බලයේ මහත්කම කිමෙක්ද කියාත්, නුඹලා දැනගන්න පිණිස නුඹලාගේ සිත් නැමැති ඇස් පහදන ලෙසත්ය.**
**උන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ තුළ ඉෂ්ටකළාවූ ස්වකීය පරාක්‍රමයේ ශක්තිමත්කමේ ඒ ක්‍රියාකිරීමේ ප්‍රකාරයට ක්‍රිස්තුස්වහන්සේව මළවුන්ගෙන් නැගුටුවා,**
**සියලු අධිපතිකමටත් බලයටත් පරාක්‍රමයටත් ස්වාමිකමටත් මේ ලෝකයෙහි පමණක් නොව පරලෝකයෙහිත් සඳහන් කරන ලද සියලු නම්වලටත් වඩා උසස්කොට ස්වර්ගීය ස්ථානවල තමන් දකුණු පැත්තෙහි හිඳුවා,**
**සියලු දේවල් උන්වහන්සේගේ පාදවලට යටත්කොට, සභාව උදෙසා සියල්ලට ප්‍රධානියා වෙන්ට උන්වහන්සේ නියම කළ සේක. (එපීස 1:19-22)**

යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා බව නැවත-නැගිටීමෙන් සහතික කෙරේ.

**ශුද්ධකමේ ආත්මයේ ප්‍රකාරයට දේව පුත්‍රයාණන් හැටියට මළවුන්ගෙන් නැගිටීම කරණකොටගෙන බලයෙන් යුක්තව ප්‍රකාශ කරනු ලැබූ සේක. (රෝම 1:5)**

## අනාගත නැවත-නැගිටීම

බයිබලය පවසන්නේ අනාගතයේ දී අප දන්නාවූ මේ ලෝකය අවසන් වන කාලයක් පැමිණෙන බවය. ඒ අවස්ථාවේ මැරුණවූ සියලු දෙනම නැවත-නැගිටිනු ඇත. ඇදහිලිවතුන් ලෙස මියගිය අය සදාතන ජීවනයට නැවත-නැගිටුවනු ලැබේ. නොඇදහිලිවතුන් ලෙස මියගිය අය නැවත-නැගුටුවා, විනිශ්චය කර සදාතන දඬුවමට පමුණුවනු ඇත.

අනාගත නැවත-නැගිටීම පිළිබඳව 1 කොරින්ති 6:14; 15:1-58; 1 තෙසලෝනික 4:13-18; යොහන් 5:28-29; 2 කොරින්ති 4:14 හා එළිදරව් 20:4-6 කියවන්න. අනාගත නැවත-නැගිටීම ගැන හාවස්ටයිම් ජාත්‍යාන්තර ආයතනයේ "*ඇදහිල්ලේ අත්තිවාරම්*" පාඩමාලාවෙන් ඔබට විස්තරාත්මකව ඉගෙනගත හැකි වේ.

## නැවත-නැගිටීමේ වර්තමාන බලය

මළවුන්ගෙන් නැවත-නැගිටීම යම්කිසි දිනෙක අප දත්දකින බව සත්‍යයකි. එහෙත් නැවත-නැගිටීමේ බලය අනාගතයට පමණක් සීමා නොවේ. එහි බලය ඇදහිලිවතුන්ට දැන් අත්දැකීමට පුළුවන. දැන් ආගමික බලයේ පදනම නැවත-නැගිටීම වේ. මන්ද එය ඔබට පහත දැක්වෙන දේ සපයන බැවිනි.

### අලුත් බලාපොරොත්තුවක්:

ඔබට බලාපොරොත්තුව ඇත්තේ නැවත-නැගිටීමේ බලය තුළිනි. ඔබගේ ජීවිතය සොහොනින් අවසන් වන්නේ නැත. ඔබට සදාතන ජීවනය ලැබෙනු ඇත.

> **අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පියවූ දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා. මක්නිසාද ජීවන බලාපොරොත්තුවක් ලැබෙන පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටීම කරණකොටගෙන උන්වහන්සේ තමන්ගේ මහත් දයාව ලෙස අප නැවත උත්පාද කළ සේක. (1 පේතෘස් 1:3, 6)**

බලාපොරොත්තුව ප්‍රබල බලයකි. බලාපොරොත්තුව නොමැතිව මනුෂ්‍යයෝ අධෛර්යට හා වෙහෙසට පත්වෙති. නැවත-නැගිටීමේ බලය මගින් බලාපොරොත්තුව පණගන්වයි.

### අලුත් ජීවිතයක්

ඔබ යේසුස්වහන්සේ ගැළවුම්කරු ලෙස පිළිගත් විට පාපයේ ආත්මික මරණයෙන් ආත්මික ජීවිතයකට ඔබ නැවත-නැගිටිනු ඇත.

> **නුඹලාගේ වරදවල ද මාංසයේ අචර්මඡේදයෙහි ද මැරී සිටියාවූ නුඹලා උන්වහන්සේ සමග ජීවත්කරවූ සේක. එසේය, උන්වහන්සේ අපේ සියලූ වරද අපට කමාකළ සේක. (කොලොස්සි 2:13)**

ආත්මික නැවත නැගිටීමේ ප්‍රතිඵලයක් වන්නේ පාපයට මරණයය. නැවත-නැගිටීමේ බලය තුළින් ඔබට අලුත් ජීවිතයක් ගතකළ හැකිය. කලින් ජීවත්වූ ආකාරයට ජීවත්වන්නේ නැත. ඔබ ලෝකයේ නපුරට මියගොස් යේසුස්වහන්සේ තුළ ජීවත් වන්නේය.

ස්වයං දියුණුව මගින් ඔබ අලුත් ජීවිතයක් ගත කළ නොහැකිය. ඔබගේම බලයෙන් ඔබට එය කළ නොහැකිය. ඔබ එසේ ජීවත් වන්නේ නැවත-නැගිටීමේ බලයෙනි.

> **එලෙසම නුඹලාත් පාපයට මැරී සිටින්නන් කොටද යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේට ජීවත්ව සිටින්නන් කොටද සිතාගනිල්ලා.**
> **එබැවින් නුඹලා නුඹලාගේ මරණීයවූ ශරීරයේ තෘෂ්ණාවලට කීකරුවන ලෙස පාපය එහි අධිපතිකම් නොකෙරේවා.**

**නුඹලාගේ අවයවයන් අධර්මිෂ්ඨකමේ ආයුධ කොට පාපයට භාර නොදී, නුඹලාම මළවුන්ගෙන් ජීවත්ව සිටින්නන් මෙන් දෙවියන්වහන්සේට භාරවී, නුඹලාගේ අවයවයන් ධර්මිෂ්ඨකමේ ආයුධකොට උන්වහන්සේට භාරදීපල්ලා.**
**කුමක්හෙයින්ද, නුඹලා ව්‍යවස්ථාව යටතෙහි නොව අනුග්‍රහය යටතෙහි සිටින බැවින්, පාපය නුඹලා කෙරෙහි අධිපතිකම් නොකරන්නේය. (රෝම 6:11-14)**

ඔබ මුහුණ දෙන සටන් වන්නේ ඔබ තුළ ක්‍රියා කරන ආත්මික මරණය හා ජීවිතය අතර ඒවා වේ. නැවත-නැගිටීමේ බලය මගින් පාපයේ හා මරණයේ ව්‍යවස්ථාව පරාජය කර ඔබව ආත්මික බන්ධනයෙන් නිදහස් කරනු ලබයි. යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක.

**සොරා එන්නේ සොරකම්කරන්ටත් මරන්ටත් විනාශකරන්ටත් පමණක්ය. මා ආවේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් එය අධිකලෙස ලැබෙන පිණිසත්ය. (යොහන් 10:10)**

අනාගතයේ සදාතන ජීවනය පමණක් නොව, වර්තමානයේ අධිකවූ ජීවනයද නැවත නැගිටීමේ බලයෙන් ඔබගේ වේ.

## අලුත් ස්වාමියෙක්

ආත්මික නැවත-නැගිටීම, යේසුස්වහන්සේ ඔබගේ ජීවිතයේ ස්වාමියා බවට පත් කරයි. ඔබම වෙනුවෙන් ජීවත්වීම වෙනුවට ඔබ උන්වහන්සේ වෙනුවෙන් ජීවත් වේ.

**උන්වහන්සේ සියල්ලන් වෙනුවට මැරුණේ, ජීවත්වන්නන් තවත් තමුන් උදෙසා ජීවත් නොවී, ඔවුන් වෙනුවට මැරී නැවත නැගුටුණාවූ තැනැන්වහන්සේ උදෙසා ජීවත්වන පිණිසය. (2 කොරින්ති 5:15)**

බලය ලැබෙන්නේ නැවත-නැගිටීම නිසා ඔබගේ තත්වය ඔබ අවබෝධ කර ගැනීමෙනි, ඔබ ජීවමාන දෙවියන්වහන්සේගේ සේවකයෙකු වේ. ඔබ තවදුරටත් සාතන්ගේ දාසයෙකු නොවේ.

## අලුත් ජීවිත පරමාර්ථයක්

ආත්මික නැවත-නැගිටීම මගින් අලුත් ජීවිත පරමාර්ථයක් ඇතිවේ. මෙලොව පවතින ද්‍රව්‍යමය ලැබීම, තෘෂ්ණාවෙන් ආදි තාවකාලික දේ වෙනුවට ඔබගේ අවධානය සදාතන දේ කෙරෙහි යොමු වේ.

**ඉඳින් නුඹලා ක්‍රිස්තුස්වහන්සේ සමග නැගුටුවනලද්දහු නම් උසස්තැන්හි තිබෙන දේවල් සොයාපල්ලා, එහි ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ දකුණු පැත්තේ වැඩහිඳින සේක. පොළොවේ තිබෙන දේ නොව උසස්තැන්හි තිබෙන දේම සලකා පල්ලා. මක්නිසාද නුඹලා මළහුය. නුඹලාගේ ජීවනය ක්‍රිස්තුස්වහන්සේ සමග දෙවියන්වහන්සේ තුළ සඟවා තිබේ. (කොලොස්සි 3:1-3)**

නැවත-නැගිටීමේ බලය අත්දුටු ඇදහිලිවන්තයෙකුව තවදුරටත් ලෝකයේ ඇති ද්‍රව්‍යමය දේ මගින් පාලනය නොකෙරේ. ලෝක වාතාවරණය තවදුරටත් ඔහුව පරාජය නොකරයි. නැවත-නැගිටීමේ බලයේ අත්දැකීම් ඔහුට නව දෘෂ්ටියක් හා පරමාර්ථයක් ගෙන දෙයි.

## අලුත් උත්තේජනය කිරීමක්

**තවද යේසුස්වහන්සේව මළවුන්ගෙන් නැගිටෙවූ තැනැන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නුඹලා තුළ වාසයකරනසේක් නම්, ක්‍රිස්තුස් යේසුස්වහන්සේව මළවුන්ගෙන් නැගිටෙවූ තැනැන්වහන්සේ නුඹලා තුළෙහි වසන තමන්ගේ ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන නුඹලාගේ මරණීය ශරීරයන්ද ජීවත් කරන සේක. (රෝම 8:11)**

"උත්තේජනය" යන වචනයෙහි තේරුම ප්‍රාණවත් කිරීමක් හා ජීවනය ලබා දීම වේ. දෙවියන්වහන්සේ දැනටමත් ඔබ පාපයෙන් ජීවත් කර තිබේ.

**නුඹලා නුඹලාගේ වරද සහ පාප කරණකොටගෙන මැරී සිටි කල උන්වහන්සේ නුඹලා ජීවත්කළ සේක. (එපීස 2:1)**

එමෙන්ම ඔබගේ මනුෂ්‍ය ශරීරය ද උත්තේජනය කිරීමට දෙවියන්වහන්සේට අවශ්‍යය. ඔබගේ මැරෙණ සුළු ශරීරය නැවත නැගිටීමේ බලයෙන් ජීවත් කරවීමට උන්වහන්සේට අවශ්‍යය.

> **නුමුත් ඒ බලයේ ඉතා උතුම්කම අපට නොව දෙවියන්වහන්සේට අයිති වන පිණිස මේ වස්තුව අපිට මැටි භාජනවල දරමුව. (2 කොරින්ති 4:7)**

ඔබ යේසුස්වහන්සේ ඔබගේ ගැළවුම්කරු ලෙස පිළිගෙන ඇත්නම් හා ශුද්ධාත්මයෙන් පිරී ඇත්නම්, එවිට යේසුස්වහන්සේ මරණයෙන් නැගුටවූ ඒ බලයම ඔබ තුළ ජීවත් වේ. එම ජීවනය ඔබ තු=ලින් ගලා, නැවත නැගිටීමේ බලය මගින් දැන් ඔබව උත්තේජනය කළ හැකිය.

## නැවත නැගිටීමේ බලයේ ප්‍රභවය

ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයේ මෙම නැවත නැගිටීමේ බලයේ ප්‍රභවය, යේසුස්වහන්සේ වේ. උන්වහන්සේ මෙසේ පැවසූ සේක.

> **නැවත නැගිටීම ද ජීවනය ද මමය, මා කෙරෙහි අදහාගන්නා මළ නුමුත් ජීවත්වන්නේය. (යොහන් 11:25)**

ස්වභාවික ජීවිතයේ ජීවය රුධිරයේ වන්නාසේම ආත්මික ජීවිතයේ ජීවය යේසුස්වහන්සේගේ රුධිරය තුළින් වේ. ස්වභාවික රුධිරය ඔබගේ නහර තුළින් ගලායන්නාසේම නැවත නැගිටීමේ ජීවය ඔබගේ ආත්මය තුළින් ගලා යයි. ඔබ දැන් උන්වහන්සේගේ නැවත නැගිටීමේ බලය තුළ තුළ ගමන් කරන්නෙහිද? ඔබගේ දෛනික කිතුනු ජීවිතයේදීත් එසේමද? ඔබගේ සේවයේ කෙසේද? එම ගලා යෑමට අදම සම්බන්ධවන්න.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

______________________________________________

______________________________________________

2. "නැවත නැගිටීම" අර්ථවිග්‍රහ කරන්න.

______________________________________________

______________________________________________

3. යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැවත-නැගිටීමේ වැදගත්කම සාරාංශ කරන්න.

______________________________________________

______________________________________________

4. මෙම ප්‍රකාශය සත්‍යද, අසත්‍යද? "ඇදහිලිවන්තයෙකුට නැවත-නැගිටීමේ බලය අත්දැකිය හැක්කේ අනාගතයේදී ඔහු මළවුන්ගෙන් නැවත නැගුටුවූ පසුවය" මෙම ප්‍රකාශය ________

5. ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයේ පවතින නැවත-නැගිටීමේ බලයේ වර්තමාන පරමාර්ථය සාරාංශ කරන්න.

______________________________________________

______________________________________________

______________________________________________

6. ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයේ පවතින නැවත-නැගිටීමේ බලයේ ප්‍රභවය කවුරුන්ද?

______________________________________________

(මේ පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ ඇත)

## තවදුරටත් අධ්‍යනය කිරීම සඳහා

1. යේසුස්වහන්සේ කිසිදිනෙක අවමංගල්‍යයකට සහභාගි නොවූ සේක. උන්වහන්සේ සහභාගි වූයේ නැවත නැගිටීම්වලට වේ:

   - නායින් නුවර ස්ත්‍රියගේ පුත්‍රයා: ලූක් 7:11-17

   - යායිරස්ගේ දුව: මාක් 5:35-43

   - ලාසරස්: යොහන් 11:1-46

   - තමන්ගේම: මතෙව් 28, මාක් 16, ලූක් 24, යොහන් 20

2. නැවත නැගිටීම දේශනාකිරීම ශුභාරංචි පණිවුඩයේ ඉතා වැදගත් කොටසකි. ක්‍රියා 4:2; 17:18,32; 1 කොරින්ති 15:1-8,14,19-22 බලන්න.

3. ආබ්‍රහම් ජීවත්වූයේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නැවත නැගිටීමට බොහෝ කලකට පෙරය. එසේ වුවද ඔහු නැවත-නැගිටීමේ බලය අත්දුටුවේය. මේ පිළිබඳව රෝම 4:16-24 කියවන්න.

4. එලිෂාට කෙතරම් බලයක් තිබුණේද යත්, ඔහු මැරී බොහෝ කලකට පසු ඔහුගේ සොහොනට දමන ලද මළ මිනිසෙකු නැවත නැගිටවනු ලැබීය. අප බොහෝ දෙනෙකුගේ ජීවිතවලට වඩා ඔහුට ඇට-කටුවල බලයක් තිබිනි. (2 රාජාවලිය 13:20-21)

# දාහත්වන පරිච්ඡේදය

## බලය පිළිබඳ එකොළොස්වන මූලධර්මය : දුක් විඳීමේ බලය

### අරමුණු:

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- දුක්විඳීමේ ප්‍රභවය හඳුනාගැනීමට
- දුක්විඳීම් පැමිණෙන ක්‍රම පහක් ලැයිස්තුගත කිරීමට
- ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයේ දුක්විඳීමේ පරමාර්ථ සාරාංශ කිරීමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**මක්නිසාද උන්වහන්සේ දුර්වලකමින් කුරුසියෙහි ඇණගසනු ලැබූ නුමුත් දෙවියන්වහන්සේගේ බලයෙන් ජීවත්වන සේක. එසේම අපි ද උන්වහන්සේ තුළෙහි දුර්වලව සිටින නුමුත් උන්වහන්සේ සමග දෙවියන්වහන්සේගේ බලයෙන් නුඹලා උදෙසා ජීවත්වන්නෙමු.**
(2 කොරින්ති 13:4)

### හැඳින්වීම

පිලිප්පි 3:10 ඇති බලය පිළිබඳ මූලධර්ම දෙක සාකච්ජා කිරීම පසුගිය පරිච්ජේදයෙන් ආරම්භ විය.

**යම් අන්දමකින් මළවුන්ගෙන් නැගිටීමට පැමිණෙන ලෙස, උන්වහන්සේ සහ උන්වහන්සේගේ නැවත-නැගිටීමේ බලයත් උන්වහන්සේගේ දුක්වල පංගුකාරකමත් දැනගන්නා පිණිසත්ය. (පිලිප්පි 3:10,11)**

දහසය වන පරිච්ජේදයේ සැලකිල්ලට භාජනය වූයේ ඇදහිලිවන්තයෙකුගේ ජීවිතය තුළ නැවත නැගිටීමේ බලය පිළිබඳව වේ" මෙම පරිච්ජේදයේ අවධානය යොමු කෙරෙන්නේ දුක්විඳීමේ ඇති සහභාගිකමේ බලය පිළිබඳව වේ. පාවුලුතුමා යේසුස්වහන්සේ ගැන මෙසේ පැවසීය.

**මක්නිසාද උන්වහන්සේ දුර්වලකමින් කුරුසියෙහි ඇණගසනු ලැබූ නුමුත් දෙවියන්වහන්සේගේ බලයෙන් ජීවත්වන සේක. එසේම අපි ද උන්වහන්සේ තුළෙහි දුර්වලව සිටින නුමුත් උන්වහන්සේ සමග දෙවියන්වහන්සේගේ බලයෙන් නුඹලා උදෙසා ජීවත්වන්නෙමු.**
(2 කොරින්ති 13:4)

අප දුක්විඳීම දෙස බලන්නේ මිනිස් තර්කයන් හරහා වේ. මිනිසු තර්කයන් අනුව බැලූ කල, යේසුස්වහන්සේගේ කුරුසිය ශ්‍රේෂ්ඨ, උතුම් ජීවිතයක් නිරපරාදේ නාස්ති කිරීමකි. එහෙත් දෙවියන්වහන්සේගේ තර්කය අනුව එය උන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීමේ ශ්‍රේෂ්ඨතම ක්‍රමය වේ. එහි ප්‍රතිඵලය වූයේ මිනිසාට ගැළවීම ලබා දීමය.

මෙම ආත්මික බලයේ වැදගත් මූලධර්මය පාවුලුතුමාට අවබෝධ විය. දෙවියන්වහන්සේගේ බලය දුර්වලතාව තුළ සැඟවී සිටී. ඔහුට මෙසේ කීමට හැකිවූයේ එබැවිනි.

**උන්වහන්සේද: මාගේ කරුණාව නුඹට සෑහේය. මක්නිසාද දුර්වලකමේදී මාගේ බලය සම්පූර්ණවන්නේයයි මට කීසේක. එබැවින් ක්‍රිස්තුස්වහන්සේගේ ශක්තිය මා කෙරෙහි පිහිටන පිණිස මාගේ දුර්වලකම් ගැන ඉතා සන්තෝෂයෙන් පාරට්ටුකරන්නෙමි.**

> **එහෙයින් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා පැමිණෙන දුර්වලකම්වලටත් අන්තරායවලටත් හිඟකම්වලටත් පීඩාවලටත් විපත්තිවලටත් ප්‍රසන්නව සිටිමි. මක්නිසාද, මම දුර්වලව සිටින කලම ශක්තිමත්ව සිටිමි.** (2 කොරින්ති 12:9-10)

අපට දුර්වලතා හෝ අසමත්වීම් හෝ තුළ කිසිවිටෙකත් බලය පෙනෙන්නේ නැත. ඇදහිල්ලේ කේන්ද්‍රස්ථානය කුරුසිය වූ අයට මෙය පුදුමාකාර ආකල්පයකි. යේසුස්වහන්සේ නැවත නැගිටීම අත්දුටුවේ දුක්විඳීමෙන් පසුවය. නැවත නැගිටීමේ බලය ලැබෙන්නේ උන්වහන්සේගේ දුක්විඳීමේ සහභාගිකම තුළිනි.

සැබෑ ආත්මික බලය ප්‍රදර්ශනය කෙරෙන්නේ දුක්විඳීම, ගැටලු හා අර්බුද නොමැති විටෙක නොවේ. ඒවා මධ්‍යයේය. ලෝකයා හිරිහැරයක් ලෙස සලකන දෑ බලය විසින් දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කෙරෙන අවස්ථාවක් බවට එය හරවනු ලබයි.

## දුක්විඳීමේ ප්‍රභවය

දෙවියන්වහන්සේ දුක්විඳීම මැවුවේ නැත. එය මුලින්ම ලෝකයට ඇතුළු වූයේ, සාතන් විසින් පොළඹවන ලදුව මිනිසා විසින් කරන ලද පාපය තුළිනි (උත්පත්ති 3). සාතන්ගේ පරීක්ෂාවට මිනිසා ඉඩදෙමින් පව් කළ විට දුක්විඳීම ලෝකයට ඇතුළු විය. පාපයේ ප්‍රතිඵලයක් ලෙස පැමිණි දුක්විඳීම, එහි ආරම්භකයාවූ සාතන් නිසා සිදුවන්නක් බව පෙන්විය හැකිය. ඔබගේ ජීවිතයට දුක්විඳීම පැමිණෙන්නේ විවධ හේතු නිසා වුවද, සියලු දුක්විඳීම් වලට හේතුව මෙම මුල් ප්‍රභවය බව පෙන්විය හැකිය.

ඇදහිලිවතෙකුගේ ජීවිතයේ, දුක්විඳීම සාතන් නපුරක් සඳහා දෙන්න බලාපොරොත්තුවුවද දෙවියන්වහන්සේට එය උන්වහන්සේගේ පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා යහපතකට හැරවිය හැකිය. එය සැබවින්ම ඔබගේ ජීවිතය තුළ දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කෙරෙන අවස්ථාවක් විය හැකිය.

## දුක්විඳීමට හේතුව

දුක්විඳීම්, ගැටලු හා පීඩාවන් පිළිබඳව බයිබලයේ බොහෝ දේ සඳහන්ව ඇත. එහි ඉගැන්වීම් සාරාංශගත කළ විට, ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයට දුක්විඳීම් පැමිණිය හැකි ක්‍රම පහක් ඇති බව පෙනේ. ඔබ ජීවිතය තුළ මුහුණ දෙන්නාවූ සියලු දුක්විඳීම් මින් එක් ක්‍රමයකින් පැමිණේ.

### ඔබ වටා සිටින අය

දුක්විඳීම් හා අසීරු අවස්ථාවන් ඔබගේ ජීවිතයට, ඔබ වටා සිටින අයගෙන් පැමිණිය හැකිය.

යෝසෙප්, මේ ආකාරයෙන් දුක්විඳීමට පත්වූ කෙනෙකු පිළිබඳ නිදසුනකි. ඔහුගේ කිසිදු වරදක් නොමැතිව, යෝසෙප්ව ඔහුගේ සහෝදරයන් විසින් මිසරයට විකුණන ලදුව, එහිදී පොතිපර්ගේ බිරිඳ නිසා සිරගත කළ අතර සිරගෙය තුළදී ඔහු උපකාර කළ අයද ඔහුව අමතක කළෝය. එහෙත් ඔහුගේ ප්‍රතිචාරයට සවන් දෙන්න. යෝසෙප් මෙසේ පැවසුවේය.

> **නුඹලා මේ රටට මා වික්ක නිසා ශෝක නොවෙල්ලා, නුඹලාටම කෝප නොවෙල්ලා, මක්නිසාද දෙවියන්වහන්සේ ජීවිත ආරක්ෂා කරන පිණිස නුඹලාට පෙරටුව මා එවූ සේක... එබැවින් මා මෙහි එවුවේ නුඹලා නොව දෙවියන්වහන්සේය.** (උත්පත්ති 45:5,8)

### ජීවිතයේ අවස්ථාවන්

දුක්විඳීම් පැමිණෙන දෙවන ක්‍රමය වන්නේ ජීවිතයේ විවිධ අවස්ථාවන් මගිනි. මෙය බයිබලයේ රූත් පොතේ සඳහන් නයෝමිගේ අත්දැකීම්වලින් පැහැදිලි වේ. ඇගේ ස්වාමිපුරුෂයාගේ හා

දරුවන්ගේ මරණය නිසා ඈ දුකින් තිත්තව සිටියාය.

යේසුස්වහන්සේ නැවත පැමිණ මරණයේ අවසාන සතුරා පරාජය කරන තුරු, මරණය ජීවිතයේ කොටසක් වේ. මරණය පැමිණියේ මුල් පාපය නිසා වන අතර එය අප සියලු දෙනාම මුහුණ දිය යුතු ස්වභාවික අවස්ථාවකි. මන්ද "එක් වරක් මරණය... නියමව තිබේ". (හෙබ්‍රෙව් 9:27)

ජීවිතයේ මේ අසිරු අවස්ථාවන් නයෝමි අත්දුටු විට, ඈ මෙසේ පැවසුවාය. "මට තවදුරටත් නයෝමි (මින් අදහස් වන්නේ ආශිර්වාදලත් යන්නය) යයි නොකියන්න, මට මාරා යයි කියන්න" මාරා යන නමෙහි තේරුම "තිත්ත" යන්න වේ.

## ඔබගේ සේවය

දුක්විඳීම සඳහා තෙවැනි හේතුව වන්නේ ස්වාමින්වහන්සේ වෙනුවෙන් කරන ඔබගේ සේවයය.

නව ගිවිසුමේ සඳහන් දුක්විඳීම මෙසේය: උන්වහන්සේගේ නාමය නිසා (ක්‍රියා 9:16), ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් (පිලිප්පි 1:29), දේව රාජ්‍යය සඳහා (2 තෙසලෝනික 1:5), ශුභාරංචිය සඳහා (2 තිමෝති 1:11-12), යහපත්කම් සඳහා (1 පේතෘස් 2:19-20; 3:17), ධර්මිෂ්ඨකම නිසා (1 පේතෘස් 3:14), කිතුනුවෙකු වශයෙන් (1 පේතෘස් 4:15-16) හා දෙවියන්වහන්සේගේ කැමැත්තේ ප්‍රකාරයට (1 පේතෘස් 4:19).

ප්‍රේ%රිතවූ පාවුලුතුමා සේවයේ ප්‍රතිඵලයක් ලෙස දුක්විඳීම පිළිබඳ නිදසුනකි. ඇතැම් අය දුක්විඳීම අසාර්ථක බවේ හෝ ඇදහිල්ලේ මඳකමේ හෝ ලකුණක් ලෙස සලකති. මෙය සැබෑ නම් ප්‍රේරිතවූ පාවුල්තුමාට ඇදහිල්ල නොතිබූ අතර මුළු සභා ඉතිහාසයේම අසාර්ථකම තැනැත්තා වේ.

ආසියාවට පැමිණි කළ ජීවිතය ගැන පවා බලාපොරොත්තුවක් නැති තරමට, උසුලන්ට බැරි බරකින් තෙරපී සිටි බව පාවුලුතුමා පැවසිය (2 කොරින්ති 1:8). සාමය හා සමෘද්ධිය පමණක් ඇති බව ඇදහිලිවතුන්ට පෙන්වන ප්‍රිතිමත් එවැන්ජලිස්තවරුන්ට වඩා වෙනස් තත්වයක් ඔහු ඉදිරිපත් කරයි.

දෙවියන්වහන්සේ පාවුලුතුමාව පළමුවෙන්ම සේවයට කැඳවූ විට ස්වාමින්වහන්සේ වෙනුවෙන් ඔහුට විඳින්නට සිදුවන දුක් පීඩා ගැන දැන්වූ සේක (ක්‍රියා 9:16). දුක්විඳීම පිළිබඳව පාවුලුතුමාගේ ප්‍රතිචාරය වූයේ "ක්‍රිස්තුස්වහන්සේට කිප දෙනෙක් දිනා ගැනීම සඳහා සියල්ල නැතිවීම" ලෙසය. ඔහු ඇදහිලිවතුන්ට මෙසේ ලියා යැවිය. "ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහන්ට පමණක් නොව, උන්වහන්සේ උදෙසා දුක් විඳින්ටත්.. නුඹලාට වරප්‍රසාදය දෙන ලද්දේය" (පිලිප්පි 1:29).

සේවය උදෙසා දුක්වින්දේ පාවුලුතුමා පමණක් නොවේ. නව ගිවිසුම් යුගයේ මුළු සභාවම දුක් වින්දේය (ක්‍රියා 8). ඔවුන් දරාගත් ඇතැම් කෲර පීඩාවන් සමහරක් හෙබ්‍රෙව් 11 පරිච්ඡේදයේ සඳහන් වේ. ඇදහිලිවන්ත මේ බොහෝ පිරිමින් හා ස්ත්‍රීන් දෙවියන්වහන්සේගේ බලයෙන් මුදවාගනු ලැබීය. සිරගෙවල දොරවල් විවෘත වී ඔවුහු ඉන් පිටතට ගියහ. ගිනි උදුන්වල දවා මරණ ලෙස නියම කළ ද ගිනි දැල් වලින් කිසිදු හානියක් සිදු නොවී එළියට ආවෝය.

එහෙත් ඇදහිල්ලේ පිරිමින් හා ස්ත්‍රීන් ලෙස හැඳින්වූ ඇතැම් ඇදහිලිවන්තයන්ට මෙවැනි මිදීමක් නොලැබුණි. ශුභාරංචිය පිළිබඳව සාක්ෂි දුන් බැවින් ඔවුන්ව සිරගත කොට, පහර දී වධදුන් අතර ඇතැම් විට ජීවිතය වුවද පූජා කිරීමට සිදුවිය (හෙබ්‍රෙව් 11:36-40). අප අවධාරණය යොමු කරන්නේ සජීවී ඇදහිල්ල කෙරෙහි වුවද දෙවියන්වහන්සේ මරණයේ ඇදහිල්ලේ දී ද උන්වහන්සේගේ බලය එළිදරව් කරන සේක. මෙය යහපත් කාලවලදී ප්‍රකාශ කෙරෙන මහත් වූ මුදවාගැනීම් අවස්ථාවන්හි දී පමණක් නොව අයහපත් කාලවලදී ද සැබවින්ම නොසෙල්වෙන ඇදහිල්ලකි.

## සාතන්ගේ ඍජු ක්‍රියාකාරකම්

සාතන්ගේ ඍජු ක්‍රියාකාරකම් නිසාද ඔබගේ ජිවිතයට දුක්විඳීම් පැමිණිය හැකිය.

යෝබ්ගේ කතාවෙන් මෙය පැහැදිලි වේ. "ධර්මිෂ්ඨ අය දුක් විඳින්නේ මන්ද?" යන ප්‍රශ්නය සමඟ පොර බැඳීමක් මේ පොතෙන් සිදුවේ. යෝබ් ධර්මිෂ්ඨ මිනිසෙකු බවට දෙවියන්වහන්සේ සාක්ෂි දැරූ සේක (යෝබ් 1-2). යෝබ් දුක් වින්දේ, ඔහුගේ මිතුරන් ප්‍රකාශ කළ පරිදි, ඔහු පව්කළ නිසා නොවේ. යෝබ් පශ්චාත්තාපවුවහොත් මේ දේවල් වෙනස්විය හැකි බව මිතුරන් විශ්වාස කළහ.

මේ මිතුරන් උත්සාහ කළේ පෞද්ගලික අත්දැකීම් මත විශ්වීය සත්‍යයක් මතු කිරීමටය. එය, දෙවියන්වහන්සේ ජේතෘස්ව සිරගෙයින් නිදහස් කරගත් බැවින් උන්වහන්සේ ඔබට ද එසේ කරනු ඇත, යන්නට සමාන වේ. මෙය සත්‍යයක් නොවේ. මහත්වූ ඇදහිල්ලක් හා පාපයෙන් තොර ජිවිතයක් ගත කළ බොහෝ දෙනෙක් සිරගෙවල්වලදී ජිවිත පූජා කළහ.

ඇතැම් අය දුක්විඳින විට ඔවුන් පාපි, ඇදහිල්ලක් නොමැති අය ලෙස චෝදනා නොකිරීමට අප පරෙස්සම් විය යුතුය. පාපි මිනිසෙකු මාංශික දූෂණය වපුරන නිසා තිත්ත අස්වැන්නක් කපාගන්නා බව බයිබලය අපට උගන්වයි (ගලාති 6:8). එහෙත් වරද නොමැත්තන්ගේ දුක්විඳීම ගැන පැහැදිලි කිරීමට වැපිරීම හා කැපීම යොදාගත නොහැකිය.

යෝබ් දුක්වින්දේ ඔහු කළ කිසි දෙයක් නිසා නොවේ. යෝබ් ධර්මිෂ්ඨ මිනිසෙකි. මෙය යෝබ් පිළිබඳ දෙවියන්වහන්සේගේ සාක්ෂිය ද, තමාගැනම යෝබ්ගේ සාක්ෂිය ද හා මිනිසා ඉදිරියේ ඔහුගේ ,විතයද විය. ආත්මික ලෝකයේ මේ දර්ශනය පිටුපස යෝබ්ගේ දුක්විදීමේ සැබෑ හේතුව තිබේ. යෝබ්ගේ හදවත සිත හා පක්ෂපාතකම පිළිබඳව ආත්මික සටනක් තිබිණි.

ඔබට ඉහළින් ආත්මික ලෝකයේ සටනක් සිදුවෙමින් පවති. මේ සටන, ස්වභාවික ලෝකයේ ඔබ අත්දකින අසීරු අවස්ථාවන් මගින් ප්‍රදර්ශනය වේ.

යෝබ්ගේ දුක්විඳීම තුළින් පැහැදිලිවන එක් වැදගත් සත්‍යයක් නම්, ඇදහිලිවන්තයෙකුගේ ජිවිතය තුළට දෙවියන්වහන්සේගේ දැනුමක් නොමැතිව කිසිවක් ඇතුළු විය නොහැකි බවය. ඔබගේ දුක්විඳීම දෙවියන්වහන්සේ කරවන්නක් නොවේ. එය සාතන් විසින් පමුණුවන අතර එහි සීමාවන් දෙවියන්වහන්සේ විසින් තීරණය කරනු ලැබේ. දෙවියන්වහන්සේගේ බලය සාතන්ගේ බලයට වඩා උසස් වන අතර ඔබ උන්වහන්සේ කෙරෙහි නිරන්තර විශ්වාසය තැබුවහොත් අවසානයේ දී ඔබ ජයග්‍රහණය කරන්නෙහිය.

## ඔබගේම පාපය

ඔබගේ ජිවිතයට දුක්විදීම ඇතුළුවන පස්වැන් ක්‍රමය ඔබගේම පාපය වේ.

එවැනි දුක්විඳම් සඳහා නිදර්ශනයක් යෝනා වේ. දෙවියන්වහන්සේට අකීකරු වී, යෝනා පශ්චාතාපවීම පිළිබඳව දේශනා කිරීමට ඔහුට අණ කළ නිනිවයට නොව ඊට විරුද්ධ දිශාවට ගියේය. මුහුදේ දී ඔහු ප්‍රබල ක=ණටුවකට මුහුණ ¥න් අතර ඔහු ගේ ගමන අවසන් වුයේ ඔහුගේම පාපය නිසා විශාල මත්ස්‍යයෙකුගේ බඩ තුළය (යෝනා 1-2).

කරදර දෙස සැමවිටම බැලිය යුත්තේ, එය ඔබගේ මාර්ග පිළිබඳව විමසා බැලිමට සහ දෙවියන්වහන්සේ අභිමුඛයේ ඔබගේ හදවත පරීක්ෂා කිරීමට කරන කැඳවීමක් ලෙසය. ඔබ දුක්විඳින්නේ ඔබගේම පාපය නිසා විය හැකිය. තමන්වහන්සේගේ වචනයට අකීකරුව ජිවත් වන අයට දෙවියන්වහන්සේ දඬුවම් කරන බවට බයිබලය එළිදරව් කරයි. මේ දඬුවම් කිරීමේ අදහස හික්මවීම, තරවටු කිරීම හා නිවැරදි කිරීම වේ.

**කිසි දඬුවමක් ලබන කල ඒක ශෝකයට මිස ප්‍රීතියට කාරණාවක් මෙන් පෙනෙන්නේ නැත .නුමුත් පසුව එයින් පෙළුණු තැනැත්තන්ට ධර්මිෂ්ඨකමේ සමාදාන ඵල හටගන්නේය.**
(හෙබ්‍රෙව් 12:11)

ඔබව නිවැරදි කිරීමටත්, ඔබගේ ,විතය සඳහා දෙවියන්වහන්සේගේ කැමැත්තට ඔබව නැවත ගෙන ඒමටත් දෙවියන්වහන්සේ දුක්විඳීම භාවිත කරන සේක.

**මට විපත්ති පැමිණෙන්ට පළමුවෙන් මුළාව ගියෙමි, නුමුත් දැන් ඔබගේ වචනය පවත්වමි... ඔබගේ පනත් ඉගෙනගන්නා පිණිස මට විපත්ති පැමුණුණා යහපති.**
**ස්වාමිනි ඔබගේ විනිශ්චයන් ධර්මිෂ්ඨ බවත් විශ්වාසකමින් ඔබ මට පීඩා කළ බවත් දනිමි**
(ගීතාවලිය 119:67,71,75)

## දුක්විඳීම සඳහා නිවැරදි ආකල්ප

කරදර, අවශ්‍යයෙන්ම පාපයේ ගැලී සිටින බව පෙන්වන ලකුණක්ම නොවේ. "ධර්මිෂ්ඨයාගේ පීඩා බොහෝය" යි බයිබලයේ සඳහන් වේ. (ගීතාවලිය 34:19)

ඔබ වැරැද්දක් නොමැතිව හා ඔබගේම පාපයක් නොමැතිව දුක්විඳින විට, ඔබ දුක්විඳීම පිළිබඳව නිවැරදි ආකල්පයක් පවත්වාගෙන යා යුතුය. ඔබගේ ආත්මික බව පිළිබඳ සැබෑ පරීක්ෂාව වන්නේ සිත් තැවුලෙන් සිටින විට ඔබ දක්වන ප්‍රතිචාරය අනුව වේ.

**නුඹ විපත්ති දවසේදී කලකිරෙන්නෙහි නම් නුඹේ ශක්තිය අල්පය.** (හිතෝපදේශ 24:10)

ඔබ ඇදහිලිවන්තයෙකු ලෙස දෙවියන්වහන්සේගේ කැමැත්තේ සීමාවන් අතර දුක්විඳින විට ඔබට තිබිය යුතු ආකල්පය බයිබලය විස්තර කරයි.

ඔබ ලජ්ජා නොවිය යුතුය:

**නුමුත් යමෙක් ක්‍රිස්තියානිකාරයෙකු මෙන් දුක්විඳී නම්, ඔහු ලජ්ජා නොවී, ඒ නාමය සම්බන්ධයෙන් දෙවියන්වහන්සේට ගෞරව කරාවා.** (1 පේතෘස් 4:16)

ඔබගේ  යහපත පිණිස උන්වහන්සේ සියල්ල කරන බව දැනගනිමින්, ඔබ ඔබගේ ප්‍රාණය (ඔබගේ දුක්විඳීම) දෙවියන්වහන්සේට කැපකළ යුතුය.

**එබැවින් දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස දුක්විඳින්නෝ යහපත කරමින්, විශ්වාස මැවුම්කාරයානන්ට තමුන්ගේ ආත්ම භාරදෙත්වා.** (1 පේතෘස් 4:19)

ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුකූලව දුක්විඳින්නේ නම් ඔබ සන්තෝෂ විය යුතුය.

**එහෙයින් ඔවුහු ඒ නාමය නිසා නින්දා විඳින්ට තුමු වටින්නෝයයි ගණන්ගනු ලැබූ බැවින් සන්තෝෂව, සභාව ඉදිරියෙන් පිටත්ව ගොස් ....** (ක්‍රියා 5:41)

පාවුලුතුමා පවසන්නේ.

**බලාපොරොත්තුවෙහි ප්‍රීතිවෙයල්ලා; දුකේදී ඉවසිලිවන්තව සිටපල්ලා; යාච්ඤාවෙහි නොකඩව පැවතියල්ලා.** (රෝම 12:12)

**නින්දා ලබන කල අපි ආශිර්වාදකරමුව; පීඩා ලබන කල අපි ඉවසමුව; අපකීර්තිය ලබන කල අපි අවවාද දෙමුව.** (2 කොරින්ති 4:12)

**බොහෝ ඉවසීමෙන් ද පීඩාවලින් ද හිඟකම්වලින් ද විපත්තිවලින් ද, පහරකෑම්වලින් ද,**
(2 කොරින්ති 6:4)

**එබැවින් අපගේ ස්වාමින්වහන්සේගේ සාක්ෂිය ගැනවත් උන්වහන්සේගේ හිරකාරයෙක් වන මා ගැනවත් ලජ්ජා නොවී, දෙවියන්වහන්සේගේ බලයේ ප්‍රකාරයට ශුභාරංචිය නිසා මා සමඟ දුක් විඳපන්න.** (2 තිමෝති 1:8)

**මක්නිසාද අප දුක් විඳීමට නියමව තිබෙන බව නුඹලාම දනිහුය.** (1 තෙසලෝනික 3:3)

**නුමුත් නුඹ සියලු කාරණාවලදී සිහි ඇතුව සිටපන්න, දුක් ඉවසාපන්න, ශුභාරංචිය ප්‍රකාශකරන්නෙකුගේ වැඩේ කරපන්න, නුඹේ සේවය සම්පූර්ණකරපන්න.** (2 තිමෝති 4:5)

ඔබ දුක්විඳීම අත්දකින විට එය පුදුමයක් යයි නොසිතිය යුතුය.

**ප්‍රේමවන්තයෙනි, නුඹලා සෝදිසිකිරීම පිණිස පැමිණෙන නුඹලා අතරේ තිබෙන ගිනිමය පීඩාව ගැන අපූර්ව කාරණාවක් නුඹලාට සිද්ධවෙන්නාක් මෙන් පුදුම නොවෙල්ලා;**
**නුමුත් ක්‍රිස්තුස්වහන්සේගේ තේජසේ එළිදරව්වීමේදීත් නුඹලා ඉතා මහත් ප්‍රීතියකින් ප්‍රීතිවන පිණිස උන්වහන්සේගේ දුක් විඳීමෙහි නුඹලා පංගුකාරයන් වන ප්‍රමාණයට ප්‍රීතිවෙයල්ලා.**
(1 පේතෘස් 4:12-13)

ඔහු කරන මේ විස්තරයෙන් දුක්විඳීම කෙරෙහි දැක්විය යුතු නිවැරදි ආකල්පය පාවුලුතුමා සාරංශ කරයි.

**අපේ පිටත මනුෂ්‍යයා ක්ෂයවෙන නුමුත්, අපේ ඇතුල් මනුෂ්‍යයා දවසින් දවස අලුත්කරනු ලබන්නෙහිය.**
**මොහොතකට පවතින අපේ සැහැල්ලු වූ දුක, පෙනෙන දේ නොව නොපෙනෙන දේ බලා සිටින්නාවූ අපට,**
**ඉතාමත්ම වැඩි වශයෙන් සදාකාල තේජස් භාරයක් සදාදෙන්නේය. මක්නිසාද පෙනෙන දේ තාවකාලිකය; නොපෙනෙන දේ සදාකාලිකය.** (2 කොරින්ති 4:16-18)

පාවුලුතුමා දුක්විඳීම දැක්කේ සේවකයෙකු ලෙසය. එය අපටද ක්‍රියාකරන බව ඔහු පැවසීය.

## දුක්විඳීම තුළින් බලය

දුක්විඳීම, දෙවියන්වහන්සේ විසින් කරන දෙයක් නොවන බව මතක තබාගන්න. මොලොව දුක්විඳීම ඇත්තේ පාපය නිසාය. එහෙත් තමන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීමට දෙවියන්වහන්සේ දුක්විඳීම යොදාගන්නා සේක. උන්වහන්සේ එය භාවිත කරන්නේ:

### අයහපත යහපත කිරීමට

අයහපත සඳහා අදහස් කළ දෙයක් දෙවියන්වහන්සේ ගෙන එය යහපත සඳහා හරවන සේක. එය උන්වහන්සේගේ පරමාර්ථයන් සාක්ෂාත් කිරීම සඳහා උන්වහන්සේ මුදාගන්නා සේක. යෝසෙප්, තමාව වහල්කමට විකුණූ සහෝදරයන්ට මෙසේ පැවසීය:

**නුඹලා මේ රටට මා වික්ක නිසා ශෝක නොවෙල්ලා, නුඹලාටම කෝප නොවෙල්ලා, මක්නිසාද දෙවියන්වහන්සේ ජීවිත ආරක්ෂා කරන පිණිස නුඹලාට පෙරටුව මා එවූ සේක. එබැවින් මා මෙහි එවුවේ නුඹලා නොව දෙවියන්වහන්සේය.** (උත්පත්ති 45:5, 8)

යෝසෙප්ට දුක්විඳීම ගෙන ඒමට ඔහුගේ සහෝදරයන්ව පෙළඹවූයේ සාතන් වේ. එහෙත් දෙවියන්වහන්සේ එය යහපතකට හැරවීය. සෘණාත්මක වාතාවරණයක් තිබියදීත්, දෙවියන්වහන්සේ ඒ පිටුපස ක්‍රියා කළ සේක. යේසුස්වහන්සේ මරණයට බාරදීමට සාතන් මිනිසුන්ව පෙළඹවීය. එහෙත් දෙවියන්වහන්සේ එය යහපතට හැරවීය. උන්වහන්සේගේ මරණයේ ප්‍රතිඵලය වූයේ ගැළවීම හා නැවත නැගිටීම වේ.

දෙවියන්වහන්සේ ඔබගේ දුක්විඳුම් උන්වහන්සේගේ පරමාර්ථයන් සාක්ෂාත් කිරීමට යොදා ගැනීමෙන් උන්වහන්සේගේ බලය පෙන්වන සේක. ඇදහිලිවතුන්ගේ ජීවිත තුළ හදිසි සිදුවීම් හෝ ඉබේ සිදුවන දේ හෝ නොමැත. මක්නිසාද දෙවියන්වහන්සේ:

**එසේවී නුමුත් මට ලාභව තිබුණු යම් යම් දේම ක්‍රිස්තුස්වහන්සේ නිසා අලාභයයි සිතීමට පැමිණියෙමි.**
**එසේය, මාගේ ස්වාමිවූ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ ඇඳිනගැනීමේ උතුම්කම නිසා සියල්ල අලාභ යයි සලකමි. උන්වහන්සේ නිසා සියලු දේ මට නැතිවී ගියා පමණක් නොව; ඒවා කුණුයයි සලකමි. එසේ කරන්නේ මම ක්‍රිස්තුස්වහන්සේ ලබාගන්නා පිණිසය. (පිලිප්පි 3:7-8)**

## දුර්වලතාවන් ශක්තිය බවට හැරවීම

පාවුලුතුමා මෙය දන සිටියේය.

**දෙවියන්වහන්සේගේ දුර්වලකම මනුෂ්‍යයන්ට වඩා බලවත්ය. (1 කොරින්ති 1:25)**

දෙවියන්වහන්සේ පාවුලුතුමාට මෙසේ පැවසූ සේක.

**මාගේ කරුණාව නුඹට සෑහේය. මක්නිසාද දුර්වලකමේදී මාගේ බලය සම්පූර්ණවන්නේය. (2 කොරින්ති 12:9)**

පාවුලුතුමා මෙසේ කීවේ එබැවිනි.

**එැවින් ක්‍රිස්තුස්වහන්සේගේ ශක්තිය මා කෙරෙහි පිහිටන පිණිස මාගේ දුර්වලකම් ගැන ඉතා සන්තෝෂයෙන් පාරට්ටුකරන්නෙමි. එහෙයින් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා පැමිණෙන දුර්වලකම්වලටත් අන්තරායවලටත් නින්දාකම්වලටත් පීඩාවලටත් විපත්ති වලටත් ප්‍රසන්නව සිටිමි. මක්නිසාද මම දුර්වලව සිටින කලම ශක්තිමත්ව සිටිමි. (2 කොරින්ති 12:9-10)**

ඔබගේ මානුෂික දුර්වලතාවන් දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීමට අවස්ථාවක් සලසා දෙයි.

### ඔබගේ ඇදහිල්ල පරීක්ෂා කර බැලීමට

ආත්මික ලෝකයේ සියල්ල පදනම් වන්නේ ඇදහිල්ල මතය. ඔබගේ ඇදහිල්ලේ ශක්තිය පරීක්ෂාකර බැලිය යුත්තේ එබැවිනි.

**එසේ ශෝකයට පත්වන්නේ නාස්තිවී යන්නාවූ එසේදවුවත් ගින්නෙන් සෝදිසිකරන්නාවූ රනට වඩා අගේව තිබෙන නුඹලාගේ ඇදහිල්ල පරීක්ෂාකිරීමෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව්වීමේදී ප්‍රශංසාවත් මහිමයත් ගෞරවයත් පැමිණෙන පිණිසය. (1 පේත්‍රැස් 1:7)**

යේසුස්වහන්සේ තිත්තකමේ කුසලාන ඉවත් කරන මෙන් දෙවියන්වහන්සේට යාච්ඤා කළ ආකාරයට ඔබ යාච්ඤා කරන විට, එය ඇදහිල්ල පරීක්ෂා කිරීමකි. ඒ අවස්ථාවේ කුසලාන ඉවත් කළේ නැත. ඒ වෙනුවට එහි ඇති දුක්විඳීම පානය කිරීමට ඔබට බල කෙරේ. අපගේ යාච්ඤාවලට අපට අවශ්‍ය ආකාරයට පිලිතුරු නොලැබෙන නිසා පිළිතුරු නොලැබුනා යයි සිතීම වැරදි, බව ඇදහිල්ලෙන් උගනියි.

### අනෙක් අයට සහනය ලබාදීම සඳහා ඔබව පිළියෙල කි×මට

**දයාබර කරුණාවල පියවූද සෑම සැනසිල්ලේ දෙවිවූද අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පියවූ දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා.**

**අපි දෙවියන්වහන්සේගෙන් යම් සැනසිල්ලක් ලැබුවෙමුද, ඒ සැනසිල්ල කරණකොටගෙන කොයි පීඩාවක් නුමුත් විඳින්නන් සනසන්ට අපට පුළුවන්වන පිණිස උන්වහන්සේ අපේ සියලු පීඩාවලදී අප සනසන සේක. (2 කොරින්ති 1:3-4)**

ඔබ අන් අය සමඟ දෙවියන්වහන්සේගේ සහනය බෙදාගන්නා විට ඔබ

**එබැවින් හෙළා තිබෙන අත්ද බෙලහීන දණහිස් ද සවිකරගනිල්ලා. කොර කකුල් අහක්කරනු නොලැබ, සුවවෙන පිණිස, නුඹලාගේ පාදවලට සමතලා පාරවල් සාදාගනිල්ලා. (හෙබ්‍රෙව් 12:12-13)**

## ඔබ ගැනම විශ්වාසය නොතැබීමට ඔබට ඉගැන්වීමට

දුක්විඳීමේ පරමාර්ථය පිළිබඳව පාවුලුතුමා ආසියාවේදී කතා කළේය.

**එබැවින් සහෝදරයෙනි, ආසියාවේදී අපට පැමිණි පීඩාව ගැන නුඹලා නොදැන සිටිනවාට නොකැමැත්තෙමුව. එනම් ජීවිතය ගැන පවා අපට බලාපොරොත්තුවක් නැති තරමට, උසුලන්ට බැරි පමණ, අප පිටට බර පැමුණුණ බවය. එසේය, මළවුන් නැගුටුවන්නාවූ දෙවියන්වහන්සේ කෙරෙහි මිස අප කෙරෙහිම විශ්වාස නොකරන ලෙස මරණ මුගිංචිය අප තුළේම තිබුණේය. (2 කොරින්ති 1:8-9)**

ඔබ මේ දේ හැඳිනගන්නවා ඇත.

**නුමුත් ඒ බලයේ ඉතා උතුම්කම අපට නොව දෙවියන්වහන්සේට අයිතිවන පිණිස මේ වස්තුව අපි මැටි භාජනවල දරමුව. (2 කොරින්ති 4:7)**

## ධනාත්මක ආත්මික ගුණාංග වර්ධනය කර ගැනීමට

**එපමණකුත් නොව, පීඩා විඳීමෙන් ඉවසිල්ලද, ඉවසිල්ලෙන් සහතිකකම ද සහතිකකමෙන් බලාපොරොත්තුවීම ද උපදින බව දැන, අප විඳින පීඩාවලදීත් ප්‍රීතිමත්වෙමු. (රෝම 5:3-4)**

**නුඹලා ස්වල්ප කලක් දුක්වින්ද පසු, නුඹලා සම්පූර්ණකර, ස්ථිරකර, ශක්තිමත් කර පිහිටුවන සේක. (1 පේතෘස් 5:10)**

මේ ගුණාංග ඔබ යේසුස්වහන්සේගේ ස්වරූපයට සමාන කෙරේ. එය ඔබ වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ සැලැස්මය. (රෝම 8:28-29, හෙබ්‍රෙව් 2:10,11)

## දෙවියන්වහන්සේගේ ක්‍රියා ප්‍රකාශ කිරීමට

උත්පත්තියේ සිටම අන්ධවූ මිනිසෙකු ගෝලයන් දුටුවිට, මේ තත්වයට වගකිව යුත්තේ කවුරුන්දැයි ඔවුහු ඇසුහ. එය ඔහුගේ දෙමාපියන්ගේ පාපය ද නැතහොත් ඔහුගේම ද?

යේසුස්වහන්සේ මෙසේ පිළිතුරු දුන්සේක:

**දෙවියන්වහන්සේගේ ක්‍රියා මොහු කෙරෙහි ප්‍රකාශවන පිණිස මිස මොහුවත් මොහුගේ මවුපියන්වත් පව්කළ නිසා නොවේ. (යොහන් 9:3)**

## දෙවියන්වහන්සේගේ බලය පරිපූර්ණ කිරීමට

**මාගේ කරුණාව නුඹට සෑහේය. මක්නිසාද දුර්වලකමේදී මාගේ බලය සම්පූර්ණවන්නේයයි මට කීසේක. එබැවින් ක්‍රිස්තුස්වහන්සේගේ ශක්තිය මා කෙරෙහි පිහිටන පිණිස මාගේ දුර්වලකම් ගැන ඉතා සන්තෝෂයෙන් පාරට්ටුකරන්නෙමි. (2 කොරින්ති 12:9)**

## අස්ථායි දේ ඉවත් කිරීමට

ඔබගේ ජීවිතයේ ඇති සියලු අස්ථායි දේ ඉවත් කිරීම දුක්විඳීමේ ප්‍රතිඵලය වේ. ඔබ මිනිසුන්, වැඩ සටහන් හෝ ද්‍රව්‍යමය දේ මත යැපීම නවත්වන්නෙහිය, මක්නිසාද ඒ සියල්ල ඔබගේ අවශ්‍යතාවයෙහිදී අසාර්ථක වන බැවිනි. දෙවියන්වහන්සේ මේවාට ඉඩදෙන සේක.

> **නොසෙල්වෙන්නාවූ දේවල පවතින පිණිස සෙලවෙන ඒවා සෑදූ දේවල් මෙන් පහකරන බවය. (හෙබ්‍රෙව් 12:27)**

ජීවිතයේ කුණාටුවලදී, දෙවියන්වහන්සේ හා උන්වහන්සේගේ වචනය මත ගොඩනොනැගූ සියල්ල කඩා වැටෙන්නේය. (ගීතාවලිය 11:89; මතෙව් 7:24-27)

## ඔබගේ අවධානය වෙනස් කිරීමට

ඔබ දුක්විඳීම අත්දකින අවස්ථාවල ඔබගේ අවධානය බොහෝ විට හේතු හා ඵල වෙත යොමු වන්නේය. අසීරු අවස්ථාව ඇතිවීමට හේතුවත් එය ඔබගේ ජීවිතය කෙරෙහි දක්වන භයානක ප්‍රතිඵලයත් ගැන ඔබ අවධානය යොමු කරන්නෙහිය. දෙවියන්වහන්සේට අවශ්‍ය වන්නේ මේ තාවකාලික තත්වය තේරුම් ගැනීමට ඔබ කරන අරගලය ඔබගේ අවධානය සදාතන යහපත වෙත යොමු කිරීම වේ.

> **මොහොතකට පවතින අපේ සැහැල්ලු වූ දුක, පෙනෙන දේ නොව නොපෙනෙන දේ බලා සිටින්නාවූ අපට,**
> **ඉතාමත්ම වැඩි වශයෙන් සදාකාල තේජස් භාරයක් සදාදෙන්නේය. මක්නිසාද පෙනෙන දේ තාවකාලිකය; නොපෙනෙන දේ සදාකාලිකය. (2 කොරින්ති 4:17-18)**
>
> **ප්‍රේමවන්තයෙනි, නුඹලා සෝදිසිකිරීම පිණිස පැමිණෙන නුඹලා අතරේ තිබෙන ගිනිමය පීඩාව ගැන අපූර්ව කාරණාවක් නුඹලාට සිද්ධවෙන්නාක් මෙන් පුදුම නොවෙල්ලා;**
> **නුමුත් ක්‍රිස්තුස්වහන්සේගේ තේජසේ එළිදරව්වීමේදීත් නුඹලා ඉතා මහත් ප්‍රීතියකින් ප්‍රීතිවන පිණිස උන්වහන්සේගේ දුක් විඳීමෙහි නුඹලා පංගුකාරයන් වන ප්‍රමාණයට ප්‍රීතිවෙයල්ලා. (1 පේතෘස් 4:12-13)**
>
> **අපි ඉවසමු නම් උන්වහන්සේ සමඟ රජකම් කරන්නෙමුව. (2 තිමෝති 2:12)**

## පැරණි මමත්ව ස්වභාවය වෙනස් කිරීමට

මෝවාබ් දේශයට දෙවියන්වහන්සේ මෙසේ පැවසූ සේක:

> **මෝවාබ් භාජනයෙන් භාජනයට වත්කරනු නොලැබ, වාල්කමට නොගොස්, තමාගේ බාල වයසේ පටන් සුවසේ හිඳ, තමාගේ මණ්ඩි පිටින් නිශ්චල වී සිටියේය. ඔබැවින් ඔහුගේ රස ඔහු තුළ තවම තිබේ, ඔහුගේ සුවඳ වෙනස් නොවී තිබේ. (යෙරමියා 48:11)**

හොඳ මිදියුෂ සෑදීම සඳහා අවශ්‍ය කැළැත්තීම හා වත්කිරීම වැනි අසීරුතා මෝවබ් අත් නුදුටු බැවින් එම දේශය වෙනස් නොවීය. මෝවබ් ඉතා පහසුවෙන් සමෘද්ධිමත් විය. ඒ නිසා නියමාකාරයෙන් ආත්මිකව වර්ධනය වූයේවත් පරිණත වූයේවත් නැත. මේ හේතුවෙන් වෙනසක් සිදු නොවීය. "ඔහුගේ සුවඳ" ඒ ආකාරයෙන්ම තිබිණි.

දුක්විඳීම ඔබගේ පැරණි මමත්ව ස්වභාවයෙන් ඔබව ඉවත් කරයි. ඔබව කලත්තා හිරිහැරකර, වත්කළ විට ඔබගේ ආත්මික සුවඳ මාංශවත් බවින් ආත්මික බවට වෙනස් වන්නෙහිය.

## ඔබ සේවය සඳහා සූදානම් කිරීමට

ඔබව දෙවියන්වහන්සේ විසින් පාවිච්චි කරනු ලබන්නැයි ඉල්ලා ඇත. ඔබගේ ආශාව යේසුස්වහන්සේ මෙන් වීමට වන අතර උන්වහන්සේගේ පාවිච්චිය සඳහා තෝරාගන්නා ලද භාජනයක් විය හැකිය.

> **බලව මම නුඹ පවිත්‍ර කළෙමි, නුමුත් රිදී මෙන් නොවේය; පීඩා නමැති උදුනේ දී නුඹ තෝරා ගතිමි.** (යෙසායා 48:10)

දෙවියන්වහන්සේගේ දරුවෙකු ලෙස දෙවියන්වහන්සේ විසින් තෝරාගනු ලැබූවෙකු වීමට නම් ඔබ කැදවීමෙන් ඔබ්බට යා යුත්තේ පීඩාවන් මැදිනි. ස්වභාවික ලෝකයේ ලෝහ පිරිසිදු කරනු ලබන්නේ උදුනක බහා වන අතර ඒ ආකාරයෙන්ම දෙවියන්වහන්සේ ඔබව පවිත්‍ර කරන්නේ දේව කැමැත්තට අනුකූල පීඩාවන් මගිනි.

## ක්‍රිස්තුස්වහන්සේ සමඟ අධිපතිකම් කිරීමට ඔබව සූදානම් කිරීම.

> **අපි ඉවසමු නම් උන්වහන්සේ සමඟ රජකම් කරන්නෙමු.** (2 තිමෝති 2:12)

## ඔබට ආත්මික ආශිර්වාද දීමට

යේසුස්වහන්සේ මෙසේ කී සේක.

> **ධර්මිෂ්ඨකම නිසා පීඩා වින්ද තැනැත්තෝ ආශිර්වාදලද්දෝය; මක්නිසාද ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේය.**
> **මනුෂ්‍යයන් මා නිසා නුඹලාට නින්දා පීඩාකොට නුඹලාට විරුද්ධව සියලු ආකාර අගුණ බොරුවෙන් කියන කල නුඹලා ආශිර්වාදලද්දෝය.**
> **ප්‍රීතිවෙයල්ලා, ඉතා සන්තෝෂවෙයල්ලා; මක්නිසාද ස්වර්ගයෙහි නුඹලාගේ විපාකය මහත්ය. නුඹලාට පළමුවෙන් සිටි අනාගතවක්තෘවරුන්ටත් ඔවුහු එලෙසම පීඩා කළෝය.**
> (මතෙව් 5:10-12)

## ඔබට කීකරුකම ඉගැන්වීමට

> **උන්වහන්සේ පුත්‍රයෙක්ව සිටි නුමුත් තමන් වින්ද දේවලින් කීකරුකම ඉගෙනගත් සේක.** (හෙබ්‍රෙව් 5:8)

## ඔබ තුළ ඇති දේව වචනය පරීක්ෂා කිරීමට

> **ගිනි සර්පයන් හා ගෝනුස්සන් ඇත්තාවූ, වතුර නැති නියංසායෙන් යුක්තවූ ඒ මහත් භයානක කාන්තාරය මැදින් නුඹ ගෙනාවාවූ, ගිනිගල් පර්වතයෙන් නුඹට වතුර නික්මවා දී,**
> **නුඹේ පියවරුන් නොදත්තාවූ මන්නාවලින් කාන්තාරයේදී නුඹ පෝෂණය කළාවූ නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේ මතක නැතිකොට...** (ද්විතීය කථාව 8:15-16)

## ඔබේ ආත්මිකතාවය විශාලනය කිරීමට

මින් අදහස් වන්නේ ආත්මිකව වර්ධනය වීම වේ.

> **මා පීඩනයක් යටතේ සිටියදී ඔබ මා විශාලනය කළ සේක.**
> (ගීතාවලිය 4:1)

## දෙවියන්වහන්සේ සමීපව දැනගැනීම සඳහා ඔබට උපකාර කිරීමට

දුක්විඳීම තුළින් ඔබ දෙවියන්වහන්සේව සමීපතම පදනමකින් දැනගන්නෙහිය. බොහෝ සේ දුක්විඳි යෝබ්, මේ සත්‍යය ඉගෙන ගෙන මෙසේ පැවසිය.

> **මා ඔබ ගැන කනින් අසා තිබුණේය. නුමුත් දැන් මාගේ ඇසින් ඔබ දකිමි, ඔබැවින් මම මටම පිළිකුල් කොට, දුවිල්ලේත් අලුවලත් හිඳ පශ්චාතාප වෙමියි කීවේය.** (යෝබ් 42:5-6)

අප සමහරුන් දෙවියන්වහන්සේව දන්නේ වෙනත් කෙනෙකු මගිනි. අප ජීවිතයේ ආශිර්වාද අත්දකින විට, දෙවියන්වහන්සේ අපගේ අවශ්‍යතාවක් නොව සුඛෝපභෝගි කෙනෙකු වේ. එහෙත් ඔබට සත්‍ය වශයෙන්ම ඕනෑ වූ විටක දෙවියන්වහන්සේ අවශ්‍යතාවක් වේ. යෝබ් දෙවියන්වහන්සේව සමීපවම දැනගත්තේ දුක්විඳීම තුළිනි. දුක්විඳීමට පෙර යෝබ් දෙවියන්වහන්සේව දේවධර්මය අනුව දැනගෙන සිටියේය. ඉන්පසු අත්දැකීමෙන් දැනගත්තේය. පාවුලුතුමා මෙසේ පැවසුවේ එබැවිනි.

> **යම් අන්දමකින් මළවුන්ගෙන් නැගිටීමට පැමිණෙන ලෙස, උන්වහන්සේ සහ උන්වහන්සේගේ නැවත නැගිටීමේ බලයත් උන්වහන්සේගේ දුක්වල පංගුකාරකමත් දැනගන්නා පිණිසත්ය.** (පිලිප්පි 3:10,11)

ඔබට දෙවියන්වහන්සේව නැවත නැගුටුනු බලයෙන් දැනගත හැක්කේ දුක්විඳීමේ සමීපතම සහභාගිකම මගිනි.

මේ කරදර මුළුල්ලේම, දුක්විඳීමට හේතුව යෝබ් දෙවියන්වහන්සේගෙන් ඇසුවේය. දෙවියන්වහන්සේගෙන් ප්‍රශ්න ඇසීම වරදක් නොවේ. තමන්වහන්සේ මේ ලෝකයට පැමිණියේ සියලු මනුෂ්‍ය වර්ගයාගේ පාපය උදෙසා මැරෙන්නට බව යේසුස්වහන්සේ දැන සිටි සේක. එහෙත් දුක්විඳි පැයේදී උන්වහන්සේ "මාගේ දෙවියනි, මාගේ දෙවියනි, ඔබ මා අත්හැරියේ මන්ද?" කියා හඬ ගැසූ සේක.

වැදගත් වන්නේ ප්‍රශ්න කිරීමට පසු සිදුවන දෙය වේ. ස්වාමින්වහන්සේගේ ඊළඟ වචන වූයේ "ඔබගේ අතට මාගේ ආත්මය භාර දෙමි" යන්න වේ. ප්‍රශ්නය කුමක් වුවද යෝබ්ගේ ප්‍රතිචාරය වූයේ:

> **උන්වහන්සේ මා මරනවා ඇත; මට බලාපොරොත්තුවක් නැත්තේය;** (යෝබ් 13:15)

> **එහෙත් මාගේ මිදුම්කාරයාණන් ජීවත්ව සිටින බවද අන්තිමේදී උන්වහන්සේ පොළොව පිට සිටින බවද දනිමි.**
> **මේ මාගේ හම නැතුව ගියායින් පසු, මාගේ මාංශය නැතුව නුමුත් දෙවියන්වහන්සේ දකින්නෙමි.** (යෝබ් 19:25-26)

සියලු ප්‍රශ්න ඇසීම් අවසන් වූ පසු, අවධාරණය "මා" සිට "ඔබ" යන්නට වෙනස් විය යුතුය. ඔබගේ දුක්විඳීම්, පිළිතුරු නොලද සියලු ප්‍රශ්න ද සමඟ දෙවියන්වහන්සේගේ අතට කැපකළ යුතුය.

> **නුඹේම නුවණෙහි නොපිහිටා, නුඹේ මුළු සිතින් ස්වාමින්වහන්සේ කෙරෙහි විශ්වාස කරපන්න.** (හිතෝපදේශ 3:5)

ඔබ දුක්විඳීමේ ඇතැම් හේතු දෙවියන්වහන්සේ එළිදරව් කළ හැකිය. එහෙත් එය සම්පූර්ණයෙන් ඔබට අවබෝධ නොවීමට පුළුවන.

> **කාරණයක් සඟවා තැබීම දෙවියන්වහන්සේගේ ගෞරවයක්ය...** (හිතෝපදේශ 25:2)

**රහස් වූ දේ අපේ දෙවිවූ ස්වාමින්වහන්සේට අයිතිය. එහෙත් ... එළිදරව් කර තිබෙන දේ ... අපට අයිතිය (ද්විතිය කථාව 29:29).**

ස්වාමින්වහන්සේට පමණක් අයත් ඇතැම් රහස් දේ තිබේ. යෝබ් මෙන්ම ඔබ ද දුක්විඳීමේ සියලු පරමාර්ථ කිසි දිනෙක තේරුම් නොගනු ඇත.

**මනුෂ්‍යයෙකුගේ ගමන් ස්වාමින්වහන්සේගෙන් නොපැමිණේ. එසේ නම් මනුෂ්‍යයා තමාගේ මාර්ගය තේරුම් ගන්නේ කොහොමද? (හිතෝපදේශ 20:24)**

අවසානයේදී දෙවියන්වහන්සේ යෝබ් සමඟ කතා කළ විට, ස්වභාවික ලෝකයෙන් නිදසුන් කීපයක් උන්වහන්සේ භාවිත කළ සේක. ඒවා යෝබ්ට පැහැදිලි කළ නොහැකි විය. ස්වභාවික ලෝකයේ ඔහුට පෙනෙන දේ ඔහුට තේරුම්ගත නොහැකි නම්, ආත්මික ලෝකයේ ඔහුට නොපෙනෙන දේ ඔහුට කෙසේවත් තේරුම් ගත නොහැකි බව දෙවියන්වහන්සේ යෝබ්ට අවධාරණය කළේය.

යෝබ් දෙවියන්වහසන්සේට මුහුණ දෙන විට, දුක්විඳීම පිළිබඳව ඔහුගේ ප්‍රශ්නවලට පිළිතුරක් නොලැබීම තවදුරටත් ගැටලුවක් නොවේ. ඔහු දෙවියන්වහන්සේ අභිමුඛයේ සෘජුවම සිටින බැවින් ඒ අත්දැකීම වෙනත් කිසිවකට ඉඩ නොතබයි. ඔහු තව දුරටත් මිනිසාගේ තර්ක මගින් පාලනය කෙරෙන්නේවත් වධ හිංසාවලට ලක් වන්නේවත් නැත. ඔහු ප්‍රශ්න වෙනුවට භාවිත කරන්නේ පිළිතුරු නොව ඇදහිල්ල වේ.

ඔබ දුක්විදීම තුළින් දෙවියන්වහන්සේ ඉතා කිට්ටුවෙන් දැනගත් කල ඔබ, ඔබව දකින්නේ සැබවින්ම ඔබම ලෙස වේ. ඔබ තවදුරටත් දෙවියන්වහන්සේව දන්නේ දෙවැන්නෙකුගෙන් නොවේ. තර්කවලට සහ සාකච්ඡාවලට කළ නොහැකි දේ දෙවියන්වහන්සේ සමඟ මුහුණට මුහුණලා කෙරෙන හමුවීමෙන් කළ හැකි වේ.

යෝබ් දෙවියන්වහන්සේ අභිමුඛයේ සිටින විට, ඔහුට අලුත් පිළිතුරු ලැබුනේ නැත. ඔහුගේ දුක්විඳීම පිළිබඳව ඔහුට අලුත් කරුණු දෙනු නොලැබීය. එහෙත් ඔහු ප්‍රශ්න, ඇදහිල්ලෙන් ප්‍රතිස්ථාපනය කළේය. යෝබ් සෘජුවම දෙවියන්වහන්සේ අභිමුඛයේ සිටි අතර ඒ අත්දැකීම ප්‍රශ්නවලට හෝ අවිශ්වාසයනට හෝ ඉඩ නොතැබීය.

## ඔබ සිටින්නේ තනිවම නොවේ

ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුකූලව දුක්විඳින විට, ඔබ තනිව නොසිටින බව පිළිගත යුතුය. තව බොහෝ ඇදහිලිවතුන් මේ ආකාරයේම සටන් අත්දැක සිටිති.

**ලෝකයෙහි සිටින නුඹලාගේ සහෝදරයන් කෙරෙහි එම දුක්ම පැමිණෙන බව දැන, .....**
**(1 පේතෘස් 5:9)**

මතෙව් 7:24-27 හි දක්වා ඇති නිවෙස් දෙකේ උපමාවෙන් දැක්වෙන පරිදි ජීවිතයේ කුණාටු අනිවාර්යය, පාලනය කළ නොහැකිය. තමාගේ ජීවිතය දේව වචනය මත ගොඩනැගූ අයට ද එසේ නොමැති අයට ද එක හා සමානව කුණාටු පැමිණේ. කුණාටුවේ ප්‍රතිඵලය නිර්ණය වන්නේ මනුෂ්‍යයාගේ ජීවිතයේ අත්තිවාරම මතය.

දුක්විදීම දෙවියන්වහන්සේගේ කැමැත්තේ අංගයක් ලෙස බලාපොරොත්තු විය යුතුය.

**එසේය ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ භක්තිවන්ත ලෙස ජීවත්වෙන්ට කැමති සියල්ලෝම පීඩා විඳින්නෝය. (2 තිමෝති 3:12)**

**මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහන්ට පමණක් නොව, උන්වහන්සේ උදෙසා දුක්විඳින්ටත් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා නුඹලාට වරප්‍රසාදය දෙනලද්දේය. (පිලිප්පි 1:29)**

**දුක්විඳින නුඹලා ඒ රාජ්‍යයට සුදුස්සෝයයි ඒත්තුගනු ලැබීමට (2 තෙසලෝනික 1:5)**

**මක්නිසාද අප දුක් විඳීමට නියමව තිබෙන බව නුඹලාම දනිහුය. මක්නිසාද අප දුක් විඳින්ට සිටින බව, නුඹලා සමඟ සිටියදී කලින් නුඹලාට කීවෙමුව; එලෙසම සිදුවුණු බව නුඹලා දන්නාහුය. (1 තෙසලෝනික 3:4)**

**එකල ඔවුහු නුඹලා පීඩාවිඳීමට පාවාදී මරන්නෝය. නුඹලා මාගේ නාමය නිසා සියලු ජාතීන් විසින් වෛරකරනු ලබන්නහුය. (මතෙව් 24:9)**

**මාගේ නාමය නිසා ඔවුහු නුඹලා පිට අත්හෙළා, සිනගෝගවලටත් හිරගෙවලටත් නුඹලා පාවාදෙමින්, නුඹලාට පීඩාකරන්නෝය, නුඹලා රජුන් හා ආණ්ඩුකාරයන් ඉදිරියට ගෙනයන්නෝය. (ලූක් 21:12)**

**දාසයෙක් තමාගේ ස්වාමියාට වඩා උතුම් නොවේයයි නුඹලාට මා කී වචන සිහිකරපල්ලා. ඔවුහු මට පීඩාකළෝනම් නුඹලාටත් පීඩා කරන්නෝය; (යොහන් 15:20)**

එහෙත් දෙවියන්වහන්සේ සතුටු කිරීමේ අදහසින් ඔබ ඔබටම දුක්දිය යුතුයයි මින් අදහස් නොකෙරේ. මිනිසුන් දුක්විඳින විට දෙවියන්වහන්සේ කෙසේවත් සතුටු නොවේ. හිතාමතාම තමාටම දුක්දීම (මෙය තාපස් ක්‍රියාවක් ලෙස හැඳින්වේ) පාපයකි.

බොහෝ අය මෙසේ කටයුතු කිරීමට උත්සාහ කරන්නේ දෙවියන්වහන්සේගේ කෝපය සන්සිඳුවීම හෝ මිනිසුන් ඉදිරියේ ශුද්ධවන්තයෙකු ලෙස පෙනී සිටීමට හෝ වේ. එහෙත් දෙවියන්වහන්සේ සන්සිඳුවිය හැක්කේ යේසුස්වහන්සේගේ රුධිරයෙන් පමණි. එහෙත් දෙවියන්වහන්සේ දුක්විඳීමේ බෙදාවාචකය ඔබගේ ජීවිතයට පැමිණි විට එය යහපත් දෙයක් බවට ප×ව[1]තනය කරන්නේය.

මුල් සභා පිහිටුවීමේ සැලැස්මේ එක් අදහසක් වූයේ, ඇදහිලිවතුන්ට ඔවුන් දුක්විඳීම් අත් දකින බව ඉගැන්වීමට වේ. මෙය බොහෝ සභාවල අද දකින්නට නොලැබේ.

**ඔවුහු ඒ නුවර ශුභාරංචිය දේශනා කොට, බොහෝ දෙනෙක් ගෝලයන් කර, හැරී ඇවිත්: අප විසින් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට බොහෝ දුක් විඳිමින් ඇතුල්වෙන්ට ඕනෑයයි අවවාද කළෝය. (ක්‍රියා 14:22)**

යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට කළ කැඳවීම, තමාවම නොසැලකීමට හා දුක්විඳීමටය.

**තමාගේ කුරුසිය රැගෙන මා අනුව නේන තැනැත්තා මට සුදුසු නොවේ. (මතෙව් 10:38)**

**එවිට යේසුස්වහන්සේ ගෝලයන්ට කථාකොට: යමෙක් මා පස්සේ එන්ට කැමති නම් ඔහු තමාම නොසලකා, තමාගේ කුරුසිය රැගෙන මා අනුව ඒවා. (මාක් 16:24)**

**කවරෙක් නුමුත් මා පස්සේ එන්ට කැමති නම්, ඔහු තමාගේ කැමැත්ත අත්හැර, තමාගේ කුරුසිය රැගෙන, මා අනුව ඒවා. (මාක් 8:34)**

**නුඹ මා අනුව වරෙන්න** (කුරුසිය රැගෙන එන්න). (මාක් 10:21)

**යමෙක් මා පස්සේ එන්ට කැමති නම්, ඔහු තමාගේම ආශා වලකාගෙන දවස් පතා තමාගේ කුරුසිය රැගෙන, මා අනුව ඒවා. (ලූක් 9:23)**

**තමාගේ කුරුසිය උසුලාගෙන මා පස්සේ නේන තැනැත්තාට මාගේ ගෝලයා වෙන්ට බැරිය. (ලූක් 14:27)**

යේසුස්වහන්සේ ඇදහිලිවතුන්ව කැඳවූයේ තමාවම නොසලකන හා කුරුසිය රැගෙන යන ජීවිතයකටය. ඒ තමන්වහන්සේගේ දුක්විඳීමේ සහභාගිකමේ ඇති ප්‍රබල ශාක්‍යතාව නිසාය.

නැවත-නැගිටීමේ බලය හා උන්වහන්සේගේ දුක්විඳීමේ බලය, වර්තමානයේ භාවිත වන ධන හා ඍණ විද්යුත් බලවලට සමාන කළ හැකිය. බලය නිපදවීමට ධන හා ඍණ යන දෙකම අවශ්‍ය වේ.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න

2. සියලු පාපවල හා දුක්විඳීමේ ප්‍රභවය කවුරුන්ද?

3. අපගේ ජීවිතවලට දුක්විඳීම පැමිනෙන්නේ කෙසේද? මේ පරිච්ඡේදයේ සඳහන් කර ඇති ක්‍රම පහ ලයිස්තුගත කරන්න

4. දුක්විඳීම මගින් ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයේ සාක්ෂාත් කරගන්නා බලවත් පරමාර්ථය සාරාංශ කරන්න.

(මේ පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. ඔබ දුක්විඳීම අත්දකින්නේ ඔබ ජීවිතයේ කවර ක්ෂේත්‍රවලද?

______________________________________________

2. දුක්විඳීම ඔබ ජීවිතයට ඇතුළුවූයේ කෙසේද?

- ඔබ වටා සිටින අය
- ජීවිතයේ ඇති අවස්ථාවලින්
- ඔබගේම පාපය නිසා
- ඔබගේ සේවය නිසා
- සාතන්ගේ සෘජු ක්‍රියාවන්

3. ඔබ මේ දුක්විඳීමට ප්‍රතිචාර දැක්වූයේ කෙසේද?

______________________________________________

______________________________________________

ඔබගේ දුක්විඳීම් තුළින්, දෙවියන්වහන්සේට තම බලය ප්‍රදර්ශනය කිරීමට නම් එය අත්දකින අතරතුර ඔබ එයට නිවැරදි ප්‍රතිචාර දැක්විය යුතුය. ඔබ කෙඳිරි ගෑම හෝ පැමිණිලි කිරීම හෝ නොකළ යුතුය. ඉශ්‍රායෙලය දුක්විඳීමට ප්‍රතිචාර දැක්වූයේ ඒ අයුරිනි. ඔවුහු මෝසෙස්ට එරෙහිව කෙඳිරිගෑවෝය (නික්මයාම 15:24). එහෙත් සියලු කෙඳිරිගෑම් සැබවින්ම දෙවියන්වහන්සේට එරෙහිව කෙරෙන්නකි. එමෙන්ම එය ඔබ යේසුස්වහන්සේගේ ස්වරූපයට ගෙන ඒමේ උන්වහන්සේගේ සැලැස්මට ද එරෙහි වන්නකි. සියලු කාර්යයන් ඔබ උන්වහන්සේගේ ස්වරූපයට ගෙන ඒම සඳහා එක්ව ක්‍රියා කරයි. ඔබ දුක්විඳීම ගැන පැමිණිලි කරන විට ඔබ එසේ කරන්නේ මේ කාර්යාවලියට එරෙහිව වේ. රෝම 8:28-29 බලන්න.

දුක්විඳීම අත්දකින විට තිත්ත ආකල්පයක් වර්ධනය වීමට ඉඩ නොදෙන්න. තිත්තකම දුක්විඳීමට දක්වන වැරදි ප්‍රතිචාරයකි. එය වෛරකරන දොස්පවරන පැමිණිලි කරන හා පළිගන්නාවූ ආකල්පයකි. ඔබ තිත්තකමට ඉඩ දුන්නොත් එය ඔබට කරදර කරයි. ඔබ අපවිත්‍ර කරයි (හෙබ්‍රෙව් 12:16). දෙවියන්වහන්සේගේ වචනයට සවන් දීම වළක්වයි (නික්මයාම 6:9), පළිගැනීමේ ආත්මයක් ඇති කරයි (1 සාමුවෙල් 30:6). අධෛර්යය හා දොම්නස ඇති කරයි (විලාප ගී 3:18-20). එමෙන්ම ආත්මිකව විස ඇත=ල් කරයි (ක්‍රියා 8:23)

4. අසීරු අවස්ථාවන්ට ශුද්ධ ලියවිල්ල ආකාරයට ඔබ ප්‍රතිචාර දක්වන්නේ කෙසේද?

______________________________________________

______________________________________________

# දහ අටවන පරිච්ඡේදය

## දෙවියන්වහන්සේගේ බලය අත්දකින්නේ කෙසේද?

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ඔබගේ ජීවිතයේ හා සේවයේ දෙවියන්වහන්සේගේ බලය අත්දකින අයුරු පැහැදිලි කිරීමට
- සභාවේ පරමාර්ථය, එය ආත්මික බලයට දක්වන සබඳතාව අනුව හඳුනාගැනීමට
- ආත්මික බලය  වර්ධනය කරන අයුරු පැහැදිලි කිරීමට
- ඔබගේම ජීවිතයේ හා සේවයේ ආත්මික බලය අත්දැකීමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

> **ඔවුහු පිටත්ව ගොස්, සියලු තැන්වලම දේශනා කළෝය. ස්වාමින්වහන්සේ ද ඔවුන් සමඟ ක්‍රියාකරමින් ඔවුන් අතින් සිදුවූ ලකුණුවලින් වචනය ස්ථිර කළ සේක. ආමෙන්.** (මාක් 16:20)

### හැඳින්වීම

ඔබ මෙම පාඨමාලාවේදී ආත්මික බලයේ මූලධර්ම බොහොමයක් උගත්තෙහිය. මෙම පරිච්ඡේදයෙන් මේ මූලධර්ම සාරාංශගත කර ඇති අතර ඔබ උගත් ආත්මික බලය අත්දකිමට ඔබට හැකිවීම පිණිස අවසන් මාර්ගෝපදේශ දී ඇත.

### ආත්මික බලය ලබා ගැනීම

ආත්මික බලය, හැඟීම් තුළින් ක්‍රියා කරමින් ඔබ ලබාගන්නා දෙයක් නොවේ. එය ශුද්ධ ලියවිල්ල ඉගෙනීම මගින් ඔබ නිපදවන්නේ ද නැත. බලය පිළිබඳ බයිබලි මූලධර්ම දැනුමෙන් වුවද ආත්මික බලය ලැබෙන බවට සහතික කළ නොහැකිය.

ආත්මික බලය එහි ප්‍රභවයෙන් ගලා එන්නකි. යේසුස්වහන්සේ මිදිවැලට සමානකර ඇත. ඔබ ආත්මික අත්තකි. ඔබටම බලය නිපදවිය නොහැකිය. බලය ලැබෙන්නාවූ ජීව නාලිය උන්වහන්සේය. උන්වහන්සේගේ බලය ඔබ තුළින් ගලා යෑමට ඉඩ දෙන්න.

> **මිදිවැල මමය, නුඹලා අතුය. යමෙක් මා තුළෙහි පවතින්නේද, මම ඔහු තුළෙහි පවතිම්ද, ඒ තැනැත්තේ බොහෝ ඵල දරයි. මක්නිසාද මාගෙන් වෙන්ව කිසිවක් කරන්ට නුඹලාට බැරිය.** (යොහන් 15:5)

මෙම බලය  අත්දැකීම සඳහා බයිබලීය මාර්ගෝපදේශ පහත දැක්වේ.

### 1. නිරාහාරව සිටිමින් යාච්ඤා කරන්න

දෙවියන්වහන්සේ ඉදිරියට පැමිණ නිරාහාරව සිටීමෙන් හා යාච්ඤා කිරීමෙන් ඔබම නිහතමානී වන්න. මෙම ආකල්පය ඇතිව උන්වහන්සේ ඉදිරියට පැමිණීවට අපට සවන්දීමට දෙවියන්වහන්සේ පොරොන්දු වී ඇත.

**මාගේ නාමය දරන මාගේ සෙනඟ යටත් වී යාච්ඤා කර මාගේ මුහුණ සොයා තමන්ගේ නපුරු මාර්ග අත්හැරියොත්, මම ස්වර්ගයේ සිට අසා ඔවුන්ගේ පව් කමාකොට ඔවුන්ගේ දේශය සුව කරන්නෙමි.** (2 ලේකම් 7:14)

බලය පසුපස නොයන්න. යාච්ඤා කිරීමෙන් හා නිරාහාරව සිටීමෙන් දෙවියන්වහන්සේගේ බලය ගලා යා හැකි මාර්ගයක් වීම සඳහා ඔබ සූදානම් වන්න.

## 2. ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාව ලබාගැනීම

**නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය.** (ක්‍රියා 1:8)

## 3. ඇදහිල්ල ක්‍රියාත්මක කරන්න

ඇදහිල්ල මගින් බලය පිළිබඳ උන්වහන්සේගේ පොරොන්දුව පිළිගන්න.

**බලව... සතුරාගේ සියලු බලය මැඬපවත්වන්ටත් මා විසින් නුඹලාට බලය දී තිබේ.** (ලූක් 10:19)

**ඇදහිල්ල නම් බලාපොරොත්තුවන දේවල් ගැන සහතිකයය, නොදක්නා දේවල් ගැන ඔප්පුවය.** (හෙබ්‍රෙව් 11:1)

ඔබ ගැළවීම පිළිගනු ලැබුයේ ඇදහිල්ල මගිනි. දැන් දෙවියන්වහන්සේගේ බලය ඇදහිල්ලෙන් පිළිගන්න. ගැළවීම පිළිගැනීම මෙතරම් පහසු වන්නත් සුව කිරීම, යක්ෂයන් පලවා හැරීම වැනි උන්වහන්සේ බලය පෙන්වන ආශ්වර්යමත් ක්‍රියා ගැන දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීම එතරම් අපහසු වන්නත් හේතුව කුමක්ද?

## 4. බයිබලීය බල මූලධර්ම ව්‍යවහාර කරන්න

ඔබ මෙම පාඨමාලාවෙන් උගත් බල මූලධර්ම ව්‍යවහාර කිරීමට ඇදහිල්ලෙන් යුක්තව ආරම්භ කරන්න.

**ශුභාරංචියේ බලය:** ශුභාරංචියේ බලය මගින් පළමුව ඔබගේ ජීවිතය වෙනස් විය යුතුය. බලයේ සැබෑ පදනම පශ්වාතාප වීම වේ.

**ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය:** ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ වෙතට පැමිණි පසු ඔබ බලය ලබන්නේය.

**ප්‍රේමයේ බලය:** මෙය නොමැතිව ඕනෑම ආත්මික දීමනාවක්, බලය ප්‍රකාශ වෙන ඕනෑම ක්‍රමයක් බලරහිත වේ.

**ආලේප කිරීමේ බලය:** වියගහ බිඳ දමන්නේ ආලේප කිරීමෙනි. ඔබගේම ශක්තියෙන් හා බලයෙන් එය කළ නොහැකිය.

**බලය, ඇදහිල්ල හා ක්‍රියා:** මේවා එකිනෙකින් වෙන් කළ නොහැකිය. එය උන්වහන්සේගේ නාමය තුළින් ලැබෙන බලය වේ.

**යේසුස්වහන්සේගේ නාමය:** ඔබ පැමිණෙන්නේ උන්වහන්සේගේ අධිකාරී බලයෙනි. එය උන්වහන්සේගේ නාමය තුළින් ලැබෙන බලය වේ.

**යාච්ඤාවේ බලය:** යාච්ඤාව හා නිරාහාරව සිටීමේ ප්‍රතිඵලය ආත්මික බලයකි.

**දේව වචනයේ බලය:** ඔබගේ වචන නොව උන්වහන්සේගේ වචන කතා කරන්න. උන්වහන්සේගේ වචන හිස්ව ආපසු නොපැමිණේ. එය යැවූ පරමාර්ථය එය ඉෂ්ට කරනු ඇත.

**අධිකාරීත්වයේ බලය:** අධිකාරී බලය යටතේ සිටින්න, එවිට අධිකාරී බලය ඇතිව ඔබට කටයුතු කළ හැකිය.

**උන්වහන්සේගේ නැවත-නැගිටීමේ බලය:** එය දැන්, ඔබගේ මරණයට පත්වන ශරීරයේ අත්දකින්න

**දුක්විඳීමේ බලය:** විපතේදීත් විපත පාලනය කිරීමේදීත් ඔබට බලය ඇත. වැඩිම පීඩනයක් ඇතිවන්නේ බලය වැඩි විටය. ඔබට පැමිණෙන කරදර දෙවියන්වහන්සේගේ බලය ප්‍රකාශ කෙරෙන අවස්ථාවන් බවට හරවා ගන්න.

## සාමූහික බලය

ආත්මික බලය ඇදහිලිවතුන් අත්දැකිය යුත්තේ පෞද්ගලිකව වුවද ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයෙන් ස්වාධීනව එය ක්‍රියාත්මක නොකළ යුතුය. සභාව සාමූහිකව ආත්මික බලය අත්දැකීම දෙවියන්වහන්සේගේ සැලැස්ම වේ. උන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීමේ කේන්ද්‍රස්ථානය සභාව විය යුතුය.

එක් දිනක් යේසුස්වහන්සේ ජෙරුසලමේ දේව මාලිගාවට ගිය විට නායකයන් ගවයන් බැටළුවන් හා පරෙවියන් විකුණනු දුටු සේක. සෙනඟගේ පූජාකිරීමේ සතුන් ලබාගැනීමේ අවශ්‍යතාව මත ලාභ ලැබීමේ වයාපාරයක් ඔවුහු එහි පැවැත්වූහ. ඔවුන් දේවස්ථානය ව්‍යාපාරික ස්ථානයක් බවට පත්කර තිබිණි.

යේසුස්වහන්සේ ලණුවලින් කුඩා කසයක් සාදා මේ මිනිසුන්ව දේව මාලිගාවෙන් පන්නා දැමූ සේක. උන්වහන්සේ මුදල් බිම දමා මේස පෙරලා දැමූ සේක. උන්වහන්සේ මෙසේ පැවසූ සේක.

> **මාගේ ගෘහය යාච්ඤා ගෘහයක් වන්නේයයි ලියා තිබේ; නුමුත් නුඹලා ඒක සොරුන්ගේ ගුහාවක් කර තිබේ. (ලූක් 19:46)**

අද බොහෝ අවස්ථාවල දේවස්ථානය, සමාජ මධ්‍යස්ථානයක්, විනෝදවීමේ හා සහභාගිකම් පැවැත්වීමේ ස්ථානයක් බවට පත්ව ඇත. එය ආහාර බෙදා දීමේ හා විනෝදවීමේ මධ්‍යස්ථානයක් වී තිබේ.

මේ ඇතැම් ක්‍රියාකාරකම් පැවැත්විය යුතුය, එහෙත් දේවස්ථානය වෙනුවෙන් දෙවියන්වහන්සේගේ සැබෑ පරමාර්ථය එය නොවේ. දේවස්ථානය යාච්ඤාවේ හා බයිබල් අධ්‍යයනයේ මධ්‍යස්ථානයක්ව තිබියදීත්, එහි දොරටුවට පිටතින් පවතින මනුෂ්‍ය අවශ්‍යතාවන් ඉටු නොවන්නේ නම් එය දෙවියන්වහන්සේගේ පරමාර්ථ ඉටු කරන ස්ථානයක් නොවනු ඇත.

යේසුස්වහන්සේ පවිත්‍ර කළ දේව මාලිගාව වෙළඳාම් කිරීමේ හා ව්‍යපාර පැවැත්වීමේ මධ්‍යස්ථානයක් බවට පත්වී තිබිණි. එහෙත් යේසුස්වහන්සේ ලූක් 14:16-24 හි සඳහන් උපමාව මගින් දේවස්ථානයේ සැබෑ පැමාර්ථය පැහැදිලි කළ සේක. මේ උපමාවේ සඳහන් වන්නේ නිවසේ ස්වාමියා ඔහුගේ සේවකයන්ට පැවසූ දේ වේ.

> **නුඹ නුවර විදිවලට ද අතුරු පාරවලට ද වහාම ගොස්, දිළිඳුන් ද අබ්බගාතයන් ද අන්ධයන් ද කොරුන් ද මෙහි ගෙනෙන්නැයි තමාගේ දාසයාට කීවේය.**
>
> **නුඹ මහමාවත්වලට ද වැටවල් දිගට ද ගොස්, මාගේ ගෙය පිරෙන පිණිස මනුෂ්‍යයන්ට එන්ට බලකරපන්න. (ලූක් 14:21,23)**

දේවස්ථානය ප්‍රබල මානුෂික අවශ්‍යතාවන් ඇති සමූහයන්ගෙන් පිරී තිබිය යුතුය. සෑම සමාජ මට්ටමකම සිටින අය වෙත ඇදහිලිවතුන් ගොස් මේ තුළට ඒමට ඔවුන්ට බල කළ යුතුය. ආත්මික බලයෙන් යුත් ඇදහිලිවතුන්ගෙන් සභාව පිරී තිබිය යුතුය. මේ මගින් දෙවියන්වහන්සේට ප්‍රකාශ විය හැකි සාමූහික වාතාවරණයක් සභාව තුළ ඇතිවේ. එහි කොරවූවෝ ඇවිදිති, අන්ධයෝ පෙනීම ලබති, බිහිරන්ගේ කන් ඇසෙනු ඇත. එමෙන්ම ශුභාරංචියේ බලයෙන් ඔවුන්ගේ ජීවිත වෙනස් වන්නේය.

යෙරුසලමේ දේව මාලිගවේ දොරටුව අසල සිටි කොර මිනිසා මතකද? (ක්‍රියා 3) දේව මාලිගාව තුළ ආගමික මෙහෙයයන් පැවැත්විනි. එහි අලංකාර උත්සව, ප්‍රාණවත් යාච්ඤාවන්, කන්කළු ගිතිකා ගැයුම් ආදිය පැවැත්විනි. එහෙත් දොරටුව අසල දුප්පත් කොර මිනිසෙක් සිටි අතර ඔහුගේ අවශ්‍යතාවන් ඉටුවුනේ නැත. ඔහු සිටින බවක්වත් පෙනුනේ නැත. අවසානයේ දී දෙවියන්වහන්සේ තුළ ඇදහිල්ල ඇති මිනිසුන් දෙදෙනෙක්, ආත්මික බලය අත්දුටු අය, ඔහු අසලින් ගියහ. පේතෘස් ඔහුට මෙසේ පැවසීය; "මා දෙස බලන්න. මට ඇති දේ නුඹට දෙමි". එකෙණෙහිම ඔහුගේ පාදවලට ශක්තිය ලැබී දෙවියන්වහන්සේගේ බලයෙන් සුවවිය. අවශ්‍යතා ඇති ලෝකය අප දෙස බලා සිටී. දුක්විඳින මිනිස් සංහතිය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සභාව වෙත නෙත් යොමු කර ඇත. ඔවුන්ට දෙන්නට යමක් අපට තිබිය යුතුය.

## භාවිතයෙන් වැඩිකරගන්නා නීතිය

"භාවිතයෙන් වැඩි කරගන්නා නීතිය" නමැති බයිබලීය මූලධර්මයක් ඇත. ඉන් ආත්මික බලයට බලපෑමක් ඇති කරයි. මේ මූලධර්මය නිවැරදිව ව්‍යවහාර කිරීමෙන් ඔබගේ ආත්මික බලය වර්ධනය වේ. ලූක් 19:12-16 හි යේසුස්වහන්සේ පවසා ඇති උපමාව කියවන්න. තමා ලද මුදල භාවිත කර වැඩිකරගත් ්‍රිසයන්ට තවත් මුදල් ලැබිණි. මුදලින් කිසිවක් නොකළ තැනැත්තාට එය නැතිවිය. "භාවිතයෙන් වැඩිකරගන්නා නීතිය" එය වේ. ඔබට දී ඇති දෙය භාවිත කරන්න. එවිට එය වැඩිවනු ඇත. ඔබ එය භාවිත කළ යුතුය නැතහොත් නැතිකර ගත යුතුය. දෙවියන්වහන්සේ ඔබට ආත්මික බලය දී ඇත්තේ සේවය කිරීමට මිස රජකම් කිරීමට නොවේ (මතෙව් 20:25-28). ඔබ ආත්මික බලය නියමාකාරයෙන් භාවිත කළහොත් ඔබ තුළ දෙවියන්වහන්සේගේ බලයේ ගලා යෑම වැඩිවන්නේය. එමෙන්ම ඔබගේ ජීවිතයේ හා සේවයේ උන්වහන්සේගේ බලය ප්‍රකාශවීම වැඩිවන බව ඔබ දකින්නෙහිය. ඔබ එය භාවිත නොකළහොත්, එය ඔබට නැතිවන්නේය.

> **ඇත්තාවූ සියල්ලන්ට දෙනු ලැබේ; නැති අයගෙන් ඔහුට ඇති දේත් පැහැරගනු ලැබේයයි නුඹලාට කියමි. (ලූක් 19:26)**

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න

2. මෙම පාඩමෙන් දී ඇති අන්දමට දෙවියන්වහන්සේගේ බලය අත්දකින ආකාරය සාරාංශ කරන්න

3. ආත්මික බලයට දක්වන සබඳතාවට අනුව සභාවේ පරමාර්ථය කුමක්ද?

4. ආත්මික බලය වැඩි කරගන්නේ කෙසේද?

(මේ පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

දෙවියන්වහන්සේගේ බලය ලකුණු, හාස්කම් හා ආශ්වර්යමත් ක්‍රියා මගින් අත්දකිනු ලැබේ. මෙම පද අධ්‍යයනය කරන්න.

නික්මයාම 15:11

ගණන්කථාව 14:22

ද්විතිය කථාව 6:22, 7:19, 11:3, 29:3, 34:11

යෝෂුවා 3:5

නෙහෙමියා 9:10

ගීතාවලිය 77:11,14; 78:11,43; 88:10,12; 89:5; 96:3; 105:27; 136:4;

ජෙරමියා 32:20

දානියෙල් 4:2-3

යොවෙල් 2:30

මාක් 16:17

යොහන් 2:11,23; 3:2; 6:2,26; 7:31; 9:16; 11:47; 12:37; 20:30

ක්‍රියා 2:22,43; 4:30; 5:12; 6:8; 8:6,13; 14:3; 15:12; 19:11

රෝම 15:19

1 කොරින්ති 12:10,28,29

ගලාති 3:5

හෙබ්‍රෙව් 2:4

# දහනව වන පරිච්ඡේදය

# බලය බිඳ වැටීම

## අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- බලය බිඳ වැටීමට හේතු දේව වචනයෙන් හඳුනා ගැනීමට
- මිනිසාට පිළිතුරු සොයා ගත නොහැකි අවස්ථාවල දෙවියන්වහන්සේගේ පරමබලධාරීකම සහතික කෙරෙන දේව වචනයෙන් යොමුවීමක් දීමට

හැකිවනු ඇත.

## ප්‍රධාන පදය

> **ඔවුන්ගේ ඇදහිලි නැතිකම නිසා උන්වහන්සේ එහිදී බොහෝ ආශ්චර්යයන් නොකළ සේක. (මතෙව් 13:58)**

## හැඳින්වීම

ස්වභාවික ලෝකයේ මිනිසා දියුණුව උදෙසා ස්වභාවික බල ප්‍රභව මත යැපේ. ස්වභාවික බලය රාත්‍රි ආහාර පිසින ලිපක ගින්දර තරම් සරල විය හැකිය. ගින්දර නොමැතිවුවහොත් ආහාර පිසීම නැවතේ. එමෙන්ම ස්වභාවික බලය විශාල යන්ත්‍ර මගින් නිපදවන විදුලිය මෙන් සංකීර්ණ විය හැකිය. මේ යන්ත්‍ර ක්‍රියා විරහිත වුවහොත් ඒවායින් බලය නිපදවෙන්නේ නැත. එවිට ඇතැම් විට මුළු නගරයම අන්ධකාරය අත්දකිනු ඇත. ස්වභාවික ලෝකයේ බලය නිපදවීම බිඳ වැටුණු විට දියුණුව නතර වේ.

ආත්මික ලෝකයේද මේ දේ සැබෑය. බලය බිඳවැටීමක් සිදුවුවහොත්, ආත්මික දියුණුව නතර වන්නේය. එවිට ශුභාරංචියේ බලය මගින් ජීවිත වෙනස්වන්නේ නැත. රෝගීන් සුව වන්නේ නැත, යක්ෂයන් පලවා හැරිය නොහැකිය.

ස්වභාවික ලෝකයේ බලය බිඳවැටීමට හේතු තිබේ. එය ගින්න නිවී යෑම වැනි සරල දෙයක් හෝ යන්ත්‍රයේ දෝෂයක් වැනි සංකීර්ණ දෙයක් හෝ වේ. මේ බිඳ වැටීමට හේතු හඳුනාගෙන ඒවාට පිළියම් යෙදුවහොත් බලය ගලායෑම නැවත ආරම්භ වේ.

ආත්මික ලෝකයේ බලය බිඳවැටීමට හේතු තිබේ. මේවා හඳුනාගෙන නිවැරදි කළහොත් ආත්මික බලය ගැලීම නැවත ආරම්භ වේ.

## ඔබගේ නාමය නිරයේ දන්නේද?

ආත්මික බලය බිඳිවැටීමේ ප්‍රබල අවස්ථාවක් ක්‍රියා 19:13-16 හි සඳහන් වේ. මිනිසෙකුගේ තුළ වූ නපුරු ආත්මයක් පලවා හැරීමට උත්තම පූජකයාගේ පුත්‍රයින් උත්සාහ කළ විට ඔවුන් අසාර්ථක වූ අයුරු ක්‍රියා 19:13-16 හි කියවන්න. ආත්මය මෙසේ මොර දුන්නේය.

> **... යේසුස්වහන්සේ අඳුනමි, පාවුල්ද දනිමි, නුමුත් නුඹලා කවුරුද? (ක්‍රියා 19:15)**

ඉන්පසු ආත්මය වැහි සිටි මේ මිනිසා, මේ තරුණයන් පිටට පැන ඔවුන්ගේ වස්ත්‍ර ඉරා දමා, ඔවුන්ට තුවාල කළේය. ඔවුහු නිර්වස්ත්‍රව තුවාලද ඇතිව යක්ෂ ආත්මය තිබූ මිනිසා වෙතින් පලා ගියහ. පාවුලුතුමාගේ නම යක්ෂ ආත්මය දැන සිටියේය. යේසුස්වහන්සේගේ නමද යක්ෂ ආත්මය දැන සිටියේය. එහෙත් මේ තරුණයන්ගේ නම් දැනගෙන සිටියේ නැත. මක්නිසාද ඔවුන්ගේ ජීවිත තුළ සැබෑ ආත්මික බලය නොතිබුණු බැවිනි.

ඔබගේ පාපවලට ඔබ කමාව ලබා ඇත්නම් ඔබගේ නාමය ස්වර්ගයෙහි දනී. එය එළිදරව් 21:27 හි සඳහන් බැටළුපැටවාණන්ගේ ජීවන පොතෙහි ලියා ඇත. එහෙත් ඔබගේ නාමය නිරයෙහි දන්නෙහිද? දෙවියන්වහන්සේගේ බලය ඔබ තුළින් ගලා යෑම නිසා යේසුස්වහන්සේගේ නාමයෙන් ඔබගේ අධිකාරී බලය යක්ෂ ආත්ම බලවලට හඳුනාගැනීමට හැකිවෙන තරමේ තිබෙන්නේද?

යක්ෂ ආත්ම පලවා හැරීම සඳහා මේ මිනිසුන් යේසුස්වහන්සේගේ නාමය භාවිත කළද එය හරිගියේ නැත. යේසුස්වහන්සේගේ නාමය විජ්ජාවක් නොවේ. එය පසුපස ඇති බලය ඔබ සත=ව තිබිය යුතුය. එම නමේ අධිකාරී බලය ඔබ හැඳිනගත යුතුය. ඔබට අයත් විය යුතුය.

ඔබගේ නාමය නිරයෙහි දී නොදන්නේ නම්, අර්බුද ඇති විටෙක ඔබට පරාජයට මුහුණදීමට සිදුවන්නේය. පාවුලුතුමාගේ අත්දැකීම් පදනම් කරගෙන මේ මිනිසුන්ට සාතන් පරාජය කළ නොහැකි විය. ඔබට ද නොහැකිය. ඔබට සාතන් පරාජය කළ හැක්කේ ඔබගේ නාමය තුළ දෙවියන්වහන්සේගේ බලය ප්‍රකාශ වුවහොත් පමණි. ඔබගේ නාමය නිරයේ නොදැනීමට තරම් ඔබ බල රහිත නම්, ඔබ සතුරා ඉදිරියෙන් තුවාල සහිතව නිර්වස්ත්‍රව පලා යන්නෙහිය.

## බලය බිඳ වැටීම

ආත්මික බලය බිඳවැටීමට හේතු සමහරක් පහත දැක්වේ.

**පාපය**

පාපය මිනිසා දෙවියන්වහන්සේගෙන් ඈත් කරයි. ඔබ දෙවියන්වහන්සේගෙන් වෙන්වී සිටින්නෙහි නම් උන්වහන්සේගේ බලය ඔබ තුළින් ගලා යාමට නොහැකි වේ.

පාපයේ බන්ධනය සමඟ තමාගේ පොර බැදීම ගැන ප්‍රේරිත වූ පාවුල්තුමා කරන විස්තරය රෝම 7 හි කියවන්න. ඔහුගේ මිදීම ගැන රෝම 8 හි කියවන්න. ඔබ ඇදහිලිවන්තයෙකු ලෙස අත්දකින පාපය සමඟ කෙරෙන පොර බැඳීම පාවුලුතුමාටද තිබිණි. එහෙත් ඔහුගේ මාංශයේ ක්‍රියාත්මක වන පාපයේ ව්‍යවස්ථාව පරාජය කිරීමට ඔහු ඉගෙන ගත්තේය. මේ නිසා දෙවියන්වහන්සේගේ බලය ගලා යෑමට ඔහුගේ ජීවිතය විවෘතව තිබුනි.

සිමියොන් නැමැති පාපී මිනිසෙකු ආත්මික බලය ලබාගැනීමට මුදල් දෙන්නට සූදානම් වූ විට, පේතෘස්තුමා මෙසේ පිළිතුරු දුන්නේය.

> **මේ කාරණයෙහි කොටසක්වත් පංගුකාරකමක්වත් නුඹට නැත. මක්නිසාද දෙවියන්වහන්සේ ඉදිරියෙහි නුඹේ සිත හරි නැත.**
> **ඒ නිසා නුඹේ සිතේ කල්පනාව නුඹට කමාකරනු ලැබේදෝ කියා බලන පිණිස, නුඹේ මේ දුෂ්ටකම ගැන පශ්චාත්තාපව, ස්වාමින්වහන්සේට යාච්ඤාකරපන්න.**
> **මක්නිසාද නුඹ තිත්තකමේ පිතේද අයුතුකම නමැති බැම්මේද සිටින බව මට පෙනේ යයි කීවේය. (ක්‍රියා 8:21-23)**

මේ වෙන්වීම එක් කිරීමට එකම මාර්ගය පාපයට පශ්චත්තාප වී, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලේ තුළින් කමාව ලබා ගැනීම වේ. පාපය දෙවියන්වහන්සේගේ බලයෙන් වෙන් කරයි. යේසුස්වහන්සේ නැවත පැමිණෙන්නේ:

> **ඇවිළෙන්නාවූ ගින්නෙන් යුක්තව ස්වර්ගයෙන් එළිදරව්වී, දෙවියන්වහන්සේ නාඳුනන්නන්ටත් අපගේ ස්වාමිවූ යේසුස්වහන්සේගේ ශුභාරංචියට කීකරු නොවන්නන්ටත් ප්‍රතිඵල දෙන පිණිසය. (2 තෙසලෝනික 1: 6 ,7)**

පාපයේ සිටින අය

> **උන්වහන්සේගේ අභිමුඛයෙන් ද උන්වහන්සේගේ බලයේ තේජස ඉදිරියෙන් ද සදාකාල විනාශයේ දඬුවම විඳින්නෝය. (2 තෙසලෝනික 1:10)**

අවසානයේදී පාපයේ ප්‍රතිඵලය වන්නේ දෙවියන්වහන්සේගේ බලයෙන් සදාතන වෙන්වීම වේ.

### බන්ධන

ඔබගේ ජීවිතය තුළින් දෙවියන්වහන්සේගේ බලය ගලා යෑම වැලැක්වීමට ආත්මික බන්ධනවලට හැකිවේ. බන්ධන තුළම පාපය නැත. ඒවා ඔබ ඒවායේ පාලනය යටතට ගෙනෙන, ඔබට ඉතා වැදගත් දෙයක් බවට පත්වන දේවල් හෝ පුරුදු හෝ වේ. පාවුලුතුමා මෙසේ ලියා ඇත.

> **සියලු දේ ගැන මට නිදහස තිබේ. නුමුත් සියල්ල ප්‍රයෝජන නැත. නුමුත් මම කිසිවකට වසඟ නොවන්නෙමි.** (1 කොරින්ති 6:12)

ඔබගේ සිතිවිලි හා ආශාවන් පාලනය කෙරෙන ඔබගේ ජීවිතයේ ඇති ඕනෑම දෙයක් බන්ධනයකි. ඔබ එහි බලය යටතට ගෙන එයි.

එය පුරුද්දක් හෝ විනෝද ක්‍රීඩාවක් හෝ විය හැකිය. එය ඔබ ඇදහිල්ලෙන් හා බලයෙන් ක්‍රියා කිරීම වළක්වන බියක් හෝ බයාදුකමක් හෝ විය හැකිය. එවැනි බන්ධනවල ප්‍රතිඵලය වන්නේ බලය බිඳවැටීමකි. මක්නිසාද ඔබ ශුද්ධාත්මයෙන් පාලනය කරනු ලබනවා වෙනුවට ඒවායේ බලය යටතට ගෙන එනු ලබයි.

### බල මූලධර්ම කඩ කිරීම

ඔබ මෙම පාඨමාලාවෙන් බොහෝ බල මූලධර්ම ඉගෙන ගත්තෙහිය. මේ මූලධර්ම කඩකිරීම මගින් බලයේ බිඳ වැටීමක් සිදුවනු ඇත. මේ මූලධර්ම වලට අදාළව නිරන්තරයෙන්ම ඔබගේ ජීවිතය හා සේවය විමසා බලන්න. විශේෂයෙන් බලය බිඳ වැටුනු අවස්ථාවල එය අවශ්‍යය.

### සේවය කිරීම වෙනුවට රජකම් කිරීම

සේවය කිරීම වෙනුවට රජ කිරීමට ආත්මික බලය යොදාගත් විට බලයේ බිඳ වැටීමක් සිදුවේ. දෙවියන්වහන්සේගේ බල ව්‍යුහය ලෝකයාගේ මෙන් නොවන බව ඔබ මතෙව් 20:25-28 හි උගත්තෙහිය. බලය පිළිබඳ ලෝක මතය වන්නේ අන් අය පාලනය කරමින් රජකම් කිරීම වේ.

ක=ඩා කල සිටම අප ලෝකයේ බලය සදහා පොර බදින්නේය'' අප අපගේ දෙමවුපියන් පාලනය කි×මටත් තමාගේ වාසියට ඔවුන් හසුරුවා ගැනීමටත් තැත් කරයි'' අප ජීවත් වන සමාජයේ, ප×සරයේ බලය සොයන අතර ස්වභාවධ[1]මයේ බලයන්ද පාලනය බලය කි×මට තැත් කරයි'' ලෝකයේ බලය අපව පාලනය කරන දෙවියෙක් විය හැක''

බයිබලීය බල ව්‍යුහයෙන් ඉල්ලා සිටින්නේ දෙවියන්වහන්සේගේ බලය ප්‍රකාශ කිරීම මගින් මනුෂ්‍ය අවශ්‍යතාවන් සොයා ඒවාට සේවය කරන ලෙසය. මේ විෂය පිළිබඳව පාවුලුතුමා කොරින්තියේ ඇදහිලිවතුන්ට ලිවේය. සභාවේ ශ්‍රේෂ්ඨ ප්‍රේරිතයෙකු ලෙස පාවුලුතුමාට මේ ඇදහිලිවතුන් කණ්ඩායම වෙත අධිකාරී බලය තිබිණි. එහෙත් ඔහු ඒ බලය අනිසි ලෙස භාවිත කළේ නැත. ඔහු ඔවුන්ට පැවසුවේ.

> **අන්‍යයෝ නුඹලා කෙරෙහි මේ බලයට හවුල්වෙත් නම් ඊට වඩා අපට යුතු නොවේද? එසේවී නුමුත් අපි මේ බලය නොපවත්වා, ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචියට කිසි බාධාවක් නොකරන පිණිස සියල්ල දරාගනිමුව.** (1 කොරින්ති 9:12)

පාවුලුතුමා තමාගේ ආත්මික තත්වය අනිසිලෙස භාවිත කළේ නැත. ඔහු කොරින්තිවරුන් කෙරෙහි රජකම් කළේ නැත. ඔහු ඔවුන්ට සේවය කළේය.

> **එසේ කළේ බරක් වෙන්ට අපට අයිතිවාසිකම නැති නිසා නොව, අපම නුඹලාට ආදර්ශයක් වන පිණිසත් නුඹලා අප අනුව යන්නන් වන පිණිසත්ය.** (2 තෙසලෝනික 3:9)

### පෞද්ගලික ලාභ ප්‍රයෝජන

පෞද්ගලික යහපත සඳහා බලය භාවිතය පිළිබඳව පාවුලුතුමා කොරින්තියට ලියා යැව්ය.

**අපි නුඹලාට ආත්මික දේ වපුළෙමු නම්, නුඹලාගේ මාංසික දේ කැපීම මහත් දෙයක්ද? (1 කොරින්ති 9:11)**

පාවුලුතුමා කොරින්තිවරුන්ට මෙහෙවරකම් කරමින් ආත්මික බීජ වැපිරීය. ඔහුට ඔවුන්ගේ "මාංශික දේ" ලෙස මූල්‍යමය සහාය ලබාගැනීමේ අයිතිය තිබිණි. එහෙත් ඔහු මේ බලය අනිසි ලෙස යොදා ගත්තේ නැත. ඔහු ආත්මික බලය අනිසි ලෙස යොදමින් දෙවියන්වහන්සේගේ වැඩට බාධා කරනවා වෙනුවට දුක්විඳීම යහපත් යයි සිතීය. (1 කොරින්ති 9:12)

තම බලය පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා භාවිත කිරීමට පොළඹවමින් යේසුස්වහන්සේව සාතන් පරීක්ෂා කරනු ලැබීය. ගල් රොටි කිරීමටත් දේව මාලිගාවේ මුදුනේ සිට පැනීමෙන් බලය පෙන්වීමටත් සාතන් යේසුස්වහන්සේව පෙළඹවීය. යේසුස්වහන්සේ එය ප්‍රතික්ෂේප කළ සේක.

සියලු මනුෂ්‍ය වර්ගයාගේ පාපය වෙනුවෙන් යේසුස්වහන්සේ කුරුසිය මත මහත් සේ දුක්විඳි අවස්ථාවේ, උන්වහන්සේව බේරා ගැනීමට සුර දූතයන් 10,000 කට කැඳවීමට වුවද උන්වහන්සේට හැකියාව තිබිණි (මතෙව් 26:53). උන්වහන්සේ බලය එසේ ප්‍රදර්ශනය කිරීම ප්‍රතික්ෂේප කළ සේක. ඒ දෙවියන්වහන්සේගේ උසස් පරමාර්ථය ඉටු කරන පිණිසය.

## අනුකරණය

මාංශික පාපයක් වූ 'අනුකරණය කි×ම' පිළිබඳව ඔබ මෙම පාඨමාලාවෙන් මීට පෙර උගත්තෙහිය. එය අන් අය අනුකරණය කරමින් ඊර්ෂ්‍යාව ප්‍රදර්ශනය කෙරෙන එක් ක්‍රමයකි (ගලාති 5:20). මෙය මුල් සභාවේ බලය බිඳ වැටීමට එක් හේතුවක් විය. ක්‍රියා 19:13 හි සඳහන් වන්නේ පාවුලුතුමාගේ මෙහෙය අනුකරණය කරමින් "තමන් විසින්ම" යක්ෂ ආත්ම පලවා හැරීමට උත්සාහ කළ අය පිළිබඳවය. අන් අයගේ සේවාවන් අනුකරණය කිරීමට ඔබ උත්සාහ ගත් විට ඔබට, මේ අයට මෙන්ම, බලවත් බලය බිඳ වැටීමක් අත්දකින්නට හැකිවනු ඇත.

## වැරදි චේතනා

ආත්මික බලය අනිසි ලෙස භාවිත කළ නිසා එය නපුරක් යයි නොසිතන්න. දෙවියන්වහන්සේගෙන් ගලා එන ආත්මික බලය යහපත්ය. එහෙත් එය අනිසි ලෙස, වැරදි හේතු හා වැරදි චේතනාවන් උදෙසා භාවිත කළ හැකිය.

සාතන්ගේ මුල් පාපය, බලය සෙවීමේ වැරදි චේතනාවේ ප්‍රතිඵලයකි. මිනිසාගේ පළමු පාපය පිළිබඳව ද මෙය සත්‍යයකි. එයද දැනුම සමඟ බලය සෙවීම සඳහා කරන ලද්දකි.

යේසුස්වහන්සේට විරුද්ධවූ අය වෙත අහසින් ගින්දර ගෙන්වාගෙන ඔවුන්ව දවාලීමට වරක් යාකොබ්ට හා යොහන්ට අවශ්‍ය විය. එය බලය පිළිබඳ කෙතරම් ආශ්චර්යමත් ක්‍රියාවක් වන්නේද? එහෙත් ඔවුන්ගේ චේතනාව වැරදිය. ඔවුන්ගේ චේතනාව වූයේ තම සතුරන්ගෙන් පළිගැනීමය. එවැනි ප්‍රදර්ශනයක් ආත්මික බලය අනිසි ලෙස භාවිත කිරීමක් වේ.

> **උන්වහන්සේගේ ගෝලයෝ වූ යාකොබ්ද යොහන්ද ඒ දැක: ස්වාමිනි, ඔවුන් නාස්ති කරන පිණිස අහසින් ගිනි බසින්ට අප අණ කරනවාට ඔබ කැමතිසේක්දැයි ඇසුවෝය. නුමුත් උන්වහන්සේ හැරී ඔවුන්ට තරවටු කළසේක. (ලූක් 9:54-55)**

වැරදි චේතනාවල ප්‍රතිඵලය වන්නේ බලය අසමබර ලෙස අවධාරණය කිරීම වේ. යේසුස්වහන්සේ තම ගෝලයන්ට මෙසේ අවවාද කළ සේක.

> **බලව, සර්පයන්ද ගෝනුස්සන්ද පාගන්ටත් සතුරාගේ මුළු ශක්තිය මැඩපවත්වන්ටත් මා විසින් නුඹලාට බලය දී තිබේ.**
> **කොයි දෙයකින්වත් නුඹලාට අන්තරායක් නොවන්නේය. එසේවුවත් ආත්මයන් නුඹලාට යටත්වන නිසා නොව නුඹලාගේ නාම ස්වර්ගයෙහි ලියා තිබෙන නිසා ප්‍රීති වෙයල්ලා. (ලූක් 10:19-20)**

## අවිශ්වාසය

ඇතැම්විට ආත්මික බලය බිඳවැටීමේ ප්‍රධානතම හේතුව වන්නේ අවිශ්වාසයයි. අවිශ්වාසයය, යේසුස්වහන්සේගේ සේවයද බලපෑවේය.

> **ඔවුන්ගේ ඇදිහිලි නැතිකම නිසා උන්වහන්සේ එහිදී ආශ්චර්යයන් නොකළ සේක. (මතෙව් 13:58)**

ඔබ සේවය කරන අයගේ අවිශ්වාසය, දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීම කෙරෙහි බල පෑ හැකිය. එමෙන්ම ඔබගේ අවිශ්වාසයද ඊට බලපෑමට ඉඩ තිබේ. (මතෙව් 17:14-21)

## දෙවියන්වහන්සේ සීමා කිරීම

දෙවියන්වහන්සේගේ බලයට සීමාවක් නැත. එහෙත් එය අප තුළත්, අප තුළිනුත් ක්‍රියා කරන ආකාරය පිළිබඳව අපට සීමාවන් පැනවිය හැකිය. අප තුළ ක්‍රියා කරන බලයට අනුකූලව, අප සිතන හා ඉල්ලන සියල්ලටම වඩා ඉහළින් දෙවියන්වහන්සේට ක්‍රියා කළ හැකි බව පාවුලුතුමා පෙන්නුම් කළේය.

> **ඉතින් අප තුළ ක්‍රියාකරන්නාවූ බලයේ හැටියට අප ඉල්ලන නොහොත් සිතන හැමදේට වඩා ඉතා අධිකලෙස කරන්ට බලය ඇත්තාවූ තැනැන්වහන්සේටම සදාකාලයම ගෞරවය වේවා. (එපීස 3:20)**

ඇතැම්විට දෙවියන්වහන්සේ, අප ඉල්ලන හෝ සිතන හෝ දේ කරන්නේ නැත. මක්නිසාද උන්වහන්සේගේ බලය අප තුළ ක්‍රියා කිරීමට ඉඩ නොදෙන බැවිනි.

### හාස්කමක් නොමැති විට

ඇදහිලිවන්තයෙක් බලය බිඳවැටීමක් අත්දුටු විට, ඉහත සාකච්ජාවක් කළ සෑම ක්ෂේත්‍රයක්ම යාච්ඥාවන් යුතුව විමසා බැලිය යුතුය. ඒවා කඩකළ අවස්ථාවන් සොයාගත් විට, දෙවියන්වහන්සේගේ බලය බාධාවෙන් තොරව ගලා ඒම සඳහා නිවැරදි කළ යුතුය.

එහෙත් මේ සියලු ක්ෂේත්‍රයන් පිළිබඳව කටයුතු කළද, හාස්කමක් සිදු නොවූයේ නම් කළ හැක්කේ කුමක්ද? අපගේ යාච්ඥාවලට පිළිතුරු ලෙස එක් අයෙකු මිදීම ලැබුවද තවත් කෙනෙක් එසේ මිදීම නොලබන්නේ මන්ද? පහත දැක්වෙන්නේ සැබෑ නිදසුන් කිපයකි.

- එක් කිතුනු යුවලකට කුඩා දරුවන් දෙදෙනක් සිටියහ, ඒ පිරිමි ළමයෙක් හා ගැහැණු ළමයෙකි. දෙදෙනාම ප්‍රබල ලෙස රෝගීව සිටියහ. මේ දෙදෙනා වෙනුවෙන් දෙමවුපියෝ සහ ඔවුන්ගේ ඇදහිලිවන්ත කිතුනු කණ්ඩායම යාච්ඥා කළහ. එක් අයෙකු සුවය ලැබූ අතර ඔහු අද ශුභාරංචිය පිළිබඳ දේවගැතිවරයෙකි. අනෙක් කෙනා සුව වූයේ නැත. ඇය බොහෝ කලක් අසරණ තත්වයක සිට පසුව මිය ගියාය.

- සුව කිරීම සඳහා දෙවියන්වහන්සේ බලවත් ලෙස යොදා ගන්නා ජාත්‍යාන්තර ප්‍රසිද්ධියක් උසුලන එක් දේවගැතිවරයෙක් පැවසුවේ ඔහු යාච්ඥා කළ අයගෙන් සුවය ලැබුවේ 10%ක් පමණක් බවය.

- ඇදහිලිවතුන්ගේ යාච්ඥා බලයෙන් සිරගෙයින් එළියට ආ එම පේතෘස්ම පසුව ශුභාරංචිය වෙනුවෙන් ජීවිතය පූජා කළේය. සිරගෙයි දොරටු විවෘත කළ ඒ බලයම මේ භයානක මරණයෙන් ගළවා ගැනීමට නොහැකිවූයේ මන්ද?

- එලියාගේ කාලයේ කුෂ්ඨ රෝගීහු බොහොමයක් ඉශ්රායෙලයේ සිටියහ. එහෙත් දෙවියන්වහන්සේ විසින් සුවකරනු ලැබුවේ එක් අයෙක් පමණි. (ලූක් 4:27)

මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු අප සතුව නැත. මේ සියල්ල වෙනුවෙන් අපට පිළිතුරු තිබුණේ නම් හා අපට සියලු නුවණ තැබුණේ නම්, එවිට අප දෙවියන්වහන්සේ හා සමාන වන්නෙමු.

ආත්මික බලය පිළිබඳ ක්ෂේත්‍රවලදී අපි සැමවිටම දෙවියන්වහන්සේගේ පරමබලධාරී බලය පිළිගත යුත්තාහ. අප ක්‍රියා කරන්නේ පවරන ලද බලය නිසාය. එය ඵලදායී බලයකි. එය ප්‍රබල බලයකි. එහෙත් එය පවරන ලද්දකි. එනම් එය පවතින්නේ වෙනත් කෙනෙකුගේ අධිකාරී බලය යටතේය.

අපට පිළිතුරු සොයාගත නොහැකි ප්‍රශ්න පිළිබඳව බයිබලය මෙසේ සඳහන් කරයි.

> **රහස්වූ දේ අපේ දෙවිවූ ස්වාමින්වහන්සේට අයිතිය. එහෙත් මේ ව්‍යවස්ථාවේ සියලු වචන අප විසින් පවත්වන පිණිස එළිදරව් කර තිබෙන දේ අපටත් අපේ දරුවන්ටත් සදාකාලයටම අයිතිය. (ද්විතිය කථාව 29:29)**

ඇතැම් අවස්ථාවල හාස්කමක් නැත්තේ මන්දැයි දෙවියන්වහන්සේ එළිදරව් කරන සේක. අනෙක් අවස්ථාවල පිළිතුරු සෙවීමට අපට නොහැකිය. දෙවියන්වහන්සේ පමණක් දන්නා රහස් දේ තිබේ. අප ක්‍රියා කරන්නේ එළිදරව් වන ක්ෂේත්‍රය මිස, පරමබලධාරී නුවණින් නොවේ. එහෙත් ඔබගේ ජීවිතය තුළ දෙවියන්වහන්සේගේ බලය ක්‍රියාකාරිත්වය සඳහා මෙය බාධාවක් කර නොගන්න. එළිදරව් වූ දෙය තුළ ගමන් කරන්න. පිළිතුරු ප්‍රශ්නද, රහස් දේද. පරමබලධාරී දෙවියන්වහන්සේට බාර දෙන්න.

දෙවියන්වහන්සේගේ බලය ජීවිතයේ දී පමණක් නොව මරණයේදී ද ප්‍රකාශ වේ. එමෙන් දන්නා හා තේරුම්ගත හැකි දේ තුළින් ද නොදන්නා දේ තුලින් ද එය ප්‍රකාශ වේ. එය දුර්වල අවස්ථාවන්වලදීත් ශක්තිය ඇති අවස්ථාවලදීත් ප්‍රදර්ශනය කෙරේ.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න

2. මිනිසාට පිළිතුරු සෙවිය නොහැකි අවස්ථාවල දෙවියන්වහන්සේගේ පරම බලධාරීත්වය සහතික කෙරෙන ශුද්ධ ලියවිලි යොමුවක් දෙන්න.

3. ආත්මික බලය බිඳ වැටීම සඳහා මෙම පරිච්ඡේදයෙන් ඔබ උගත් හේතු සාරාංශ කරන්න.

(මේ පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම

1. 2 සාමුවෙල් 11 වන පරිච්ඡේදයේ ඇති දාවිත් හා බැත්-ෂෙබා පිළිබඳ කතාන්දරය කියවන්න. දාවිත්, දෙවියන්වහන්සේ රජතුමෙකු ලෙස දුන් බලය කාමමිථ්‍යාචාරයේ යෙදෙන්නත්, වෙනත් කෙනෙකුගේ භාර්යාවක් ගැනීමටත්, ඇගේ ස්වාමිපුරුෂයා මැරවීමටත් අනිසි ලෙස භාවිත කළේය. 2 සාමුවෙල් 12(1-14 හි දෙවියන්වහන්සේගේ අනාගතවක්තෘවරයා, අනිසි ලෙස බලය භාවිත කිරීම ගැන අවධාරණය කරමින් තරවටු කළ ආකාරය බලන්න.

2. බාලාම් නමැති පැරණි ගිවිසුමේ අනාගතවක්තෘවරයාද දෙවියන්වහන්සේ දුන් ආත්මික බලය අනිසි ලෙස භාවිත කළේය. ඔහුගේ කතාව, ගණන් කථාව 22-24 හි කියවන්න.

3. ආත්මික බලය අනිසි ලෙස භාවිත කරන අය මගින් ඔබ නොරැවටෙන පිණිස දෙවියන්වහන්සේගේ සැබෑ බලය දැනගැනීමේ වැදගත්කම ක්‍රියා 8:9-11 දී පෙන්වා ඇත.

4. යෙහෝවාස්ගේ කතාන්දරය 2 රාජාවලිය 13:18-19 හි කියවන්න. දෙවියන්වහන්සේ දුන් බලය සියල්ල යෙහෝවාෂ් භාවිත නොකිරීම පිළිබඳව ස්වාමින්වහන්සේ හා අනාගතවක්තෘවරයා කළ කිරීමට පත්වූහ. ඔහු දෙවියන්වහන්සේගෙන් මේ දේ ලැබුවද ඒ ඔහු විශ්වාස කළ දේ සඳහා පමණක් වේ. දෙවියන්වහන්සේට දීමට අවශ්‍යව තිබූ සියල්ල ඔහුට ලැබුනේ නැත, ඒ ඔහු මිනිස් සීමාවන් පනවා ගත් බැවිනි.

# විසිවන පරිච්ඡේදය

# විරෝධතාවලට මුහුණ දීම

## අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ආත්මික බලයට හා අධිකාරිත්වයට ඇති සියලු අභියෝගවල පසුපස ඇති ප්‍රභවය හඳුනාගැනීමට
- ආත්මික අධිකාරී බලය අභියෝගයට ලක් කරන්නේ මන්දැයි හඳුනාගැනීමට
- විරෝධතාවලට මුහුණ දීම් සඳහා මාර්ගනිර්දේශ ලයිස්තුගත කිරීමට

හැකිවනු ඇත.

## ප්‍රධාන පදය

> **ස්වාමීන්ට ද උන්වහන්සේගේ අභිෂේකලත් තැනැත්තාණන්ට ද විරුද්ධව පොළොවේ රජවරු සැරසෙති. අධිපතියෝ ද එක්ව මන්ත්‍රණය කෙරෙති. (ගීතාවලිය 2:2)**

### හැඳින්වීම

යේසුස්වහන්සේගේ බලය හා අධිකාරිත්වය බොහෝ අවස්ථාවල උන්වහන්සේගේ මෙලොව සේවයේදී අභියෝගයට ලක් කෙරිණි. ජලයෙන් යේසුස්වහන්සේ බව්තිස්ම ලැබූ පසු හා ශුද්ධාත්මයාණන්වහන්සේ උන්වහන්සේ වෙතට පැමිණි පසු උන්වහන්සේගේ බලය සාතන් විසින් පරීක්ෂාවන් තුනකින් අභියෝගයට ලක් කළේය. (මතෙව් 4:1-11)

ගල්, රොටි බවට හැරවීමෙන් පෞද්ගලික යහපතක් උදෙසා උන්වහන්සේගේ බලය භාවිත කිරීමට සාතන් යේසුස්වහන්සේව පෙළඹවිය. දේවමාලිගාවේ උසම ස්ථානයේ සිට පැනීමෙන් උන්වහන්සේගේ බලය පෙන්වීමට පෙළඹවීමෙන් ඔහු යේසුස්වහන්සේව පරීක්ෂා කළේය. යේසුස්වහන්සේ ඔහුට නමස්කාර කළහොත් ලෝකයේ සියලු රාජ්‍යයන් උන්වහන්සේට දෙන බව සාතන් පැවසීය.

යේසුස්වහන්සේගේ අධිකාරී බලය ඒ කාලයේ විසූ ආගමික නායකයෝ ද අභියෝගයට ලක් කළහ. ඔවුහු උන්වහන්සේගේ දේවධර්මයත්, එය ඉදිරිපත් කළ ආකාරයත් හා උන්වහන්සේගේ ජීවිතයේ හා සේවයේ දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීමත් අභියෝග කළහ.

### අභියෝග පිටුපස

තෙවෙනි පරිච්ඡේදයෙන් ඔබ 'අභියෝග බරන්නාවු ව්‍යජ දේ' පිළිබඳ අධ්‍යයනය කෙළෙහිය. සැබෑ ආත්මික බලය අභියෝගයට ලක් කරන සියලු බලයන් පිටුපස සාතන් සිටින බව මතක තබා ගන්න.

ආත්මික බලයට එරෙහි ඇතැම් විරෝධතාවන් පැමිණෙන්නේ ජීවිතයේ විවිධ අවස්ථාවන් තුළිනි. "ලෝකයේ අපේක්ෂාවන්" මහත්‍ය, බහුලය. ඔබගේ ජීවිතය තුළින් ගලායන දෙවියන්වහන්සේගේ බලයට බාධා පමුණුවන ඕනෑම අවස්ථාවක් පසුපස සාතන් සිටී.

බොහෝ විරෝධතාවන් පැමිණෙන්නේ ඔබ වටා සිටින අයගෙනි. එහෙත් ඔබට විරෝධතාවන් දක්වන්නේ ඒ සෙනඟම නොවන බව මතක තබාගන්න. ඔවුන්ගේ සිතිවිලි හා චර්යා රටාවන් කෙරෙහි සාතන්ට බලපෑම් ඇති කිරීමට ඔවුහු ඉඩ දෙති. ඔබගේ ආත්මික බලයට හා අධිකාරිත්වයට එරෙහිව ක්‍රියාකරන බලවේගය සැබවින්ම සාතන් වේ.

# අභියෝග කිරීමට හේතු

යේසුස්වහන්සේගේ අධිකාරී බලය අභියෝග කිරීමට හේතත් තිබුණි. සාතන්, ඔබගේ ආත්මික බලය අභියෝග කරන්නේද ඒ හේතු නිසාමය.

## අවිශ්වාසය

යායිරස්ගේ දුව මළවුන්ගෙන් නැගිටවීම පිළිබඳ කතාන්දරය ලූක් 8:49-56න් කියවන්න. යේසුස්වහන්සේ විශිෂ්ට හාස්කමක් කළ සේක, එහෙත් එසේ කිරීමට පෙර ඔබ වුවද මුහුණ දෙන ඇතැම් අභියෝගවලට සමාන ගැටළුවක් උන්වහන්සේට තිබිණි.

යේසුස්වහන්සේ යායිරස්ගේ නිවෙසට ඇතුළු වන විට උන්වහන්සේට අවිශ්වාසය හා ගැටෙන්නට සිදුවිය. ඔබ දෙවියන්වහන්සේගේ බලය ප්‍රකාශවීම සඳහා උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබන ඕනෑම වේලාවක, එය සිදුවිය නොහැකි මන්ද හා සිදු නොවිය යුත්තේ මන්ද, එය සිදුවීම දෙවියන්වහන්සේගේ කැමැත්ත නොවන්නේ මන්ද යන්න වැනි දේ නොඇදහිලිවන්තයන් පවසනු ඇත.

## ජනප්‍රිය මතය

ඔබ දෙවියන්වහන්සේගේ බලයේ ප්‍රධාන මාර්ගයේ සිටින බැවින්, සියලු දෙනාම ඔබට ඇල්ම දක්වන්නේ යැයි නොසිතන්න. ජනප්‍රිය මතය යේසුස්වහන්සේගේ අධිකාරී බලයට අභියෝග කළේය. මාක් 5:5-15 හි ඇති කතාව කියවන්න. යේසුස්වහන්සේ ශ්‍රේෂ්ඨ හාස්කමක් කළ සේක. එහෙත් ජනප්‍රිය මතය උන්වහන්සේ සමඟ නොවිය.

> **ඔවුහු වනාහි තමුන්ගේ සීමාවලින් අහක්ව යන මෙන් උන්වහන්සේගෙන් ඉල්ලන්ට පටන් ගත්තෝය. (මාක් 5:17)**

තවත් අවස්ථාවක සෙනඟ යේසුස්වහන්සේට සිනාසුණෝය. (මාක් 5:40). අවශ්‍ය වුවහොත් තනිවම හෝ සිටීමට ඔබ සූදානම් විය යුතුය. සෑම දෙනෙක්ම ඔබගේ සේවය ආදරයෙන් පිළිනොගැනීමට ඉඩ තිබේ. අන්තිම දිනවල සෙනඟ "කසන කන් ඇතිව" සවන් දීමට මහත් ආශාවන් ඇති කරන ගුරුවරුන් රැස්කරගනු ඇතැයි පැවසේ. ජනප්‍රිය සේවය වන්නේ සවන්දීමට ප්‍රිය කරන දේ පවසන අය මිස දෙවියන්වහන්සේගේ පණිවුඩය ප්‍රකාශ කරන අය නොවේ.

## සම්ප්‍රදාය

පරිසිවරුන් හා ලියන්නන් යේසුස්වහන්සේගේ අධිකාරී බලයට විරුද්ධ වුයේ එය ඔවුන්ගේ ආගමික සම්ප්‍රදායන් සමඟ එකඟ නොවූ බැවිනි. යේසුස්වහන්සේ බොහෝ විට "ඔබ අසා ඇත" යයි පවසමින් ආගමික නායකයන්ගේ සම්ප්‍රදාය වෙත යොමු කළ සේක. ඉන්පසු උන්වහන්සේ "එහෙත් මම ඔබට මෙසේ කියමි" යයි පවසමින් දෙවියන්වහන්සේගේ බලවත් සත්‍යයක් බෙදාගත් සේක. යේසුස්වහන්සේ විරෝධතාවන් අත්දුටුවේ බලය හා අධිකාරිත්වය පිළිබඳ උන්වහන්සේගේ ඉගැන්වීම් මිනිසා විසින් සාදන ලද සම්ප්‍රදායන් හා එකඟ නුවූ බැවිනි.

දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීමට ඔබගේ සංස්කෘතිය හා සම්ප්‍රදායන්ගේ අනුමැතිය නොලැබී යාමට ඉඩ ඇත. මෙය සත්‍යයක් නම්, එවිට ඔබට ද යේසුස්වහන්සේට මුහුණ දීමට සිදුවූ විරෝධතාවනට මුහුණ දෙන්නට සිදුවන්නේය.

## පිළිගත් සහතික

යේසුස්වහන්සේගේ අධිකාරීබලයට විරෝධතාවන් පැමිණියේ උන්වහන්සේ අනුමැතියලත් ආගමික නායකයෙකු නොවූ බැවිනි. උන්වහන්සේට පරිසිවරුන්ට හා ලියන්නන්ට මෙන් පිළිගත් සහතික පත්‍ර තිබුණේ නැත. ඔවුන් උන්වහන්සේව ප්‍රශ්න කළේ උන්වහන්සේ නාසරෙත් නම් දුප්පත් ගමෙන් පැමිණ වඩුවෙකුගේ පුත්‍රයෙකු වූ බැවිනි.

> **මොහු වඩුවාගේ පුත්‍රයා නොවේද? මොහුගේ මවුගේ නම මරියා නොවේද? මොහුගේ සහෝදරයෝ යාකොබ්, යෝසෙප්, සීමොන් සහ යූදස් නොවෙද්ද? මොහුගේ සියලු සහෝදරියොත් අප අතරෙහි නොවෙද්ද? එසේවී නම් මේ සියල්ල මොහුට කොයින්ද? (මතෙව් 13:55-56)**

ගෝලයෙකුවීමට සිටි කෙනෙක් ද මෙසේ ඇසීය.

> **නාසරෙත් නුවරින් යම් යහපතක් එන්ට පුළුවන්ද? ... (යොහන් 1:46)**

මිනිස්සු මෙසේ ප්‍රශ්න කළහ.

> **නුඹ මේ දේ කරන්නේ මොන බලයකින්ද? මේ බලය නුඹට දුන්නේ කවුද? (මතෙව් 21:23)**

ඔබ පිළිගත් ගෝත්‍රයකට කණ්ඩායමකට හෝ සමාජ මට්ටමකට අයත් නැතැයි සිතන අය විසින් ඔබගේ බලය හා අධිකාරිත්වය අභියෝගයට ලක් කරනු ඇත. ඔබට විධිමත් බයිබල් විද්‍යාලයක අධ්‍යාපනය නැති නිසා හෝ ඇතැම් නිකායක සහතිකයක් නැති නිසා හෝ ඔබට අභියෝග පැමිණීමට ඉඩ තිබේ.

මනුෂ්‍ය නිකායවලින් ලැබෙන සහතිකයකට වඩා ආත්මික බලයේ සහතිකය වඩාත් වැදගත් වේ. සියල්ලටම වඩා වැදගත් වන්නේ දෙවියන්වහන්සේගේ අනුමැතිය ලත් මිනිසෙකු හෝ ස්ත්‍රියක වීම වේ. (ක්‍රියා 2:22)

## ධර්මය

යේසුස්වහන්සේට විරෝධතාවන් පැමිණියේ උන්වහන්සේ ඉගැන් වූ ධර්මය නිසාය.

> **එකල ඔවුන්ගේ පුදුමය කෙතරම් වීදයත්, සියල්ලෝම: මේ කිමෙක්ද? අලුත් ඉගැන්වීමක්ය. මුන්වහන්සේ බලයෙන් යුක්තව අශුද්ධාත්මයන්ට පවා අණ කරන සේක. ඔවුහු උන්වහන්සේට කීකරුවෙතියි ඔවුනොවුන් අතරේ කථා කරගත්තෝය. (මාක් 1:27)**

යේසුස්වහන්සේ විසින් ප්‍රදර්ශනය කරනු ලැබූ බලය, ඒ කාලයේ සිටි ආගමික නායකයන්ගේ ධර්මය හා අනුරූප වූයේ නැත. උන්වහන්සේගේ ඉගැන්වීම්, ඔවුන් ධර්මය ලෙස හැඳින්වූ ඔවුන් විසින්ම සාදන ලද සිද්ධාන්ත හා විශ්වාසයන් සමඟ එකඟ වූයේද නැත.

## ඉගැන්වූ ආකාරය

යේසුස්වහන්සේ ඉගැන්වූ ආකාරය ගැන සමහරු විරුද්ධ වූහ. උන්වහන්සේ අධිකාරී බලය ඇතිව ඉගැන්වූ සේක. එය ලියන්නන්ගේ ඒකාකාර, නීරස ඉගැන්වීම් මෙන් නොවීය. ඇතැම් අය ඔබ කරුණු ඉදිරිපත් කරන ආකාරය ගැන විරුද්ධ වනු ඇත. ඔබ හැඟිම්බරව හා අධිකාරී බලයකින් යුක්තව උගන්වන බව ඔවුන් පවසනු ඇත.

යේසුස්වහන්සේගේ ඉදිරිපත් කිරීම සරල වූ අතර ඒවා බලවත් විය. ගැඹුරු, දේවධාර්මික පණිවුඩ එතරම්ම හැඟිම්බරක් නොමැතිව දේශනා කරන ලෙස ඇතැමුන් ඔබට උපදෙස් දෙනු ඇත. එහෙත් පාවුලුතුමා පැවසූ දේ බලන්න.

> **මාගේ කථාවත් මාගේ දේශනාකිරීමත් ප්‍රඥාවේ සිත් පොළඹවන්නාවූ වචනවලින් නොව ආත්මයාණන්වහන්සේගේ ද බලයේ ද ප්‍රකාශකිරීමෙන් විය. එසේ වුණේ නුඹලාගේ ඇදහිල්ල දෙවියන්වහන්සේගේ බලයෙන් මිස මනුෂ්‍යයන්ගේ ප්‍රඥාවෙන් නොපිහිටන පිණිසය. (1 කොරින්ති 2:4-5)**

## ආත්මික වැරදි

වැරදි ආත්මික අදහස් ඇති අය බලය ප්‍රදර්ශනය කිරීම අභියෝග කිරීමට ඉඩ තිබේ.

**යේසුස්වහන්සේ උත්තරදෙමින්: නුඹලා ශුද්ධලියවිලිවත් දෙවියන්වහන්සේගේ බලයවත් නොදැන, වරද්දාගනිහුය. (මතෙව් 22:29)**

ආත්මික වැරදි තුළ ජීවත්වන අය, ඔවුන් දෙවියන්වහන්සේගේ බලය පිළි නොගන්නා නිසා ඔබට අභියෝග කරනු ඇත.

## අයුතු භාවිතය

ආත්මික බලය අයුතු භාවිතයට ගැනීමට ඔබව පොළඹවන අය විසින් ඔබට අභියෝග කරනු ඇත. සාතන් විසින් යේසුස්වහන්සේට මෙම ක්ෂේත්‍රයේ අභියෝග කරන ලදි. තම පෞද්ගලික යහපත උදෙසාත් තමාගේ මහන්තත්වය ප්‍රදර්ශනය කිරීමටත් උන්වහන්සේගේ බලය භාවිත කිරීමට සාතන් යේසුස්වහන්සේ පෙළඹවීය.

සාතන්, ඔබවද මේ ආකාරයෙන් පරීක්ෂා කරනු ඇත. උසස් තත්වයක් ලබා ගැනීමට ඔබගේ බලය භාවිත කිරීමට සාතන් ඔබව පොළඹවනු ඇත. පෞද්ගලික යහපත සඳහා බලය භාවිත කළ හැකි විවිධ ආකාර ඔහු ඔබට යෝජනා කරනු ඇත. ඔබ මුහුණ දෙන බලවත්ම අභියෝගය මෙය විය හැකිය.

## ඔබගේ ජීවිත ගමන

ඔබ ඇදහිල්ලෙන් හා බලයෙන් යුක්ත ජීවිතයක් ගතකරන විට ඔබ විරෝධතාවනට මුහුණ දෙන්නෙහිය. ඇදහිල්ලෙන් ගමන් කරන අය සාමාන්‍ය ස්වභාවික දෘෂ්ටියෙන් ගමන්කරන අයව කුපිත කරවති.

ස්තේපන් ඇදහිල්ලේ හා බලයේ මනුෂ්‍යයෙකි (ක්‍රියා 6:8). ඔහුගේ ජීවිත ශෛලය හා සාක්ෂිය ඒ කාලයේ සිටි ආගමික නායකයන්ව කෙතරම් කුපිත කළේද යත් ඔවුහු "අනින ලද සිත් ඇතුව" (ක්‍රියා 7:54) සිටියහ. අවසානයේදී ඔහුව ගල්ගසා මැරූහ.

# අභියෝග සම්මුඛවීම

ඔබ ආත්මික ආශිර්වාදවලින් ඔබ්බට බලය හා ආධිපත්‍යය සහිත පෙදෙස් ගමන් කරනවිට ඔබට අභියෝග පැමිණේ. සාතන් ඔබගේ අධිකාරි බලය අභියෝගයට ලක් කරන විට ඔබ කළ යුතු දේ මෙසේ වේ.

## ප්‍රභවය හඳුනාගන්න

සැබෑ ආත්මික බලයට එරෙහිව පැමිණෙන සියලුම අභියෝග සාතන්ගෙන් බව මතක තබා ගන්න. ඔබ අභියෝග කරන්නෝ, සෙනඟ හෝ අවස්ථාවන් හෝ නොවෙති. විරෝධතාවන් හා කටයුතු කිරීමට ඒවායේ සැබෑ ප්‍රභවය ඔබ හඳුනාගත යුතුය.

**මක්නිසාද අපේ පොරබැදීම වනාහි මාංසයට සහ රුධිරයට විරුද්ධව නොව, අධිපතිකම් වලටත් පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාරයේ ලෝක මුලාදෑනීන්ටත් ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධවය. (එපීස 6:12)**

## විවාද කරමින් කාලය නාස්ති නොකරන්න

ඔබගේ සටන මාංශය හා රුධිරය සමඟ නොවන බැවින් මිනිසුන් සමඟ විවාද කිරීමට හෝ තර්ක කිරීමට හෝ කාලය නාස්ති නොකරන්න. තර්ක, බුද්ධිය හෝ දේවධර්මය පිළිබඳ විවාද ආදියෙන් සාතන්ට බලපෑමක් ඇති නොවේ.

යේසුස්වහන්සේ, තමන්වහන්සේගේ ආත්මික අධිකාරී බලය පිළිබඳව තර්ක කිරීමට කාලය මිඩංගු කළේ නැත. උන්වහන්සේ තමාට අභියෝග කරන්නන්ගේ ආත්මික තත්වය අවධාරණය කෙරෙන ප්‍රශ්න කිපයක් අසා ඉන්පසු මෙසේ පැවසූ සේක.

**මේ දේවල් අහවල් බලයෙන් කරමියි මමත් නුඹලාට නොකියම්. (මතෙව් 21:27)**

## විරෝධතාවනට මුහුණ දෙන්න

විරෝධතාවන් මධ්‍යයේ පැන දුවන්න එපා. මනුෂ්‍යයන්ව සතුටු කිරීම සඳහා දෙවියන්වහන්සේගේ බලයේ ගැලීම නොනවත්වන්න. දෙවියන්වහන්සේගේ බලය ඇසුරෙන් විරෝධතාවනට මුහුණ දෙන්න.

යේසුස්වහන්සේ යායිරස්ගේ දුව නැඟුටුවීමට ඒ නිවසට ඇතුළු වූ අවස්ථාවේ උන්වහන්සේට මුහුණ දීමට සිදුවුයේ අවිශ්වාසයනට වේ. උන්වහන්සේව නැවැත්වීමට එයට ඉඩ දුන්නේ නැත. බියවී හෝ පරාජය වී හෝ උන්වහන්සේ නිවසින් පැනගියේ නැත. උන්වහන්සේ විරුද්ධවාදීන්ට මුහුණ දී උන්වහන්සේ පැමිණි පරමාර්ථය සාක්ෂාත් කරගත් සේක.

## අධිකාරී බලය ඔබ අතට ගන්න

යේසුස්වහන්සේ ඔබට පවරන ලද අධිකාරී බලය මතක් කර ගන්න. උන්වහන්සේ මෙසේ පැවසූ සේක. "මම ඔබට සතුරාගේ සියලු බල පරදවන බලයක් දී ඇත්තෙමි""

එය උන්වහන්සේ ඔබට දී ඇති අතර ඔබ එය භාවිත කළ යුතුය. සාතන්ගෙන් අභියෝග පැමිණෙන විට ඊට මුහුණ දීමට ආත්මික අධිකාරීබලය ලබාගන්න. යේසුස්වහන්සේගේ නාමයෙන් ඒ බලය ලබාගන්න. දේව වචනය පදනම් කරගෙන ඒ අධිකාරී බලය ලබාගන්න. ඔබ මේ පාඩමාලාවෙන් උගත් බලය පිළිබඳ මූලධර්ම භාවිතා කරන්න.

ඔබට සතුරාගේ සියලු බලවලට වඩා වැඩි බලයක් දී ඇත. අවිශ්වාසයේ සෘණ බලවේග පරාජය කරන්න. දෙවියන්වහන්සේ තුළ අධිකාරී බලය පිළිබඳ ඔබගේ නිවැරදි තැන හිමි කරගන්න.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න

______________________________________________

______________________________________________

______________________________________________

2. සැබෑ ආත්මික බලයට එරෙහිව සියලු විරෝධතාවන් දක්වන ප්‍රභවය කුමක්ද?

______________________________________________

______________________________________________

______________________________________________

3. ඔබ මේ පාඩමෙන් උගත් බලයට හා අධිකාරිත්වයට අභියෝග කෙරෙන හේතු සාරාංශ කරන්න.

______________________________________________

______________________________________________

______________________________________________

4. ආත්මික බලයට ඇති විරෝධතාවනට මුහුණ දීමට. මේ පරිච්ජේදයෙන් දී ඇති මාර්ග නිර්දේශ ලයිස්තුගත කරන්න.

______________________________________________

______________________________________________

______________________________________________

(මේ පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදය අවසානයේ ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. දෙවියන්වහන්සේගේ බලයෙන් අභිෂේකලත් අයට අභියෝග කිරීම ඇරඹුණේ යේසුස්වහන්සේගෙන් නොවේ. මේ පිළිබඳව දාවිත් ගීතාවලිය 2හි කතාකර ඇත. මේ විෂය පිළිබඳව එම ගීතිකාවෙන් උගන්වන දේ සාරාංශ කරන්න.

2. දෙවියන්වහන්සේගේ බලය පවරා ඇති මිනිසුන් හා ගැහැණුන්, පැරණි ගිවිසුම කියවා හඳුනාගන්න. සාතන්ගේ විරෝධතාවනට මුහුණ දී ඒවා සමඟ කටයුතු කළ ආකාරය බලන්න. ඉන්පසු මෙම සත්‍යයන් ඔබගේ ජීවිතයට හා සේවයට යොදා ගන්න. පහත දැක්වෙන සටහන භාවිත කරන්න.

| **යොමුව** | **පුද්ගලයා** | **ඔවුන් මුහුණදුන් අභියෝග** | **ඔවුන් ඒ සමඟ කටයුතු කළ ආකාරය** | **එය මාගේ ජීවිතයට අදාළ කරගන්නේ කෙසේද?** |
|---|---|---|---|---|

# ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු

## පළමුවන පරිච්ඡේදය

1. දෙවියන්වහන්ස, ඔබ මාගේ දෙවියන්වහන්සේය, අලුයම ඔබ සොයන්නෙමි. වතුර නැති වියලුණු වෙහෙස උපදවන්නාවූ දේශයක දී මාගේ ආත්මය ඔබ කෙරෙහි පිපාසා ඇත්තේය. මාගේ මාංශය ඔබ කෙරෙහි ආශා ඇත්තේය. මෙසේ ඔබගේ බලයත් ඔබගේ මහිමයත් දකින පිණිස ශුද්ධස්ථානයේදී ඔබ දෙස බලා සිටියෙමි (ගීතාවලිය 63:1-2).

2. ආගම යනු දෙවියන්වහන්සේ දැන ගැනීමට මිනිසා දරන උත්සාහය වේ. එය චාරිත්‍ර හා නියමයන්ය, බලය නොමැති වචන හා ක්‍රියාය. ආගම ආත්මික මරණය ගෙන දේ.

   දෙවියන්වහන්සේගේ බලය යනු, මිනිසාට තමන්වහන්සේ එළිදරව්වීමට ඇති උන්වහන්සේගේ ආශාව දෘශ්‍යමාන ලෙස විදහා දැක්වීම වේ. ආත්මික බලය යනු දේව රාජ්‍යයේ ක්‍රියාත්මක කි×ම වේ. එය ජීවය ගෙන දෙයි.

3. දේශපාලනික, බුද්ධිමය, ශාරීරික, මූල්‍යමය, හමුදාමය, ආගමික බලය හා ශක්තියේ බලය වේ.

4. මතෙව් 20:25-28

5. "බලය" යන වචනයේ බයිබලීය තේරුම නම්, ආගමික ශක්තිය, හැකියාව බලය හා ශක්තිය වේ. එය ප්‍රබල ක්‍රියාවන් හා හාස්කම් කෙරෙන අධිස්වභාවික ක්ෂේත්‍රයකි. "අධිකාරී බලය" යන වචනයේ බයිබලීය තේරුම, බොහෝ දුරට "බලය" යන වචනය හා සමානය. එය, තවත් කෙනෙක් වෙනුවෙන් ක්‍රියා කිරීමට ඇති නීතිමය බලය හා අයිතිවාසිකම වේ. අධිකාරී බලය ලබා ගැනීම යනු බලය ප්‍රදර්ශනය කිරීමේ ක්‍රියාවකි.

6. බයිබලීය ආත්මික බලයේ ප්‍රභවය පියවූ දෙවියන්වහන්සේ ද, පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ද ශුද්ධාත්මයාණන්වහන්සේ ද වේ. දුෂ්ට ආත්මික බලයේ ප්‍රභවය සාතන්ය.

7. පොරොන්දුව හා පොරොන්දුව අයත් කර ගැනීම

8. පොරොන්දුව අයත් කර ගැනීම ඔබගේ තෝරාගැනීමකි. ඔබ මූලධර්ම අවබෝධ කරගත යුතුය. ඔබ මූලධර්ම භාවිතා කළ යුතුය.

9. පශ්චාතාප වීම

## දෙවන පරිච්ඡේදය

1. දෙවියන්වහන්සේ එක්වරක් කී සේක. මම දෙවරක් ඇසීමි. එනම් බලය දෙවියන්වහන්සේට අයිති බවය (ගීතාවලිය 62:11)

2. යම් දෙයක ප්‍රභවය යනු එහි ආරම්භය හා එහි සම්භවයයි.

3. ශුද්ධ බයිබලයෙන් එළිදරව්වන සැබෑ හා ජීවමාන දෙවියන්වහන්සේ වේ.

4. පහත දැක්වෙන ආකාරයට දෙවියන්වහන්සේ සිය බලය එළිදරව් කරන සේක.

| | |
|---|---|
| ස්වභාවධර්මයෙන් | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ |
| විනිශ්චයන් | ශුද්ධාත්මයාණන්වහන්සේ |
| මිදීමෙන් | අධිස්වභාවික ලකුණු |
| උන්වහන්සේගේ ලිඛිත වචනයන් | ඇදහිලිවන්තයින් |

5. අසත්‍යය. බලයේ ප්‍රභවයත් ශ්‍රේෂ්ඨතම බලයත් දෙවියන්වහන්සේය. එහෙත් උන්වහන්සේ තවත් බල පිහිටුවා ඇත.

6. එපීස 1:9-10 සහ 3:11

## තෙවැනි පරිච්ඡේදය

1. ඒක පුදුමයක් නොවේ. මක්නිසාද සාතන් පවා ආලෝකයේ දූතයෙකුගේ වෙස් ගනියි. එබැවින් ඔහුගේ සේවකයෝ ධර්මිෂ්ඨකමේ සේවකයන්ගේ වෙස් ගනිත් නම් ඒක පුදුමයක් නොවේ. ඔවුන්ගේ අන්තිමය ඔවුන්ගේ ක්‍රියා ලෙස වන්නේය. (2 කොරින්ති 11:14-15)

2. පාවුලුතුමා "උස්තැන්වල ආත්මික දුෂ්ටකම්" ගැන කතා කරන විට ඔහු අදහස් කරන්නේ ලෝකයේ ආත්මික පද්ධති තුළ රිංගා ඇති දුෂ්ට ආත්ම පිළිබඳවය. ඔවුහු දෙවියන්වහන්සේගේ සැබෑ බලය අනුකරණය කරති.

3. ඔබගේ සාරංශය තෙවැනි පරිච්ඡේදයේ ඇති සාකච්ඡාව හා සසඳන්න.

4. ඔබගේ සාරාංශය තෙවැනි පරිච්ඡේදයේ ඇති උපක්‍රමික හා සසඳහන්න.

## සිවුවැනි පරිච්ඡේදය

1. යේසුස්වහන්සේ ඔවුන් ළඟට ඇවිත් කථා කොට: ස්වර්ගයෙහි ද පොළොවෙහි ද සියලු බලය මට දී තිබේ. (මතෙව් 28:18)

2. යේසුස්වහන්සේ සීමාසහිත නොවූ සේක. උන්වහන්සේට ස්වර්ගයේ හා පොළොවේ සියලු බලය තිබිණි. මතෙව් 28:18

3. පියවූ දෙවියන්වහන්සේ

4. ඔබගේ සාරාංශය සිවුවැනි පරිච්ඡේදයේ ඇති සාකච්ඡාව හා සසඳන්න.

## පස්වැනි පරිච්ඡේදය

1. බලවල සර්පයන්ද ගෝනුස්සන් ද පාගන්ටත් සතුරාගේ මුළු ශක්තිය මැඩපවත්වන්ටත් මා විසින් නුඹලාට බලය දී තිබේ. කොයි දෙයකින්වත් නුඹලාට අන්තරායක් නොවන්නේය. (ලූක් 10:19)

2. ඇදහිලිවතුන්ගේ ආත්මික අධිකාරී බලය පවරා ඇත්තේ යේසුස්වහන්සේ විසිනි.

3. යම් කෙනෙකුට යම් දෙයක් කිරීමට වගකීමක් භාරදුන්විට ඔහුට ඒ සඳහා අධිකාරී බලයද දිය යුතුය.

4. ශුභාරංචිය මුළු ලොව පැතිරවීමට

5. "dunamis" යන ග්‍රීක වචනයෙන් අදහස් වන්නේ සහජයෙන්ම ලබාගත් බලය වන අතර "exousia" හි තේරුම පවරන ලද බලය හෝ අධිකාරීත්වය වේ.

## හයවන පරිච්ඡේදය

1. ඔවුහු පිටත්ව ගොස්, සියලු තැන්වල දේශනා කළෝය. ස්වාමින්වහන්සේ ද ඔවුන් සමග ක්‍රියාකරමින් ඔවුන් අතින් සිදුවූ ලකුණුවලින් වචනය ස්ථිර කළ සේක. (මාක් 16:20)

2. බලය ආත්මාර්ථකාමී දේ සඳහා මොලොව භාවිත කෙරේ. ආත්මික බලය භාවිත කළ යුත්තේ ආත්මික පරමාර්ථවලට හා දේව රාජ්‍යයේ ප්‍රගතිය සඳහා වේ.

3. මතෙව් 20:25-27

4. මේ පරිච්ඡේදයේ සාකච්ඡා කළ ඕනෑම බලය සඳහා පරමාර්ථයක් ඔබට ලිවිය හැකිය.

## හත්වන පරිච්ඡේදය

1. මක්නිසාද මම ශුභාරංචිය ගැන ලජ්ජා නොවෙමි. අදහන්නාවූ සියල්ලන්ටම, එනම් පළමුකොට යුදෙව්වාට ද එසේම ග්‍රීකයාට ද, ගැළවීම පිණිස එය දෙවියන්වහන්සේගේ බලයව තිබෙන නිසාය. (රෝම 1:16)

2. ශුභාරංචිය ගැන වචනයේ තේරුම "ශුභ ආරංචිය" යන්නය. අප ශුභාරංචිය පිළිබඳව බයිබලිය හැඟුමකින් කතා කරන විට ඉන් අදහස් වන්නේ දේව රාජ්‍යය හා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් ලැබෙන ගැළවීමේ ශුභ ආරංචිය ගැනය.

3. 1 කොරින්ති 15:3-4, ශුභාරංචියේ මූලික කරුණු වලින් අවධාරණය කෙරෙන්නේ යේසුස්වහන්සේගේ ජීවිතය හා සේවය පිළිබඳවය. එහි සියලු මනුෂ්‍ය වර්ගයාගේ පාපය වෙනුවෙන් උන්වහන්සේගේ මරණය, උන්වහන්සේගේ භූමදානය හා මළවුන්ගෙන් නැවත නැගිටීම ලිඛිත දේව වචනයට අනුකූලව අන්තර්ගත වේ.

4. රෝම 1:16-19 බලන්න

   - එය මිනිසාට දෙවියන්වහන්සේගේ බලය එළිදරව් කිරීම වේ.
   - ජාතිය, වර්ණය හා ආගම කුමක් වුවත් එය ගැළවීම ගෙන දෙයි.
   - දෙවියන්වහන්සේ පිළිබඳ මිනිසා දන ගත යුතු දේ එය එළිදරව් කරයි.
   - පාපයට එරෙහි දෙවියන්වහන්සේගේ කෝපය හා විනිශ්චය එය එළිදරව් කරයි.
   - එය දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම එළිදරව් කරයි.
   - ඇදහිල්ල මගින් යුක්තිය ඉටුවන්නේ කෙසේදැයි එය පෙන්වයි.
   - එය අප ජීවත්වන ඇදහිල්ලේ පදනම වේ.

5. රුධිරයේ බලය පිළිබඳ ඔබගේ සාරාංශය හත්වන පරිච්ඡේදයේ සඳහන් සාකච්ඡාව හා සසඳන්න.

6. ඇදහිල්ල

7. ඔබ පව් කර ඇති බව පිළිගන්න. රෝම 3:23
   යේසුස්වහන්සේ ඔබේ පාප උදෙසා මැරුණු බව විශ්වාස කරන්න. යොහන් 3:16-17
   ඔබගේ පව් දෙවියන්වහන්සේ ඉදිරියේ පාපොච්චාරණය කර ඒ සඳහා සමාව අයදින්න. 1 යොහන් 1:8-9
   වෙනස් වූ ජීවිතයක් අත්දකින්න" 2 කොරින්ති 5: 17

8. අසත්‍යය. යේසුස්වහන්සේ තම කැමැත්තෙන්ම කුරුසියෙහි සිය ජීවිතය පූජා කළ සේක.

## අටවන පරිච්ඡේදය

1. බලව, මම මාගේ පියාණන්වහන්සේගේ පොරොන්දුව නුඹලා වෙතට එවමි. නුමුත් ඉහළින් නුඹලා බලයෙන් සරසනු ලබනතුරු නුවර නැවතී සිටින්න. (ලූක් 24:49)

2. ක්‍රියා 1:8. බලය පැමිණෙන්නේ අප වෙත ශුද්ධාත්මයාණන්වහන්සේ පැමිණි පසුව වේ.

3. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සාක්ෂිකාරයෝ වීමට. ක්‍රියා 1:8 බලන්න.

4. ගලාති 5:22-23

5. පශ්චත්තාප වී බව්තිස්ම වන්න.
එය ඔබට බව විශ්වාසකරන්න.
ඊට කැමැත්ත දක්වන්න.
එය ත්‍යාගයක් බව පිළිගන්න.
දෙවියන්වහන්සේට යටත් වන්න.
අනෙකුත් ඇදහිලිවතුන් සඳහා යාච්ඤාවන් ඉල්ලන්න.

6. ඔබගේ ලයිස්තුව අටවන පරිච්ඡේදයේ ඇති සාකච්ජාව හා සසඳන්න.

## නවවන පරිච්ඡේදය

1. දැන් පවතින්නේ ඇදහිල්ලල බලාපොරොත්තුව, ප්‍රේමය යන මේ තුනය. මෙයින් ඉතා උතුම් එක නම් ප්‍රේමයය. (1 කොරින්ති 13:13)

2. ප්‍රේමය යනු, ගැඹුරු ස්නේහය, සැලකිල්ල හා රැකබලා ගැනීම වැනි ශුද්ධාත්මයාණන්ගේ ඵල ලෙස අප ජිවිතය තුළ වර්ධනය වන හැඟීමකි.

3. පළමු ශ්‍රේෂ්ඨ ආඥාව නම් දෙවියන්වහන්සේට ප්‍රේම කිරීමය. දෙවැන්න අන් අයට ප්‍රේම කිරීමය. මාක් 12:30-31

4. එකිනෙකා වෙනුවෙන් අපගේ ඇති ප්‍රේමය නිසා. යොහන් 13:35

5. ප්‍රේමය

6. ප්‍රේමය

7. ප්‍රේමය හා එක සමානය

## දසවන පරිච්ඡේදය

1. නුඹලා උන්වහන්සේගෙන් ලැබූ ආලේපය නුඹලා තුළ පවතින්නේය. යමෙකු විසින් නුඹලාට ඉගැන්වීම් ඕනෑ කරන්නේ නැත. එම ආලේපය සියල්ල ගැන නුඹලාට උගන්වන ලෙසද, එය බොරු නොව සත්‍යව තිබෙන ලෙසද, එයින් නුඹලාට ඉගැන්වූ ප්‍රකාරයට ද උන්වහන්සේ තුළ පවතින්න. (1 යොහන් 2:27)

2. පැරණි ගිවිසුමේ ශුද්ධ ආලේපය භාවිත කළේ දෙවියන්වහන්සේ වෙනුවෙන් කැපවූ සෙනඟ හා දේවල් වෙන්කර තැබීමටය.

3. ශුද්ධ ආලේපය භාවිත කළේ දිවැසිවරු, රජවරු, පූජකවරු මෙන්ම අල්තාර හා කූඩාරම් ද එහි බඩු බාහිරාදියද දෙවියන්වහන්සේට කැප කිරීම සඳහාය.

4. අභිෂේකලත් තැනැන්වහන්සේ

5. ඔබගේ සාරාංශය දසවන පරිච්ඡේදයේ සාකච්ජාව හා සසඳා බලන්න.

6. දෙවියන්වහන්සේ සෑම කෙනෙක්ම එකම සුවිශේෂී සේවය සඳහා ආලේප නොකරන බැවිනි. දෙවියන්වහන්සේ ඔබව ආලේප නොකළ සේවයක් කිරීමට ඔබ උත්සාහ කළහොත් ව්‍යාකූල තත්වයක් ඇතිවන අතර ප්‍රතිඵල අසාර්ථක වේ.

7. ඔබගේ පිළිතුර දසවන පරිච්ඡේදයේ දී ඇති මාර්ගනිර්දේශ සමඟ සසඳන්න.

8. දෙවියන්වහන්සේ

## එකොළොස්වන පරිච්ඡේදය

1. ස්තේපන් අනුග්‍රහයෙන් ද බලයෙන් ද පූර්ණව, පුදුම ද හාස්කම් ද සෙනඟ අතරේ සිදු කෙළේය. (ක්‍රියා 6:8)

2. ඇදහිල්ල යනු විශ්වාස කිරීම හා යම් දෙයක් ගැන සහතිකයක් තිබීම වේ. විශ්වාසය යනු සහතික වීම වේ. ශුද්ධ ලියවිල්ලේ ඇදහිල්ල, විශ්වාසය හා සහතික වීම යන වචනවල තේරුම එක හා සමානය. ඇදහිල්ල යනු බලාපොරොත්තුවන දේ පිළිබඳ සහතිකයය, අදෘශ්‍යමාන දේ පිළිබඳ නිසැකකමය. හෙබ්‍රෙව් 11:1 බලන්න.

3. ඇදහිල්ල භාවිත නොකළ අය ගැන යේසුස්වහන්සේ පැවසුවේ ඇදහිල්ල නොමැත්තෝ ලෙසය (මතෙව් 17:17). මඳ ඇදහිල්ල ඇත්තන් ගැන (මතෙව් 6:30; 8:26; 14:31; ලූක් 12:28) සහ මහත් ඇදහිල්ල ඇත්තන් ගැන උන්වහන්සේ කතා කළ සේක. (මතෙව් 8:10; 15:28; ලූක් 7:9)

4. ගැළවීමේ ඇදහිල්ල, පාරිශුද්ධත්වයේ ඇදහිල්ල, ආරක්ෂා කිරීමේ ඇදහිල්ල, ඇදහිල්ලේ දීමනා, ඇදහිල්ලේ ඵල

5. දේව වචනයට සවන් දීමෙන්

6. ඔබගේ සාරාංශය එකොළොස්වන පරිච්ඡේදයේ සාකච්ජාව හා සසඳන්න.

## දොළොස්වන පරිච්ඡේදය

1. එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේව ඉතා උසස්කොට, සියලු නාමවලට වඩා උසස් නාමය උන්වහන්සේට දුන්සේක. එසේ කළේ, ස්වර්ගයෙහිද පොළොවෙහිද පොළොව යටද සියල්ලන් යේසුස් යන නාමයෙන් දණ නමන පිණිසත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වාමින්වහන්සේ බව පියවූ දෙවියන්වහන්සේගේ ගෞරවය සඳහා සියලු දිව්වලින් ඒත්තුගන්න පිණිසත්ය. (පිලිප්පි 2:9-11)

2. බයිබල් යුගයේ නම්වල මහත් වැදගත්කමක් තිබේ. බොහෝ අවස්ථාවල දෙන ලද නාමය උපදින වේලාවේ වාතාවරණය විසින් නිර්ණය කෙරිනි (උත්පත්ති 19:22). ඇතැම්විට ඒ නමින් බලාපොරොත්තුවක් හෝ අනාගත වාක්‍යයක් හෝ ප්‍රකාශ විය (යෙසායා 8:1-4; හොසියා 1:4). දෙවියන්වහන්සේගේ සැලැස්මේ දෛවය අනුව ආබ්‍රහම්, සාරා, යාකොබ්, පේතෘස්, පාවුල් ආදී නම් වෙනස් විය.

3. දෙවියන්වහන්සේ විසින් එවන ලද දේවදූතයෙක්

4. යේසුස්

5. යේසුස්වහන්සේට උන්වහන්සේගේ නම ලැබුණේ මොලොව ශ්‍රේෂ්ඨ මිනිසුන් නම් ලබාගන්නා තෙආකාරයෙන්මය. එනම් උත්පත්තියෙන්, කි%යාවන් නිසා  හා පැවරීමෙනි.

6. දේව වචනයට සවන් දීමෙන්. රෝම 10:17

7. අ. ගැළවීම ආ. සුවකිරීම ඇ. පාරිශුද්ධිකරණය ඈ. ඉගැන්වීම, දේශනාකිරීම
ඉ. යක්ෂයින් ඊ. බව්තිස්මය

8. අ. සත්‍යය ආ. සත්‍යය ඇ. අසත්‍යය

## දහතුන්වන පරිච්ඡේදය

1. ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙක් ඔප්පුකරන කන්නලව්ව කරණකොටගෙන මහත් දේ ඉෂ්ට වෙයි. (යාකොබ් 5:16)

2. යාච්ඤා කිරීම හා නිරාහාරව සිටීම

3. ඉල්ලීම, සෙවීම හා තට්ටුකිරීම

4. නමස්කාරය හා ප්‍රශංසාව, කැපවීම, ඉල්ලීම, පාපෝච්චාරණය, මැදිහත්වීම

5. දහතුන්වන පරිච්ඡේදයේ ඇති ලයිස්තුව බලන්න

6. යාච්ඤාව යවු දෙවියන්වහන්සේ සමඟ සංවාදයකි. එය විවිධාකාරය, එහෙත් මූලිකවම මිනිසා දෙවියන්වහන්සේ සමගත් දෙවියන්වහන්සේ මිනිසා සමගත් කතා කිරීම වේ.

7. ඉතා සරලව ගත් කළ නිරාහාරව සිටීම යනු ආහාර නොගෙන සිටීමය.

8. බයිබලය පරිදි නිරාහාරව සිටීම දෙයාකාරය. පූර්ණ නිරාහාරව සිටීම යනු කිසිවක් නොකා නොබී සිටීමය. මේ සඳහා නිදසුනක් ක්‍රියා 9:9 හි තිබේ. අර්ධ නිරාහාරව සිටීම යනු සීමා කරන ලද ආහාර ගැනීමය. මේ සඳහා නිදසුනක් දානියෙල් 10:3 හි ඇත.

9.
- නිහතමානි වීමටය
- පාපය සඳහා පසුතැවිලි වීමටය
- එළිදරව් ලබාගැනීම සඳහා
- දුෂ්ඨකමේ විලංගු මුදාහැරීමට, මහා බර ඉවත් කිරීමට, පීඩාවට පත්වූවන් නිදහස් කිරීමට හා සියලු බන්ධන බිඳ දැමීමට වේ
- දුප්පතුන්ට ශාරීරික හා ආත්මික ආහාර සැපයීමටය
- දෙවියන්වහන්සේ අපව අසන පිණිස

## දහහතරවන පරිච්ඡේදය

1. මක්නිසාද දෙවියන්වහන්සේගේ වචනය ජීවමානය, බලවත්ය, කොයිම දෙමුහත් කඩුවකටවත් වඩා තියුණුය. ප්‍රාණය හා ආත්මයද සන්ධි හා ඇටමිදුලුද වෙන්කරන තරමට කාවදින්නේය. සිතේ සිතිවිලිද අදහස්ද විමසන්නේය. (හෙබ්‍රෙව් 4:12)

2. දෙවියන්වහන්සේ

3. “රෙහ්මා” (rhema) යන දේව වචනය සුවිශේෂී අවස්ථාවකට යෙදෙන දෙවියන්වහන්සේගේ සුවිශේෂී ප්‍රකාශයකට යෙදේ.

4. “ලෝගොස්” (Logos) යන දේව වචනය දෙවියන්වහන්සේගේ පූර්ණ ප්‍රකාශයකි. එය දෙවියන්වහන්සේ පවසා ඇති සියල්ල එළිදරව් කිරීමකි.

5. උන්වහන්සේ ඔවුන්ට දේව වචනයෙන්, වචනයේ බලයෙන් පිළිතුරු දුන් සේක. උන්වහන්සේ “රෙහ්මා” දේව වචනය භාවිත කළ සේක.

6. ඔබගේ සාරාංශය දහහතරවන පරිච්ඡේදයේ සාකච්ඡාව සමග සසඳන්න.

7. ඔබගේ සාරාංශය දහහතරවන පරිච්ඡේදයේ සාකච්ඡාව සමග සසඳන්න.

8. අසත්‍යය

## පහළොස්වන පරිච්ඡේදය

1. හැමදෙනාම බලය ලත් මුලාදෑනීන්ට යටත් වෙත්වා. මක්නිසාද දෙවියන්වහන්සේගෙන් මිස කිසි මුලාදෑනිකමක් නැත්තේය: ඇත්තාවූ මුලාදෑනිකම් දෙවියන්වහන්සේ විසින් නියම කර තිබේ. (රෝම 13:1)

2. ඔබ ආධිපත්‍යය ලබාගත යුත්තේ නීත්‍යානුකූල ප්‍රභවයකිනි.

3. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ ආධිපත්‍යය යටතේ සිටි සේක. උන්වහන්සේ ක්‍රියාකළ ආධිපත්‍යයේ ප්‍රභවය දෙවියන්වහන්සේය. එමනිසා යේසුස්වහන්සේට ලෙඩරෝග යක්ෂයන්, පාපය හා ස්වභාධ[1]මය කෙරෙහි ආධිපත්‍යය දැක්වීමට හැකිවිය.

4. ඔබගේ සාරාංශය පහළොස්වන පරිච්ඡේදයේ සාකච්ඡාව සමග සසඳන්න.

5. ඔබගේ සාරාංශය පහළොස්වන පරිච්ඡේදයේ සාකච්ඡාව සමග සසඳන්න.

6. ඔබගේ සාරාංශය පහළොස්වන පරිච්ඡේදයේ සාකච්ඡාව සමග සසඳන්න.

7. රෝම 13:1-7

8. දෙවියන්වහන්සේ

## දහසයවන පරිච්ඡේදය

1. යම් අන්දමකින් මළවුන්ගෙන් නැගිටීමට පැමිණෙන ලෙස, උන්වහන්සේ සහ උන්වහන්සේගේ නැවත-නැගිටීමේ බලයත් උන්වහන්සේගේ දුක්වල පංගුකාරකමත් දැනගන්නා පිණිසත්ය. (පිලිප්පි 3:10,11)

2. "නැවත නැගිටුවීම" යන වචනයේ තේරුම මරණයෙන් නැවත නැගිටුවීම වේ. මලාවු පුද්ගලයෙක=ට නැවතත් ප්‍රාණය දීමය.

3. ඔබගේ සාරාංශය දහසයවන පරිච්ඡේදයේ සාකච්ඡාව හා සසඳන්න.

4. අසත්‍යය

5. ඔබගේ සාරාංශය දහසයවන පරිච්ඡේදයේ සාකච්ඡාව හා සසඳන්න.

6. යේසුස්වහන්සේ. යොහන් 11:25

## දහහත්වන පරිච්ඡේදය

1. මක්නිසාද උන්වහන්සේ දුර්වලකමින් කුරුසියෙහි ඇණගසනු ලැබූ නුමුත් දවියන්වහන්සේගේ බලයෙන් ජීවත්වන සේක. එසේම අපි ද උන්වහන්සේ තුළෙහි දුර්වලව සිටින නුමුත් උන්වහන්සේ සමග දෙවියන්වහන්සේගේ බලයෙන් නුඹලා උදෙසා ජීවත්වන්නෙමු. (2 කොරින්ති 13:4)

2. සාතන්

3. දුක්විඳීම අප ජීවිත තුළට පැමිණෙන්නේ අන් අය මගින්, ජීවිතයේ විවිධ අවස්ථාවලින්, සේවයෙන්, පාපයෙන් හා සාතන්ගේ ඍජු පහරදීම් වලිනි.

4. දුක්විඳීමේ පරමාර්ථ පිළිබඳ ඔබගේ සාරංශය දහහත්වන පරිච්ඡේදයේ සාකච්ඡාව සමඟ සසඳන්න.

## දහඅටවන පරිච්ඡේදය

1. ඔවුහු පිටත්ව ගොස්, සියලු තැන්වලම දේශනා කළෝය. ස්වාමින්වහන්සේ ද ඔවුන් සමඟ ක්‍රියාකරමින් ඔවුන් අතින් සිදුවූ ලකුණුවලින් වචනය ස්ථිර කළ සේක. (මාක් 16:20)

2. ඔබගේ සාරාංශය දහඅටවන පරිච්ඡේදයේ සාකච්ජාව සමඟ සසඳන්න.

3. දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීමේ කේන්ද්‍රස්ථානය සභාව විය යුතුය.

4. එය වැඩිකරගැනීම සඳහා ඔබ භාවිත කළ යුතුය. ලූක් 19:12-26 හි ඇති උපමාව බලන්න.

## දහනවවන පරිච්ඡේදය

1. ඔවුන්ගේ ඇදහිලි නැතිකම නිසා උන්වහන්සේ එහිදී බොහෝ ආශ්චර්යයන් නොකළ සේක. (මතෙව් 13:58)

2. ද්විතිය කථාව 29:29

3. ඔබගේ සාරාංශය දහනවවන පරිච්ඡේදයේ සාකච්ජාව හා සසඳන්න.

## විසිවන පරිච්ඡේදය

1. ස්වාමින්ට ද උන්වහන්සේගේ අභිෂේකලත් තැනැත්තාණන්ට ද විරුද්ධව පොළොවේ රජවරු සැරසෙති. අධිපතියෝ ද එක්ව මන්ත්‍රණය කෙරෙති. (ගීතාවලිය 2:2)

2. සාතන්

3. ඔබගේ සාරාංශය විසිවන පරිච්ඡේදයේ සාකච්ජාව හා සසඳන්න.

4. විසිවන පරිච්ඡේදයේ දී ඇති මාර්ගනිර්දේශ බලන්න.